යොයිසා චරිතය

හෙවත්

චාල්ස් හැන්රි ද යොයිසා

සාමදූත විනීශවයකාර මැතිතුමාගේ

ජීවිතකථා ශරීරය.

විද්‍යෝදය පරිවෙණාධිපති ගරුකටයුතු

ශ්‍රී සුමඞ්ගල

කොළඹ නවකෝරළාදියෙහි

ප්‍රධාන නායක ධුරන්ධර මාහිමියානන් වහන්සේගේ

ශිෂ්‍ය වූ ද

දසසුර, සිරිසඟබෝ චරිතය, අසූරු ශික්ෂාව, කවිමිණිඹරණ

සහ වෙනත් කාව්‍ය නාට්‍ය පොත්වලැ කතුවූද

සී. දෙන් බස්තියන්

දිනපතා ප්‍රවෘත්ති පත්‍ර කතුවරයා විසින්

සම්පාදනය කරණලදින් මුද්‍රාඩිකණ්යකොට

ප්‍රසිඩකරණලදී.

දිනපතා ප්‍රවෘත්ති යන්ත්‍රාලයේ මුද්‍රිතයි.

1904.

AUTHOR.

ඩී. දෙන් බස්තියන්, ගුරු කතා.

THE

DE SOYSA CHARITAYA,

OR,

THE LIFE OF

CHARLES HENRY DE SOYSA, Esq., J.P.

BY

C. DON BASTIAN,

Editor of the "Sinhalese Daily News" and Author of "Dásayura," "Sirisangabo Charitaya," "Aksara Siksáwa," "Kawuminibarana," &c.

Pupil of the Very Revd. Sri Sumangala, Principal of the Vidyodaya Páli College and High Priest of the Nawa Korales in the Colombo District.

PRINTED AND PUBLISHED BY THE AUTHOR.

COLOMBO:

PRINTED AT THE "SINHALESE DAILY NEWS" PRESS.

1904.

DEDICATION.

පිළිගැන්වීම.

සසිරි සඳ හිරු දලඳ තුරු ගහ සුරිඳුසැව් නුබතෙලි න් ප...
සුසිරි පිරි නැව්පඬව් මුතුගණ තරඟ පෙළ සමුදුරි න් ප...
තෙසිරි දන මිණි සානක තුරුලිය ඇසුරු සත මිහිතෙලි න් ප...
අසිරි සිරිදුරු **සොඩිස මැහිවරු** කල ලොවැඩ මෙම **පොතින්** ප...

අඹර සමුදුරු දෙරණ වරසිරි තොතැන නරඹන සුදන දනහ
පවර මෙක්වන් තමන් තමනැස හමුව එහිරග දුනේ කදිම
අමර නර තිසි වෙකුදු නොම ඇත මෙඈ මෙව්ලස නොවෙයි කිය...
මෙවර මුළුලෙව දනට එවැනිව පෙනේ **මෙපොතින්** කරුණු මො...

ගුණවතුන් ගුණ වණන අය පින්කමට මාවත තනන දනයො
පැණවතුන් විසූ පොරණ දින ගරු වදන් සුරැකුම පුනුය සිහිනො...
දනවතුන් හට වෙසෙස්නෙන් උන උනා බැලුමෙන් ලොවැඩ සද...
මනපසන් සිදුවෙවා පැතුමෙන් කල මෙතැන රැති නොවෙද පඩි...

ඔබමැතිනි යස සුගුණ සවණන වැකුන අප මහ රදින් සසඳ
මනතුටිනි සිරි ලකට **වරගන** කළා දනමන කුමුදු පොබක
එමදරනි මෙහි කරුණු සත්බව සැමට වැටහ් යාම නිර ස
යනුහෙසිනි ඔබෙ මහගු **සුරනට පුදමි මෙම පොත** මෙසේ නිම...

ගුරු කරු...

DEDICATION.

පිළිගැන්වීම.

ස සි රි සඳ හිරු දලුදූ තුරු ගහ සුරිඳුසැව් නුබතෙලි න් පළ
සු සි රි පිරි නැවපබව් මුතුහණ් තරහ පෙළ සමුදුර් න් පළ
ගනසිරි දන මිණි කනක තුරුලිය ඇසුරු සත ඕජිතෙලි න් පළ
අ සි රි සිරිදූරුඇසිඔබ මැහිවරු කල ලොවැඩ මෙම පොතින් පළ

අ බ ර සමුදුරු දෙරණ් වරසිරි තෙතෑන නරඹන සුදන දනා
ප ච ර මෙක්වත් තමන් තමනැස හමුව එකිරිග දුනේ කදිම
අ ම ර නරකිසි වෙකුදු නොම ඇත මෙඇ මෙවිලස නොවෙයි කියන
මෙවර මුළුලෙව දනට එවැනිව පෙනේ මෙමපොතින් තරුණු පොනව

ගුණ වතුන් ගුණ වණන අස පින්කමට ඕවත තනන දනයො
පැණ වතුන් වියු පොරණ දින ගරු වදන් සුරැකුම සුතුය සිහිකො
දැනවතුන් හට වෙසෙස්නෙන් උන උනා බැලුමෙන් ලොවැඩ සදා
මනපසන් සිදුවෙවා පැතුමෙන් කල මෙතැන රැඟි නොවේද පැ

ඔබ මැනි නි යස සුගුණ සවණන වැකුන අප මහ රදිනි සසද
මන කුවිනි සිරි ලකට වරගන කලා දනමින කුමුදු පොබක
ඒම දරනි මෙනි කරුණු සත්බව සැමට වැටහ යාම නිර ස
යනුහෙසිනි ඔබෙ මහහු සුරනට පුදම් මෙම පොත මෙසේ නිමන

ඉසුරු කවි.

PREFACE.

ප්‍රස්තාවනාව.

ප්‍රස්තාවනාව.

PREFACE.

ලඞ්කාද්වීප වාසී විශුද්ධ බුද්ධිමතුන්ගේ ප්‍රසාද සංවෙග පිණිස ලියනලද මෙම ග්‍රන්ථය, ලොකාර්ථ සාධක කරුණු සඞ්ඛ්‍යාවක් සඳහා ලියන ලද්දේය. එනම්:—

බෞද්ධ ලඞ්කික අප අසහාය යොගනාමමු ත්වන් අවබොධකළ ප්‍රත්‍යක්ෂවාදී වර සර්වඥ සධර්ම චක්‍රවර්ති භගවත් අර්හත් සම්‍යක් **සම්බුද්ධරාජයාණන්වහන්සේ** විසින් වදාළ "දානං සීලං භාවනා පත්ති දානං" යනාදී දෙලොස් වැදෑරුම් පුණ්‍යකර්ම ලක්ෂණයෙන් පෙණෙන පැසසිය යුත්තන්ට පැසසීමද, ගුණ වැණිය යුත්තන්ගේ ගුණ වැණීමද වාදශවිධ පුණ්‍යකර්ම හෙයින් * එම උතුම් බුද්ධ **නිධිය** අපගේ දිවි කෙළවර දක්වා උල්ලඞ්ඝනය නොකොට රක්ෂාකටයුතුහෙයින්ද, ලොව විද්‍යමාන ක්‍රිස්තියානි

---

* "කුසලංති සංරොතනානං
පතා පුඤ්ඤාභ කාරිකා
ගුණනො වණ්ණනා යා සා
පසංසාති පකිත්තිතා"

සුචරිත කරන්නවුන්ගේ ඒ පිණිස සතුට හා උත්සාහය ඇතිකරන්නාවූ ගුණවර්ණනාව ප්‍රශංසායයි කියනලදී. යනු භාවයි. සධර්මොපායන,

ජනතාව විසින් ගරුබුහුමන් කරන්නා, **සදව ධාන්‍යයෙහි** ධර්මිෂ්ඨයන් පිළිගැනීමට සහ ගෞරව කළ යුත්තන්ට ගෞරව කිරීමට කර තිබෙන නියමය * ප්‍රාශංස්‍ය නිසාද, විචක්ෂණතාව විසින් "ධනය" ලෝකයාගේ ප්‍රයෝජනය පිණිස පරිත්‍යාග කරන්නා සත්පුරුෂයෙක් කොට ගැණිය යුතුය † යන නියමය පිළිපැදිය යුතු නිසාද, සාධු ජනයාගේ ගුණ වර්ණනා කිරීම ආදි සත්ක්‍රියාවන් කරණකොටගෙණ සෙබෙහි විරාජමානවීමේ ප්‍රයෝජනය ‡ නොහල යුතු බැව් පෙණෙන හෙයින්ද, අන්‍යයන්ගේ ගුණ වර්ණනාකිරීමෙන්ම යසස් ලැබියයුතු බැව් § විචක්ෂණභාෂිත නිසාද, ලුබ්ධාධ්‍යාශය කරණකොටගෙණ පුණ්‍ය

---

* ධර්මිෂ්ඨයෙකුගේ නමින් ධර්මිෂ්ඨයෙක් පිළිගන්නා තැනැත්තා, ධර්මිෂ්ඨයෙකුගේ විපාක ලබන්නේය. තවද ගෝලයෙකුගේ නමින් මේ බාලයන්ගෙන් එකෙකුට ඇල්වතුර පිඟාන්වක් බොන්නට දුන්නේ නම්, සැබවින් නුඹලාට කියමි. ඔහුගේ විපාක නොනස්නේයයි කීයේය."
ශු. මතෙව් X. 41. 42.

"ගෞරව දෙන්ට තිස්සාට ගෞරව දීපල්ලාය" රෝම. XIII. 7.

† "ධනානි ජීවිතංචෛව පරාර්ථේ ප්‍රාඥ උත්සෘජේත්
සන්නිමිත්තෙ වරං ත්‍යාගො විනාශෙ නියතෙ සති"

ධනය, ජීවිතය, යන දෙක නුවණැති පුරුෂයාතම ලෝකයාට උපකාර පිණිස පරිත්‍යාග කරන්නේය. විනාශය නියමවූකල සත්පුරුෂයන්ගේ හේතුවෙහි ප්‍රාණ, ධන දෙක පරිත්‍යාගකිරීම උතුම්වේ. යනු භාවයි.
හිතොපදෙශ.

‡ "සබඳුකල කුමු ද න
සඳරැසමෙන් දිවුණුව න
මෙරමා ගුණ වණ න
විසන් පැළඹෙ සෙබෙහි හොබි න

කොමුදන් විකසිතකලාවූ විශුණවන්නාවූ චන්ද්‍රකාන්තිය මෙන් අනුන්ගේ ගුණ වර්ණනාකරන්නාවූ ව්‍යක්තයාතමු සභාවෙහි ශෝභමාන වෙමින් විරාජමානවේ." යනු භාවයි.
කාව්‍යශේඛර.

§ "එසින් නැත ගුණාඪ්‍යවු වියතුන් සක සා
වෙනින් වෙන උනා බලමැනවිත මබ සා
උනුන් වන වනා දෙස කිවන් විම සා
අනුන් ගුණ වණා විස නොලබති යස සා"

"එහෙයින්, සුනයෙන් සත ගුණයෙන් යුක්ත විචක්ෂණයිනි, මාගේ වචන වෙත වෙන්කොට බැලූකල උගතුන් විසින් පරීක්ෂාකාරීව මොන මොන වැදත් කී නමුත් අන්‍යයන්ගේ ගුණ වර්ණනාකිරීමෙන්ම කීර්ති ලැබියයුතුය" යනු භාවයි.
මකරධ්වජ.

ස්ථානයන්ගෙන් පෙරළා අනර්ඝාකාරයට පත්වෙන අපරට ඇතැම් ප්‍රභූන් ආලෝක මණ්ඩලයට ගෙණ උගය ලොකාරි යෙහි සිටුවාලීමේ යහපාය පරමයි හෙයින්ද, ඉඟිය ජනයා සහ බාල සමූහයාගේ විපුල ප්‍රයෝජනයට මෙම සත්චරිතය අන්‍යෙන්‍යාපකාර වන හෙයින්ද, **"ද ඔසිඝා මඝින"** නම් මෙම ග්‍රන්ථය මෙසේ සම්පාදනය කෙළෙමි.

ලක්දිව ශාසන චරිත සහ රාජ චරිත අනාගත, මහාවංශ දීප වංශ, සමන්ත පාසාදිකා අටුවා, පූජාවලී, රාජාවලී, රාජ රත්නාකර, යනාදී පොත්වලෑ සඳහන් කරුණු සාවධානයෙන් ගෙණ බැලූ කල බුඩ ශාසනයේ සහ රාජ නෙජසාදියෙන් විරසසිහියම මුල්කොට ඇතම් නරපතීන් ලඞ්කා රාජ්‍යානු ශාසනා කළ බව මනාලෙස වැටහේ.

ඉංග්‍රීසින් විසින් ජීවග්‍රාහයෙන් ගන්නාලද **ශ්‍රී වික්‍රම රාජසිංහ** රජුට එනතුරු ලක්දිව රජය කළ සියලුම රජ දරුවන් දෙකොටස් කළ කල, වැඩි පස සිරිලක ලොක ශාසනවය විනාශකයන් හැවියට ගැනේ. අඛ්‍රපසින් ලොක ශාසනවය වර්ධනයට හේතු අනන්‍ය කරුණු ඇතිවූ බව පෙනේ. නිසැකව ගැණිය හැකි කාලයක් වන විජයකල **විජය රජුගේ** පටන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලය දක්වාද, එතැන් පටන් අද මේ තත්පරය දක්වාද, රාජ නෙජසාදියෙන් විරහිත සාමාන්‍ය වැසියෙක්, මෙම ප්‍රකරණයෙන් පෙණෙන, කිසි පැකිලීමකට නොපැමිණ **"උත්තමඝන්"** කොට ආමන්ත්‍රණය කළ හැකි **ද ඔසිඝා මැනිවරුන්** මෙන් ලොකාරිසාධක කෘත්‍යයන් කරපු බවක් කිසිම ප්‍රකරණයකින් අප විසින් මේතාක් නොදක්නා ලදී.

ඈලප වේලාවකින් පරව යන ඈගාවය දත් කුසුම් හෙම් මඩු ලොල සමූහයාට ආමන්ත්‍රණය කොට ලොක සඞ්ඝයා සන්තර්පණය කරණ අවියෙන් සාදන මඩු පිණ්ඩයන්ට ප්‍රධාන වන මකරාදු ගැණීමට විධාන කරන්නාක්මෙන් මනුෂ්‍ය ජීවිතයේ නිස්සාරකම සහ පරාර්ථයෙහි අගය දත් **ද ඔසිඝා මැනිවරුන්ද,** තුදී ජනයාට ආමන්ත්‍රණයකොට වසතු පරිත්‍යාග කිරීමෙන් මොනවට ලොක සඞ්ඝයාට අනුග්‍රහ කර තිබෙන බව මෙම ප්‍රකරණයෙන් නිරවද්‍යව ඔප්පුවේ.

ලෝ මැතිවරුන් ඉක්මවා මෙසේ ලොකානුකම්පාකාරීව ධන පරිත්‍යාග කළ නිසිවෙක් සාමාන්‍ය ජනතාව අතුරේ ඇතිවුන බවක් සිංහල ඉතිහාස නසින්ද නොපෙණේ. මුඛපරවිපරාහත කථා සැරෑපයෙක්ද නොඇසුවෙමු. ඇතැම් කෙණේක්, විසින් ලක්දිව සථාපිත පැන්තළිසක්, සුළු විශ්‍රාම ශාලාවක්, විදුලියක් හැර අන්‍ය පොදු ප්‍රයෝජන වක් එකද හොඩනැගිල්ලක් නිර්ක්ෂණය නොකෙළෙමු. නමුත් **ද සොඩිසා මැතිවරු** වනාහි වෙසෙසින් ලක්වැසියා සඳහා දැඟෑමාන බොහෝ දේ කර තිබෙන බව අහසේ සරණ **ඉර සඳ තාරකා** මෙන් විදුමාන්‍ව තිබේ.

ලක්වැසි ජනතාවට සුවසේ ගමනාගමනය කරගැණීමට සහ නිරුපදුව ලෙස රථ වාහනාදිය ගෙණියාමට බොහෝ මාවත් තනවා දීමෙන්ද, එහොඩ මෙහොඩ වීමට, පාලම් හේදඹු, තනවා දීමෙන්ද, ශිලතුන්ට ආරොහණ ශාලා තනවා දීමෙන්ද, ප්‍රසූතිකාවන්ට සූතිකාගාර තනවා දීමෙන්ද, මස්න්ට ආවාස තනවා දීමෙන්ද, නිවෙස් නැත්තවුන්ට නිවෙස් තනවා දීමෙන්ද, වඳුනා මානාදිය සිඟිස බුඩසථාන සඳහා භූමිභාග දීමෙන්ද, ක්‍රිසතියානින්ට දෙවිමැදුරු තනවා දීමෙන්ද, විදුලියින් සඳහා විදුලුයන් තනවා දීමෙන්ද, මළවුන් සඳහා සුසාන භූමි තනවා දීමෙන්ද, කුසගිනි නිවුම සඳහා සෙනඟ දැනය කිරීමෙන්ද, වසා සඳහා කපුවතුවලව ආධාරකිරීමෙන්ද, රොජින් සඳහා වෙදුන් නියුක්තකරවීමෙන්ද, ශාසා සඳහා පොතපත සුලබකරවී මෙන්ද, යාචකයින් සඳහා දන්හල් විවෘතකරවීමෙන්ද, **සුබරි** තය සඳහා සඩගම ඇතිකිරීමෙන්ද, සාපිපාස වැනසුම සඳහා ඉසකොල දීමෙන්ද, ජීවිකා වෘත්තිය සඳහා රක්ෂාස්ථාන කරවීමෙන්ද, අසරණයින් සඳහා **සින් ටැම්ප්** දීමෙන්ද, නිවී තින්ට බොහෝ ධන දීමෙන්ද, කරකියා තිබෙන මහත් සුණ්‍ය කෘත්‍යයන් හැර **ද සොඩිසා** මහතුන්ගේ මූත්තනු මිත්තනියන්ගේ කාලය පවන් මේ දන්වා **ද සොඩිසා** මැති වරු දිනපත්‍ර දිනානන්‍යස දන්වා ලොකයාව දෙන දීමනා ගෑණි සතර අඟතීයෙන් දුරුව සිතුසල **ද සොඩිසා පවිල**

අමරපුරප්‍රවරයෙන් ඉගිලී එත් ලඬකා භූමි මණ්ඩලයේ රෝප ණය විගිබෙන **කලපබාහ්‍ය කලපලතා** කදම්බයකොට නැණ වත් පසට මොනවට වැටගි යනු නිසැකය.

රාජ තෙජසාදියෙන් විරල සාමාන්‍ය රට වැසියෙකුගෙන් මෙබඳු උත්තරිතර පරෝපකාර කෘත්‍යයන් සිංහල රජකාලෙන් පසු මේනාක් සිදුනුනාය යනු යථත්පිරිසෙසින් අපගේ වචන යන්ගේ සත්‍යතාව දුන් ඉතින් නුවණැත්තන්ට මනාලෙස අවබොධව ගියාඃයි සිතමු.

මේ සත්‍යය කරණකොටගෙණ මොඹයු අනාවරණ ලෙස අනාථනාථව සිට අනන්ත සත්වරිතයන්ගෙන් අනුනය කර ගිබෙන බැව් අනුස්මරණය කළ අප විසින්, වර්තමාන අනාගත සත් ජනයාගේ විපුල ප්‍රයෝජනය පිණිස කරණලද මේ යත්නය ගැණ කවර නුදීයෙක් අප හා අනුඥ නොවී සිටීද?

ඇතැම් සිංහල රාජාමාත්‍යාදී උතුමන්ගේ චරිත දක්වන මහාවංශාදිය හැර සාමාන්‍ය සත් ජනයාගේ චරිත දක්වන හෙල බසින් සුත් මහා ප්‍රකරණ මේනාක් ලක්දිව සුලබව නොමැති බැව් දනිමු. අප රට විසූ පිදියසුතු ඇතැම් උගතුන්ගේ සත්වරිත ගදූ පදූ කාව්‍යාදියකින් යන්තමක් ඇති නමුත්, ඌනාති පූරණ වශයෙන් සකස් කරණලද එකම ප්‍රකරණයකුදු දැනට නොමැත්තේය. මෑත කාලයේ විසූ කීර්තිධර ගරුකටයුතු **ජේමිස් ද අල්විස්** ශ්‍රෙෂ්ඨ නීතිඥතුමා ගේද, මොරටුවේ විසූ ප්‍රසිද්ධ න්‍යායිවරත්න **ජුලිස් ද සිල්වා** "නෙවි" තුමාගේද, ප්‍රසිද්ධවූ සහ න්‍යායිවරතවූ කීර්තිධර **සැමිස්සොන් ද ආබ්‍රෙව් විජසඟුණිරතන රාජසභා** වාසල මුදලි තුමාගේද මාතර විසූ පුණ්‍යවන්ත කුශලකාමීන් **කනිනා ද සරම් ලමාළුනින්** * ආදිකොට ශෙසු දෙනෙකුගේ චරිත විකි වශයෙන් මුද්‍රාඞ්කණයකොට ඇති නමුත්, ඇතිවියසුතු බොහෝ දෙයින් මෙකී පුඃතකද ඌනව තිබෙන බැව් හැගේ. බස්නාහිර දෙශවාසී හෙල ජනයාගේ චරිත ගැණ ලියූ පඬිවරයන් එකී

---

* "සුසිරිවත" පොත.

චරිත සංක්ෂෙපයෙන් අවසාන නොකොට ඒ සත්චරිත ගතකළ වුන්ගේ කුඩා කාලයේ පටන් සිදුවූ තොරතුරු ඉතා අපහසු වෙන් තමුන් සපයාගෙණ බොහෝදුරට ලොකයාට ප්‍රයොජන වෙන අයියෙන් ලියාතිබෙන බව මොනවට ඔප්පුවේ. තවද මෙකී චරිතයන්හි, ඒ ඒ හුදීන් කල උසස් කටයුතු මෙන්ම පහත් කටයුතුද අන්තර්ගතකොට තිබේ. ඇතම් අපරට වාසීන්වූ කලී උසස් කටයුතුම මිස පහත් කටයුතු මෙබඳු චරිතයන්හි අන්තර්ගත වෙනු දක්මට රුචි නොවේ. එය මනොඥයයි අපි නොකියමු. කරුණු කවරේදයත්, මෙලොව උපදින බොහෝ දෙනම ළදරුව, තරුණව, මහළුවන්නාක් මෙන් සුළු සුළු කෘත්‍යයන්ගෙන් මධ්‍යම ස්ථානගතව එයින් උසස් භාවයට පැමිණීම ස්වභාවධර්ම හෙයිනි.

1896 යේ මුද්‍රාංකනය කරණලද **සාර් ඒ. මූලි** නම පොත් කර්තෘවරිය විසින් ස්වර්ගස්ථ ශ්‍රීමත් අප **වික්ටෝරියා** මහා රජිනින්වහන්සේ ගැණ ලියනලද "මහා රාජිනී චරිතය" විශාල ග්‍රන්ථයක්කොට ලියා තිබේ. කොපමණ දුරට එහි විස්තරකොට ලියාතිබේද යතහොත්, ශ්‍රීමත් මහා රාඥිය උපන් තිම්රගෙයි සිහියම පවා එහි යොදා එයද විස්තරකොට තිබීමෙන් හැකිතරම් දුරට කරුණු සොයා ලොකයාට ප්‍රයොජන ගෙණදීමට විපුල පරිශ්‍රමයක් දරා තිබෙන බව වැටහේ. **නැපෝලියන් බෝනපාර්ට්, කොලම්බස්, ජෝන්සන්, ග්ලැඩ්ස්ටන්** ආදී උතුමන් ගැණ ලියනලද චරිත මහත් පොත්කොට ලියා තිබෙන බැවින් ජීවිත කථා බොහෝ කරුණු එකතුකොට ලිමෙන්ම ලෝකයා සැනැප්වීම අවශ්‍ය බව පෙණේ. ඉහතකී සිංහල ජීවිත කථා ගැණ මෙසේ සනාතකොට උවමනා කරුණු සපයා නොගෙණ ලියාතිබී මෙන් එම ජීවිත කථාවලැ අගය බොහෝ දුරට පහලවැටී තිබෙන බැව් පැහැදිලිය. කරුණු මෙසේහෙයින් **"ද සොයිසා චරිතය"** ලියන අපට ඒ මැතිවරුන් සම්බන්ධ බොහෝ කරුණු එක්කරගැණීමේ මහත් උත්සාහයක් දරන්ට සිදුවිය.

ජෝසෙප් ද සොයිසා මහත්මයා සහ එම **ශ්‍රීය මහත් මිය** ගැණද, **ජෝර්ජ් ද සොයිසා** වාසල මුදලිතුමා සහ ලමාඑතනිය ගැණද, **සූසව් ද සොයිසා** වාසල මුදලිතුමා

සහ එම **ලමාඑතනින්** ගැන්ද, කරුණු සොයා ගැනීම සඳහා පුරාණ ලියවිලි එකතුකරගැනීමටද, උඩ පාත දෙර පින් වැදගත් බොහෝදෙන ගෙන්වා ගැනීමටද, නොයෙක් තැන ඇවිදීමටද, සිදුවීමෙන් මහත් මුදලක් වියදම්කිරීමට සහ මහත් පරිශ්‍රමයක් දරන්ටද සිදුවිය. ඇතැම් කරුණු දැනගැනීම සඳහා අදහස්කළ වෘඩ ජනයා සොයා යාමෙන් අපට ලැබුන ඵලයනම්; ඇතැම් කෙනෙකුගේ මෘත ශරීර දැකීමත්, ඇතැම් කෙනෙක් මැරී වළලා සතියක්, මසක්, ආදී වශයෙන් ඇසීමත් පමණකි. දිවි ඇතිව ලැබුනාවූ ඇතම් වෘඩ ජනයාගෙන් වැඩි දෙනෙකුගේ සිහි විකලව තිබුන බැවින් කිසිවක් දැනගැනීමට ඒ වෘඩ ජනයාගෙන්ද නොහැකි විය. මෙපමණකින් අපගේ ධෛර්‍ය අඩුකර නොගෙණ නව දුරටත් යතන කරගෙණ යාමෙන් ලැබුන සිහිනුවණැති වැඩිමහල්ලන්ගෙන් මෙම චරිතයට ඇතුලත්කොට තිබෙන බොහෝ වැදගත්කරුණු නිරවද්‍ය ලෙස දැනගන්ට ලැබුනේය. **ජ්‍රෝණිස් ද සොයිසා** වාසල මුදලිතුමා සහ **ලමාඑතනින්** විසින් උඩරට වාසි වැදගත් බොහෝ පවුල්වලට කළ කී මහත් උපකාර කොටසකගේ ඇතැම් තැනක කරුණු දැන ගැනීමට මහත් උත්සාහ දැරුවේවී නමුත් එය හරිහැටි දැන ගන්ට නොලැබුන හෙයින්, එබඳු වැදගත් බොහෝ දෙය අත්හැරදමන්ටද සිදුවිය.

වර්ෂ 1900 ශේ දෙසැම්බර් මස 26 වෙනි දින මේගැණ වැඩිදුර කරුණු සෙවීම සඳහා කොළඹින් පිටත්ව උඩ රටට අපගේ පැමිණීමෙන්, මෙම ප්‍රකරණයට අවශ්‍ය බොහෝ කරුණු එකතුකරගැනීමට ලැබුනා පමණක් නොව, මේ මැතිවරුන් විසින් කරවනලද, වැව් අමුණු සහ ගොඩනැගිලි මාවත් දැකීමෙන්ද විපුල ප්‍රීතියට පත්වීමු. මයිලපිටියේ සිට හගුරන්කෙත දක්වා තනවා තිබෙන මාවත අපගේ දැශිත පථයට වන්කල, අපට සිහිගියේ **ජ්‍රෝණිස් ද සොයිසා** මුදලි මහත්‍රීශ්වරයානන්ගේ නාමයෙන් **ද සොයිසා පවුලට** ගෞරවකිරීමට මහා බල පරාක්‍රමයෙන් යුත් කරුණා සම්භාරයෙන් පරිපූර්ණ සුභාවිතාර රත්නාකරණ ලක්ෂණ **මහා රාජෝත්තමයෙක්** හෝ **මහා රාජිනියක්ම** ප්‍රමාණ

බවය. ඒ සෙසේවීහමුත් මහත් පුණ්‍ය බලයෙන් ජනිත රශ්මිමාලා සුවිලකින් මේ දෙදෙන ආලෝක වීමෙන් ඔහුදේ පුණ්‍යවූ වෙට බොහෝ කරුණු මෙම ප්‍රකරණය කියවීමෙන් හැගියන්.

මෙකී පුරාණ රශ්මිමාලා නොම මේකාක් නොනැසි පවතින බැව් **ද සොඹිසා දාෂ්ටිවිශේෂන්** සහ පුත්‍ර මහත්වරුන්ගෙන් ඔප්පුවෙත්. සද හිරු පවලේ දුරක ලක්‍ෂණ නාරකා රූප කිසි කලෙකත් පෘථිවිය ආශ්‍රයකරන්ට අදහස් නොකොට ඉතා සමීපයෙන් ආකාශ තලයේම ගමන්කර අලුකරන්නාක් මෙන් **ද සොඹිසා** පවලේ පුත්‍ර මහත්වරුන් අධිමී මානීයන්හි නොබැස වැඩිමහල් ද සොඹිසා මැතිවරු ගමන්කළ ධම් මාර්ගයන්හිම ඉතා සමීපයෙන් ගමන්කිරීමෙන් පරිචිතවූ ලෝකොපකාරම කරත්ථසි අපගේ බලවත් විශ්වාසයක්.

මෙම ප්‍රකරණයට අන්තර්ගතව තිබෙන අනිශයින් සැල කියයුතු ඉතා වැදගත් කරුණු මෙතෙකින්තල කල උසස් තනතුරු ආදිය ප්‍රාර්තනා නොකොට මෙකී සත් වර්ෂ කල නම්ුන්, **ද සොඹිසා** පමිලව ඔස් තිසුපුද ආදිසකින් නොව, රන් රිදී මුතු මැණික් ආදියකිතුන් නොව, උතුන යෙෂ්‍යාදියකිතුන් නොව, ගරු උසස් තනතුරු ආදි සඛ්‍රහයන්ගෙන්ම කල ගුණ සැලකීම කටයුතු බව නිසැකවම මොනවට ඔප්පුවේ. අප ආණ්ඩුකල නෛසර්ගික් විරාජමාන පුණ්‍යයෙන්ත බදු **මහා රාජිස** විසින් **"මහාසම්මි"** නාමයෙන් **ද සොඹිසා මැනිෂ්ෂව** සඛ්‍රහකරගතිබීමද, **ජේ. ඩබ්ලිව්. ඔ. ද සොඹිසා** අභිධාන ජෙෂ්ඨ පුත්‍රයානය **මහාඤ්ඤිනින්** වහන්සේ වෙනුවෙන් ත්‍රිසා කල **ලඬකාණ්ඩුව** විසින් **සාමදූන විනිශ්චය්කාර** ධුරයට සහ **වාසල** මුදලි ධුරයට පත්කර සිටීම ලාඬකික ජනතාවට වික සැනසිල්ලක් බව ශ්‍රීමත් සත්වෙනි **ඇඩ්වර්ඩ්** අප මහා රාජෙන්ත්‍රවයානන් වහන්සේ ප්‍රධානකොට ඇති ලඬාණ්ඩුවට සකුති පුරසරකොට දන්වා සිටිමු. නමුත් **ද සොසිසා** පවලෙන් දැනුදු සතියක් තුල තරණ පරෝපකාරයන්ගෙන් දශයට බෙදු පඬුවක්වත් නොකළ, කිරීමට නොපොහොසත් ඇතැම් මතකුන් **වාසල** මුදලිතම්වලට සහ සාමදූන විනිශ්චය කාරධුරවලට පත්ව සිටින බැව් හොඳකාර අවිදු දනිමු.

ලොකයාගේ ප්‍රයෝජනය පිණිස රූපියල් ලක්ෂගණන් වියදම්කොට ආණ්ඩුවට පරිත්‍යාගකර තිබෙන ලක්හා මිපයේ බැලුබැලු දිශාවන්හි ලෙලදෙන කොත්කැරලිවලින් යුත්ත විශාල බොඩනැගිලි රාශිය කළාවූද, රූපියල් ලක්ෂගණන් අහසා උදහස, ක්ෂේත්‍රාදිය ලොකයාට ප්‍රයෝජන ගැන්මට පිණිව හැරතිබෙන්නාවූද, රූපියල් ලක්ෂගණන් වියදම්කොට ලොක යාගේ ප්‍රයෝජන සලකා මාවත්, පාලම්, ඡේදවූ ආදිය තනවා ආණ්ඩුවට පරිත්‍යාගකර තිබෙන්නාවූද, රූපියල් ලක්ෂ ගණන් පිදීමෙන් සහ රූපියල් ලක්ෂගණන් වියදම්කිරීමෙන් මහා ශාස්ත්‍රාගාරා තනවා දීමෙන්ද, වෙසෙසින් ලාඕකික දුශ්න්ට පිහිටන **"රජවරුෂ, ඔබුවරුෂ"** යන ශබ්දව යෙන් ප්‍රකටව වසන්නාවූද, දැනට **ද සොයිසා සම්මේල්** ප්‍රධානියා කොට ගැනෙන **ඡේ. ඩබ්ලිව්. ඕ. ද සොයිසා** මැතිවරයාට ලබ්කාණ්ඩුව මගින් කරතිබෙන ගෞරව චිහ්ණ, ත්‍රිහුණ කිරීමට මේ ප්‍රකරණය මහොපකාරවෙයයිද විශ්වාස කරමු.

නවද චිපින්චිට ලබ්කාවට පැමිණි ඇගම් ලබ්කෙශ්වර සින්නේ සමහර වැරදි අදහස් කරණකොටගෙණ මෙම උතුම් පවුලේ නෙවෙනියාවන **මාලීස් හැන්ඩි ද සොයිසා** සාමදුන චිනිශ්චයකාරතුමාට දිසයුතු ගෞරවයන්ට බාධා පැමිණේව බව ලක්දිව ප්‍රකට ඉංග්‍රීසි පුවත් පත් මගින් දැනගන්ව ලැබී තිබේ. එකී වැරදි අදහස් නැමති කිළිටි ජවනිකාවෙන් මෙපමණකල් වැසී සිටි එකී ආණ්ඩුකාරයන් සහ වෙසෙසින් ශ්‍රීමත් සත්වෙනි **ඇඩිවර්ඩ්** මහා රජෝත්තමයාගෙන් වහන්සේ ප්‍රධාන රජ පවිල ඇතුළුව මහා මන්ත්‍රී ගණයාද, එඩිහලන්ත ආණ්ඩුවේ උසස් පහත් නිලධාරිහුද, කාත්‍යාලික අප ලබ්කාණ්ඩු කාර උතුමාද, මෙතුමා ඇවෑමෙන් ලක්දිව ලබ්කෙශ්වර බුරයට චිපින්චිට පැමිණෙන උතුමන්ටද, එකී කිළිටි ජවනිකාව දවාහැර ඇතිසැටි දැනගැන්මෙන් ද **සොයිසා** පවිල සමඟ විපුල ප්‍රීතියට පත්වීමට මෙම ප්‍රකරණය දුන් ඉතින් පිළිසරණ වේයයි සලකමිහ.

ලබ්කාවිය වාසි සිංහල වගියා ආඩම්බර වියයුතු ආකාර අප්‍රමාණ යහපත කළාවූද, කරන්නාවූද, **ද සොයිසා** පවිලේ අභිවෘධිය සහ ගෞරවය සවිප්‍රකාරයෙන් ප්‍රාර්ථනා කරන්නාවූ,

ඉසි සිත් නොමැති සත්පුරුෂ ලක්ෂණ වාසි මුලු සිංහල ජනතාව මෙලෝ පරලෝ ප්‍රයෝජන පිණිස අනන්ත කරුණු අත්හදිහ මෙම ප්‍රකරණය සාවධානයෙන් කියවා තේරුම් ගන්නැල අප විසින් මෙ සඳහා කර තිබෙන යතනය හැම් තුළාබර වශයෙන් කිරාගත හැකිව, විපුල ප්‍රීතියට පත් වෙනු ඇතැයි සලකමු.

උත්තම, මධ්‍යම, අධම යන ශබ්දනුයෙන් ක්‍රියාව කරණ කොටගෙන්ම එකම මනුෂ්‍ය වර්ගයා නෙපසට බෙදී යන බව ඒකාන්ත සත්‍යයකි. මෙම එකම මනුෂ්‍යවර්ගයා අතුරෙන් කෙණෙක් පින් සඳහා වසා කැබෙල්ලක් දීමෙන්ද, කෙණෙක් බතුලුවක් දීමෙන්ද, කෙණෙක් පොල් ගෙඩියක් දීමෙන්ද, කුශලක්‍රියා කෙරේනම්, ඒ සඟපත් මනුෂ්‍යයන්ට ඒ ඒ ප්‍රමාණ සතුති ප්‍රශංසා ගෞරව කිරීම අවශ්‍යය මනුෂ්‍යයන්ගේ යුතු කමකි. කිසිවෙක් පින් සඳහා හැමදේ වැඩිවත් දේනම් එබඳු සත්පුරුෂයා මහත්සේ සතුති ප්‍රශංසා ගෞරව ලැබිය යුත්තෙක් බව නියතය. මේ නයින් ද **සොයිසා** පවිල ලෝ වැසියන්ට අභිමත සකල දෙයින්ම ආධාරකර තිබෙන හෙයින් අපගේ උතුම් ආණ්ඩුවෙන් සහ මුලුලඟ ඇති සත්පුරුෂ සකල ජනයාගෙන්ද අනිශය ගෞරව ප්‍රශංසා ලැබිය යුතු බව සත්පුරුෂ කාට නොවැටහේද? ඒහෙයින් ඉසි සිත් සහ අධම අනවිකාරී අත්තානොමත වඩ්ඪංශනයකොට ගරුකට යුත්තන්ට ගරුකිරීමෙන් ලැබෙන මහත් ඵලයට සකල පුදිසු මෙම ප්‍රකරණය හජනයකිරීමෙන් පැමිණෙත්වා යනු ප්‍රාර්තනා කරමහ.

මෙම ප්‍රසාවනාවේ මුලින් සඳහන්කරණලද කාරණා රාශිය මුල්කොට අත්තානොමතයෙන් විරහිතව අප විසින් ලියනලද මෙම ප්‍රකරණය උගතුන් රැවි කරණ අපියෙන් සහ ලොකාරිය සිදුකරණ අපියෙන් බොහෝ පරික්ෂාවෙන් ලියනලද නමුත්, ප්‍රමාද භ්‍රමාදියෙන් සිදුවන යම් යම් වරද මෙකි විද්‍යමාන නොවේයයි නොකියමු. එසේද වුවත් සාගරාම්බු පානයෙකි ලොල්වූ මහා මෙඝතෙම කිසි කලෙකත් කලල් දියෙකි නොබසින්නාක් මෙන් ඉවබඳ ලොකෘ ප්‍රකරණයන්හි

රූපිවූ වරපණ්ඩිත තෙම එසේ ඇතිවූ සුළු වරදෙකිදු, නොබස්නා බැව් දැක්ම, අපගේ ධෛර්යයට වැදගත් කරුණකි. එසේදවුවත් වසූනවෘක්ෂ බුලයන්ගේ පවා පණිණ්කා ගැටෙන්නාක් මෙන් මෙබඳු ප්‍රකරණයන් ගැණද රහිතා කරන්නවුන් ඇතිවීම සාමාන්‍ය ධර්මයෙකි. සඳ මුල් පණිණ්කා වන්හෙන් කොපමණ වසාගත් නමුත් එහි විද්‍යමාන සුගන්ධයට කිසිම බාධාවක් නොමැති හෙයින් අපගේ උත්සාහයවද බාධා ඇතැයි නොසිතමු.

"සතව් තු වා නිංදතු වා පණ්ඩජජන
සතතයතු කිං සත්‍යන් මම කොවිදෙජනා
ප්‍රමාණමස්මින් දයතෙ ව යඃ පරාන්
ශ්‍රමව ජානාති කෘතෙෆ තථෙදෘශි"

යන විවක්ෂණෝප දෙශයෙන් දක්වන ඵබඳු රහ්‍යාවනතයා වත්, ඔහුගේ නින්ද ප්‍රශංසාවයවත් මෙහේවූ තැන පමණ නොව මෙයාකාර ප්‍රකරණයන්හි පමණ දන්නාහුනම්, මෙබඳු ප්‍රකරණ ලිවීමෙහි තත්වයද, වෙහෙසද, දන්නාවූ ලොකාභි සිධිකාමී කුළුඤ්ඤ ගුණයෙන්සාර පණ්ඩරයෝමය, මෙයින් අඳ මෙබඳු තන්හි මෙම වරෙපදෙශයම හජනය කරමිහ.

විවජජන නිලකාහරණ ශ්‍රී කාලිදාස මහා කවිතු "රඝු වංශ" නම් මහා කාව්‍යාරම්භයෙහිදී මෙසේ ප්‍රකාශකෙරේ:—

"මන්දඃ කවියශඃ ප්‍රාර්ථි ගමිෂ්‍යාම්‍යුප හසතාම්
ප්‍රාංශු ලභ්‍යෙ ඵලෙ ලොභා දුදබාහුරිව වාමනඃ"

පණ්ඩිතයන්ගේ (කාව්‍ය නිර්මානයෙන් ජනින) යශස් පතන සුලුවූ, අප්‍රාඥවූ මම, උස් මිනිසකු විසින් ලැබිය හැකුවූ ඵල යෙහි ලොභයෙන් බිමවනලද අත් ඇති මිටි මිනිසකු මෙන් සිනාහසියහැකු බවට පැමිණෙන්නෙමි" යනුය.

මෙසේවූතැන අපවැන්නන් විසින් කරණලද මෙබඳු ප්‍රකරණයන්හි විද්‍යමානවන ගුණ දෙස් ගැණ කවර කථාද? කරුණු මෙසේ හෙයින් මෙහි විද්‍යමාන යම්කිසි දෙෂාදියක් ඇතිවේනම් එය දිය බැහැරකොට ක්ෂීර පාණය කරණ රාජ හංස ලක්ෂණයෙන් පණ්ඩරහු මෙහි රසයම පානය කරත්වා!

තවද මේම ප්‍රකරණය මෙසේ පූරණ කරගැණීමට දුෂ්කරවූ බොහෝ කරුණු දහසකැණීමට උපකාරවූ උඩ පාත රට චාසි ද සොයිසා මැතිවරු ඇසුරුකළ ගිහි පැවිදි ශ්‍රීමතුන්ටද, මේ ගැන් ඇහැම් ලියවිලි සහ කාරණා සපයා දුන් ද සොයිසා මැතිවරුන්ගේ ඇහැම් මුනි මිත්‍ර මහතුන්ටද, වෙසෙසින් කථාශෛශභාවොපගත ජොතීඃශාස්ත්‍රාඥ හැන්නැදිගේ දුනියෙල් ප්‍රනාන්දු, වීරහැන්නැදිගේ අන්තෝනි ප්‍රනාන්දු යන මිහතුන්ගේ නාමයන්ටද, වරුසහැන්නැදිගේ හැන්රි ජ්‍රෝණිස් සොයිසා මහතානන්ට සහ තවත් මෙසමාඛිව අපට උපකාරවූ උඩ පහත දෙරට චාසි ගිහි පැවිදි උතුමන්ටද, දේවගැති උතුමන්වද, ආණ්ඩුවේ මුද්‍රාඛ්‍යක ශාලාවේ ප්‍රධානතැන්පත් ජී. ජේ. ඒ. සකින් මහතාවද, එච්. සී. කොටල් මහතාට සහ ජේම්ස් පොන්සේනා අගයකුණවිමින ජයතිලක කරුණාරත්නා මුදලි තුමවද අපගේ තිසුවිදීම මෙහිදී මහකනැති නොකරමු.

මෙහැර 457 වෙනි පිටේ පෙණෙන දරු දෙන්නා වෙතුවට තුන්දෙනා වියසුතු බැවිද, 402 වෙනි පිටේ සඳහන් ඔගීස්ට මිහමුදලිනුමගේනාමය "කොණරඩ් පීටර් දියස් බණ්ඩාරනායක" වියසුතු බවද, මෙහි අවසානයට යොදූ තිබෙන සිතියම් සුදුසු කැන්වලට යෙදීමට කලට වෙලාවට සපයාගැණීමට නොලැබුනහෙයින් අගට යොදන්ට සිදුවූ බවද දන්වමු.

තවද "ඔබසර්වර්" "ඇක්හැමිනර්" "වසිමිස්" යන ඉංග්‍රීසි ප්‍රසිඛ පත්‍රවලින්ද, ලක්ඛිවිකිරණ, ලඩ්කානිඩානය, ලක්මිණි පහණ, ඡුනාවිප්‍රදීපය, දිනකරප්‍රකාශය, සරසවි සඳරැස ආදි සිංහල ප්‍රසිඛ පත්‍රවලින්ද මේ සම්බඛි යම් යම් කරුණු උපුටාගැණීමට ලැබුන බව එහි උගත් කතෘ මැතිවරුන්ට සතුති පිදීමෙන් මෙහි සඳහන් කරමහ.

ද සොයිසා චරිතය නම් මෙම ග්‍රන්ථයේ සියලුම අයිති වාසිකම ද සොයිසා පවිලේ පුත්‍ර මහතුන්ට පිදුව බව සියලු දෙනා වසින් සලකනු ලබත්වා.

ඩී. එච්. ඒ. ද සොයිසා මැතිතුමාගේ නාමය දරණ "ඩී. එච්. ඒ. ද සොයිසා" යනු සඳහන් ඔනසණ්ඩාන මුද්‍රය නොවෑති මේම ග්‍රන්ථයක් කිසිවෙක් වෙත හිබී අසුවූයේනම් නඩුවඟට පවුරුවන බවද දනසුනුසි.

ඕ. දෙන් ඛස්නිඔන්,
ග්‍රන්ථ කතෘ.

1904 ක්වූ ජනවාරි මස
කොළඹදිස.

මෙම ප්‍රකරණයේ
පිටු කීපයක් මුද්‍රාඛණ්ඩයකොට ඇතැම් ගරුතරවූ උගත්
උතුමන්ගේ අදහස් උදහස් දැනගැනීම් සඳහා
දැක්වූකල අපට ලැබුන සහතිකපත්‍ර
මේට අන්තාගත කෙරෙමු.

සාක්ෂි පත්‍රය.

සී. දෙන් බැහියන් දිනපතා සිංහල ප්‍රවෘත්ති කතිකා තැන විසින් සඛ්‍රහ කරණලද ද සොසිසා චරිත නමවූ පොතේ මුද්‍රිත භාගය එම කතිකා මහත්මයා විසින් දක්වන ලදින් අවලොකනය කෙලෙමි.

මේ පොත නම්, ඉකුත්වූ චලිලිස් හැන්රි ද සොසිසා සාමදූන විනිශ්චයකාර මහතුන්ගේ සවරිත කථාව හා එතුමාගේ පරම්පරා වර්ණනාවෙන් යුක්ත මහා සඛ්‍රහවකි. මෙහි ගුණවර්ණනා කටයුත්තාන්ගේ ගුණ කීර්තනයද, ඉහ ලොකාභිවෘඛිකාමින් විසින් ගතයුතු උපදෙශක කථාදියද මනාකොට සඛ්‍රහ කරණලද බැව් හැඟේ. මෙහි සඳහන් කරණලද සාමදූන විනිශ්චයකාර මැතිතුමා මෙසේ ප්‍රකරණාරූඪ කටයුතු පරාර්ථ සාධක ගුණවතෙක් බවද දනිමි. මේ සඛ්‍රහවද සාමාන්‍ය ඥදෙශිකයන්ගේ ස්වභාවබොධයට යොග්‍ය ලෙස වාක්‍ය යොජනාවෙන් යුක්තයි.

(අත්සන්කළේ) ත්‍රිපිටකවාග්ඡාරචාර්‍ය
ශ්‍රී සුමඞ්ගල යොලඹ නවසෝරලාදිඅෙයි
ප්‍රධාන නායක ස්ථවිර.

1901 අප්‍රේල් 6 වෙනි දින කොළඹ මාලිගාකන්දේදිය. H. SUMANGALA.

1901 අප්‍රයෙල් මස 2 වෙනි දින
කළුතර පුලිනතලාරාමයේදිය.

දී සොසිසා චරිතය නම් ප්‍රකරණය මම හොඳකාර කියවා බැලිමි. එය මුද්‍රණයකරවා ලොකයා අතට දීමෙන් මහත් වැඩ සිදුවිය හැකිවේ. දූනට හැදෙන උතුමන් විසින්ද උභයලොකාර්දියක කටයුතුකිරීමට මෙය සිත් උනන්දුකරවන පොතකි. ලාඞ්ඛික ජනයාට පමණක් නොව පාරදේශික ජනයාටපවා ප්‍රයෝජනවත් වැඩ කළ උතුමෙකුගේ චරිතය මහජනයා අතට දීමෙන් එබදු දේ අනෘයන් විසින්ද කිරීමට

සිත් ධෛර්යවෙනු නිසැකය. නවද මෙය භාෂාරීතිය උල්ලං ඝනය නොකොට කාවත් තේරුම්යන පරිද්දෙන් කඳිමට ලියාතිබෙන බැව් පෙනේ. ලොකාවිදුයක මෙම පොත සම්පාදනය කළ සි. දෙන් බස්තියන් මහතාද ලංකාවේ බොහෝ දෙනා හොඳකාර දන්නා අදුනන දුනට දිනපතා ප්‍රවෘත්ති පත්‍රයේ කතා සහ අසිනිකාර උගත් මහතෙක් බැව් කීමට කැමැත්තෙමි. ලුහුබින්ම මේ විශාල පොත ගැණ අප සිතට මහත් ප්‍රීතියක් උපන් බවත් මෙබඳු සත්‍යතත්‍ය ගැණ හැකිතරම් අනුබලදීමට කැමති බවත් සඳහන්කිරීමට කැමැත්තෙමි.

(අත්සන්කළේ) **වැලිගම ශ්‍රී සුමඟල නාඹක**
ඇත්තර වම්හ.

———:o:———

1901 අප්‍රේල් මස 2 වෙනි දින
වස්කඩුවේ අභිනවාරාමයේදිය.

ලඞ්කාවේ ඉතා ධනවතෙක්ව විසූ චාර්ලිස් හෙන්රි ද් සොයිසා සාමිදුන විනිශ්චයකාරතුමාගේ ජීවිත කථාව අන්ත රීතියෙන්ට සි. දෙන් බස්තියන් මහතා විසින් සම්පාදනය කරණලද "ද සොයිසා චරිතය" නම් විශාල පොත මවද කියවීමට ලැබී ඉතා සතුටුවිමි. ලඞ්කාවේ හැදෙන බාල පරම්පරාව විසින් මේ පොත කියවීමෙන් උභයලොකාවිදුයක සුවසුතුකිරීමට මහත් ධෛර්ය ලැබේ. එබැවින් මේ පොත මහත් ලොකාවිදුයක උතුම් ප්‍රයත්නයක් බැව් හැනියයි.

මේය සම්පාදනය කළ සි. දෙන් බස්තියන් මහතා කුඩා කාලයේ පටන් මම හොඳකාර දන්නා නොයෙක් ප්‍රකාශවලදී මිනෙන්ද ගුරුකම් ලැබූ යහපත් උගත් මහතෙකි. ලඞ්කාවේ බොහෝදෙනාගෙන්ද ආදර බුහුමන් ලබන්නෙකි.

(අත්සන්කළේ) **වස්කඩුවේ සුගුනි නාඹක උන්නාන්සේ.**
W. SUBHUTI.

———:o:———

4—4—01.—පෑලියගොඩදිය.

මෙකී ලබ දිනපතා සිංහල ප්‍රවෘත්ති පත්‍රයෙහි කතිකුත සි. දෙන් බස්තියන් මහත්මයා විසින් සඞ්ගහ කරනලද "ද සොයිසා චරිතය" නමැති ප්‍රකරණයේ මුද්‍රිතභාගය ග්‍රන්ථ කර්තෘ විසින් අපට දක්වනලදුව එහි ප්‍රතිපාදනය සඳහා අපිද ප්‍රීතිමත්වම්.

මේ ප්‍රකරණයෙන් වර්ණනා කරනු ලබන ලෝකාර්කාරී සත්පුරුෂ මහත්ශ්වරයාණන් (සංගීර්යවූ ද සොසිසා සාමිදුන වීනිශ්චයකාරතුමා) ජීවත්ව සිටියදීම ඒ මහතාගේ ගුණ සම්පත්තිය අපටද ප්‍රත්‍යක්‍ෂව පැවැත්තේය. ද සොසිසා පෙළපත අඟිවෘඹියට පත්වූ තැන් පටන් ක්‍රමක්‍රමයෙන් ලෝවැඩ වැඩි මෙහි එම පරම්පරාව නිරතුරු යෙදී සිටිනබව ලොකප්‍රසිඛ කරුණකි. එවැනි සත්පුරුෂ මහතෙකුගේ චරිතය ලොකයාට හඳුන්වාදීමද කෘතඥතාවයට ඇතුලත් ප්‍රශංසනීය ගුණ ධර්මයකි. මේස්හෙයින් මෙවැනි ප්‍රයත්න ගැන අපේ සතුට සප්‍රකාශකරමු.

(අත්සන්කළේ) පෑලියගොඩ විද්‍යාලඩ්කාර පරිවෙණාධිපති
රත්මලානේ ඛේමාභිධාන ශ්‍රීධර්මාරාම
කොළඹ හලාවත දෙදිගාවේ ප්‍රධානනායකස්ථවිර.
Dharma Kirtti Sri Dharmarama.

———:o:———

"ඒ සොසිසා චරිතය" නම් පොතේ පළමුවෙනි පිටු පණස (50) ප්‍රවේශමෙන් කියවා බැලුවෙමි. සම්මෘදන නඩුකාර ධූරයක් ඉසුලූ කාලයාගාකල චාර්ලස් හැන්රි ද සොසිසා මහතාගේ පිතාවූ ජොරෝණිස ද සොසිසා රජවාසල මුදලිතුමාගේ පිය මුතුන් පරම්පරාව ගැණ සහ එතුමා විසින් කරණලද පරෝපකාර වැඩ ගැණද මෙහි කරුණු අනතගීතවී තිබේ. ඉහතකී මහත්වරු දෙදෙනාගෙන් දෙවනුකී මහතා මා දුන ඇදින ගණ සිවි බැවින්, මවිසින් කියවනලද පිටුවල අනතගීත කාරණවල සත්‍යතාවය ගැණ මට සහතික කළ හැකි බව කියමි. එහි කියවීමට යෝග්‍ය, මතු පැමිණෙන පරම්පරාවට ප්‍රයෝජනවත් බොහෝ කරුණු අඩංගුවිනිබේ. භාෂාවද පිරිසිදුය, අලඩ්කාරය, ව්‍යාකරණානුකූලය, භාෂාරීත්‍යානුකූලය, මවිසින් කියවනලද පිටුවල අන්දමට මේ පොතේ ඉතුරුඟරියත් සකස් කරණු ලද්දේවීනමද, ඉතුරුඟරියේදී වාර්ලස් ද සොසිසා මහතානන්ගේ ජීවිත කථානන්තරය හරියාකාර දක්වනලද්දේවීනමද, කවත් වැඩිදුරටත්, මේ පොත කොයි ආගමකවත් කුලයකවත් කෙණෙකුට වේදනා නොවෙන පරිද්දෙන් සකස් කරණුලද්දේවීනමද, එය කවුරුත් ආසාවෙන් කියවනවාත්

ඇර, සාමාන්‍ය ජනතාවට ඉතා ප්‍රයෝජනවත් පොතක් වෙන බවත් ශංකා රහිතව කිසහැකිය.

(අත්සන්කළේ) ඩී. ගුණසේකර,
ආණ්ඩුවේ ප්‍රධාන භාෂා පරිවර්තනික
ධුරන්ධර වාසල මුදලිතැන.

1901 අප්‍රේල් මස 6 දින කොළඹදිය.

———:o:———

1901 අප්‍රේල් මස 6 දින කොළඹදිය.

සිංහල දිනපතා ප්‍රවෘත්ති පත්‍රයේ කතෘ ධුරන්ධර, සී. දෙන් බස්තියන් මහත්මයා, ලඬකාවේ පරෝපකාර වැඩවල කරවේම සෙදී සිටී උතුමෙක්වූ, පරලොකප්‍රාප්ත චාර්ලස් හැන්රි ද සොසිසා මහතාගේ ජීවිත කථාන්තරය ලිවීමෙ වැඩෙහි දැනට සෙදී සිටියි. මට දකින්ට ලැබුණු තරමට ඒ වැඩේ ඉතා හොඳට කරතිබෙ. තවද දෙන් බස්තියන් මහත්මයාව ඒ ගැන ධෛර්‍යදීම සුදු බව කියමි.

(අත්සන්කළේ) ඝඨිමන් ද සිල්වා,
ප්‍රසිඛ ඉහැන්විම දෙපාතීමේන්තුවේ මුදලිතැන.

———:o:———

පලමුවෙන්ම ලඬකාවේ දිනපතා සිංහලෙන් පලකරණ ලද ප්‍රවෘත්ති පත්‍රයේ අයිතිකාර සහ කතෘධුරයද, වෙනත් නොයෙක් ප්‍රසිඛකරණලද ප්‍රයෝජනවත් ග්‍රන්ථවල කතෘධුරයද, සී. දෙන් බස්තියන් මහත්මයා දරණ බව කීමට ප්‍රීති ඇත්තෙමි. ඒ මහතා ප්‍රකටවූ ප්‍රසිඛ කථාකාරයෙක්වා සහ, ප්‍රසිඛ කරණලද ග්‍රන්ථවල ආඛාරයෙන්ද, කීප අවුරුද්දක් පැවැත්වූ වැවූ, රාත්‍රි පින් සෙක්ලයක් පිහිටවීමෙන්ද, ශාස්ත්‍රාභිවෘඞි සමිතියට පිහිටවීමෙන්ද, මහජනයාට බොහෝ වැඩ කරදී තිබෙන හෙයිනි. "ද සොසිසා චරිතය" නම් පොතක් ඒ මහතා විසින් ලියනලදුව දැන් එය මුද්‍රාඞ්කණය කරගෙණයයි. එය ඉතා ප්‍රයෝජනවත්, උගතමනා දේ අනාගත, ව්‍යඤ්ජන කාව්‍යයෙන් කරණලද්දක් බව මගේ විශ්වාසයයි. මෙබඳු වැඩක් කිරීමට ඒ මහතා සඵපුණ්‍යයෙන්ම ප්‍රමාණවේ. තවද මම උන්නැහෙගේ අභිවෘඞිය පතමි.

(අත්සන්කළේ) ජී. මැන්දිස් ගුණසේකර,
"රිජිස්ට්‍රාර් ජනරල්" දෙපාතීමේන්තුවේ මුදලිතැන.

1901 අප්‍රේල් මස 6 දින කොළඹදිය.

PREFACE.

ප්‍ර ස්තා ව නා ව.

PREFACE.

———:o:———

HIS work, entitled "De Soysa Charitaya" (Biography of De Soysa), was undertaken with a two-fold object : on the one hand, to pay respect to Mr. De Soysa's memory, and on the other, to so preserve his memory that it might tend to win and incite others to imitation of what an estimable man's life presents.

I have endeavoured, at some length, to present to the public a few of the many beneficent acts of the De Soysa family, for which it stands unparalleled in the annals of local munificence. What better testimony can, indeed, be adduced of the judicious expenditure of a family's wealth than that afforded in the construction of roads and bridges for the public benefit ; the providing of hospitals, lying-in-wards for women, resthouses and ambalams for travellers, almshouses for the indigent, homes for the homeless, churches for public worship, schools and colleges for the advancement of education, and burial grounds for villages ; the presentation of lands to Buddhist temples, and fields to those who lack the means of livelihood ; the encouragement of literature ; the promotion of industry and agriculture ; the giving of employment to the unemployed ; the granting of charitable allowances, &c., for all of which, and many other unrecorded acts of kindness, the De Soysa family stands deservedly conspicuous and pre-eminent.

In delineating the life of the late Mr. C. H. De Soysa, J.P., the subject of this Memoir, I have attempted to make it fuller and more complete than would perhaps have been done by the average Sinhalese biographer. It is to be

regretted that, except in the "Mahawansa" and other national histories, which give accounts of kings and their ministers, there are scarcely any Sinhalese works containing biographies of less highly-placed individuals. Of learned men of renown we have many imperfect and fragmentary records, scattered in prose and verse, but not one complete account. Even the biographies of modern celebrities, such as Advocate James De Alwis, Chevalier Jusey De Silva, Gate Mudaliyar Sampson Rajapaksa, Mrs. Catrina De Saram Lamaetani, &c., are defective and brief, while works of this nature among Western nations are usually full and complete. Such records should, we consider, commemorate events connected with a person both in his prosperity and adversity. But the people of this country have an aversion to anything being published which does not entirely redound to the honour of the individual concerned. This seems hardly fair, for man has to pass an insignificant stage of life before attaining eminence, just as a child has to pass its youth before reaching middle age.

Sarah A. Tooley, in her biography of Queen Victoria, published in 1896, gives such details as a minute description of the accouchement room of Her Majesty, illustrating it by an engraving, and the lives of Napoleon Bonaparte, Columbus, Johnson, Gladstone, and other great men are voluminous. The public are always interested in details, and therefore I have collected and embodied in this work much apparently trivial and minute information regarding the De Soysa family.

Owing to the necessity of consulting ancient documents, I have been at considerable pains to gather the information relating to Mr. and Mrs. Joseph De Soysa, Gate Mudaliyar and Mrs. Jeronis De Soysa, and Gate Mudaliyar and Mrs. Susew De Soysa. I visited many persons who knew them in the mountain country as well as in the low country. The results of some of my journeys were disappointing; in several cases I was only in time to hear of the death of my expected informant; in others they were so old and

decrepit as to be unable to recall the desired events. But my efforts were not altogether in vain, as the information embodied in this work will testify. It is however to be regretted that some of the beneficent acts of Mudaliyar and Mrs. Jeronis De Soysa towards many respectable Kandyan families, which I have not been able to ascertain correctly, must be left unrecorded. My visit to the mountain country in December, 1900, was, I am happy to say, most successful, inasmuch as it enabled me to see for myself some of the tanks, embankments, buildings, and roads constructed by Jeronis De Soysa, Mudaliyar, which fully convinced me that the De Soysa family could only be adequately honoured by their sovereign. And it is abundantly evident from the public life and munificence of Lady De Soysa and her sons that the spirit of their predecessors still influences them to a very high and honourable degree.

Considering the many munificent acts of the De Soysa family towards the public, and the extent to which its members have assisted the poor in Ceylon, not to speak of liberal donations and contributions towards Government objects, one might well doubt the adequacy of the recognition which they have received, the title of "Lady" conferred on Mrs. De Soysa by Her late Majesty Queen Victoria, and the rank of Gate Mudaliyar and Justice of the Peace bestowed on her eldest son by the local Government, to the contrary notwithstanding. It will nowhere be denied, I think, that such services justly merit greater and more lasting recognition, as it is a question whether, from the time of King Wijayo up to the present, there have been any other private benefactors in this Island who can be compared to the members of this respected family.

It has been my endeavour to complete this Biography in a manner acceptable to the different communities of Ceylon, and I trust that I have been successful in this

direction. It is hoped that those competent to appreciate the work will direct their attention more to its aims and endeavours, and the benefits to be derived therefrom, than to its shortcomings and imperfections.

My thanks are due to a number of Buddhist Priests and laymen in both the up and low countries, who, from their association with the De Soysas, were in a position to furnish me with valuable information otherwise difficult to obtain, and to the relations and friends of the family (Mr. W. Henry Jeronis Soysa and the late Messrs. H. Daniel Fernando and W. Anthoney Fernando deserving special mention) who favoured me with documents and other information. Nor can I omit to express my thanks to Messrs. G. J. A. Skeen and H. C. Cottle of the Government Printing Office, both of whom rendered valuable help; and to Mr. James Fonseka, Mudaliyar, of the same office. I am also indebted to several Christian Ministers, who gave me whatever assistance lay in their power.

Grateful mention must also be made of the English newspapers, the "Ceylon Observer," the "Ceylon Examiner," and the "Times of Ceylon," and of the Sinhalese papers, the "Lakrivikirana," the "Lankanidhanaya," the "Lakminipahana," the "Jnanarthapradipaya," the "Dinakaraprakasa," the "Sarasavisandaresa," &c., from all of which I have made suitable extracts.

In conclusion, I beg to announce that I have presented the copyright of this work to the sons of the De Soysa family.

C. DON BASTIAN.

Colombo, January, 1904.

TESTIMONIALS.

Maligakanda,
Colombo, 6th April, 1901.

I have read the printed portion of the work entitled the "DE SOYSA CHARITAYA" sent me by its author, Mr. C. Don Bastian, Editor of the "Sinhalese Daily News."

The work is an extensive one, embracing the life of the late C. H. De Soysa, Esq., J.P., and a description of the family from which he had come. I find that it deals with the merits of those meritorious and the maxims acceptable to those inclined to the performance of religious acts. I know that the subject of the Memoir—the Justice of the Peace referred to—was one philanthropically bent and deserving of such treatment as has been accorded in this work. The phraseology of the work is such as to commend itself to even the ordinary run of natives.

(Signed) H. SUMANGALA,
Principal of the Vidyodaya Pali College at Maligakanda, and High Priest of the Nawa Korales of the Colombo District.

Pulinatalá Rámaya, Kalutara, 2nd April, 1901.

I have carefully read over the work entitled "DE SOYSA CHARITAYA." To print and hand it to the public would contribute to great good. It is a work calculated to give an impetus to the rising generation to betake itself to what contributes to the spiritual and secular welfare of the public. The handing to the public of the picture of a life devoted to acts, beneficial not only to the Ceylon public, but also to foreigners, will encourage many to follow in the noble footsteps. It may be noted with pleasure that the diction of the work is all that can be desired, and renders the work acceptable to every one. The author of the work is an erudite gentleman of much repute in Ceylon, and is the respected Editor and Proprietor of the only Sinhalese daily newspaper in the Island. In short, I am glad to record here my great satisfaction at this extensive piece of work, and my ever ready and willing disposition to encourage, as far as I can, all undertakings of this nature.

(Signed) WELIGAMA SRI SUMANGALA,
High Priest.

Abhinawaramaya,

Waskaduwa, 2nd April, 1901.

I have read with much pleasure the work entitled the "DE SOYSA CHARITAYA," containing the biography of the late Charles Henry De Soysa Esq., J.P., who was one of the richest men in Ceylon, written by Mr. C. Don Bastian. A perusal of this work is bound to give Ceylon's rising generation great encouragement to take to what has for its object the spiritual and secular welfare of the public. Therefore I consider the work as eminently calculated to render a great public service.

The Author of the work, Mr. C. Don Bastian, a learned gentleman of good qualities, has been known to me from his youth, and has, on several occasions, received instruction from me.

(Signed) W. SUBHUTI, P. N. M. R.,
High Priest.

Peliyagoda, 4th April, 1901.

The printed portion of the "DE SOYSA CHARITAYA," written by Mr. C. Don Bastian, Editor "Sinhalese Daily News," was sent us by the author, and we were much pleased with it.

The good qualities of the philanthropic subject of this Memoir (late Mr. De Soysa, J.P.) impressed themselves upon us too in his lifetime. That, ever since the prosperous days of the De Soysa family, the members of that family have been continually engaged in gradually promoting the welfare of the public, is a circumstance world-famed. To lay before the public the life of such a good man as the late Mr. De Soysa is a commendable act of gratitude. Such being the case, we express our satisfaction at the plausible undertaking.

(Signed) DHARMA KIRTHI SRI DHARMARAMA,
Principal of the Vidyálankára College at Peliyagoda and High Priest of the Colombo and Chilaw Districts.

I have carefully read the first 50 pages of the work entitled "THE LIFE OF DE SOYSA." These pages give an account of the ancestry and philanthropic acts of Mr. Jeronis De Soysa, Mudaliyar of the Governor's Gate, who was the father of the late Mr. Charles Henry De Soysa, Justice of the Peace. As I was acquainted with the former of these two native gentlemen I can from personal knowledge vouch for the accuracy of the facts stated within the

pages I have read. They contain much readable matter which will be useful to the rising generation. The style is chaste and elegant; the language is grammatical and idiomatic. If these pages are a fair specimen of what follows, if the subsequent portion gives a faithful sketch of the life of Mr. Charles De Soysa himself, and if, moreover, it is not calculated to give offence to any caste or creed, I have no doubt the book will be read with interest, and will be highly useful to the general public.

(Signed) B. GUNASEKARA,
Chief Sinhalese Translator to Government
and Mudaliyar of the Governor's Gate.

Colombo, 6th April, 1901.

Colombo, 6th April, 1901.

Mr. C. Don Bastian, the Editor of the "Sinhalese Daily News," is now engaged in writing a life of the late Mr. Charles Henry De Soysa, one of Ceylon's greatest philanthropists. The work, so far as I have seen it, has been done very well, and Mr. Bastian deserves encouragement.

(Signed) SIMON DE SILVA,
Mudaliyar, Department of Public Instruction.

I have much pleasure in stating that Mr. C. Don Bastian is the Proprietor and Editor of "Dinapatha-Pravurthi," the first Sinhalese daily newspaper, and author and editor of several useful publications. He is a well-known public speaker and has done much service to the public by the issue of those publications, by the opening of a night charity school which he kept up for several years, and by the formation of Literary Associations. He has written a book entitled "DE SOYSA CHARITAYA" ("Biography of De Soysa") which is now in the press, and which, I believe, will be found useful and instructive and ably done. He is quite competent to undertake a work of this class, and I wish him every success.

(Signed) A. MENDIS GUNASEKARA,
Mudaliyar, Registrar-General's Office.

Colombo, 6th April, 1901.

NOTE.—Any person found in the possession of a copy of this book not bearing the embossed stamp of Mr. T. H. A. De Soysa will be prosecuted.

පටුන.

CONTENTS.

පිට.

ද සොයිසා චරිතය 5

පළමුවෙනි අදියර.

මෙතුමාගේ මුත්තා 9
කොස්ගෙඩියේ ප්‍රවෘත්තිය 10
සූකරමාංස ප්‍රවෘත්තිය 13
දරුවෙකු ගැලෙව් ප්‍රවෘත්තිය 14

දෙවන අදියර.

මෙතුමාගේ ආත්මා 21
ලූණු පිළිබඳ ප්‍රවෘත්තිය 24

තෙවන අදියර.

මෙතුමාගේ පියානෝ 31
කොලරා රෝගයට දෙන බෙහෙත් ගුළිය 33
පනාකුවිටම් ලොතරැයිකිරීම 38
සරණ මඩිගල්‍යය 40
පළමුවෙනි දරුඵලය 42
ද සොයිසා පව්ලේ ජයගැම්ම 43

පිට.

කපුවත්ගේ ප්‍රවෘත්තිය 48
විදුරුයදුරුහොත්පත්තිය 49
උඩරට වැඩිඅමුතු සහ මංමොවත් ආදිය සමුච්චිකිරීම . . 50
ලොවප්‍රකට හිඩහය 54
විශාල හොඬහෑගිලීවල හිමිකාරයාවීම 55
බොරවුවේ අවබලම 59
සාධාරණ සරණ සමාගම 60
පහතරට මංමොවත් පාලම් හේදඩු ආදිය සමුච්චිකිරීම . . 61
කදිම චිනිඟවයක් 64
වාසල මුදලිතනතුරේ ආරම්භය 65
වාසල මුදලිතනතුරේ උතුසවය 68
හතුරන්කෙන ගමන 70
හිමිවම්භාව 77
අණවයාගේ ප්‍රවෘත්තිය 90
සළඹුන් සැලකීමක් 92
නායකෘතනිය 93
ගිඩි නුද්දන් ප්‍රවෘත්තිය 95
තත්ගිණෑසාව හල උපසාරය 97
කෝලහලයක් සංසිඳවීම 99
රත්රන් පවුම් තුණක්කින් දඩයම් නැවත්වීම 101
පොත්ගුල් විහාරය 102
මුදලිතුමා ක්‍රියාකුලබඩිය පිළිගැණීම 103
ගුරුවිරුෘගේ අසනිපය සහ ආගුහනය 103
ගුඩ එවිමානුවෙල් දෙවම්සිරිය 104
මෙම දෙවිසෘනය ගෙවදීමේ මෙහෙය 107
දඩල් සෑම 108
මුදලි මැතිතුමා හතුරන්කෙනට ගිය අනතිම ගමන . . 111
අවමඩහලෙෘනසවය 114
දේවම්සිරියතුල මුදලිතුමාගේ වල මතුපිට පිහිටුවා තිබෙන
පිලාලෙඛනය 119
මෙතුමාගේ ප්‍රතිමාව 120
මෙතුමාසම්බන්ධ ප්‍රබන්ධ 123

සිව්වන අදියර.

පිට.

මෙතුමාගේ මෑනියෝ 129
තමන්ට ලැබෙන පුරුෂයාගේ පළමුවෙනි දර්ශනය . . . 132
සුපනයක් 134
දරුසම්පතක් ලැබීම 135
පුනුවඬිනය 136
දෙවෙනි දරුඋපත 137
කෘතොපකාර සැලකීමක් 138
පවුම දහයේ ප්‍රවෘත්තිය 139
තෙල ප්‍රවෘත්තිය 139
අදිසි අසනීපයක් 141
නිරහඞ්කාරකම 142
ලමාඵතනි යන ගරුනාමය ලැබීම 143
අසොමය වලලු සුවල 144
රදලතෙනෙකුගේ මතය 145
යස පිළිතුරක් 147
තවත් කදිම පිළිතුරක් 148
රූකසුරුවම්කම 150
පැදුරු එයන්නිට දුන් ඩෙයිස් 151
කොස් ව්‍යඤ්ජනය 151
පුපුලමැල් පෙට්ටිය 153
තරුණියන් තිදෙනෙකුට කළ උපකාරය 154
සුරතලාගේ ප්‍රවෘත්තිය 156

පස්වන අදියර.

මෙතුමාගේ සුළු පියානෝ 165
කුරුවැල ප්‍රවෘත්තිය 167
මුතුමදිනගේ වෙලේ කෝලාහලය 168
ඉගෙණගැණීම 168
උඩරට යාම 169

පිට.

කුමිරගේ චේතියා සම්බන්ධ ප්‍රවෘත්තිය 170
හඬු මිනිහෙයක් 173
පතලේ ගල පොඩිකර අහයදීම 175
සෝදුගොඩ රාළගේ ප්‍රවෘත්තිය 177
සේදියාට ජයවුන ප්‍රවෘත්තිය 178
සුසෙව් ද සොයිසා මහතාගේ අවඩකකම 180
සුසෙව් ද සොයිසා මහතාගේ අවගාහනය 181
සරණ්මඩලෑය 182
කොළඹ පැවතුන ජලසනනි රොගය 184
මෑතලේ කැරැල්ල 185
මුදලි මඩගලෙෑත්සවය 188
හතුරන්කෙත හමන 193
කොළඹට පැමිණීම 194
මොරවු ග්‍රාමයට පැමිණීම 200
ලෝකාර්ථය සඳහා මෙතුමා කළ අනගි වැඩ 204
සවුරුදු දහය 204
ඛණ්ඩාභාරය 204
සම්මෝදමක් 205
ගල්කස්සේ ඉඩම සහ ගොඩනැගිලි 205
මහ ජලගැල්ම 205
රාජකුමාර සඞ්ග්‍රහය 206
අදූශ නොවිපල 206
ශුඛවූ යොහන්ගේ දෙවමඤ්චය 209
පාණිදුරයේ ආරෝග්‍ය ශාලාව 210
පාණිදුරයේ ශාස්ත්‍ර ශාලාව 210
මාරාවිල දෙවමඤ්චය 210
මාරාවිල ආරෝග්‍ය ශාලාව 215
සතුරන්කෙත දෙවමඤ්චය 215
පාණිදුරයේ සොහොන් භූමිය 215
දුර්භික්ෂය 216
භික්ෂොපදේශය 216
ඔක්තුකාගාරය 216

පිට.

මෙතුමාගේ විවේක කාලය 222
රෝගාතුර කාලය 227
අශුභ දින 228
අවමඩගල්ල පෙළහර 228

සවන අදිසර.

සුසෙව් ද සොයිසා ලමාඑනනී 237
අවමඩගල්ල පෙළහර 240

සත්වන අදිසර.

සුසෙව් ද සොයිසා වාසල මුදලිතුමා පිළිබඳ යතුනි පත්‍ර . . 249

අටවන අදිසර.

චාලිස් හෑන්රි ද සොයිසා සාමදූත විනිශ්චයකාරතුමා . . 273
අවශාහනය 274
මෙතුමාගේ කුඩා කාලය 274
පාඨශාලාවල ගතකළ කාලය 278
උඩරට ගතකළ කාලය 280
පවුම දහයේ ප්‍රවෘත්තිය 281
වණ්කාරයාගේ ප්‍රවෘත්තිය 282
උක්කුරාළගේ ප්‍රවෘත්තිය 284
කිරිමැණිකිගේ ප්‍රවෘත්තිය 284
තලාතුඔයේ කන්කානමගේ පව්ලේ ප්‍රවෘත්තිය 285
දුවිත් අප්පුගේ ඔග්‍රිගේ ප්‍රවෘත්තිය 285
මළවුන් වලලූ ප්‍රවෘත්තිය 285
දෙල්ගොට උක්කුරාළගේ ප්‍රවෘත්තිය 286
රන්හාමිගේ ප්‍රවෘත්තිය 286

පිට.

පුරාණ කාලය 288
සරණ බිඹාලෑය 289
සුභ ශාන්තිය 293
පේර ශාන්තිය 294
කිතිය නාවිය 296
සඟ කරුණාව 299
මියිමරුවන් අල්ලාදීමක් 300
අහතුරකින් බේරීම 301
අසතෘ චෝදනාවක් 301
එන්දෙ චෙදරාළගේ එඩිමඩිනය 302
පොත්පත් කියවීම 304
ලිපි ශාලාව 305
මෙ මහතාගේ පුනු පුනුකාවෝ 310
රාජ කුමාරොත්සවය 312
මෙදිනි සවස 316
ආලෝක කිරීම 318
රාජ කුමාරයානන්ගේ සම්ප්‍රාප්තිය 319
කුමාරයානන් ද සොඩිසා මහදේරයේ ගහකළ කාලය . . . 320
ඩේවි කාර්සන් ගායනා කණ්ඩායම 321
පාන ශාලා 321
නාඩගම් 321
දුවිඩ නාට්‍යය 322
නැව් කරකවන්නියෝ 322
රූකඩ නැටීම 323
මිශ්‍ර නාට්‍ය 323
භෝජන ශාලාව 324
රාජ කුමාරයා පිටත්වයාම 325
නැවතාත් ක්‍රීඩා පටන්ගැන්ම 326
රන් භාජන 328
රාජකුමාරයානන් විසින් ද සොඩිසා මහතුන් පිළිගැණීම . 331
ආදර්ශ ගොවිපල 332
ආදර්ශ ගොවිපල හැණි ආණ්ඩුකාරතුමාගේ කථාව . . . 334

පිටු.

දරුවන්ට ශාසනු ඉගැන්වීම 340
හෙලදිව රුවන 342
සත්‍යසමුච්චය 342
ලක්මිණිපහණ 344
දිනකර ප්‍රකාශය 347
සරසවිසඳරැස 351
ඥානාවී ප්‍රදීපය 354
රිවිරැස 356
"ඇල්ෆ්‍රඩ් හවුස්" නම් ද සොසිසා මැදිරිය 362
සාමදූත චිනිශ්ඛකාර බුරස 372
මොරටුවේ මහා ශාසනාගාලා දෙක 372
ආණ්ඩුකාර උතුමානන්වහන්සේගේ කථාව 392
ප්‍රසූතිකා ගෘහය 398
උතුමානන්වහන්සේගේ කථාව 403
බුරුම නානාජාතිකුමට කළ සඛ්‍යුහය 407
මෙතුමා එඛගලන්නයට ගිය ගමන 408
මෙතුමාගේ ජ්‍යෙෂ්ඨ දුකිතාගේ සරණ මඛඛල්‍යය . . . 411
මෙතුමා කළ අගනා ලේඛන 423
එඛගලන්නායේදී කළ පරිත්‍යාග 433
අන්තිම කැමති පත්‍රය 443
අන්තිම කැමති පත්‍රයේ පිටපත 447
අන්තිම අනුශාසනා 453
මරණය ගැන ලක්දිව ඇතුව ගිය කැලඹීම 456
මොරටුව 457
කාරකසභාව 459
ඔක්තෝබර් මස පළමුවෙනි බුදු දින 459
අවමඛඛල්‍ය පෙළහර 460
මෙතුමා ගැන කරණලද දෙශනාව 471

නවවන අදියර.

ද සොසිසා ආයාවාව 481
ක්‍රුඩා කාලය 482

පිට.

තරුණ කාලය. 484
ශ්‍රීමත් ඉන මහාරාජිනිය විසින් ගෞරවකිරීම 494
"ලණ්ඩන් ගැසට්" පත්‍රය 507
තරඟකාර ආණ්ඩුකාරතුමා එවූ විදුලි පණිවිඩය 508
ද සොයිසා ආයාචනව ගැන පිළිතුරු 509
ආයාචනාව ඇසීම 511
ද සොයිසා ආයාචනව 513
පුදුමාව නිසාගම 519

දසවන අධිකර.

මෙතුමා සම්බන්ධ ප්‍රබන්ධ කාණ්ඩය 525

එකොළොස්වන අධිකර.

ප්‍රජේ ද සිල්වා වැවලියර්තුමා. 655
පළමුවෙනි දරු උපත 656
කිරිමවවට කල උපස්ථානය 657
ශාස්ත්‍රාධ්‍යයන කාලය 658
පියාට පනාග දෙසියයක් දීම 660
ඒ ලියමන 668
මෙහි සිංහල පිටපත 670
පිළිතුරු 671
පිළිතුරු (සිංහල) 672
සිංහල පිටපත. 695
සිංහල පිටපත. 709
"නෛව" තුමාගේ මොරටු ගමන 713
රෝගාතුර කාලය. 719
අවමඞ්ගල්‍යය 719
අන්තිම කැමති පත්‍රය 725
අන්තිම කැමති පත්‍රයේ පිටපත 729
අන්තිම කැමති පත්‍රයේ ඌනාතිරේකය. 731

දෙවෙලෝස්වන අදියර.

පිට.

පුංසේ ද සිල්වා මැතිනිය 737

තෙවෙස්වන අදියර.

පුංසේ ද සිල්වා "වැවලියර්" නුමා පිළිබඳ ප්‍රවෘත්ති . . . 747
අනගාරික ධර්මපාල පත්‍රය (ඉංග්‍රීසි) 780
අනගාරික ධර්මපාල පත්‍රයේ පිටපත 783

හතරවන අදියර.

දූනව ද සොයිසා පව්ලේ ප්‍රධාන මැතිනුමා 793
ලදරු කාලය 794
අවගාහන මඩගල්ලය 794
ක්‍රීඩා කාලය 795
ශාස්ත්‍රාධ්‍යාහරණය 796
සාමදූත විනීයවයකාර ධුරය 798
පරාර්ථය සඳහා පළමුවෙන් දුන් රුපියල් දශදහස 798
මෙතුමා එඩගලනතයට සාමේ දෙවෙනි ගමන 799
මෙතුමා සම්බන්ධව පැවැත්තූ උත්සවය 799
මෙතුමා සම්බන්ධ මොරටු සඞ්ඝමය පැවැත්තූ උත්සවය. . 803
මහාසී "ඇම්. ඒ." නම් අක්ෂරමය 804
වාසල මුදලි ධුරය 804
වරක් ප්‍රතිශෝපකල රුපියල් දශදහස 806
ශිලාලෙඛනය (ඉංග්‍රීසි). 811
ශිලාලෙඛනයේ පිටපත. 812
දෙවෙනි දීමනාව 813
රාජගෞරවය 814
ග්‍රහපීඩාවිචරණය. 825

ඔනිසම් පෙන්වන පටුන.

CONTENTS OF THE ILLUSTRATIONS.

පිට.

චාලිස් හෑන්රි ද සොසිසා සාමදූත විනිශ්චයකාරතුමා . . 3
ප්‍රෝඛ්ස් ද සොසිසා වාසල මුදලිතුමා 29
හඳුරන්කෙත දියතලාකන්දේ භූමි සටහන 45
මොරවුවේ අම්බලම 57
හඳුරන්කෙත වලව්ව 73
හඳුරන්කෙත මිෂන් පාඨශාලාව 75
මොරවුවේ ශුද්ධ එමොනුවෙල් දෙවස්ථානය 105
මොරවුවේ වලව්ව 109
ප්‍රෝඛ්ස් ද සොසිසා වාසලමුදලිතුමාගේ කිරිගරුඬ රූපය . 121
ප්‍රෝඛ්ස් ද සොසිසා ලමාඑතනී 127
සුසෙව් ද සොසිසා වාසල මුදලිතුමා 163
ප්‍රෝඛ්ස් ද සොසිසා මුදලිතුමාගේ කණ්‍යාන ආදිය . . . 189
සුසෙව් ද සොසිසා මුදලිතුමාගේ කණ්‍යාන ආදිය . . . 191
"සැල්බි හවුස්" නම් නිවෙස 195
පානදුරේ ශුද්ධවූ යොහන්ගේ දෙවමැදිරය 207
පානදුරයේ ආරොග්‍ය ශාලාව 211
පානදුරේ ශු. යොහන්ගේ උසස් පාඨශාලාව 213
මෑරුවිල ශුද්ධවූ සෙත්පන්ගේ දෙවස්ථානය 217
මෑරුවිල ආරොග්‍ය ශාලාව 219
හඳුරන්කෙත දෙව මැදුරය 223
ද සොසිසා කෞතුකාගාරය 225
සුසෙව් ද සොසිසා වාසලමුදලිතුමාගේ මිනිවල
වසාතිබෙන ලේඛනය . . . 231
සුසෙව් ද සොසිසා ලමාඑතනී 235
ලොත ලෙඛනය 241
සුසෙව් ද සොසිසා ලමාඑතනීගේ මිනිවල
වසාතිබෙන ලෙඛනය . . . 245

පිට.

සී. එච්. ද සොයිසා මහතා උපන් ගෙය 271
පාඨශාලාවට ගිය කරත්තය 275
කොළඹ කොටුවේ ප්‍රධාන ලිපි ශාලාව 307
ඇඩින්බරෝහි ආදිපාදයානෝ 313
රන් භාජන 329
ද සොයිසා මැදුරය 363
වෙල්ස්හි රාජකුමාරයානන්ගේ ශාස්ත්‍ර ශාලාව 373
වෙල්ස්හි රාජකුමරිය්‍යගේ විහාර ගෘහ පාඨශාලාව . . . 377
වෙල්ස්හි සිංහල පාඨශාලාව 383
ප්‍රසූතිකා ගෘහය 399
ලූනාවේ පාර සහ පාලම 421
වෙල්ස්හි රාජකුමාරයානෝ සහ කුමාරිකාවෝ 425
සී. එච්. ද සොයිසාතුමාගේ අත් අකුරු 451
සී. එච්. ද සොයිසා මහතානන්ගේ මෘතකලේබරය . . 463
ඕනිපෙච්චිය 465
අවමඩහල්‍ය පෙරහැර 469
චාලිස් හැන්රි ද සොයිසාතුමාගේ සොහොන් කොත . . . 475
ද සොයිසා ආඥ්‍යාව 479
ඇඩින්බරෝහි ආදිපාදයානන් සම්බන්ධ උත්සවයේදී
විසුරුවාහරිණලද කැඳවීම් පත්‍රය . . 489
ද සොයිසා ආඥ්‍යාවගේ අස්තය 499
එම . . . . එම 501
එම . . . . එම 503
එම . . . . එම 505
මත්තේගොඩ මැදිරිය 515
ප්‍රූසේ ද සිල්වා නෛවිත්තුමා 653
චැවලියර්තුමාගේ පදක්කම 677
අස්තය 679
එම 681
එම 683
එම 685
එම 687

පිට.

අස්තය 689
එම 691
එම 693
අස්තය 701
එම 703
එම 705
එම 707
මොරවුවේ සුදුවැල්ලෙ කිබෙන වැවලියර්තුමාගේ නිවස . 717
සූදහටිකර නිබෙන ප්‍රසේ ද සිල්වා නෙවිතුමගේ
මිනිවලෙ ලෙඛනය . . 723
එම මැතිනියගේ මිනිවළේ ලෙඛනය 724
ප්‍රසේද සිල්වා මැතිනිය 735
ජේ. ඩබ්ලිව් සී. ද සොයිසා සාමදූන එතිශ්වයකාරතුමා . 791
සුදු ප්‍රාණ් පරීක්ෂික ශාලාව 807
ඒ. ජේ. ආර්. ද සොයිසා, ඊ. ඇල්. ඇප්. ද සොයිසා,
ටී. එච්. ඒ. ද සොයිසා යන මහත්වරු . . 817
ජේ. ඇස්. ඩබ්ලිව්. ද සොයිසා, ඇල්. ඩබ්ලිව්. ඒ.
ද සොයිසා, ආර්. ඊ. ඇස්. ද සොයිසා යන මහත්වරු . 819
ජෝසොප් ද සොයිසා මහතාගේ සොහොන් ගෙය . . . 905
රජතකුලාව 907
මොරවුවාසින් එසින් දුන් සතුති පත්‍රය 909
මොරවු සඩහමයේ සතුතිපත්‍රය 911
ද සොයිසා ආයාවව සහ පුත්‍ර මහත්වරු 913

INTRODUCTION.

ප්‍රාරම්භය.

CHARLES HENRY DE SOYSA, Esq., J. P.

චාර්ලස් හැන්රි ද සොයිසා, සාමදාන විනිශ්චයකාර තුමා.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

THE

LIFE OF De SOYSA.

ද සොයිසා චරිතය

ලඞ්කාද්වීපයේ පමණක් නොව දෙශදෙශාන්තරයන්හි පතළාවූ කීර්ති යක් ඇතිව සිසුවාවූ ද, උත්තරීතර පරිත්‍යාගියෙක්වූ ද, නිරහඞ්කාර මිනිසෙක්වූ ද, ලාඞ්කික සෞංහලීය ශ්‍රේෂ්ඨ ධනවතාවූද, **මාර්ක්ස් හැග්ගි ද සොයිසා ඔබ්හුණවඩන විපුල රාජසුතිය කරුණාරත්න දිසානායක** සමාදුන විනිශ්චයකාර ධුරන්ධර මහත්තුරුවරයානෝ, ක්‍රිස්තු වර්ෂ 1836 වේ මාර්තු මස 3 වෙනි බුදුදින (පුර පසෑ) ය් මොරවුවේ "**ඉඞ්ගිරිස**" යන ග්‍රාමයේ උපන්හ.

PART I.

Mr. JOSEPH De SOYSA.

—:o:—

පළමුවන අධිකරණය.

ජෝසොප් ද සොයිසා මහතා.



GRAND-FATHER.

මෙතුමාගේ මුත්තා

වරුසි * හැන්නැදිගේ ජෝසොප් ද සොයිසා මහත්මයා මෙතුමාගේ † මුත්තාය. ද සොයිසා මහත්වරුන්ගේ මුල් භූමිය සිරිලක දක්ෂිණ දිශාභාගයෙහි පිහිටි, ඇල දොළ ගඞ්ගාදියෙන්ද, සමුද්‍ර තීරය කින්ද, අගනා වෘක්ෂ ලතාදියෙන්ද, මධුර සැළලිහිණි ආදි පක්ෂි ගණයාගෙන්ද, ගව මහිෂාදින්ගෙන්ද, උගතුන්ගෙන් සහ සජ්ජනයා ගෙන්ද ගහණවූ, **දෙවි නුවර** හෙවත් **දෙවුන්දරය.** මෙකී පරම්පරාවෙන් පමණෙක් දෙවි නුවර හැරවිත් එසේම සව්සිරින් සපිරි **පාණදූරයෙහි** පදිංචිවූහ. ජෝසොප් ද සොයිසා මහතා පාණදූර ග්‍රාමයේදී ඉපදී එහිම වැඩී, තරුණවූ කල **මොරමුවට** පැමිණ, එහි විසූ **හැන් නැදිගේ හෙන්ද්‍රික් පීරිස් මහත්මයාගේ** දුහිතෘවූ **ප්‍රන්සිස්කා පීරිස්** නම් තරුණිය සරණ පාවා ගෙණ ඉතා සාරවූ මේ මොරටු ග්‍රාමයේම පදිංචිවූනේය. එහි විසීමට ආ මෙම පරම්පරාවේ පළමුවෙන් තැනැත්තා මෙතෙමේය.

---

* "වරිසි" පුරාණ ලේඛන.

† ඇතැම් පලාත්වල මීට "සීයා" යන නාමයද ව්‍යවහාර කරති.

ඒ කාලයේ හැටියට කාලා හැඳලා දරුවන් පොෂණය කර ගැනීමට හැකි දේපලාදියෙන් සුසැනව විසූ මේ මහත්මයා මෙලොව ජීවත්වීම උදෙසා උවමනා ගුණ නුවණ ආදියෙන්ද, පරලොව සැප සාදා ගැනීමට උවමනා ධර්මඥ කමින්ද, කල්යැවි සත්පුරුෂ මහතෙකි. බඩු පැවිම සඳහා බර කරන්න සවා කුලියට යැවීම, වතුවිවි වැවීම, කුඹුරු වැපිර වීට, ගවයන් බෝ කිරීම ආදියෙන් මෙතෙම ධන ඉපදෙවිය. මේ මහත්මයාගේ නසාදු ජීවිතයේ ඵල වශයෙන් දරුවන් එකොළොස් දෙනෙක් ඇතිවුන බව පෙනේ.

එනම්:—1. ලේනෝරා ද සොසියා, 2. පේදුරු ද සොසියා පිදුන මහත්මයා, 3. ප්‍රෝඛීස් ද සොසියා, 4. සොහානීස් ද සොසියා, 5. දුම්හු ද සොසියා, 6. (කුඩාකල මියගිය) නැනූ දරුවා, 7. ලුවිස් ද සොසියා, 8. සුසෙව් ද සොසියා, 9. සිමෝනා ද සොසියා, 10. අන්තෝනි ද සොසියා, 11. සලමොන් ද සොසියා, යන පුත්‍ර දුහිතෘන්ය.

ජෝසෝප් ද සොසියා මහත්මයාට "ජෝසරාල්" කියාද ආදර වශයෙන් ඒ මහත්මයාගේ ප්‍රමාණයේ මහත්වරුන් එවකට වෑවහාර කරහිබේ. මේ මහත්මයා කොඩිනරම් හොඳ ගුණයකින් සහ නුවණකින් ක්‍රියාකර තිබේද යනු මේ මිතු දක්වන කරුණු වලින් ඔප්පුවේ.

කොස් ගෙඩියේ ප්‍රවෘත්තිය.

යළෝකත මහත්මයාගේ ඉතා හොඳ ශරීර ශක්තිය සම්පන්න පුත්‍රයින් කීපදෙන හෙදර සිටින වෙලාවක කොරෙක් චිත්තට පැන කොස් ගහකට නැග ගෙඩියක් බෑමේය. මේ බව දැනගන්ට ලැබුන වහාම මේ මහත්මයා ගෙයින් චිත්තට බැස්සේය. එකල තම් පුත්‍රයින් තමා පස්සේ එන බව දුටුවේය, සාධාරණ ප්‍රඥා සම්පන්න මේ මහත්මයා "ඔන්න ඔය පැත්තෙන් දුව

පල්ලාය" කියා ඔවුන්ට අන්‍ය දිශාවක් පෙන්නා අයවල් කොස් ගහෙන් ගෙඩිය බාන්ට ඇත යන සැපුවෙන් ඒ ගහ සමීපයට එන කල සොරා ගසින් වහා බැස, බියපත්ව සිටි තැනම නුදුවා සිටියේය. දැනවත්ත මේ මහත්මයා වහාම වැටෙන් පිටට පනින්ට සොරාට නියමකර තොග ගෙඩිය දැගින් උස්සා වැටෙන් පිට සිටි සොරාගේ කරට දී කඩිනමකර පුත්‍රයින් යළි දිශාව නොව, අන්‍ය දිශාවක් පෙන්නා ඒ දිශාවෙන් දිවයන්ට නියම කෙළේය. මෙසේ නියම කළ වහාම තම පුත්‍රයින් දුවගිය දිශාවට යැවීම ඔවුන්ට කථාකර "අපව හිමි නැත ඔහුට හිමි දෙය ඔහු ගෙන්වාවෝ" කියා පුත්‍රයින් කැඳවා ගෙණ ගෙදර ආවේය. හොරාගේ දැනයත් පුත්‍රයින්ගේ ගැලවිල්ලත් යන දෙකම, නොනසා ක්‍රියා කළ මේ සත්පුරුෂ මහතා, ඒ කාලේ සිටි නුවණැත්තන්ගෙන් ප්‍රශංසා ලැබීම අරුම යක් නොවන නුමුත්, වර්තමාන කාලයේ ලියන මෙම පොතට මේ නාමය ඇතුළත් කරන්ට ලැබීම මහත් ගෞරවයක් බව අපට වැටහේ.

ජෝසොප් දැසොයිසා මහතා අන්‍යයන් තෙරෙහි මහත් ලැදි භාවයකින් කාලය ගතකර සිටින බව සොඳසේ පෙනේ. මොරටු ගමේ පමණක් නොව අවට ගම්වල වසන මනුෂ්‍යයන් අතරේද ලෙඩක් දුකක් පැමිණි කල, මේ මහත්මයා එහිදී දැකින්ව ලැබීම සිරිතක්මෙන් පැව තිනා. මුදු සිනක් ඇති මේ මහතා නිතරම ඔඛාසියඅතින් අන්‍යයන්ට බෙහෙත් කොටා දීම, බෙහෙත් සපයා දීම ආදි යට මහත් සතුටකින් සිටියේය. තමන්ගේම කය වෙහෙසා ඒවකට තමන්ට තිබුන සුළු පොහොසත්කමෙ හැටියට තමන්ගේම මුදල් ඔසදමිකර දුක්පත් ජනයාට උදව් කෙළේය. බෝවෙන රොගයක් වී නම්දු, යමෙකුට වැල දුන කල ඒ ගැන කිසි භයක් සිනයකින් පමණවත් නොසිතා එහි පැමිණ, තමන්ටවූ විපතක් මෙන් සලකා ඒ රොගාතුරයා සුවපත්කර සතුට ප්‍රකාශ කිරීමෙහි අභය සම්පුර්ණයෙන් ඉගෙණ් රට සමිබව සිටියේය.

යහපත් බොඬයෙක්ව සිටි මේ මහතා, ශුඛ බුඛ ධර්මයෙහි ප්‍රකාශිත ශ්‍රී බුඛ වචනයන්ට අනුරූපව ජාති භෙද ආදියෙන් තොරව, පරාත්මයෙහිම ඇලී සිටියේය. මල දුටු කල සඟණෙන් එහි පියාසර කරණ මිධුලෝලුයෙකු මෙන්, මළස්නක් ඇසූ වහාම පුණ්‍ය ලෝලයෙන් එහි පැමිණ, ඊට උචමනා දෙය සපයා දීමෙහි පඬිතු කාරයෙක් වෙන සිරිතක්ද ඇතිව සිටියේය. අසරණ තැනක් නට, ඉතා රහසේ මෘත ශරීරය ගුම්ඵන කරගැනීමට මුදල් ආදිය දීමෙන් ඒ පවලේ දුක නිවා දැමීමේ සිරින වෙසෙසින් ඇති වූයේය. මළවුන්ට තොරව කිරීමේනි පරිවේෂදය තදිමට මේ මහතා පාඩට කර ගෙණ තිබුනේය.

එවකට මොරවුව එක පොල් අන්තෙන් වැසි තිබුනාය කීවාට මොරවු වැසි නුවණැති ජනයෝ දැන් අමනාප නොවෙන්යයි සිතමු. දැනට මහල් දෙමහල් නුන් මහල් වලින් බබලන මාලිගා වැනි ගෙවල් මොරවුමේ ඇති නමුත්, එවකට ඇතුව ගිය වැඩි කොවස අතු සෙවිලිකල ගෙවල්ස; පරහට වැඩ කැමති මේ සත්පුරුෂයා ඕනි සුන් සමිඟ හොස් දුක්පතුන්ගේ දිරා ගිය අතු ගෙවල් සෙවිලි කරදී ඔවුන්ට උපකාර වෙන සිරිතද ඇති වූයේය. ක්‍රීඩා භූමියට දුව යන්ට ආසා ඇති දරුවෙකු මෙන්, සුචරිතය කෙරෙණි ස්ථානයන්ට පැමිණෙන්ට මේ මහතාගේ බලවත් ආසාවක් පැවතුනේය.

ජීවිතාව සභිස මේ මහතාට චතුපිවිවලින්ද කරත්ත වලින්ද යට යට ප්‍රයෝජන ලැබුන නුමුත්, ඒ ගැන තිඩි විටක උඩඟු නොවී දුක්පතෙක් මෙන් ක්‍රියා කිරීමට කැමැත්තෙන් සිටියේය. නම්බුකාර තමත් වැදගත් කමත් රඳා තිබෙන්නේ මුදල් උඩ නොව, නො කැලල්වූ ක්‍රියා කාර කමේ බව ඉතා පැහැදිලි ලෙස තේරුම් ගෙණ සිටියේය. තමා ප්‍රමාණ අය අතුරේ පම ණක් නොව තරුණයින් අතුරේද, මේ වග උගන්වා දීමට නොපෝසේ උත්සාහ ගත්තේය; මෙපමණක්

නොව අන්‍ය සුචරිත සකල ක්‍රියාවන්ම විශෙෂ විශයෙන් මොරවූ ගම්වාසින් අතරේ පුරුදු කර ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරුවෙය.

උඩඟු වීමෙහි වරද, අනුන්ට උපකාර නො කිරීමෙහි වරද, වෛර කිරීමෙහි වරද, අනුන් සන්තක දේපල උරුම් කර ගැණීමෙහි වරද, ආශම නො ඇදහීමෙහි වරද, රොගාතුරයින්ට පිහිට නො වීමෙහි වරද, මිළඟුන් නො තැකීමෙහි වරද, පාප මිත්‍ර සෙවනයෙහි වරද, අලසව සිටීමෙහි වරද, තරහ කිරීමෙහි වරද, දිළිඳු සෑහී මිත්‍ර ජනයාට උපකාර නො කිරීමෙහි වරද, දුසි දුසාදින්ට සුදුසු කට සුතු නොකිරීමෙහි වරද, කළගුණ නො සැලකීමේ වරද. දුන් මත් යාචකාදීන්ට සඞ්ග්‍රහ නො කිරීමෙහි වරද, අනුන් සා පිපාසයෙන් සිටින බව දැන දැන ඒ ගැණ නො සලකා තමන්ගේ බඩ වැඩීමෙහි වරද, සැලකිය සුතු ගෞරව කළසුතු වැදගතුන්ට හිස නො නැමීමෙහි වරද, දෙමව් පිය ගුරුවර වැඩි සිටියන් නො සැලකීමෙහි වරද, යනාදී නා නා වීධ වරද නො කිරීමෙන් ලොව ජීවත්ව කල දවස ගෙවීමට නිතර දරු මුණුබුරන්ට අවවාද අනුශාසනා කරණ උතුම් සිරිත නොනසා පැවැත්තුවේය.



සූකර මාංශ ප්‍රවෘත්තිය.

එක් දිනක් ජෝසොප් ද සොසිසා මහතා උදය කාලයේම යම්කිසි උවමනාවක් සඳහා ගෙදරින් පිටත්ව ගොස් සිටින අතර, මේ මහතාගේ නෝනා මහත්මයා නාදුනන අන්නෝ රාල නම් කෙනෙක්, ගම් උඟුරු මස් පිසක් ගෙණැවිත් ජෝසොප් ද සොසිසා මහතාගේ නෝනා මහත්මයා අතට තෑගි වශයෙන් දී ගියේය. මෙම නෝනා මහත්මයා ඒ ගැණ ඔහුට සතුති කර ඔහුගේ නම අසා ගිහේ නමා ගෙණ වෙනත් ව්‍යඤ්ජන සමග උඟුරු මසුන් පිස සිරින් ආහාර

තම සොඳුරු පුරුෂයාට කැමැති පිණිස සූදානම් කර තැබුවාය. උදයකාලයේ ගෙන් පිටතින ජෝසෙප් ද සොසියා මහත්මයා සවස තුන්වරම පමණ ගෙදර ඇවිත් අත් පා සහ මුව සෝදා ගෙන් කෑමට හිඳගන්කල, ලොකු පිහානක උෆරුමස් කිරෙහි බව දැක එය කොහෙන් ලැබුනාදැයි තම භාර්යාව ගෙන් ඇසිය; අන්තොරාළ නම් කෙනෙක්, එකී මස් තෑගි වශයෙන් ගෙනෙන් දුන් බව ඕතොමෝ කිවාය. සේරම මෙච්චරද? කවුන් හිබේදැයි සැමී පුරුෂයා ඇසූ විට, ඇතිලියේ තව ඉතුරුව තිබෙන බව ඈ කිවාය; මෙ මහතා උෆරු මස් පිහානත් රැගෙන් උසන ගෙට ගොස්, ඒ ඇතිලි යට පිහානේ මස් සියල්ලමත් හලා ඇතිලිය රැගෙණ ගොස් ගෙපස තිබුන දිස සුන් ලිඳට බහා, ඇතිලිය මුළු තැන්හෙයි තබා තම භාර්යාවට ආදරයෙන් කථාකර මෙසේ කීවේය. "ඔය අන්තොරාළ කියන තැනැත්තා මස් ආදිය ලබන්නේ වැරදි මාර්ගයකින්ය; ඒ දේ පිළිගැනීම් කෑමත්, වැරදිය; මටත් මගේ දරුවන්වත් උඹ කරුණාවකුයි නිසා ඊට කැළල්කර නොගැන්මට පුවේශව වෙයන්න; ඕන් පසු ඔහු ගෙණෙන හෝ එවන, තිබිවත් පිළිගන්ට එපාය" යනුය.

ධර්මිෂ්ඨ මහතා අධර්මයෙන් සපයන දේ නොම්ලයේ නමුත් හසුකර ගැනීමට අකමැතිවා පමණක් නොව, ඊට සෑම් ප්‍රකාරයෙන්ම විරුද්ධව සිටි බවත්, මෙයින් මනාලෙස ඔප්පුවේ.

දරුවෙකු හැලෙමි ප්‍රවෘත්තිය.

නැවතත් දිනක් ජෝසෙප් ද සොසියා මහතා උවමනාවක් නිමිත්ත මොරටුවේ සිට ගල්කිස්සට එන අතර ඕගෙල් නම් ශක්ති සම්පන්න තරුණයෙක් ඉතා වැරේව ඒලවාගෙණ ආ තිරික්කලයකට සය අවිරිදි පමණ වයස ඇති දරු වෙක් අසු වෙන්ට සලා දැක, ඉඳිරියට පැන ගොනුගේ

නාස් ලනුව අල්ලා තිරික්කලය නවතා දරුවා බේරා ගත්තේය. දරුවාගේ මව දරුවා බේරා ගැනීම වෙනුවට මරහඬ දීමට පටන් ගත්තාය. මේ මවගේ හැඬීමට අසල් වාසි ජනයෝ රැස්වෙන්ට පටන් ගත්තෝය. තිරික්කලය නැවැත්තුවාට කෝපවූ ඕගෙල් තිරික්කලයෙන් බිමට පැන, ජෝසොප් ද සොසිසා මහත්මයාට පහරක් ගැසුවෙය; ඒ පහර සටහට ඇහ නැවරුණ වහාම ඕගෙල්ගේ කෙස් වැවිය අල්ලා මේ මහතා ඔහුට පහරක් ගැසිය, ඕගෙල්ගේ ශක්තිය ඒ පහරින්ම බිඳී "මා මරන්ට එපෝ" යන ශබ්දයෙන් හඬන්ට පටන් ගත්තේය; මේ මහතා ඕගෙල්ගේ කෙස් වැවිය අත නෑර, "මගේ පහර තට රිදුනේදැ" යි ඇසිය. "රිදුනේය, ඉතින් කිසි දවසක මෙසේ වැරයේ තිරික්කලය එලවන්නේ නැතැ" යි හෙතෙම දිවිලේය. පිය ගුණයෙන් සමඟ මහතා "මගේ පහර තට ඔපමණ රිදුන කල, අර කුඩා දරුවාගේ ඇහ උඩින් තිරික්කලය ගියානම්, කොපමණ රිදුමක් උසුලන්ට සිදු වේද? නා, මට ගැසුවේ ක්‍රෝධයෙන් සහ උඩඟු වෙන්ය; මිසිසින් තට ගසන ලද්දේ ක්‍රෝධ යෙන්වත් උඩඟුවෙන්වත් නොව, තා මත්තට හදන අදහසිනැ" යි පවසා, කෙස් වැවිය අත හැරියේය. ඕගෙල් සෙමින් සෙමින් ගොනු දක්කා ගෙන් ඈතට ගොස් තිරික්කලයේ නැග යන්ට ගියේය.

මේ ඕගෙල්නම් තරුණයා මැර කමෙහි දක්ෂ යෙකි, මෙතාක් මොහුගේ පියාටවත් අනෘයෙකුටවත් කිසිකරු කරගන්ට බැරිව සිටි තෙනෙකි; ජෝසොප් ද සොසිසා මහතාගේ එකම පහර මොහුට කොපමණ දුරට හොඳව සිටියාද කිවොත්, එතැන් පටන් මෙතෙම ඉතා හොඳ තරුණයෙක් වෙන්ට අදහස්කර මැර කම් ආදිය අත් හැර, පියාට සහ අනෘයන්වද කිසිකරු භාවයක් පෙන්නුවෙය. ඕගෙල් දැන් හොඳ මිනිහෙක් වී සිටින්නේ කෙසේද? යත්, ඕගෙල්ගේ

පියා සහ ගටිවාසින් සොයා බැලූ කල, මේ සිදුවූ කෝලාහලය සත්වූ පරිද්දෙන් ප්‍රකාශ විය. ම්ගෙල්ගේ පියා ම්ගෙල් සමග බුලත් ආදියත් රැගෙණ මොරවුවේ ජෝසොප් ද සොසිසා මහත්මයාගේ නිවසට පැමිණ ම්ගෙල් ලවා ජෝසොප් ද සොසිසා මහත්මයාට බුලත් දෙවා පාවඳවා සමාව ඉල්ලවිය. ජෝසොප් ද සොසිසා මහතා ඔහුට අවවාදකොට පියාට සහ පුත්‍රයාටත් දවල් කෑමෙන් සඩහනකර පිටත් කෙළේය. සැබවින්ම ම්ගෙල් පසු කාලයේ හොඳ තරුණයෙක්ව ගටිවාසි කාගෙත් හිත් දිනා ගෙණ විසුවේය.

නිවිතිත මේ මහතා දරුවා මරණයෙන් බේරා ඒ දෙමව්පිය ආදීන්ට සහනය ගෙණ දුන්නා පමණක් නොව, අධිපතියා මැර වැර ම්ගෙල් යහපතෙකු කොට ම්ගෙල්ගේ දෙමව්පියාදීන්ට සතුව ගෙණ දීමෙන් සඩහන දෙකක් කෙළේය. තම ජීවිතයට ඇති ආසාව මනක නැති කර ඉකා වේගයෙන් දුව ආ හරකා නවතා, ම්ගෙල් ගෙඹුත් ගැහැට විඳ ඒ ම්ගෙල් හදු හැර්මත්, අසරණ දරුවා සුවසේ ඒ දෙගුරුන්ට භාරදීමත් ගැණ, මෙය කියවන්නෝ ජෝසොප් ද සොසිසා මහතා ගැණ, කුමන කල්පනාවක් උපදවත්ද? අහෝ මෙබඳු උතුම් පුරුෂයෝ සිංහල වනියා අතුරේ සිටියෝය, යනු ඇසිම පවා සංතුසිදුසක කරුණකි.

නිලතල සතුනි ප්‍රසංශාදිය ලබා ගැණීමෙහි ආසා වට විරුඩව, නිතර මෙ මහතා, පුඩ කරමින් සිටි බව වැටහේ. මේ සත්පුරුෂ මහතා, අනුන් කෙරෙහි සහ විශෙෂ ලෙස දුන්පතුන් කෙරෙහි පෙන්වන ලද මහත් කරුණාව ඉවසාගත නොහි මිට කෘතොපකාර වශයෙන් "විදුන" නිලයක් හෝ "ආරච්චි" නිලයක් හෝ ලබා දීමට එවකට එක්ක ආශ්‍රය කළ මිත්‍ර සම්භාවා අදහස් කළ බව, සෘජු ඉණ්වතා දැනගත් සැටියේ ඒ මිත්‍ර සම්භාවා සොයා ගොස්, තමාගේ කට වචන යෙන්ම මෙසේ කියේය. "තුඹලා මා ගැණ සිතා

තිබෙන අදහස ඔත් වලින් අහක්කර දමා දැල්ලා; විදුන රාළ පිටපට ගහගණ දුක්පතාගේ වහලව නැති අතු සෙවිලි කිරීමට පටන් ගත් කල, නුඹලා සිනහා වෙන්නානුයැ; මේ ඇර, නුඹලාගේ විදුන රාළට එය කිරීමට නුඹලා ඉඩ නොදෙන්නානුයැ; ආරවචි මහත්මයා ඵුන කල නුඹලා මගේ වැඩට කොහෙත්ම ඉඩ නොදෙන්නානුයැ; මුදලි වරුන්ගේ සහ එජන්ත වරුන්ගේ වලව දෙරවුවල රෙද්ද කැහැ පට කවා ගෙන්, දෙහොත් මුදුන් දීමෙන් නැති සිටිවේ වදයට, මා පත්කිරීමට නොසිතල්ලා; මගේ වැඩපල අත් හැර, දවස්පතා උසාවිගාණේ එල්ලී සිටීමටත්, අනුන්ගේ අරක්කු "සෝප්පි"යට අත දිගු කිරීමටත්, අල්ලසට අත ඕට මෙලවීමටත්, පඩි නොමැති නිලතල ලබාගෙන් කොල්ල කෑමටත්, හොර තක්කඩි මැරවරයින්ගේ කැහි, උදැළු, පොලු, පිහියාවලට, මගේ ඔළුගෙඩිය දීමටත් මා පොළඹවන්ට නුඹලා උත්සාහ නොකරල්ලාය" යනා දිය කියා එම නීලය ප්‍රතික්ෂෙප කෙළේය. මේ නිබොරු රත්රන්මය වචන සමූහය ගැණ කලපනා කල තැන එවකට සිටිය සැබෑව හජනය කළ ජීවතුන් අතුරෙන්, සොයා ගැණීමට දුලිහ මනුෂ්‍ය කයක් ලබා සිටිය මහත්ම යෙක් බවට මේ සාක්ෂියම මදි වේද? අහෝ! මෙබඳු සත්පුරුෂයන් ගැණ පෞරාණික ප්‍රාඥයන් විසින් ප්‍රකාශිත වචනයන්ගේ මහිමය ඔප්පු වෙනහැටි බැලුව මැනව!

මෙසේ නොයෙක් සුචරිත ධර්මයන්ගි යෙදී සිට අප මුණ පරිවි කම් කල යථොක්ත මහතා, වැඩිසිට වසහ වූයේ එයින් පෙළි, පස් සැත්කෑ හඬුරුද්දක් පමණ ආයු වළඳා, වෂී එක්වා දහස් අටසිය තිස්නමයේ අප්‍රෙල් මස දෙලොස් වෙනි දින බඹු මිනුදින් ඇතුළුව සියලු ඉසුරු අත්හැර සඬගී ප්‍රාපත වූයේය.

මෙම ජෝසොප් ද සොයිසා මහතා ජීවත්ව සිටියදී, කල දවස යැව පිළිවෙල කථානන්තරය කියවන ලද හුදී ජනයා සඬගී ප්‍රාපත යථොක්ත මහතා ගැණ, දුන්වූ කලීදු

ප්‍රශ්නය වෙතු නිසැකය. තමාගේ ආත්මය පමණක් ප්‍රාර්තනාකොට කල් නොහැර, අන්‍යයන්ගේ ආත්මය සඳහාත් මොහොවට ක්‍රියාකොට තමන් ලත් ජීවිතය සෑම ප්‍රකාරයෙන්ම සුදුසු මග හෙණ යාමෙන්, පාරලෞකික සැපට හේතු බොහෝ කුශල චරිත සුරතට කරගත් බව පැහැදිලි ලෙද පෙනේ. මෙලොව කටයුතු සඳහා කල යුතු හැහෑ කෑහෑ ආදි සකලම, ශක්‍තී පරිද්දෙන් ඉවු කොට ලොකයාගෙන් පැසසුට ලැබුවාක්මෙන්ම, බාල පරම්පරාවනේ අභිවෘධියට හේතු මහත් ආදර්ශ ඇඟි කල බැවිද වැටහේ. පිය ගුණයෙන් නිතර සැලෙන හෘදය ලක්ෂණයෙන් යුත් මෙයි සත්පුරුෂ මහතා ගැන්, ලුවණැති ලොකයා බොහෝසේ අනුකම්පා කොට අප මෙන් තිපුපුද ආදියෙන් අනුග්‍රහ කල නමුත්, බිහිසුණු මිරුවා කිසි අනුකම්පාවක් නොකොට තමාගේ පුරුදු චරිතය නැමති තවුක ජාලයෙන් මේ මහතා වසාගත් හෙයින්, ලුදි ජනයෝ මෙම සාධු සත්පුරුෂ මහතා මෙන් වහා වහා පරාජ කෙරීයෙහිම නිසුකතවීමෙන් දෙලොව ජය ග්‍රහණය කර ගැනීමට උත්සාහ දරත්වා!

PART II.

Mrs. JOSEPH De SOYSA.

දෙවන අදිසර.

ජෝසොප් ද සොයිසා

නෝනා මහත්මයා.

GRAND-MOTHER.

මෙතුමාගේ ආත්තා.

සොප් ද සොසිසා මහතාගේ ප්‍රියභාර්‍යාවවන **හැන්නැදිගේදුන් සිස්කා පිසිස් නෝනාමහත්මිසා** මෙතුමාගේ * ආත්තාය. මෑ සුචරිතයට ඇලුම්ව, මෙසේම අසල්වාසින්ට හිතව සිටිය කල්‍යාණ ගුණාඩ්‍යයන්ගෙන් දිමුතු සත්‍රියක් බව ඔප්පුවේ. අන්‍යයන් සඳහා දිනපතා කය, හුන, ධන විසදම කරණ සඩකිය සඩාම් පුරුෂයාට එයි සුචරිත වඩ වඩා කර ගෙණ යාමට මෝනොමෝ ධෛර්‍ය්‍ය දුන්නිය.

මෑ සඩකිය පුරුෂයාට දෙවෙනි නොවන කරමේ ගුණවත් සත්‍රිරත්නයක් බව සඩාම් පුරුෂයාගේ සුචරිත ක්‍රියාවලින් මනාලෙස ඔප්පුවේ. කිසි අවශ්‍රුතකමක් නොමැතිව අනුන්ට ජෝසොප් ද සොසිසා මහතා නිහිපතා වගේම කරකියා නිබෙන මහත් ඇප උපකාර ගැණ නුවණින් කල්පනා කළ තැන, සිය ඕරින්දගේ ගෙඟ වැරැඩයක්වත් ඇතුව

* ඇතෑම් පලාත්වල මේට "ආච්චි" යනුදු වැවහාර කරති.

ගියා නම් හොරාගේ කරට හෙරලි ගෙඩියද් ඇරීමෙදීවත්, නිතර දුන් අනෘ දීමනා ගැණීවත්, විරුඩකම් නොපා සිටි යයි කිය නොහැකිය.

වැඩි පක්‍ෂයක් ලොව සිපින නුවණ මඳ ස්ත්‍රීන්ගේ චරිත සෙවකල ජෝසොප් ද සොයිසා මහතාට ඉතා ලෙහෙසි යෙන්ම සුචරිත ධර්මවල ගැටී සිටීමට ඉඩ ලැබුනේ, මෝ තොමෝ නුවණ මඳ ස්ත්‍රීන්ගෙන් තුරන්වූ හෘද ශිතල මාතෘ ගුණ රාශියෙන් පිරී සිටි වරහනක් නිසාමය. මතු දක්වන කරුණුවලින් එය මනාලෙද ඔප්පුවේ.

මෙම නෝනා මහත්මයා මොරටුවේ වැදගත් පවුලක උපන්නියක්ය. එවකට පැවතුන චර්ත්‍රාදිය දැන ඉගෙණ, කල දවස පසුකල හැන්නැදිගේ හෙන්ද්‍රික් පීරිස් මහත්මයාගේ ප්‍රිය දියනියය.

ඒ කාලයේ ගෑණු දරුවන්ට ශාස්ත්‍ර ප්‍රගුණ කිරීම නද වරදක්ය යන විශ්වාසය නිසා, මෑටද දෙමව්පියෝ ශාස්ත්‍ර නො හදලෝය. නමුත් මෝතොමෝ, පුස්කොල සෝඩියක් සොයවාගෙණ කිව්වු ඥාතියෙකුගේ මාර්ගයෙන් ඉගෙණීම ලැබ අකුරු හැඳින මහත් උත්සාහයකින් මඳක් කියවන්ට සහ ලියන්ට දැන සිටියාය. තමන් දැනගත් සතර අනුන් වත් දීමට ආසාවෙන්, තමා වයසේ අසල්වාසි තරුණි යන්ට කථාකර, පිංක නමුත් අකුරු හඳුනා සුළු පොතක් පතක් කියවීම ප්‍රයොජන නිසා, තමා දත් ප්‍රමාණ ඉගෙණ ගැණීමට ඔවුන්ටද කීවාය. ගෑණු දරුවන්ට අකුරු ඉගැන් වීම එවකට කොපමණ නිකතව තිබුනාද යනු, ඒ තරුණි යන් ඊට තදලෙස විරුඩකම් පෑමෙන් ඔප්පු වුනේය. මෑ දැනගත් පිංකඉගෙණීමෙන් පසු කාලයේ මහත් ප්‍රයො ජන ගත්තාය. සුළු සුළු පොත් කියවීමෙන් පසු කාලයේදී වැදගත් පොත් පවා පසසේ කියවන්ට පුරුදුව සිටියාය. මෙ කරණකොටගෙණ ස්වභා ඇසට වඩා නුවණැසින් ලොව පවත්නා හොඳ නරක දැනගන්ට ලැබී, නුවණැති ධර්මිෂ්ඨ තරුණියෙක්ව සිටුවාය. තරුණ කාලයේ සිහිනුව

ණිත්තියක්ම, ගෘහස්ථ කම් දැන සිටි බැවින්, ජෝසොප්ද සොඩිසා මහත්මයා, මෑ සිරිත්ප්‍රකාර සරණ කරගත්තේය.

මෝ තොමෝ විටින් විට දරුවන් එකොළොස් දෙනෙක් ප්‍රසූත කලාය. දරුවන් වැඩිමෙහිදී, ඔම්යාගේ කටයුතු ඉටු කිරීමෙහිදී, අසල්වාසින්ට උදව් කිරීමෙහිද දැඩිව සිටියාය.

මෙ වරාඩගනාව ප්‍රසූත කළ දරුවන් අතුරෙන් **ඔතු මිශ්ට** සහ **සුරතුරට** උතුමන්ද කටයුතුමු, **ජෝශ්ප් ද සොඩියා** සහ **සුසෙම් ද සොඩියා** යන මහත්වරු දෙදෙන ලොකයාට උදව් කිරීම සඳහා, වෙනම වතු හදු දුන්නාක් වැනිය. මෙපමණ උතුම් පුත්‍රරත්න දෙකක් ලොකයාට දුන් වන්වත්තේ ඡායා රූපය එවකට ගලකවත් තොටා තිබුනානම් ඉන් රැගෙණ මෙහි සිදුවී තිබෙන එම සිතියම් නොමැති උණතාවය සම්පූර්ණ කරන්ට තිබුනි. එසේ නොහලේ ලක්දිව ඊට සෑහෙණ පාඩුණ නොතිබුනාසින් නොව, අනාගත යෙහිදී ගෞරවකිරීමට සුදුස්සන් නැති වේදෝ හෝ යන හයෙන් වෙන්ට ඇත්තේ හෝසි සිතමු.

ඇතම් නුවණ මඳ ස්ත්‍රීන්මෙන් ඩොම් පුරුෂයා ගෙදර ආඩාල ගෙදර අපහසු සහ දරුවන්ගේ, එක්කෝ දුසි දසුන්ගේ වරද, නැතිනම් දෙලොවම නසන ප්‍රලාප කිම නොව, අසල්වාසි දනයාගේ දුක් දන්වා ඊට ශකති තර මින්වත් උපකාර කරවීමට පුරුෂයා පොළඹවන සිරිත නිතර නිතර ඇහිකලාය. ඩොම්පුරුෂයාවද ඩඹිය ප්‍රිය භාර්‍යාවගේ මෙ කියමන් කණලු මඩු මෙන්වී; තම පවිල වෙතුවෙන් සපයන්නාවූ බත්තුල පවා දුක්පතුන්ට දිමේ වපිනා කම තම භාර්‍යාව තේරුම්ගෙන සිටීම නිසා, ඇට වඩ වඩා ආදරය වෙන සිරිතක්ද පැවැත්තුවෙය.

මේ වන්වති දැතින් පොල්අතු විසා දුක්පතුන්ගේ ගෙවල් සෙව්ලි කරගැණීමට නොමිලයේ සවන්නිය, ගෙදරට අපහසු අමාරුකට පැමිණ තිබියදීත්, අනුන්ගේ ඉල්ලීම් හැකි පමණකින් පිරිමිසන්නිය.

ලුණු පිළිබඳ ප්‍රවෘත්තිය.

දිනක් සවස් කාලේ අසල ගේකින් ලුණු වීකක් ඉල්ලා එවුවේය. මේ දවස්වල කොළඹ තඩේ ලුණු ගණන් උස්සී තිබුන නිසා, මොරවුවේ කඩවලද ලුණු නිහඬුනේය. පෝසොප් ද සොසියා මහතාගේ මේ ගෙදරද ලුණු ඉනාම නිහඬිය, නමුත් කරුණාවන්ත මෝනොමේ තිබුන ලුණුවලින් කොටසක් ඉල්ලා එවූ ගෙදරට යැව්වාය; වික වේලාවක් පසුව යන අතර, තවත් අසල ගෙයකින් එසේම ලුණු වීකක් ඉල්ලා එවනලදී. ඉතුරුකර ගෙණ තිබුන කොටස ඒ ගෙදරට යැව්වාය. එකල ගෙදර රෑ කෑම පිස ඉවර නමුත්, සම්භර වෑඤ්ජන වලට ලුණු ඇඹුල් ඇද්ද යනු සොයා නොබලා තිබුනේය. ඉල්ලා එවූ දෙපොලටම ලුණු දී අවසානේදී උයාපු ඇතට වෑඤ්ජන වල ලුණු ඇඹුල් පරීක්ෂාකර බැලූ කල, එක වෑඤ්ජනයකට ලුණු මදව තිබුන බව දැන සිනහාවී අසල ගෙවලත් ලුණු නිහ නිසා, මූදු වතුර මුසු කිරීමෙන් ලුණු රසය ගන්ට අදහස්කර **ජුවා** නම් කොල්ලා මූදු වතුර වීකක් ගෙණ එම පිණිස වැල්ලට පිටත්කළාය. ඌ මූදු වතුර ගේන්ට ප්‍රථම රත්නාපුරයට බඩු පටවා කරත්ත ගෙණ යන දසියානට කෙනෙක් ලුණු මලු හයක් ගෙණැවිත් "හෙව ගන්නතුරු මේ ලුණු මළු හය මෙහේ තිබුනාවේය" කියා තබා යන්ට හැදුනකල, මේ නෝනා මහත්මයා ඔහුට කථාකොට "දැයි අප්පේ අපටත් ලුණු නිහය" යි කිවාය; හෙතෙම "එසේනට, ලුණු මල්ලක් ගන්ට" ය කියමින් විටත්ව ගියේය. ජුවා මූදු වතුර ගෙණාකල මේ නොම සිනහාවී "ජුවෝ! ඔය මූදු වතුර දැන් ඉහින් ඔසිකරපන්, ලුණු වීකක් වෙනුවට මලු හයක්ම ලැබුනාය" යි කිවාය. ජුවාද මේ ගැණ සුදුමැති සිටියේය. ඉන් මල්ලක් උනා ලුණු ගෙණ ලුණු ඔදුව තිබුනු වෑඤ්ජන රසය සම්පූර්ණ කළාය.

ජෝසෙප් ද සොයිසා මහත්මයා මෙදින සැන්දෑවේ යම් කිසි උවමනාවක් සඳහා ගමෙම් ඇතකට ගොස් සිටි, කෑම් කන වෙලාවට ගෙදර ආවේය; පළමුව, පුරුදුලෙස ඉතා සැලකිල්ලෙන් සහ ගෞරවයෙන් පුරුෂයාගේ කෑම් සූදු නම් කොට දී, කෑමට පටන්ගත් කල කටකොනකින් සිනහවෙමී ප්‍රශ්නු සම්බන්ධ කථානන්තරය පුරුෂයාට කිවාය. ජෝසෙප් ද සොයිසා මහතා ඉතා ආදරයෙන් කථාකොට, ගෙදර ප්‍රයෝජනයසඳහා ඉහිරිවගිබුන ප්‍රශ්නික ගෙවල් දෙකකට බෙදුදීමේ ඵලය එවලේම ලැබුන මහිමය ගැන් වර්ණනාකර, මන්තවත් දුක්පතුන්ට උපකාර කිරීමට් අවවාද කෙලේය. මෙම නුවණැති නෝනා මහත්මයා කන්ට අතවගත් කෑමපිඩ පවා නොකා අනුන්ට දීපු තැන් අනන්තය, වසූ කෙලහාගත් ස්ත්‍රීන්ට වසූ දීමෙන්ද, හැවිට කෙලහාගත් ස්ත්‍රීන්ට හැවිට දීමෙන්ද, දුක්පතුන්ට අනන්තවිට සඛ්‍රහ කලාය.

මැගේ මේ උතකෘෂ්ට ගුණ කරණකොට ගෙන්, පුරුෂ යාටද අත දිගහැර දුක්පතුන්ට සඛ්‍රහ කිරීමට ඉව ලැබුන බව හොඳාකාර ඔප්පුවේ. එවැනට සිටි නුවණැති ජනයාගෙන් ලබනලද ඝනුති ප්‍රශංසා ඇතුව දිඝායුෂ වැලඳු මේ පුණ්‍යවනති මහඵකම නැමති බහණ්ඩ වෙළන ලද්දී, දේපල සහිත දරු මුණුබුරන් සහ දුක්පතුන් අතහැර ජන්මාන්තර ප්‍රාපනවූවාය.

කුඵණු බර ගුණ ආදී ලක්‍ෂණයෙන් දවස් යැව මේ චරහනගේ චර චරියාව අසන බලන සකල ස්ත්‍රීහු පරාජයම ඉවුකිරීමෙන් උගය ලොක ජයශ්‍රීය මුදුන් පමුණුවා ගණිත්වා!

PART III.

GATE MUDALIYAR

JRONIS De SOYSA.

නෙවන අදිසර.

ජ්‍රෝණිස් ද සොයිසා

වාසල මුදලි තුමා.

JRONIS DE SOYSA, ESQ., GATE MUDLIYAR.
ජ්‍රෝනිස් ද සොයිසා, වාසල මුදලිතුමා.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

FATHER

මෙතුමාගේ පියානෝ.

සොප් ද ඔඩිසා මහත් මයාගේ සහ හැන්නැදිගේ ප්‍රන් සිස්යා පීරිස් නෝනා මහත්මයා ගේ දෙවෙනි පුත්‍ර ප්‍රේන්ස් ද ඔඩිසා මහත්මයා, මෙතු මාගේ පියාණෝ. මේ මහතා උපන්නේ, ක්‍රිස්තු වසී 1797 තේ අප්‍රෙල් මස 19 වෙනි දින මොරවුවේදිය, දෙමළපියන් වසින් ගෙදරට ව්‍යවහාරයෙන් නාමය

බබාසිඤ්ඤෙසා, ප්‍රෝණිස් දොසිසා යනු, පල්ලි නෝමබුවේ පදිංචිකාල නාමය. එවකට පමණක් නොව, දැනට පවා නව දෙක දෙක වැවහාර කිරීම් වැදගත් සිංහල වනියා අතරේ සිරිතක්ව පවතී.

මොරවුවේ රාවහා වත්තේ පසෙක පිහිටි පල්ලිය නොඩැල්ලේ පන්සලට දෙමව්පියන් එසින් මේ ලමයා මහණ කිරීමට පූජා කර, එතැන් පටන් ශාසනු ඉගෙණීම සඳහා එම පන්සලටම යවනලදී. එවකට එම පන්සලේ වැඩ සිටියේ, මැද්දේ ගම **ධම්ම ඡෝති සථවිරඡන් වහන්සේය.** මේ සථවිරයානන් වහන්සේ, වෙදෑ ඡෝති ශාසනුාදිය හසල, සථවිර කෙනෙකි. බබාසිඤ්ඤො නොකඩව පන්සලට පැමුණුනා පමණක් නොව, හොඳ සිසුරු කමක් දක්වමින් ඉගෙණ ගැන්මට ආසාවකින් සිටියේය. මේ නිසා ගුරු හාමුදුරුවෝ සහ එම විහාර සථානයට එවකට ආගිය කවුරුත්, මේ ලමයාට මහත් ආදරයක් දක්වුවානුය.

බබාසිඤ්ඤො මහණ වීමට වඩා කැමති නැති බවත්, ගෘහසථ ධර්මයේ ක්‍රියාකුනු සඳහා වඤවෑන වීමට කැමති බවත් දුටු, ගුරු හාමුදුරුවෝ, වෙදෑ ශාසනු යන් ජොතිඡශාසනුයත් යන ශාසනු වය, ප්‍රයෝජන ගන්ට හැකිවෙන අන්දමට විඤතුරකොට මහන්සි ගෙණ ඉගැන්නුවාහ. කල් යාමෙන් මේ ශාසනු දෙක ප්‍රධාන ලිඛිත, ගණිතාදියද දැන ඉගෙණ, සැලප වශ යෙන් වෙදකම් කිරීමට පටන් ගත්තේය. මෙතැන් පටන් බබාසිඤ්ඤො වෙදරාළ, බබාසිඤ්ඤෝ වෙද මහත්මයා, යන නෙන් පළමුකොට මොරවු ගමේ ප්‍රකටවිය.

මේව වෙද මහත්මයා විසරු බලු විසටද, සනනි රෝගයන්ටද, විසූරියටද වෙදකම් කිරීමට ඉතා දඤව සිටියේය. විසූරිය සහ ජලසනනියට (කොලරා) ඉතා ප්‍රත්‍යඤ

විශෙෂ බෙහෙතක්ද * තනාගෙන් තිබුනේය. රොහා තුරයන් සුවපත් කිරීමෙන් බොහෝ ප්‍රශංසා සහ සුළු තෑගි ලොගද ලබමින්, නිහතමානීව විත කලක් මොරවුවෙම විසුවෙය. මෙවකට වෙද මහත්මයාගේ වයස අවුරුදු දහහතවත්, දහඅටවත් අතරේය. උඩරට අලඹකාරාදිය කරත්තකාරයන්ගෙන් අසා එහි ගොස් එමට නොයෙක් වර තම පියාගෙන් අවසර ඉල්ලූ නමුත් නොලැබුනේය. මේ ගැන තිතර හිතේ තබාගෙන් තමන් කැටුව කොහොම නමුත් වරක් උඩරට ගොස් එමට පියාගෙන් අවසර ලබා දෙන හැටියට කරත්න කාරසින්ට යාවඤ්ඤ කෙළේය. කරත්න කාරයෝ යටත්පිරිසෙසින් ජෝසොප් ද සොසිසා මහතාට මේ බව දන්වා, ප්‍රවෙශමෙන් එක්ක ගොස් එක්ක එන බවට හිවිස, ඉතා අමාරුවෙන් අවසර ගත්තෝය. මේ කාලයේ මහතුවර සහ අවට ගම් වල වසඹගහන රොග දුරුවාරේ පැවතුන බැවින් මෙම පුඤ්ඤ වෙද මහත්මයා සමග තුවර යාමට ඔවුන්ගේ ප්‍රවෙශම සඳහන් ඕනෑව තිබුන බැවින්, ජෝසොප් ද සොසිසා මහතාගෙන් අවසර ගැණීම මොවුන්වද අවශ්‍ය කෘත්‍යයක්ව තිබුනේය. බබාසිඤ්ඤා සමග තුවර යාමට අවසර ලත් කරත්තකාරයින්ට ඊට පසුවදාම තුවර ගෙණියාමට "කොන්ත්‍රාත්" බඩු රාශියක් ඉතා වැඩි ගණනට ලැබුනේය. කවදා වත් නො ලැබුන ඉතා වැඩි ගණනකට කොන්ත්‍රාත් බඩු

---

* මෙකී බෙහෙත.

වෂ 1854 ක්වූ ජනවාරි මස 10 වෙයි දින ලඹකා හිඛානය.

"කොලරා රෝගයට දෙන බෙහෙත් ගුලිය."

"කොලරා යන නමින් දැනට මේ රටවල මිනුස්සයින්ට හදිස්සි යෙන් මරණය පැමිනෙන්නාවූ භයානකවූ රෝගය පැමිණිවිට අය

රාශිය ලැබීමෙන් කරත්තකාරයෝ ඉතා සතුටට පත්ව, බඩු පටවාගෙන් බබාසිඤ්ඤෝ වෙද මහත්මයාත් කැටුව මහනුවරට යාමට පිටත්වුනෝය. මහ නුවරට ගැමුණි විහාර කිසි ප්‍රමාදයක් නොමැතිව පටවා ගෙන් ගිය බඩු ඉතා හොඳ ගණන් වලට විකිණී බඩු මිල කාරයින්ට මහත් ලාභ ලැබී කරත්තකාරයින්ට පොරොන්දුවට වඩා ගෙවිවෝය. බබාසිඤ්ඤෝ වෙද මහත්මයා සමඟ ආ ගමණ් ඉතා සාත්‍මික වුන බැවින්, කරත්තකාරයෝ ඉතා ප්‍රීතියට පත්ව වෙද මහත්මයා සමඟ නුවර සෑම තැනම ඇවිද හොඳ හැටි වෙද මහත්මයා සතුටු කරවා කොලඹ එමට අදහස් කළෝය.

මහනුවර දීද කොළඹට ගෙණ්එමට ඔවුන්ට බඩු රාශියක් එසේම බලාපොරොත්තු නුන වැඩි ගණන ගව ලැබී ඒ ගැණුත් ප්‍රීතිව, ඒ බඩු පටවා ගෙණ් කොළඹ එමට මහනුවරින් පිටත් වුනෝය. වෙද මහත්මයා ඉතා තීසුතුණු නුවණින් බඩු පැවතීම බඩු විනි ණීම ආදිය ගැණුද, මහනුවරට උවමනා බඩු ආදිය ගැණීද කලපනාවට ගෙණ්, තම අදහස් කරත්තකාර සින්ට නාඟවා සිටියේය. කරත්ත කොළඹට සේන්දු වුන දවසේම, ගාලු ගෙණයාමට බඩු රාශියක් එසේම වැඩි ගණනකට මොවුන්ට ලැබී, වෙද මහත්මයා එක්ක ආවාසින් වෙසා මහත් ප්‍රයෝජන ඔවුන්ට ලැබුනු බව

වලුනව, මෙහි පනත අන්සත් කරණ ප්‍රෝඡිස් ද සොසියා දියා නායක වාසල මුදියන්සේ වන මා විසින් අවුරුදු ගහනක ඔව දෙන්නාවූ අත් දැකලා නිවෙන බෙහෙත් ගුලි දෙවඟියක් මනුෂ්‍ය සින්ගේ ප්‍රයෝජනය පිණිස මෙසින් ළිදරවු කරන්ව මගේ ප්‍රසන්න තිබෙනවාත.

මෙම ළිදරව් කරණ බෙහෙත් ගුලි නම්.—

1 යකිනාරන් ඇට කොහොඹ ඇට යක් බේරිස ඇට යක් වනස්ස ඇට දෙකි ඇට දෙඩන් ඇට මුරුංගා ඇට කරාබු වසාවාසි සාදිකාය අඹින් සිනාක්කාරන් අරළු ඉඹුරු වදුනග සුදුළුණු නම්

ඔවුනොවුන් කථාකොට මේ ගමන්ම ගාල්ලවත් එක්ක යාමට අදහස්කොට, ලැබුන බඩු කරත්ත වලට පවවා ගෙණ පිටත්ව මොරටුවට පැමිණියෝය. මොර වුවේ ගැල් මුදු වෙද මහත්මයා සමග ගෙදරට පැමිණි ආගිය තොරතුරු කියා වෙද මහත්මයා ගාල්ලට එක්ක ගොස් ගාල්ලත් පෙන්වා නැවත මෙසේම ප්‍රවේශමෙන් එක්ක එන බවට පොරොන්දුවී, ජෝසෝප් ද සොයිසා මහත්මයාගෙන් ඊවද අවසර ඉල්ලා සිටියෝය. වෙද මහත්මයා නුවර ගොස් සුවසේ ආ නිසාත්, නුවර යාම තරම ගාලු යාම දුෂ්කර නොවන නිසාත්, වෙද මහත්මයා ගාලු යාමට සතුට ඇතෙව් නිසාත්, ඊවද, අවසර දුන්නේය. පියාගෙන් මේ ගමන්වත් අවසර ලැබුන වෙද මහත්මයා මේ කරත්තකාරයින් සමග ගාලු පුරයට පිටත්ව ගියේයි. ගාල්ලට පැමිණි කලද වෙද මහත්මයාගේ වාසනාවටමෙන් පටවාගෙණ ගිය බඩු නුවරදී මෙන්ම, මහත් ගණනකට විකිණී බඩු ගිමිසන්ට මහත් ලාභ ලැබී, එසේම කරත්තකාර ඔන්ට පොරොන්දුවට වඩා මුදල් දුන්නෝය. කරත්ත කාරයෝ වෙද මහත්මයාට ගාලුනුවරත් හොඳ හැපී පෙන්නා නුවර ගමනේදීත්, ගාලු ගමනේදීත්, ඔවුන්ට මහත් ප්‍රයෝජන ලැබුනේ, වෙද මහත්මයා සමග ආ නිසාසයි නිඃසැයකරගෙණ වෙද මහත්මයාට කෑගී

දුරු සුදු දුරු ගම්මිරිස් මෙක් බෙහෙත් අවුත් වාසින් සම භාග කිරා ගන ඉකුරු ඉස්මෙන් අඹරා ගම්මිරිස් ඇට පමනට ගුලිකර පවනේ ඊසලා වමනේට නොහොත් වමනේ සැහැල්ලුවට පෙරලිල්ලට දුනුකෙඹිසා බඩ සහ මුරුන්හා පොතු ඝසින්ද, ඊටම උක් පැහි ඕ පැහි ඉකුරු ඝසින්ද, තණිකර සැහැල්ලුවට උපු පිසලි ඝසින්ද, ඊටම ඕ පැහි සෙන්ද එක වරට ගුලි පහ බැගින් දෙනු. ඕවම කැවිල්ලට යක් නාරන් පොතු ලුනු අරණ් පොතු මුරුංහා පොතු ඕ පොතු ගෙන කඩ පිඹුරේ තම්බා ඇඹ ගැට ගැහෙනමාට පෙරලිල්ලට පස් තෙල් ගා කැවිලි කරනු. නමුදු මේ බෙහෙත් ගුලිත සෑදූ දින පටන් හමාසයකට වැඩිය පිළිවන්නේ නැහැයි හැල්පහා කරණවාය.

හක් දෙන්ට අදහස්කොට පහාහ විසිපහකට **පනා කුට්ටමක්** යැගෙන් තෑගිකලෝය. මෙසේ තෑගි කර සැලිප වෙලාවක් යන අතර නැවතත් කොළඹ ගෙන්ඒමට එසේම "කොන්ත්‍රාත්" බඩු රාශියක් මොචුන්ට ලැබුනේය. ඒ බඩු පටවා ගෙණ මහත් සතුටින් හාල්ලේ සිට මොරටුවට පැමිණි වෙද මහත්මයා පියාට බාරදී, ඔහුගෙ කොළඹ ආවේය. වෙද මහත් මයා පියාට සියලුම තොරතුරු කියා පනා කුට්ටමද දුක්කුවේය.

මෙසේ උඩරටගැණ සිතමින් වසනා අතරම වෙළඳුම සම්බන්ධ තොරතුරුද සොයමින් සිටියේය. "උතුසාහ වත්තයා කෙරෙහි ලක්ෂ්මි පැමිණෙනවාය" යන උපදෙසයමෙන් වෙළඳුම ගැණ තොරතුරු සොයමින් සිටි මේ තරුණ මහතා පළමුවෙන්ම ලුණු කහ මිරිස් දුම් කොල ආදී කන ද්‍රව්‍යත්තවල පටවාගෙණ ඉතා අමාරු අපහසු දරාගෙණ දුහසේ වෙළඳුම සඳහා වරුෂ 1825 හේදී පමණ උඩරටට ගියේය.

---

2 චෙනුව, දෙදුරු අසමෝදගන් නිප්පිලි ශ්‍රී චඞි ආගිවුඩයන් ඩිනක්කාරත් කොත්තමල්ලි වැල්මි වියලි ඉතුරු ජිරිස් කන්සා කොල මොනර විල් දවාගත් අලු යන මෙකී බෙහෙත් සම්භාගව කෙන එවා බරව අවින් බරක් ගෙන උක් පැහැසෙන් අඹරා තම්පිරිස් ඇට පවනව ගුලිකර පවනේ වියලා වරකව ගුලි දෙකක් බැගින් වවනේව උක් පැහැසෙන්ද, සැහැල්ලුවට අත්තිත්කා පොතු සුඹින්ද, සදහනෙන්ද ගිනිසමට නැබිලි කසපැන් දියෙන්ද කෝමාරිකා අලු කෙසෙල් බිල් සුඹින්ද දෙනවා හොඳයි. අත පය කෙඩා පෙර ලෙනවාට තුඹ කොල නිසා කොල කුප්පෙමිනිස යක් වනස්ස අත්තාන බිරුවා යන මෙකී කොල දෙඩන් ගැව සමඟ කොවා සස හෙන ඒ සුසට බෙහෙත් ගුලි පහක් දිස කර කහාරා ඇඟ සවිකරේ හලවනු. වදුලිය පොතු ලුනු අරන පොතු කුරුඳු පොතු බිරුඟා පොතු කහ ලුනු ලා කොවා පෝවියි බැඳ කඩිපිඹිමෙන් කැවිලි කරනු.

(අත්සන්කරේ) ජෝශියස් ද සොසියා.

මෙසේ වෙළඳුම සඳහා ගිය * වේ මහත්මයාට ඉතා දුක් පීඩා විඳින්ට සිදුවිය. අලුත් මාලුවක් සමග හෝ සෑහෙන ඵලවලුවක් සමග හෝ බත් කෑම නොලැබුනේය. බොහෝ විට මහනුවර යන ගමන්වලදී කන්ට සිදුවූයේ කරත්ත කාරයන් විසින් උයනලද කරවල සහ පොල් සම්බල් සහිත බත්ය. පැදුර වෙනුවට ගෝනි ඵලාගැන්මටද කොට්ටය වෙනුවට පිදුරු බිස්සක් තබා ගැන්මටද සිදුවුන වාර බොහෝය. ඝන සුලඟින් පෙළීමටද, නිදි නොමැතිව සිසිමටද, සිදුවූ වාර බොහෝය. ධීර පුරුෂ නෙම වේ එතෙකවත් මැලිනොවී, අපමණ දුක් පීඩා ඉවසමින් වෙර වඩවඩා වෙළඳුම දියුණුකර ගැනීම්ට මහත් පරිශ්‍රමයක් දැරුවේය.

දුනෙහි නියත ගතියද, දුක් කරණ්නොවගෙණ ඝිනට ලැබෙන කරදරද, දුනට බෙහෙත ඉවසීම බවද, ඊයම්ය කරණ්නොවගෙණ දුක නැති කිරීම හැකි බවද, දුක ලැබීමට හේතුව මුදල් ඝිහකම බවද, දුක් නො ලැබ සැප ලබන්ට බැරි බවද, දුකට පිහිටන්නා මහොත්තමයා බවද, වේ වෙද මහත්මයා මහනුවර යාමෙන් ඉගෙණ ගත්තේය. ඉදුම් හිවුට්, කෑම් පිම් ආදී සැප ඝිහරණ ගැණ සැරව නොසිතා, ලැබෙන ලැබෙන හැටියෙන් සැප දුක ඉවසා, පටන්ගත් වෙළඳුම් කටයුතු සඳහා ඊයම් කරගෙණ ගියේය. උඩරට යන ගමන්වලදී තමන්ගේ ප්‍රයොජනයටගිබුන එකම්බුලත්වීට, දුටකොල කැබෙල්ල, සුරුවිවුව, පවා අනුන්ගේ ප්‍රයොජනයට දීපු තැන් අනන්තය. වෙළඳුමෙන් සිතිසිසි ඵල ප්‍රයොජනයක් ඇතිවුයේනම්, එය සතරට බෙදූ තුන්කොටසකින් ලොකයා සත්ප්වන මහතු මනඃප්‍රසාදනය සහවාගෙණ ක්‍රියා කිරීමේ සත්‍යතාව තත්පරයෙන් තත්පරය වේ මහතාට පිළිසරණ වුබව පෙණේ. කඩුගන්නාව ආදී

* වෙළඳාම සඳහා උඩ රටට ගොරවුවෙන් ගිය පළමුවෙනි තරුණයා මේ මහතාය. 1870, අප්‍රෙල්, 23, ඔබසර්වර්.

දුශ් ස්වාභයන්හි කරත්ත කඳු නැංගවීම උවමනා කල්හි, සඛ කරුණාව ඇති මේ මහතා කරත්තකාරයන් සමග කැසපොට කවාගෙණ රෝද අල්ලමින් ගවයන්ට කරුණා කලහැන් අනනතය. මේ ගමන් වලදී මං පහරණ සොරු නොයෙක් විට මුන ගැසුන නමුත්, කිසිම විටක කිසි අනතුරක් මේ මහතාට සිදු නුවුයේය. සොර සතුරු භයගැණ රොමයක් පමණකුදු නො සලකා, සැම කල්හි ක්‍රියා කොලේය.

මෙසේ දිවා රෑ වෙහෙස ගෙණ උඩරට ගිය මේ මහත්මයා, එවකට පිදුරු සෙවිලි කල දැනට මහනුවර "කර්ක්" වීදියේ අඩක නමය (9) දරණ අරක්කු ගුදම, ප්‍රධාන වෙළඳාම්පොල කරගෙණ වෙළඳාම ආරම්භ කෙලේය. බර කරත්ත සහ වෙළඳාමට උවමනා ද්‍රව්‍යයන් ගෙන්ද තමා සන්තක මුදලින්ද, එවකට මේ මහත්මයාගේ පොහොසත් කම රුපියල් හත්අට සියයක් පමණයයි සිතන්ට කරුණු තිබේ. පළමුවෙන්ම වෙළඳාම පටන් ගත් පිදුරු ගේ සහ ඒ අවට තිබුන කුඩා පිදුරු ගෙවල් කීපයද, ගුණමලානම් උඩරට කෙනෙකුට හිමි ගෙවල්ය; පළමුව මේ ගෙවල් බද්දට ගත් නමුත්, පසුව මුදලටම ගෙණ, එකී පිදුරු ගෙවල් බිඳ හෙලා දැනට තිබෙන විශාල ගොඩ නැගිලි කෙලේය.* මෙම ගුණමුලා නයින තුරුම වෘත්තිදනයෙන් සහ වෙනත් උපකාර කිරීමෙන්ද සැලකුවේය. විටින් විට කොළඹට පැමිණීමෙන් උඩ රටට උවමනා නානා විධ ද්‍රව්‍ය සම්පාදනය කරගෙණ ගොස් වෙළඳාම කරමින් ක්‍රමයෙන් වෙළඳාමෙන් සුළු ප්‍රයොජන ලබන්ට පටන් ගත්තේය.

———:o:———

පනා කුච්චම "ලොහරයි" කිරීම.

සුළු ප්‍රයොජන ලැබෙන්නාක් මෙන්ම මේ කාලය හිරිහැර සහ කරදර සහිත කාලයක්ව තිබුනේය. වෙළඳ මේ

* මේ ඉඩම්වල හිමිකම මේතාක් ද සොයිසා පවුලට අයිතිව තිබේ.

දියුණුවට ලැබෙන සුළු ප්‍රයෝජන ඉතා මදව තිබේය. මේ කරණකොටගෙන් වෙළඳුමට උවමනා මුදල් ඉතා හිඟවූ බැවින්, කරත්ත කාරයන් විසින් ගාල්ලේදී රැගෙන් ත්‍යාගශාල පනා කුවිටම "ලොතරැයි" කිරීමට අදහස් කර, "නොවිමරය" පනාග දෙක බැගින් විකුණ තමාටත් "නොවිමරය" ක් තබාගෙන් පනාග පණහකට "ලොතරැයි" කෙළේය. සිව්වසි දෙනෙකු ඉක්මවා තමා තුන් වරට වීසිකළ දුටු කැටය වැඩි ගණනක් පෙන්නිමෙන්, පනා කුවිටම මේ මහනාටම හිමිකරවිය. මේ ප්‍රසාවට එහි එකතුව සිටියවුන් දෙබා ගෙන් නැව ත්ත් "ලොතරැයි" කිරීමට ඉල්ලූහ. ඊටද කැමත්ව පළමුයේ තමාවත් "නොවිමරය" ක් තබාගෙන් දෙ වෙන් වරටත් පනාග දෙක බැගින්ම, පනාග පණහකට "ලොතරැයි" කෙළේය. හේතු බලය අන්‍ය බල සියල් ලටම වඩා උසස්ව සිටිමේ සත්‍යයලෙස, දෙවෙනි වර වීසිකළ දුටු කැටය පළමු ගණනට වඩා ඉහළ ගණනක් පෙන්නා දිමෙන්, අනික් හැම දෙන පරාද කරවා පනා කුවිටම හිමි කාර මේ මහනාටම ආත්කර දුනිය. "අප්‍රාණික වශතු පවා හේතු බලය දුවුනැන ප්‍රාණික සව භාවයෙන් ජය ආත්කර දෙයි" යන ආයෝපදේශය මෙහිදී සැබෑ කළ මහිමය බැලුව මැනව! "ඉතින් කාපුවම කලක දිවි තිබෙන තුරු මෙම පනා කුවිටම ලොතරැයි නො කරමි" යි, එහිදී මේ මහතා එවලේම ප්‍රකාශ කෙළේය. මෙසින් ලැබුනාවූ ප්‍රතාග සියයත් වෙළඳුමට යොදූ, මුදල් හිඟව තිබුන අමාරුව බොහෝ දුරට සන්සිඳවාගෙන්, නැවත නැවත වෙළඳුම දියුණු කර ගැනීමට උත්සාහ දරන්ට පටන් ගත්තේය.

මෙම මහනාගේ සහෝදරවූ **ඔගානිස් ද ඔඩිසා** සහ **ලුඩිස් ද ඔඩිසා** යන මහත් වරු, තඹෙ බඩු විකිණීමට සිටුවිමෙන්ද, **පේදුරු ද ඔඩිසා** මහත්මයා උඩ රටට උවමනා බඩු ආදිය පටවා එවීම සඳහා කොළඹ නවත්වා ඕන්ද, තමා උඩ රට වෙදහට කිරිමෙහි නියුක්ත

වෙමින්ද, තරයේ වැසූ සමපොදුනයකිරීමට පවන්ගත. වෙද කමෙහි දක්ෂතාවය නිසා, උඩරට රදල මහත්වරු, නිලමේ වරු, කෝරාළවරු බොහෝ දෙනෙදු; පහත රටින් උඩ රට ගොස් සිටි වැදගත් මහත්වරුදු; මේ මහතා සමග මිත්‍රකම් බැඳ, ඔහු එපා කට ඉෂ්ට කර දීමෙන්, මහත් සේ උපකාර වෙන්ට පටන් ගත්හ. තම පියාට ඇතුව සිය නුවණ නුවණ යහපත් තරුණ පුත්‍රයා කෙරෙහිදු ඇති විය. සමහර කටයුතුවලදී ක්‍රියා කර තිබෙන ආකාරය හැණ කල්පනාකරන්ඩ හැකි, පියාට ඇතුව සිය නුවණට වඩා සිසුම නුවණින් මේ පුත්‍රයා ක්‍රියාකර තිබෙන බව මොනවට ඔප්පුවේ.

———:o:———

සරණ මඩගලාසය.

තරුණ වයසට සම්ප්‍රාප්ත යථොක්ත මහත්මයාව, සිරිත් ලෙස තරුණියක් පාවාදීමේ මඟුලාසය ගැණ වැඩි හිටියන් අදහස් කළ නැත, මොරවුඹේ ඉඩමේ සිසු **මුහු නන්නිසිගේ බස්නිසන් කුරේ මහත්මයාගේ** සහ **ලෂ්ගේ සිසු හැන් නැදිගේ ඉස්නිනා පිසිස් නෝනා මහත්මයාගේ** දිය සිය වන, **ප්‍රත්ඩිස්කා කුරේ** තරුණ නෝනා මහත්මයා සමග සාර බැඳීමට සතුටු බව යටත් පිරිසෙසින් වැසි හිටියන්ට, මෙතෙම දන්වා සිටියේය. එවකට වැඩි පොහොසත්කමක් නැති මේ පවිලෙන් හිර හැණීමහැණ, වෙද මහත්මයාගේ පසෙයේ වැඩි හිටියන් වඩා සතුටු නොවූ නමුත්, තරුණ **ප්‍රත්ඩිස්කා කුරේ** නෝනා මහත්මයාගේ කෙතුය සහ තමාගේ කෙතුය යන දෙකම සිතුම් වෙන බවත්, ඉහ සංයොගාදියේ හැපියට ධන සැපසීමට නෝනා මහත්මයාගේ කෙතුය රත්රන් ආකරයකට සමාන බවත්, තමන් දත් ශාස්ත්‍රයෙන්ම කෙතු දෙකින් දැන, මේ කතාබහතාව ගැණීම සරලෙස සතුට ප්‍රකාශකර සිටියේය.

මෙසේ මෙම නෝනා මහත්මයාම කාර බැඳීමට, විසි කළ නොහැකි තවත් වැදගත් කරුණක්ද හිතේ පැවතුනේය. එනම්:—මෙම නෝනා මහත්මයා ඔසප් කල ඒ ඵලාඵල දුනගඤ්ඤ කමනී එපස වැඩ හිටියෝ, මෙම මහත්මයාගේ ගුරුවර මැද්දේගම උන්නාන්සේකරා පැමිණියාහ. ඔසප්වීමේ නැකත පරීක්ෂා කර බලා, ඉස දිය දීමේ කල් වේලා නියමකර, ආ මුන් යන්ට හැර, උන්නාන්සේ මේ මහත්මයාට කථාකර, "බබාසිඤ්ඤෝ උඹ, දැන් ඉතින් මහණ නොවන කලපනාවෙන් සිටින නිසා, මීට පින වෙලාවකට ප්‍රථම ඔසප් නැකත ගුඩකර ගැණීමට මෙහි ආ, ඇත්තන්ගේ ඒ ගෑණු ලමයා, උඹේ භාර්‍ය්‍යා කොට පාවා ගණිත්, උඹේ කෙළුය මා දන්න නිසා එසේ ඉඟ කර ගැණීමට ලැබුනොත්, මේලොව උඹේ ජීවිතය ඉතා උසස් ලෙස පසු කිරීමට හැකිවෙනවාට අනුමාන නැතිබව මට හොඳසේ වැටහේ" යනු වදුරා හිඹිමය.

එවකට මොරටු පලාතේ ඇතුව ත්‍රය සිරිත් ලෙස මඬහලෙනසවය පවන්ගෙණ දෙපසෘය සමඟි සතුවින් මඟුල් කෑවානුය. මනමාලමහත්මයා සහ මනමාල නෝනාමහත්මයා සම්බන්ධ සිරිත් උලලඞ්ඝනය නොකොට පෝරුවේ සිටුවීම, අඟක කියවීම, බුලත් ගුරුළු දීම සහ හේලේ කඩ්ඩිය දීම ආදී කටයුතුද, කැවිලි පෙවිලි සහිත බත් සහ ව්‍යඤ්ජනද, සම්පාදනය කර සඞ්ග්‍රහ කිරීමද, දෙපසෘය විසින්ම හොඳින් පවත්වන ලදී. වෙන දෙයක් නම් ඒ කාලයේ මඬහලෙනප්‍රසාධ වසන්ගිදී ඝනතරලෙස පවත්වාපු දෙමළ බෙරෙන් ගසන ලද දෙනාලයද, ඒ නාලයටම පය නම් නටන "නෝනංගියා" ගේ නැටීමද මේ මඬහලෙනසවයේදී අත හැරී නොගිය බවද පෙණේ. මෙසේ ඒ කාලයේ හැටියට උසස්ලෙස මඟුල්කා, ඉවරවූ පසු, නැවතත් උඩරටට පැමිණ කළ යුතු වෙලඳාම ආදියෙන් මහත් ප්‍රයෝජන ලබන්ට පටන්ගත්තේය.

මෙවැනිම එම මහතාගේ සහ එම නෝනා මහතාගෙන් මහත් වාසනා බලය කරණකොටගෙණ ආණ්ඩුවට දර සහ වියදා, හාල් සහ වෙනත් ද්‍රව්‍යාදියද සම්පාදනය කිරීමෙ නිවසුට වලට බැඳී, ඒ ලියවිලි වලම කිසි බිය සැකක් නැතිව අත්සන් කෙළේය. නියම දින වේලාවට මේකී දෙය ආණ්ඩුවට ඉතා විශ්වාස ලෙස සහ කඩිසර ලෙසත් සම්පාදනය කිරීම ගැන් එවැනට බඹෑම දිශාවේ ආණ්ඩුවේ ඒජන්තවන **ගරු. ජෝර්ජ් ටර්නර්** තුමා ටෙ සාමූ ගුණ ඇති විශ්වාසික මහතා යෙරෙහි මහත් කරුණාව උපදවා ආණ්ඩුව සමග කරණ ගත්තු දෙනු වලදී බොහෝ පහසු ගෙණ දුන්නේය.

——:o:——

පළමුවෙනි දරු උපත.

ක්‍රිසතු වරුෂ 1836 යේ මාර්තු මස 3 වෙනි දින ශ්‍රෝණිස් ද සොසිසා නෝනා මහත්මයා, නෛසර්ග ලක්‍ෂණයන්ගෙන් හෙබියාවූ **චාර්ල්ස් හැන්රි ද සොසිසා** නම් උතුම් පුත්‍රරත්නය, මොරටුවේ සුඛකිය දෙමව් පිය නිවසෙහිදී ප්‍රසූත කළාය. ප්‍රසවයෙහිදී ඇතම් ගබ්හිණීන්ට පැමිණෙන විශෙෂ බිසකරු පීඩා ආදියක් සිදු නො වීමද, ටෙ දරුවා සුව පත්ව බිහි වීමද, පිය තුමාට අත්‍යන්ත සතුටු දායක කරුණක් විය. මව්ට සහ ලදරුවාට ඒ වේලාවට උවමනා සුළු ඖෂධාදිය, මැද්දේ ගම සුවිර යන් විසින් කරණ ලදි. ගුරු වදන් ලෙස සහ තමා දැන ගත් ජොතිශාස්ත්‍රය කරණකොට ගෙණ, පින් ඇති භාග්‍යවක් ලබාගත්තාන් මෙන්ම, සුඛකිය ප්‍රිය භාග්‍යවම හා සුරතල් දරුවා සුවපත් කර ගැණීමටත් තමන් දැන සිටිය වේදය තෙමය, ගුරුවරයා හා එක්ව විමසා සෙදීමට ඇතම් තැනකදී ඉඩ ලැබීම, ඉතා ප්‍රශංසා කටයුතු ක්‍රියාවක්වා සමණක්නොව, ප්‍රයොජනවත් ශාස්ත්‍රා දැන සිටීමේ ඇති මහත් ඵලයද ඵලිදරව් හිමට හේතුවිය.

රත්රන් ගේ තුළ දුල්වූ මිණි පහන වෙන්, ධන සම්පත්ති යෙන් පිරි තිබුන ගෘහයට පින්ඇති දරු සම්පතක් පලමු වෙනිවර ලැබීම, තව දුරටත් මහත් වාසනා වෙරීමට පුළු නිමිත්තක් වූයේය. පියාට පුත්‍ර ප්‍රේමය සඞ්කීය හාද යෙහි හට ගත් වහාම, ලොකයා තෙරෙහි තිබුනාට වඩා මහත් කරුණාවක්ද හටගැණුනේය. මේ පර මොහොතට කරුණා මහිමය, මේ මහත්මයාගේ සහ සඞ්කීය පරම්පරාවගේද, ලොකයාගේද හිතාහිවෘඞ් කීර්ති ප්‍රශංසා පිළිබඳව වෙතාක් පවත්නා බව සත්‍යයකි.

———:o:———

ද සොයිසා පවිලේ ජය ගුම්ස.

———

මේ කාලයේ උඩ රට කෝපි වැවීමක් වශයෙන් නොපැවතුන. ඉබේ කෝපිගස් වැවී පල හට ගෙන එකී පල, ගස් මුලම ඉදී වැටෙයි. මේ නිසා කෝපි එවකට උඩ රට සිංහලයින් අතුරේ අගය නොවිය. මේ බව සැලව හිය ඉංග්‍රීසිනු ආණ්ඩුව සමග සාකච්ඡා කොට උඩ රටට පැමිණ කෝපි ඇති ඉඩම් මැන්න පිමටත් මුදලට ගැණීමටත් පටන් ගත්හ. පුස්සැල්ලාවේ කෝපි සහිත ඉඩම් ඉංග්‍රීසින් මිලේට ගන්නා ප්‍රවෘත්තිය උඩ රට සෑම තැනම පැතිර යාමට පටන් ගත. උඩ රටට ඉංග්‍රීසින් පැමිණ ඉඩම් ගන්න බව සැලවූ හඟරන් කෙන වාසින්, භයට පත්ව සිංහලේ රජ්ජුරුවන් විසින් පත්කර සිටි, ඉනා වයස් ගත කැලෑ කෝරාළට මේ බව දන්වන ලදී. හඟරන් කෙන පලාතට ඉංග්‍රීසින්ගේ ඊම නවත්වාලීම ගැණ කැලෑ කෝරාළ අදහස් කොට හැරම්පිටි වාරුවෙන් ප්‍රෝක්ටර් ද සොයිසා මහත්මයා (බබා සිඤ්ඤෝ වෙද මහත්මයා) සොයා ගෙණ මහනුවරට ආයේය. සොයිසා මහත්මයා කැලෑ කෝරාළ ආදරයෙන් පිළිගෙණ ඉනා සැලකිලි ලෙස ගරු සත්කාර පවත්වා, තෑගි පිටි ආදියෙන් සඩිඟුණ

සර ආ නොරතුරු ඇසුවේය. "ඉංග්‍රීසින් මෙහි පැමිණ කෝපි වැඩීම සඳහා ඉඩම් ගැනීමට අදහස් කර, දැනට සුස්සැල්ලාව පලාතේ ඉඩම් මන්නවන බවත්, මිහ හමාර කරවන ලදු ඉඩම් ආණ්ඩුවෙන් සහ වැසියන්ගෙන් මුදලට ගන්නා බවත් සැලව තිබේ; සුදු මිනිසුන් අප පදිංචිව ගතුරන් කෙත පලාතට එමට ඉඩ දුන්නෙමුනට, මුලු දිය තලාවම අත් කර ගන්නවාට අනුමාන නෑ, එසේ වුනොත් අපගේ බවලත් උදව්යට සහ ගෘහ දරුවන්ටත් මහත් කරදර සැලසෙන්ට සහ අපගේ ජීවිත විනාශයටද කරුණු පැමිණෙන්ට පුළුවන් නිසා, වෙද මහත්මයා මේ ගැන කලපනා කොට ගතුරන් කෙත ඉඩම් ආණ්ඩුවෙන් ඉල්ලා මුදලට ගැනීමට උනන්නාහ දැරිය සුතුය. එවමනා වුනොත් මේ සඳහා වෙන ගිහ පාඩු අපි කිප දෙනෙකු හෙළුන් ලබන හැකැ," යනාදිය කියේය. මේ කථානන්තරය ඇසූ වෙද මහත්මයා, කැලෑ කෝරාළට බොහෝසේ සතුති කොට කරත්තයක් බන්දවා පිටත් කර හැර, ගතුරන් කෙත රාජකීය කෝපි වත්ත නම් කැලෑව වෙන්දේසිකර විකුණනවාදැයි ඒජන්තතුමා හෙන් ඇසුවේය. ඒජන්තතුමා එය වෙන්දේසියට නියම කරණ බව කියමින්, පිට නෑර ගැනීමට වචනයෙන් ධෛර්යයද දුන්නේය. කැලෑ කෝරාළගේ ඉල්ලීමත්, ඒජන්ත තුමාගේ ධෛර්ය දීමත් මේ මහත්මයාගේ හිතට දැඩලෙස වැදී, වෙන්දේසියේදී ඉඩම් පිටනෑර ගන්ටම ඕනෑ යයි සිර ලෙස සිතුවේය. ඉඩම් මැන වෙන්දේසි කරණ දින වේලාව නියම කළ කල්හී, වෙද මහත්මයා එවකට හැදින පිළිවෙළට සුදු රෙද්ද සහ "හෙන්ත්‍රක්කයත්" හැඳ මහතුවර කච්චේරියට පැමිණියේය. වෙන්දේසිය පටන් ගත් කල ඉංග්‍රීසින් සමඟ අක්කර හාරසිය දෙ අසූවකුත් පර්චස් අට තිසක් ප්‍රමාණ (අ. 482. ප. 38.) **දිසඟලා කන්ද** නම් ගතුරන්කෙත පුරාණ රාජකීය කෝපිවත්තාක්වූ එවකට කැලෑව මෙන් පෙණුන ඉඩම් තරකයට මෙන් ඉල්ලන්ට පටන්ගත්තේය.



THE PLAN OF DIYATALAKANDA, HANGURANKETA.

හඟුරන්කෙත දිඹනලා කන්දේ භූමි සටහන.

CINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

ඉංග්‍රීසිහු ඉඩම ඉල්ලාගෙණැත්ත "මේ සිංහලයාගෙන් නැවත ඉතා ලෙහෙසියෙන්ම ඔහු ගත් ගණනට අපට ගන්ට පුළුවන් වෙය" යි යන බලවත් විශ්වාසයෙන් නො ඉල්ලා ඇත්යාය. වෙදමහත්මයා අත්කර 482 පර්චස් 38 ම පවුම් හාරසිය එනොලොසකුත් සිලිමකට (පවුම් 411. සිලි. 1. ට) එවකට මහනුවර කච්චේරියේ මුදලි තනතුර දැරූ හැන්රි අල්විස් මුදලිතුමාට නොවසක් තබා වසි 1837 තේ නොවැම්බර් මස 4 වෙනි දින සිතියමෙන් පෙණෙන **දිසහලා කන්ද** නම් රමණීය භූමිය මිලදාට ගත්තේය.

ඉඩම ගත්තාට පසු ඉංග්‍රීසිහු, වෙදමහත්මයා ගත් ගණනට ඉල්ලුවාහුය. එසේ නොදෙන බව දැන, ගත් මිල ගණන මෙන් දෙඟුණයක් දෙන්ට ඉල්ලූහ. එසේද වුවත් නො දෙන බව සිර ලෙස දැන, නො ඉල්ලා කරබා සිටිය විපාකය ගැන දෙමිනස්ව යන්ට ඔයානුය. මෙවකට ලඞ්කාණ්ඩුකාරයාව සිටි, **සර් රොබර්ට් බ්ලම්ෆී හෝර්ටන්** උතුමානන් වහන්සේට ඒජන්ත තුමා විසින් මේ බව දන්වා, ගත් ඉඩමට ලැබිය සුදු ඔප්පුව උප ලේකම් වන ජී. ඊ. චුඩ් හඩුස් තැනගේ අත්සන පිහිටුවා කොළඹ මහ ලේකම් කන්තෝරුවෙන් ලබා දුන්නේය. මෙසේ ආණ්ඩුව සන්තකව තිබුන හඟුරන් කෙත රාජකීය කෝපි වත්ත නමින් ප්‍රකට, මෙම කැලෑ සහිත විශාල ඉඩම, මුදලට ගෙණ උත්සාහයෙහි පමා නොවන පුරුදු ඇති මේ මහතා, හඳුල්කාර මුදලි තුමාට වැටහෙන මුදල ගෙවා, කැලෑව එලිකර දර සපයන්ට පටන් ගත් හල, එය පුරාණ රාජකීය කෝපි වත්තක්වනුබුන බැවින් ඉන් වැඩි කොටස ඉබේ වැවුන කෝපි ගස් වලින් ගහන් බැව් පෙණී ගියේය. මේම ගස් ඇවලප වශයෙන් කප්පාදු කල පසු, පල දරන්ට පටන් ගත්තෙන් පළමු වෙනි වතාවෙම කෝපි පල සහ එම පැල විකිණීමෙන් වත්තට දුන් මුදල පමණක් නොව, තවත් වැඩියෙන් මහත් මුදල් ලක්ද ලැබිය. මෙම මහතාට සිර ලෙස ධන අත්පත් මම පටන් ගැණීමට මුල්වූයේ මෙකී **ජය භූමි** භාගයය.

සැලළු වැසෙන හා සමානවූ මෙම කෝපිගස් සමූහය **දෙවිසන්වද, රජුන්වද, ද සොඩිසා පරම්පරාවටද, ලොක** සාවද ඉන වැඩ පිණිස දීඝ කාලයකට නොනැසෙන රත්රන් පල හා සමාන **කෝපි පල** චරින් වර දුනය කෙළේය. අනෝ! පරහට දයාව ඇති මෙම මහතාටම මේ ආඥාවෙමින් වැතුව ලැබුන මහිමය බැලුව මැනව! මේ නිසා උඩඟු නොවූ සින්වත්හා, වැඩි දුරටත් ලොකොප කාරය සඳහා ධන සපයමැයි සිතා, මේ අතරතුර අරක්කු ථේන්දසද පාලම නොවුපල් ථේන්ද ආදියද ගත්තේය.

———:o:———

කපු වත්තේ ප්‍රවෘත්තිය.

කොළඹින් උඩ රටට පැමිණ සිටිය ඕගෙල් සිල්වා නම් තෙනෙක් ඉංග්‍රීසිකාරයෙක් හොවසතට කබාගෙණ කපු වැවීමට, පුස්සැල්ලාවෙන් ඉඩමක් ගත්තේය. තම හොවසට වැටහෙන මුදල පසුව දෙනවායයි ඉංග්‍රීසිකාරයා කී කල, සිල්වා මහතා එය අදහා ඉඩමට දිය යුතු මුදල ඉඩම් අයිතිකාරයාට දී දැමුවේය. ඉංග්‍රීසිකාරයාගේ ගුරු කවිට කපු පැල මිලයට හෙන්වා තවන් නෙලේය. අවා සනාවටමෙන් ඒ දවස්වල පැවති නද සුසම්‍රශමීය කරණ කොට ගෙණ, මේ වැවිල්ල බලාපොරොත්තුව ලෙස හරි නොහිඳේය. මේය හරියන්නේ නැති බව දැනගත් සුද්දා, කොළඹ හොස් එන බවට පොරොන්දුව ඕගෙල් සිල්වා මහත්මයාගේ චියදමෙන්ම කොළඹට පැමිණ, කිසිවෙකුටත් නොදන්වා නැවිනැඟ සිසපුර යන්ට ගියේය. ඕගෙල් සිල්වා මහත්මයා සුද්දගේ කිමිවිට වැවිල්ල පටන් ගත්තා මිස, ඔහු ටේ වැවිල්ල ගැණ කිසිවක් නොදැන සිටියේය. සුද්දගේ කිම වළි ගෙණ පටන් ගැන්මෙදීම මහත් මුදලක් චියදම් කිරීම කරණකොටගෙණ නය වීමෙන් නිකමගට පත් විය. මේ ගැණ කිසි කරණක් නොමැති ඕගෙල් සිල්වා මහත්මයා, ප්‍රෝණස් ද සොඩිසා

මහතා සොයාඇවුත්, සිදුවූ ප්‍රවෘත්තිය දන්වා චත්ත උකසට තබා ගෙණ පතාග දෙසියයක් නයට ඉල්ලූහ්ත්; මේ වැවිල්ල සම්බන්ධ ගුරුතම් දෙන හැටියටද යාවිසූවුනේය.

පරෝපකාර මහතා උකස කමක් නැතැයි සිතා පතාග දෙසිය අතට දී, ඒ කාලයේ තමන් දුන හිටිය හැටියට වැවිල්ල ගැණ කාරණා කියා විවත් කෙළේය. මිගෙල් සිල්වා මහතා ද සොයිසා මහත්මයා කී ලෙස වැවිල්ල සම්බන්ධ ක්‍රියාකිරීමට පටන් ගත්තේය. වරඹාවද ලැබී වැවිල්ල සරු කර ගැනීමට ඉඩ ලැබුන හෙයින්, මිගෙල් සිල්වා මහතා ප්‍රීතියට පත් විය. පලමුවෙන්ම ලැබුන කපු වටු නෙලා මෙලා පුලුන් රැගෙන් කුඩා ශිරෝධානයක්කොට, එය සමග බුලත් පුවක් සුදි සිනි, තැඹිලි, කැවුම්, කෙසෙල්කැන්, ආදියාත් ගෙන්වා ගෙණ සිල්වා මහතා හඟුරන්කෙත චත්තට පැමිණ, ද සොයිසා මහතා බැහැදූක කපුවත්ත සම්බන්ධ තොරතුරු දන්වා ශිරෝධානය සතුටු පඩුරුකොට දුන්නේය. ද සොයිසා මහතා සහ එම නෝනා මහත්මයා මිගෙල් සිල්වාට හොඳ හැටි අනුග්‍රහ කොට යන්ට හැරියේය. මිගෙල් සිල්වා මහතා මීටපසු වතුකාර ඉංග්‍රීසි මහතෙකුට මේ කපු චත්ත උකසට තබා මුදල් ගෙණ තව දුරවත් විසඳා කර ගෙණ එන කාලයේ උණ රොගය වැළඳී එම චත්තේදීම මිය ගියේය. චත්ත උකස කිමියා සතානක විය.

———:o:———

මිනිස දුරකොහපනහිස.

මේ කාලයේ මේම මහතාගේ නෝනා මහත්මයා දුරි ඇතුව සිටියාය. මදි මදි අසනීපකටද ඇති විය. ප්‍රසූතය සඳහා හඟුරන් කෙත චත්තේ සිට කොළඹට හෝ, මොරටුවට හෝ එමට මෙම කාලය ක්‍රුසුදුසු බැවින් රට තව සුදු සුදුනම් නොට චත්තේ පදිංචි නිවසේදීම

ප්‍රසවය සිධවෙනවාට, ද සොයිසා මහතා සතුටින් සිටියේය. නෝනා මහත්මයාද, ඒ ගැණ ශෙෂ භයක් නොමැතිව සිටියා පමණක් නොව, එසේම හඟුරන්කෙත වත්තේ ස්වකීය නිවසේම වැඩි අපහසුවක් නොමැතිව විජය ගෘහිණිය ප්‍රසූත කළාය. මෑනියන්ට සහ දරුවාටත් උවමනා බෙත් ආදිය මෙම මහත්මයා අතින්මකර මව සහ දරුවත් සුවපත් කර ගත් නමුත්, දරුවාට එකොළොස් මස් වූකල හදිසි අතිසාර රෝගයක් වැළඳී මිය ගිය බැවින්, ඒ මෑත දෙහස හඟුරන් කෙත වත්තේම වළ ලෑමට සිදු විය. * මවට සහ පියාටත් දරුවාගේ මරණය ශොකජනක කරුණක්ව තිබුන නුමුත්, ස්වභාව ධර්ම ගැණ කල්පනාකොට විදුක ක්‍රමයෙන් තුනී කර ගත්හ. මෙහිදී මෙම මහතාට සහ නෝනා මහත්මයාටත්, දරු දුක බොහෝ දුරට තේරී ගිය බැවින්, වඩ වඩා දිලිඳුන්ට උපකාර කිරීමටද, වෙසෙසින් දිලිඳු දූරි ඇත්තියන් ගැණ සැලකීමටද පටන් ගත්හ. මෙසේ කුශලදහමින් සහ ඉතා ප්‍රේමයෙන් කල් යවමින්ද ලොකයාට උදව් කරමින්ද මෙම කුටුම්බ සුවසේ විසූහ.

———: o :———

උඩ රට වැව් අමුණු සහ මංමාවත් ආදිය සමුඞ කිරිම.

මෙසේ අප්‍රමාණ කුශල ක්‍රියාවෙහි යෙදී සිටිය ලොකොපකාර මහතා, එපමණකින් නිශශබ්ද නොවී, මසිලපිටියේ සිට හඟුරන් කෙත දක්වා කරත්ත පාර තනවා දීමට අදහස් කර, එය මැන දෙන හැටියට සීප දෙනෙකුගෙන් ඉල්වීය. එවකට මසිලපිටියේ සිට හඟුරන්කෙත දක්වා ඝන කැලෑව සහිත කවූලැහැඩින්ද, වල්අලි, වල්ඌරු, සපාදීන් ගෙන්ද

* මෙගල් ඔල්වා මහතා සතුව පවරු නොව දූන් ශීලොරාධානය මේ දරුවාගේ [illegible] තබා වළලූ බව දැනගතිමු.

බිය විය යුතු ආකාර පැවතුන හෙයින්, කිසිවෙක් එට ඇතුල්ව මගීන්ට සතුටු නුවූයේය. වීර වික්‍රමැති මේ මහතා මීට පසු බට නොවී, බිය සැක නැතිව ලී "කෝදුව" සූරහින් රැගෙණ, හුදකලාව වනලැහැබ වදිමින් කැලෑව මැන, පාර මාර්ග කොලේය. මේ පාර මාර්ග කර කැලෑ එළිකරණ කාලයේ * මනුෂ්‍ය කයකින් නො ඉසිලිය හැකි දුක් පීඩා රාශියක් මේ පරාර්ථක මහා සත් පුරුෂයා විසින් උසුලනලදී. මෙසේ අක්කරයක් පවුම් හය සියයකට නමුත් නිම කරන්නට අමාරු හැතැප්ම දෙකහමාරක් පමණ දිසි මාර්ගය නොබෝ දින ගණන කින්ම අවසාන කරවා, එහි ගමනා ගමනය කරන්නා වුන්ට සහ කරත්ත ගෙණ යන්නාවුන්ටද, සුවසේ යාම ඊම සලසා දුන්නේය. මෙම මහතා තමාගේ ජීවිතය ගැණ නොසලකා අන්‍යයන් රක්‍ෂා කිරීමට කැමති මහ සාධු සත්පුරුෂයෙක් බව මෙහිදී පළමුවෙනි වරට ලොකයා පිළිගත්හ.

තවද හාර ගම කොලොන් ගහ තොටුපලේ සිට මා ඔයේ තොටුපල දක්වා, හැතැප්ම දහයක් ප්‍රමාණ කරත්ත පාර තනවා දීමට ලොකු මුදලක් වියදම කල බවත්, එහි ගමනා ගමනය කරණ දහස් ගණින් සේනාවට එය මේ වනතුරු විපුල ප්‍රයොජනවී තිබෙන බවත් ප්‍රකටය.

උඩ රට ගොණ ගම වැව, මල්බළුවාවේ වැව යන වැව් දෙක බඳවා දීමෙන් ප්‍රමාණාතික්‍රාන්ත යහපතක් ඒ පලාත් වාසීන්ට කර දුන්නේය. මෙය කොයි තරම් දුරට ප්‍රයොජනවත් වුනාද යනු ඒතාක් දුකසේ ගොඩ බිම වපුරණලද කුරහන්නම ධාන්‍යයෙන් ඉතා දුක සේ ජීවත්වුන එගම්වාසී ජනයාට බත් ලබා ගැණීම

* මේ පාර තනන අවදියාවේ වල්අලි වල්හූරු ආදි විපකොර සතුන්ගෙන් ගැලවීම පිණිස ඒ අසල තිබුන මහ සියඹලා ගහක අට්ටාලයක් බැඳ රෑ කාලය එහි ගත කලේය. මෙම ගස මිනිලවිපියේ ගාල සමීපයේ මේතාක් තිබේ.

සඳහා මෙ කල උතුම් කටයුත්ත අත්‍යන්තොපකාරවීමෙන් ඔප්පුවිය. එගම් වාසීනු, මෙය සිහිපත් කරමින් සිය අත් ඔසවා සන්තොෂව මහතාට මෙ දවසදක්වා පින්දෙන බව කවුරුත් දන්නා ඇත්තක්ව පවතී. මෙ පලාත්හි ගමනා ගමනය කරණ මහත් සෙනාවගේ සැප විහරණය සඳහා, එසේම මහත් මුදලක් වියදම්කර හාරගම් තිබ්බාවුවාවෙ වත්තේ අම්බලමක් සාදවා දීමෙන් සුළු පවු නොවන සහපතක් කර දුන්නේය.

හෝනා වත්ත නලාතුඹය, නාරන්විට, යනාදී පලාත් වල පාලුවී තිබුන කුඹුරු, අස්වද්දා ගැනීමට වැව අමුණු කරවා දීමෙන් දහස් ගණන් සේනාවට කල මහොපකාර ගැණ ද සොයිසා නාමය ගරුකොට සලකා පින් දෙන් නෝ දහස් ගණන් ඒ පලාත්වල මෙතාක් ජීවත්ව සිටින්නාහ.

හඟුරන්කෙත වත්ත ගෙණ එම වත්තේ කෝපි ගබඩා සහ පදිංචි ස්ථානද තැනවීම සඳහා ඒ අසල "දිය බුබුලේ ගෙදර" නමින් එවකට ප්‍රසිඬ, දුක්පත් නිවෙසක මෙම වෙද මහත්මයා නැවතී සිටියේය. එම නිවස වාසී, මෙ මහතා ගැණ කලකී සැලකිලි නිසාද; කලක් නවාතැන් ගෙණ සිටිය නිසාද; කල ගුණ සැලකීමක් වශයෙන් ඔවුන්ට සහ ඔවුන්ගේ පරම්පරාවෙන් පැවතෙන්නන්වද බොහෝ උපකාර කලේය. මෙ මහතා ජීවත්ව සිටිනකල මොවුන්ගේ පරම්පරාවේ අය ඉක්මන්ලෙස මිය යන්ට පටන් ගත්තෝය. මෙ මහතාගෙන් පසුව ඉතුරුව සිටිය තුන්හතර දෙනාටද ඔවුන්ගේ ජීවත් වීම තිබෙන තුරුම, ද සොයිසා පවු ලෙන් උපකාර ලැබුනේය. දැනට හඟුරන්කෙත "පොත් ගුල් විහාරස්ථානය" නමින් ප්‍රසිඬ විහාරය ගොඩනැඟීමට මෙතෙම එම ඉඩම පිදුයේය. එම විහාරය ගොඩ නගා එහි ප්‍රධානත්වයට අත්දස්සි නම් ස්ථවිර කෙනෙක් පත් කරණ ලදී. මෙම ස්ථවිරයානන් වහන්සේ මෙ මහතාට ඇතුව සිටි කරුණාව අතිශයින් මහත්ය.

වාරගොල්ලේ විශාල කුඹුරෙන් ලැබෙන මහත් ඵල ප්‍රයොජන මේ මහතාගේ නියමය පරිද්දෙන් දැ සොයිසා පවිල මොහොක් පිණට දිගණ් එන්නේය. පොහෝ දිනයන්හි පමණක්නොව, අන්‍ය දිනයන්හිදැ, වඳුනාකාර පිරිස විහාර ස්ථානයන්ට පැමිණ මල් පහන් පූදකර යන ගමන්, හතුරන්කෙන වන්නේ නිවසට පැමිණ මේ මහතාගේ ඡායා රූපයට වැඳ පින් දී යන සිරිත අද දක්වා පවතී.

මේ මහතා ක්‍රිස්තියානි ලබඩිය වැළඳගත්තාවපසු, හතුරන් හෙත බාල දරුවන්ගේ ශාස්ත්‍රොදග්‍රහණය පිණිස පාඨ ශාලාවක්ද ස්ථාපිත කොට, කතිසේරු කෙනෙකුගේ මාර්ගයෙන් වැඩ කිරීමට චර්ච මිසියොනාරිස් සමාගමට බාර දෙනලදී.

ලක්දිව නොයෙක් පලාත්හි වසන නොයෙක් ජාති දිලිඳු ජනයා පැමිණ, තම තමන්ගේ දුක් සහ පීඩා දන්වා සිටිය සියලුම ප්‍රයත්නවලදී, ඔවුන්ට ප්‍රයෝජන වෙන ආකාර ධන පරිත්‍යාග කිරීමෙන් සතුටු කල බව ඉතා ප්‍රකටය. දිලිඳු පවුල්වල තරුණියන් දිග දිමට හැපි නැත කියා පැමිණුන කිසිවෙක් නිස්අතින් නැරිය බවත් * ධනයෙන් පමණක් නොව වෙනත් ඔවුන්ට උවමනා රන් ඊදී

---

* ඉතා පොහොසත්ව සිටිය උඩ රට පවුලක් අසරණ භාවයට පත්ව, දුවක් අතහැර මුදල් නැති බැවින් එම පවුලේ ප්‍රධානියා වන, බුත්කල මුදියන්සේලාගේ පියිරි බණ්ඩාර මහත්මයා ලෝඩ්ස් සොයිසා මහතාට එවූ කවි දෙකක්:—

ඛ න දෙ න් න ට දිළිඳු ධන දුක් බලා ට හා
සැ ම ස මි ප න අතුව මැව් ඉඛ ඛඛා ම හා
ඩි න පෙම්කොා ට බලවූ නිදි මුව කමල දි නා
දු ව් දෙ න් න ට බැරිය ඔබ නොබැලුවොත් වේ හා

දෙ න ව සි යන වදන බොරු වෙන්නවත් හැ යි සු
දෙ න ව සි නොකියා ආපසු ඉල්ලුමත් සැ කි සු
මැ න ව සි ලැබුනොත්ින් මුදලක් මැතිදෙ දු කි සු
දෙ න ව සි කියම් ලැබුනොත් එය මෙහත් වි කි සු

මේ ඉල්ලීම පතාගෙ දෙසියක් දෙමින් ඉණ්ඩ කළාය.

ආහරණාදියෙන්ද, වාහනාදියෙන්ද සඤ්ඤා කළබවත් ඉතා ප්‍රකටය. පරොපකාරී වේ මහතා නිලෝහලෙස ධන පරිත්‍යාග කර රහසිව සිටී අනාථ බොහෝ දෙන කසාද ජීවිතයට පත්කරවා දුසාදදී විශෙෂ ලෙස උපකාර කෙළේය. එසින් වැසි දෙන දුනට **ඔනවතුන්වද, උගතුන්වද,** ලක්දිව මේ නාක් බබලන බව සත්‍යයකි. තවද උඩ පාත දෙ රට වසන කාලවලදී, මෙසේ ධර්ෂ්ඨ සුතුහට ඉඟ කිරීමෙන් කාලය පසු කළා පමණක් නොව, නිහර උගතුන් සහ ගුණවතුන් ආශ්‍රයට ගිනවද සිවිසේය.

මළවුන් සඳහා කරමිජන සිහන්ඇති වේ මහත්මයා සිය ගණන් මිනි ශරීර වළලෑමටද, ඒ නමින් දුන ධර්ම කිරීම ටද සියවනාවතව වඩා වැයතු පරිත්‍යාග කිරීමෙන්, අනුන්ට ඉවසල්වූ බව ප්‍රකටය. අසල්වාසි ජනයාගේ දුක් සැප නොසොයා සිටිය එතම දිනක් ඇත්තේ නැති බවද එසේම ප්‍රකටය. සැබෑවින්ම වේ සත්පුරුෂ මහත්මයා, අසල් වාසි ජනයා කුස ගින්නෙන් සිටින බව දුන, ආහාර ගන්; එකම පැයක් මුළු ජීවිතයේම ඇතිවුන බවක්, අපට දුනගන්ට නොලැබීම මහත් ප්‍රීතියකි.

———: o :———

ලොව ප්‍රකට නිධානය.

———

ද්‍රෝණස ද සොසිසා මහතාට හතුරන්කෙත වත් තෙන් ප්‍රමාණාතික්‍රාන්ත, රන් රිදී මුතු මැණික් සහිත නිධානයක් ලැබී එසින් ධනවත් වුනේය, යන්නත් ලොව ප්‍රකටව තිබෙන බව දනිමු. මෙය පමණක් දුර සැබෑය. හතුරන්කෙත වත්තේ කෝවි ගබඩා සෑදීම සඳහා පොලොව කැණෙහෙණ යන අතර පුරාණ තඹ කාසි අන ලොස්සක් පමණ එක තැනකද, තවත් අතලොස්සක් පමණ තඹ කාසි තවත් තැනකද, තිබී සමහරය. එවකට ඒ තඹ කාසි වලංගු නොවන නිසාද, වලංගු වුනත් එසින්

ඵලයක් නොමැති නිසාද, ඒ ඒ තැන්හිම ඒ කාසි තිබෙන්ට හැර, ඒවා යට කර ගබඩාවල "අත්තිවාරම්" පිහිටෙව්වේය. මීට වඩා මේ මහතාට තව තුලගක් කොසිම වත්තකින් වත්, නිධානයක් වශයෙන් නොලැබුනේය. මෙම කාසි දැන් ඒම ස්ථාන කැණෙන්ට වත් දකින්ට පුළුවන් කම තිබේ. මේ ඇර, රජුන්ගේ මාලිගා වලටද විහාර දේවාල වලටද, පුරාණ භාවිතා කළ ඉතා ලක්ෂණවූද අගණාවූද මහා චඤ්ඡා පාෂාණ කීපයක් මිලයට ගන් ඉඩම් වලින් සඹහවුන නමුත්, ඒ කිසිවක් ගන්නවා නවා අතවත් නො ගැසුවේය. මේ මහතා පසු කාලයේ මොරවුවේ සෑදෙවි දෙවසථානයට මෙම අලංකාර ගල් ගෙණ යාමට බොහෝ දෙනා ඉල්ලූ කල, "ඒ හල් අපටවත් අපේ පල්ලිවලටවත් හිමි එවා නොවේය. එවා ඔහේ තිබුන තැන්වලම තිබුනාවේ" යනු පැවසිය. නුවණැති මේ මහතා මෙකි වසතුවලින් ප්‍රවෙශවිව ක්‍රියා කර තිබෙන අගය ප්‍රශංසනීය බව නුවණැත්තනුම් නො කියද්ද? චන්ද්‍රයාට කිරි මුනුදු හමු වූවත් ආලෝකය එකම ප්‍රමාණය සේම, මේ මහතාට නිධාන් ලැබුනත් මෙම ගුණයම බව මෙයින් මනාව ඔප්පු නොවේද? ලැබුනාය කියා රවේ ප්‍රකට නිධාන් කථාව මෙපමණ බැව් මහ ජනයා අදහන්වා.

———: o :———

විශාල ගොඩ නැගිලිවල හිමිකාරයා වීම.

මෙයින් පසු වෙළඳුම බොහෝ සෙයින් දියුණු කොට, ලොකු කුඹුරු සහ වෙනත් විශාල වතු විපිද, මහ නුවර සහ කොළඹ වටිනා විශාල ප්‍රසිඛ හෙවිල්ද, මිලයට ගෙණ ඒ සියල්ලටම තමා එකම හිමි කාරයා විය. ප්‍රෝත්සීස් ද සොසිසා මහතා වැඩිපුර උඩ රට ක්‍රියා කරණ නිසා, මේවකට කොළඹ ද සොසිසා පවුලේ ප්‍රධානියා ලෙස ක්‍රියා කළ සුසෙව් ද සොසිසා මහතා

මෙම කටයුතුවලදී ටෙ මහතාට ආධාර ඔය. වරින් වර නවත් ඉඩම් මිලයට ගෙණ යා කිරීමෙන් විශාල කරණ ලද හඳුරන්කෙහ චත්තට දැනට මුලු **දිඝනලාවම** අනාත්මික වේ. එහි අක්කර දහසක් පමණ දැනට වවා තිබේ. * මෙම චත්තේ සහ එවින් එට මිලයට ගන්නා ලද වතුවල කලමනා කටයුතු සඳහා, ඩඹ්ය ග්‍රාමයේ තරුණයෝ බොහෝ දෙන තෝරා ගෙණ ලැබ්ඛිහ. මෙයින් බොහෝ දෙනා, තමින්ගේ නෑයෝ වෙති. ඉංග්‍රීසි කාරයින්ගේ මාණි යෙන් කෝපි යහනාදියේ වැඩ ඉගෙණ සිටි සිංහලයන් ලවා, මෙම වැඩ පල පුරුදු කර හැරීම පරමාර්ථ කොට ගෙණ, හෙතෙම කිසි කලක තමාගේ වැඩවලට සුරෝපියයකු නො ගත්තේය. ටෙ මහතාගේ චතුර මහත්සේ දිසුණු වන ප්‍රමාණයටම ලොකයාට ප්‍රයොජනවත් වීමද දිසුණු ඔය. තම ප්‍රිය භාර්යාව වූ නෝනා මහත්මයාගේ සෙනඟයේ ධනස්ථානය හැණ ටෙ මහත්මයාගේ සතුට සමසේ ඇති වුනේද, තම ගුරුවරයාගේ ඉල්ලීම පිසි නො කොට විළි ගත්තේද, එමෙන්ම, ජල ගැල්මක් මෙන් ධන ගැල්ම පටන් ගත් තේය. මෙසේ ලැබෙන මහත් ධන නිසා අහඞ්කාර නොවූ වින්චනා, නොසෙක් චිට බෙහෙත්, බෙහෙත් තෙල් ආදිය ඩඹ්ය ඔයදමෙන් සහ සිසතින් තනා ගෙණ කිසි තරා තිරමක් නො සොයා හය සැක නැතිව වසංගත රෝගීන්ගේ ගෙවලට වැදී බෙහෙත් කිරීමෙන් සහ ඔවුන්ට උවමනා කෑම පිළි ආදී උපකරණ සපයා දීමෙන්ද, ලජ්ජා සහිත පමිණෙකුට රහස් ගතව ඔය සියදමට මුදල් දීමෙන්ද, ඔවුන් නිරොග් කළ වාර කිපයක් බව මෙහි සඳහන් කිරීමට ලැබීම සාමාන්‍ය සහ විශෙෂ වශයෙන් වතිවාහික ප්‍රතු ජනතාවට කදිම ආදර්ශයක් වෙයයි විශ්වාස කරමු.

---

* ඉඩම්කොට ගේ, සිංහෝනා සහ අතරින් ජනර කෝපි ගස් වෙවලගෙකුන් එහි දැනට නිරඹන වැඩිලිය.

මොරවුවේ අම්බලම.

පරමොහකෘෂ්ට පරහව දයාබර මහතා, මොරවුවේ කුරුදු වත්තේ මහත් මුදලක් වියදම් කර දුවුවන් මන නයන පිණවන ආකාර, අගය ඇති මහ විශ්‍රාම ශාලාවක් තනවා. එකකුදු ඌණ නොකොට, ඊට උවමනා ශාඛා ගෘහයන් ගෙන් සම්පූර්ණෘත කොට මහ ජනයාගේ ප්‍රයෝජනයට දිනි. භික්ෂූන්වහන්සේලාවද, ක්‍රිස්තියානි ගුරු වරුන්වද, ශෛව විෂ්ණු භක්තිකයින්වද, රොගාතුර යින්ව සහ දුරි ඇත්තියන්වද සුවසේ විශ්‍රාම ගැණීමට සුදුසු විශෙෂ ගෘහ පඬික්තිවලින්ද මෙය පරිපූර්ණකොට තිබේ. තවද එහි පැමිණ විඩා සංසිදුවා ගන්නා වුන්නේ සා පිපාස සඳහා ඊට යාබු අගනා වෑංජන ලතාදි යෙන් ගහණ ඉතා රමණීය විශාල භූමියක්ද, මහ ජනයා උදෙසා දිනි. * මේ පොතෙන් පෙණෙන ඝනයමෙන් එකී විශ්‍රාම ශාලාවට මහත් දන රැසක් වියදම් කිරීමෙන් කරණ ලද මහ ජන සඬ්ග්‍රහයෙහි ප්‍රමාණය සහ ගරු භාවය ගැණ වර්ණනා කිරීම සුර ගුරු බදු ප්‍රාඥයින්ට අයත් කම්යක් හෙයින් මෙයින් අපගේ මුඛ පියා ගෙණ සිටීම එම සුර ගුරු බදු ප්‍රාඥයින්ට කරණලද විතීය වර්ණනාවක් වෙයයි සිතමු. †

---

* මුදුන්බඩ දුම්රිස ගමනා ගමනය කිරීමට ප්‍රථම මෙම අම්බලමේ ඇති අගය අන්ශයින් මහත්ස. විශ්‍රාම සඳහා පැමිණෙන ජාති ජනයාගෙන් ගහර පිරී තිබුන බැව් දනිමු.

† ලොක ප්‍රසිඩ ගරු කවයකු වේෂ්ස ද අල්විස් මන්ත්‍රුන්දුසානන් ඉසින් මෙම විශ්‍රාම ශාලාව ගැණ මෙසේ ලියා තිබේ.—

ලොවසා දිසි යසැති දුරු සිරි සර මෙසෙ	ස
සොසිසා මුදලි සඳු සත සහපත වීල	ස
සලසා තිබෙන මහ අම්බලම යස ලෙ	ස
සහොසා දුක මදත් සිව හලෙලි සර කැ	ස

මෙම අම්බලම ගැණ එවකට කර තිබෙන

සාධාරණ සරණ සමාගම.

සකල ජන විනොදනා පිණුඩ බුඩමත් මේ මහනා, මොරවුවේ **සාධාරණ සරණ** නමින් සමාගමක් සථාපිත කර, එවකට එම පලාත් වල පැවතුන දුසිරිත් හඩහ කර, සුසිරිත් වඩින යෙන්දැ; යහපත් චරිත්‍ර ආදිය ඉගැන්විමෙන්ද, ශිෂ්‍යාචාරයෙහි බොහෝ දෙනා පිහිටුවාලිමෙන්ද, මහත් යහපතක් කර දුන්නේය. දුක්පත් ජනයාට පැමිණි මහත් අනතුරා ආදිය සහ හදුහඹ කරණ කොට ගෙණ පැමිණි අපහසු අමාරුකම් වලදී, නොයෙක් විට මෙම සමාගම මඟින් ඔවුනොවුන් සැනැප් විය. මනමාලියන්ගේ හිසේ ගසන **කොරෝන් පිස**, තුම්දුනයෙන් පසු **සුරාවෙන්** කරණ සඩ්‍ගුහය; මිතුල් දිනට පසු දින පවත්වන **ඉස දිස දීම** යනාදි සිරිත් මෙම සමාගම මඟින් බොහෝ දුරට නැති විය. වර්තමාන කාලයේ සමාගම පිහිටුවා යහපත වඩිනය කිරීම සඳහා සම්හරු වීදින මහත් කරදර විය හියදම් ගැණ සැලකූ කල, සාධාරණ සරණ නම් මෙම් සමාගම සම්බන්ධව මෙම ලගොන්වූ සත්පුරුෂ මහතා කොපමණ් කරදර අපහසුකම් සහ වියදම් දරන්ට බනුව තිබෙන්ට ඇද්ද යනු මෙය .. කියවන කාවත්

නවීන ප්‍රබන්ධයක්:—

ඉරි විරි අප වුනි වරුණ වෙමින් එක් දහසින් අවසිය
සනලිස යෙ න්

ඉරි විරි ගුණයෙන් පෙර කළ කුසලින් සියලුම සඹ
පත් බහු ලබ්මි න්

ඉරි විරි සසසින් දින දින වැඩෙමින් සැම සතඟට
පෙම ඝස අම්ම න්

ඉරි විරි ගුණ ඇති බඩා හිස්තෙ මැති මොරවු
පිහිසෙ කළ වැනෙ උතු න්

වැවහෙනවාට අනුමාන නැහි බව දනිමු. සමාගම් වාහි සෙනුත් සඟකිය වඤියාට හිත වැඩ කිරීමට උත්සාහ කර තිබෙන මෙම වීර පුරුෂයාගේ නාමය අදත් අපට උච්චාරණය කිරීමට ලැබීම සැබවින්ම වාසනාවක් කොට සලකමු.

—————:o:—————

පහත රට මංමාවත් පාලම් හේදඩු ආදිය සමුඹි කිරීම.

———————

කොළඹ සිට හාල්ලට යන මහ පාරේ, හැනෑප්ම එනොළගේ කණුව ලඟ සිට, නැගෙණ හිර අතට හැනෑප්ම දෙක හමාරක් පමණ දුර ප්‍රමාණ කඳිම කරත්ත පාරක් කොස්පැලන්කිස්ස දක්වා තනවා දීමට, මේ මහතා මහත් මුදලක් වියදම් කෙළේය. මෙම පාර දැල වාසය කරණ ජනයා, ඉතා දුකසේ ජීවිකාව කරන්නාහුය. නිසි ප්‍රකාර මාවතක් නොමැති තමින් මට ප්‍රථම මේ ජනයා මහත් හිරිහැර වින්දෝය. මෙකී පාර සාදවා දීමෙන් මහ ජන සඛ්‍යහවක් කිරීමට සතුටු වුන මහතා පාරට උවමනා ඉඩම් ගැණීම පිණිස මිල කිරීමට සුදුස්සන් පත් නෙළේය. උවමනා ඉඩම් මිල කළ කල්හි, එකම නැනැත්තෙක් පමණක් ඒ ගැණ විරුඩ වූයේය. නුවණැති මේ මහතා ඔහුට කාරණා කියාදී එකී විරුඩකම් බිඳ දැමුවේය. ඉඩම් කාරයින්ට

ගල් මුල් අත් හැර උස ඕපි එක්කර බෙර ඇස මෙන්
සම වැඩ කර වා
නිල් පොල් රතු පොල් නෙසෙල්ද සමඟින් තවත්
බොහෝ පලමැල සිටු වා
නිල් ම ල් සුදු මල් රත් මල් සමඟින් අඹබලමට මේ
වර කර වා
පන් සිල් අටසිල් දස සිල් බලසෙන් වස් ඇර මේ
කඨි පවසන වා

මුදල් දීමෙදී මෙකී විරුඹ කාරයාට, වැසි මුදලක්ද දුන්නේය. ඉඩම ගත් ඉක්බිති, පාර මායිම කොට වැඩ පටන් ගත්තේය. නොබෝ දවසකින් වැඩ හමාර කොට මහ ජනයාගේ ප්‍රයොජනය පිණිස එදී 1839 යේදී මෙය විවෘත කර ලූවේය. මෙදින රාවතා වත්තේසහ කොස්පැලන්කිස්සට යන තෙක් පාර දෙපස ජනයාට මහත් උත්සව දවසක් වීමෙන් පරාව් කාම් මහතාට යහපති දීමෙන්ද, රබන් හැසිර, බෙර හැසිර, සිඳු කීම ආදියෙන්ද ප්‍රීතිය ප්‍රකාශ කලාහ. පාර තැනවීමට ක්‍රියා කළ අඟෝල්දස් මැන්දිස් මහතාට සහ, වෙනත් ඒ හැණ මිනන්සි ගත්නවුන්වද මේ මහතා සන්තොෂ ධනයෙන් සඤ්ඤ කෙළේය. මොරටුවට කරදුන් ධාමික වැඩවල ආරම්භය මේ අති ප්‍රයෝජනවත් **මහපාරවීම.** මෙම කරත්ත පාරෙන් මේ වනතුරු මහ ජනයා ලබන ප්‍රයෝජන අප්‍රමාණය. සංප්‍රදේ දෙව මන්දිරය සමීපයෙන් නැගෙණහිරට සහ උතුරට යාම ර්ම සඳහා ලොකු මුදලක් වියදම් කර, මොරටුවේ උයන දක්වා, හැතැප්ම දෙකක් පමණ දිසි ඉතා හොඳ කරත්ත පාරක් තනවා දීමෙන් මේමහතා කළ උපකාරය කුඩා නොවූ එතක් බව එය දකින කාටත් වැටහි යනු නිසැකය.

තෙලවල මැදින් මාම්පේ දක්වා ඉතා රම්‍යාකාර කරත්ත පාරක් සාදවා දීමෙන්, මේ මහතා මහ ජනයාට කළ මහොපකාරය අතිශයින්ම ප්‍රශංසනීයව තිබීම මහත් සතුටකි. එවකට වලංගුව පැවතුන පවුම් ගණනින් පවුම් දුසකට වැඩි ගණනක් වියදම් කර, කඳවල කුරුදු වත්ත අසල විශාල ගුම් හාගයක් ගණවා, මහ කුඹුරක් කර රට දිය ගැන්වීම සඳහා වැවක් තනවා දීමෙන්

රට රට සිට එන සෙනග ඉසල්ලම ඉවලා සති සුර පුර ඕල සේ
වට වූට බලවින් දෙකොත් බුදුන්දි සින් දෙයි වේද මැනිදුව සංතා සේ
මිවි ඕස වෙන කාටත් නොපෙනුණිදෝ නව පද බැඳ කීමට සින සේ
ඕට ඕට දෙවියෝ ආවිරි දෙවඟින් රාහාදෙන් අප මැනිදුන් නොල සේ

එහි වාසිනිට කළ මහ සඞ්ග්‍රහය ගැන වර්ණනා කිරීම ප්‍රමාණාතික්‍රාන්ත බව මෙය කියවන නුවණැති ජනයාට මනාව වැටහේමය. මොරටුවේ එවකට ඇතුව ශිය ජීවී මංමාවත් සහ පාලම් හේදවූ ප්‍රකෘතිමත් කර දුන්නා පමණක් නොව ඇතම් මංමාවත් යිබ්බිශියාට වඩා විශාල කර දීමෙන්, මෙතුමා ජන සඞ්ඛ්‍යාව මොනවට සතුටු කෙළේය.

මොරටුවේ කුරුඳු වත්ත මැදින් වැටී තිබුන අතු පාර, කුඩා කලපුව නොහොත් ලුනාව, අතුලාන දක්වා කරන්න යාම ඊට හැකි වනයේ කදිමට තනා දීමෙන්, වැසියන්ට මහත් සහපතක් කර දුන්නේය. තවද එව කට මෙම ලුනාවෙන් එගොඩ මෙගොඩ වීමට පොදු තිබුනේ හේදණ්ඩක්ය. මෙම හේදණ්ඩ මඟින් යාම ඊම කරණකොට ගෙණ, ඇලට වැටී විනාශ වෙන මනුෂ්‍ය ජීවිත ගැණ කම්පිත සිතාවකට පත්, පරහට මහොපකාර මේ සත්පුරුෂ මහතා, එවකට පාලම් තැනීමෙහි ප්‍රසිද්ධියක් ඉසුලූ, බලාපු වඩුගේ බස්තියන් මැන්දිස් මහත්මයා සහ දක්ෂ සුඤ්ඤකම් කරුවෙක්වූ හජ්ජි ලෙබ්බේ මරික්කාර් නම් කැනැත්තාත් ගෙන්නවා, පාලම තැනීමෙහිද, දෙගොඩ බැම්දෙක ශකාගිමත් ආකාර බැඳීමෙහිද වැඩ භාර දුන්නේය. මේ ගැණ මහත් ධන පරිත්‍යාගයක් කිරීමට උවමනා වෙන බව, මෙතෙම කලින් දැන ඒ ගැණ කිසි මසුරුකමක් සිනයෙනුදු නො සිකා ඉතා ඉක්මනින් පාලමේ වැඩ අවසාන කිරීම සඳහා මහත් ධනයක් හුදකලාවම විසදම කෙළේය. නොබෝ දවසකින් පාලමේ වැඩ සම්පූර්ණයෙන් අවසානවූ කල, මහ ජන දායේ ප්‍රයෝජනය පිණිස විවෘත කර ආණ්ඩුවට භාර දෙනලදී. අහෝ! මේ පරහට දසාව ඇති උත්තමයා ගැණ වර්ණනා කිරීමට කවරෙක් පොහොසත්ද?.

සල්පිටි කෝරළේ පොල් ගස් ඔවිවේ සිට, මත්තේ ගොඩ හරහා දෙල් ගහ කනත්ත දක්වා, මහත් මුදලක් විසදම් කර ඉතා ප්‍රයෝජනවත් කරන්න පාරක් සාදවා

දීමෙන් මහත් සේනාවකට විපුල ප්‍රයොජන අත්පත් කර දුන් බව පෙණේ. මෙ ඇර සුළු මංමාවත් සහ පාලම් හේදඩු ආවාස පාඨශාලා රැශියක්ද, උඩ පාත දෙරට වාසීන්ටම කර දුන්නේය. තවද මංමාවත් පාලම් හේදඩු යසසේ නිමාවට පමුණුවා, ඒ සියල්ලම ලඞ්කාණ්ඩුවට භාර දුන්නේය. දිළිඳු කම නැමති වසත්‍රයෙන් වැසී සිටින වැදගත්කමින් සහ නඹුකාර කමින් යුත් බොහෝ දෙනාට, නොයෙක් වර ඒ ඒ ඇත්තන්ගේ ඉල්ලීම් පරිද්දෙන් කළ කී උපකාර අනන්තාප්‍රමාණ බව පැහැදිලි වශයෙන් පේන්ට තිබේ. *

———: o :———

කඳිම විනිශවයක්.

කොළඹ ඒමෙන්ද මහනුවර යාමෙන්ද වෙළඳාම් කිරීමෙන්ද, කුශල ක්‍රියාවන්හි යෙදෙමින්ද, කාලය ගත කරණ මෙ මහතාට දිනක් හඟුරන් කෙත වත්තේ දබරයක් හටගත් බව දැන ගන්ට ලැබුණේය. සුකාතීය ඉවත් කිරීමෙහි බලවත් විනාශය දත් හෘදය ශීතල මහතා, වහාම ඒ ගැණ එහි පැමිණ කාරණා විභාග කොළේය. හඟුරන්කෙත වත්තෙන් කොටසකට බෙදා තිබෙන වැවතැන්නේ වත්තේ වැඩ කරණ කුලිකාරයින්ට එහි මුලාදෑනියා හිරිහැර කර තිබෙන බව නිපුණ නුවණින්

* මෙතුමා ගැණ සර්. ජේ. ඇමර්සන් ටැනැට් තුමාගේ කාලය නාවද මෙකල සිංහලයින්ට වැදගත්ව තිබේ. එතුමා ලඞ්කාව ගැණ ලියන ලද විශාල ග්‍රන්ථයේ මෙතුමාගේ උතුම් නාමයද ඇතුළත් කොට කථා කර තිබීම මුළු සිංහල සේනාවටම මහත් නම්බුවකි. "දිළුණු භාවයට නැගෙන්නාවූ මොරටු වාසීන්ගේ සමෘද්ධව හෙතුවූ තවත් මාර්ගයක් නම්, පිට රට කෝපි පැවරීම සඳහා කෝපි වෙනුවට පීප්ප තැනීම ආරම්භ කිරීම සහ පොල් තෙල් පිරවීමට ලේඝර තැනීම පටන් ගැන්මත්ය. මෙගම (මොරටුව) ප්‍රධාන ස්වදේශිකයෙක් වන ජෝණිස් ද සොයිසා එනමට නාම සාදවන ලද තෙමතු

තෝර බේරා ගෙණ, විනිශ්චයකොට ඔහු වරද කාරයා බැව් ප්‍රකාශ කෙළේය. මෙම මුලාදෑනි තැනට වසින් වස සිරිත් ප්‍රකාර නියම වැටුප් ගණිනට වැඩිකරගෙණ ආ මුදල, වැරැද්දට දණ්ඩන වශයෙන් තහනම් කෙළේය. සත්පුරුෂ මහතා, මෙපමණකින් මෙය පැහැර නොහැර එවලේම දූසස්න් කඩ පෙළට යවා කඩවල තිබුන පමණ කොසෙල් කැන් සහ සකුරු ගෙන්වා කුලීකාර යන්ට සඞ්ග්‍රහ කර, එතැන් පටන් එවකට කුලීකාරාදීනු ඉතා සතුටු වඝුවක් වන, ලූණු සේරුව බැගින් මසකට දෙවරක් මෙ මහතාට අයිති සියලුම වතුවල කුලීකාර යින්ට නොමිලයේ දීමට ආඥා කෙළේය. මෙ සිරිත චාර්ල්ස් හැන්රි ද සොයිසා මහතා ස්වගීයත වන තුරුම නොනසා පවත්වා ගෙණ ආවෝය. නමුත් මෙතුමාගේ කථාශෙෂභාවොපගතවීමෙන් පසු වතුවල වැඩ අමුතු පිළිවේළකට ගන්ට සිදුවුන බැවින්, ලූණුවලින් දීම අත් හැර එම වැඩි මුදල වැටුප් වලට එකතුකළාහ.

——:0:——

වාසල මුදලි තනතුරේ ආරම්භය.

ස්වකීය උත්සාහයෙන් මහත් ධනයක් සහ කීර්තියක් අත් පත් කර ගත්, මෙ පරොපකාර මහතා ගැණ මහ නුවර දිශාපති **චාර්ල්ස් බුලර්** මහතා අභිශයින් සතුටට පැමිණ, මෙ මහතාට, **රජ වාසල මුදලි** තනතුර දීමෙ

සහ පූර්ව දිශා ලක්ෂණයෙන් යුත් පදිංචි ගෙය සිංහලයින්ගේ ප්‍රාසාද ගොඩනැංවීමෙහි ආදර්ශයයි. මහ ජනයා කෙරෙහි උනන්දුවූ මොහුගේ භාෂාභිමන්තකම නිසා ඒ මූර්ථ පලාතවම ප්‍රයොජනවීමද මග තොට ඉදිවෘතක්වීමද ගම් වාසීන්ගේ ශුභ සිද්ධියට අනුබල දීමද කරණකොට ගෙණ 'රජ වාසල මුදලි' යන නිලය දෙන ලද්දේය," යනු සඳහන් කර තිබේ. මෙසින්ද මෙතුමා භාෂාභිමානයෙක්ද පරාර්ථක සත්පුරුෂයෙක්ද නොවූ හොඳහැටි හැගෙයි. "ඇමර්සන් වැනැන්ව" පි. 143, 144. මිනිස් කාණ්ඩ.

ඇති බලවත් සුතුකම, එවකට ලංකාශ්වරයානන්ව සිව් **සර් ජෝර්ජ් ඇන්ඩර්සන්** උතුමානන් වහන්සේට දන්වා සිටියේය. දිශාපතිතුමාගේ ඉල්ලීම පර්ද්දෙන්, ද සොයිසා මහතාට වාසල මුදලිකමක් දීමෙන් ගෞරව කිරීමෙ ඇති අවශ්‍යකම තේරුම ගත් ලකිසුරුතුම, **ශ්‍රීමත් ඇලෙක්සැන්ඩ්‍රිනා වික්ටෝරියා මහා රාජිනිය්** වහන්සේ උපන් දින සම්පව තිබෙන බැවින්, සිරිත් ප්‍රකාර පවත්වන ලද රාජෝත්සව ප්‍රසතාවෙහිදී, වාසල මුදලි තනතුර දෙනබව ප්‍රකාශ කර, ඊට සූදනම වීම සඳහා යැවිය යුතු ලියවිල්ල, ද සොයිසා මහතාට යැවීය. මෙ බව සැලව ගිය කල, මෙ මහතාගේ මිත්‍ර සමූහයා ඉතා සතුටට පත්ව, රන් මාලයකින් පුදමහයි සනිටුහන් කොට ඊට සම්මාදමක් පටන් ගත්හ. ද සොයිසා මහතාගේ මිත්‍ර මහතුන් සත් සියයක් විසින් පරිත්‍යාග කල මුදලින්, රත්රන් පවොම එකසිය පණහක් රුගෙණ, කල් නොමැති සෙයින්, රත්රන් පවුම දෙක බැගින් එකට යොදා තවත් රාත්රන් පවුම දෙසාලිසක් රුගෙණ එක පොකුරක් කොට එහි එල්ලා, ගරුතර ආණ්ඩුකාර උතුමානන්වහන්සේගේ සිය අතින්ම පැලඳ වීමට වහා වහා පිළියෙල කරණලදී. *

---

* මේ මාලය එවෙලාවට තනා ප්‍රසතාවට පිරිමසා ගත් නුමුත් පසුව එක ඉතා අලංකාරයට තනා ඊටම රත්රන් පදක්කමක් අමුනා නැවතත් ක්‍රිස්තු වර්‍ෂ 1854 රේ මැයි මස 24 වෙනි දින කොළඹ රජවාසල පැවැත්තු මහරාජිනීන් උපන් දින මංගල්‍යෝත්සව යේදී ලකිසුරු තුමාගේ සිය හස්තයෙන්ම පළඳවනු ලැබිය. එම පදක්කමේ මෙහි පහතයේණ වාසගම ඉංග්‍රීසි අකුරෙන් කොටන ලදි:—

"ජෝණ්ස් ද සොයිසා ධර්ම ගුණ වඩින විපුල ජනසූරිය දිසා නායක කරුණාරත්න වාසල මුදලි තුමාට උන්වහන්සේගේ නොයෙක් මිත්‍රාදීන් විසින් දිළිත්දන්ගේ සහනය පිණිස කරණ ලද්දාවූ ධාර්මික උත්සාහයන්ද මහජනයාගේ ගුණ සිද්ධි වඩිනය පිණිස කරණලද ස්වදේශාල ප්‍රයත්නයන්ද උතුම් කොට ප්‍රේමයෙන් සලකා ඔවුන්ගේ ඇති සම්භාවනය සඳහා සහ සම්මානනයේ සිහිවීම පිණිස තෑගි කරණලදි". විලියම් ඒකින් මහතාගේ "ඇඩම්ස් පීක්."

මේ මහතාට නියමවූ වාසල මුදලි තනතුර ගැණ සම්හරුන්නේ නිරවිත විරුඬකට කරණකොට ගෙණ හසන හඬදුසියේ වචනයක වෙනසක්වී තිබුනේය. මේයි විරුඬකවල ඇති නිරවිත භාවය ගැණ මහලේකම තැනවූ **සර් චාර්ල්ස් මෙකාතිතුමා** සහ දිශාපති තැනවූ **බුලර් තුමාත්** ඉතා සැලකිලි වනතව ක්‍රියා කරණ ලදුව අනතිම විනාඩියේදී ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේ, තමන්ගේ පැනයෙන්ම "හසතකඩදුසිය වෙනස් කොට ද සොසිසා මහතාට **වාසලමුදලි** තනතුරම දුන්නේය.* උතුමානන් වහන්සේ විසින් කස්තානය සහ මිතු සබුහයාගේ ඉල්ලීම පරිද්දෙන් රන් මාලයත් කර පලඳවනකල, සතුට ප්‍රකාශ කිරීම සඳහා කළ කථාව **අර්නෑස්ති ද සේරම** මහ මුදලි මහත්‍රිශ්වරයානන් විසින් සිංහල භාෂාවෙන් ප්‍රකාශ කරණලදී. සියලුම පඬිතවල ජනයා ආණ්ඩුකාරතුමාගේ යුකතිය ගැණත්, ද සොසිසා මහතාට ලැබිය යුතු ගෞරවය ලැබීම ගැණත් සතුට ප්‍රකාශ කලෝය.

ශ්‍රේෂ්ඨ ද සොසිසාතුම උඩ පාත දෙරට වාසි ජනතාවගේ ප්‍රයෝජනය සලකා, කර නිබෙන මහත් කටයුතුද, වියදම් කර නිබෙන මහත් ධනයද, ගැණ සිතා බැලූ කල, ඉංග්‍රීසි ආණ්ඩුව විසින් සිංහලයාට දිය යුතුයයි සිතන ඉතා උසස්ම නිලයක් දිමෙන් ගෞරව කළ යුතු බව අපට වැටහේ. අනික් යම්කට ඉඩ නොමැති නම්, ඇතම් ශෛඛලික රජ දරුවන් ගෙන් මිස අන්‍ය කිසිම සිංහලයෙකුගෙන් උඩ පාත දෙරට

---

* ද සොසිසා තුමට මුදලි තනතුර ලැබුන බව දනගත් වෙලේ ගෙදර බණ්ඩාරමහතා කී කවිය.

ක දලි මෙන රුවන් අතුරා දුසි අතු	රේ
සි දලි තණ විලස බත් තැටි දී සියෝ	රේ
ඇම්ලි ශිෂ්‍ය නිවා සත පිනවන සොඳු	රේ
මු දලි සඳ උදුවිස උඩ රට අඹ	රේ

ජනතාවට මෙසා යහපත් කෘත්‍යයන් කළ කිසිවෙක් මෙතෙක් ඉදිරියට නා නිසා, ඉංග්‍රීසි ආණ්ඩුවෙන් දෙන උසස්ම නිලයක් ලැබීමට සම්පූර්ණයෙන්ම මේ මුදලිතුමා සුදුස්සා බව මොනවට ඔප්පුවේ.

පරහට අතිශයින් දයාබර ෂ්‍රෝණ්ස් ද සොසිසා මුදලි තුමා සැඟෂාතියෙන්ම මෙසා මහත් ධනයක් සපයා ඒ ධන, කැට කැබිලිති මෙන් ලොකයාට බෙදූ දුන්නේ, නිල තල කීර්ති ප්‍රශංසාදියකට ලොභයෙන් නොව, කුසල්ම ප්‍රාප්තිය කොටම බව **ඉර හඳ** සේ පැහැදිලිව ඔප්පුවේ. සත්‍යයෙහි ගුප්තව තිබෙන දිව්‍ය ගතියෙන් සත්‍යවන්තයා ආලොකයට ගෙණ එනු ලැබීම සත්‍ය නිසා අසත්‍ය අයුතු මැඩ ගෙණ **චාර්ල්ස් බුලර්** තුමාගේ සත්‍ය අදහස පරිද්දෙන්ම **ෂ්‍රෝණ්ස් ද සොසිසා ධර්ම ගුණ වර්ණන විපුල ජයසූරිය කරුණාරත්න දිසා නායක වාසල මුදලි** යන ශබ්දය ලක්දිව පුරා පැතිර යාම සත්‍ය යෙනි ආශ්චර්‍යයක් ලෙස නොගැණේද? මෙම මුදලි තුමා මෙන් යමෙක් සත්‍ය අදහස ස්ථිර ලෙස පෙරටු කොට යහපත කෙරේ නම්, ඔහුටද එසේම යහපත සිදුවෙනු නිසැකය.

———:o:———

වාසල මුදලි නෙනතුරේ උනසවය.

ක්‍රිසතු වර්ෂ 1853 නේ මැයි මස 24 වෙනි දින මේ මඞ්ගල්‍යය සඳහා නානා ජාතික වර්ණක් ජනයා ප්‍රධාන කොට අවශෙෂ ජනයා විසින් මහනුවරදී, මහත් ගරු

මේ කවිය ඇසූ කුමරගේ ශේනයා කිරිගල පිටියේ සුබා නම් නැකතිරාළ ලවා මෙම කවිය තනවා මුදලිතුමාට යැවිය,

පුරා අත නොම කිරා දෙන දන දිවාරැ නෙක දනට වැසි බ ඳ
සරා බත පිඬු කිරා වැනි දුගී සතට දුනී වෙසතුරු වරා ලෙ ද
මෙරා වස ලක පුරා සුපැනිර සොවිස නම අග වස මුදලි ස ඳ.
අරා සිට නි ල ඹරා ගිරි රට දෙනෙලියේ රහ බලන්වා අ ද

ගම්භීරාකාරයෙන් මෙතුමා පිළිගන්නා ලද්දේය. පාත රට වෙළඳ ජනයා සල්පිල් වසා එම ස්ථාන සරසා නිවාඩු දිනක් කොට තැනින් තැන ලක්ෂණ තොරන් සහිත සැරසිලි කර, මෙතුමාට මල් සහ පිනිදිය ඉසිමෙන් ගෞරව කර මහ නුවර ජන යාගේ සහ උඩ රටට පැමිණ සිටි පාත රට ජනයාගෙත් කරුණාව ඌනත්වයක් නොමැතිව පෙන්නූහ. මහනුවර "කර්ක්" චීවියේ අඩක 9 දරණ නිවස ප්‍රස්තාවට හොඹනා කාර ඉතා ලක්ෂණට මල් වනස්ස කොඳි ආදියෙන් සරසා බඳු මිත්‍ර ආදිහු සහ වතුකාර යුරෝපිය මහත්වරු එහිදී ගෞරවයෙන් මුදලි තුමා පිළිගත්තෝය. සිය ගණන් සතුති පත්‍ර ක්ෂයවා ඔප්පු කළහ. මුදලි තුමා තරා තිරමක් නොබලා තමන්ට ගෞරව කළ නොකළ සියලු දෙනාටම සතුති පෙරටුකොට ආචාර සමාචාර දක්වා ඒ තුමා සඳහා ක්‍රියා කළ සියලු දෙනාටම මොනවට සඬ්ග්‍රහ කෙළේය.

මුදලි තුමාට හිමි මහනුවර ඉහත කී විශාල ගෘහයේ එදින රෑ මහත් මඟහල්‍ය කෑමක් දීමෙන්, උසස් සිංහල ඉංග්‍රීසි මහත්වරුන්ට මොනවට සඬ්ග්‍රහවක්ද කෙළේය. මේ ප්‍රස්තාවේදී එම විශාල ගෘහය ලක්ෂණ සැරසිලි වලින්ද ආලොකයෙන්ද උදදීපනීය විය. කෑමට වාඩිවී සිටි උසස් මහත්වරු මුදලි තුමාගේ සැප ප්‍රාර්ථනා කරමින්ද වලව්වේ මහත්මයාගේ සැප ප්‍රාර්ථනා කර මින්ද, මුදලි තුමාගේ එකම පුත්‍ර ද සොයිසා මහතාගේ සැප ප්‍රාර්ථනා කරමින්ද, සහෝදර සුසෙව් ද සොයිසා මහතාගේ සැප ප්‍රාර්ථනා කරමින්ද සිංහල ඉංග්‍රීසි ව්‍යක්ත කථා පවත්වමින් "වයින්" නම් බීම වර්ගය පානය කළා හුය. "හුරා" ශබ්දයන්ගෙන් සහ අත්පොලසන් දීමේ ශබ්දයන්ගෙන්ද එදින රෑ සෙඩිකඩ ගල නගරී තොම දිසී කාලයකට පසු මහත් සතුෂ්ඨි භාවයක් ඉසුළුවාය.

මහ නුවර කීප දිනක් නැවතී එන යන්නන්ට සඬ්ග්‍රහාදිය කොට මැයි මස 29 වෙනි දින මුදලි තුමා

හඳුරන්කෙන චත්තට යාමට පිටත් විය. මහ නුවර පවතේ හඳුරන්කෙන චත්ත දක්වා මහ දෙපස නොයෙක් විලාශ නොරන් බැඳ, මග සරහා තන්හි තන්හි කොඩි ඇද ඒ කාලයේ හැටියට ඉතා ශොභන ලෙස මොහොවට සරසා තිබුනේය. මුදලි නුමා පෙරටු කොට මිහත් පෙළහරක්ද මහ නුවර සිට පිටත් විය.

————: o :————

හඳුරන්කෙන ගමන.

මෙකල මෙන් එකල ඡායා රූප ගැණීමේ සිරිත පැවතුනානම්, මෙම පෙළහරේ සිතුයම මෙහි යොදූ එහි අහස සහ විසතර සම්පූර්ණයෙන් පෙන්වන්ට නුබුනි. එසේද උවත් පමණක් දුරවත් විසතර කිරීම අවශ්‍ය නෙයින් මදක් සඳහන් කරමු.

දවල වසූ ඉන හැඳ රතු වසූ ඊපිට බැඳ රතු වසූසන්ගෙන්ම හිස් වෙලාගත් ශ්‍රිංගාර රසඳුවූ, පරෙප කාර මුදලි මහත්‍රිශ්වරයාගේ විපුල ගුණ රාශිය පර මිණ්ඩල ජනයාට දැනුම් දෙන්නාක් මෙන්; බෙර පද ගසන්ට පටන් ගත්හ. ජනතාවට හතුරුව නානා ප්‍රකාර ගැහැට දෙන දිළිඳු කම් නැමති සතුරන් හඬඟ කර ලීමට පරෝපකාරය නමැති ඛඩ්ගය දකුණ තින් රැගෙණ අප මහත්‍රිශ්වරයා සම්ප්‍රාපත වෙන්නේය යනු හඟවන්නාක් මෙන්; හොරණෑකාර ජනයා වස් තුලල් හොරණෑ පිඹින්ට පටන් ගත්හ. අහසින් කෙරෙහි පමණක් නොව කණුන් තෙරෙහිද මෙම මුදලි මහත්‍රිශ්වරයා ඇස කොණකින් නමුත් බලන බව හඟ වන්නාක් මෙන්; බෙර ගත්තහු එකෑස් බෙර ගසන්ට පටන් ගත්හ. පර දන වැඩ කැමති මුදලි මහත්‍රිශ්වර යාගේ පුණ්‍ය රූපය ජන අත්ල මධ්‍යයෙහි සිතියම් කරලීමේ සුකාසිය සඞකිය සිත්තර සැමියන්ට නොදන්නු අතාර්ථය ගැණ දෙස් දක්වන්නාක් මෙන්; වචන සැර

කර ත් කියමින් තැවිකාර ස්ත්‍රී සමූහයා දූතැහි දැසිවිලි ඔබ ඔබා තැවි කරකවන්ට පටන් ගත්හ. මුදලි මහත්‍රිඥවරයා ධන විසුරුවා දෙගුරුන්ගෙන් වියොගවූද දිළිඳු භාවයට වැල්ව සිටින්නාවූද අසරණ කන්‍යාඝනාවන් නිසිලෙස් තරුණයන්ගේ සරණයට ඇතුළත් කළ අනන්ත තැන් වලදී ඔවුන් සතුටින් ඉපිල සිටිය ලීලාව දක්වන්නාක් මෙන්; නලඟනෝ නටන්ට පටන් ගත්හ. මුදලි මහත්‍රිඥවරයා දුන් මත් යාචකාදීන් අතර රන් රිදී මුතු මැණික් ආදී වයඟ විසුරුවා හරිණ පුදුම ලීලාව හඟවන්නාක් මෙන්; මාලාකාර ජනයා සුදු රතු නිල් කහ ආදි වණ් මල් විසුරුවන්ට පටන්ගත්හ. මුදලි මහත්‍රිඥවර යාගේ බත මනුෂ්‍යයන් අතුරේ පමණක් නොව කුහුඹු බිලාල සුනඛාදීන් අතුරේද පවත්නා බැව් හඟ වන්නාක් මෙන්; ව්ලඳ බදුන් ගත් අත් ඇත්තෝ ව්ලඳ විසුරුවන්ට පටන් ගත්හ. මුදලි මහත්‍රිඥවරයා දුක්පත් තම නමැයි හිඟ් නිවීමට මහ මෙහයක් හා සමාන බැව් හඟවන්නාක් මෙන්; සුවඳ භාජන අත් ගත්තෝ සුවඳ පැන් ඉසින්ට පටන් ගත්හ. මුදලි මහත්‍රිඥවරයා අසූතතට පහර දෙන උතුමෙක් බැව් හඟවන්නාක් මෙන්; කසකාර ජනයා කස පුපුරවන්ට පටන් ගත්හ. මුදලි මහත්‍රිඥවරයා නානාප්‍රකාර කනඳ ගැල්වල පටවා ගෙණැවිත් දුන් මත් යාචක දනයාගේ සඬ්ග්‍රහයට ගෙණ යන බැව් හඟවන්නාක් මෙන්; නානා ජාතික ජනයා ආරූඪවූ අශ්ව ගව බැඳි රථ පඬිතිගමන් කරන්ට පටන් ගත්හ. මුදලි මහත්‍රිඥවරයා දුක් පත් ජනයාට මිහිරි වචනයන්ගෙන් නිතරම ආමන්ත්‍රණය කරණ අන්දම් හඟවන්නාක් මෙන්; අඟ කිඹකිණ් පොකුරු බැඳි දඬු ගත්නු කිඹකිණ් නාද පතුරුවන්ට පටන් ගත්හ. මුදලි මහත්‍රිඥවරයා දුන්නට දෙන දුන වෙලාව දැනුම් දෙන්නාක් මෙන්; සක් අත් ගත්නු සඬ්ඛ නාද පතුරුවන්ට පටන් ගත්හ. මුදලි මහත්‍රිඥවරයා දුක්පත් තමෙන් මිදී සිටින්නවුන් දැක සතුටින් හිස

වහන බැව් හඟවන්නාක් මෙන්; නළුවෝ ඖස් වන වනා හවන්ට පවන් ගත්හ. මුදලි මහත්ඥෙරයා පරහට ඇති දයාව හැමති මුකතාහාරයේ සොයිම තැනක වත් පැටලිලි, පලුදු නැති බැව් හඟවන්නාක් මෙන්; ත් කියන් හෝ තාල පිළිවෙළ නොනසා ත් කියන්ට පවන් ගත්හ. මුදලි මහත්ඥෙරයා වැව බඳවා දීමෙන් සඛ්‍යහ කළ ලක්ෂණ හඟවන්නාක් මෙන්; කොඩි අත් ගත්තෝ කොඩි ඔසවා ගෞරව කරන්ට පවන් ගත්හ. මුදලි මහත්ඥෙරයා නිවෙස් නැත්නාඹුන්ට නිවෙස් දුන් ආකාර හඟවන්නාක් මෙන්; වසුා අත් ගත්තෝ විතාන ඔස වන්ට පවන් ගත්හ. මුදලි මහත්ඥෙරයා මංමාවත් පාලට හේදඬු කර මහ ජනයාගේ ගමනා ගමනයට කළ මහොපකාරය හඟවන්නාක් මෙන්; එසේම වසුා අත් ගත්තෝ පියඹලි හෙලන්ට පවන් ගත්හ. මුදලි මහත්ඥෙරයා දුක්පත් ජනතාව පාලනය කරන් **රජ්ජුරු චෝස** යන ප්‍රකාශ පත්‍රය කියවන්නාක් මෙන්; මහ ජනයා ඔල්වර හඬ පවත්වන්ට පවන් ගත්හ. මුදලි මහත්ඥෙරයා ආඥාපිටයෙන් සහ පරාජයෙන් කෙළ පෑමිනි සේය යන සතුට ප්‍රකාශ කරන්නාක් මෙන්, මහ ජනයා අත්පොලසන් දෙන්ට පවන් ගත්හ.

මෙසේ මහත් පෙළහරින් මහ නුවර සිට කුණ්ඩ ශාලය දක්වා රාජ ලීලාවෙන් ගමන් කරන කල, අතර මාඟ දෙපස කසින් කඩ ඒ ඒ ගම වාසි ප්‍රභූ ජනයාද දුක්පත් ජනයාද මල් වීලඳ පිනිදිය ඉසිමෙන් ගෞරව කිරීමටද, එළු පාළි සංඝකෘත පඤ්ච බඤ්ඣනාදි යෙන් ආශීර්වාද කිරීමටද පවන් ගත්හ. මුදලි තුමා මෙසේ සියලු දෙනාට තම නිරහඞ්කාර ඖස පහත්කොට ප්‍රති වදන් දෙමින් කුණ්ඩ ශාලය දක්වා අසුන් යොදන ලද රථයෙන් ගමන් කර, එතන සිට පෙළහර සමග මුදලි තුමා දෝලාවෙන්ද සේනාව දෙපසින්ද ගමන් ගත්තේය. කතුරන්කොත වත්ත සමීප වෙන අතර එතුමාගේ වතුවල ජනයාද අන්‍ය වතුවල ජනයාද



HANGURANKETA WALAWWA.—හඟුරන්කැත වලව්ව.

HANGURANKETA MISSION SCHOOL.—හඟුරන්කෙත මිෂන් පාඨශාලාව.

චතුස්සාර සුරෝපීය මහාත්වරුද, වෙනත් සෙනගද, දහස් ගණන් එකතුව පමණක් දුර ඉදිරියට අවුත් මේඝ ගජ්නා මෙන් බල්වර හඬ දෙමින්ද මල් විසිකරමින්ද, සුවඳ පැන් ඉසිමෙන්ද, හඟුරන්කොත මෙතුමාගේ ලස්සණ නිවසට කැඳවාගෙණ අවුත් එහිදී ස්තුති පත්‍ර කියවා මහත්ගෞරව කළහ. මුළු දියතලාවෙම මල් ගහකවත් මල් වැලකවත් මෙදින එකම මලක් සොයා ගන්ට බැරිවීමම මුදලි තුමාට ලැබුන ගෞරවය ප්‍රමාණ කිරීමට සාක්ෂියකි. *

———:o:———

හිම වර්ෂාව.

හැතැප්ම ගුණකට වඩා දිසිවූ මෙ පෙලහර හඟුරන් කොත වත්තට ක්‍රමයෙන් අවුත් සේන්දු වුන වහාම පලිහු කැට බඳු හිම වර්ෂාවක් වහින්ට පටන් ගත්තේය. මෙ කාලය උෂ්ණ කාලයක්ව තිබුනා පමණක් නොව විශෙෂ වශයෙන් මෙදින අතිශයින් උෂ්ණ දිනක්ව පැවතුනේය. පෙලහරට පැමිණි දහස් ගණන් සේනාව ඉතා තර ලෙස මෙදින වෙහෙසටද, අව්තාප යෙන් මිරිකීමටද, පිපාසයෙන් පීඩිතවද සිටින බැව් දුටු දිව්‍ය සමුහයා, මුදලිතුමා විසින් පරහට කළ කී උතුම් වැඩ ගැණ දෙව සඬග්‍රහයක් කරමහයි සිතා දෙ හෝ වැස්සු මෙම හිම වර්ෂාව මෙ වේලාවේ මෙසා

* මසිලපිටියේ සිට හඟුරන්කොත වත්තට ගනතුරු වරුපාවක් මෙන් සුවඳ මල් පෙති ඉසිමෙන් මුදලිතුමට ගෞරව කිරීමට හිසම් කර ගත් අසවුන්ගෙන් කෙනෙක් වන, උකුවල වලව්වෙ සේනා රතන විජයගුණතිලක මල්පැන්න මහබණ්ඩාර මහත්මයා කුණ්ඩසාලෙදි අපට සම්භව, මෙමඋත්සවයගැණ සැරැණු දැන්නුවේය. මේ මහතා විසින් දිනසුතු මිල් පැස් ගණන එකතුකර ගැණීමට පණිසක් පමණ මිනිසුන් යැව් නමුත්, මෙදින පහන්වෙන කාලයේදිම මුළු දියතලාවේ ඇතුවගිය මල් මේ සඳහාම නෙලාගෙණ තිබුන බැවින් නොලැබුන බවත්, ඒ වෙනුවට වහාම මහ නුවරට මිනිසුන් යවා පින්දිස බෝතල පණිසක් සම්පාදනය කළ බවත් අප සමග කීවේය. මෙම බණ්ඩාර මහතාට වයස සත්අසූ වස් පස්මසක් පමණ බවද පැවසීය.

මහත් සේනාවට අමෘත වතුරක් මෙන් වී, ශ්‍රීම කැට අවිල අවිලා කඳා ප්‍රීතියෙන් ප්‍රීතියට පත්වූහ. මේ ආශ්චර්යයක් වතුර ගැන ඇසූ කව්රුත් මවිතවූහ. *

මුදලිතුමි, තමන් සඳහා පැමිණි දහස් ගණන් සේනාවට කෑම පීම ආදියෙන් සඛ්‍රහ කිරීමට පටන් ගත. මුදලිතුමා වාසල මුදලි ඇදුමෙන් සැරසි කස්තාන පැලඳ රන් මාල පදක්කම ආදියෙන් ලීලා පෙනව ටෙ වේලාවේ සිපි නමුත්, පියෙක් මෙන්ද මිහු යෙක් මෙන්ද, දුසනෙක් මෙන්ද, පැමිණි ජනතාවට සඛ්‍රහ කළ මහිමය ගැන වර්ණනා කිරීමට නතනාට හාරදී මෙයින් අහක්වීම සුතුයයි අපට වැටහේ. සිය ගණන් ජනයා මුදලිතුමා දර්ශනය සඳහා සිය ගණන් කෑන් මළු රැගෙන් මෙදින ටෙ වේලාවේ ආවාහුය. ඒ සියල්ලම දුටු මුදලිතුමා සුත ප්‍රෙමයෙන් කෑගි හොඟ දිමෙන්ද, කෑවිපිට දිමෙන්ද ඔවුනුට මොනවට සඛ්‍රහ කෙළේය.

ටෙ සියල්ලටම වඩා ටෙ පොත කියවන නුවණැත්ත තනු මවින කරුණුසුලු කරුණක් මෙදින සිදුවීම ආශ්චර්යයකි. මුදලිතුමා වාසල මුදලි තනතුරට පත් වෙන්ට ප්‍රථම්, බතුලුවක් ඇස නොදැක ගොඩ කිම ඉතා අමාරුවෙන් කුරහන් වපුලා දුකසේ කන ගොන හම් වාසි ජනයාගේ ඕසකරු දුක දැක, ගොනගම වැව බන්දවා දිමෙන්, බත් කා ජීවත් වීමට සැලසූ බැව් ටෙ පොතේ නැනක සඳහන්ව ඇත. ඒ ගම්වාසි ජනයා

---

* මේ ජව වර්ණව ගැන එදිනම ඊට්බන්ගොඩ ජයසුරිය ආරච්චිගේ දෙන් පවුලිස් වෙදඅප්පුහාමි කී කව් දෙකක්:—

පෙම්න සදිනට සිරිට වන ජොරණ්ඩ් ද සොසියා මැතිඳු පුවන ර
ලදිසුරු වෙරින් ආදර නම්බු සුතු සස මුදලි තනතු ර
ඩ න දින තනුරන්කෙනේ තම සොඳුරු මදුරට සතුටු සුරව ර
ස ද න ලෙස විදි මිණි රැසින සෙද පාණ වැස්සක් වැසි මනහ ර

පොර ණ වේසඟරු තිරිදු යාලේ පොකුරු වැසි වැස නුවරවස්ස ද
ස ද ණ සුදුසුරු දුනම් පල සල ලෙසින් රිස්සූ නෑ සතුන් මැ ද
ද ර ණ ඉණ ජොරණ්ඩ්ද සොසියා දිසානායක මුදලි මැති ස ද
දෙ ර ණ අසණ්ද පොළඹවැලි පාණ වැස්සක් සුදුම් ලෙද අ ද

එතතුව රන් රිදී මුතු මැණික් ආදියට වඩා අප විසින් සැලකිය යුතු බහින්ම මුදලි තුමා පිදිය යුතුයයි සම්මත කරගෙණ, කළගුණ සැලකීමක් වශයෙන් ඔවුන්ට බත් දුන් පියතුමා වන මුදලිතුමාට ගෞරව සඳහා, මෙම උත්සවයට රැස්වූ දහස් ගණන් ජනයාට කෑම පිණිස සිය ගණන් තනිකර බත් කත් සහ ඊට උචිතනා ව්‍යඤ්ජන කත් සිය ගණනක්ද රැගෙණ අවුත් මෙදින මුදලිතුමා බැහැදක්කාහුය. මොවුන් ගෙණා බත් දහස් ගණන් සේනාව බඩකට පිරෙන්ට කා ඉවරකරන්ට නො හැකිවූයේ අනතිමයේදී හරකුන්ගේ කෑමට ගොඩකරණලදී. මෙ ආශ්චර්ය්‍ය මෙදින සිදුවීම ගැණ මෙය කියවන්නෝ කුමක් සිතාද්ද? * මෙ පුණ්‍යවන්ත පරොපකාර මුදලි තුමාගේ ප්‍රමාණාතික්‍රාන්ත මෙම එකම ගුණ විශෙෂය සඳහා **"නරදෙව්"** යන ගරු ශබ්දය ආරූඪ නොවන් නේද? †

---

* වාසල මුදලිකම ලබාගෙණ හඟුරන්කෙත වත්තට
මුදලිතුමා සම්ප්‍රාප්තවූන දින කිරිගල පිටියේ
සුබා නැකතිරාළ කී කවියක්.:—

කු රු ළු කැල පිනවූවට බැස්සා වැනිය හඟුරන් කෝතට දන රැ ස
අ ර ඹ බුඹ පමණවම වැස්සා මිදුන දිය යැට මපිත වන ලෙ ස
ඇ මු ළු බත් දලු බුලත් රි ස් සා යන්ට සිතුමෙන කයා විය නො ස
මු ද ලි මැනිහට දූත් උ ස් සා වැන්ද දුක් පත් දනන් නොවල ස

† ගොනගම වාසී දනකාට කරදුන් කෘතඥයන්ට වඩා, මයිල පිටියේ සිට හඟුරන්කෙත දක්වා තනාදුන් මහමාවත අතිශයින් ආශ්චර්ය්‍ය බවට, සිරිමල්වතු වලව්වේ පරම්පරාවෙන් පැවතෙන, ගජතුඞ්ග අඟසගුණවඩින රාජසුන්දර මහනිලමේතුමා ගුරුදෙණියේදී අප සමග කළ කථාවේදී ප්‍රකාශ කළේය. එනම්:—

මයිලපිටියේ පටන් හඟුරන්කෙත දක්වා ඝන කැලෑසහිත දුප්පාතය එලිකොට පාර මාකිම් කොළේ මෙම මුදලිතුමා බඩට බත්කා නොව බොහෝවිට ඇඹුල් දළු වඟී කා පිත් වතුර හිමෙන් සහ ගසාගත් පිට පොවේ නොම ගුනීමෙන් බවය. අඳුරු දිනවල රෑ කාලයේ සිස්ඔිලා ගසක වාසන කරමින් සඳපහන් දිනවල රෑ කාලයෙත් හුඳකලාව මේ පාර තැනීමේ වැඩකළේල; මෙසේ තද වෙහෙසට පත්ව බැරිතැන ගොඩනර හැකැප්ම සියගණන් ඇරිද හිසුන් හැටින් පමණ එකතු

මෙසේ මෙතුමාට ලැබුන වාසල මුදලිඃනම ගැණ සතුටුවූ නානා ජාතික ජනයා නොයෙක් පුද පඬුරු රැගෙණ මෙතුමා බැහැ දැකීම සඳහා දිවාරෑ දෙකේම හඟුරන්කෙත * වත්තට පැමිණෙන්ට පටන් ගත්හ. පැමුණුනාවූ දරුවාගේ පටන් මහල්ලා දක්වා සියලු දෙනා වම ඉතා ආදරයෙන් සඞ්ග්‍රහ කර යන්ට හැරියේය. පස් දිනක් යනතුරු එන යන ජනයාට කල කී ආදර

කොට ගෙණ, දිනක් මෙවාවන තනන සම්පයට එක්ක අවුත්, එතුමාට උදව්වෙන මෙන් ඉල්ලූකල, ඔවුහු මෙසේ කීවෝලු, "පාතරට උන් නැගේ සතුන් ඇස බැඳගෙණ අවුත් සිටින නිසා වන දෙවතාවුන් වහන්සේලා බල දීමෙන් රජ මල් උසනට සාමට (රජමල් උසන නම් මොවුන් ව්‍යවහාර කොළේ රජුන්ට හිමි කෝපිවත්ත, හෙවත් රජුගේ මල් වත්ත හඟුරන්කෙත තිබුනහිසාලු, මෙ ක්සන්නේ මුදලිතුමාට හිමිවූ ඉඩමටය.) මාවත තනන්නේය. අපවැනි නර පණුවන්ට තබා නිලමන සොඩයින්ටත් බැරි වැඩ අප කරන්නේ කෙසේද? කියාස මෙසේ පවසා,එනාම කෙණෙක්වත් නොසිට පලාගියෝලු. බුදුවෙන බොසිසතවසෝ විනිසි අනාතාහැර එතොකුදු කොයන්ට අදහස් නොකොට සාරමසක කාලය තුළ දිවා රෑ මහත් දුකක් සහ වෙහෙසක් ගෙණ බොහෝ දුර ගල් අතුරා මිනිසුන්ගේ හඟ දුරුවෙන තැනට මාවත ගෙණ එතැන් පටන් උදව් ටික ටික ලබාගෙණ මාවත සම්පූර්ණකොට මින ජනයාගේ ගමනා ගමනයට සහ කරත්ත සුවසේ ගෙණ යාමට විවෘත කලෝලු. (මෙම මාවතේ ඉතුරු වැඩ සම්පූර්ණ කොළේ මුදලි තනතුර ලැබුනාට පසුව බව සමහරුන්ගේ තමවත් තීසමනකි.) ඉංග්‍රීසි රජුන්ට ලංකාව හසෞප්‍රාපත නොවී සිංහල රජුන් අත තිබුනා නම්, එස් පෙදෙසත රජකම මෙතුමාට දෙනු නිසැක බවත් එසේ නොදී සිටීමට නුවණැති මින නිලමෙලා ඉඩ නොදෙන බවත් මේ මින නිලමේ අප සමග කියා සිටියේය. තවද මේ අනගි මින මාවත ගැණ මිනණුන්නාන්සේ නමක් ප්‍රබන්ධවගයක් කර තිබුන බවත් එයින් මින නිලමෙ තුමට කවිකන පද දෙකක් පමණක් පාඩමේ තිබෙන බවත් ප්‍රකාශ කළේය.

ඒ කවි පද දෙක:—

හඟුරන්කෙත පාර තැනූ පනත රවින් ආ උතු මා
සහරුවත්තෙ වෙලෙන් වෙසිදි රජවෙනවා ඇතා නිත මා

* සහරනකෙත, සැඟුරන්කෙත, සහරුවත්කෙත, හඟුරන්කෙත යනාදී නාමයන් මෙම පලාතට ක්‍යන බව ඇසිමු. මුඛපරම්පරා කව පවතින මේ නාමයන් ගැණ දිගතලා කෝරළවාසී ජනයා නානාවිධ විරාකතරද කියත්. එනම්:—

ගෞරව සඞග්‍රහ අවසානයෙහි, සයවෙනි දින මදක් විවේක ගෙණ සත්වෙනි දින මොරවූවට යාම සඳහා කොළඹ එමට පිටත්විය.

එවකට කොළඹින් උඩ රටට යාමද, උඩරටින් කොළඹ එමද, ලෙහෙසි පහසු වැඩක් නොවෙ. කඩුගන්නාව ආදී අන්තරා සහිත ස්ථාන පසුකර යාම රිවි මහ යුඩයකින් ජය ගැණිමටත් වඩා උසස් ලෙස වැඩි දෙන කල්පනා කර සිටියෝය. සොර සතුරන්ගෙන්ද ශීත සුලං ආදියෙන්ද කොයි වෙලේ අනතුරක් පැමිණේද යන භයක් ගමනා ගමනය කරණ ජනයා අතර පැවතුනේය. මෙසේ එවකට උඩ රට යන සියලු දෙනාම මෙන් "පින් පව්" ඇර යන සිරිතක් පැවතිනි. ඒ භය නිසා මුදලිතුමා කොළඹ එමට පිටත්වූ කල උඩ රට වාසි මුදලි තුමාට හිතෛෂිත බන්ධු මිත්‍රාදීහු, සුවසේ කොළඹට පැමිණිමට සහ නැවත නිදුක් නිරෝගිව උඩ රටට එම ගැණත් දෙවියන් යැදිම පමණක් නොව, ආශිර්වාදද කලෝය. මුදලිතුමා සියලු දෙන අස්වසා පිටත්විය. මග තන්හි තන්හි මාරුකිරිම සඳහා අසුන් සහ අසරුවන් තබා අසුන් යොදනලද රථයෙන් ප්‍රිය පුත්‍ර චාර්ල්ස් හැන්රි ද සොයිසා මහතාත් සමග පිටත්ව එන මුදලිතුමාට කඩුගන්නාවෙදී උදය කෝපියෙන් අනුග්‍රහ කිරිමට මානුවෙල් ප්‍රණාන්දු මහතා සූදානමව සිටියේය. කඩුගන්නාවට පැමිණි එයි

පුරාණයේදී මේ පලාත කෙෂත්‍රයක්ලු. මේ අසල කුඩා ආවාසයක සඟනමක් වැඩසිටියේලු; මෙකී ක්ෂෙත්‍රයේ රත්රන් තිබෙන බව පළමුව මෙම සඟනම දැක වදාළ බැවින්, එතැන් පටන් "සඟුන් දුටු රත්රන ඇති කෙත" "සඟරනකෙත" නමින් ප්‍රකාවවිලු; මෙම කෙතේ සඟවා තිබුන රත්රන් මතුවූ බැවින් "සැඟුරන්කෙත" නමින් ප්‍රකටවූ බවද, "සංඝරතනය" වැඩසිටිය බැවින් "සඟරුවන්කෙත" නමින් ප්‍රකටවූ බවද, සකාර හකාරාදෙශයෙන් හඟරන්කෙත නොහොත් හඟුරන් කෙත වූ බවද කියත්. මේ ඇර මේ පලාතට "ගේවාවින්සයයිද, දිඹපාලා කන්ද, දියතලා කෝරළයයිද කියත්. මෙය පමණක් මිස මේ ගැණ අන්‍ය විස්තරයක් පොතපතකින් අප විසින් නොදක්නාලදී.

නොනැවතී කෝපියද නොගෙණ ගමන ඉක්මන්කලසුතුනිසා මාලුවෙල් ප්‍රණාන්දු මහතාට සතුනිකොට කලින් ලියාඑවා තිබුන ප්‍රකාර දවල් කෑමට මාවනැල්ලට පැමිණිසේය. ලියමන ලබනලද දූනට මොරටු සඩගමයේ ප්‍රධාන තැන් පත්, විදුහලාගේ ජොහානස් ද මැල් මහතා කෑගල්ල පලා තට පැමිණ මහන්සි ගෙණ උවමනා සියලුම ද්‍රව්‍යයන් රැගෙණවිත් මොනවට දවල් කෑම සූදානම කරණ ලද් දේය. මුදලිතුමා ගමන ඉක්මනින් යාමට උවමනා නිසා, මාවනැල්ලේද නොනැවති, අඹේපුස්සට යන්ට ඕනෑ බව ද මැල් මහතාට දන්නුකල, ඒ මහතා කනගාටුවට පත්ව, "හොඳමයි යාමට මාවන තිබේ; නමුත් සූදානම කර තිබෙන ආහාර පානාදිය රථයේ ගෙණත් තබමි"යි පැවසීය. එකල මුදලිතුමා සහ පුත්‍රයාත් රථයෙන් බැස ද මැල් මහතාගේ වාසස්ථානයට පැමිණ දියනාගැණීමට උවමනා බව දන්නූහ. වැඩිහිටියන් ගැණ සහ පැනවතුන් ගුණවතුන් ගැණ සැලකීමෙ මාහැඟි ධර්මය එවකටත් දූන සිටිය ද මැල් මහතා සිය අතින්ම, "සපත්තු මෙස්" ගලවා එම මහතාගේ වහන් සහල දෙපා සේදීමට සලසා දිය නෑමට කැඳවා ගෙණ ගොස් එයින්ද සතුටු කරවා එක්කැවිත් දවල් කෑමෙන් පිය පුත් දෙදෙනා මොනවට සැනැජ්විය. ද මැල් මහතාගේ යටහත් පහත්කම ගැණ සහ ගුණවත්කම ගැණත් අතිශයින් ප්‍රශනනව එයින් පිටත්වීමට සූදානමවූකල, සවස්වූ බැවින් අතුරුපසකින්ද සලිදු සඩග්‍රහ කොට පිටත්කරවිය. * මුදලිතුමා තම පුත්‍රයාත් කැටුව එයින් පිටත්ව රෑ කෑමට අඹේපුස්සේ බ්‍රැන්ඩි ගම්පලගේ ජෙරෝනිස් පෙරේරා විජේසිංහ මහතා (ජෝරන් කොස්තාපල් රාළහාමි) ගේ නිවසට පැමිණිසේය. ඒ මහතා ඉතා හොඳින් රෑ කෑම සූදානම කොටදී

* මුදලිතුමා, ද මැල් මහතාගේ ආවාහ ස්මාංගිදී මෙවිනතුරු ප්‍රවේශයෙන් තමාගෙණ සිටින රත්රන් පවුම තැගිකොට දී, විවාහ සෙනිදී පැලඳිවට එතුමාගේ අගනා රන් මාලය දුන් බවද, මඟුලට දකොාටදී වෙනව විසදුම දීමෙන් ආදර සැලකිලි කළ බවද ද මැල් මහතා අපට දන්විය.

මොනවට සතුටු කෙළේය. මුදලිතුමා ඉතා කඩිනම්කොට උඩ රට වාසි හිතෙකිකසන්ගේ ආසාවමෙන් කිසිම කාය චිත්ත පීඩාදියකට නොපැමිණ සුවසේ 1853 නේ ජූනි මස 7 වෙනි දින කොළඹ කැලණිගඟ නොවමුණට සම්ප්‍රාප්ත විය. නොවලඟ වාසි සිංහල වෙළඳ ජනයා ප්‍රධාන කොට ඇති ඉංග්‍රීසි, ලන්ඩි, හිඳු, පාර්සි දුවිඩ, මරක්කල ආදි ජනයා මුදලිතුමා ගෞරවයෙන් පිළිගෙණ, ආදර බුහුමන් කළහ.

නවද නොව සමීපයේ කීපපලක විශාල ගෙඩි ගෙවල් බැඳ ගොප් සහ නානාවිධ ඵල පලලවයන් ගෙන් සහ කෙහෙලි රාශියකින්ද එම ගෙඩි ගෙවල් සරසා තිබුනේය. මුදලිතුමා පිළිගැණීමට සැරසි සිටි මොරටුව, පාණ්දුරය, මීහමුව, මාරඹිල ආදි පලාත්වල ජනයාද, කොළඹ නඩවත් සතර කුල සිටි ප්‍රසිඛ සිංහල, සුරෝපිය, ලන්දේසි, දෙමළ නිලධාරික ජනයාද ධනවත්හු සහ මුදලි මුහන්දිරම් ආරච්චිවරු ආදිකොට ඇති මහත් සේනාව මල් සහ විලඳ ඉසිමෙන්ද, සුවඳ පැන් ඉසිමෙන්ද, ආදර ගෞරව පවත්වා සියවලි විටින් දූනට විගුදන් ගොඩැල්ලේ අඤ්ජස්සොසිසා මහතා වසන "ග්‍රනරිහිල්" නම් නිවසට කැඳවාගෙණ ආවානුය. එවකට මෙම නිවසේ පදිංචිව සිටියේ, එම නිවස හිමි සුසෙව් ද සොසිසා මහතාය. මේ නිවස මෙනාක් ද සොසිසා කුවුඹිට අයිතිවයිබේ. මෙම ගෙදොර රැස්ව සිටි සත්‍රී පුරුෂ ජනයා එසේම මල් විලඳ සුවඳපැන් ඉසිමෙන් මුදලිතුමා පිළිගැණූ ලැබුවානුය. සිය ගණන් ජනයා ත්‍රිභාෂාවන්ගෙන් සරසනලද කාව්‍ය ප්‍රබන්ධ සහිත සතුති පත්‍ර කියවා ඔප්පු කළෝය. එවකට සින්දු කියෙමි සහ සින්දු බැඳීමෙහි සමර්ථව කොළඹ විසූ, දෙන් හර්මානිස් ගුරුතුමා විසින් ඉතා රමණීකාර ගොනනලද සතුති ලියවිල්ලක් කියවා මුදලිතුමාට පිළිගන්වන ලදුව, ඒතුමා විසින් ඊට සන්තොෂ ධන වශයෙන් රත්රන් පවුම් හතරක් තෑගි කෙළේය. මුදලිතුමාට සෙත් සලසන

ප්‍රශංස කරණලද ශ් සින්දු ආදියද සමහරු කියවා ඔප්පු කලෝය. එහිදී මුදලිතුමා වෙනුවෙන් සහෝදර සුසෙව් ද සොයිසා මහතා පැමිණ සිට මහත් සේනා වට කෑමපිම ආදියෙන්ද තෑගිදීම සතුටු කිරීම ආදියෙන්ද ඉතා සාදිමට සඞ්ග්‍රහ කලහ. මෙආදි සියලු සුතු කම් අඩු නැතිව ඉඩකර ජූනි මස 10 වෙනි දින මුදලිතුමා උපන් ග්‍රාමයට (මොරටුවට) යාම සඳහා සූදානම විය.

මෙ ගමනටද මහ පෙලහරක් සූදානම විය. පෙළහරේ පටන්ගැන්ම රතු ඇඳුමෙන් සැරසුන පස් විසි දෙනෙකුගෙන් යුත් "ලස්කිරින්" නම ගේවා හමුදාවකින් යුක්තවිය. ඉන්පසු නානාවිධ බෙර දවුල් ගසන්නෝද, වස්කුළල් හොරණෑ පිඹින්නෝද සින්දු කියන්නෝ සහ තිගිතා කරන්නෝද, වීණා ගාන්නෝද, පිනුම් කාරයෝ සහ නැටුවෝද, තුවක්කු ගත්තහු සහ අවශෙෂ ක්‍රීඩා කරුවෝද, පිල්වෙළට සිටගත්හ. මුදලිතුමා රණකම් කල මාහැඟි වස්ත්‍රයක් සහ ඉතා අගනා කළු "ලාක්කවලින්" නිමකර රත්රන් "බොලත්" සහ "බොත්තම්" සහිත කබාය හැඳ රන් පටිය සහිත රන් මිණිමුසු කසකාතය සහ රන් පදක්කම පැළඳ, අගනා දිලෙනා ඉඳුනිල් වෙරළුම් මිණි ආදිය බැඳි මාහැඟි අඞ්ගුලාභරණාදියෙන් සැරසී * තම ප්‍රිය පුත්‍ර රත්න සත් සමග පෙලහර මද්‍යයට සම්ප්‍රාප්තවූකල, රැස්ව සිටි අවශෙෂ මුදලි මුහන්දිරම්වරු තම තමන්ගේ කලාතුකරුවන් සමග සරද සඳ පිරිවැරු තුරු රැස මෙන් මුදලි මන්ත්‍රිශ්වරයා පිරිවරාගත්හ. යලිදු සුසෙව් ද සොයිසා මහතා ගාඩම්කරුවන්ට විශෙෂ සඞ්ග්‍රහවක් කල ඉක්බිති පෙලහර පිටත්විමට සංඥ කරණලදි.

* මේ ඇඳුමේ අලඞ්කාරය ගැණ ලියන ලිපිකරුවෙක් මෙසේ ලියාතිබේ. "ඇත්තෙන්ම මේ ඇඳුම දෙවානුපණ්ණගේ දසවෙනි ආඥාව කැඩීමට මනුෂ්‍යයන් සහාය ලෙස පොලඹවමින්ත" යනුයි.

13. ජූනි, 1858, ඔබසර්වර්.

මෙසේ මහත් පිරිසත් සමග මුදලිතුමා මද තැනක් දෙපයින් ගමන්කර ප්‍රිය නඳුනයාත් සමග, සුදු අසෙකු බැඳි මාහැඟි රථයට නැංගේය. මේ රථයට පෙර පෙල හරද පසු පස්සේ මහත් සේනාවද ඒ පසු දිසි රථ පඬිතියද ගමන් ගත් අතර දෙපස රැස්ව සිටි දහස් ගණන් ජනයාගේ අවඟිරකම් නිසා මාහිසට බැස ගන්ට බැරිවූ ඇතැම් ගුදීජනයා ගරුතර ආණ්ඩුකාර තුමා විසින් ගෞරව කරණු ලැබූ මේ පුණ්‍යවන්තයා සඛයිය ගෘහ්‍ය පාඤ්ජරයන්ගෙන් එබී සුවඳ පැහින් තෙවූහ. මෙසේ සම්භාවනා විඳ විඳ එන මුදලිතුමා ඉදිරියට එව. සි. සැල්බි නම් රාජකීය නීතිඥතුමා (Queens Advocate) පැමිණ මෙතුමා ලැබූ උසස් තනතුර ගැන එතුමාගේ සන්තුෂ්ටිය ප්‍රකාශ කෙළේය.

මුදලිතුමා මොරවුවට යහපත් වෙන බැව් ඇසූ කොළඹ නගරවාසි වෙළඳ දනයා ප්‍රධානයොට ඇති බොහෝ දෙන තන්හි තන්හි, සැරසිලි කර ඒ ඒ ස්ථානයන්හි රැස්ව මල්ඉසිම, පිනිදියඉසිම, ආදී යෙන් සහ සතුති සහිත කාව්‍යාදියෙන්ද, එතුමාට ගෞරව සඩ්ගහ කළෝය. දුර්ඛ ජනයාද මනාලෙස ගොතනලද හෙළ මල්මාලා මුදලිතුමාගේ කරලා දෙති පල සහ හෙළ සඳුනෙන් සඩ්ගහ කළානුය. සිංහල, සුරෝපිය, ලන්සි, දෙමළ, මිරක්කාල, පාර්සි, අරාබි, ජා, සම්බන්කාර ජනයා, එක මවෙකුගේ පුත්‍ර රැසක් මෙන් සමගිව මුදලිතුමාට කළ ගෞරව මදවා ඕස වැඩි නැති බැව් අදවනතුරු වෘඛ ජනයා කියත්. මුදලිතුමා රැස්වූ මහත් සේනාවට සහෝදර ප්‍රේමයෙන් කථාකර සතුති කෙළේය. ඒගුදම් ගොඩැල්ල, මිසන් ගස්විමිය, පණික්කිවිමිය, වොල්වොන්දල්විමිය පසු කර කසිමන්දෙරකඩට පැමිණි කල, මුදලිතුමා දකිනය සඳහා රැස්ව සිටි මහත් සමූහයා විප්‍රකාර සඛභාවයෙන් කෞතුක වදන් උච්චාරණය කළෝය. එනම්:— හෙරිවාදුයන් විසින් ගසනලද විශෙෂ බෙර පදයන්

හෙන් මුළු ලක්දිවටම අමුතු යහපතක් වෙම මුදලිතුමා හෙන් සිදුවෙන බව හැඟියන්නේයයි සමහරු උච්චාරණය කලෝය. හලාකාරයින් විසින් පිඹිනලද සුම්භිරි නාද යන්හෙන් මෙම මුදලිතුමා දුන් ඉනින් වඩ වඩා සුම්භිරි වදන් යසින් ජනයා සඛ්‍රහ කරන් බව හැඟවෙන්නා සයි සමහරු උච්චාරණය කලෝය. මෙම පෙළහරට මුසුවූ කොඩි පෙල ලෙලදෙන අන්දම් දැක මුදලිතුමාගේ දයාන්විත හෘදය මණ්ඩලය දිලින්දන් කෙරෙහි කම්පිත වෙන ආකාර හඟවන්නේයයි සමහරු උච්චාරණය කලෝය. උඩැක්කිකාරයන් විසින් අයි තබා ආනහයා හසනලද උඩැක්කි ශබ්ද අසා මේ තේව පූජාවට කරණ හොරව කිරීමෙන් මුදලිතුමා දෙව රජතුවෙන් නර ලොවට බැස සිටින්නෙක් හැටියට හැඟෙන්නේයයි සමහරු උච්චාරණය කලෝය. මෘදඟ හෙරි වයන ශබ්ද අසා මේ මුදලි තුමා සම නොබැඳි බෙර පුරවා දුන්නට ධාන්‍ය දෙන බැව් හැඟෙන්නේයයි සමහරු උච්චාරණය කලෝය. රඟ දෙන නළුවන් දැක මෙම මුදලිතුමා දුක් මිත් යාචකාදීන්ව බහින් වතින් සඛ්‍රහ කර සතු වින් ඔවුන් නවවන බව හැඟෙන්නේයයි සමහරු උච්චා රණය කලෝය. සමහරු මුදලිතුමා දැක සතුවින් පිනා සිනාහ පහළ කලෝය. සමහරු සුවඳ පැෂ්ඕන් සහ සුවඳතිර මිලින් පිදුවෝය. සමහරු කවතොල වියලා හෙණ මුදලිතුමාට ඊෂ්‍යා කලෝය. සමහරු වාසල මුදලි කම් චිතා කෑමට සැරසෙන්නාක් මෙන් දනත පඛතති චිත චිතා සිටියෝය. සමහරු ඇස් ඔරවා රාෂ්‍යස විලාස යෙන් මුදලිතුමා දෙස බලා සිටියෝය. සමහරු මුදලි තුමා ලැබූ උසස් තනතුරට ක්‍රොධ කරමින් ගල් රූප මෙන් බලා සිටියෝය. සමහරු තැන තැන රඤවු ගැසි හොඳ නරක දෙවදන් මුසු කථාවන් පැවැත්තුහ. ඔහොව් ධර්මයානුග ශ්‍රෙෂ්ඨ දැනීමක් ඇති ඥනවන්ත මුදලි තුමා, මේසේවූ සත්ත්වයාට එතම කරුණාවෙන් තුම නිරහඞ්කාර නිස පාන්කරම්න්ද, සුම්භිරි වදනින් සතුති කරම්න්ද, කසිවන්දෙරකඩින් දිටත්ව හර්ෂිතියට පැමිණි

කලා මරක්කල වෙළඳජනයා මුදලිතුමාට විනිදිය ඉසි මෙන් ගෞරව කළෝය. ඔවුන් විසින් කරණලද ගෞරව ඉවසා ඔවුන්වද ඉතා කරුණාවෙන් යතුරු කර විට කොටුව පසුකොට පොල් නැඟි විවිතනියට පැමිණි සේය. පුදුමයකට මෙන් මෙහිදීත් හතුරන් කෙතදී මෙන් මල් වර්ෂාවක්වැනි සතුටුදායක වර්ෂාවක් වැස අධිකොෂණයෙන් මිරිකී සිපි දහස් ගණින් ජනයාට වසඟ වළාහකතෙම උපකාර විය. සැබෑවසෙන්ම මේබඳු උතුසවයන්හිදී වර්ෂාව අනතරාසඝාත නමුත් මෙම වර්ෂාව මෙහි උතුසවයට අවශ්‍යම වර්ෂාවක් වීමෙන් දෙව බලයෙන් සිදුවූ විශෙෂයක් ලොහෝ බොහෝ දෙන සිතූහ. නවද සතරදිගින් හමන මඳුමාරුත නැමති සතරමෙස දූතයින් විසින් මුදලිතුමාගේ කීර්ති රශ්මි සතර දිශාවට ගෙණයාමෙන් සිරිලඟට හානි පැමිණෙය යන බයෙන්දෝ හෝ, එක්ව ගිය පිරිස වහා වහා පිවිතනිය ඉක්මවා කොල්ඵ පිවි පෙදෙශට පැමිණියෝය. එහිදී ගරු වාලිස් පිවර ලෙයාර්ඩ බස්නාහිර පලාතේ මහ එජනතතුමා සම්මුඛවී ඉතා සතුටට පත්ව එතුමාගේ සතුට ප්‍රකාශ කෙළේය. මුදලිතුමා ඊටද සතුති කොට මද තැනක් යන අතර එලි යවිනම ප්‍රසිඛවූ ඉංග්‍රීසි වෙදතුමා සහ ඩැල්ෂිල් මහතාත් සම්බව ඒ මහත්වරුන්ගේ සතුටද ප්‍රකාශකළෝය. මුදලිතුමා ඒ ගැණත් සතුතිකොට එසින් පිවත්විය. මෙසේ මුදලිතුමාට සම්මුඛවූ සියලු තරතිරම් මිනුසවූහ යාට ආචාර සමාචාර කරමින් යන අතර කොල්ඵපිවි වාසි ජනතාවද මුදලි තුමාට මහත්සේ ගෞරව කළෝය. මුදලිතුමා ඒ හැමදෙනට සතුතිකර කොල්ඵපිවියෙන් පිටත්විය. මෙසේ මහත් පෙළහරින් එන්නාවූ මුදලිතුමාට සල්ඵිවි කෝරළේ මුහන්දිරම් බුරඹර දෙන් එබුහා ද රුබෙරු සමරවීර ගුණසේකර මහත්මයා සැකිය වලවව ලඟ සිට ඉතා කරුණාවෙන් කථාකොට, තිමන්හැරීමට සතුටු සියලු මහතුන්ට කැම බීම සුදුනම් බව දන්වා වලවවට පැමිණීමට ආරාධනා කෙළේය. මුදලි තුමා එය ඉවසා, එහි පැමිණිකල ඉතා නාගරිකතාලෙස මහත් මුදලක් වියදම්

කොට පිළියෙල කරන්නූනා සැටියට ආදියෙන් මුහන්දිරම් මහතා මොනවට සැලකුවා තෙළේය. මුදලිතුමා ඇතුළුව පිරිස මුහන්දිරම් මහත්මයාට සතුතිකොට එයින් පිටත්වූහ. මහත් විඩා සහිතව ආවාවූ පෙළහර සමූහයාට මේ කෑම පීට දිවබොදුන් හා අමා පැන් සමානවිය. එප මණ්ඩපය නොව, වෙහෙස කරණකොටගෙණ මදක් දුවිලවූ ගදඹ පිරිසට සැකිය සුතුකව පළමු ආහාරය ඉසිට කරගෙණ යාමට මෙය මහත් උපකාරයක් වූයේය. තවද බටබලපිටි වාසී ජනයා එහි සිට මුදලිතුමාට සඹා වෙමා කලෝය. එයින් පිටත්ව වැල්ලවත්තට පැමිණි කල එහි ජනයාද මහත්සේ ගෞරව කලෝය. මෙසේ දෙතිවල ගල්කිස්ස, රත්මලාන ආදි පළාත්වල ජනයා මෙයින් කරණලද අප්‍රමාණ ගෞරව සඬහ විඳ යන අතර මොරවුවෙන් මුදලිතුමා සම්මුඛවීමට පිටත්ව ආ මහත් පෙළහර මේ සේනාවට එකතුවුනේය. මේ දෙ සෙනගේ එකතුවීම කලණ්‍ණ නදිය සහ කාල නදියත් එක්වුනා සමානව තිබුනේය. කොළඹින් හිය පෙළහරේ දවුල් තම් මිචවට් කරුවන්ද, හොරණෑ කරුවන්ද, උඩැක්කි කරුවන්ද, ඒ කියන්නන් සහ නවවන්ද, මිහිඟුබෙරකරුවන් සහ කැපි කරුවන්නන්ද, වෙනත් වෙස් ගත්තවුන්ද මොරවුවෙන් ඉදිරිසට ආ පෙළහරේ එවැන්නවුන් සමඟ තරහයට දවුල් තම්මිචවට් මිහිඟුබෙර ගැසීම් ආදියට පටන්ගැණ්මෙන් වංචලවූ මුසුදාසට වෙරඹ වාතය එකතු වුනාක් මෙන් පෙළහර මහත් ප්‍රෞඪ සඬහාවක් ඉසුලුවේය. තරු කැල මිඩෑයෙකි බබලන තාරාපති ලෙසින් පෙළහර සමූහයා මිඩෑයෙකි මුදලිතුමා බබල බබලා මොරවුවේ කුරුඳු වත්තේ තමන් සෑදෙව් අවිබලම සම්පයට පැමිණි්යේය. මේ ප්‍රසාදවට රත්මලානේ පටන් මොරවුවේ එතුමාගේ වලව්ව දක්වා, දෙපස ප්‍රාකාර ලක්ෂණ ගොප් බැම් වලින් සහ කොඩි පෙළ මල් කලස් ආදියෙන් මොනවට සරසා පොලව සම්කොට මානිය හෙල වැල්ලෙන් වසා වලව්ව මංගල්‍ය දුටුවන් ආනන්දය කරවන නෙක ඵල යන්ගෙන් සුතා විශාල අට පවිවට් ගෙඩි ගෙයක්ද බැඳ

තිබුණේය. * වලව්වද එවකට කරණ උසස් සැරසිලිවලින් විරාජමානවිය. අම්බලම ආසනගතවූකල මුදලිතුමා රථයෙන් බැස මහත් සේනාවත් සමග පියවිලි පිපින් වලව්වට යන පත්විය. වලව්වේ සිටි නෝනා මහත්වරුද මහත්වරුද ඉතා ගෞරව සහිතව සුවඳ පැන් ඉසීමෙන්ද මල් විසිකරමින්ද රන් මිණි මුසු මුදු මාල තෑගි කිරීමෙන්ද තම තමන්ගේ ආදර දක්කුවෝය. නොයෙක් දෙන සතුති පද්‍ය කියවා ඔප්පු කළෝය. නොයෙක් වෘත්තවලට තනන ලද ගී සින්දු කියවා සමහරු ඔප්පු කළෝය. පාලි සංස්කෘත පාඨ ශ්ලෝකාදියද එසේම සමහරු කියවා ඔප්පු කළෝය. මොරටුවේ කඩ වසා වෙළඳ ජනයා රැස්ව තැන තැන මහත් උත්සව පැවැත්තූවෝය. මෙදින මුළු මොරටුව ආලකමන්ද පුරප්‍රවරයෙහි සිරිදැරී. මෙසේ අවිනිශ්චිත ගරු බුහුමන් ලැබීමෙන් පරිපූර්ණ මුදලිතුමාට මහා රාජ්‍ඤියගේ ආණ්ඩුවෙන් ගෞරව පිණිස ලැබුන හස්තය කොල්ළු පිටියේ විසූ මර්සේලිස් පෙරේරා මහතා විසින් ක්‍රියෙච්කල පැමිණි සිටිය උසස් සිංහල සහ යුරෝපිය මහතුන් සමග ඉංග්‍රීසි ක්‍රමයට පිළියෙළ කර තිබුන කෑම අනුභව කිරීමට මුදලිතුමා පළමු වෙනි වරට වාඩිවිය. කෑමෙන් පසු අද්‍රියන් මැන්දිස් මනුකුල සූරිය සේනානායක ගල්කිස්ස සහ පේරුව ඇතුළුව මොරටුවේ මුදලි තුමා සිංහලෙන් කථාකොට වාසල මුදලිතුමාගේ සහ වලව්වේ මහත්මයාගේත් සැප ප්‍රාර්ථනා කෙළේය. ගෞරවනීය මැක්විකර් තුමා ඉංග්‍රීසියෙන් කථා කොට එසේම සැප ප්‍රාර්ථනා කෙළේය. එවකට ධනවතෙක්ව සිටිය බලාපුවඩුගේ මනු

* ගේ ඉදිරිපිට තිබුන ප්‍රීති සාධක තොරණ මුදලිතුමාගේ නෑසෑන නෑදෑන කරණ එකක්විය. පාර හරහට නෙරා ගොස් අඩි තිස්පහක් පමණැති මධ්‍යම රේඛාවක් ඇති අව පත්‍රවමකින් පුන් ගුනලින් සිදුරු ඇති ගෙතුම් වැඩවලින්වූ සහ අසල තිබුන ශ්‍රී වන ජීර්ණ මල්වලින් අලඞ්කාර ලෙස සරසන ලද උඩු විසනක් ඇතිවූද පිටත ගෙඩි මල් ආදියෙන් රම්‍ය ලෙස සරසන ලද්දාවූද මෙම තොරණ විදෙශිකයන් විසින් කරණ ලද්දාවූ තොරන් අතුරෙන් ඉතා මානැඟීඑක බව සියලු දෙනාම කීහ. මොරටුවට ගොස් එය බැලීමටද සෑහෙන එකකැයි 1853. ජූනි, 13 දින ඔබ්සර්වර් පත්‍රයේ ලියුම්කරුවෙක් කියා තිබේ.

තුල සුසෑ සෙලෙස්ත්‌තු මැන්දිස් මහත්මයාද, ලිදමුලගේ ප්‍රන්සිස්තු සිල්වා පීස් ඔසිසර් මහත්මයාද, ඇලෑක්ෂැන්ඩර් ධර්මරත්‍නා මුදලිතුමාද, එසේම සිංහල භාෂාවන් පවත්වා මුදලි තුමාගේද, වලව්වේ මහත්මයාගේද, මුදලිතුමාගේ එකම පුත්‍ර ද සොසිසා මහතාගේද, අවශෙෂ බන්ධුන්ගේද, සැප ප්‍රාර්තනා කළෝය. මෙයින් පසු පැමිණ සිටි සේනාවට විවින්විට කෑම් බීම් දීමෙන් ආදර සඞ්ග්‍රහ කිරීමටද පටන් ගත්හ. මෙදින ය් මහත් රාශියක් ගිණුකෙළි දැක් වීමෙන්ද, වෙනත් නොයෙක් ක්‍රීඩා දැක්වීමෙන්ද, ජනයා මහත් උත්සව පැවැත්තුවෝය. මෙදින මොරවු අධිනාවගේ ප්‍රෞඪවූ කිනිසි ලතා නොමෝ දස දිග බලා ධාවනය කිරීමට පටන්ගනී. මුදලිතුමා කීප දිනක් මොරවුවේ නැවතී දුක් මග් යාචකාදීන්ට සහ දිළිඳුන්ට වතින් බතින් සහ ධනයෙන් මොනවට සඞ්ග්‍රහ කර පෙරළා උඩරට ගියේය. මෙසේ උඩ රට ගියාවූ මුදලි තුමා **වාසල මුදලි** තනතුරක් නබා **වෙල්විදාන** තනතුරක් ලැබූ කෙනෙකු පමණවත් අහඞ්කාර නොවී තමින් පළමු පුරුදු සෙනා ඇදුම් හැඳ වැටීම සම්ප්‍රාප්ති තමන්ගේ පුරුදු වැඩ පටන් ගත.

———:o:———

අහිංසාගේ ප්‍රමාණාතිශය.

මුදලිතුමා චතුවල ඇවිදීම සඳහා අසුන් පිට යාමට පුරුදුව සිටියේය. දිනක් මුදලිතුමා උදය කාලයේ අසෙකු පිට නැඟ චතුවල ඇවිදින්ට යාමට අදහස්කොට අස්හල්ව ගියකල්, පිට නැඟ යාමට අදහස් කළ අශ්වයා නෝප ස්වභාවයෙන් මුදලි තුමාගේ මුහුණ බලා හේසාරවය කෙළේය. වෙනදු හඬන ස්වරයෙන් මේ අශ්වයා හේසා රවය නොකළ කරුණ පරීක්ෂා කරමැයි සිතා කිව්වුවී අසු ගතව අත හසා බැලූකල දුවස් කිපේකින් පිසදමා නැයි වැඩත් සැහෙන ප්‍රමාණ දිය සහ කෑම් නොදී තිබෙන

බවත් දිවැසින් දුටුවාසේ දැන, සත්ව කරුණාවෙනා මුදලි තුමා සිය අතින් පැයක් පමණ වේලා අසු විසඳමා සිය තින්ම දිය පොවා කෑමදී, මේ අසු බාර අස්ගොව්වාට දඹ ගසා, වෙන අසෙකු පිට නැඟ යමැයි සිතා වෙන අසෙකු සමීපයට ගියේය. මේසේ ගියකල පළමු කවා පොවා අත ගෑ අසු මෙඟ ගජිනාවස්ථේ ගේසාරවය නොනවතා පවත් වන්ට පටන් ගත්තේය; මොහුගේ ඕසකරු ශබ්දය ඔස් නිසාදැයි පරීක්ෂා කරණ අපියෙන් නැවතත් කිව්වුවු කල වෙනත් ඩහාවකට නැවතත් ගේසාරවය කරමින් තමින් ගේම පිට නැඟ යන්ට කියන්නාක් මෙන් මුදලි තුමාගේ දිසාවට පිට සරව සරවා කකුල් ගසන්ට පටන් ගත. ප්‍රඥවන්තා මුදලිතුමා මොහුගේ අදහස් පරීක්ෂා කරමැයි සිතා, මොහු පිට අඟවාහරණ යොදූ නැංගේය. තම සුවාමී මුදලිතුමා පිට අරාගත් මේ අසු; ඊට ප්‍රථම නැඟී කිසිකරු කමක් දක්වා වෙනදූ මේ අසු ගසන අනාතුරු සහිත පිම් එකක්වත් නොගසා ඉතා ඉක්මනට හැල්මෙම ගමන් කර මුදලිතුමා සතුටු සිසලු තැන්වලටම ගෙණ ගොස් ආපසු එම ලීලාවෙන්ම අස්හල සමීපයට පැමිණුනේය. මොහුගේ සුදුම ලීලාව ගැණ මුදලිතුමා විමසුවත්ව එක වරක් අත ගා කෑම දුන් පමණකින් මේ අඟවයා මෙපමණ දුරට කළ ගුණ සලකා ක්‍රියා කළ නමුත්, ඇතම් මනුෂ්‍යයන් කළගුණ නොසලකා ක්‍රියා කිරීමේ අමනකම ගැණ හිතට ගෙන එනැන් පටන් සෑමදාම උදය අස්හලට ගොස් අඟුගණසා පරීක්ෂා කරණ සිරිත නොනවතා පැවැත්විය. චතුපදික මේ සතාගේ කළ ගුණ සැලකීමේ මහිමය කළ ගුණ නොසලකන අයට ඉතා හොඳ පාඩමක් දෙයයි විශ්වාස කරමු. මුදලිතුමාගේ අගිතුත අමූලික ගුණ රාශිය ගැණ තිරිසන් යෝනිගත අසෙකුට මේසේ වැටහී තියානම්, නුව නැති මනුෂ්‍යයන් ගැණ කියතුම කවරේද?

වාසල මුදලිකම ලැබුන පමණතින් මුදලිතුමාගේ ප්‍රකෘතිගත් ඉක්මවා ක්‍රියා නොකෙළේය. ඊට කාරණයක් නම්:—බොහෝවර වාත්තේ තටසුතු කරණ ප්‍රඥාවලදී

මුදලිතුමා වෙත හොයෙක් දෙන පැමිණ **බබාසිස්සේ, මුදියන්සේ ජාලහාමි කොහේද** කියා මෙතුමාගෙන්ම ඇසි විය. මෙසේ නිරහඞ්කාර මුදලිතුමා පළමු කළ කී කුසල ක්‍රියාවලට වඩා විශුද්ධ තිහුණ් වශයෙන් දුක්පතුන් සත පවමින් කාලය පසු කෙළේය *

—————:o:—————

කලගුණ සැලකීමක්.

මෙම මුදලිතුමා තවත් කෙනෙක් හා වෙළඳුම සම්බන්ධ කටයුත්තක් නිසා උඩ පලාතට පැමිණ දිනක් එහි කැලෑ පාරක ගමන් කරන් අතර භයානක ලක්ෂණයෙන් යුත් මහ දිවියෙක් මුදලිතුමාගේ පෙරට පැනගෙන් ආවේය. මුදලිතුමා හයව වටපිට බැළුකල, ජා මනුෂ්‍යයෙක් පස්සෙන් එන බව දුටුවේය. ජාමිනිහා මුදලිතුමා ඔහුට කථාකරන්ට ප්‍රථම, දිවියා ඉදිරියට දුව එන අතර දිවිතෙම හයව දුව ගොස් කැලෑ වැදුනේය. කල ගුණ සැලකීමේ උත්තම මාර්ගය දන් ප්‍රසූසඞ්ප්‍රසූකත්‍ව මුදලිතුමා මෙම **පකිර් තුවන්** නම් ජා මිනිහාට බොහෝසේ සතුති කරමින් ඔහුට හතුරන් කෙත නිවසට එන්ට නියම කොට, ඔහු මහනුවර සිට නියමකළ දින ආකල මසකට පවුම් දෙකකුත් සිලිම් පත බැසින් දිවි තිබෙනතුරු පිං පඬි දීමට සහ ජීවත්ව සිටිනතුරු ගුයනිවිදීමට මාහැඟි පලතුරු සහිත වත්ත කුත් දුන්නේය. මුදලිතුමාගෙන් පසු පිං පඬිය පමණක් හෝ වත්ත පමණක් හෝ දීමට බොහෝ දෙන අදහස්

---

* උඩ රට රුක්මලේ නිලමේ උපහාරයක් ඉල්ලා සොඬියා මුදලි තුමාට යැවූ කවියක්.

දිය ත පසිඳ සොඬියා මුදලිදු මෙවේ නා
සැඳිත බෙදන මුදලින් සිව් සැවක් ප නා
මි මිත අත එවා සිහිවක් උනොත් සි නා
සත ත දිසනූ වේස තැමෙවැඩ ලැබි සෙ නා

මේම උපහාරය මුදලිතුමා ඉඟිකළාහු.

කල නමුත්, සූර්ය්‍ය පොතෘතෙම සූර්ය්‍යාලොකයම පතුරුවන් නාක්මෙන්, **මාලීස් හැන්රි ද සොයිසා** තුම පියතුමාගේම නියමය ඉෂ්ට කොළේය. පකීර් තුවන්ගේ මරණයෙන් පසු මෙකී දීමනා නැවතුනේය. පරාර්ථයක මෙකී සත්පුරුෂ උතුමා, තම ජීවිතය ගලවා දුන් ජාම්නීභාව කල ගුණ සැලකීමක් වශයෙන් කල කී සැලකිලි අභිශයින්ම ප්‍රශංසනීය බව පෙණේ. නිලනතරයේම පරහට දයාවන්ත සහ පරහට වැඩ කැමති මෙ පින්වත් මුදලිතුමාට විරුඩව දිවියා ඉදිරියට එම සමග නිර්භීත පකීර් තුවන්ගෙ පැමිණීමත් දිවියා ඉදිරියට යාමට ඔහුට කෙණෙහි පහළවූ හිතිවිල්ලත් ආශ්චර්ය්‍ය බව වැටගේ. එසේවී නමුත් පරිශුඩ චිත්ත සන්තානයෙන් යුත් උත්තමයන් අභිශයින් හසුලූ සර්‍ාන ගතවූවාන් වහාම ඉන් ගැලවීමට මාර්ගයන් සම්භවීම සතුඃවූ ධර්මයක් බැවින්, ලොකවාසීහු මෙම මුදලිතුමා මෙන් සත්චරිතයන්ගෙන් චිත්ත පරිශුඩිය මුදුන්පමුණුවාගෙණ පරාර්ථයෙහි ඇලී වාසය කිරීමට මෙයින් ඉගෙණ ගන්නේවා!

———— :o: ————

නාග ශාන්තිය.

———

ජෝර්ජ් ද සොයිසා මුදලිතුමා එක් දිනක. දඹවෙල පිකිරිබණ්ඩාර මහතා සම්භවීම සඳහා දූසයින් සමග කුඹුරු ඔස්සේ නියර මාර්ගවලින් දඹවෙලට යන්ට ගියේය. මෙ දවස්වල පැවති තද වර්ෂාව කරණකොටගෙණ කුඹුරු සියල්ලම වතුරෙන් යටවී තිබුනේය. මුදලිතුමා යන්නමක් පෑදී තිබුන නියරකින් යනඅතර ධවල වර්ණ නාගයෙක් දුර්විල ස්වභාවෙන් තමා ඉදිරියට එන බව දැක, පස්සෙන් පස්සට ගියේය. නාගයාද ගමන නොවලකා මුදලිතුමා ඉදිරියටම එන බව දැක, මගහැර යාමට ඉඩ නොමැති සෙයින් නැවතුනේය. මුදලිතුමා නැවතුනකල නාගයාද නැවතුනේය. එහිදී මෙ සතා මුදලිතුමාට අනතුරු කරණ අදහස

කින් එහා සතෙක් නොව, කෑම හානියෙන් පෙළෙන සතෙක් යනු දිවැසින් දුටුවාසේ දුනු, හැරී බැලුවේය. මෙයේ බැලුකල මෙම නියරදිනේම එන දෙමල මිනිසුන් දෙදෙනෙක් දුටුවේය. මෙයින් කෙනෙක්අන දික් දණ්ඩක්ද, අනිකා අත කඩබැඳි බත් මුලක්ද තිබුනේය. දණ්ඩඅතැති තැනැත්තා නාගයා දැක දණ්ඩන් ගසා මරන්ට කැන් කල හමුන් එය වලකා, මුදලිතුම බත් මුල උනවා බත් යෙහෙන් නාගයාට ඉතා කිට්ටුව තණ මතු බත් ඇතුරුවේය. නාගතෙම ඒ බත් සිඹ හිස ඔසවා මුදලිතුමාට නමස්කාර කරණ ලීලාව දක්වන්නාක් මෙන් තුන්විටක් නාග හිස නමා ඒ එක්ක තිබුන දියසුන් පස් පිණ්ඩයක් උඩට හොඩවුනේය. දෙමළු දෙදෙන නාග යාව බයෙන් මුදලිතුමාගේ වාම හස්තය අල්වාගෙණ නාගයා හොඩවූ පස් පිඩ සම්පයෙන්ම ගොස් ඉන් ඔබබට පැමිණියාහ. දෙමළු දෙදෙනා මුදලිතුමාගේ මේ උතුම් ක්‍රියාව ගැන පැසසුවා පමණක් නොව, භාරගම වත්තේ එවකට කුලිවැඩකළ රන්කිරා * නම් අයට මේ බව දන්වා, මුදලිතුමා රන්කිරාලා හිතා ඔපින ප්‍රමාණයට වඩා බොහෝ පින්ඇති උසස් උතුමෙක් බැව් තේරුම් කරදී එතුමාව වඩ වඩා සැලකිලි ගෞරව කිරීමේ වටිනාකම ප්‍රකාශ කලාහු. නුවණැති මෙතුමා විෂඝොර සපියාගේ අදහස් උදහස් පුදුම්සේ දුන බතින් සහරා කර තමනුත් ගැලවී දෙමළු දෙදෙනාත් ගලවාගෙණ නාගයාත් නොමරා ඔහුට කළ ඥානයේ විපුල අනසිතාවය එසේ මෙසේ අයට තේරුම්යන කරුණක් නොව, වර පණ්ඩිත ජනයා ඉතා ප්‍රිය කරණ ආශ්වස්සිමත් කරුණක් බැව් වැටහෙනු නිසැකය. මෙබඳු උත්තමයන්ට යසඉසුරු අත්හිම කවරනම් ආශ්වස්සි යක්ද? නුදී ජනයා ප්‍රිය භාවයෙන් යුක්තව මෙම මහඟු කරුණු දැන ඉගෙණ, විෂඝොර සතෙකුදු නෑර සියලු කාල සෙනිම් ශාන්ති දැනයම් කරත්වා!

---

* මෙම රන්කිරා ලෙවුලේදී අපට සම්භව මේ කථාව නිසනලදී. ඒ මේ දෙදෙනාගේ නම්, රාමා සහ මාණික්සාන් බවද, ඔහුට දුනට වසර දෙසැටක් පමණ වෙන බවද පවසා මුදලිතුමා තේවාවිස්සේ රජ්ජුරුවන් වහන්සේය. වලව්වේ මහත්මයා දෙවින් වහන්සේය යනාදී විශයෙන් ඉතා වැදගත් තොරතුරු නැඹුරුවිය.

ගිනි නුඳුන් පුවාහනිය.

දිනක් මෙම මුදලිතුමා තවත් අයෙක් සමඟ සවස්වරු පරමපරාවෙන් පැවතෙන වැදගත් නිලමේ කෙනෙක් සඳහාවීම සඳහා උඩ ගම්මැද්ද නම් ස්ථානයට යනකල් මහදි රැවුණේය. නුවූ ඵලියක් නොලැබ බොහෝ දුර ගොස් ඉන් එහා යාම දුෂ්කර හෙයින් සහ ඇතැම් කාරය නිසාත් නුවූ ඵලියක් ලබා ගන්න අටියෙන් වසා තුබුන ගෙයක දොර තට්ටුකර නුවූ ඵලියක් ඉල්ලීය. ඒ ගෙයි වැසිනු නුවූ ඵලියක් නොදෙන බව කීවේය. ඔනෑ වෙලාවක ඔනෑ රූපා ඵලියක් ඉල්ලන්නෙකුට වහාම නුවූ ඵලි දෙන සිරිත බහුලව පවතින උඩ රටදී, මෙ ගෙයි වාසිනු නුවූ ඵලියක් නොදෙනවයි කී කථාව මහත් පුදුමය කට වැටහී, තද අදුරේම උඩගම්මැදට පැමිණ නිලමේගේ වලව්වට ප්‍රවිෂ්ටවූයේය. නිලමේ මුදලි තුමට සහ එක්ව ආ අයටත් රෑ කෑම සූදානම්කරදී ආ නොරතුරු අසා කථාබස් නොට සැනසීමට සහන් සූදානම් කර දුන්නේය. උදය කෝපියද එහිදි ගෙණ, එසින් නික්ම එන්නේ ගිනි නුඳුන් ගෙදරට පැමිණ ගිනි නුඳුන් කරුණ ඇසුවේය. ඔවුන්ගේ නෑයෙක් තුඛුරක් සම්බන්ධව ඔවුන් හා විරුද්ධව මේ ගේ ගිනි තබන බව කියා තිබුන සෙයින් තුන්මසක කාලයක් පමණ සිට ඔවුන් නිදිවජ්ජිතව ඉතා දුකසේ රෑ කාලය පසු කරණ බවත්, කිසිවෙකුට දොර වැසුවාසින් පසු ඵලියක් දිමට හෝ අන්‍ය උදව්වක් කිරීමට දොර හරින්ට භය බවත් දැන්නුවේය. එහි සිටි කෙනෙක් මේ **බබාඝිඤ්ඤෙ, මුදියන්සේ රාලහාමියයි** කීකල නම් සහ මෙතුමාගේ ගුණ ඔවුන් අසා තුබුන බැවින් ඉතා පසුතැවිල්ලට පත්ව මුදලි තුමාගෙන් සමාව අයැද සිටියාහ. මුදලිතුමා ඔවුන්නේ විරුද්ධකාරයාගේ පදිංචි ස්ථානය අසා ඔවුරන්කෙනට පැමිණ පසු දින මෙයී විරුද්ධකාරයා ගෙන්වා නොරතුරු ඇසුවේය. නුවූ ඵලිය නුඳුන්නවුන් ඔහුගේ නෑසියන්

බවත්, කුඹුරෙන් ඔහුට එක පඩගුවක් ගිම් බවත්, ඒ පඩගුව ගුසාහිවිදීමට ඔහුට ඉඩ නොදී ඔවුන් කන බවත් ඊට ඔහු විරුඬව ඔවුන්ගේ ගේ ගිනි තබන බැව් කී බවත් නොසඟවා මුදලිතුමට දන්වා සිටියේය. පසුදිනට ඔහුට නැවතත් එන්ට නියමකොට, ගිනි නුදුන් පවුලටද, පණිවුඩයවා පසුදින ගෙන්නා වැඩි දුරටත් කාරණා විභාග කර බැලූකල, ගිනි නුදුන් පවුල ඉතා හාරදූර පවුලක් බවත් ඔවුන්ට පෙනෙන්ට තිබෙන්නේ මෙ එකම කුඹුර බවත් විරුඬකාරයා නෑයෙක්වා සහ මුදල් වතුපිටි ගිම් කාරයෙක් බවත් දැන, ඔහුගේ කුඹුරු කොටස මුදලිතුමාට විකුණනවාදැයි ඇසීය. එසේයයි කීකල, මුදල් කොපමණ ඔනෑදැයි ඇසීය. මුදලිතුමා සතුටු මුදලක් දෙන හැටියට ඉල්ලුවිට කුඹුරුපඩගුව කොපමණ වටිදැයි ඇසීය. පවුම් තුණ හතරක් වටියයි ඔහු කී කල මුදලිතුමා සින්නක්කරයේ එය ලියවාගෙණ පවුම් පහක් දී එම කුඹුරු කොටස මෙ අසරණ පවුලට තෑගිකොට දුන්නේය. නොතාරිස් වියදම සහ මුද්දර වියදමද මෙතුමාම ගෙව්වේය. උඩගම්මැදි මෙ පවුල මුදලිතුමට දෙහොත් මුදුන්දී වැඳ එයින් විහාරයට පැමිණ මල් පුදා පින් අනුමෝදන් කළෝය. * අගනා මාණික්‍යය පතිතවූ පෑව්විතලය පවා බැබලෙන්නාක් මෙන් මෙම මුදලිතුමා සපැමුණුන යම් තැනක් ඇද්ද ඒ හැම තැනම බැබලුන බව මොනවට ඔප්පුවේ. ඇහැට නිදි නොලැබ් ඉතා භයෙන් තුන්මසක් පමණ දුක් ඉසුලූ මේ පවුලේ භය දුරුකොට බියකරු කරදරයක්ව තිබුන කුඹුරු කොටස ඔවුන්ට තෑගිකළ කල; අහෝ! ඔවුන්ගේ හිත්වල හටගැණුන ප්‍රීතිය අතිශයින්ම මහත් වාව අනුමාන නොවැතිස. ලොව ඇති ආගම්වලින්

* මොවුන්ගේ පරම්පරාවෙන් එන දූනට මෙම කුඹුර භුක්ති විඳින හිරිනාම් නොදෙම් මහල්ලෙක්, උඩගම්මැද්දට අපගේ පැමිණීමේදී මොහු රෝගාතුරව සිටියේය. මේ කථාව අප සමග කියා මුදලිතුමට පින් දෙමින් තැබුවේය.

උහන්වන යම් යම් ධර්ම කෙයේවුවත් මෙව් තුශලකර්මය කළ මේ පරෝපකාර උතුමාට ඔබගියක් තිබෙනට මේ සඳහාම එහි චාරිය නොහරිනු ලැබෙද? පින්වත් තුදී ජනයිනි; මෙය ධාරණය කොට ලෙවනට නිතර හිත වැඩම කරත්වා!

———:o:———

නත් ගිහියාට කළ උපකාරය.

———

යටිහඳුරන්කෙන රත්මැවියේ ගෙදර කිරිහාමි නම නැනැත්තා මෙම මුදලිතුමාගේ ගිහියෙකි. මුදලිතුමා ගෙන් මොනු වෙදකම් ඉගෙණ ගත්තේය. සුචිනිතකම් කින් සුත් මේ ගෝලයා කෙරෙහි ප්‍රශනන සිත් ඇත්තේ වෙදකමෙන් ප්‍රයොජන ගැණීමට ඉගැන්නුවෙය. ගිහිය නෙමෙද ආචාර්ය මුදලිතුමාට හයපසුව නිතර රොත් අස්වා ගැණීම් ආදියෙන් සහ නිතර ආශ්‍රයෙන් බෙහෙත් කරණ ක්‍රමආදිය ඉක්මනින් ඉගෙණ ගත්තේය. ගුරුවර මුදලිතුමා ගෙන් අවසර ගෙණ සුළු සුළු වෙදකම් කිරීමවද පටන් ගත්තේය. කිරිහාමි වෙදරාළ යනුවෙන්ද ඇතැමුන මොනුට ආමනුණයවද පටන් ගත්හ. මොනු මෙවැනට කළ කී වෙදකට බොහොමයකින් රොත්න් සුවපත් වූ බැවින් කිරිහාමි වෙදරාළ යනුවෙන්ම ප්‍රකටවිය. ගුරුවර මුදලිතුමාද බොහෝවිට එතුමා යාසුනු ගමන්වලදී කිරිහාමි වෙදරාළ යවා, එතුමා පැමිණියාක් මෙන්ම වෙදකමේ කටයුතු කරවා ප්‍රශංසාව සහ තෑග්ග ඔනුට හිමිකරවන්නේය.

මේසේ ක්‍රියා කරගෙණ එන කාලයේ දිනක, හදිසියෙන්මවගේ මුදලිතුමාට වෙලවිල්ලක් සැදී අපහසුවුනේය. මුදලිතුමා බොහෙනක් නියම කර නොගෙණ, අසනීපය දන්වා ඊට සුදුසු බෙහෙතක් නියමකරවාගෙණ, එහමෙන් දූසයෙක් පිටත්කර කිරිහාමිගේ නිවසට යැවූවෙය. දූසයා එහි පැමිණ අසනීපය කියා බෙහෙතක් නියමකිරීමට

ඒ කලා එවෙලාවට එයි තරාදියක් නොතිබුන නිසා අතින් බෙහෙත්වල ප්‍රමාණය කිරා වෙන වෙනම දවටා, කසාය කර බීමට එව්වෙය. කසාය රැගෙන දුසස්‍ය පැමිණ, තරාදියකින් නොව බෙහෙත් අතින් කිරෑ බව මුදලිතුමාට දන්වනුවෙය. මුදලිතුමා තරාදිය ගෙන්වා එයි බෙහෙත් වෙන වෙනම කිරවා බැලූකල ඒ සියල්ලම හරි බරට තුබුන බැවින් ඉතා සතුටට පත්ව කසාය උණුකර බීවේය. ගුරුවර මුදලිසඳගෙ අසනීපය දුන ගැණීමට ශිෂ්‍යයා ආකලා වඩා හොඳින් වෙදකම් කිරීමට ඔහුට ඔවාදී හඳුරන්නෙත දුනට ආණ්ඩුවේ විශ්‍රාම ශාලාව අසල තිබෙන මහ තුඩුර පණිතිබෙනතුරු ගුණතිවිඳීමට ඔහුට දුන්නේය එපමණක් නොව වෙනත් නානාප්‍රකාර උදව් උපකාරද විසින්විට කෙළේය. මෙම ශිෂ්‍යභෙම පසුව වෙදකම් කරණ කොටගෙණම ප්‍රගුතාවයක් ඉසුලූ නමුත් තම ගුරුවර මුදලිතුමාට මහත් සැලකිලි ගෞරව තෙළේය. * හෝලයා විසින් ගුරුවරයාට කෑගි හොඟ ගරු සත්කාර කලසුතු කැන ගුරුවරයා විසින් හෝලයාට මෙසේ කෑගි හොඟ ගරු සත්කාර කල බැව් දුන ගැණීමද කල්පනා කට සුකකාකි. හෝලයින් විසින් සඩකීය ගුරුවරුන්ට කරණ උපසථාන හරු සැලකිලි කෙසේ වෙනත්, මේ අපගේ ගුරු වරු ලැබීම අතිශයින් දුෂ්කර බව වැටහේ. ඈතම ගුරු ශිෂ්‍ය පරම්පරාවන්ට මේ ප්‍රවෘත්තිය සුඳුරතර හෙයින් මේ අතුවෙන් ක්‍රියාකොට ජගදුහිවෘඛිය කෙරෙන්යයි විශ්වාස කරමු.

---

* වරුපතැන්නැදිගේ චාර්ලස් ලුවිස් සොසියා මහතාගේ භතුරන් කෙරෙ "සැනසිලිමේ නිවසට" නිලාභතුර වලව්වේ පියිරිබණ්ඩා ගිවපු කෝරළ හෙන්වා, මුදලිතුමා ගැණ ඇසුකල මේ ප්‍රවෘත්තිය අප සමග කියා මුදලිතුමා තැණි සත වලව්වේ මහත්මයා ගැණ මහත්සේ වර්ණනා කරමින් කැඳවේය. මොහුට දුනට පස්අසූ වරුපයක් පසුවූ බවද පැවසිය. මේ පොතේ අන් තැනෙක පලව් තිබෙන කතුවත්තේ ප්‍රවෘත්තිය තැණි සත විසෙල් ගිල්වා මහතා ගැණද කරුණු ප්‍රකාශ කෙළේය.

කෝලහලයක් ඇතිවිණි.

මුදලිතුමාට මදක් අසනීප කාලයක කෝච් ගැහීම් සඳහා කිරිබැද්දල පුඤ්චිරාල ප්‍රධානකොට මිනිසුන් දස දෙනෙක් උඹව දිශාවට විවත්තර හැරියේය. පුඤ්චිරාල තම අනෙතවාසිකයන් සමග තැනින් තැන ඇවිද කෝච් හිමියන්ට කෝච්වල ප්‍රමාණයට පොරොන් දුව, සමහරුන්ට මුදල්ද සමහරුන්ට හාල් රෙදි ආදිසද අධිකාරම්කොටදී, උඹව පලාතේ ඉතා ඈත යනතුරු යියේය. මීට දෙදවසකට පසු මරක්කල මිනිස්සු රැසවු වක් උඹව පලාතට පැමිණ පුඤ්චිරාල අධිකාරම්කොට දිසු තැනැත්තන් සිසල්ලම රවටාගෙණ රට වැඩි වෙන්ට හාල් රෙදි මුදල් අධිකාරම්කොට දී පුඤ්චිරාළලාට මුන නොගැසී සැඟවුනෝය. මරක්කල මිනිස්සු හඳුනගිනවුවෝ සිංහල මිනිසුන් හිහක් පමණ රවටාගෙන ඔවුන්නේ ආරක්ෂාවට එකතුකරගෙණ සිටියෝය. පුඤ්චි රාළලා හැරී එන අතර මරක්කලයන් කර හිබෙන වැඩකටාව දැනගන්ට ලැබී තද කෝපයට පැමිණ එවුන් සෙවීමට පටන් ගත්තෝය. මේසේ සොයනකල සිංහලයින් සමග රැසවුගැසී සිටින මොවුන් සඹුවී කථා බස් වීමෙන් දබරය හටගත්තේය. දබරයේදී වැඩි කුවාල මරක්කල පසට සිදුවිය. දෙපක්ෂයේ දබරය දිසුණුවෙන්ට යන බවත් දෙපසම උදව්වට සෙනග එකතු කරන බවත් හඳුරන්කොටට සැලවුකල, සුසෙව් ද සොයිසා මහතා එතියාමට වහාම සූදානම් වූයේය. මුදලිතුමා සුසෙව් ද සොයිසා මහතාගේ ගමන වැලකුවේය. එසේ වැලකුවේ සුසෙව් ද සොයිසා මහතා සැරවර පුරුෂයෙක් නිසාය. සුසෙව් ද සොයිසා මහතා මීට ප්‍රශනන නොවී මුදලිතුමා නවතා ඔහු එහි යාමට ඕනෑ බව හැගෙව්කල, මුදලිතුමා තරහගනිසෙන් මෙන්, "සාමෙල් උඹ ඔපමණ හපනෙක්ත් නුවා මා අත්හැර සුඹ හමුදුවට බැඳියන්හ, උඹ සුඹයට යාමට

ඉක්මින් වෙන්නෙමියි, මම සාමඳුනයට යාමට ඉක්මන් වෙමි" යි කියා වහාම තුදසකලාව පිටත්ව ලෑවට හිඳේය. මේ තුමා එහි සේන්දු වෙනවා හා සමග දෙපස තද දබරයට සූදුනවව සිටියෝය. පුඤ්ඨරාල මුදලිතුමා ආඛව දුන "ඉතින් කොප හැමෝම මරමි" යි මොරදුන්නේය. මුදලිතුමා මහ පින් ඇත්තේ දබරය නවතන්ට දෙපසටම නියම කොට අරඹේ කෝරාළගේ නිවසට දෙපසම ගෙන්නා දබරයේ තිබෙන නිශ්චිතතම කියාදී, කෝපිවලට වැඩි අධිකාරම දුන් මරක්කලඛින්ට කෝපි ගැන්මට නියම කෙළේය. කෝපි දීමට වැඩි අධිකාරම ගත් මිනිස්සු කියට උනත් මරක්කල මිනිසුන්ට කෝපි නොදෙන බව සජර ලෙස කියා නොමිලයට නමුත් කෝපි රැගෙන් යාමට මුදලිතුමා ගෙන් ඉල්ලා සිටියෝය. මරක්කල මිනිසුන්ද මුදලි තුමාව කෝපි ලැබෙනවාට සතුවුවූකල, මරක්කල මිනිසුන් පොරෙන්දුවූ වැඩි මුදල කෝපි හිමිකාරඛින්ට ගෙවා කෝපි රැගෙන් එමට පුඤ්ඨරාලව නියම කොට, මගදී සම්භරවිට සුසෙව් ද සොසිසා මහතා මරක්කලඛින්ට තළාස යන හයෙන්, මරක්කල රසවුව සමග මුදලිතුමා විටත්ව ආහෙය. මගදී මේ මරක්කල මිනිසුන් එකිනෙ කාව පනා දෙක බැගින් රහසේ දුන් බවද පසුව පුඤ්ඨරාල ලාව දැනගන්ට ලැබුනාලු. *

නිරුරුස පතිතවන සියලුම ස්ථාන ආලොක වෙන් නාක්මෙන් පින්වතුන් පැමිණෙන හැමතැන ශාන්තිය සහ සාමඳුනය නිසහයෙන්ම සිදුවීම සත්‍ය හෙයින් ජීවිත හානි සහ ලේ වැගිරීම්වලට හේතුව නිබුන මෙම දබරයන්

* මේ පුඤ්ඨරාල කොස්සින්නයේදී අපව සම්භව්ය. මොහුව වරුප අව අසුවක් බවත්, මොහු පඳිසුඩ් ඉඩම් ගැණීමව මුදලිතුමා මුදල් දුන් බවත් කියා මුදලිතුමාගේ සහ වලව්වේ මහතාගේත, සුසෙව් ද. සොසිසා මහතාගේ සහ චාර්ලස් හැන්ප් ද සොසිසා මහතාගෙන් ගුණ් වණනා කළේය. මොහුගේ සිහි සෙ.ඳ නිමුත් තද ජරාවෙන් පෙළෙන හෙයින් ඒවත කාතිය එදිනවිත් වේදෝ අපව වැටහිනි. අඳිදු මොහුව මුදලින් සුව පරිත්‍යාගශක්ද කළෙමු.

යත් වලකා කෝපි ගිම්යන්ටත් වැඩි ප්‍රයෝජන කොට, මරක්කල ජනයාටත් සනෙතාෂ ධන දී කෝලහාලය පසිදු ලිලාව ගැන් කවර ෂුනඩනතයෙක් මෙතුමාට නො පසසාද? මෙබදු සථානගතවන සකල ප්‍රහූන් මෙතුමාගේ ආජීව මග ගමන්කොට විපුල ප්‍රයොජන ලබනු දකින්ට කැමැත්තෙමු.

———:0:———

රත්රන් පවුම් තුණකින් දඩයම් නැවැත්වීම.

මහනුවර නැවතිසිටිය ඉංග්‍රීසිකාරයෙක් දඩයම් පිණිස දිනක් හතුරන්කෙතට පැමිණියේය. මෙදින රෑ හතුරන් කෙන විහාරසථානයේ පහන් පින්කමක් පැවැත්වීම සඳහා ශේවාවිස්සේ බෞඛ ජනයා එම විහාරයට රැස්ව පහන් පිළියෙල කිරීමෙහි යෙදී සිටියහ. පින්කමට රැස්ව සිටි පිරිස දඩසම්කාරයා දැක, ඒ පලාතේ දඩයම් කිරීමට ඉඩ නොමැති බැව් කීවානුය. ඉංග්‍රීසිකාර දඩයම් කාරයා සමඟ එක්වී ගොස් සිටි සුසුරානම් තැනැත්තා මේ පිරිසගේ අදහස් දඩයම්කාරයාට කියාදුන්නේය. දඩයම් කාරයා ඊට කිකරු නොවී, එසේ වලකන්ට එන්නන්ට වෙඩිතියන බව පැවසිය. සුසුරා එයද මේ පිරිසට තේරුම් කර දුන් කල, එම පිරිස කිපී, දඩයම්කරුට කිපිවක් නොකියා මුදලිතුමාට මේ බව දන්නුවේය. මුදලිතුමා වහාම මඵව සමීපයට පැමිණ, සතුන් මැරීම ගැන මේ පලාතේ බෞඛ ජනයාගේ ඇති බලවත් අමනාපය සුසුරා ලවාම තේරුම් කෙරෙවිවේය. දඩයමේ ආ ගමන ගැන් ඔහුට හුහක් වියදම් උනනිසා, එසේ දඩයම් කරගෙන යාමේ නිදහස නැතිනම් වියදම ඉල්ලා සිටියේය. දෙප සම සැනසීමට කලපනා කළ පරිදිකාම් මුදලිතුමා වලව්වට ගොස් රත්රන් පවුම් තුණක් රැගෙණැවිත් දඩයම්කරුට වූ විදයම පිණිස දී පිටත්කර මහනුවරටම යැවිවේය. මුදලිතුමා මේ කළ ක්‍රියාව ගැන් සතුටු බෞඛයෝ මුදලි

තුමා වෙනුවෙන්ද එදින රෑ රත්නත්‍රයට පහන් පිදුවෝය. කයින් වචසින් මනසින් නොහැක්වූ ඇතමදේද පැහැර නො හැර ධනයෙන් නමුත් ඉටුකර ලෙව්දනයා මොනවට සතපන මුදලිතුමාගේ සෞන්දර්‍ය ගුණ විශෙෂය ප්‍රභූ මහත්වරු පිළිගෙණ ක්‍රියා කරත්නම වෙනයින්ම ඔව්හු පැසසිය යුත්තාන් වෙනු නිසැකය. *

———:o:———

පොත්ගුල් විහාරය.

———

මෙම මුදලිතුමා හඟුරන්කෙත රාජකීය කෝපි වත්ත මිලයට ගෙණ, කැලෑ එලිකොට එහි වැවී තිබුන සහ ඉදී තිබුන කෝපි පල එකතුකොට සම භූමි භාගයක ඇතුරු වාද, ඒ භූමි භාගය දැනට ප්‍රසිද්ධ පොත් ගුල් විහාරස්ථානය පානා තිබෙන භූමි භාගයලු. † මෙහි කෝපි ඇතිරීමට මෙතුමට වනදෙවතාවුන් විසින් ස්වප්නයෙන් කී බවද මෙම ස්ථානයේ කෝපි ඇතුරු දින පටන් ගස්වල කෝපි වැඩිවූ බවද, ඉඩම තුණුරුවන්සන්තක කලාට පසු සෘතු ගුණය හොඳව කෝපි පල බරට ගස් නමා වැටුන බවද, මෙතුමාට උවමනා කෝපි නෙලීම ආදී වැඩ නොමිලයේ නමුත් කරදීමට මිනිසුන්ගේ හිත් ධෛර්‍යවුන බවද,

* මෙම දඩසම්කාරු සමග ගිය පුෂුරාගම් අය රදගස්පාන නම් ස්ථානයේදී අපට සම්බවිය. මොහු ඉතා වයොවෘද්ධ කෙනෙකි. මොහු අපට දැක්නු තවත් කාරුණක් නම් "උදය නැකිච්ච පැදුරේදී ඔබාසිස්ගේ මුදියන්සේ හාමුදුරුවන්ගේ නම ගිහිකර දෙරට බැස්ස කල එද ඔත නොවරදින බව සත්තකය" යනුය.

† මේ හැණ පොත්ගුල් විහාරස්ථානයේ වැඩසිටින් අතර්දසී ස්ථවිරයන් කළ ප්‍රබන්ධයක කවියක් පුංචි බණ්ඩා ආරච්චි මහතාට පාඩම් තිබී කීවෙය. ඒ කවිය:—

කා ළි ජෙවාර්ජ්සෙ සිහලුන් නොදිවූ රස මස ගිහිකො වා
ද ළි හුරුතැති දළි වැරලි වතළුක් දුරැර පැහැගි තු වා
පා ළි සොයිසා මුදලි මැතිතව ඉතා ආදර ගරුකො වා
කෝපි ඇතුරු පොළොව සුදුනව පිදීය මොක්පල ලබන වා

කෝපියෙන් මහත්සේ වෑහූ රැස්හිමට පටන් ගත් බවද, ක්‍රියාහියානි සමය පිලිනොගෙණ සිටියානම් හැඟුරන්කෙතේ රජුන් විසින් සහවා තිබෙන සතරමහ නිධානය ලබනඑක නිසැක බවද, බුත්තල පුංචි බණ්ඩාර ආරච්චි මහතා ආදීහු තලාතු ඔබේදී අප සමග කිවාහුය. මේ විප්‍රකාර කියමන් කෙසේවී නමුත් මෙතුමා කෝපි ඇතුරු හුම් හාගය තුණු රුවන් සතතාක කලේ එවකට බෞඩයෙක්ව සිටි නිසා සම කිසි අඩුයක් සලකාගෙණ බැව් නිසැකය. මෙම හුම්ය රමණීය එකකි. එහි තනා තිබෙන විහාරස්ථානය සහ පූජා කාලය සිත්කළු ප්‍රිය දර්ශන වසූනිය ස්ථානයකි.

———:o:———

මුදලිතුමා ක්‍රිස්තු ලබඹිය පිලිගැන්ම.

මෙම මුදලිතුමා බෞඩයෙක්ව සිට කළ කී වෙළඳාම කරණකොට ගෙණ ධනවතෙක් වූයේය. මෙතුමා ධන යෙන් ආඪ්‍යවෙගෙණ එන කාලයේ, එඩගලනත සහාවේ ක්‍රිස්තියානි ගුරුවරුන් මෙතුමා ආශ්‍රයට පැමිණ එම සභාවට ඇතුලත් කරගන්නාලදී. එසේදුවුවත් උඩ පාත දෙරට වැසි ඇතම බෞඩයන් විසින් මෙතුමාගෙන් නොයෙක්වර ඉල්වනලද උපකාර වැඩි පසසයක් ඉහට කළ බව පෙණේ. තමන්ට ගුරුවූ මැද්දේගම ස්ථවිරයානන් වහන්සේවද එම විහාරස්ථානයවද නමන් විසින් කළ සුතු සකල උපකාරම හොඳින් ඉහට කෙළේය. මේ ඩොමින්වහන්සේ ජීවත්ව සිටිනතුරුම සුවදුක් සෙවීම පිණිස ශිය සියලුම වකාවල ශිස් අතින් නොගියේය. රස කෑවිලි පෙවිලි සහ බුලත් දුම්කොල ආදියද වෙනත් උවමනාද ගෙන්වා සත සිරිත නොබිඳ රැක්කේය.

———:o:———

ගුරුවරයාගේ අසනිපය සහ ආදහනය.

මැද්දේගම ස්ථවිරයානන් වහන්සේට වයොවෘධකමින් පැමිණුන රොගාතුරතම ගැන් උවමනා සියල්ලම මුදලිතුමා ඌනවයක් නොමැතිව සම්පාදනය කෙළේය. ගුරුවරයා

ජීවත් කර ගැනීම සඳහා මහත් පරිශ්‍රමයක් දැරිය. නමුත් මරණය සැමහාව ධර්‍මය බැවින් මරුතෙම මේ ගුරු වරයා කරාද පැමිණ වසඟ කර ගත්තේය. මුදලිතුමා ගේ ගැන් අතශය ශොකයට පත්ව ආදාහනයට උවමනා සියල්ල සපයා ගරු ගම්භීර ආකාරයට අන්තිම උපසථා නය කිරීමට සුදුනම් වුයේය. එවකට සඳුන් දර සෑපයීම ඉතා දුෂ්කරව තිබුන නමුත්, මහත් උත්සාහය කින් උඩ පාත දෙ රටින්ම සඳුන් දර සපයවා කරත්ත තුණක් ගෙන්වා චන්දන චිතකයම සජ්ජිත කරවිය. තවද මෙම ආදාහන මඩගල්‍යයට උවමනා පෙළහරද මිහන වස්ත්‍රාදියද අවශෙෂ ගිහුන් වහන්සේලාගේ දුන කැත්තෑසද නිලෝහිව මොනවට සුදුනම් කෙළේය. කපිපුර පුෂප අගිල් චන්දන පිනිදිය ආදියද එසේම රාශියක් සම්පා දනය කෙළේය. මෙසේ සියලු කටයුතු සලසා තනනලද සිවි ගෙයට මෑත දෙහෙය ගෙණ පෙළහර සහිතව සර සනලද ආදාහන භූමිය කරා ගොස් එහිදී මෑත දෙහෙය සිවි ගෙයින් ගෙණ චිතකාරොපණයකොට සමයානුකූල සකල කැත්ත මොනවට ඉටුකොට ආදාහන මඩගල්‍යය අවසාන කෙළේය. මුදලිතුමා මෙපමණකින් ආචාර්‍ය්‍ය කෘත්‍ය ගැණ පරිසිමුවනොවී එම මෑතදෙහයේ අළු පෙළහරින් ගෙණැවිත් එය නිධාන කොට එම විහාරයේ පසක **ආචාර්‍ය්‍යසමරණ චෛත්‍යද** සථාපිත කරවී. මෙම චෛත්‍යය මොරවුවේ එම විකාරස්ථානයේ මෙතාක් හොඳින් පවත්නේය. මේ මහා සථවිරයානන්ගේ කථාශෙෂ හාවොපගතවීමෙන් පසුවද මෙම විකාරයට උවමනා කටයුතු ගැණ කල යුතුකම් ඉටු නොකර පැහැර නැරියේය. විවින් විට කරණලද උපකාර කැර මස්පතා නොකඩව හාල් බුසලක් යැවීමෙන් සඛ්‍රහ කිරීමවද පවන් ගත්තේය.

———:o:———

ශුඛ එම්මානුවෙල් දෙව මැදිරිය.

———:o:———

මුදලිතුමා වාසල මුදලි තනතුරට පත්වුනාව පසු මහත් ධනයක් වියදම්කොට කරණලද ප්‍රධාන කෘත්‍ය නම් මොරවුවේ ශුඛ එම්මානුවෙල් දෙව මැදිරිය ගොඩනැඟීමය. මීට පුථම



HOLY EMMANUEL CHURCH, MORATUWA.

මොරටුවේ ශු. එම්මානුවෙල් දෙවිඇදහිලිය.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

තිබුන පරණ කුඩා දෙව මඤ්චරය කඩාදමා දැනට තිබෙන දෙව මඤ්චරය තැනීමට සෑමුවෙල් විලියම් දිංගස් (කොලෝනියල් චැප්ලේන්) උන්නාන්සේ විසින් උපදෙස් දෙන ලදින් එය පිළිගෙණ අතීතව දෙව මඤ්චරය ගොඩනැඟීමට ආරම්භ කෙළේය. මේ ගැන සතුටුවූ ඇතැම් මහතුන් විසින් පරිත්‍යාග කළ සෙසු මුදල් හැර මුදලිතුමා පවුම් අට දහස් (8,000) හෙවත් රුපියල් අසූදහස් (Rs. 80,000) ක් විසදම් කොට කරවන ලද දුටුවන් ල ගන්නා ලක්‍ෂණ දර්ශනීය ශාන්තිමත් සෙල්මුවා මෙම දෙව මඤ්චරය අන්තරාය විශොධන ගොපානයි ආදි දෘවයන්ගෙන්ද, චප්‍ර පඤ්චර ආදියෙන්ද සණ්ඩාරඇඩහ, ප්‍රජ්ක්‍රමණ ශාලා, යුපරම්මණ්ඩල ආදියෙන්ද, දෙශනා ආසන පීඨකාදියෙන්ද, පරිපූර්ණ කර නිර්ඝාකරණ ලද්දකි.

මෙකී දේවස්ථානය සාමාන්‍යයෙන් ක්‍රියතියානි ජනතාව සහ වෙසෙසින් මොරවුවේ ක්‍රිස්තු භක්තික ජනයාද අනව රතයෙන් අභිමාන කරවන්නිය.

———:o:———

මෙම දෙවස්ථානය ගොඩදැමීම මෙහෙය.

———

එම් 1860 වේ දෙසැම්බර් මස 27 වෙනි බුදු දින මෙම දෙවස්ථානය කැප කිරීමේ මෙහෙය පැවැත්වීමට නියම කොට ඒගැන් උවමනා කටයුතු ගරු ගම්මිරිඤ්ඤාරයට පිළියෙළ කෙළේය. දෙවස්ථානයට හැරෙන් මංකඩ ඉතා ලක්‍ෂණ විශාල තොරණක් බැඳ එය ගොප්වලින් සහ රන් තැඹිලි, නවසි, බෝදිලි ආදියෙන්ද දුටුවන් මවිත කරවන ආකාරයට සරසා තිබුනේය. එතැන පටන් දෙව මඤ්චරය දක්වා මග දෙපස නානාවිධ සැරසිලි කර, තන්හි තන්හි කොඩි ඇද ඉතා රමණීයාකාරයට සරසා තිබුනේය. දෙව මඤ්චරයද මල් වනස්සාදියෙන් සරසා ආසන පිළියෙළ කොට දර්ශනීයවූ වහාම ක්‍රිස්තු භක්තික ජනයා සමඟිය

යොරෙකි ආසා උපදවන ආකාර විවිධාලඞ්කාරව තිබුනේය. මොරවුවේ මුදලිතුමාගේ වලව්ව පටන් දෙව මඤ්චය මංකඩ දක්වා නානාවිධ සැරසිලි කර තිබුනේය. කලින් කර තිබුන ආරාධනා පිළිගත් ලඞ්කාඞ්කාර **සර් චාලිස් මෙකාතිනි** උතුමාගෙන් වහන්සේ සහ රජ පිරිසද, ගරු (සර්) රිචර්ඩ් මෝර්ගන් තුමාද, අති ගෞරවනියවූ **ලේඩිස් වැස්මැන් බිෂොප්** ස්ටාමින්ද, සාමුවෙල් විලියම් දියස්(කොලෝනියල් චැප්ලේන්) තුමාද, එඞ්ගලැන්ත සභාවේ වෙනත් පාදිරි උන්නාන්සේලා කිප නමක්ද, උසස් පහත් නිලධාරින්ද නොයෙක් දිශාවලින් සපැමිණ ගෑණු මහතුන් සහ පිරිමි මහතුන්ගෙන්ද දෙව මඤ්චය ඉතිරින. අඟිනව දෙව මඤ්චය කැප කරණ මෙහෙය දර්ශනය සහ ශ්‍රවනය සඳහා පමණේක්ද, සැරසිලි දර්ශනය සඳහා පමණක්ද, ආඞ්ඛ්‍යකාර උතුමානන් වහන්සේ ප්‍රධාන රජ පිරිස දර්ශනය සඳහා පමණේක්ද, මුදලිතුමාගේ අලඞ්කාර අගනා සමුහණ් වාසල මුදලි ඇඳුම දර්ශනය සඳහා පමණේක්ද, ඒත ගායනා කිරි රසවිඳීම සඳහා පමණේක්ද රුස්වීමෙන් දෙව මිඤ්චාඞ්ගනයද ඉතිරින.

ඉක්බිති කැප කිරීමේ මෙහෙය නියම කර තිබුන වේලාවට එනම:—පෙරවරු 10 යේ කණ්සමට බිෂොප් තුමා විසින් සම්යානුකූල චරිත්‍ර ලෙස මෙහෙය පටන් ගෙණ එකොළහේ කණ්සමට සමාපත කරණලදි. මෙසේ අඟිනව දෙව මඤ්චය කැපකිරීමෙන් ලබනලද විවේක ඇත්තේ, බිෂොප්තුමා විසින්ම පරොපකාරොත්තම මුදලි තුමා ගරුතර ආඞ්ඛ්‍යකාර උතුමානන් වහන්සේට හඳුන්වා දෙන ලදින් දෙනම ප්‍රිය මිත්‍ර ධර්මයෙන් බැඳුනාහ.

———:0:———

දවල් කෑම.

උතුමානන් වහන්සේ සහ උසස් නිලධාරියුද බිෂොප් තුමා ප්‍රධාන පාදිරි උන්නාන්සේලාද වෙනත් වැදගත් මහත්වරුද මුදලිතුමාගේ වලව්වට සම්ප්‍රාපතව පිළියෙල

THE WALAWWA AT MORATUWA.—මොරටුවේ වලවව්.

කර තිබුන රස කෑම බීම ආදියෙන් මොනවට සඛ්‍යුත විඳ අනෙත (සර්) ර්චර්ඩ මෝර්ගන්තුමා විසින් කරණලද කතා රසායන අර්ථානවිත ද සොඳිසා පවලේ වණ්නිය කථානන්තරය ගැන උතුමානන්වහන්සේ මහත් ප්‍රීතියට පැමිණියාහ. එහි සිටි අනෘ උසස් මහත්වරුද එසේම වෘකත කථා පැවැත්තු පසු, පස්වරු දෙකහමාරට පමණ පැමිණි පිරිස ප්‍රීති ඝොෂා රවයෙන් විසිරී ගියේය. ඝාභාවික ධර්මයට වාල්ව සිටින මනුෂ්‍යයා ඝාභාවික ධර්මයට අසුවීමේ වේලාව කිසියේත් නොදන්නා බැවින් මුදලිතුමාද අඟිනවදෙව මැදිරියේ වැඩ අවසාන කර, එය කෑප කිරීමේ මෙහෙය දඹිනය සඳහා ජීවත් වේද්දෝ නොවේද්දෝ යන විචිකිච්ඡාවෙන් සිටි නමුත් එම සැකය විඛවංශනය වීමෙන් කෑපකිරීමේ මෙහෙය ඝර්කීය වැඩු පථයෙන්ම දඹිනය කළ බැවින් පස්වන්නේ ප්‍රීතියට පැමිණ සන්තුෂ්ටිවිය. අනෘයන් කෙරෙහි නිතර වැඩ කැමතිවූද අනෘයන්ට සිදු විපත තමන්ට සිදුවූ විපතක් මෙන් සලකන්නාවූද හුදී ජනතාවිගේ අභිප්‍රායන් මිසතෘප්‍රාපතිම ආඝවෘෂියක් ලෙස ප්‍රාඥයෝ කල්පනා නොකෙරෙත්මය.

———— : o : ————

මුදලි මැතිතුමා හඟරන් කෙතට ගිය අනන්තිම ගමන.

මුදලිතුමා මද මද අසනීපකමින් කොළඹ නැවතී සිටින කාලයේ, එතුමා විසින් ගොනගම වාසින්ට කරදී තිබුන කුඹුරුවලැ වැපිරීම ආඥුව විසින් තහනම් කරන්නලදී. මෙවිනු කුඹුරු තහනම අහක්කර ගැනීම් සඳහා මහත් උතසාහ දැරුවේවී නමුත්, ඒ සියල්ල නිෂ්ඵලවී, වැපිරීම නොලැබ කෑම හානියට පත්වූහ. මේ බව පරෝපකාර මුදලිතුමාට සැලවූ විහාම, සනිපය සඳහා උඩ රට ගොස් ඒම ගුණය කියා බඹුවරයන්ට සම්ඤ්ප්‍රයොග කර හඟරන් කෙත ගොස් ගොනගමට පැමිණ කාරණා විභාග කර

අවුරුද්දක් උත්සාහ කලත් නිදහස් කර ගැණීමට බැරි තරම් අඩලකට ආණ්ඩුවන් මෙ මනුෂ්‍යයනුත් හබවී කර ගෙණ තිබුන කුඹුරු තහනම ගැණ, මහනුවර කච්චේරියට මෙතුමා පැමිණ කාරණා පෙන්නුම්කොට එක දවසින්ම කුඹුරු තහනම අහක්කර ගොනගම වාසින්ට අභය ලබා දුන්නේය. තවද හඟුරන් කෙත විහාරයට මෙතුමාගෙන් පසු කිසි ආරාවුලක් නොවීම සඳහා තමන් පලමු විහාර ස්ථානයට පිදු ඉඩමට යොග්‍ය නොතාරිස් ඔප්පුවද ලියවා අත්සන් පිහිටුවා අඹුල්දෙණියේ නම් එහි ප්‍රධාන ස්වාමීන් වහන් සේට දුන්නේය. සැබවින්ම මෙම පරොපකාර උත්තමයා මනුෂ්‍ය ගුණයෙන් ක්‍රියා කල කෙණෙක් නොව දෙව ගුණයකින් ක්‍රියා කර තිබෙන මහා පුණ්‍යවන්ත මහොත්තමයෙක් බව කාට නොවැටහේද?

මුදලිතුමා මෙයින් පසුව තව දුරටත් නානාවිධ පුණ්‍ය ක්‍රියාවලට වස්තු පරිත්‍යාග කිරීමෙන්ද දුගී මගී යාචකා දින්ට සඞ්ග්‍රහ කිරීමෙන්ද, දෙව මෙහෙයාදියට නිතර එල බීමෙන්ද දාන ධර්මාදිය කිරීමෙන්ද, කාලය ගත කරණ අතර, වෘඬ්ධවය කරණකොටගෙණ ජරාව විසින් වෙලා ගන්නාලදින් දුර්වල භාවය හෙතුකොට ගෙණ වාකොප රොගයන්ගෙන් අසනීප හටගත්තේය. මෙසේ අසනීප වූ නිසා සනීප ගැණීමට අදහස් කොට මෙතුමාට අයිති මොරටුවේ කුරුඳු වත්තේ **රස්ටම්** නම් රම්‍ය නිවසට පැමිණීයේය. එහිදී වත්තේ ඇවිදින අතර මෙතුමාගේ කකුලේ රෝස කටුවක්ද ඇණීමෙන් තිබුන අසනීප දියුණු විය. අසනීපය වැඩිවූකල බම්බලපිටියේ දැනට **ඇල්ෆ්‍රැඩ් හවුස්** නම් (එවකට බගතලේ) වලව්වට ගෙණාවේය. මුදලිතුමාගේ මෙම අසනීපය සිරිලක සෑමතැන පැතිරින. නොයෙක් පලාත්වලින් මුදලිතුමා දැක සුව පහසු දැන ගැණීමට නිතර පැමිණෙන ජනයාගේ සඞ්ඛ්‍යාව ඉතා මහත්විය. ආණ්ඩුවේ උසස් නිලධාරිහුද, නීතිඥවරුද, මුදලි මුහන්දිරම් ආරච්චිවරුද, සෙසු නිලධාරීහුද වෙලඳ ජනයාද අවශෙෂ නොයෙක් ජාතිකයන්ද සුව පහසු

දැනගැණීම සඳහා නිතර පැමිණෙන්ට පටන් ගත්හ. උඩ රට නොයෙක් පලාත්වලින් එසේම සිංහල, යුරෝපිය නිලධාරීහුද වෙළඳ ජනයාද මේ අසනීපය අසා මහත්සේ දෙමනස්ව දුරාතර ගෙවා පැමිණියහ. මිගමුව, මාරාවිල හලාවත ආදියෙන් පමණක් නොව, ගාල්ල මාතර ආදි පලාත්වලින්ද මුදලි තුමා දැක යාමට බොහෝ දෙන පැමිණියහ. මුදලිතුමාගේ බඹුන්ගෙන් සහ ගම් වැසි යන්ගෙන්ද ශිෂ්‍යෙෂික මිත්‍ර සමූහයාගෙන්ද වලව්ව නිතරම පිරී තිබුනේය. මුදලිතුමා මේ ප්‍රඥාවේදී ඔත්පලව සිටි නමුත්, වලව්වේ මහත්මයා මෙසේ එන යන්නන්ට මෑනි ගුණයෙන් ආදර සඬ්ගහ කළාය. මුදලිතුමා මරණ මඤ්ච කයට ප්‍රාප්තවූ බැව් ඇසූ ගම්වාසි ජනයා අනතිම වරට මුදලිතුමා දැකීමට පැමිණ සුවදුක් විචාරා අවසර ගෙණ යන්ට පිටත්වූ කල, ඔවුන්ට ආදරයෙන් කථා කොට සූරිය ගස් යට සිටීම අත්හැර සිහි නුවණ වඩා සමාධියෙන් කල් ඇරපල්ලාසි පැවසිය. මේසේ පැවසුවේ සඬදෙශික ජනයා නිතර නඩු කියා ගැන්මෙන් නායකි වෙන හිසා, එයින් වැලකී සිටීමවය. මේවකට තිබුන පරණ දිඤ්ඡක් උසාවිය සමීප භූමියේ තිබුන සූරිය ගස් සෙවනේ නඩුවලට එන සඬදෙශික ජනයා වාඩිවී සිටින සිරිත මුදලිතුමා දැක තිබුන බැවින්, මේ ප්‍රඥාවේදී පමණක් නොව සනීපයෙන් සිටි බොහෝ ප්‍රඥාවලදීද, සඬකීය වෘත්තික ජනයාගේ මේ ගස් යට සිටීම වලකා ලන්ට (නඩු මගට නොයාමට) පිළිවන් උත්සාහ දැරුවේය. එපමණකුදු නොව, ලොකයා අතුර පවත්නා, නානාවිධ දුශ්චරිතයන්ගෙන් සඬකීය ගම් වාසින් ප්‍රධානකොට ඇති ජනතාව මුදවා ගැණීමට සනීප යෙන් සිටි කාලයේ නිතර නිතර බලවත් උත්සාහ දැරුවාක් මෙන්ම, මේ ප්‍රඥාවේදීන් දුක් සැප සෙවීමට සපැමිණි කාටත් සත්චරිතයන්ගෙන් යුක්තව වාසය කිරීමට ඉල්ලා සිටියේය. පරාර්ථකාමීවූ මුදලි තුමාට වැළඳී මේ අස නීපය සුව ගෙණ දෙන අතකට ගෙණ එම සඳහා එවකට ලක්දිව සිටි දැක්ක සිංහල ඉංග්‍රීසි වෛද්‍යයන් බොහෝ

උත්සාහ දැරූ නමුත්, ලාංකික ජනයාගේ පරම සතුරෙක් ලෙස මරූ නෙම මෙහිදී ක්‍රියා කිරීමට පැමිණ මුදලිතුමාගේ වලව්වේ මහත්මයා ප්‍රධාන බන්ධු මිත්‍රාදීන් ඇතුළුව මුළු ලක්දිව වාසීන් ඝොරතර දුක් නමැති මහා සමුද්‍රයෙහි හෙලා, පන්සැට වස් එක්මස් නව දිනක් විරාජමානව ලක් දිව ආලෝක කළ මෙම මාණික්‍ය ප්‍රදීපය ක්‍රිස්තු වර්ෂ 1862 යේ මැයි මස 28 වෙනි දින රෑ එකොළහමාරට ස්වර්ගාලෝක කිරීම සඳහා රැගෙණ ගියේය. *

---: o :---

අවමඞ්ගලෝත්සවය.

මුදලිතුමාගේ ජීවිතක්ෂයට සත් දවසකට ප්‍රථම තමන් ජීවත් නොවෙන බව ස්ථිර ලෙස තේරුම් ගෙණ සුසෙව් ද සොයිසා මහත්මයා කැඳවා, තමාගේ ඒකම පුත්‍රයා සහ තම ප්‍රිය භාර්‍යාව වන ඔහුගේ මවද, මුළු මහ බූදලයද, ආරක්ෂා කිරීමට බාරකර "සාමෙල් උඹ මෙහෙද එහෙද?" යනු ඇසුවේය. "මෙහේ අපේ කාවද ඉන්නේ" සුසෙව් ද සොයිසා මහතා උත්තර දුන් කල, ජීවිතක්ෂයෙන් පසු මොරටුවේ වලව්වට මෘත දෙහය ගෙණ යන්ට නියම කෙළේය. එපරිද්දෙන්ම මෘත දෙහය මොරටුවේ'වලව්වට ගෙණ යනලදි.

මැයි මස 30 වෙනි දින මෙම අවමඞ්ගල්‍යය ගරු ගම්භීරාකාරයෙන් පවත්වන්ට කාරණා පිළිවෙළ කර ගන්නාලදි. මුදලිතුමාගේ ප්‍රාණය හැඟවුන වහාම සහෝදර සුසෙව් ද සොයිසා මහත්මයා සහ පුත්‍රවූ චාලිස්

---

* මුදලි තුමා කර්‍මශේෂ භාවොපගතවූ බව දැනගත් රණවක මහතා මිරුවාට කී කවිය.

රා ව ණා ජානකිව පෙම් බැඳි වරදගෙණි ඔහු ගත් තොප ගෙ ට
කා ර ණා වරදවා අවනීත පත් උනේ මරු මෙතොප මුවගෙ ට
ඒ ව ණා ගුණ රුසින් වැඩලූ සොයිස මුදලිඳු කෙරේ වෛරකො ට
කා ර ණා කිම උඳුර ගත්තේ නැතුව වද මුදු ගිතක් තොපහ ට

හැන්රි ද සොසිසා මහතාත් උඹ පාත දෙ රටට අයත් නොයෙක් දිසාවන්ට මල හසුන් යවනලදින්, ජල ගැල්මක් පර්ද්දෙන් සේනාව රැස්වෙන්ට පටන් ගත්ත. "අනේ! බබාසිඤ්ඤෝ මුදියන්සේ රාළහාමි පරලොක ප්‍රාප්ත වුනේය" යන එකම ශබ්දය මෙදින උඹ පාත දෙ රට ප්ස්මහල් තුන්මහල් දෙමහල් ප්‍රාසාදවල මෙන්ම එක් ම්හල් ගෙවලද කුඩා අතු පැලයන්හිද පැහිරින. මාර්ග යන්හි ගමනා ගමනය කළ මනුෂ්‍යයන් තුඩ තුඩද පැවතින. මුදලිතුමාගේ මෘතදෙහෙය දර්ශනය සඳහා සම්ප්‍රාප්තික ජනී ජනයන්ගෙන් මොරටුව පිරී ඉතිරින. මුදලි තුමා නැමති කලප වෘක්ෂ රාජයාගේ සෙවනෙහි වෙනාක් ජීවත්වූ දහස් ගණන් ජනයාගේද, මුදලිතුමාගේ දන් දෙරින් ජීවත්වූ දහස් ගණන් දිළිඳු ජනයාගේද දුඃඛිත විලාප, කල්‍යානත මෙඝයාගේ ගොඟාව බඳුවිය. පුත්‍ර කලත්‍ර බන්ධු ඥාතීන්ගේ වේ වෙලේ පැවති වැලපීම් ගැණ කුමන කථාද?

කඩු කස්තාන සහිත වාසල මුදලි ආභරණයන්ගෙන් මෘත දෙහෙය සරසන ලදින්, ධවල වස්ත්‍රයන්ගෙන් පිළි යෙළ කරණලද මාහැගි මුලස්නෙහි තබා මහා ජන දර්ශනයට අවකාශ දින. මුදලිතුමාගේ ශුභ සරණ මඩගලෘ ඝෝෂිදී, වාසල මුදලිකම් ලැබීමෙදිද, අන්‍යම් වරට මෘත ශරීරය ජනතාවට ප්‍රදර්ශනය කරණ තන්හිදිද, ගාල්ලේදී කරත්තකාරයින් විසින් තෑගි කරණු ලැබුවාවූ දෙවරක් "ලොතරැසි" කර තමුන්ටම දිනුමෙන් අත්පත්වූ පනා කුවි වම ගිස අලඞ්කාරයට යොදූ තිබුනේය. මිදුම් පිණ්ඩයට ලොභයෙන් රැස්වී එහිම විනාශ වෙන්ට සැරසෙන්නාවූ කුහුඹු රැසක් මෙන්, මෘත කලේබර දර්ශනයට රැස්වූ ජනී ජනයෝ අඩියකුදු නොසොල්වා මුදලිතුමා සමඟම මිය යන්ට සැරසෙන්නාක් මෙන් දුඃඛිත ලීලා දක්වාලූහ. අත කබල ගත් යාචකයාද, දඬු කිසිලි ගත් විකලාඞ්ග යාද, කන්වැල අත නොගත් කතාද, මෙම් පවත්නා විලාප නොඇසෙන බිහිරාද, දුක ප්‍රකාශ නොකළ හැකි

නොඑවාද, අහිමිකොට සැබවින්ම ඇති දෙයක් නොපෙ නේනා අඛ්‍යාද ටෙ රැස්වූ ජනතාව අතුරේ විද්‍යමාන වීමෙන් උසස් තැනැත්තාගේ පටන් යාචකයා දක්වා මුදලි තුමා හැම ඇති සැලකිල්ල රමණීකාරයෙන් ඔප්පුවෙමය. මුදලිතුමාගේ සඞ්ඝසඞ්ගීම හැම ඇසු ගොනගම වාසිහුදා, වෙනත් එසේම උපකාර ලැබූ අනෘ ගම්වාසිහුද, ලිප් නිදිගි නොමොලවා ආහාර උදව් නොකොට සිටියා පම ණක් නොව, බොහෝ දෙන මුදලිතුමාට අනහිම ගෞරවය කිරීම සඳහා උඩ රට සිට මොරවුවට සම්ප්‍රාප්තවුහ. මුදලි තුමාගේ මෑත දෙහෙය දැක මොවුන් විසින් ප්‍රකාශ කළ දෑඩින වදන් පෘථිවිය චලනය වෙන තරම් විය. පරම ගුණ පරිඃවක මුදලිතුමා පොළව කණවා ගොනගම වාසින් සඳහා කර දුන් සෙතුසෙන්ම වී රැගෙණ විලඳකර ගෙණැ එන් සුවිද කවා එය ඉසිමෙන් අනහිම ගෞරවයද කලෝය. "කොපමණ දිලිඳුවුවත් සත්පුරුෂ ජනයාට කරණලද උපකාර නිරාඵක නොවන්නේය" යි යන නුවණැස් ඇත්තවුන්නේ මන ප්‍රකාර, මොවුන්ට බත් දුන් පියා වාසල මුදලි තනතුර ලබාගෙණ හතුරන්කෙත වත්තට සහපත්වූකල එම සෙතුසන්ගෙන් වී ගෙණ බත් පිස පැමිණි ජනතාවට සඞ්ග්‍රහ කිරීමද, මුදලිතුමා සඞ්ඝසඞ්ග කල එමෙන්ම වී ගෙණ විලඳ කර සඞ්ග්‍රහ කිරීමද, සැල කිසුතු හෘදයානුවිත කරුණක් සෙයින් කෘතොපකාර සැලසීමේ රමණීකම මෙසින් බොහෝ දෙනාට ඉගෙණ ගන්ට සුළුවන් බව කියමු.

ඉතා අගනා ලෙස තනතලද මිනි පෙට්ටියේ මෑත දෙහෙය බහා පියන වසා ඒ මතු පිට නොයෙක් දෙනා එසින් එවනලද මල් මාලාවලින් සරසනලදී. මුදලිතුමාට අයිති උඩ රට චතුවල ගස්වලදා, වෙළඳම් ශාලාවල දෙරටුවලද අනොවාසික ජනයා මෙඳින කළු කොඩි එල්ලා තම තමන්ගේ දුක ප්‍රකාශ කලෝය. මුළු මොර වුවේ පාඨශාලාවල ලමයින්ට මෙඳින නිවාඩු දිනක්කොට ශාසනු ශාලා වසා දැමුවාසුය. මොරවු වාසි ජනයා මොරවු

නරශ්‍රේෂ්ඨයාගේ කථාශෛලිය හාවය ගැන්ම ගෞරව වශයෙන් මෙදින කඩපිල් වසා කළු කොඩි ඇදිමෙන්ද වෙනත් මළවුන් සඳහා කරණ ගෞරව අඩු නොකිරීමෙන්ද සැලකුහ. මෙදින ඝනවූ කළු වර්ණයෙන් යුත් වලාකඩකින් මුළු මොරටුව වැසුවාක් මෙන් විය. මොරටු අඹගනාව නියම ලෙස ඇඟේ කළු ඇඳුමෙන් සැරසී මුළු මොරටුව විශේෂ ලෙස අඳුරු කෙළේ මෙදිනය කියන්ට පිළිවන. මිනී පෙට්ටිය මතු පිට ලක්‍ෂණ මල් මාලාද මල් මතුපිට මිණි රුවන් කස්තානය සහ මිහුගින් විසින් තෑගි කළ රන් මාලයද පවියද තබා තිබුනේය. දුක ප්‍රකාශ කරණ වැකුයන්ගෙන් සරසන ලද දෙන (තුම්බය) පිට මිනිය තබා ඉතා ක්විටුවර මුලාදෑනින් විසින්, දෙන උර පිටට ගෙණ කොඩි යේසත් මළ බෙර සහිතව ගුඩ එම්මානුවෙල් දෙවස්ථානයට ගමන් ගත්හ. වාසල මුදලිකමට ලැබියසුනු ගෞරව වන ගාර්දියේ සහ අතපත්තුවේ හේවා පන්න ජනයාද එඩගලනත සහාකාර ජනයාද, ඒ. ඩබ්රනත මහ විදුන මුදලි, ඒ. පී. ජයසිංහ භාෂා පරිවර්තිකික මුදලි, මතියිනස් පෙරේරා ජයවර්ධන භාෂා පරිවර්තිකික මුදලි, ඒ. ගුණවර්ධන පානදුරේ භාෂා පරිවර්තිකික මුදලි, ඒ. මැඩ්ස් මොරටුවේ සහ ගල්කිස්සේ මුදලි යනාදී මුදලිවරු අටදෙනෙක්ද, දෙහිගම මහරදලතුමා සහ උඩරට නිලමෙලාද, දෙන වටකර ගන්නා ලදුව ඉහිරි සිංහල සුරෝපිය, ලංසි, දෙමළ, මරක්කල, ජා, පාර්සිආදී පන්දහක් පමණ නොයෙක් තරා තිරමවල සේනාවද, පාඨශාලාවල ලමෝ සහ ගුරුවරුද දෙන පසු භාගයෙන් ගමන් ගත්හ. මහදෙපස දහස් ගණින් සේනාව කඳුලු වගුරුවමින් මුදලිතුමා සැඟ සිප විඳිවා යන්නෙන් පින්පෙත් දිමෙන්ද යාඳු කිරිමෙන්ද මේ වෙලාව ගතකල මහිමය සැබැවින්ම පුදුමය. රදිකාසි බුසල් දෙකක් මැන කීප දෙනෙක් රැගෙණ මිට මිට විසිකරමින් වලව්වේ පටන් දේවස්ථානය දක්වා අව මඟගලෑ පෙළහර සමග ගමන්කල නමුත්, එක් මුදල් අඩුලා ගත්තවුන් අතුර කිසි අරගලක ශබ්දයක් නැති බිමද මහත් පුදුමයක්ව තිබුනේය.

දේව මන්ද්‍රයට පැමිණ සකස්කරණලද මළස්න මතුපිට මිනිපෙපිටියනබා ආගම නය ලෙස සෑමුවෙල් ඔලියව දියස් (කොලෝනියල් චැප්ලේන්) උන්නාන්සේ ප්‍රධාන පාදිරිවරු දෙලොස්නමක් විසින් මළවුන්නෙ මෙහෙය ඉටුකරණ ලදින් එම දේව මන්දිරයතුළ පූජාස්ථානයට නුදුරුව මෑතදෙහෙය තැන්පත් කලානුය. පැමිණි දහස් ගණන් සේනාව මොරවුවේ මුදලිතුමාගේ වලව්වට ආපසු පැමිණ වලව්වේ මැතිනිය සමග සහ පුත්‍ර මහතා සමගද යුසෙවිද සොසිසා මහතා ඇතුළුව බන්ධුන් සමගද දුක්වී අවබඩගලෑ සඬ්ග්‍රහවිද විසිර් ගියානුය.

මෙසේ අනතිවෙදි ප්‍රිය භාර්‍යාව ඇතුළුව පුත්‍ර දුහිතෘ බන්ධු මිත්‍රාදින්ද, චතුපිටි ශේඳෙර ගව මකිස රන් රිදී මුතු මැණික් ආදි අගනා ඉසුරුද, රජුන්ගෙන් සහ මහ ජනයාගෙන් ලැබූ අනන්‍යාප්‍රමාණ ඝනාගි ප්‍රශංසාදිය ඇතුළුව චාසල මුදලිකමද අතහැර කලඤ් කුසල කර්මය පමණක් සුරතින් ගෙණ මියපරලොව ගිය මෙම උත්තම මුදලි මහත්මාවරයාගේ සත්චරිතය ගැන අසන කියන කවර සුදු ජනයෙක් පරාර්ථක ධර්මයෙහි ප්‍රමාද වේද?

දේව මහදිරඟතුළ මුදලිතුමාගේ වල මතුපිට පිහිටුවා
හිඳෙන ගිලා ලෙඛනය.*

ජොරෝනිස් ද සොයිස

ධම්ගුනවර්ධන

විපුල ජයසුරිය

කරුණාරත්න දිසානායක

වාසල මුදියන්සේ රාලහාමි

උපතෙන් ක්‍රිස්තු වරුසයෙන් 1797

අප්‍රෙල් මස 19 වෙනි දිනදිය.

මෙව රාලහාමි වරුෂ 1862 මැයිමස 28 වෙනි දින

කළුර්ය කලේය.

මුළු වයස වරුස 65 මාස 1 දින 9 යයි.

රෑ වින් තුනුහිරු නෙදින් දිහිසුරු දහින් දහිසුරු පැරසූ සස රැ ස
හිරිහින් කිරිසිදු තුතු තරහ රහ අඟවමින් පැතුරුණු දෙසුණු දෙ ස
මෙවන් මහසින් බලෙන් සුත් සත්හව පවා මරු වදු නොවල ස
ලෙවන් මේ බල බලා අන්වැඩ පමාවූ අරුම මැයි හැම ලෙ ස

සාමි තුල නසින මලඬුන් පුනඃවන්නායෝය.
ප්‍රකාස XIV. 13.

---

* මෙතුමාගේ සත්චරිතය ගැණ ඉතා සතුවින් සිටි ලොක ප්‍රසිඛ
දෙන් අන්දිරිස් ද සිල්වා බටුවන්තුඩාවේ පණ්ඩිතොත්තමයා විසින්
රචනා කරදෙන ලද මෙහිදෙණ කවිය සහිත ගිලා ලෙඛනය මුදලි
තුමාගේ සුවිශිතා සහෝදර සූසෙව් ද සොයිසා වාසල මුදලිතුමා විසින්
සම්රණය පදහා පිහිටුවනලදි.

මෙතුමාගේ ප්‍රතිමාව.

ශුද්ධ එව්මාතුවෙල් දේව මන්දිරයේ පූජාස්ථානයට පෙලින් ඇතුල්වෙන දෙරටුවේ ඇතුල් භිත්තියේ මෙතුමාගේ රූපය කිරිගරුඬ පාෂාණයෙන් මොනවාට සථාපිත කරතිබේ. රූපය කඩුකඋතාන සහ මාල පදක්කම් ආදියෙන් අලංකාරකොට වාසල මුදලි ලක්ෂණයෙන් නිමා කොටතිබේ. මෙතුමා සිටීමේන් සුරතෙහි ඇහිලි විදහා ශුද්ධ එව්මාතුවෙල් නම් මෙම දෙවමන්දිරයේ සිහියම පෙන්නා සිටින ලීලාවට රූපය සකස්කර තිබේ. මෙතුමාගේ දකුණුපස එම ගලෙන්ම මතු කර කපණලද හැසි රූපය පිට මෙම දෙව මන්දිරයේ සිහියම ලකුණු කොට තිබේ. මෙතුමා එය දක්වන ආකාරය පැහැදිලිව පෙනේ. වාම හස්තය වටපස තුනවියේ තබාගෙන් තිබේ. වාම පාර්ශ්වයේ පහත යාතු පොතක්ද ඒ පුස්තකය මතුපිට කඩදසි හොන්නක්ද තිබේ. ඒ මතුපිට "Endowment of Schools at Moratuwa" යනු ඉංග්‍රීසි අකුරෙන් කොටා ඒ අකුරු රත්රන් ගා තිබේ. මේහි අදහස "මොරටුවේ පාඨශාලා දායාදය" යනුයි. නැවිපනාව සහ පෙලින්පනාව ජීසේහසා අගනා වස්තුවක් සහ කමිස තබාය හැඳ කඩු කඋතාන පවිමාලා පදක්කම් පැළඳ ජීවමානව සිටින්නාක් මෙන් මෙම රූප සටහන මොනවට නිමකර තිබේ. ගලේ ඉතුරු කොටස ඉතා ලක්ෂණව ඔපලා තන්හි තන්හි කැටයමකර ඒ කැටයම් රත්රන් රෙඛා ආදී වීසිතුරු කර්මාන්තයන්ගෙන් නිමාවට පමුණුවා තිබේ. එහි පහල සිංහල ඉංග්‍රීසි උභය භාෂාවන්ගෙන් මෙසේ අකුරු කොටා තිබේ.

MARBLE STATUE OF JRONIS DE SOYSA ESQR.,
GATE MUDALIYAR.
ජ්‍රෝණිස් ද සොයිසා වාසල මුදලිතුමාගේ කිරිගරුඩ රූපය.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

ශ්‍රේනිස් ද සොයිසා වාසල මුදලි මනුවේරසානන්ට හරමානිස් දිසස් මහන්මසා මිසින් ඔප්පුකරණලද පූ බ ඡි.

සිසිර සිසිර රැස්පුන් පුන්තලස් පා පිසුම් පුල්
හර හර ගිර සක්නා නිවියන්පාරදෙව කිත්
මුදලිදු සොයිසා නම් රාජ වාසල්ගි තෙවනා
විඳ විඳ පවතිවා වාසියක් කල් නොහිමි සෙත්

විමල කමල දෙවිදු දුල් උදුල් තොස් උරේහි
බඹ පියඹ නිවස්නා වන් මහත්පාය සිත් ගත්
මුදලිදු සොයිසා නම් රාජ වාසල්ගි තෙවනා
විඳ විඳ පවතිවා වාසියක් කල් නොහිමි සෙත්

කුලසිය සිසපත් විල් දුන් සහොස් සේකරසේ
පස මිතුරු කැලන් මත් ඇත් දුමු සිරදෙක් කුල්
මුදලිදු සොයිසා නම් රාජ වාසල්ගි තෙවනා
විඳ විඳ පවතිවා වාසියක් කල් නොහිමි සෙත්

සදි ගණ නෙක ඕලොල් සිත් පිනූ සුල් කමල් මල්
මැතිවර කුරුමැද්දේ සාලපාසා හෙබීමෙන්
මුදලිදු සොයිසා නම් රාජවාසල්ගි තෙවනා
විඳ විඳ පවතිවා වාසියක් කල් නොහිමි සෙත්

උවනත පිරිඳෙරුස් නෙත් කමල්පත් විලස්පෑ
රැහි රැහි සිතදිමෙන් සිත්මිණත් කප්කුරත් ගත්
මුදලිදු සොයිසා නම් රාජවාසල්ගි තෙවනා
විඳ විඳ පවතිවා වාසියක් කල් නොහිමි සෙත්

දිය දිස සත සිත් මෙත් දුන් රදෙක් මෙ මහන්වූ
සතර සතර වේ සිත්සේ දැනීමෙන්, දිමුත්වූ
මුදලිදු සොයිසා නම් රාජ වාසල්ගි තෙවනා
විඳ විඳ පවතිවා වාසියක් කල් නොහිමි සෙත්

සොම් සොම් ශිරිනා උස්වූ නැණින් සෙව් වියත්වූ
තිර ඇදහිය සුත්වූ බස් නිදෙස් සත් බිණ්මෙන්
මුදලිඳු සොයිසා නම රාජ වාසල්හි තෙව්නා
විඳ විඳ පවතිවා වාසියක් කල් නොහිම සොත්

තිලිත නැණ පිකුම්පින් ඈ ගුණෙන්දුල් නිහින්කල්
සිරිසදිසර සොම්නස් වත් මහත් සුත් නුවන් ගත්
මුදලිඳු සොයිසා නම රාජ වාසල්හි තෙව්නා
විඳ විඳ පවතිවා වාසියක්කල් නොහිම සෙත්

ද ර ණ තිලින සුරතුර දිනූ හිසුණුනැණැහි සරසවි මෙ න
පොරණ පිණ්න් ලත් කොත් වත් රන්රුවනුත් හැම මන මෙ
ක ල න ජෙරෝනිස් ද සොයිස වාසල මුදලිඳු සසොබ න
නි හි න ජෙහෙන් විඳැ විඳැ සුව පවතිනු වා සියක් පම න

සි සි ර සිසිර කිරණ කිරණ හර හර ගිර සියපත හෙ ළ
අ ම ර නිසා යසරුස නිති තුඩ තුඩ සැදු සුදන සිය ල
ස ත ර ජෙරෝනිස්ද සොයිස නම මුදලිඳු රජ වාස ල
නි තර දිනනු රෝදුක් හැම දුරැර දියසෙ වැකි අලකො ල

ල බ න පිණ්ස මතු සුව තැන තැන සාලා මන පිණව න
ප ම ණ නොමැති දන වියදම් කරු කරු මහවත් සසොබ න
සනෙන දනන් හට සුවවස් ඒදඬු පාලම් තිරව න
නොමිණ වැව්ද ඇල අමුණුත් කරවා ලෝ වැඩ සාද න

රුපුකැල හලුවේවා සිත්හි සොම්නස් වැඩේවා
සිතැතිද සිදුවේවා රෝ දුකක් නම් නොවේවා
යසලිය ලියලාවා සැමකල් වාස වේවා
මැලිතුම් දිනාවා ආවඩා සෙත් සලස්වා *

---

* මෙම මුදලි මහේශ්වරයානන් ගැණ කරණලද එළු පාලි සංස්කෘත හෙළ පද්‍ය බොහෝ තිබුන බව දැනගන්ට ලැබී තිබෙන නමුත්, එකී ප්‍රබන්ධ දැනට සපයා ගැණීම අතිශයින් දුෂ්කරව තිබේ. වර්ෂ 1872 හේදී ලක්රිවිකිරන් කතෘ ජී. සී. පීරක්ගොඩ මහතා විසින් අච්චුගසා ප්‍රසිද්ධ කරණලද සොයිසා වර්ණනාවෙන් මේ ශ්ලෝක පමණක් උපුටාගැන්මට පුළුවන්වූ හෙයින් එය අදිගරත් වශයෙන් නොසොද, මෙසේ මහාලිමු.



PART IV.

Mrs. JRONIS De SOYSA.

ඔබ්වමන අදිගර.

ජ්‍රෝණිස් ද සොයිසා ලමාඵතනි.



MRS. JRONIS DE SOYSA.—ජ්‍රෝනිස් ද සොයිසා මැතිනිය.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

මෙතුමාගේ මෑනියෝ.

HIS MOTHER.

තු තන්ත්‍රිගේ ප්‍රැන්සිස්කා කුරේ ලමාඑතනි මෙතුමාගේ මව්ය. මෑ මාතා ගහියෙන් බිහි වෙනු සමගම අසල සිටි කුකුළෙක් නවුගහා හැඩලූයේය. එකල එහි සිටි වණ්කුල සූරිය වඩු මෙසන්ගේ සිම්යොන් මෙදිස් නම කෙනෙක් කුකුළාගේ හැඩලීම ගැණ ප්‍රීතිව "කවදා කුමුත් මේ දරුවා ලොකු සැපතකට පත් වෙන්නේය" සි එහි සිටිවුන්හට කියේය. මෑ බිහිවීම කරණ්කොටගෙණ මවට වඩා අපහසුවක් නොවීමද මව පිය දෙපයාගේ නෑදෑයින්ට ප්‍රීතියක් විය. මෑ කුඩා කාලයේ ඒ ප්‍රමාණ දරුවන් සමග කෙළි සෙල්ලමට යාමට වඩා කැමති

නොවී, නේ අනුගෑම, රෙදි නැවීම, මඹ සමඟ උසන හෙට හොස් රතු ලූණු ලෙලිහැරදීම ආදිය වඩා කැමැත්තෙන් කළාය. හෙඩිම වැටී තිබෙන රෙදි කැබෙල්ල, කොස් ඇටය පවා අවලා සහවා තබන සිරිතක්ද පැවතුනේය.

දිහක් මැනේ ඔඹ සුරතලට නම්බාපු හෙරලි මිදුලු තුන් හතරක් "පිරිසි" යක බහා වාඩි කරවා කෑමට දුන්නාය. මිදුලක්ෙකා "පිරිසි"යත් රැගෙණ නැඟුවුන කල "පිරිසි"ය බිම වැටී කැබැල්ලක් කෑයි ගියේය. "පිරිසිය" කැඩුන කල මෑ හඬන්ට පටන් ගත්තාය. හැඩිම නොවලක්වන බව දැක වෙන පිරිසියක හෙරලි මිදුලු ලා දුන් නමුත්, එය නොගෙණ කෑයි ගිය පිරිසිය හරිහස්සා ඉල්ලිමෙන්ම හැඩිය. පසුව කොහොල්ලෑ මැලියමෙන් යථනමකට අලවා දුන් කල; හැඩුම නවතා සිනාහමී පිරිසිය අතට අරගත්තාය. මෙසකට වයස අවුරුදු හතරක්පමණ ඇත. මෑ වැඩෙන්ට වැඩෙන්ට යේදෙර වැඩ දැනගැණීම දියුණුවිය. එවකට ගෑණු දරුවකු වීසින් දැන ගතයුතු මැසුමද දැනගත්තාය. ඉඳීම තුනක් දුරට ඉගෙණ ගත්තාය. වයස අවුරුදු දෙළහ පමණ වෙන කාලයේ වැඩිකිරිය ගෑණු කෙනෙකු නරම කැවුම් බැඳීම් ආදී කැවිලි වර්ග සැදීමටද පුරුදුව සිටියාය. රාකසුරුවමකම ගැණැද දක්ෂයක්ව සිටියාය. මුදල් සහවා තැබීම ගැණ ආසාවක් තිබුනා වගෙම උවමනාවූ විට අනුන්ට නමුත් දිමවද කැමැත්තෙන් සිටියාය. හෙදර කැඩුන බිදුන යමක් තුමුත් ඇතට ගෑණු ලමසින් මෙන් වීසිකර අපුන්වා ගැණීමට කැමැති නොව, ඒ කැඩුන දේ හැකි අන්දමකින් පරිහස්සා හෙණ එසින්ම පළමු ලැබූ ප්‍රයොජනය ගන්ට තතර කැමැත්තෙන් සිටියාය. මැගේ මේ සහජත් ක්‍රියා ගැණ දෙවිවියන් පමණක් නොව මෑ ගැණ අසන දකින කාගෙත් සිත් මනාපව තිබුනේය. දෙවිවියන්ට හය පැහැව සිටියා පමණක් නොව වැඩිකිරි හැම දෙනාටම මහත් කීකරුකමක් දක්නට්ලාය.

මෙසේ වැඩෙන මැගේ වයස සවුරුදු දෙකේ වූයේ, එය පැමිණි යාය. රහත මාණ්ඩිකායෙන් ලැබෙන වන්දිය රහත වන්දිය මෙන්ම මෙකිදීද කුක්කුට ශබ්දයක්ම පෙර නිමිති පෙන්වීම ආශ්චර්යයක් නොවන්නේද? මෑ උපන් මොහොතේ කුකුළෙක් හඬලා පෙර නිමිති දැක්වූවාක් මෙන්ම, එය පැමිණි මොහොතේද පළමුකොටම කුකුළෙකු තවුතිසා හැඬලූ ශබ්දය කණ වැටියාම අසන්නවුන් මවිත නොකෙරේද? **ප්‍රැන්ඩිස්කා කුරේ** මේ බව තම මවට දැන්වූ කල මව සෝම් පුරුෂයාට දන්වා මිතු වන ඵලා ඵල දැනගැන්ම සඳහා ඒවකට නැතත් ක්මෙකි ප්‍රසිද්ධියක් ඉසුලූ පල්ලිය හොඩැල්ලේ මැද්දේගම සථවිරයානන් වෙත සතුටු පඬුරු දී සුදුස්සෝ පිටත්කර යවනු ලැබූහ. ඔය තැනැත්තෝ මැද්දේගම උන්නාන්සේට පුදු පඬුරු දී එය පැමිණි වේලාව කියා ඵලා ඵල ඇසුවාහුය. උන්වහන්සේ වේලාව පරීක්ෂාකර බලා, ලොකොපකාර ස්ත්‍රියක් වන බව දැන ඉතා සතුටට පත්ව "මෑ ඉතා වාසනාවන්ත ස්ත්‍රියක් වෙනු පමණක් නොව ලොකයාගෙන් ගරු බුහුමන් ලබන තැනැත්තියක්ද වෙනු නියතය. මෑ පුජ්‍ය වෙනවා ඇත. මෑ ඉතා වාසනාවන්ත පුරුෂයෙකුට භාර්යාව වී උසස් ගරු නාමයක්ද දැරීමට සුදුස්සියක් බව පෙනී යන්නේය. වේලාව නුඹලාට සත්තක නම් මා කී කරුණු නොඅනුමානව මෑට සිඳවන්නේය. සතුටින් හොස් ප්‍රවේස මෙන් ඈට උවමනා ඉසව කරපල්ලාය" යි කී කල, ඒ වේලාවේ පළමුවෙන් ඇගේ කණ වැටුන කුක්කුට ශබ්දය ගැන හාමුදුරුවන්ට සැල කළෝය. හාමුදුරුවෝ එයද ඉතා සුදුසු ශුභ ලක්ෂණයක් බව දන්වා ආ තැනැත්තන් පිටත් කළෝය. ඵලා ඵල දැනගැන්මට ඔය තැනැත්තන් ගෙදරට පැමිණ මැගේ මවට සහ පියාටත් මේ බව ප්‍රකාශ කළ නැන, මැද්දේගම සථවිරයානන් වහන්සේගේ කියමන් ගැන මහත්සේ සලකන මොවුහු ඉතා ප්‍රීතියට පත්ව, නියම කළ දින වේලාවට ඉස දිය නාවා ඒ මඟුල්‍යය පැවැත්තුවෝය. තරුණ ප්‍රැන්ඩිස්කා කුරේ මේ කියමන් ගැන් අසා ඒ සියල්ල සිත් තුළ

ධාරණය කරගෙන් ඒ ගැන කිසි මානයකට නොපැමිණ ගාහපත්‍යවිධාන ඉගෙනීමට වඩා වඩා උනන්‍යාහ දැරුවාය. අසල වැසි තමන් ප්‍රමාණ තරුණියන්ගේ දියුණුව සඳහා ඈට පුළුවන් දෙයින් අනුග්‍රහ කිරීමට නිතර සතුටින් සිටියාය. ඉවීමට දක්ෂියක් වෙන අදහසින් ඒ ගැන සොයා බලා දුනහත් යුතුන්ගෙන් සහ මවගෙන්ද ඉවීම ඉගෙනීමෙහි යෙදුනාය. ගෙයි ඇතිවෙන සිංහල තරුණියක් දිනේක යන්ට ප්‍රථම ඉර හඳ දුටුවත් වරදය යනු එවකට නරයේ සැලකූ නිසා, මෑවද වඩා එලිමහනට එමට ඉඩ නැතිවිය. එසේදුවුවත් ගෙදරට පැමිණෙන වැසිකිරියන්ට එවකට පැවති සිංහල සිරිත් පිළිවෙළට සඛ්‍රහ කිරීමට මෑ දෙගුරුන්ගෙන් අවසර ලබා ගෙණ සිටියාය. තරුණ වයසට සඛ්‍රාපන මෝනොමෝ ගෙදරට එන යන වැසිකිරියන් මොනවට පිදීමෙන් ඒ ආ ගිය කාලේත් සින් නෙත් දිනාගත්තාය. මේ යහපත් පැවැත්ම නිසා බොහෝ වැදගත් වැසිකිරි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය මෑ කෙරෙහි මහත් ආදරයක් බදිනා ලදින්, මෑ ධනවත් තරුණියකුවම සරණකර දීමට මාරු බලමින් සිටියාහ. පමණක් දුර කාරණා කාරණා දත්තාවුද, පමණක් ධනවත්කට ඇන්නාවුද, තරුණියන් කීපදෙනෙක් ගේ ආදර වන්නයන්ගේ උපදෙස් පිට මෑට ලොගව සරණ පිළි ඵසු නමුත්, යව සව තරුණු කරණකොට ගෙණ මැඟේ දෙමව්පිය බැඳු මිත්‍රාදීන් විරුඬවූ බැවින් ඒ ඝයල්ල ප්‍රතික්ෂෙපවිය.

———:o:———

නමන්ව ලැබෙන පුරුෂයාගේ පළමුවෙනි දර්ශන ඝ.

———

දිනක් මෑ ගොඩපර තලා ගිස සෝදූ වතුර නා අලුත් වස්ත්‍ර සහ අලුත් ගැට්ටයක් ගැඳ උදය කාලයේ නෙදර සිටින අතර තරුණ වයසේ පුරුෂයෙක් ගේ ඇඟේ අසලින් යමින් ඇඟේ මුසුන බැලූ බව දුටුවාය. මෑටද

ඔහුගේ මුහුන සඹුණියෙන් පෙණී ගියාය. මෑ ටෙ තරුණයාගේ මුහුන දුටු වහාම විදුලියක් මුහුන ගැසුනායේ හෘදයඛණ්ඩයකට පත්විය. නිෂ්ක්‍රාතුරූපව පමණක්නොව ගිප්නොටිසම් (Hypnotism) මැග්නැටිසම් (Magnatism) නම් සුරෝපිය ශාස්ත්‍රානුරූපවද මෙයේ ආඛණ්ඩ උපදින බවද, එසේ උපන් කල්හි ධාතු බල හෙතුකොට ගෙන එහි ඉහ ඵල ලැබෙන බවද සත්‍යයකි. ටෙ කාරණය ගැන් ටෙ තරුණයාට මෑ දැකීමෙන් හටගත් ආඛණ්ඩය ගැන් මෙහි සඳහන් කිරීමට සිදුවූසැටි දැනගැන්මට සුපර ලෙස නොලැබුනේවී නුමුත්, ඔහුද එසේම හෘදයඛණ්ඩය කට පත්වෙන්ට ඇතුවාට කිසිම අනුමානයක් නැති බව ශාස්ත්‍රඥයින් පෙනේ. මේ තරුණයා කාගේ කවිද නම කෙසේද, කොගේ වසන තෙනෙක්ද යනු මෑ ටෙ කාක් නොදැන සිටි නමුත්, චිත්තාඛණ්ඩියෙන් පසු මොනු තෙරෙහි ප්‍රෙමය බැඳී ගියාය. මොනු සමග කරකාර බස නතේ ප්‍රශ්නය ඉදිරියට ආකල මොනුගේ නම එවැනට ප්‍රසිද්ධව සිටි **බබාඹිසෙකුසර, වෙදමහතා** බවත් ඈ එකවරක් දැකීමෙන් ප්‍රෙමය හටගැනුන තරුණයා මොනු බවත් දැන මොනු සමග සරණ බඳිනයට කැමැත්ත හඟවා සිටියාය. තරුණ්ගේ පක්‍ෂයෙන් කිසි විරුද්ධකමක් නොවූ නමුත් තරුණයාගේ පක්‍ෂය මදක් විරුද්ධවිය. මෙසේ ටෙ පක්‍ෂයට විරුද්ධ වෙන්වූන හේතුව නම්, තරුණියා එවැනට තරමක් දුර ප්‍රසිද්ධව සිටි නිසාත් වෙදකම සහ ජෙනති ශාස්ත්‍රය දත් නිසාත් මිට වඩා උසස් තැනකින් ඔහුට කන්‍යාවක් ගේන්ට හැකිය යනු කල්පනා කිරීමෙන්ය. ගුරු හාමුදුරුවන් විසින් වෙද මහතාට සුපරලෙස මෑ ගැන් කියා තිබුන නිසාත් මැගේ කේතුය තමාගේ කේතුයට සිනුවෙන නිසාත් මිට අනුකූලව දෙදෙනා සම්බන්ධව සිදුවුන ශාස්ත්‍රාන්විත හෘදයඛණ්ඩය උපතාව සිට මෑ ගැන්ම වෙද මහත්මයාට සුපරව සිටීමට සිදුවීමෙන් දෙපක්‍ෂය එකතුව වචන තින්දුකර සරණ බඳිනයට දින නියම කොට වම් 1833 ගේ ජනවාරි මස 27 වෙන්

දින පෙරනම් ප්‍රසිද්ධ කරණලදී. සරණ බන්ධනයේ දින දෙපක්ෂයේ නෑදෑ මිත්‍ර සමූහයා එකතුව මොරටුවේ දූනට ශුද්ධ එම්මානුවෙල් දෙවමඳිරය පිහිටා තිබෙන ස්ථානයේ තිබුන පෞරාණික දෙවමඳිරයට පැමිණ එහිදී ක්‍රිස්තු වර්ෂ 1833 පෙබරවාරි මස 28 වෙනි දින සාමුවෙල් ප්‍රෙරා දේශනාකාරතුමා ලවා ශුභ සරණ බන්ධනය ඉටු කරගන්නාලදී. මෙ මඞ්ගල්‍යයෙහිදී කිසිම අවලක්ෂණයක් සිදුනූනා පමණක් නොව බලාපොරොත්තුවට වඩා සකලම දේ සඵලාකාරයට සිදුවීම මෙ අභිනව යුගලයේ මතු වාසනාවට ලක්ෂණයක් බව එවකට මොරටුගමෙ විසු නුවණැති කවුරුත් සැලකූහ. සරණ බන්ධනයෙන් පසු කලක් උඩරට විසිමෙන්ද කලක් පාතරට විසිමෙන්ද අන්‍යොන්‍ය ප්‍රෙම බන්ධනයෙන් කාලය ගත කළහ. වෙද මහත්මයා කරකියන කුශල ක්‍රියා ගැණ හෝ දුක්පතුන්ට කරණ ධන පරිත්‍යාගය ගැණ හෝ ඕ තොමෝ කිසි විටක විරුද්ධ වචන මාත්‍රයකුදු නොකීය. ගඞ්ගානම් ගඟ සමුද්‍රයට එකතුවූ පරිද්දෙන් මෙකී දිමිතා ගැණ නෝනා මහත්මයා පඟකාරී වීමෙන් දුක්පත් ජනයාට ජය මඞ්ගල්‍යයක්ම සිදුවිය. අභිනව යුවල ඉතා සැපෙන් මෙසේ පසුවෙන අතර, ද සොයිසා නෝනා මහත්මයාට දරු ගර්භයක් ඇතිවිය. මෙකී දරුගර්භය මූකිරීමට පටන්ගත්තාක් මෙන්ම සනීපය සහ සිතේ ප්‍රිය භාවයද ඇතිවිය. ඇතම් අන්‍ය කුළුදුල් දරි ඇත්තියන්ට මෙන් තද අපහසු මලානික කම්ද නොපැමිණියේය. මෙකී ශුභ ලක්ෂණයන් විද්‍යමානවීමෙන් පූර්ණවන්ත දරුවෙක් ලැබේය යන බලා පොරොත්තුවකින් අඹු සැමි දෙදෙන වාසය කළහ.

———:0:———

ස්වප්නයක්.

දිනක් රෑ කාලයේ නිද්‍රෝපගතව සිටිනකල මෑ ස්වප්නයක් දැක එය පසු දින උදයේ ස්වාමි පුරුෂයාට කීවාය. "ඊයේ රෑ සුදු වස්ත්‍රවලින් සැරසුන කෙනෙක්

පැමිණ මගේ වම ඇස උදුරා විසිකර, දකුණු ඇස උදුරා වමැසට සවිකර වෙනින් අමුතු ඇසක් දකුණැස වලෙහි ඔබා යන්ට හිඳේය. මෙසේ පිහිටු දකුණැස පළමු තිබුන දකුණැසට වඩා දුර පෙණීමක් ඇතිවුනේය. වමැසට සවිකළ පළමු තිබුන දකුණැස පෙණීම පළමු තිබුනාක්මෙන් ඇතිවිය. ඇස් ඉදිරිමෙදිවත් පිහිටිමෙදි වත් කිසි වෙදනාවක් නොවිය"යි සිනය දුටු අන්දමට මෙසේ කීවාය. සඞ්ඝාමිපුරුෂතෙම "නරක හිනයක් නොවේය, නමුත් කිසිවෙකුට සිනය කියන්ට එපාය"යි ඒ වේලාවට කීවේය. මෑදෑ හිනය ගැණ නොයෙක් දේ සිතූ නමුත් එසින් ලැබෙන ඵල විපාක තේරුම් ගන්ට බැරිවිය.

———:o:———

දරු සම්පතක් ලැබීම.

මෝතොමෝ දරු සෙනහස කරණකොටගෙණ දරුවන් ඇති දුක්පත් මව්වරුන්වද දුක්පත් අවශෙෂ ජනයාටද වත් බත් ධන දීමෙන් සඞ්ග්‍රහ කිරීමට විශෙෂලෙස පටන් ගත්තාය. උඩරට නැවති සිටින කාලවලදීද පහතරට සිටින කාලවලදීද, උඩ පාත දෙරට වැසි දුක්පත් ස්ත්‍රීන්ට සහ පුරුෂයින්වද දරුවන්වද මහත්සේ නොසැඩව උදව්කිරීමට පටන්ගත්තාය. සඞ්ඝාමිපුරුෂයා කර කියන කුසල ක්‍රියා ගැණ මෑ අනවරතයෙන්ම එකහව සතුටින් ක්‍රියා කළාය. මේ කරණකොට ගෙණ මෙම කාන්තාවගේ ගුණ යශපත්භාව උඩ පාත දෙරට ජනයා අතුරේ විර ප්‍රසිඛවිය. මෙසේ කල්යවනා සමයෙහි පළමුවෙනි දරුවා බිහිවීමේ කල ආසන්නවිය මෝ තොමෝ මේ දරුවාට ගැබ්ගත් කල පටන් ඉතා තද ලෙස ප්‍රවෙශව විමට සිතා සියලු ඉරියව්වලදී තද ප්‍රවෙශ මැහින් ක්‍රියාකළාය. එවැනට කුලුදුල් ප්‍රශවය සඳහා සුදු ගේ දෙමව්පියන්ගේ නිවසට යාමේ සිරිතලෙස මෝ තොමෝ දෙගුරුන් සමීපයට පැමිණියාය. මොරවුවට

පැමිණ තම දෙගුරුන් අතර සුවසේ වසනාකල, ඔස්ගණන් සඹුගේ පිළිමෙන් මොරටුවේ තම දෙගුරුන්ගේ ත්‍රව සෙනිදි පුණ්‍ය ලක්ෂණයෙන් විරාජමානවූ පිරිමි දරුවකු ප්‍රසූත කළාය. දරුඇවිස්කාරය විපුලාකාර තිබුන මෙම නෝනා මහත්මියා මේ දරුවා කෙරෙහි උපදවනලද මහත් ආදරය ඒ දවස්වල ඒ ගම් අසල ඇතිවුන මේ පලලේ දරුවන් අතරේද පැවතින. ප්‍රසූතිකාවියන්ට සහ දරුවන්වද මේ නිවසෙන් මහත් ඵලප්‍රයෝජන විය. මේම පින්ඇති දරුවාගේ වැසීම දිසුඹු වෙන්ට වෙන්ව සියාව ඛන උපදවීමට නොයෙක් මාණි ඇති වුනේය. මේවිටද තිතු පැතු සම්පත් ලැබෙන්ට පටන් ගත්තේය. හතුරන්හෙත වන්නේදී මේම නෝනා මහත් මයා දුවු වචපනය ගැන් මෙහිදී තම සැමි පුරුෂයාට වැවසුහ පරිද්දෙන් ව්‍යහරාකර දුන්නේය. "වම්ඇස උතුලා විඩකිරීම නට ගෑඹු දරුවෙක් නොලැබිමිය්සි සිතේය. දකුණැස වමෙහි පිහිටීම නම්, ඒනි ඌනව්‍යය සඹුගේ කරලීමය, දකුණැස වෙනුවට අමුතු ඇසක් පිහිටුවාලීම නට, පිරිමිදරුවා ලැබීමය. තිබුනැසට වඩා ඒ ඇස දුර පෙණීම නම්, දරුවා වාසනාවන්ත පිරිමි දරුවෙක් වීමය. ඒ මේ දරුවාය" යනුයි.

———:o:———

පුත්‍ර වර්ණනය.

සැමි පුරුෂයා මෙසේ කීකලා, දරුවා ප්‍රවේශමිකර ගැණීම ගැන සහ වැඩිම ගැණත් වඩ වඩා ධෛර්‍යයි හෙණ මේ තොමෝ ක්‍රියා කිරීමට පටන්ගත්තාය. අසල් වාසි ගෘහිනීන් ගැන ඉතා ලොකු සැලකිල්ලක්කළා පම්ණක්නොව ප්‍රශවයෙහි වෙහෙසදත් මේ තොමෝ ප්‍රසූතිකාවන්ට උවමනා දෙයින් මහත්සේ සඩ්ග්‍රහ කළාය. අසල ප්‍රසූතිකාවුන්නේ ප්‍රශවවිලදිදී, තරාජරම්, දුක්පත්, පොතොසත්කම්, ආදියක් නොසලකා ඒ ගෙවලට වැදී මවකු ලෙසද, යහලු සහියක් ලෙසද, දැයියක් ලෙසද,

විත්තඹු ලියක් ලෙසද ක්‍රියාතරමින් උදව්කළාය. ප්‍රසූති කාවුන්ටු සහ දරුවන්ට ශීතසුලං ආදියෙන් වැලකී සිටීමට උවමනා ලෝම වසාදීයද, බොහෝවිට සංවාදනය කරදුන්නීය. තමන්ට සැලවුවිට නිබිරි ගෙවලට උවමනා දුරු මිරිස් තෙල් බෙහෙත් ගමේ පමණක් නොව ඈත ගම්වල වසන ප්‍රසූතිකාවන්ටද තෑගිකොට යැවීය. යමක් ඉල්ලා ආ කෙනෙකුට "නැහැයි" යන වචනය කිසි කලකත් භාවිතා නොකොට, ඉල්ලන ප්‍රමාණය බැරිවුනත් තමන්ට හැකි ප්‍රමාණයෙන් දෙන සිරිතද ඇතිකළාය. නිතර දුන් මත් යාචකාදීන්ට වගින් බතින් සඩිග්‍රහ කිරීමට මහත් ආශාවකින් සිටියාය. කාට නුමුත් ලෙඩක් දුකක් පැමිණිවිට ගෙදර තිබෙන සියලුම දේ දීලා නමුත් ඔනු සුවපත් කරගැනීමට මහත් ආශාවක් ඇතිවිය. නිතර සෙලවෙන්නාවූ මහා සමුද්‍රයේ ජලයසේ නිතර දුක් පහුන් කෙරෙහි කම්පාවන සිතක් ඇතුව සිටියාය. කෑනෑදු භාවය ගැණ දැන ඉගෙණ ගත් ගුරුවරියක් බව කියන්ට කරුණු තිබේ. ගුණවත් සුසුදු තම සැමි පුරුෂයා ඉගෙණගත් විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලාට කරගෙණ ආ සඩිග්‍රහ නොනැවැත්තුවා පමණක් නොව දන් මුරයද දීමෙන් කෑනෑදු භාවය මොනවට රක්ෂාකළාය.

———:o:———

දෙවෙනි දරුවන.

මෙසේ සුවසේ වසන අතර කල් යාමෙන් මෝ නොමේ දෙවෙනි දරුවාට ගැබ් ගත්තීය. දරුගැබ් ගත් නැන් පවන් සිනට කසට සැපමද කමදැ, මිදි මිදි අසනීප කම්දද ඇතිවිය. සැමියුරුෂයා විසින් ඒ ඒ වේලාවට සුදුසු ඖෂධාදිය දීමෙන් සුවපත්කර ගත්තේවී නමුත් ආහාර වෛකල්‍යාදිය නොසඳව පැවතුන. දිනෙන් දින ගැබ් බේරීමට පවන්ගෙණ දසළුකඩමස සම්පූර්ණවීමට ආසන්න විය. ගම්සිගින්නට දුර ගමන්යාම දුෂ්කර බැවින් සහ වාහනාදියෙන්යාම අපහසුසහිත බැවින්ද නොලබා එමට

කලහකා හොකිරීමටත් උඩරට ගෘහිනීන්ට සතිප බවත් ඩොම් පුරුෂයා කියාගිවුන බැවින් උඩරට හඟුරන්කෙත වත්තේ හිවසේදීම ප්‍රසූත කිරීම සම්‍රකරගෙණ පින්දහම් කිරීමෙන් කාලය ගතකළාය. මෙසේ කාලය ගතකරණ අතර දෙවෙනි වරට මෑ ගෘහිණු දරුවෙක් ප්‍රසූත කළාය. මේ දරුවා යසසේ වැඩි එකොලොස් මස වූ කලී ආම රකත රෝගයෙන් මිය ගියාය. ඒ පිළිබඳ මෑත ශරීරය එම වත්තේ වලලෑමටද සිදුවිය. මේ ශෝකය මැට බලවත් වුනේවී නමුත් ඉතාවන්නා ඩොම් පුරුෂයා එයින් මේ ගැන කී ගුණ දතුම්කිසිවා සිතට ගෙණ සැහසුනාය.

——:o:——

කෘතොපකාර සැලකිමක්.

මොරවුවේ වසන අතර ගිහිභාන කාලයකදී දිනක් මෑ සනානය පිණිස අසල ලිඳකට ගොස් නාන්ට පටන් ගත්කල තවත් ගෘහිණු කීපදෙනෙක් නෑමට එම ලිඳටම පැමිණිසාහ. ඒ පැමිණුන ගෘහිණු කීපදෙන නෑමෙන් ලිදේ වතුර ඉතා නිහාවුනේය. මේ ගුණවති වතුර කලගෙඩි තුණ තනරක් නා ඇහ කුඹුඉලිමෙන් සිවින අතර, එක ගෘහිණියක් හැර අනික් හැමදෙනම ඉතා ඉක්මනින් නාගෙණ යන්ට ගියාහ. නැවතුන ස්ත්‍රී මේ නෝනාමහත්මයා දෙසබලා "අඩුව නෑම නිසා ප්‍රතිඥා හටගැනේදැයි" ඇසුවාය. එසේයයි උත්තර ලැබුන වහාම, ඊට ඈත ලිඳකින් කීප වරක් වතුරගෙණැවිත් දීමෙන් හොඳහැටි නා ගැණී මට සැලසුවාය. එන්වති මේ උපකාරක ස්ත්‍රී කෙරෙහි මහත් සැලකිලිවනාව දිවිඇතිකාක් වනින් බහින් සහ ධනයෙන්ද ඇගේ ඔනෑකම් ඉතා සැලකිල්ලෙන් ඉටු කිරීමෙන්ද කෘතඥ භාවය රැක්කාය. නෑමට ලිඳලඟට පැමිණුන රැකවුව සමඟ ආ මේ ස්ත්‍රිය වාසනාව විසින් නව තන ලදින් ඇට සහ ඇගේ දරුවන්වද මේ උත්තමිය මහත් ඉසුරු දුනය කළාය.

පවුම් දහයේ ප්‍රවෘත්තිය.

දිනක් ප්‍රෝඞ්ස් ද සොයිසා මහතා හරක් කිප දෙනෙක් ගැණීමට සිතා තමන්ලඟ තිබෙන මුදලට තවත් පවුම් දහයක් උවමනා බැවින් එය කාගෙන් ලබාගන්නවාද යනු කල්පනා කරමින් සිටියේය. අමුතු කල්පනාවක්කින් සිටින බව තම මහත්මියට වැටහී, කල්පනා කරන්නේ කුමක්දැයි යටත් පිරිසෙයින් ඇසුවාය. "හරක් කිපදෙනෙක් ගැණීමට පහසු ක්‍රමයක් තිබෙය. මා අත තිබෙන මුදලට තව පවුම් දහයක් උවමනා නිසා ඒ ගැන සිතමින් සිටිමි" යි ද සොයිසා මහතා කීයේය. රාහසුරු වම්කාර් යහන්ගෙට ගොස් කාසි කැටයක් බිඳ පවුම් දහය ගෙණැවිත් අනට දුන්නාය. ද සොයිසා මහතා සිනාසවී පවුම් දහයගෙන් වහාම ගොස් සිතුවේ හරක් රැගෙන් ආයේය. මේ සුඤ්ඣි කොපමණ දුරට රාහසුරුවම්කම් රැකගෙණ ක්‍රියාකරනිබේද යනු මෙසින්ද ඔප්පුවේ. මෙය කියවන සජ්ජනයන් යම්පමණ යහපතියන්ද ඒ පමණට මෙම උත්තමියගේ පුදුම ආදර්ශගෙණ මෙලොව දිනනවා ඇතැයි විශ්වාස කරමු.

—————: o :—————

තෙල ප්‍රවෘත්තිය.

දිනක් අත් තෙල් විකිණීමට ගෙණියන ස්ත්‍රියක් මොරටුවේ නිවසට පැමිණි කල තෙල් නැළි දෙකක් මැණ දෙන්ටය කියා, සමිකිසි කරුණක් නිසා ද සොයිසා නෝනා මහත්මයා කාමරයට ගියාය. තෙල් අම්මා තෙල්නැළි දෙකමැණ භාජනයට වත්කොට මුදල් ලබාගැණීමට ප්‍රමාදව සිටින අතර පූසුම් චාල්ස් මහත්මයා මිදුලේ සිට හෙට දුව ඒමෙන් කකුල හැපී තෙල් භාජනය පෙරළුනේය. ද සොයිසානෝනා මහත්මයා කාරණය දැන තව තෙල් නැළි දෙකක් මැණපන්ය කියා වෙනින් භාජනයක් ගෙන්වා

දුන්නාය. ඒ භාජනයටත් තෙල් නැළි දෙකක් මැණ ඉවරවූ පසු තෙල්නැළි සතරයාට මුදල් ගැණ දුන්නාය. තෙල් අම්මා ප්‍රථම තෙල් මැණ වත්කළ ඉකිරිඝිය භාජනයට තෙල් නැළි තුනක් මැණ දුම්මු නිසා තව තෙල් නැළියක මුදල ලැබෙන්ට ඕනෑයයි කීවාය. "ඉකිරිඝිය ඒ භාජනයට තෙල් නැළි දෙකක් මඟින්ට මාකිකල නුඹ තෙල් නැළි තුනක් මැන්නේ ඇයිද" යි ඇසුවාය. "මට ඇසුනේ තෙල් නැළි තුනක් මඟින්ට කීවාක්මෙනැ" යි තෙල් අම්මා කීවාය. තෙල් භාජනය පෙරළී තෙල් ඉකිරුණ නිසා තෙල් අම්මා කිවේ සඔසුණි බොරුව බව නෝනා මහත්මයා දැන, "හොඳයි උඹ කියන්නේ ඇත්තනම් ඒ තෙල් නැළියේ කාසිත් ඉදුය" යි කියා දී යන්වහැරියාය. තෙල් පෙවිටිය නිසටගෙණ මෑ දෙරකඩ එහාට මෙහාට සක්මන් කරන්ට පටන්ගත්තාය. නෝනා මහත්මයා මෙය දැක "ඇයි අම්මේ නොයන්නේ!" යි ඇසුකල "මගේ ඇස් අඹ කාරවුන බැවින් යන්ට මග පෙණෙන්නේ නැහැ" යි කීවාය. කරුණාවන්ත නෝනා මහත්මයා එහාම දෙර කඩව පැමිණ මැණේ අත අල්වා ගෙණැවින් වාඩිවීමට සලසා කෝපි උදැහැකරවා බොන්ටදී ඉසට බෙහෙත් තෙල් වකියක් දමා විකසෙලාවක් හාන්සිවීමට සැලැස්සුවාය. තෙල් අම්මාකල බොරුවහැණ මෙහිදී ඈ භයව "තෙල් නැළියක සල්ලි වැඩිය ගත්තේ මව බැරිවෙලාය, පළමු භාජනයට මැණ දුම්වෙත් තෙල් නැළි දෙකය, ඒ නිසා වැඩියේ දුන් තෙල් නැළියේ මුදල ගන්වය" යි කියා මුදල නෝනා මහත්මයාට දෙන්වසැදුකල නෝනා මහත්මයා මුදල නොහෙණ බොරු කිමෙනි වරද ගැණ සහ වෙරුකර ධාමික ලෙස සමනකරණ අපගේ මුදල් අසුන්නේ අරගන්න කොහෙනහුට හරි නොයනි බවත් ඇස් අඳකාරවීමෙන් එය සඟවාකල බවත් කියා ඈ ලග ඉතුරුව තිබුනතෙල් නැළි පහත් මැණගෙණ ඒ සේරටම මුදල්ගැණිදී වැඩියේ ගත් මුදලත් ඈට ගන්ට සලසා "ඉතින් තවදුර ඇවිදීම මවිසින් වැලකූ බැවින් සුවයේ ගෙදර ගොස් උයා පිහා කාපන්නැ" යි පවසා විවත් කළාය. තමන්ට වෙහැකාකල යුතුව

කළ යී සැලකිල්ලෙන් මේ උත්තමියගේ විපුල ගුණ රාශිය මොනවට ප්‍රකාශවෙන්නාක් මෙන්ම, බොරුකාරීගේ ඒ ක්‍රියාව කරණකොටගෙන් ඇය අභිකාරවීමෙන් එකිවිපා කද එවලේම ප්‍රකාශවීමත් නුදීජනතාවගේ මතුදිසුරුවට ඉතා වැදගත් බව කියමු.

———: o :———

අදිසි අසනිපයක්.

———

ද සොසිසා නෝනා මහත්මයා මොරටුවේ නිවසේ නැවතී සිටින කල, ශ්‍රෝණිස් ද සොසිසා මහතා උඩරට සිට මොරටුවට පැමිණ දෙතුන් දිනක් පසුවෙන අතර, දූලවිර අදිසි ඇවිල්ල්ලක් හටගෙන් අපහසු උනේය. ආශ්වාස ප්‍රාශ්වාස ගැන්මේ වේදනාව නිසා වඩා කථා නොකර සිටියේය. මේය නෝනා මහත්මයාට තද දුකක්ව, පුත්‍රයා වන චාලිස් ද සොසිසා මහතා ලඟට කැඳවා දූස් පිරුණ තදුලින් සුනතව "පුතේ උඹේ මුළු බුදුලයම ලියා දී, පියා සනීප කර දෙන හැටියට සපන් වෙදකුගෙන් ඉල්ලාපන්ස, පියා නැතුව මගේ ජීවත්වීමෙන් උඹට විරිමකින්නේ නැහැ" සි කීවාය. පුත්‍ර පුඤ්ඤ මහතා පියාගේ සහන ලඟට කිට්ටුව මව කියාපු ලෙස පියාට කියේය. මුදලි තුමා සිනාහවී "මට තද අසනීපයක් නැත. මවිසින් කථා නොකර සිටින්නේ කථා නොකර සිටීමෙන් ඉක්මනට ඇවිලිලි අඩස්සිවලට ගුණ දෙන නිසාය. නමුත් මව මා ගැන් ඇති සැලකිල්ල උඹ මව ගැන් නිසා ත්‍රියා කරපන්න. මගේ බුදලේ හිමිකාරි උඹේ මවය. මවගේ බුදලේ හිමිකාරයා මම කෑමෙන් නම් උඹ වෙන්ට ඕනෑය. එය හිමි කර ගැන්මට, මවට ඇතරුව ආදර වනතාව හිටපන්නැ" සි කීය. තම සැමි පුරුෂයාගේ සැලපවූ අසනීපය පවා නෝනා මහත්මයාට ඉවසා සිටින්ට බැරිවී පුතාට කී කථාවෙන් සැකිය සැමි පුරුෂයා කෙරෙහි පැවති තද මිහොසික සහෘ ප්‍රෙමයද, අපේ බුදලේය, මගේ බුදලේය යනාදිය නොකියා "උඹේ බුදලේ"

කී කියමනෙන් තමන්ගෙන් සඩාම් පුරුෂයාට කිසිවක් අයිතිනුහ බැවින් මෙ බූදලයට එකම හිමිකාරයා එකම පුත්‍රයා නිසා ඇත්ත ප්‍රකාශ කිරීමද, වසතු තෘෂ්ණාවෙන් නොසිටිය බවද, කදිමට ඔප්පුවේ. පියතෙම පුතාට දුන් පිළිතුරු වලින් සඩයිය හාවභාව කෙරෙහි පැවතුන ඒකාන්තික ප්‍රෙමයද, මිය කෙරෙහි පුත්‍රයා හික්මවීමට ගෙණ්ඇ උපාවද, බූදල්හැණි පුත්‍රයා වෙන අහඞ්කාරය බිඳහෙලීමද සිදුවුන බව පෙණේ. මේ පොතේ මේ වාක්‍යය කියවන අඹු සැමි පුත්‍රාදීන්ට මේ කථා දෙක මාහැනි අනුශාසනා වකි.

—————:o:—————

නිරහඞ්කාර කම.

සඩාම්පුරුෂයා ගැණවත්, ධනය ගැණවත්, අන්‍ය සතුති ප්‍රශංසා පිදීම් ආදිය ගැණවත් කිසි අහඞ්කාරයක් සිහිනය කින් පමණවත් නොසිතූ මේ පුණ්‍යවන්තී, නිතරම ඇගේ පුත්‍රයාට ඉහැන්නුවේ අහඞ්කාරවීමෙන් පැමිණෙන මහත් අනර්ථයෙන් මිදී කල්කිරීමටය. චාලිස් සොඩිසා මහත්මයා දිනක් පාඨශාලාවෙන් අඩුත් සවස්භාගයේ දෙරකඩ සිටින අතර ඊට වඩා වැඩිමහල් ලමයෙක් පැමිණ චාලිස් මහත්මයාට ඇවිදින්ට යන්ට අඞ්ගැසිය. එවකට ලෙඩ සහිතව සිටිනිසා වඩා සෙල්ලම්ට සහ ඇවිදීමටත් මිනාපයක් නොතිබුන හෙයින් "මට බැරිය" යි කීවේය. එවිට අර ලමයා "පෙණේද කාසිකාරයකුගේ ආඩම්බර" කියාහෙණ යන්ටගියේය. ද සොසිසා නෝනාමහත්මයාට මේ දෙන්නාගේම කථාව ඇසි වහාම දෙරට බැස එසේ කියා හෙණ සහ ලමයාට කථාකොට ගෙට කැඳවා "චාලිස්ට සතිප මදිනිසා ඇවිදීමට යන්ට බැරිය කිවා මිස ආඩම්බර යක් උඹට නොපෙන්නුවේය. උඹේ තාත්තා ලහත් කාසි තිබේ. හිතන්නන් ලහත් කාසිතිබේ. කාසි නැතුව කාට වත් ජීවත්වෙන්ට බැරිය. චාලිය තවම සම්භාවණ මිනිහෙක් නොවනකොට කාසිකොසින්ද ? චාලිස්ගේ

පියාලග කාසිනිබෙන්ට පුළුවන්වා මෙන්ම තුඹේ පියා ලගත් කාසි නිබෙන්ට පුළුවන. චාලීස් කාසිකාරයා වුනොත් උඹ යහලුවා නිසා වඩා කැමතිවෙන්ට ඕනෑ. උඹ කාසිකාරයා වුනොත් චාලීස් උඹේ යහලුවා නිසා වඩා සතුටුවීමට ඔනුව සුතුකම් තිබේ. ආඩම්බර කියන වචනය නපුරු වචනයකි. චාලීස් ආඩම්බරනෑ. උඹ ආඩම්බර මෙන්වත් එපා. චාලීස් ආඩම්බරනම් එහි වරද උඹ පෙන්නාදීපන්. පුනා මෙබදු නරක වචන භාවිතා නොකර සමගියෙන් දෙදෙන කල්යවා පල්ලාය" සි පවසා එම ලමයාට ඉඟි වකීයක් කන්වදි කිසඳුනගා විටත් කලාය. එම ලමයා විටත්කර හැරූ තුවණැත්ති පුන්සාව කථානොව "චාලීස් කිසි ආඩම්බරයක් නොමැතිව කල පසුකරණ උඹේ පියාගේ නාමය රකින්ට කිවින උඹ හෙට අනිද්දාට උඩහු වුනොත් මිනිස්සු මක් නොකියද්ද? නිසුවෙන් ගැළවෙන්ව හැකිවේද? මගේ පුතේ මේ කාරණා උඹේ ඔය පුංචි හිතේ පදිංචිකරගෙණ පියා මෙන් කල්හැරීමට දැන් මෙයින් හිතට ගඹින්නැ" සි පැවසිය. ඇතම් දෙමව්පියාදිනු තමන්ගේම දරුවන් උසස් කොට සලකා මෙබදු ප්‍රසංගාවලදී අනුන්ගේ දරුවන්ට විරුඬව ක්‍රියාකරණ බව බොහෝ විට දක්නා ලැබෙන කාරණයකි. නමුත් මෙහිදී මේ උත්තම ක්‍රියාකර තිබෙන අගය ගැණ දරුවන්ලත් තුවණැති අම්මාලා මැතේ නාම යට සතුතිකිරීමට ලොභවෙත්ද?

——————:o:——————

ලමාඑතනි ඝන ගරු නාමය ලැබීම.

——————————

මෙම ලමාඑතනි රැකසුරුවම්කම් ඉතා හොඳට උගත්නි සැමී පුරුෂයාට ලැබෙන දෙය රැකීමෙන් තමනුත් නොයෙක් ධාර්මික උපායවලින් ධන ඉපිදවීමට පටන්ගත්තාය. මෙසේ දුහැමෙන් සෙමෙන් කල්යවන අතර, තම සැමීපුරුෂයාට වාසල මුදලිකමට සහාය කරලීමෙන් මැද්දේ ගම සාවිරයානන්ගේ කිම පරිද්දෙන් මෑ **ලමාඑතනි**

සහ ගරු නාමයෙන් එකෑවරම ප්‍රකටවිය. මේ ගැණ ලෝම කුපයකුදු පමණ ගර්හා නොවූ වරයුතුරි, පුරුදු ගෙකට සහ අනෘ චරිතද පළමු පුරුදු සුභාවයෙන්ම පැවැත්විය. ලමාඑතනි යන නාමය කරණ කොටගෙන මේනොමේ උයන ගෙට නොගොස් නොනැවතුනා පමණක් නොව, සුකීය සුවාමිපුරුෂයාගේ කෑමට උවමනා සැකලම පිසීම ආදිය සුකීය හස්තයෙන්ම සම්පාදනය කළාය. මේ කාලයේ බැලූ බැලූ දිසාවේ දැසි දසුන් සිදි නමුත්, තමන් විසින් පුරුදු සුභාවයෙන් ඕස් නෙත් කරණ කටයුතුද ගව මඟිසාදින් හලට යවන වෙලා දියද ගෙපහන් දල්වන වේලාදියද ශකති තිබෙනතාක් නොවැලැක්කුවාය.

———:o:———

අසොමය වළලු සුවල.

පුවිදිශාවාසි ජනයා අමනුෂ්‍ය දෙස් හිනනවන අදහසින් තම දරුවන්ගේ අත්පාවල යකඩ වළලු මුදු යනාදිය පළන්දවන සිරිත ලෙස, මෑව බාල කාලයේ යකඩ වළලු දෙකක් පළඳවා තිබුනේය. සරණ බඹුන යට ප්‍රථම දින වනතුරු තිබුන මේ වළලු දෙක තමාගේ සහෝදරයින් විසින් අහක්කර ඔවුන් දෙන තෑග්ගක් වශයෙන් පනාග හසකුත් පනම් අවක් වියදම්කර රිදීයෙන් වළලු දෙකක් තනවා තම සහෝදරිගේ දැතේ මගුල් දිනේදී පළඳවනලදී. මෙම වළලු දෙක ගෙවී පලාපු පොල් ඉරටුවක ප්‍රමාණයට තිබියදීත් ඉතා වැදගත් ප්‍රභා වලට පැමිණෙන කලත් එයම පැළඳ ගිය බව පෙණේ. **පවුවි දොලොස් ඔසඝකට** ඉතා අගනා වළලු දෙකක් මුදලිතුමා තනවාදී තිබුන නුමුත්, ඊට වඩා ආශාවෙන් අතේ තිතර තිබුන හෙවිගිය රිදී වළලු දෙක පැළඳීමට සතුවින් සිටියාය. මේයි අගනා වළලු සුවල ඇතම තැනක පැළඳගෙණයියා ඕස සතුටකින් නොවෙය. බොහෝ අප්‍රිය කමෙන් මුනුණ මැලිකරගෙණ "මාලිස්ගේ වදේ බැරි ඒසා

අදිනවාය" යි කියමින් පැළඳීමද එසේම අප්‍රිය සුගාවෙන් ගලවා දැමීමද කළාය. නා නා ප්‍රකාර ආභරණ රෙදි විලි ඉල්ලමින් දුක්පත් පිරිමින් වෙහෙසන ඇතැම් වයස බිරින්දන්ලෙද කිසිකලකත් තම සැමියාට අස වල් ආභරණය සපයාදෙන්වයයි නොකීවාය. නමුත් සුකීය භාග්‍යවතීගේ නිරහඞ්කාර චරිතය දත් සැමියා වඩ වඩා ආදරයෙන් ඇගේ අප්‍රශ්නනය තිබියදීම ඉතා අගනා කුරු කරාබු රන් රිදී මුතු මැණික් ආභරණ තනවාදී තිබුනේය. මෙයී දේ ඇතැම්විට පුත්‍රයාගේ හෝ යෙහෙලිනිය ගේ හෝ ඉල්ලීම පිට පැළැන්දූය. තමන්ට හිතුසේ ආභරණ සාදවා ගන්ට ඉඩ ඇතුව ශියේවී නමුත් රිදී කුරක් පමණකුදු තනවා නොගත්තේය. **පින්වතිණි, ධනවතිණි, ලමාථනතිණි,** යන ආරූඪ නාමයන්ගෙන් උපලක්ෂිත මේ උත්තමියගේ නිරහඞ්කාර මෙම එතම චරිතය ආභරණගැණ උඩඟු වෙන සත්‍රීන් හික්මවන කසයක් කොට නොහැඟේද?

———:o:———

රදල කෙනෙකුගේ මතය.

———

මෙම වලව්වේ පැමිණි තැන උඩරට වසන කාලයේ දිනක් ඉතා අලුයම උඩරට රදල කෙනෙක් ඔහුට විරුඬව ගෙණ ගිබුන අසුභ නඩුවක් සඳහා මුදලක් ඉල්ලා ගැණීමට මුදලිතුමා සොයා වලව්වට පැමිණියේය. මොහු එන කල වලව්වේ මහත්මයා වලව්වේ දෙරකඩ සිවියාය. එදින උදය මෙම රදල තැනට පලමු කොට දකින්ට ලැබුන ශුභ නිමිත්තනට මෙම වලව්වේ මහත්මයාගේ ප්‍රිය මුහුණය. මුදලිතුමා රෑ හරියෙන් නැගිට වතුවලට ගිය බැව් මොහුට කියා ආ නොරතුරු ඇසූ හැමුන් එය නොකියා අදු වෙන කුරුත් වැඩි පසසයක් සිංහල ජනයා වරදවා වැවහාර කරණ "නෑ සීකම්" යන වචනය හාවිතා කළ නිසා සඞ්ග්‍රහ කිරීමට රුචි ගුණවති උදය කෝපියෙන් සඞ්ග්‍රහකර යන්ට හැරියාය. මෙම රදල තැනට විරුඬව

ගෙණ යාවුන නඩුව ඉඩං නඩුවකි. එය විරුඬකාරයින් විසින් අයුක්තෙන් පැමිණෙව එකකි. මෙ නඩුව මොහුට අවාසි වුනොත් ඔහුගේ අඹු දරුවන් පටන් නැතිවී යනු නියතය. මෙදින නඩුව ඇසිමට නියමකර තිබුන නිසා නඩුවට උවමනා මුද්දර සහ නීතිඥ ගාසතුවත් ඔනෑකර තිබුණේය. මෙය ලබා ගැණීමට මුදලිතුමා සමගනූන නිසා නඩුව කල්ගැණීම සඳහා කෙලින්ම උසාවියට පැමිණුනේය. විරුඬ පක්ෂය බලපුළුවන් කාරයින් නිසාත් රදල තැන මෙ ප්‍රස්තාවෙදී අසරණව සිටිනිසාත් ඒ පක්ෂයේ නීතිඥයින් විසින් නඩුව විනිශ්චය කිරීමටම විනිශ්චය කාරයාගෙන් ඉල්ලා සිටිනලදි. මීට ප්‍රථමත් කීපවරක්ම නඩුවගැණ සූදනම් වීමට රදල තැනට අධිකරණාධ්‍යක්ෂක තැන නියමකර තිබුන නිසා මෙහිදී අධිකරණාධ්‍යක්ෂක තැනවද මොහුට අනුකම්පා කිරීමට ඉඩ නොමැතිව නඩුව ඇසීමට පටන්ගත්තේය. නඩුවේ සාක්ෂි ඔවුන්ගෙන්ම බොරු වී නඩුව විත්තිකාරයාගේ වාසියට තීන්දුකලා සහ නඩු ගාසතු ආදිය විත්තිකාරයාට ගෙවීමට පැමිණිලි පක්ෂයට නියම කෙලේය. අසරණ රදල තැන ඉතා ප්‍රිතියට පැමිණ ඉතා ඉක්මණට වලව්වට දුවැවිත් මුදලිතුමාට සහ වලව්වෙ මහත්මියාටත් උදය වලව්වට ආ කාරණයත් නඩුවට සිදුවූ ප්‍රවෘත්තියත් තත්වූ පරිදි දැනුම්දී සිට, “නීතිඥයෙක් නොමැතිව අද නඩුවෙන් ජය ගැණීමට මට සරණවූයේ මුදලිතුමගේ පුණ්‍යවන්ත ප්‍රිය භාර්‍ය්‍යාවවූ වලව්වේ මහත්මියාගේ මුහුණ පලමුව දැක උසාවියට යාමය” යි කියා ස්තුති කෙලේය. මුදලිතුමා රදලතුමාට වාඩිවීමට සලසා ගෞරවාදරයෙන් කථාකර නඩු යාමෙ වරද බොහෝදුරට පෙන්නා දුන්නේය. උදය පලමු දකින පතයට සම්මුඛවෙන ප්‍රාණ අප්‍රාණ වස්තූන්ගේ ශුභාශුභ ගැණ ශාස්ත්‍රයෙහි පෙණේ. නැකැත් බලා ශුභ යොගවලදී යනෙන ගමන බිමන සඵලවෙන බවද, ඒ ශාස්ත්‍රයින් පෙණේ. ඇතම් ආචාර්‍ය්‍ය මතානුකූලව ශ්‍රියාවන්ත ස්ත්‍රීන් දැක කථාකර යාම හෝ දියපිරි ඝට චිලිකුම්ඵල, ආදිය හෝ අරුණ ලොක කාලයේ ප්‍රථම දකිනයට යමෙකුට ලැබෙ නම් එදින ඔහුගේ කටයුතු නැකැත් බලා කර කියන

කාවයුතුවලට වඩා සාරාර්ථයකි නියමකර තිබීම මේ උත්තමයා දක්ක කථාකර ගිය රදළ තුමගේ ජයග්‍රහණයෙන් මොනවට ඔප්පුවේ. පෙර නිමිති නොසලකා නින්දා කරන්නන්ට මෙයද කදිම පාඩමකි.

---:o:---

යස පිළිතුරක්.

වලව්වේ මහත්මයා සහ මුදලිතුමත් යශෛශ්වර්‍ය්‍යයෙන් බරව සිටින කාලයේ, එක් දිනක මුදලිතුමාට තිබි වතුවල ප්‍රධාන වෛද්‍යකො තැන්පත් වෙද අප්පුහාමි වලව්වට පැමිණි වෙලේ වලව්වේ මහත්මයාට කථාකර "මුදියන්සේ රාලහාමි මේ පින්නේ තව තව කඳු නංවා සම්භකිරිමට යවන්නේ මේ ලැබී තිබෙන ඉසුරු මදිනිසාද" යි කාවටකම වශයෙන් ඇසීය. වලව්වේ මහත්මයා "වෙදරාළ, මාසයක් අපි රක්ෂාව නොකර සිටියොත් ගිහමනට බසින්ට වෙය. තිබෙන දේ කා කා

---

* හඳුඹෑවල රාජසුන්දර මුදියන්සේලාගේ විජය වික්‍රම පණ්ඩිත බණ්ඩාර මහත්මිතාව, හල්ඔළුවේ තෙන්නකෝන් මුදියන්සේලාගේ ගුණරතන බණ්ඩාර මහත්මිතා

සැව කාව්‍ය සහ ඊට එව් උත්තර.

වහල තද වැස්සට තෙම් මගෙ නිවස බැ උනි පොළව මිතු පි ට
අහල කිසිවෙක් නොමැති බැව ඔබ දනි මෙම දුක මිතා දිම ට
පහල රට සිට අවුත් සිටිනා සොයිස මැනිහිට මෙවග කම ට
සහල ගොඩ නොඑලා මෙපත දන්වනුය ඇවෙත විගස කාම ට

උත්තර.

පෙම් මා සපිරු නදිසය මන ර ම් මා ස
දැ ම් මා මසුරු දුගි නිති තල ව ම් මා ස
බු ම් මා නොසිඳ දන දී තුවු වෙ ම් මා ස
ස ම් මා බඹනු නරලොව එව අ ම් මා ස

නැ ණ කිව් දනට සම්වෙන කව නොබැ ත් ද ට
ගු ණ ගෝතමට දෙසා වනු නැතා දුතෙ ත් ත ට
අ ණ ජන රඳෙනු වැනි බැරි ලිය කිය ත් ත ට
පි ණ වන පවෙනු මග දුක්පත් දන ත් ත ට

බිඹ අලසව කාලය ගතකිරීම වරදය, දුක්පතුන්ට සහ යාචකාදීන්ට දෙන දීමනා සහ සියසැම්යාගේ වතුවල රක්ෂා වෙන්නන්ගේ වැටුප්ද, දිසසුනුය. යලිත් තම තමන්ගේ ප්‍රයෝජනය සඳහා සඹහකර ගැණීම අවශ්‍යය" යි පැව සිය. ඇතිදේ දිසුඹුකර ගැණීමෙහි ඇති විත්‍රයද, අනෘයන් කෙරෙ ඇති කරුණාවද, ටෙ උත්තමියගේ වචන පිටෙන් ප්‍රකාශවුන මහිමය ප්‍රශංසනීය බව කවරෙක් නොකියත්ද?

———:o:———

නවත් කදිම පිළිතුරක්.

මුදලිතුමා මොරවුවේ වලව්වේ සිටින දිනක කොළඹ ගිහෙල් සිල්වා නට වැදගත් කෙනෙක් මුදලිතුමා සඟ විටට මොරවුවට ආවේය. මොහු වලව්වට පැමිණෙන්ට සැලපවෙලාවකට මිත්තෙන් යම් කිසි උවමනාවක් පිණිස මුදලිතුමා පානදුරයට පිටත්ව ගොස් සිටියේය. මුදලිතුමා එනතුරු නවතින්ට මොහුගේ කල්පනාව හිඟුන බැවින්, වලව්වේ මහත්මයා වාඩිවෙන්ට නියමකර දවල් කෑම පිළියෙළකර දුන්නාය. මොහු කා බී සිටින අතර ලමා එකතිකොම් වලව්වේ සිටින වැඩකාර්යෙකුට කථාකර ගොඩ කට්බායක් සහ හොඳ හැට්ටයක්ද ගොඩ සබන්

කළලත ලකුණු සොඳුරුය සර ර	ම්මා ස
ම්ව ව ත පෙව කිරණි සඳ දුර දූ	ම්මා ස
වස දෙත අව රත්‍රයෙ නැත වැල පෙ	ම්මා ස
වෙව සත බුදුලි සඳහෙත් සකි අ	ම්මා ස
එ නි සා සිතුර සැපැළිණ් එ වල	ව ව ට
ගොතසා වගෙ වදන් තොප ගිස නම්	ව සු ට
ප ව සා එතතු මැතනිස සිතු ගණී	ව ඉ ට
ගොලසා සිතිට වෙනවා ඇත නර	ව ව ට

මුතනකි තවිස සත රට ලබන සිළිතුරු ලියප්ලුත් රැගෙණ ගුණරතනබණ්ඩාර මහත්මයා වලව්වට පැමිණ වලව්වේ මහත්ම යාට මෙසුවිත් දුන්නාසේලා වලව්වේ මහත්මයා මේබව බුදුලිතුමාටද දන්වා, බුදුලිත සත දුව දඩු වලින් ගොඩාකාර ගිවසක් තනාගැණීමට ගොසුට උදව් කළාහු.

කෑල්ලක්ද අතවදී වතුර නා එන්ට නියම කළාය. ඕගෙල් සිල්වා මෙය බලාසිට ලමා එතනීට කථාකොට "වැඩකාරයින්ට වලව්වේ මහත්මයාගේ කරුණාව වැඩිය ඔපමණ ආදරෙන් හැඩිව සහ සඛන් දිමෙන් දුසියන් ආඩම්බර වෙනවාට අනුමාන නැත. වැඩකාරයින්ගේ හැදීමට යම්තරමකට රෙදිපිළින් ලූණු සබඳුත් දුන්නාම් හොඳටම ඇතැ" යි කියේය. මෙය ඇසූ පින්වති අම්නාප ගහියකින් ඕගෙල් සිල්වා දෙසබලා "හැබෑවට මහත් මයා කාගේවත් අතයටට මහත්මයා දුසයෙක් ලෙස පත්වී සිටින අතර ඒ ගෙදර භාවිතාකරණ හොඳ රෙදිපිළි සබන් ආදිය සහ කෑම් බීම් ආදිය සහවාගෙණ නරක රෙදිපිළි සබන් ආදියද, නරක කෑම් බීම් ආදියද ඒ ගෙදර සාමිවරු මහත්මයාට දෙන්නම් හිත හොඳවේද ? ඒ සාමිවරුන් ගැණ ආදරය හිතේද ? අපි යම් යම් දෙයට ආශාවෙමු නම් වැඩකාරයාත් ඒ දේ වලට ආශා ඇතිබව මෙපමණ වැඩිමහල් මහතෙකුට තේරුම්ගන්ට බැරිවුනාට කන ගාවුය. තවද හොඳ දෙයින් තමන් සහ දරුවන් හැකි විදිමින් නරකදේවලින් වැඩකාරයින් සතුටුකිරීම කොප මණ අකුසල්ද ? වැඩකාරයින් අකීකරු වෙන්නේ හොඳ දේවලින් ඔවුන් සලකනවාට නොව නරකදේ වලින් ඔවුන් සනසන්ට කරණ වරදවූ මසුරුවූ නීතිය උත්සාහවලින් බවත්, අසරණ ඔවුන්නේ විවේකා දිය රොග ජිඩාදිය, මනාප අමිනාපාදිය, ඔනෑ එපාකම් ආදිය ඉඟ නොකොට වදකරුවාට අසුවූ අයවලුන්ට මෙන් මර මරා වැඩ පමණක් ගෙණ යම්තමකට කුලියක් දී ඔවුන් සනසන්ට කරකියන බොරු උත්සාහ නිසා බවත් කල්පනා කිරීම සත්පුරුෂකමක් බව මම දනා මගේ වැඩකරුවන්ට මා ප්‍රිය දෙයින්ම සත්කාර කරමි" යි පැව සිය. ඕගෙල් සිල්වා මේ කථාවගැණ තුෂ්ණීම්භූතව සිටියා පමණක් නොව තමන්ට මෙවෙනකුරු ඉගෙණගන්ට නොලැබුන කදිම පාඩමක් ඉගෙණගත්ට ලැබී, මේමෙතුමිලි පිඹුරෙකුගේ මුදලිතුමා එනකුරු කරබා හුන්නේය.

මෙබඳු ගුණවත් උත්තම මැට මෙසා මහත් යසස් ලැබුයා මදවාම්ස වැඩියක්ව පෙණේද? මෙසේවූ ස්වාමි දූන් සටතට පැමිණෙන දුසි දුසාදීහුද පින්කලහු නො වන්නෝද ? හොඳ නොහොඳ නොදන්න අහඞ්කාරයෙන් දූසි දූසුන් නොසලකා ක්‍රියා කරණ මන්‍දබුඩි පූරුෂයින්ට සහ ස්ත්‍රීන්ට මෙය කොපමණ අගනා පාඩමක්ද?

———:o:———

රැකසුරැවම්කම.

———

තවත් දිනකදී වැදගත් මහතෙක් මොරටුවේ වලව්වට පැමිණි කල, වලව්වේ මහතා උඩ රට යාම පිණිස බුලත්, පුවක්, ඉඟුරු, සුදුළූනු, ආදිය පොදි බඳිනවා දැක "උඩ රටින් ඔය ද්‍රව්‍ය ඕනෑ පමණ ගැණීමට පහසුව තිබියදී මෙහෙ සිට ඕවා උස්සා ගෙණ යන්ට සූදානම්වෙන්නේ මක්නිසාද" යි ඇසිය. වලව්වේ මහත්මයා ඔහුට කථාකොට "මෙකී ද්‍රව්‍යසන් මෙහි නැතිවෙන්ට හැර දමා ගොස් උඩ රටින් මුදලට ගැණීම ශාපයක් වෙන බව නොදන් නෙහිද? තඹසල්ලියක දෙයක්වත් විසි කිරීම වරදක්වා පමණක් නොව ඒ වෙනුවට අමුතුවෙන් තඹසල්ලියක් වියදම් කිරීම විනාශයට මුල බව තේරුම් ගෙණ තිබෙන නිසා මේ මාර්ගෝපකරණ යන ගමනට ගෙණ යන්ට සූදානම් කරමි. ඒ ඇරත් මගදී අඩිසියක් සිදුවුන කල තුරුල්ලේ තිබෙන මෙකී ද්‍රව්‍යයන් ඉතා ඉක්මනට උපකාර වෙන බව දනිමි" යි පැවසිය. මේ පොදිය බඳින කාලයේ මේ පින්වත් ධන සම්භාරයෙන් පූර්ණව සිටි කාලයය. මෙවකට මෝතොමෝ **ලමාඑතනි** යන ගරු නාමයෙන් ප්‍රසිඩ තැනැත්තියකි, නමුත් ලමාඑතනි කමත් ධනවත් කමත් අහකින් තබා **රැක සුරැවම් කම** රක්‍ෂා කර තිබෙන මනිමයද, එවකට පැවතුන සිහි නුවණද, මෙයින් යසසේ ඔප්පුවීම බොහෝ ස්ත්‍රීන්ට කදිම ගුරු නමක්ය.

පැදුරු විසන්නිට දුන් ධෛර්‍යය.

මොරවුවේ වලව්වේ වැඩකාරියක්ව සිටි අසෝ නමැති මධ්‍යම වයසේ ස්ත්‍රියක්, ඉතා ලාභ්‍ය පැදුරක් විසා වලව්වේ මහත්මයාට නැඟිකලාය. පැදුර නා නා වර්ණ සායවිකල පන්වලින් විසනලද්දකි. මැගේ මිනිබිරියන්ට කියාහැර සායවිකල පන් ගෙන්වා මේ පැදුර විසා නිමකලාය. පැදුර ඉතා අගයට විසා තිබුන හෙයින්, ඒගැන් වලව්වේ මහත්මයා මැගෙන් කාරණා ඇසුවාය. මැගේ මිනිබිරියන් පැදුරු විසමනට දක්‍ෂියන් බවත් පැදුරුවිසා විකොට රූකෙණ බවත්, සායම්ආදිය ගන්ට මුදල් අත තිබෙනම් ඒ තැනැත්තියන්ට සහ මෑවත් මිටවඩා ලාභ්‍ය පැදුරු විසන්ට පුළුවන් බවත් කිවාය. එකල "නවදුරවත් මේ ශිල්පය දියුණුකර ගැන්මට උඹේ මිනිබිරියන්ට සහ නුඹවත් නෑන්ගක් දෙමිය. එය උඹ සහ මිනිබිරියන් අනුරේ බෙදු ගන්නැ" යි කියා වලව්වේ මහත්මයාගේ රාකසුරුවම් කමින් එකතුකරගෙණ සිටි මුදලින් පවුම් හතරක් අසෝ අතට දුන්නාය. පින්වතියේ මේ පරෝපකාරය කරණ කොටගෙණ ඔවුන්ට මහත් ධෛර්‍ය ලැබී පැදුරු විසම නෙන් දියුණු භාවයට පැමිණුනාය. උත්සාහයට ධෛර්‍යදීම මහත් උත්තම චර්තයක් හෙයින් මෙම පුණ්‍යවන්තියේ සත්ක්‍රියා අනුව යම් ස්ත්‍රියක් යා නම් ඈවද මහත් යහපත සිදුවෙනු නිසැකය.

———: o :———

කොස් ව්‍යඤ්ජනය.

කිරිබණ්ඩා ගිවපු කෝරාල දිනක් හතුරන්කෙත වලව්ව සමීපයෙන් යනකල, ලොකු කොස්ගහක් අසල වලව්වේ මහත්මයා සිට කෙනෙකුලවා එම කොස්ගහේ කටුබන්දවනවා දුටුවේය. කෝරාල එහි නැවතී වලව්වේ මහත්මයාට කථාකොට, "කොස්ගෙඩිවලට අහගහන

කෙනෙක් මෙහේ නැත, කුමකට ඕවා ප්‍රවේශම් කරණවා ද"යි ඇසිය. වලව්වේ මහත්මයා සිනාහාවී "කවුබැන්ද වීමේ වත නිලමෙට දකින්ට ලැබෙය"යි කීවාය. මෙම කථාවෙන් පසු කෝරාළ යන්ට හිඳේය. එක දිනකට පසු එම ගසින් කොස් නෙලා කොස්මදුලු බැද සකිරා මුසුකොට ලොකු විහාරක බහා මෙම කෝරාළට තෑගිවශයෙන් යැවිය. තෑගිලැබූ කෝරාළට කොස්ගහේ කවුබැන්දිමේ කථාව සිහිවී එවෙලාවට වලව්වේ මහත්මයාට සතුකොට යවා, එකරිකිල්ලේ පලගත් කොස්ගෙඩි දෙකක් රිකිල්ලන් සමඟ නෙලා එකක් අම්ගෙඩිය හිටින්ටත් අනික නොකපා වෘක්ෂකොටත් ලොකු තැටියක තබා වලව්වෙමහත්මයාට තෑගිකැවිවේය. වලව්වේ මහතා ඊට සතුකොට මුදලි තුමාවත් මේ බව දන්වා මේ වෘක්ෂයත් සමඟ ආහාර ගත්කල, එම වෘක්ෂය ඉතා රසවත්වූ වෘක්ෂයක් බව වැටහී, කෝරාළ ගෙන්වා එය පිසුආකාරය ඇසුවාය. "එක රිකිල්ලේ පලගත් කොස්ගෙඩි දෙකක් රිකිල්ලන් සමඟ ගෙන්වා රිකිල්ලෙන් එක කොස්ගෙඩියක පිටකවූ කොඳහැපි පැහැදමා දුරුවන් අඹිරා කොඳු (ඒඳු) ලිපනවා පමණක් පැසුනකල රුගෙණ, ගින් කුරකින් (ගාර්පුව) කොස් ගෙඩිය තුලට එකී දුරුසුස කොඳහැපි කවා (බහා) අනිත් කෙසෙල්පිති කොඳහැපි බැඳ, උයන ගෙඩිය බදනක බහා තුයන ගෙඩිය බදන උසප්‍රමාණයට යමක්මතු තබා බදන විසා කොඳහැපි කටබා නෙල් ඉසෙනකල ප්‍රවේශමෙන් ගෙඩිය පෙරළා තව වරක් බදනේ ගෙඩිය තිබ්බයදීම එම බදනේම පැසුන දුරුසුස (බොර) ගෙඩිය තුලට කුර කින්ම කවා ඉතා රික වේලාවක් බදනේම තිබෙන්ට හැර ගැණ්මෙන් මෙම වෘක්ෂය පිසිය හැකිය"යි කියා දුන්නේය.

වලව්වේ මහත්මයා මෙය පරීක්ෂාකරමැයි සිතා කෝරාළ ගෙන් වැඩිදුරටත් කාරණා අසාගෙණ ඊට පසු දිනම එකරිකිල්ලේ පලගත් කොස්ගෙඩි දෙකක් සොයවා ගෙණ

මෙම ව්‍යඤ්ජනය පිස ඉගෙණ ගත්තාය.* මේබඳු පිසීම් ආදිය ගැණ සමහර ස්ත්‍රීහු නොසලකා සිටිතත්, එහි අගයදන්නියෝ මෙබඳුදෙය පැහැර නෑර දැනගැණීමට සතුටුවෙත්. මෙය කියවන පුණ්‍යවන්තියෝ මෙම උත්තමිය ගේ මෙබඳු උත්සාහයන් ගැණ ප්‍රියව අතවපත් හොඳ දෙය ඉගෙණ සතුටුවෙතැයි සිතමු.

———:o:———

පුසුලවැල් පෙට්ටිය.

වලව්වේ මහාත්මයාගේ බෙහෙත් කාරකය පුසුලවැලින් වියනලද පෙට්ටියක්ලු. එම පෙට්ටිය කට්ටි කීපයකින් යුක්ත එකක්විලු. එහි බෙහෙත් තෙල්වගී අඩංගු කුඩා වීදුරු බෝතල සහ ඇතැම් කට්ටිවල සුදුලූනු, අමුඉඟුරු තිප්පිලි, ගම්මිරිස්, වසවාසි, සාදික්කා ආදිය පුරවාගෙණ තිබුනේලු. තවත් ඇද්දත් සහ රිදී පෙට්ටිවල බෙහෙත් ගුලිබහා එම පෙට්ටි මෙ පත්පෙට්ටියේම අසුරාගෙණ තිබුනේලු. මුදලිතුමා වලව්වේ නැතිවිට හෝ කොළඹ ආවිට හෝ රෙගයක් කියා කිසිවෙක් ආකල, දුරබැහැර වැඩිනම් නොගොස් රෙගලක්‍ෂණ අසා පුසුල වැල් පෙට්ටියෙන් බෙහෙත් ගෙණදී ඊට යොදන අනුපානද කියා පිටත්කරවන වාලු. වලව්වට සමීප තැනකනම් මෙම උත්තමිය පුසුල වැල් පෙට්ටිය සුරතින් රැගෙණ එහිගොස් රොගාතුරයා බලා තමන්ට වැටහෙන ප්‍රමාණයට සුදුසු බෙහෙත් තෙල් ආදිය දීමෙන් සහ අසරණවන්තාව සිටින්නන් බව දැනගත් කල මුදල්දදී එනවාලු. බොහෝවිට වලව්වට්ම ඇවිත් රෙදි සහ වෙනත් එම රෝගියාට උවමනාදේ යවනවාලූ මෙ

* ඉවම කෝරාළ හඳුරන්සොත, "සැකසිමේ හිවසේදී" සමිතව මෙම ප්‍රවෘත්තිය සහ වෙනත් මුදලිතුමගේ සහ වලව්වේ මහත්මයා ගේ ගුණ රාශිය ගැණ පවසා වර්ණනා කෙළේය. පමණක් නොව අප සමයකාල සාතවර්ගයෙන් ඔහු ශුපගාපයෝජ්‍ය දැන ඉගෙණ සිටින්නෙක් බවද වැටහින.

වලව්වේ මහත්මයාගේ මහත් කරුණාව නිසා සහ උදව් නිසාත් බෙහෙත් ගත් බොහෝ රෝගීන් ඔත් සතුටු කර ගැණ්මෙන්ම ඉක්මනට සුවපත් වෙනවාපු. මෙය අප සමඟ යි * කිරිඑතනා නොයෙක්විට ඈට පැමිණි රෝගයන්ගෙන් මිදුනේ වලව්වේ මහත්මයාගේ බෙහෙත්කිරීමෙන් බවද කියා දිවිලාය.

———:0:———

තරුණියන් තිදෙනෙකුට කළ උපකාරය.

මීපේ උක්කුනට ඕනිහෙකුගේ දියනිවරු තිදෙනෙක් සිරුප්පේ සිටියෝය. උක්කු හැමදෑම මුහරෝගයෙන් පෙළෙන්නෙකි. උක්කුගේ භාර්‍ය්‍යා හතුරන්කෙත වලව්වට පැමිණ වී කොටාදීමෙන් සහ වෙනත් වැඩපල කරදීමෙන් දියණිවරුන් තිදෙනා සහ සැමි පුරුෂයත් රක්‍ෂාකරන්නීය. මෙසේ කලයවනාතර මේ මහළු ස්ත්‍රිට අඩස්සියක් සෑදී මරණාසන්නවිය. මේ කාලයේ ප්‍රේම්ස් ද සොසියා මුදලිතුමා කොළඹ පැමිණ සිටියේය. මේ අසනීපය දැන ගත් වලව්වේ මහත්මයා මුදලිතුමාගේ ශිෂ්‍ය කිරිහාමි හෙන්වා සිරුප්පේට පිටත්කළාය. කිරිහාමි උක්කුගේ නිවසට පැමිණි කල රෝගකාරීගේ ලක්‍ෂණ ඉතා අසාධ්‍ය බව දැක බෙහෙත්කිරීමට ඕනෑ නැති බැව් සිතිය. සුළුප වේලාවක් රෝගකාරිදිහා බලා සිටිනවිට, රෝගකාරී දැන එකතුකොට වැඳ දුවරුන් ලඟට කැඳවා අත් තුණ් අල්වා "වලව්වේ ස්වාමිදුරුවෝ" කියා නිශ්ශබ්දවිය. කිරිහාමි කොඳට කිව්වුව් බැලුකල රෝගකාරීගේ ප්‍රාණය හැඟවුන බව දැන, වහාම හතුරන්කෙතට පැමිණ සිදුවුපරිදි වලව්වේ මහත්මයාට කීවේය. වලව්වේ මහත්මයා උවමනා

---

* මෙම කිරිඑතනා ඉතා වසස්ගත සත්‍රීයෙකි. ඇගේ වසස සීසන්ට ඇ කොදුත් බවත්, මුදලිතුමාට හිල ලැබි හතුරන්කෙතට එන කාලයේ මැ දිගහොස් දරු දෙදෙනෙක් ඇතුව සිටී බවත්, මේ උපතවිය ඇ දුටු බවත්, එහි වණනාත්, හිම වසිව ගැණුත් කොර තුරු අප සමඟ කීවාය. මැ මෙවිකට පසිඳුව සිටියේ කැවිවලය.

වියදම පළමුව එහියවා මෑතදෙහය වළලන්ට ප්‍රථම එහි ගොස් දුක්වී දුවරුන් තුන්දෙන පෙළුම ඇති තරුණියන් නිසා ඒ තැනැත්තියන්ට යම් අනතුරක් සිදුවූවොත් වරද බැව් සිතා පමණකුදු නොව අනතිමසේදී දුවරුන්ගේ අත් හෙණ කී වචනයත් සිහිකොට මෑතදෙහය වළලෑමට ගෙන් පිට ගත්කල තරුණියන් තිදෙනාත් සමග වලව්වට පැමිණියාය. උක්කු සුවපත්කිරීම සඳහා මහනුවර ආරෝහ ශාලාවට යැවිවාය. දෙමසකට පසු උක්කු එහිදී මලේය. මව්පිය දෙදෙනාගෙන් වියෝගවූ මේ තරුණියන් තිදෙනා තම දියනිවරුන්මෙන් රැක බලාගත්තාය. මුදලිතුමා කොළඹ සිට පැමිණිකල මේ සියලු පුවත් කිවාය. මුදලිතුමා ඒ ගැන අතිශයින් ප්‍රශ්නනව වලව්වේ මහත්මයාට කථාකොට "මම ඉස්සර වුනොත් මා යන තැනට උඹ එනවා ඇත. උඹ ඉස්සර වුනොත් උඹ යන තැනට මම එනවා ඇත. කොහොමවුනත් අපි දෙදෙනාට පරලොව සැප වරදින්නේ නැහැ" යි කියා සිනාහවුනේය. පස් මාස යක් යන්ට ප්‍රථම මෙම තරුණියන් * තිදෙනා මිරුළ්පෙට වැඩුම්ලිද, රත්ගේනට මද්දුම්යද, මතුරටට බාල තැනැත්තියද, පතා සිය සිය දායාදත් සමග දිග දෙනු ලැබූහ. මේතුන්දෙනම මේම උතුම් දෙනම හඟරන්කෙත සිපින තුරුම් සිංහල අවුරුදුකාලවල කත්මළු බැඳ වලව්වට පැමිණ මුදලිතුමා සහ වලව්වේ මහත්මයා බැහැ දැක තෑගි හොග ගෙණයනවාලු. †

---

* මේ තුන්දෙනා දැනට ඊසගොස් සිටින බවත් බාල තැනැත්තිගේ දියණියක් පසුගිය පෙළහර කාලේ මහනුවරදී නිරී එහනාට සමිහවූ බවත් අප සමග කිවාය.

† මනුෂ්‍ය සිත් විපර්යාසවන හෙයින් කුසල චිත්ත මෙම උතුම් සුවලඟෙන් සිදුවී නිබෙන බව මෙම පොතෙන් පෙණෙන්නේවි නමුත්, මේගැණ වැඩිදුර පරීක්ෂාකරණ අවස්ථාන් උවරට පැමිණි හොතෙක් දුෂ්කර ස්ථානවල පවා අපගේ ගමන්ක්‍රීමෙන් දැනගන්වලැබුණ කරුණුත් සහ එහි වාසි වශයොවාඛ උපස් උතුමන් ද හොයිසා පවුල් තැණ් (විශෙෂවශයෙන් මෙම උතුම් දෙපල තැණ්) හරිණුලද මහත් විස්තා

සුරතලාගෙ ප්‍රවෘත්තිය.

වලව්වෙ මහත්මයා නුවර කොටුගොඩැල්ල වලව්වේ සිටින කාලයේ කකුලේ භයානක ව්‍රණයක් ඇති සුරතලා නම ගැටයෙක් මගයනු දැක, ඔහු කැඳවා ඉතා ආදරයෙන් කථාකර වණය සුවකර අරිණතුරු නැවතෙන්ට කීවාය. සුරතලා ඊට කැමතිවූකල, වලව්වේ පැත්තක කාමරයක් නැවතීමටද් වලව්වේ මහත්මයා ස්වාමිපුරුෂයාගෙන් දැන සිට බෙහෙතක්තනා වණය කුණුකැපෙන්ට දැමුවාය. සුරතලා වේදනාව ඉවසාගත නොහී ඒ වේලේ පටන් පසුවද වන තුරු කෑගහන්ට පටන්ගත්තේය. ඒ කාලයේ කීපවිටක්ම වලව්වෙ මහත්මයා අවදිව අවුත්, සියඅතින් කෝපි සූදානම්කර බොන්ට දීමෙන්ද නැලවිලි කථා කීමෙන්ද යම් තම එලිකරගෙණ, උදය වතුර උණුකරවා සුරතලා එලියට ගෙණ මොරදෙද්දීම වණය සියඅතින් සෝදා එය නෙත මාත්තු කිරීමට රෙදි පාංකඩ කැබෙල්ලක් ගෙණඒම සඳහා වලව්ව තුලට ගියාය. මෝඩ සුරතලා වේදනාව ඉවසාගත නොහී අත්දණ්ඩත් රැගෙණ "වලව්වේ මහත්මයා වණය රිදෙව්වාය" යි බැණ බැණ පැන පැන යන්ට ගියේය. බැණීම ගැණ කිසිම තරහක් හිතට නොගෙණ සුරතලාගේ පැන යාම ගැණ ශොකකරමින් ඔහු සොයා අල්ලා ඒමට මිනිසුන් පිටත්කර යැව්වාය. තෙදිනක් පිට පිට මිනිසුන් කීපදෙනෙක් මුළු මහනුවර ඇවිදවා, සතර වෙනි දින ඈතවූ කැලේදී ඔහු අල්වා ගෙන්වා ගත්තාය. මෝඩ සුරතලා "වණය සුවකිරීම කමක්නැත යන්ට ඕනෑය" යි කී නමුත් ඔහු

සත ඔවුන් විසින් දුන් ඔසවා අනුමෝදනා කරණ පින්ද, "පොළව මැස සිටින දේවතක්ස, දෙව දූවක්ග, රාජාධිරාජසිංහ රජුස, ඒ දේවත්තාගේය," යනාදී ශබ්දද එයේකයි සාප්‍රමම කීය නොහැක් නමුත් ඉතා ශුවණින් නොසිනා පනකලපුත කරුණු නොවන බව අපට වැටිනී සීගේන. සාලිත සත් පුරුෂ දෙදෙනෙක් මෙලෙ මෙම සිරිලක ඇතිවෙත්නම් ලාඩකින ජනතාවට එය සම්ප්‍රකාරයෙන්ම උතුම් මඞ්ගලයක් වෙනු නිසැකය.

නෑර බලාත්කාරයෙන් වණය සෝදා බෙහෙත් දමා කාවර යකබහා මුරකාරයෙක් තැබුවාය. මෙසේ දෙමසක් පවණ සිසයින් වණය සෝදා සිසයින් බෙහෙත් යෙදීමකොට සම්පූර්ණයෙන් වණය සුවකොට මරණයෙන් බලතා රක්ෂාවක් කරගෙන ජීවත්වෙන්ටය කියා ගන්ට හැරියාය. සුරතලා කථානායකර ගොස් ඉන හැඳහිබුන එකම සරොම් වික්‌ණා බුලත් පුවක් දුම්කොල රැගෙන පිටපටය පිපින් එදිනම එක වේලාවකට පසු වලව්වට පැමිණ බුලත් පුවක් අතට නොදී වලව්වේ මහත්මයාගේ දෙකකුලේ පිපපතුල්පිට තබමින් දෙහොත් මුදුන්දී වැඳවැටුනේය. වලව්වේ මහත්මයාට මේ වැඳීම දරන්ට බැරිව කඳුළු වගුරුවමින් සුරතලාගේ අත්දෙක අල්වා නැගුවුවා සරම් මක්වුනාදැයි ඇසිය, සරම් පණම් හයකට වික්‌ණා බුලත් පුවක් ගෙණ බව කියමින් එදා හිත නරක්වෙන වචන කියා ගියාට සමාවක් යදිමින් නැවතත් වැඳවැටුනේය. වලව්වේ මහත්මයා සුර තලා කළගුණ දන් යෙණෙක් බව තේරුම්ගෙන සරමක් සහ ලේන්සුවක් තෑගිදී රක්ෂාවක් දීමට හතුරන්කෙන චත්තට පිටත්කර යැවිවාය. සුරතලා ඉතා විශ්වාසලෙස චත්තේ රක්ෂාවේ යෙදී සිටින අතර, උණක් සෑදී ඊට පස් අවුරුද්දකට පසු මියගියේය. මග ගිය වණකාර සුරතලා වලව්වට කැඳවා ධන සහ යස වෙහෙසමින්ද නිදිමැරී මෙන් සහ බැඹුම් ඇසීමෙන්ද එකම සුරතලාට කළ කි මහොපකාරය අනිශය ප්‍රශංසනිය නොවේද? අහෝ! මෙබඳු කරුණාලක්‌ණ ක්ෂීරයෙන් ලොකසාධයා සන්තාපී ණය කළ එකම මානවයන් වැනිවූ මෙම උත්තමිය එකල ජීවත්වූවන්නේ පුණ්‍ය මහිමතාවය හේතුකොට ගෙන පහලවුවාක්දෙහොයි හැඟිමි.

මෙපරිද්දෙන් දිවා රෑ දෙක්හි ප්‍රමාණාතික්‌රාන්ත කුසල ක්‍රියාවෙහි යෙදී සිටි මෙම උත්තමියට, මුළු ජීවිත යේදී නොලැබුනාවූ භොරතර දුක්කාලයක් හදුරුව සිටියේය. ඒනම්:—තමන්ට ඉතා ප්‍රෙම කලාවූද, මහත් ධන සම්භාරයක් අත්කර දුන්නාවූද, එසේ මෙසේ මනුෂ්‍ය

ලියක් නොලබන සැප ගෙණදුන්නාවූද, සඬකිය සඬාම් පුරුෂයා කථාශෙෂතාවොපගතවීමෙන් වියොග දිවට සිදු වීමය. සඬාම් පුරුෂයාගේ මෘත දෙහයට කළයුතු සියලුම හෙරෙව ඉහටකිරීමෙන්ද ඒ නාමයට දැන ධර්ම කිරීමෙන්ද තවදුරටත් කුසල ක්‍රියාවෙහි ඇලීමෙන්ද, එකම පුත්‍රයාගේ දියුණුවට කටයුතු කිරීමෙන්ද, වතුපිටි ගව මහිසාදි දේපල රැකබලාගැණීමෙන්ද කාලය පසුකිරීමට පටන් ගත්තාය.

පුරුෂයාගෙන් වියෝගව මෙසේ කාලය ගතකරණ සමයෙහිම, තරුණ පුත්‍රයාට කුලහනක් ගෙණ දෙන අද හසින් ඒ ගැණිද ක්‍රියාකලාය. මඬගල්‍ය කිපයක් ගැණ කාරණා පැමුණුනේවී නමුත් අනත්තියේදී ඉරුට චන්ද්‍රයා සංයොග වූනාක්මෙන් පුත්‍රයාට සෑහෙන පුණ්‍යවන්ත කනාවක් ලැබී ප්‍රිතියට පත්ව ඒ මඬගල්‍යොත්සව කටයුතුද මොනවට ඉවුකලාය. මීට පසු ගෘහස්ත කටයුතුවලින් තමන් ඕදුනාය යන අදහස පෙරවුකොට නොප රක්කුව වඩ වඩා කුසල ක්‍රියාවල යෙදීමෙන් දවස් පසු කරමින් සිටින අතර, වයොවෘඬකම නිසා රොගාතුරවූවාය. සුත්‍ර මහතා සහ සෙහෙලිනිය ප්‍රධාන බඹුමි වගියා විසින් වෛද්‍යයන් ලවා නොයෙක් ආකාර උත්සාහ ගෙණ සුව කරගැණීමට පරිශ්‍රම දුරුවේවී නමුත්, මාරයාට හිමි මාසිවට ඇතුල්වූ හෙයින්, ඒ සියල්ල නිෂ්ප්‍රයොජනවී 1882 මාර්තු මස 16 වෙනි දින සියලු යසෛශ්වර්‍ය්‍ය සහිත දරු මුනුබුරු කැමදෙනාට සහ මුළු ලඬකා වාසින්ට මහත් දුක් දෙමින් මොරවුවේ වලව්වේදී රෑ කාලේ ජම්මානන්තරගතවූනාය.

තවද මේම වලව්වේ මහත්මයාගේ ප්‍රාණජීවය හැඟ වෙන්ට තත්පර ගණනකට ප්‍රථම වෙතුම් ආදරයෙන් සැලකූ ගෙයි වහල එක්කම හිඹුන කුන්දිරා පොල්ගහ මුලින් ඉහිලි වහලට ගෙත්තුඩුනේය. අපූරුවකට මෙන් වේ නිසා වහලේ එකම උළුකැටියක්වත් නොබිඳුනේය.

මෙම උත්තමිය දුක අනයිම සඞ්ග්‍රහකිරීමට නොයෙක් දිශාවලින් මහජනයා රැස්වෙන්ට පටන්ගත් බැවින් මෘත දෙහෙය දහඅට (18) වෙනි දින දක්වා තබන්ට සිදුවිය. නොයෙක් ගුණාඞ්ගයන්ගෙන් පරිපූර්ණ සිටු දේවියෙකුට සමකළ හැකි මෙ උත්තමියගේ මෘතදෙහයට, රජ බිස වෙකුට ලැබෙන ගෞරව පරිද්දෙන් ගරු බුහුමන් ලැබෙන්ට පටන්ගත්තේය.

වෙළුඳ ජනයා සල්පිල් වසා කළුකොඩි ඇද තම තමන්ගේ දුක ප්‍රකාශ කළෝය. නොයෙක් පලාත් වලින් මෘත දෙහයට ගෞරව වශයෙන් මල් මාලා ගොතා එවන්ට යෙදුනේය. නොයෙක් පලාත්වලින් දුක් ප්‍රකාශිත විදුලි පණිවුඩ එවීමටද පටන්ගත්හ. අතපත්තු සහ ගාර්දියේ නේවාසන්න පිරිසද ඉංග්‍රීසි පඤ්ච තුයඞ්ද, සිංහල සිඞ්ගාර පඞ්කතිද, නොයෙක් තරාතිරමෙ ජනයා හාරදහකට වැඩි ගණනක්ද, කුඩ කොඩි ධ්වජ ආදිය සහ එඞ්ගලන්ත සභාවේ ලක්ෂණ කොඩිය සහිතව අවමඞ්ගල්‍ය පෙළහර වලව්වෙන් පිටත්විය. දුටුවන් සතුටු කරවන අසුන් සතරදෙනකු යොදන ලද රථයේ මෘතදෙහය බහාලූ පෙට්ටිය තබා ඒ පෙට්ටිය සියගණන් මල් මාලාවලින් සරසා තිබුනේය. එදින මොරටුවේ පාඨශාලා බොහොමයක් වසා මේ උත්තමියට ගෞරව වශයෙන් නිවාඩු දිනක්කොට බොහෝ ලමයින් කැටුව ඒ ඒ ගුරුවරුද පැමිණ අවමඞ්ගල්‍ය පෙළ හරට එක්වූහ. වලව්වේ මහත්මයාගෙන් අනන්තාප්‍රමාණ උදව් ලැබූ දහස් ගණන් දුක්පත් ජනයා මග දෙපස සිට හිස අත් බැඳ ඉකිබිඳ හඬමින් තමතමන්ට හැකි හැකි අන්දමින් ගෞරව කිරීමට පටන්ගත්හ. මොරටු අඞ්ගනී එකම කළු රෙද්දකින් සැරසුනාක්මෙන් මෙදින මොරටුවේ සකල සිරි වසා අඳුරු කළාය. පියෙන් පිය ගමන් කිරීමෙන් ශුඩ එම්මානුවෙල් දෙව මඤ්දිරය සමී පයට මෙ පෙළහර සම්ප්‍රාප්තවූ කල, දහස් ගණන් සේනාව ඉවසිය නොහැකි දුකට පත්වූහ. මිනී පෙට්ටිය දෙව මඤ්දිරය තුළට ගෙණ ඒව පිළිවෙළ තර තිබුන ආසනය

පිට තබා කොපල්ස්ටන් බිහොප් ඩාම් සහ හෙන්. ඒබ්‍රහම් ඩැන්දිස් සඩදෙකික දෙවහැතිතුමා (කොලෝනියල් චැප්ලේන්) ප්‍රධාන දෙවගැතිවරුන් දස දෙනෙකු විසින් මිළවුන් ගුම්දහකිරීමේ මෙහෙය පවත්වන ලදින්, මෙම දෙව මැදිරිය තුළ තම ඩාම් පුරුෂයා කැන්පත් කළ බිනි වළේ වාම පාර්ශ්වයෙන් කැන්පත් කළාහ. මුදලිතුමා ගේ මෑත දෙහය බහාලූ පෙට්ටියද දහනව අවුරුදු නව මස් දිසි දවසකව (අ. 19. මා. 9. ද. 20) පසු විවෘතකරණ ලදුව, එතුමාට අන්දවා තිබුන වාසල මුදලි කබාය එදින ඇන්දු වාක්මෙන් නොදිරා මේ වනතුරු තිබුන බැව් දුටු මහත් සමූහයා මවිතවූහ. පුත්‍රවූ චාලිස් හැන්රි ද සොසියා මහතා මෙතුමාක් ප්‍රිය මවගේ සෙවනේ සිටි නමුත්, මෙදින එයින්ද ඉවත් වෙන්ට සිදුවිය. අහෝ ! ගුණ නුවණින් අග කැන්පත් ආදරවන්නා මෑතියන්ගෙන් මෙදින වෙන්වෙන්ට සිදුවුන මේ පුත්‍රයාගේ එවකට පැවති දුඃඛිත භාවය කෑණ කියතුම කවරේද.?

සිහි නුවණැති කිනියිමත් ධනවත් ඩාම් පුරුෂයෙක් ලැබිමෙන්ද, එසේම පතළාවූ කීනියි ලතාවක් ඉසුලූ පුත්‍ර රත්නයක් ලැබිමෙන්ද, එකම පුත්‍රයාට භාර්‍යාව හොට ධනවත් සුචරිත පින්වත් යෙහෙලියක් ලැබිමෙන්ද, පුණ්‍ය ලක්ෂණයන්ගෙන් භ්‍රාජිත මුතුබුරන් සහ මිනිබිරියන් ලැබිමෙන්ද, බයින් වයින් සහ ධනයෙන්ද, වෙනත් නානාවිධ මිනිසුන්ගෙන්ද, දහස් ගණන් දුක්පතුන් සන්තර්පණයකිරිමෙන්ද, තෘෂ්ණාතලෙස ලොකොපකාර වැඩ ගැනී ධන පරිත්‍යාග කිරිමෙන්ද, පරලොව වැඩ සඳහා මහත් කුසල ක්‍රියා කිරිමෙන්ද, අන්තිම කාලයේ දරු මුතුබුරු ඤාති මිත්‍රාදීන්ගෙන් නිම නැති ගරු සත්කාර ලබනය කරමින්ද සිට, කර්‍මාශෙෂයාවොපගතවූ මේ උත්තම්ය සමාන උත්තම්යන් ලොව ඇතිවීම අභාවයි නෙඛින් මේ උත්තම්යගේ සුචරිත ක්‍රියා අනුව යම් සත්‍රියක් ගමන් කෙරේ නම් ඈ වාසනාවන්තියක් බව කියාමිහ.

PART V.

GATE MUDLIYAR,

SUSEW De SOYSA.

—:o:—

පස්වන අදිකර.

සුසෙව් ද සොයිසා

වාසල මුදලි තුමා.



SUSEW DE SOYSA, ESQ., GATE MUDLIYAR.
සුසෙව් ද සොයිසා, වාසල මුදලිතුමා.

මෙතුමාගේ සුළු පියානෝ.

HIS UNCLE

සොප් ද සොයිසා

මහතාගේ අටවෙනි දරුවාවූද, ප්‍රෝත්ස් ද සොයිසා වාසල මුදලි මහත්මයාගේ පස්වෙනි සහෝදරයාවූද **සුසෙව් ද සොයිසා ගුණවර්ධන විපුල ජයසුරිය කරුණාරත්න දිසා නායක වාසල මුදලි මහත්මයාගේ** මෙතුමාගේ සුළු පියා හෙවත් බාප්පාය. උපන්නේ ක්‍රිසතු වසි එක් දහස් අටසිය නවයේ පෙබරවරි මස පස්වෙනි (1809. පෙ. ම. 5.) දින මොරටුවේදිය. මෙතුමාට කුඩාකාලයේ ගෙදරට ව්‍යවහාරකළ නාමය **සාමෙල්ල** සාමෙල් පළමුකොට ව්‍යවහාර සිංහල (සංස්කෘත) හෝඩිය ඉගෙණගත්තේ මොරටුවේ පල්ලිය ගොඩැල්ලේ විහාරස්ථානයේ මැද්දේගම සුවිරයානන්ගෙන්ය. කඩිසරකමත් නිර්භීත කමත් එක සමානව මේ ලමයාට ඇතුවකිය නිසා, වැඩුණකල උසස් භාවයට පත්වන්නේය යන විශ්වාසය එවකට මොරටුවේ සිටි වැදගත් නුවණැත්තන්හුගේ පැවතිණේය. පාන්දුරේ දුනට රන්ගොත් විහාරස්ථානය නමින් ප්‍රකට එවකට ගල්

වලේ පන්සලේ වැඩඉඳිය ඇතළුවේ ගුණරතන මහා ස්ථවිර ඉටපොල කලාණගියාය සථවිර යනු මහා ස්ථවිර දෙනමගේ ප්‍රධානත්වය පිට පැවැත්තු පිරිත් ධර්මදේශනාවේදී, දහඇවිරිදි වයස්වූ ටෙ ලමයා ඉතා දැහැලෙස එහි දෙරකඩ අස්නය ගිනෙන් මෙකී විඥාඝය ගුහක් දුරට එත්තු ගියේය එසේම කුඩා කාලයේදී මොනු තම පලලේ කිසිවෙකු හරුහොකොට ක්‍රියාකර නිබෙන බවද ඔප්පුවෙ.

අකුරුකරවාගෙණ පන්සලේන් ගෙදර එනඅතර පවා, අයින් ලමයින්ට ප්‍රථමයෙන් එමටද දුවඑන අතර පළමු වෙනියාව එමටද කැමැත්තෙන් සිටියේය. පාඩම් දීමෙදීද නොවරදවා පාඩම්දී ගුරුහාමුදුරුවන්ගෙන් සහ දෙමව්පියන් නෙන්ද හොඳ නම ලැබීමට ආශාවෙන් සිටියේය. සාමෙල් සම්හර දවස්වල තමන්ගේම හරක් මෙච්චල් කිරීම් සඳහා හරකුන් රැගෙණ වෙල්වලට යන්නේය. දිනක් හරක් රැගෙණ වෙලකට ගියකල තවත් කොල්ලෝ රැසවු වක් හරකුන් රැගෙණ එසේම මෙච්චල් කිරීම පිණිස එම වෙලට ආවෝය. සාමෙල් කලින් මෙම වෙලට පැමිණ තෘණ සකින රම්‍ය භූමිභාගයක තම හරක් කවමින් සිටියේය. මෙම බිමැ තණ සාරබැව් දුටු, පසුව ආ කොලු රැසවුව ඔවුන්ගේ හරකුන්ද මෙහි දැක්කුවේය. සාමෙල් අතර සහ මොවුන් අතරද මෙ ගැන කථාබස්වී ඔවුන්ගේ ඕනෑකමවිට දබරයට සැරසුනකල සාමෙල් තවදුරටත් ඔවුන්ගේඅසුනුකම් ගැන සහ තමන්ගේ සුතුකම ගැනත් කාරණා කියා සිටියේය. නමුත් ඔව්හු ඒ කිසිත් පිළි නොගෙණ දබරසවම පිටපට ගසා ගත්හ. සාමෙල්ද පිටපට ගසා ගෙණ ඔවුන් සමග ගුදකලාව දබරයට පටන්ගත. විකවෙලාවකට පසු ඔවුන් පරාජයකොට ඔවුන්ගේ හරකුන්ගේ ලඳු කපා වෙලෙන් පන්නා හැරියේය. මේතෙනදී සාමෙල් තම පලලේ කොල්ලන් අතර ප්‍රසිද්ධවිය. ටෙ කෝලාහලය තම පිය ජෝසොප් ද සොසියා ඔහුතාවද සැලුව ඒ ලමයින් ගෙන්වා පුතාට හරවලු කොට සාමදූනකර හැරියේය.

කුරුමැල ප්‍රවෘත්තිය.

දිනක් හරකුන් රැගෙණ වෙලකට ගොස් දිගෙලි කොට තමා සෙවනැලි කොස් ගහක්යට සෙවනෑ දිගාවී සිටියේය. ඒ අතර අන්තො නම් ලමයෙක් තමාගේ හරක් රැගෙන් එම වෙලට පැමිණ එසේම හරක් දිගෙලි කොට මෙම කොස්ගහ යටටම ආවේය. මොහු කොස් ගහයටට කිට්ටුවෙන අතර සාමෙල් උඩබලාගෙණ සිටිනු දැක "මොකද සාමෙල් උඩබලා බුදියෙන්නේ" යි ඇසුවේය. "මම උඩබලා බුදියෙන්නේත් ප්‍රයෝජනයක් සඳහාම බව උඹ නොදන්නෙහිදැ" යි පවසා, නැඟිට පිටපට ඟසා කොස්ගහට නැඟ කුරු වැල ගෙඩිය බාන්ට ලනුව ඕසිකිරීමට අන්තොගෙන් ඉල්ලීය. අන්තො "වැලගෙඩිය මට ගෙදර ගෙණයන්ට දෙතොත් ලනුව ඕසිතරඤ්ඤය" යි කීවේය. සාමෙල් කිපවීමක් ලනුව ඉල්ලූ නමුත් අන්තෝ ලනුව නොදී පෙරලිතරණ නිසා, ඉතා ප්‍රවේශමෙන් ගෙඩිය නිබෙන අත්තටම බඩහා කොස් වැලගෙඩිය කපා කපින් ඩෑගෙණ බිමට බැස "සාමෙල්ගේ වැඩ මෙහෙමය" යි කීවේය. අන්තෝ මේ ගැණ කෝපව වැලගෙඩියට පඬින් ගැසුවේය. ගැසූ පාරට වැල ගෙඩිය පිපුරුවේය. සාමෙල් ඛිඳගෙණ වැලමදුලු තුණ් ඔතරක් පලමුකොට කා "වරෙන් යාලුවේ වැලකන්ට" කියා අන්තෝට කථා කෙළේය. එවර අන්තෝ දුවැවිත් වැලගෙඩිය පෑගුවේය. එඟිදී සාමෙල් අන්තොට දුවනතුරු ගුටි ඇන තම හරකුන්ට වැලගෙඩිය කවාගෙණ වතුරද පොවා හරකුන් රැගෙණ ගෙදර ආවේය. මේ බවද පෝසොප් ද සොඩිසා මහතාට දැනගන්ට ලැබී කාරණා විභාගකර අන්තෝ ගෙන්වා පුනාට තරවටුකොට දෙදෙනා සාමදානයෙකි පිහිටෙවීවේය.

මුතුමදිනගේ වෙලේ කෝලාහලය.

මොරවුවේ කුමරගෙ වත්තේගේ අල්ලිස් ප්‍රනාඳු නම් කෙනෙකුට අයිති මුතුමදිනගේ වෙලට හරක් මෙව්වල් කිරීම පිණිස ගොස් සිටින අතර, එහි සිටි කොල්ලෝ "සාමෙල් දැන් හයිකාරයාය, වැලගෙඩි කවින් ඩෑගෙණ ගහෙන් බහින්ට හපනාය" යි යනාදිය කියා සරදම් කිරීමට පටන්ගත්හ. පිකාවෙලාවක් සාමෙල් මෙගැණ තූෂ්ණීම්භූතව සිටි නමුත්, තමනුත් කොලු වයසේ බැවින් "කවදා නමුත් නුඹලාගේ වැලගස් වලින් සාමෙල් ගෙඩි බාන්නෙත් ඔය කියන හැටියටමය" යි කීවේය. මෙසේ දෙබස් නුවමාරු කරගැණීමෙන් ගුටිගහගැණීමට පටන් ගත්හ. මෙහිදීත් සාමෙල් තන්යම නමුත් කොලුරැකුවුවටම ගුටි ඇන පරාජයකර දැමීය. මේ බවද ජෝසෝප් ද සොසියා මහතාට දැනගන්ට ලැබී, දබරකරගත් හැමදෙනම ගෙදරට කැඳවා සාමෙල්ට තරයේ අවවාදකොට සාමදාන යෙහි පිහිටුවාලීය. මෙදින ඊ කෑමකා අවසානවූකල ජෝසෝප් ද සොසියා මහත්මයා සාමෙල්ට කථාකොට "සාමෙල් උඹ මෙසේ උඹ පලලේ ලමයින් එදිරිකර ගත්තාම කොහොමද ? උඹ ගැණ වැඩිමහල් ඇත්තෝ කුමක් නොකියත්ද" යි කීයේය. සාමෙල් "අනේ තාත්තේ මාගැණ වැඩුමහල් හැමදෙනම කියන්නේ ගහගැණීමෙන් මම හැමතැනදීම දිනනවාය කියා" යි කීවේය. මෙහිදී ජෝසෝප් ද සොසියා මහත්මයා සාමෙල් හරක් මේව්ව ලසට නොඇවීමට අදහස් කෙළේය.

—:o:—

ඉගෙණ ගැණීම.

සාමෙල් සිංහල කියවීමටද ලිවීමටද පමණක් දුර ඉගෙණ ගත්තේය. සිංහලෙන් වාසගමක් තනාගැණීම වද තුනක් දුරට පුළුවන්කම තිබුනේය. පසුව කොල්ඵ විජේ වසූ මර්සේලිය් පෙරේරා ගුරුමහතාගෙන් මදක්

දුරට ඉංග්‍රීසි ඉගෙණගත්තේය. ඉංග්‍රීසි කථාවද හුනක් දුරට හැකිව හිඳුනේය. මේ අතර සහෝදර ෂ්‍රෝඞ්ස් ද සොසියා මහතාගේ වෙළඳුම්ට උදව් කිරීම සඳහාද වෙළඳුම් ඉගෙණීම් සඳහාද උඩරට යාමට අදහස් කළ බැවින් ශාසනා ඉගෙණීම මෙපමණකින් වලකාලන්ට සිදුවිය.

———:o:———

උඩරට යාම.

සුසෙව් දී සොසියා මහතා, සහෝදරයා සමග උඩරට ගොස් ඒ වෙළඳුම්ට ආධාර කරණ අදහසින් ක්‍රියා කිරීමට පටන්ගත්තේය. මෙවකට මහනුවර පලාත කෝපියෙන් ගහණ කාලයකි. කෝපි ඉබේ වැවෙනු පමණක් නොව ඒ ගැණ වැසිගන්නේ සැලකිල්ලක්ද වැඩියේ නොහිබුනේය.

සුසෙව් ද සොසියා මහතා උඩරට ගොඩතරේ ඇවිදිමින් කෝපි එකතුකිරීමට පටන්ගත්තේය. එතතු කරණලද කෝපි ගෝනිවල පුරවා මහනුවර නවතින ස්ථානයට ගෙන්වා ගෙණැවිත් ගොඩේ ගෑණු උදවිය ලවා කොටවා ලෙලිහැර නැවතත් ගෝනිවල බහා ඒ ගෝනි ගෙන්වාගෙණ විකිණීමට යන්නේය. මෙසේ උඩරට නොයෙක් දිශාභාගවලැ ඇවිද කෝපි විකිණීමෙන් මුදල් සැපෙව්වේය. මේ කාලයේ මේ මහතා අප්‍රමාණ දුක් ඉසුලුවේය. ගල්උඩ සහ කැලෑබදම් සියතින්උයා කෑමද, නිදි නොමැතිව සිසිමද බොහෝවර සිදුවිය. වැස්සය, අව්වය, කැලෑවය, කන්දය, බඩගිණිය, පිපාසය, සනාදි කිසිවක් නොසොයා මේ ප්‍රයත්නය තරයේ කරගෙණ යාමෙන් මහත් මුදලක් සපයා ගත්තේය. මෙයින් පසු නොයෙක් ගිවිසුම් සහිත කොන්ත්‍රාත්වැඩද පාලම් රේඳ අරක්කු රේඳ ආදියද අන්‍ය වෙළඳුම්ද කිරීමට පටන්ගෙණ ඉතා ඉක්මනට ධනවත් වූයේය. සහෝදර ෂ්‍රෝඞ්ස් ද සොසියා මහත්මයාගේ වෙළඳුම් සම්බන්ධ මහත් වෙහෙසක්ද මේ අතරතුර

දූරිය. ප්‍රෝඞ්ස් ද සොසියා මහතා මේ කාලයෙහි වඩාම වෙදකම් ගැන් වාවෘතව් සිටි නිසා වෙද මහත්මයා පටන්ගෙන් තිබුන වෙළඳුමේ කටයුතු ගැණ බොහෝවිට ක්‍රියාකිරීමට සුසෙව් ද සොසියා මහතාට සිදුවිය. සුසෙව් ද සොසියා මහතා තම සහෝදර ප්‍රෝඞ්ස් ද සොසියා මහතාට ඉතා යීතරුව සිටියේය. සොහොයුරන්ගේ වචනයට විරුඬව ක්‍රියා නොකිරීමටද, සොහොයුරාට මහත් හයපත්‍රකමක් ඇතුව සිසිමටද නිතර උත්සාහ දැරීය.

———:o:———

කුමරගේ ජේනසා සම්බඞ්ධ ප්‍රවෘත්තිය.

———

උඩරට භාරගම් පලාතේ සමහර කුඹුරුවල වැඩපල බලාගැණීමටද ඒ කුඹුරු අදේට වැපිරීමටද කුමරගේ ජේනසා නම් කෙනෙකුට ප්‍රෝඞ්ස් ද සොසියා මහතා භාරකර තිබුනේය. කුමරගේ ජේනසා ප්‍රෝඞ්ස් ද සොසියා මහතාට මහත් කුළුපග කමක් සහ විශ්වාසිත කමියුත් පෙන්නා සිටි නමුත්, ශීලාචාර ධර්ම්ඥකම් ඥානකර ක්‍රියාකරන්නෙක් බව සුසෙව් ද සොසියා මහතා හොඳහැටි දත් හෙයින්, මොහු කෙරෙහි වඩා කැමැත්තකින් නෝසිටියේය. මෙසේ පසුවෙන අතර චාල්ස් හැන්රි ද සොසියා මහතාට අසනීපයක් සෑදී ඒ බව මොරටුවේ සිට ප්‍රෝඞ්ස් ද සොසියා මහතාට ලියාඑවනලදින්, වැඩ සියල්ල මලනුවන්ට භාරකර මොරටුවට පිටත්ව ආවේය. මෙසේ සහෝදරයා හොළඹට පිටත්ව ආවාට පසු වඩා හොඳට භාරගම් කුඹුරුවල වැඩකිරීම පිණිස ඒ වැඩ පළමු කල කුමරගේ ජේනසාගෙන් අහක්කොට උපාසක අප්පුහාමි නම් ධර්ම්ඥ ක්‍රියාකාරතමින් කලදවස ගෙවන කෙනෙකුට භාරදුන්නේය. මේ ගැණ කුමරගේ ජේනසා මේ මහතා කෙරෙහි නිතයවින් අමනාපයෙන් සිටියේය. උපාසක අප්පුහාමි කුඹුරු භාරගෙණ වැට නියර බැඳ වපුලේය.

තුන්මසකට පමණ පසු, ශ්‍රෝණිස් ද සොසිසා මහතා උඩ රට එන බව මලනුවන්ට දන්වා එව්වේය. මේ කාලයේදී උපාසක අප්පුහාමි වසුල කුඹුරුවල පැල ගොයම්ය. කුමරගේ හේනයා ද සොසිසා මහතා එන බව දැන, මගට සඟවෙන්ට ගොස් දෙහොත් මුදුන්දී වැඳ "හාමුදුරුවනේ මගෙන් හාරගම කුඹුරු අහක්කොට පුඤ්ඤ හාමුදුරුවෝ උපාසක අප්පුහාමිට දුන්නෝය" යි කීවේය. හාරගම කෝපි ගබඩා කිපයක් තැනීමට ඉඩම් මායිම්කරදීම් මෙවකට උඩමනාව තිබුන නිසා, ද සොසිසා මහතා මග නැවතී මලනුවන්ට හාරගමට පැමිණෙන්ට සහ දවල් කෑම එහි සූදානම් කිරීමටත් දින නියමකර ලියමනක් ලියා හඟරන්කෙන වත්තට හැර, එදින එහි පැමිණීමට කුමරගේ හේනයාටද නියම කෙළේය. යුසෙව් ද සොසිසා මහතා සහෝදරයා එව් ලියමන කියවා නියම දින වේලාවට හාරගමට පැමිණ දවල් කෑම සූදානම්කරවා සහෝදරයා පිළිගැණීමට බලා සිටියේය. නියම දින වේලාවට ද සොසිසා මහතා හාරගමට පැමිණ මලනුවනුත් සමග කෝපි ගබඩා තැනීමට ඉඩම් නියමකොට එයී වැඩ කරකියන පිළිවෙල කියාදී හමාරකොට මලනුවන් සමග කෑම සූදානම්කර තිබුන ස්ථානයට පැමිණ දෙදෙනාම කා බී සඔසුණිව ද සොසිසා මහතා සිරිත් ප්‍රකාර කෑමෙන් පසු බොන කෝපි බීබී මලනුවන්ට කථාකොට "සාමෙල් උඹ මා යවනේද? මම උඹ යවනේද" යි ඇසුවේය. යුසෙව් ද සොසිසා මහතාට කාරණය තේරී කිසි පිළිතුරක් නොදී බිම බලා ගත්තේය. තුන්වරක්ම මෙම ප්‍රශ්නය ඇසු නමුත් උත්තරය නොලැබුන නිසා "සාමෙල් උඹ හොඳවෙක් ද" යි ඇසුවේය. ඊටත් උත්තර නැති බව දුන හැරී කුමරගේ හේනයාට කථාකොට "පල නෝ කුඹුරු බලා ගණුව" යි කීවේය. හේනයා වැඳ අවසරගෙන් යන්ට හිඳේය. කුමරගේ හේනයාට විරුද්ධව කියන්ට බොහෝ කරුණු තිබුනේවී නමුත් වැඩුමහල් සහෝදරයාගේ වචනයන්ට විරුද්ධව කථාකිරීමෙහි බලවත් ලැජ්ජාදත් යුසෙව් ද සොසිසා මහතා නිශ්ශබ්දව සිටියේය. අහෝ

මේබඳු ගුණ ඇති මහතුන්ට අයත්වූ යසස් එක් විධියකට ආශ්චර්යයිමක් හොවේය. ප්‍රෝණිස් ද සොඩිසා මහතාගේ අතිමම කාලයේදී මුළු බුදලයේ බලය සුසෙව් ද සොඩිසා මහතාට හිමිකළේවී නමුත් එතනදීවත් සහෝදරයාගේ වචනය නිසා කුමරගේ හේනයාගෙන් මේ පලිය ගන්ට නොසිතුවේය. කුමරගේ හේනයාගේ මුළු පරම්පරාව අද දක්වාම මේ කුඛුරුවලින්ම රැකෙන්නේය. සහෝදර ප්‍රේමයෙන් හිනහවූවන්ට මේය කදිම පාඩමකි. සුසෙව් ද සොඩිසා මහතාට වුදුකලාව ක්‍රියාකිරීමටද, හිනුවක්ලෙස වියදම් කිරීමටද හැකිවූ ධනයත් සහ බලයත් ඇතුව සිටි නමුත් සහෝදරයාගේ ජීවිතය නිබෙනතුරුම ඒ අන්අඩබතුවේම හිව සහෝදරයා කරණ කියන යම් යම් දේට කීකරුව සිටියේ ප්‍රතිපත්ති විවම සිටියේය. ද සොඩිසා මහතාද මේ මලතුවන් කෙරෙහි මහත් ආලයක් සිතතුල දැරුවේය. බොහෝවිට වැදගත් කටයුතුපැමිණිකල තනි තුවන්නින්ම එය නොකොට "සාමේල් මේකාරණය මෙසේ කරමුදු" යි අසයි. මලතුවන්ද සහෝදරයාගේ ඔඩහා අදහස් උදහස් දිවඇසින් දුවුවාසේ දුන ඊව උත්තරදෙයි. මෙසේ මේ සහෝදරයින් දෙදෙන නොයෙකුත් වෙළඳුම් ආදිය පටන්ගෙන් ක්‍රියාකිරීමෙන් දෙදෙනාවම මහත් ධන සම්භාරයක් ලැබුනේය. සුසෙව් ද සොඩිසා මහතා විශාල පොල්වතු කුරුඳුවතු හෙණ එවාසේ වැවිලි පටන්ගත්තා පමණක් නොව සුඛ හමුදුවට කාල් දීමටද පටන්ගත්තේය. මෙයින් ධන රාශියක් උපයා අරක්කු ටේන්ද ආදියද ගෙන් වඩ වඩා ධන සැපයීමට නොපසුවට විසඳියක් දුරිය. මේ කරණකොටගෙන් ප්‍රමාණාතික්‍රාන්ත ධන සම්භාරයන් ඉපදෙවිවේය.

ප්‍රෝණිස් ද සොඩිසා මහතා උඩරට වෙළඳුමේ තවසුතුද වතු වවි ආදියේ වැවිලිද මලතුවන්ටම ඕනෑ හැටියකට බලාකරගැනීමට ඉඩහැර, විවින්විට විශ්‍රාම හෙණ සිටියේය. සුසෙව් ද සොඩිසා මහතා තම සොහොසුරට ඉතා හයපහකින් වැවිලි ආදිය ඉතා සරුසාර අඳුම්ට වර්ධනය කෙළේය.

නපුරු මිනිසෙක්.

ප්‍රෝඟිස් ද සොසිසා මහතා කොළඹ නැවතී සිටින කාලයේ, දිසනලාහේ වත්තේ වැඩකරමින් සිටි කුසලා නම් තරුණයෙක් දවස් ගණනක් වැඩට නා වව සුසෙව් ද සොසිසා මහතාව දැනගන්වලැබී, ඔහු පදිසඳ් ගැවුණව පළඳ්වඩ යවා ගෙන්වා, වැඩට නා කාරණා ඇසුවේය. කුසලා ඉතා බැගෑපත් අන්දමින් දෙහොත්මුදුන්දී වැඳ "පුංචි හාමුදුරුවනේ මම කිරිගේන්ට කිතාගෙණ කිපින "කිරි" හාරගම වත්තේ වැඩකරණ "කිරා" සහවාගෙණ යන්ට මාරුබලා සිටින නිසා මව්සින් ඈ ප්‍රවෙශට කරගෙණ සිටීමෙන් වැඩට එන්ට බැරිවුනේය" සි කීවේය. "ඇයි බොල "කිරි" කිරා සමග යාම වඩා හරිනොවේ ද" සි සුසෙව් ද සොසිසා මහතා ඇසූකල "හාමුදුරුවනේ ඈ කිරාට කැමති නැත. ඇගේ කැමැත්ත මා සමග යාමටය" සි කුසලා කීවේය. "හොඳයි නෝ දැන් ගොස් දවස් තුණකින් මෙහේ වර" කියා කුසලා පිටත්කර හැර හාරගමට පළඳ්වඩ යවා කිරා ගෙන්නා කාරණා ඇසුවේය. "හාමුදුරුවනේ කුසලා කියන්නේ බොරුය. "කිරි" හැමදුමත් මා සමග දිගයන්ට කැමතිය, කුසලාට ඇගේ කිසි කැමැත්තක් නැත. ඈට දීමට වළලු දෙකක් නැති මට කොලොන්ගෙදර නෙදේට පතාපහත් මම බාර දුන්නෙමිය" සි කිරා දිවුරා කීවේය. කුනවනත මහතා කිරා නවතාගෙණ තුවරට යෙන්නේ පිටත්කර යවා කොලොන්ගෙදර නෙදේ ගෙන්වා රිදිවළලුවල කථාව ඇසුවේය. කිරා නම් අයෙකු දන්නේ නදුනන්නේ නැත බවත් පතා පහක් ඔසුගෙන් වළලු සෑදීමට නොහැක් බවත් නෙදේ දිවුරා කීවේය. නෙදේන් නවතා ගෙණ, කිරිගේ පියාට පළඳ්වුඩයක් යැවුවේය. මේ අතර කුසලාද ඇවිත් පෙණ්සිවිටියේය. කිරිගේ පියාද කිරි සමග ඇවිත් පෙණ් සිවිටියේය. කිරිගේ පියා රහස් සථානය තවගෙණ කිරි තා සමග දිගයන්ට කැමතිදැයි ඇසුවේය.

"හාමුදුරුවනේ කිරිගේ කැමැත්ත ගිහෙන්නේ කුසලා සමඟ දිගයාමටය. අපගේ කැමැත්ත කුසලාට කෙල්ල දීමටය. කිරි මෙහෙණ් පෙරළිකිරීමට අදහස්කර සිටිහ බව මට දැනගන්ට ලැබී තිබේය" යි කිරිගේ පියා මහත් යටහත් භාවයෙන් සැලකර සිටියේය. තව දුරටත් මේකී සැබෑව පරීක්ෂාකරමැයි ඤාණවන්ත මහතා කලපනාකොට, සුන්දරී නම් ඩැකීය වැඩකාරයාට කථා කර, සුන්දරී, කිරි, කුසලා, නෙදේ සහ තමන්ගේ කාමරයකවලි දෙරවසා මුල්ලක හේත්තුකර තිබුන තුවක්කුව ගෙණ එය සුන්දරී අතට දී "අර ඇවිත් ඉන්න කෙල්ල නිසා මුන්නෙන් වැඩගන්ට බැරිය, නෝ අර කිවින කිරිනට කෙල්ලට වෙඩිතියාපිය" යි මහත් තරහක් දක්වමින් කීවේය. සුන්දරීද තුවක්කුව ගෙණ ඉන් පිට වෙන්ට සැදුකල කුසලා ගහක් කඩාවැටුනාමෙන් සුසෙව් ද සොසිසා මහතාගේ පාමුල වැටී "අනේ හාමුදුරුවනේ කිරි මරන්ට එපාය, ඕ මරාදමුව මැනව" යි කියා යාච්ඤාකෙළේය. "නෝ මොකද කියන්නේ" යි යනු කිරිහෙන් මේ මහතා ඇසුකල, "කිරි නිසා නමාය, මේ වියවුල් වෙන්නේ ඔබවහන්සේගේ කලපනාව ලෙස කිරි මරාදමීම සුභය" යි කිරා කීවේය. පරහට දයාවන්ත මහතා ඇත්තා නැත්ත මෙසේ පරීක්ෂාකර කුසලා අතට පත්තර දහයක්දී "පල කිරි සමඟ දිගයාපිය, මෙතැන් පටන් නොවරදවා වැඩට වර" පවසා පිටත්කර හැර, කිරා ගහක බඳවා හොඳටම තළා කුසලා සමඟ වීරුඹ නොවන්ට තරවටුකොව හාරගමට පිටත්කර හැරියේය. නෙදේවද ගමන්ගාසතුදී ඇත්ත කීවාට සතුහිකර පිටත්කර හැරියේය. මේසේ තම ධනය පවා වියදම්කර ඇත්ත දැනගැනීමෙන් සුභනාසුභනිමෙහි දෙපක්ෂයක් විඳිවුවිලලන සත්පුරුෂ ජනයා මෙලෝ පරලෝ දෙකම දිනන බවට විචක්ෂණයන් වදුල උතුම් ගුරුපදෙශ මෙහිදී සැබෑවිනහැටි බලා ලෝකසන්නියා ආදර්ශගත්‍ර ලැබෙයයි විශ්වාස කරමු.

පතලේගල පොඩිකර අහසඳිම.

දිනක් කෝපිවගයක් මිලයට ගැණීම සඳහා මල්ඔළුවාවෙ සිට හැතැල්ම දෙළහක් දුර පතලේගලට සුසෙව් ද සොඩිසා මහතා හුදකලාව පිටත්ව ගියේය. මේසේ යනඅතර පතලේගල නම් කන්දෙන් ගලක්වැටී කන්ද පාවුල තිබුන ගෙයක් යටවී එගෙට දරුවෙක් සහ දරුවාගේ පියාද අසුව දරුවාගේ මව විලාපනබවින් සිටියාය. මේ ශබ්දය මේ මහතාට ඇසී එම හඬපස්සේ ගොස් එහි පැමිණ බැලූකල සිදුවී තිබෙන මහත් විපත දැන වහාම ගමන නවතා අර සුළි ඇහුල්වෙන්ට එපාය කියා කෑගසද්දී, වැටිතිබෙන ගලයටට රිංගා පළමුතොට දරුවාද දෙවනුව දරුවාගේ පියාද ඵලියට ගත්තේය. මේ දෙන්නා ඵලියටගෙණ තමාගේ ඇඟකැවිරි වැලිපිසදමන අතර, තව වරක් එම කන්දේ කොනක ගිරවී තිබුන මහ පස්ගොඩ ගේ උඩ වැටුන ගල උඩට වැටීමෙන් ගල හොඳටම පහත බැස්සේය. මේ මහතා තව තත්පර දෙකක් ගලයට නැවතුනානම් හැබෑවින්ම සුසෙව් ද සොඩිසා මහතා එදා ගලයට මිය යනවාට කිසි සැකක්නැත. පරොපකාර මහතා ඵලියටඑනතුරු මේ ගල නැවතීම අශ්චර්‍යයකි. දරුවාගේ අතක් පොඩිවී තිබුනේය. පියාගේ කකුලක් සහ අතේ ඇඟිලි දෙකක්ද තුවාලව තිබුනේය. කිසි සහයක්නැගි මේ අසරණ පවුලට පිණිටවෙමැයි නැවතත් සිතා, ඒත්‍රට දරුවා උසුලාගන්ට නියමකොට පින්වත් මහතා අසරණ මිනිහා උසුලාගෙණ එහි සිට හැතැල්ම තුණහමාරක් දුරඇවින් තැන්නේ ගෙදර වෙදරාළට බාර දුන්නේය. වියදම සහ වහන්සිය මේ මහතා ගෙවන බව කියා වෙදකම්කිරීමට නියමකොට මල්ඔළුවාවට පැමිණ එදෑ එහි නවාතැන්ගෙණ පසුවදා පතලේගලට කෝපි ගැණීම සඳහා පිටත්ව ගියේය. සිතුවාටත් වඩා අඩු ගණනට කෝපි රාශියක් ගෙණ එනගමන් තැන්නේ ගෙදරට පැමිණ රෝගාතුරවීන්නේ සුවදුක් විමාගකොට

ඔවුන්ට යැපෙන්ට මුදල්දී වෙදරාළ ධෛර්‍ය්‍යකර නුවරට පැමිණ බොහෝ ලාභඇතුව ගෙණා කෝපි විකුණා මුදල් ගත්තේය. බලාපොරොත්තුනූන ගණනකට කෝපිගන්ට ලැබීමත්, එසේම බලාපොරොත්තු නූන මහත් මුදලක් ලාභඇතුව විකුණාගන්ට ලැබීමත්, ගලයටට අසුනොවීමත් සිදුවුනේ, පතලේගෙදර අසරණයින්ට උදව්කල නිසාදෙ හෝ යන සන්දෙහයට පැමිණ මිනිසුන්යවා වැටුන ගල පොඩිකරවා ගලක් නොපෙරෙළෙන දුර ප්‍රමාණයෙන් කුඩාකැබෙල්ලක් මිලයට ගැණීමට සහ එහි තිබුන ගෙට වඩා පිකන් ලොකු උළු ගෙයක් තනාගැණීමටත් මෙ අසරණයන්ට මුදල්දී වෙදකමකල වෙදරාළටද නෑගි භොග දුන්නේය. * මෙබඳු අදිසි අනතුරාය කාරයන්ට ආරෝග්‍ය ශාලාවක් ගොඩනැගීමට මෙතනදී **සිංහයි පලමුවෙනි සනිටුහන** කරගත්තේය. තමන්ගේ ජීවිතාශාව පවා අත්හැර අනුන්ගේ ජීවිත ගැලවීමෙන්ද, වෙදහෙද කම් කරවා ඔවුන් සුවපත්කරවීමෙන්ද, හැතැප්ම තුණ හමාරක් දුර සියතින් අසරණ මිනිහෙක් උසුලාඒමෙන්ද, අනගිමයේ පළමු තිබුන මාතාගෙටවඩා සතසහශ්‍ර ගුණය කින් උසස් උළුගෙයක් තනාගැණීමට උපකාර කිරීමෙන්ද නළකී මහෝපකාරය ඇතම ධනවතුන්ට පළමුවෙනි පාඩමක්වෙනු පමණක්නොව, මුළු සොයිසා පරම්පරාවටම ශාන්තිදානය පිණිස මෙයම මදිනැති බවත් කියමු.

---

* කැන්නෙ ගෙදර වෙදරාළ මෙහිගැණ කළ ප්‍රබන්ධය.

ක ල පෙරළෙන නපුර නොතකා පුතු පිසංගෙණ ඇවි ගැලෙ ව ව
බ ල විකුවැනි පුසෙව් සොයිස බඳු අඟ උඩරට වල ව ව
ක ල පෙර සිටි බව නොම ඇසි එබැවින් මැනි පුද කර ව ව
ද ල ද පෙළතුර දිණ සකි නිලමෙලාට කඳනා දෙ ව ව

කෙලලා මිල් දූතින් තැම දළුදු කාමුදුරුව න් ට
පු ද ලා පුජෙ ද සොයිස බාරකරමු රැකා බල න් ට

(අගින් දෙපදය සපයාගන්ට නෑ)

පාතරව දෙ න් නා
කල් පින් සෙදු නොව න් නා
අපට ඉන් ව න් නා
සැපත ණකැවි දුරුව ගි න් නා

කොපමණ පීඩාසහිතවූවත් පොහොදින පැමිණි කල වඳුයා තමාගේ සඹුපුණි සදරුස නොහකුලුවන්නාක්මෙන්, සත් පුරුෂයා කොපමණ වෙහෙසට පත්වූ නමුත් උපකාර කලයුතු ස්ථානය ලැබුනතැන තමාගේ ධෛර්‍ය රූසත් නොහකුලාය යන ආප්තොපදේශය මෙහිදී විද්‍යමානවීම වතීමාන අනාගත දෙකටම ඉතා ප්‍රයෝජනවෙනු නිසැකය.

මෙසේ තරුණ කාලයේම කුසලක්‍රියාවට පුරුදුවූ සුසෙව් ද සොසිසා මහතාට තෙනේක් තරුණ බෝධි ප්‍රයෝග කලින් දූනගන්ට පුළුවන් සුදුමි ඇතයක් තිබූ නේය. නොයෙක් තරුණ ගැන තමන්කරා පැමිණුන ඇතට අයගේ ඇවිදිලි යාඥාසූ සඹුපුණියෙන් බොරු බව ටෙ මහතා ඔහුන්ගේ දෙහලඤණයන්ගෙන්ම තෝරාගත්තේය.

———:o:———

කෝදුගොඩ රාළගේ ප්‍රවෘත්තිය.

එක්තරා දිනක සුසෙව් ද සොසිසා මහතා දවාලට කෑ සිටින අතර, කෝදුගොඩ රාළ නව මඩෑම වයසේ තෙනෙක් හඳුරන්නෙත නිවසට පැමිණ දුරතියා වැන්දේය. මොහුගේ වැඳීමෙන්ම කපටියෙක් බව තේරුම්ගෙණ "අර මිනිහාගේ වැඳීම පුරහම බොරුය" යි ලඟසිටිවුන්ට හෙවින් කීවේය. සුසෙව් ද සොසිසා මහතාත් වැඳීමට උත්තරවශයෙන් ආචාරකොට ආවේ මොකදූයි ඇසුවේය. "බුදුවන්ඩ හාමුදුරුවනේ ඔබේ ඉතිරිවූ ගෘහස්ථමයාට මිහුලක් තින්දුවී තිබෙන නිසා ඈ දීගන්ට පින්පිණිස මුදලක් ලබාගන්ට ආවෙමැ" යි කීවේය. ගම කොහේද කියා ඇසූකල කෝදුගොඩයයි කීවේය. නම කොහොමද කියා ඇසූකල කෝදුගොඩ රාළයයි කීවේය. කෝදුගොඩ තිබෙන්නේ කොයි පලාතේද කියා ඇසූකල, උඩදුම්බරයයි කීවේය. "හොඳයි උඩදුම්බර මගේ මිතුයෝ සිටිති. එයින් තෙනෙකුට ලියා දූනගෙණ මුදල් විතක් එවන්නෙමැ" යි ද සොසිසා මහතායිකල "හාමුදුරුවනේ දූනට අප පදිංචිව

සිටින්නේ සවිතුවරය"යි කීවේය. "සවිතුවරට මම තුව සතියකින් පැමිණෙන තිසා කඩුගන්නාවේ කෝරාල්ලාගේ හෙදරින් සිතුරාදා, සෙනසුරාදා මා සොයා එහේ වරෙන්නැ"යි කීවේය. මෙසේ දෙඩමින් සිටින අතර, ඕනෑකළ කෝරාල යවිතුවර සිට එහි පැමිණුනේය. කෝරාළ දුටු කෝදුගොඩරාළ සුදුමැලිවිය. කෝරාළට වාඩිවීමට සලසා කෝදුගොඩ මෙවරාළ ගැන තොරතුරු ඇසුවේය. ඔහු කුපවියෙක් බවත් අඹුවක් අමතරේ තබාගෙන සිට ඈ මිල බවත් දරුවන් එකෙක්වත් නැති බවත් කෝරාළ දුන්නුවේය. එහිදී කෝදුගොඩරාළ ඉදිරියට කැඳවා "බොරුයිවේ මන්දැ"යි ඇසූ තැන, හොඵවෙක් මෙන් නොදෙඩා සිටියේය. පසුව ඔහුවහොඳට තින්දුකර පන්නා හැරියේය. තුවණැති මහනාට මෙසේ හොරමැර චාරකයන් හැඳිනගැනීමට හැකි තුනයක් තිබුන බව මෙයින් ඔප්පුවේ.

සුසෙව් ද සොසිසා මහතා කෙලින් ක්‍රියාතුරණ ඇත්ත නැත්ත ඉදිරිපිට සිට නිගියව කථාකරණ ඇත්තන්ට මහත් ආදරයක් සහ හොඳ සැලකිල්ලක් ඇතුව සිටියේය. එබදු ඇත්තන්ගේ දුක්සැප දෙක ගැණද සෙවේය. ඔවුන්ගේ ඉල්ලිවලටද කන්දුන්නේය.

———:o:———

සේදියාව ජයවුන පුවතිනිය.

———

දිනක් දරකැපීමට කැලෑපන්නා හැර සිටිය සේදියා අතරේ සහ දෙමළුන් අතරේද සටනක් සිදුවිය. සේදියා ඉක්මින්කර දර කපන්ට දෙමළුන්ට බලකළ නිසා දෙමළු පස්දෙනෙක් එතතුව සේදියාට තැවේවෝය. දෙමළු විසින් පාරතුණක් සේදියාට ගැසුවාට පසු සේදියා තාරවෙනිපාර දෙමලෙකුට ගැසිය. සේදියා සහ දෙමළු පැමිණි වෙ කෝලාහලය සුසෙව් ද සොසිසා මහතාට පැමිණිලිකර සිටියාහ. දෙමළු එකපාරක්වත් සේදියාට

නෝගැසූ බවත් සේදියා නොනැවතීම දෙමළුන්ට දණ්ඩ කින් සහ අතින් තැළූ බවත් කීපදෙනෙකුගේ ශරීර වල ඉලිප්පී තිබුන පහර පෙන්නමින් කියා සිටියාහ. සේදියාට ඉස්සරවෙන්ට හැර දෙමළු පසුව පැමිණිල්ල සකිකිරීම සඳහා තෝටුවලින් පහර ඉලිප්පෙන තරමට ඔවුනොවුන් තලාගගන්නාලදී. මේ බවක් සේදියා නොදන සිටියේය. ද සොඩිසා මහතා සේදියාට කථාකර "මොවුන්ට උඹ මෙයාකාර තැළුවේ මන්ද" යි ඇසුවෙය. "රාළහාමි මොවුන් දරනොකපා අලසව සිටිනු දැක ඉක්මන්කර දර කපන්ට යි නියා මට මොවුහු පස්දෙනෙක් එකතුව තැළුවෝය. තුන්වරක්ම මොවුන්ගෙන් තැළුවකා බැරි තැන සතරවෙනි වරට මම පාරක් (මිනිහා පෙන්නමින්) ගුට දුනිමි. මේ මගේ වචන සැබෑය" යි කීවේය. "ඇයි බාං මේ දෙමළු ඔක්කෝම කියන්නේ උඹ ඔවුන්ට තැළූ බවය." නුඹට ඔවුන් තැළු බවට එකම 'සාක්ෂියක්වත් නැතුව උඹේ කිම මා පිළිගන්නේ නොහොමදැ" යි ඇසුවේය. "රාළහාමි පිළිගත්තා හෝ නොගත්තා හෝ මට කාරණයක් නෑ. එකම සිංහලයෙක්වත් ඇත්ත කියන දෙමළෙක්වත් මාලහ නොසිටිය බැවින් සාක්ෂි ඇතිමට කිසිවෙක් නැතුවා සැබෑය. මා යිවේ ඇත්තයි. රාළහාමි සතුටු යමක් කල මැනව" යි සේදියා කීවේය. ද සොඩිසා මහතාවද සේදියා කියන්නේ ඇත්ත බව වැටහී, නැවතත් "ඇඹාං සේදියෝ, මොවුන්ගේ ඇතේ මෙතරට පහර ඉලිප්පෙනතුරු එතනොට තැළුවේ කවදැ" යි ඇසුවේය. "ඒ බව් මම නොදනිමි, ඔයතරම් පහර මිතුවෙන්ට මම කාටවත්ම නොතැළුවෙමැ" යි කීවේය. දෙමළු දිවුරා සේදියා තැළූ බවත් රාළහාමිට හඟේ ඔවුන් සේදියාට නොතැළූ බවත් කියා සිටියාහ. සුසෙව් ද සොඩිසා මහතා දෙමළෙක් අභිමුඛගෙණ "ඇත්ත කියොත් නුඹ කන්කානි නිලයට පත්කරණු පමණක් නොව, තවත් නුහුන් උපකාරද කරන්නෙමි" යි කියා ඔහුගෙන් ඇතිතාක් ඇසුවේය. ඔහු ගෙනුත් ඇත්ත දැනගන්ට බැරිවුන බැවින්, තව දෙමළෙක්

සවිග කාමිරියට පැමිණ ඇත්ත නොකීවොත් වෙඩිනියා විරණඛෑම කියා තුවක්කුව අතට ගත්තේය. දෙමළා වෙවුලමින් ඇත්ත කීමෙය. කෝටු කැපූ ගහදා, තලාගත් ඉඩවිද, සේඳියා චරදට පමුණුවන්ට රහස්මනුෂ්‍ය කළ පිළිවෙළද ඔහු පැවසිය. තවත් දෙන්නෙකු මෙසේම කාමිරියකට ගෙණ තර්ජන කළ තැන් ඔවුහුද ඇත්ත කීවා හුය. හුනවාහන මහතා දෙමළුන්ට පස් පස් දවසේ පඩි දඩගසා ඇත්තයිම ගැණ සේඳියාට ඇතුතිකොට පඩි වැඩිකොට පවුර තුන්යක් නැතිද දුන්නේය. මෙතැන්පටන් සේඳියාට ජය ඇත්වෙන්ට පටන්ගත්තේය.

——:o:——

සුසෙවි ද සොසිසා මහතාගේ අවසන කම.

ක්‍රිසතු වසි 1829 වේදී සුබහමුදුවේ සනිපාරක්ෂාව සඳහා නුවරඑලි පලාතේ හාවාඑලිය නම් ස්ථානයේ ආණ්ඩුව විසින් **හේවා ශාලා** තනවනලදුව එහි පදිංචියට එන මුළු හේවා හමුදුවටම උවමනා ද්‍රව්‍ය සැපයීමේ පොරොන්දුවට ශ්‍රෝඕස් ද සොසිසා මහතා බැඳුනේය. මෙවැනට පාරක් නොවක් හරිහැටි නැති බැවින්, මෙයි උවමනා ද්‍රව්‍යයන් හාවාඑලියට ගෙණයෑමද ද්‍රව්‍ය සැපයීමද ඉතා දුෂ්කරව තිබුනේය. ඉතා බැරෑරුම්වූ මේ කෘත්‍යයන් ඉෂ්ට කිරීමට සුසෙවි ද සොසිසා මහතාට බාරකර, ශ්‍රෝඕස් ද සොසිසා මහතා වෙදකමේ කටයුතු සහ වෙළඳුමේ කට යුතු හැඟිද වෘත්තවිය. ඒ කාලයේ හේවායන්ට පාන් වෙනුවට හාල් තවමා දීමට නියමව තිබුනේය. වී රැගෙන් තවමා පොතුහැර දීමද, වී සොයා දුරකතර යාමද, මේවැනට මහත් වෙහෙසඇති දුෂ්කර වැඩකොටසක්ව තිබුනේය. කලට වේලාවට හේවාහමුදුවගේ කෑමට උවමනා තවමාපු හාල් සහ චෙනත් ද්‍රව්‍යයන් සම්පාදනය කිරීම ගැණ යටොකත මහතාට විපුල පරිශ්‍රමයක් දරන්ට සිදුවිය. කොලඹින් අයෝමය බඩුන් ගෙන්වා ඒ ඒ පලාත්

වල තබවා ඊ තවබන ක්‍රමය පුරුදු කරවන්ට පටන් ගන්නාලදී. දිවා රෑ දෙක්හි ඇවිදීමෙන් කලවෙලාව ප්‍රවේශ කරගෙණ මෙකී දුෂ්කර දිමනා ඉවුකිරීමෙන් පේවා ජන ප්‍රධානීන්ගේ හිත් දිනාගතිය. මේ ගණුදෙනු ඉතා ප්‍රවේශමෙන් ඉවුකළාපමණක් නොව සැහැල්ම කරුමයින් දුන ඉගෙණගත් * සඞ්ඛ්‍යක්‍රමයෙන් තමන් කෑ බුලත්විට පටන් ගණන්කබා සහෝදරයාට දක්වීමෙන් තමන්ගේ අවඛකකම ප්‍රකාශ කෙළේය. මෙකී කෘත්‍යයන්හි යෙදීමෙන් මහත්සේ මහන්සි ගත්තාක්මෙන් මහත් ධනයක්ද ඇතිකොට සහෝදරයාට පෙන්නා සිපියේය. මලනුවන්නේ ඇති සෘජුවූ අවඛකකම ගැණ සහෝදරයා අතිශය ප්‍රීතිව මහත් ආදරයක් සහ බලවත් විශ්වාසයක් හිතතුළ උපදවා ගත්තේය.

———:o:———

සුසෙව් ද සොසිසා මහතාගේ අවගාහනය.

සුසෙව් ද සොසිසා මහතා හොඳ බෞද්ධයෙක්ව මෙසේ ධන සපයමින් කල්හරිණ සමයෙහි ක්‍රිස්තියානි ගුරුවරු මේ මහතා සමග මිත්‍රකම් බැඳ, ක්‍රියතු හයානකයෙක් කර ගෙණ, සුසෙව් ප්‍රෙරා මහත්මයා නව කෙණෙක් චිතෘස්ථාන යට ගෙණ මොරවුවේ ලන්සි පල්ලියේදී අවගාහනය කරණුලැබිය. මෙසේ කරණලද අවගාහනයෙන් පසු ක්‍රිස්තියානි ආගම දැන ඉගෙණ ඒ ලබඩිය හජනය කර මින්ද දේවපණත් රක්ෂාකිරීමෙන්ද කල්යැව නමුත්, පළමු ඇදහූ බුදුසමයට සිනයකින් පමණවත් විරුද්ධව නොපා ඇතම් ප්‍රභාවල උපකාරිකවද සිටියේය. ඉක්බිති ද සොසිසා මහතා ගෘහ බඹුනයට පමුණුවන්ම පෝසොස් ද සොසිසා මහතා සහ ෂ්‍රෝඩර්ස් ද සොසිසා මහතාත් අදහස්කොට ඒ ගැණ ක්‍රියාකලහ.

---

* සිංහල ඉංග්‍රීසි ශබ්දකෝෂ ඉගෙණගත් නමුත්, ගණන ක්‍රමය දුනනොගෙණ සිටියේය. නමුත් සැහැල්ම කරුමවලින් ඉලක්කම් හදුනාගෙණ සඞ්ඛ්‍යාවෙන්ම එකතුකිරීම, අඩුකිරීම වැටුකිරීම ගුණන් දුරට දැන සිටියේය.

සරණ මඞ්ගල්‍යය.

සුසෙව් ද සොයිසා මහත්මයාගේ පියාවන ජෝසොප් ද සොයිසා මහතා කැලණි විහාරස්ථානය වැඳීම පිණිස යනෙන ගමන්වලදී නාගලගම්වීදියේ (කොස්ගස්ලඟ) විසූ හැන්නැදිගේ හෙන්ද්‍රික් පීරිස් මහතාගේ * නිවසේ නැවතී කා බී යන සිරිත ඇතිකොළේය. මෙ කාලයේ තම යහලු වාට ප්‍රිය දියනියන් දෙදෙනෙක් සිටියෝය. ජෝසොප් ද සොයිසා මහතා වන්දනාවේ ගොස් එන ගමන් මෙහි විශ්‍රාම ගෙණ මොරටු යාමට පිටත්වීමෙදී, මෙ ලමෝ දෙදෙනා සමඟ "මෙයින් එකෙක් අපේය" යි කියා යන්නේය. මෙ ගෑණු ලමෝ දෙදෙනා තරුණ භාවයට පත්ව වැඩෙන අතර වැඩුමහල් තැනැත්තී හදිසි රොගයකින් මිය ගියාය. ජෝසොප් ද සොයිසා මහතාගේ කීම පරිද්දෙන්ම බාල දියනිය වන එඩගල්තිනා පීරිස් මහත්මිය, සුසෙව් ද සොයිසා මහතාට සරණ විචාරා තීන්දුකරගත්හ. දෙපස නෑදෑ මිත්‍ර සමූහයා මෙමඞ්ගල්‍යය ගැණ අතිශයින් සතුටුව ඒ සඳහා කාරණා පිළියෙළ කිරීමට පටන්ගත්හ.

එවකට පැවතුන සිරිත් ප්‍රකාර දෙපක්‍ෂයේ මිත්‍ර සමූහයා මඞ්ගලාභරණයෙන් අලඞ්කාරලෙස සැරසී මනම්මාල මහත්මයා සහ මනමාල මහත්මියත් සමඟ † දේවමන්දිරයට පැමිණ ලොව සිරිතට අනුකූලව දෙව්පණිහෝ පිළිවෙළ නොසික්මවා ක්‍රිස්තු වර්ෂ 1839 යේ දෙසැම්බර් මස 6 වෙනි කිවි දින ශුභ සරණ බන්ධනයට අභිනව සුවිල ඇතුළත් කරණුලැබූහ. දෙපක්‍ෂයේ පිරිස මනමාල මහත්මියගේ පියනිවසට පැමිණ, එවකට පැවති සිරිත් ලෙස කෑම්බීම් ආදියෙන් සඞ්ග්‍රහවීඳ ප්‍රීතියට පැමිණියාහ.

---

* මෙකී නිවසේ පසු කාලයේ ජොතිශශාස්ත්‍රාචාර්ය ඩොන් පිලිප් ද සිල්වා ඇපා අප්පුහාමි පදිංචිව සිටියේය. මේතාක් මෙහි අයිති කම පීරිස් පරම්පරාවටය.

† වොල්වෙන්දල් පල්ලියේ පිහිටි දෙව්ස්ථානයේදී මේ මඞ්ගල්‍යය සිදුවූ බව සමහරෙක් කියති.

මෙසේ පැමිණි පිරිස නොයෙක් අනුමින් ඉතා ප්‍රීතියට පත්ව මනමාලි කැඳවාගෙණ යාමට සුදුනටව ඒ සම්භාව නාවත් මොනවට ඉවුකර මහත් ප්‍රීතියෙන් මනමාලි සමග මොරවුවේ ඉඩමේ ඉදිගහ වත්තේ නිවසට යාමට පිටත්වූහ.

මොරවුවට පැමිණි කල මනාල මහත්මයාගේ පියා ප්‍රධාන බන්ධුමිත්‍රාදීන් සිසින් මනාල නෝනාමහත්මයාගේ පියා ප්‍රධාන පිරිස සාදරයෙන් පිළිගෙණ ගෞරව සම්භාවනා කළහ.

සුසෙව් ද සොසිසා මහතා තිසුණු නුවණින් සුකත වියැවනත තෙනෙකි. කිසිවෙකුට කිසි භයක් ඇති කෙනෙක් නොවේය. වහා කිපෙන සුලු කෙණෙක් නමුත් වහාම එසින් මිදිමද ඇති නෙනෙකි. වවිනා සහ අනගි වතුපිටි ගෙවල්දොරවල් ගවමහිසාදියද විශාල කුඹුරු ආදියද හිමිකාරයෙකි. විශාල පොල්වතු කුරුඳුවතුවල හිමිකාරයෙක්වා පමණක්නොව හොඳ වැවිලිකාරයෙකි. මේ මහතා වෙළඳුම් සම්බන්ධ වඩා වැඩකළේ වැදගත් ප්‍රසිද්ධ ඉංග්‍රීසිකාරයන් සමගද පාර්සි, හෙට්ටි, මහමදුගරිකාර වෙළෙන්දන් සමගද එඩගලනත රාජ්‍යයේ ප්‍රසිද්ධ අර්බත් නොට් ලේතම් සහ සමාගම (Arbuthnot Latham & Co.,) සමගද අදවෙනතුරු පවතින ජෝර්ජ් සුවර්ට් සහ සමාගම් (George Stewart & Co.,) සමගද සම්බන්ධවය. මෙකී සමාගම් සම්බන්ධව සහ ඉහතකී මහත්වරුන් සම්බන්ධවද කළකී වෙළඳුම් ගණුදෙනු ආදියෙන් මහත් ධනයක් ඉපදවීය.

ගුණවත් මහතා යමෙකුට පැමිණි රොගපීඩාදියක් දුටු කලද තමාගේ ශිතවම සැබෑසකියා තේරුමයන විපතක් අහාරුවක් යමෙකුට පැමිණි කලද විවිනොපා යසරහට උපකාරකිරීම අඛයක් වශයෙන් පැවැත්නුවෙය. යමෙ කුගේ වරදක් දුටුකල ඔහු ධනවත්වූවත්, බලසම්පන්න වූවත්, වැඩිහිටියෙක්වූවත්, ගුණවතෙක්වූවත්, උගතෙක් වූවත්, නෑයෙක්වූවත්, මිත්‍රයෙක්වූවත්, දුකියෙක්වූවත්

කිසි විසඳුමක් නැතිව ඔහු ඉදිරිපිටම එකී වරද කියා පෑමෙන් ඇත්තා සුකහ බෙරගන්න සිරිනදු, මේ මහතා ඇති කෙළේය. මේ නිසා ත්‍රුවරුවනි ලෝකයා මේ මහතා ගැන් විශෙෂ ප්‍රශංසානුභාවයක් උපදවා සිටියාමෙන්ම අසුන ජනයා අප්‍රශංසාවෙන්ද සිටියාහ.

———:o:———

කොළඹ පැවතුන ජලසනනි රොගය.

———

වසි 1844 දේ මුළු කොළඹ වැසි ජනතාව අතුර ජලසනනි රොගය (කොලොරා රොගය) පැතිරියන්ට පටන් ගත්තේය. ආණ්ඩුවද මහජනයාද ඉතා භයට පැමිණි යාහ. මේවකට සුසෙව් ද සොසියා මහතා පදිංචිව සිටියේ කොළඹ විහුදුමහොඩැල්ලේ නිවසේය. ඩච්මහට මහතා අසරණයන්ට උදව් දියයුතු වේලාව මේ බව දැන, වහාම තම සහෝදරයාගේ ප්‍රත්‍යක්ෂ ජලසනනි ගුලිය ඇඹරීමට බෙහෙත් සපයවන්වද අන්‍ය දක්ෂ වෙදුන් රැස්කොට නා නා විධ බෙහෙත් සහ බෙහෙත් තෙල් සම්පාදනය කරවීමටද පටන්ගත. ඉතා කඩිනමින් බෙහෙත අඹරවා, වීදුරු භාජනවලැ එය පුරවා තම නිවසේ මෙස යොදු, ඒ මෙස මතුපිට බෝතල පිළිවෙළට තබවා පැමිණෙන්නන්ට බෙහෙත් දීමටද අසරණයන්ට බෙහෙත් සහ වියදමට මුදල්දීමටද නියමකොට මේ කටයුතු කරවීමට ප්‍රවානිස් සොසියා මහතා පත්කළේය. මේම උපක්‍රමය මහජනයාට බොහෝ උපකාරවිය. රොගයද නොපැතිරෙණ ලෙස කටයුතුකලා පමණක්නොව, මේම බෙහෙත් සහ මුදල්ද අසරණ ජනයාට මොනවට සරණවිමෙන් නොබෝ දින කින්ම ජලසනනි භය කොළඹ නගරයෙන් බැහැරයාමට කාරණා සිදුවිය. බෙහෙත් සඳහා සහ දුක්පතුන්ව දීම සඳහාත් මේ මහතාගෙන් මහත් මුදලක් මේ ප්‍රයත්නයේදී වියදම්විය. උඳුරුසකින් දුරුකිරීමට නොහැකි ඝනදුර එකපුන්සඳින් දුරුවේන්නාක්මෙන් ධනවත් බොහෝදෙන

තවත් සිටි නමුත්, මෙසා මහත් වසංගත භය එකම සුසෙව් ද සොඩිසා මහතා නිසා දුරුවුනේය කියන්ට හැකි අයුරුමට මෙහිදී ක්‍රියාකල බව මතාව ඔප්පුවේ. රාජාවට වාල්නුන එවකට සිටි සිහිනුවණැති ගුණිජනයා අතුර ප්‍රකටවගියේ ඕයකරු මෙම වසංගතය මේ විත්වතාගේ තෑගිවනතාක්‍රම්ම බැහැරලූ බවය.

———:o:———

මාතලේ කැරැල්ල.

1848 වෙදී මාතලේවාසී ජනයා ඉංග්‍රීසින්ට විරුඬව කැරැල්ලක් ගැසුවානුය. මේ කැරැල්ල ගැන පාතරවින් උඩරටට පැමිණි සිටි ජනයා මහත් භයට පත්වූහ. මාතල පලාතේ ද සොඩිසා මහත්වරුන්ට අයිති ගුදම්වල සහ සල්පිල් ආදියෙහි සිටි අනෙතවාසික ජනයාද මෙකී ස්ථාන අත්හැර යාමට අදහස්කර තිබෙනබව, ද සොඩිසා මහත්වරුන්ට දැනගන්ට ලැබුනේය. තමන්ට භිමි මෙකී ස්ථාන රැකබලාගැනීමටද, තමන් වෙනුවෙන් සිටින ජනයා රක්ෂාකරගැනීමටද, ඉඩක් ලැබුනිනම් ඉංග්‍රීසින්ට පක්ෂව කැරැල්ල සමාදුනකරලීමටද අදහස්කොට "කලිසම් කෝට්" ආදියෙන් සැරසි තමන්ට භිමිව සිටි අශ්වයෑති **මෙනිසා** නම් සුදු අශ්වතරයා පිට නැග **මියවාසම්** නම් දෙමළ අස්ගොව්වා සමග නිර්භීත මහතා මාතලේට පිටත්ව ගියේය. පළමුව මාතලේ තමන්ට භිමි ස්ථාන වලට පැමිණ එහි සිටි ජනයාට අවවාද කර භය දුරු කොට කැරැල්ල ගැන පරීක්ෂා කෙළේය. මේ අතර ඉංග්‍රීසි සුඬ හමුදුවක් පැමිණ හතළිස්දෙනෙක් පමණ සිංහලයින් මරා පමණක් දුර කෝලාහලය සංසිඳවනලදී. උඩරට නොයෙක් හට නියම් ගටවල ඇවිදීමෙන් උඩරට වාසී උසස් පහත් කවුරුත් හොඳකාර මේ මහතා දැන හිඳු නම් බැඳ හිඬුන සෙයින් වහාම එහි පැමිණ කැරැල්ලට මූලිකයන් සොයා දැන ගොස්, ඉංග්‍රීසින්ට විරුඬව කැරලි

හැකිවෙ වරද බොහෝ කාරණා නිසා පෙන්නාදී කැරලි නොහැකිමට සිත් හැදුවේය. සුසෙව් ද සොයිසා මහතා යි කාරණාවල ඇති වැදගත්කම කල්පනා කල කැරැල්ලේ මූලික ජනයා, කැරැල්ලට එකතුව සිටි ඉහිරි ජන සමූහයා විසුරුවා හැර සාමදානයට කැමැත්ත ප්‍රකාශ කරණලදී. ඉංග්‍රීසිහුද ඊට සර්වප්‍රකාරයෙන්ම එකඟව මහනුවරට හැරී ආවාහුය. සුසෙව් ද සොයිසා මහතාගේ නිර්භීතකම ගැණද රාජපාක්ෂික කම ගැණද ආණ්ඩුවේ ප්‍රධානීහු දැන පැසසුවා පමණක් නොව රාජපාක්ෂික ලාබකිත ප්‍රභූජනයෙක් හැටි සවද ගණන් ගනු ලැබුවාහුය. * මෙතැන් පටන් ජෝර්ජ් ද සොයිසා මහතාට මෙන් මෙ මහතාටද ආණ්ඩුව සමග කල යි කටයුතුවලදී මහත් ජය අත්පත්විය. මෙ කරුණෙ මෙ මහතාට ධන ඉපදවීමට විශෙෂ මාර්ගයක්ද විය.

සුසෙව් ද සොයිසා මහතා ස්වකීය සහෝදරයා මෙන්ම පරාර්ථක වැඩකර ලොකයාට පිහිටවීමට සතුටින අන්‍යයන්ගේ ශුභ සිද්ධිය † සඳහා මහත්සේ ධන පරිත්‍යාග කෙළේය. මෙසේ ක්‍රියා කර ගෙණ එන කාලයේ එනම් වර්ෂ 1870 වේ; සර්වඥාත ශ්‍රීමත් අප මහාරාජිනියගේ ප්‍රිය පුත්‍ර රාජ කුමාර ඇඩින්බර්ග්හි ආදිපාදෝත්තමයානන් වහන්සේ සිරිලකට සම්ප්‍රාප්තවූහ. චාලිස් හැන්රි ද සොයිසා

* මොරටුව වැසියෙක්වූ පූරන් අප්පු නම් කෙනෙක් රජකෙනෙකු මෙන් හැඳ පැළඳ උපද්‍රවකලද මෙම කැරැල්ල සාමදානකිරීමට සුසෙව් ද සොයිසා මහතාට ලෙහෙසි ලැබුනේ මේ බොරු රජා ගැණ හොඳ සාර දැන ඔහු කඳුනාගෙණ සිටි හිසාසයි පමණක් දෙන කියති.

† මේ මහතා අන්‍යයන්ගේ ශුභසිද්ධිය ගැණ ක්‍රියා කරණ බැව් දැනගත් රෙවරන්ඩ් සාමුවෙල් විලියම් ඩයස් උන්නාන්සේ (කොලෝනියල් චැප්ලේන්) මේ මහතා සමග තද මිත්‍රකමක් බැඳ සිටියාහ. මෙ තුමා අච්චුකස්වකලද සිංහල භාෂා පොතක් මේ මහතාට තෑගිකරණ ලදින් එයි එතුමාගේ අත්අකුරෙන් ලියා තිබෙන (Mr. S. Soysa, from His affectionate Pastor & friend, S. W. Dias, May the blessing of God accompany this New Year's present. Mutwal, Dec., 27., 1867.) "දයාන්විත දෙවිගැතිතැන සහ මිත්‍රයාන් වන, ඇස්. ඩබ්ලිව්. ඩයස්ගෙන් ඇස්. සොයිසා මහතා වෙතටයි. මේ අලුත් අවුරුදු තෑගග සමග දෙවාශීර්වාදයද් වේවා. 1867 දෙසැම්බර් 27 දින මෝදරදී." යන්නෙන් මේ මිත්‍රකමේ ස්ථිරභාවය මොනවට ඔප්පුවේ.

මහතා සුසෙව් ද සොයිසා මහතා සමග සාකච්ඡාකොට මුළු ලන්කා වාසි සිංහල හමුදුවගේම ගෞරවය ආරක්ෂාකර ගැනීම් සඳහා, රාජ කුමාරයාට සභාවනා කටයුතුයයි නියමය කොට මේ ප්‍රථම **ලඞ්කානුහාසයෙහි** සඳහන් නොවූ ආකාර රාජ හොජනොත්සවයක් පවත්වා රාජ කුමාරයාගේ සහ මුළු ලොක වාසින්ගේම සිත්වලට කා වදින ලෙස මොනවට සඞ්ගහ කිරීමට වේ මහතා පඩිතු කාර්යෙක් එම කරණකොට ගෙන් කුමාරයා සහ ආණ්ඩු කාරයානෝද මහත් ප්‍රීතියට පැමිණ සුසෙව් ද සොයිසා මහතාට වාසල මුදලි තනතුරක්ින් ගෞරව කිරීමට කැමති බැව් වසී 1870 වේ අප්‍රෙල් මස 24 වෙනි දින ප්‍රකාශ කර වදුලෝය.

මෙසේ වදුල ඉක්බිති, ද සොයිසා මහතාට එවලේම හිතිහිසේ සොහොයුරාගේ අගනා ලක්ෂණ කයානය පැලඳීමට මෙය මාණියක්වුන බවය. එසේද වූවත් එකෙණෙහිම රජකුමරු ආණ්ඩුකාරයානන්ට ආමන්ත්‍රණය කොට, තමාගේම ඒයැදමෙන් කයානය තුනවා කර ලීමට අණකොට, ඉතා ලැහැණ් ඉතා පුස්නා හිරුවන් මාණික්‍ය බැඳි "දුසිකවු" වක් (Scarf Pin) සහ කුමාර යාගේ ඡායා රූපයක්ද තෑගිකරලූහ.

ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේ රජ කුමරුගේ අණපරිද්දෙන් කයානන්ය තැනවීමට අදහස් කොට, එවකට ලක්දිව පමණක් නොව එරෝපාදි රටවලුද ප්‍රසිඩ දක්ෂ රන්කරුවෙක්වූ බතොලමෙවුස් ජොහානස් ගෝම්ස් මුදලිවරයා රජවාසලට ගෙන්වා කයානය තැනීමට නියම්කොට මුදල් දුන්නේය. මුදලි තැන ඉතා කඩිසරලෙස සහ ලක්ෂණලෙස කයානයේ වැඩ මොනවට හමාර කළ තැන එතට:—වසී 1871 කේ මැයි මස 24 වෙන් දින මහතුවර රාජ මන්දිරයෙහිදී නෙක ශ්‍රීන් විරාජමාන ඇතියා අප මහා රාජතින් වහන්සේ උපන් දින සිහිපත් කරණ මඩගලෙත්සව අවසානයේ

ගරුතර ආණ්ඩුකාර **සර් හර්කියුලස් රොබින්සොන්** උතුමාණන් වහන්සේ රන් කස්තානය අතට ගෙණ, ඉතා රම්‍ය ව්‍යක්ත කථාවක් කොට ද සොයිසා පවුලේ ගුණ වර්ණනා කරමින් **සූසව ද සොයිසා ධර්ම ගුණවර්ධන විපුල ජයසූර්‍ය කරුණාරත්න දිසානායක වාසල මුදලි** නමින් කස්තාන පලඳවන්ට යෙදුනේය.

———:o:———

මුදලි මඞ්ගලෝත්සවය.

රන් කස්තාන ආදියෙන් විභූෂිත මෙතුමා මහනුවර බූවැලිකඩ වලව්වට පැමිණි කල, එහි රැස්ව සිටි සිංහල, ඉංග්‍රීසි, දෙමළ, ලංසි, පාර්සි, මරක්කල ආදි නොයෙක් තරාතිරම්වල නිලධාරිහු සහ වෙළඳ ජනයාද, මුදලි මුහන්දිරම් වරුද, රදළවරුද, නෑදෑ පිරිසද සුවඳ පැන් මල් ආදියෙන් සඞ්ග්‍රහකර ආදරයෙන් පිළිගත්හ. මෙසේ පිළිගත් ඉක්බිති මුදලිතුමාට ලැබුන හස්ත කඩදාසිය කියවා තේරුම්කර දෙනලදී. එවිට රිචර්ඩ් ප්‍රැන්සිස් මෝර්ගන්තුමා (මහාරාජිනීන්ගේ අවකාත්) ආදි උසස් මහතුන් විසින් ව්‍යක්ත කථාවන් පවත්වා මුදලිතුමට සහ වලව්වේ මහත්මයාටද ආශිර්වාද පැවැත්තුහ. මෙ ප්‍රස්තාව සඳහා බූවැලිකඩ වලව්වද ඒ අවටද වනස්ස, මල්, කොඩි, ගොබ ආදියෙන්ද, තොරන් ආදියෙන්ද කදිමට සරසා, රස කෑම බීම ආදියද පිළියෙළකර තිබුනේය. පැමිණි සියල්ලට මුදලිතුමාගේ දක්ෂ මෙහෙකරුවන් විසින් ඉතා ආදරයෙන් සහ මහත් සැලකිල්ලෙන් සඞ්ග්‍රහ කරණලදී. මෙ අතර හෙළු, පාළි, සංස්කෘත කව් ශ්ලෝ, සින්දු ආදි ප්‍රබන්ධ කියවා බොහෝදෙන ඔප්පුකලහ. මුදලිතුමා ඉතා ප්‍රේමාන්විත ලෙස කථාකර පැමිණි මහත් සේනාවට ස්තුති කෙළේය. ඉතා සවස් වනතුරු රැස්වූ මහ සේනාව කෑමෙන් සහ බීමෙන් ප්‍රීතිසට පත්ව අන්තිමයේ මුදලිතුමට ස්තුති වශයෙන් ඔල්වර හඬ පවත්වමින් විසිරී ගියෝය.



MUDALIYAR JRONIS DE SOYSA'S SWORDS &c.



MUDALIYAR SUSEW DE SOYSA'S SWORDS &C.

හඟුරන්කෙත ගමන.

සහොදර ජෝෂඵ මුදලිතුමා මෙන්ම මෙම මුදලිතුමාත් හඟුරන්කෙත මතකනැති නොතොට, පසුවදු එහි යාමට සුදුනම්විය. 1871 තේ මැයි මස 25 වෙනි ඉරු දින මුදලි තුමා අසුන් දෙදෙනෙකු යොදනලද මහැති රථයකින්ද පිරිවර ජනයා අනෑ රථවලින්ද පිටත්වූහ. මෙසේ යන් නාවූ මුදලිතුමාට තන්හි තන්හිදී ගිහා මිනුන්දින් රුස්ව කරණලදු ගෞරවාදර ඉවසීමෙන් ඔවුන්ට සතුතිකොට ඒ ඒ තැන් ඉක්මවා හාරගමට පැමිණියේය. එහිදී බෙර රබන් තේවිසි ආදියෙන් සහ නර්වන්ගෙන්සුත් මහා පෙළ හරක් ඉදිරියට පැමිණ නව සිලෝ ආදි ප්‍රබන්ධ කියවි මෙන්ද, සුවඳපැන්, සුවඳ මල් ආදියෙන්ද ගෞරවකොට මුදලිතුමට පෙරවුවෙන් මෙම පෙළහර හමන්කිරීමට වන.

හෙළසුල් පදමයක් පිරිවරාගත් ඕලොල් රැසක් මෙන් මුදලිතුමා පිරිවරාගෙණ යන සේනාව පෙරමුනට, රදල වරු ප්‍රධාන ග්‍රාමික ජනයා විසින් හස්ත්‍යාභරණයන්ගෙන් සම්ලඩකෘත ඇතුන් පසළොස් දෙනෙක් සහිත පෙළහරක් රැගෙණ සම්ප්‍රාප්තව ආදර ගෞරවයෙන් මුදලිතුමා පිළි ගත්හ. මුදලිතුමා සමග මහනුවර බ්‍රිවැලිකඩ වලව්වෙන් පිටත්වූ සෙනඟද, හාරගමදි සම්මුඛවූ පෙළහර සහිත සෙනඟද, මේ සේනාවද යන තෙසෙනඟගේ එකතුවීම, රම කුමාර මඞ්ගල්‍යෝත්සවයෙකිදී අයොධ්‍ය කාශී, මිථිලා යන තෙරට සෙනඟගේ එකතුවීම හා සමානවිය. මෙසේ මහ පෙළහරින් සුසාන සේනාව මුදලිතුමා පිරිවරාගෙණ හඟුරන්කෙත වලව්වට පැමිණියහ.

මෙම උත්සවය සඳහා එහි පැමිණ සිටි මුදලිතුමාගේ මිනුවූ ඉංග්‍රීසි චතුරාර මහත්වරුන්ද, චතුවලෑ වැඩකරුවන්ද වෙනත් වැදගත් මහත් පිරිසක්ද විසින් සුවඳපැන් මල් ආදියෙන් ගෞරවකොට පිළිගන්නාලදී. ඉක්බිති පිනන් වල වලව්වෙ මහ රදලතුමාගේ ඉල්ලීමපිට රජ කුමරු

පරිත්‍යාගකල සහතාගයේ කොටා තිබෙන වාසගම සහ හංසා කඩදාසියන් කියවා තේරුම්කර දුන් ඉක්බිති, සම හරු තම තමන්ගේ සතුටින් තනාගෙණ සහ උගතුන් ලවා තනවා ගෙණැවිත් තිබුන කවි සිලෝ සින්දු ආදිය කියවා ඔප්පුකලහ. මුදලිතුමා මේ හැමදෙනට බොහෝ සේ සතුත්කොට සූදානම්කර තිබුන අනුරූපස පිළිගන්නා හැටියට සියලුදෙනගෙන්ම ඉල්ලා සිටියේය. මෙය පිළි ගත් සියලුදෙනා තම තමන් කැමති පරිද්දෙන් අනුරූපස පිළිගෙණ දිලිප රජ දුටු යාගමණ්ඩල වාසීන්මෙන් එදින මුදලිතුමා දුක දුක මහත් උත්සව පැවැත්වූහ. තවද විසුම මණ්ඩලයෙහි පිහිටි පදම ශ්‍රී කාන්තාව අලුතෙන් හට ගැණුන මහනෙල කරා පැමුණුනාසේ බල, ධන, කීර්ති, ශ්‍රී කාන්තාව ජෝර්ජ් ද සොයිසා මුදලිතුම නැමති ප්‍රථම ස්ථානයෙන් පෙරලි, සුසෙව් ද සොයිසා මුදලිතුම නැමති දෙවන ස්ථානයෙහි ආරූඪවූ ලක්‍ෂණ මෙදින ප්‍රකාශ වීමෙන් හගුරන්කෙත වාසි ජනතාව විශෙෂ ප්‍රීතියට පත් වූහ. මුදලිතුම, තමන් ගැණි සහ තම සොහොවුරා හැණීත් තරුණ සොයිසා මහතා ගැණිත් නිතර සලකන හගුරන්කෙත වාසි ජනයා ප්‍රධාන අවශෙෂ ජනයාට කල යුතු සකල යුතුකම් ඉටුකර ඔව්හු වඩ වඩා සතුටට පත් කර කොළඹ එමට පිටත්වූයේය. සෙඩකඩගල නුවර දුම්රිය ස්ථානයට, මහත් සමූහයක් පැමිණ මුදලිතුමට ගෞරව සම්භාවනාකොට ඔල්වර හඬ පවත්වමින් ආශංසනය කලහ.

———:o:———

කොළඹට පැමිණීම.

———

මුදලිතුමා කොළඹට පැමිණෙන බැව් ඇසූ හිත මිත්‍රා දිනුදෑ ඤාති සමූහයාද ඉතා ප්‍රීතියට සපැමිණ ඒ සඳහා කල යුතු සකලම දෙය සම්පූර්ණ කලහ. කොළඹ මසන් ගස්විව්යේ පිහිටි මුදලිතුමාට හිමි "සැල්බි හවුස්" නම් වලව්ව මෙම ප්‍රස්තාවට උවමනා ලෙස ඉතා ලක්‍ෂණට

සරසා පැමිණෙන ජනතාවට අතුරුපස දීම සඳහා විශෙෂ අතු ශාලාවක්ද පිළියෙළකොට එයද මොනවට සරසා ලූහ. වලව්ව දෙරතඹ විශාල හතරැස් තොරණක් තනා එය දුටුවන්නේ චිත්තාකර්ෂණ වන ආකාර රූප ලෙස වනස්ස, මල්, කෙහෙල් ආදියෙන් සරසා මුදලිතුමාට ආශංසන වදන් රැසක්ද ඔතියමකර තිබුනේය. මසන්ගස් වීථියේ සන්ධියේ මහැලි ඉතා විශාල තොරණක් බැඳ ඵල පල්ලවයන්ගෙන් සහ මල්මාලා ධජ මාලාදියෙන් සරසා තිබුනේය. මෙපමණකිනුත් අවසාන නොකොට, මසන්ගස් වීථියේ සන්ධියේ පටන් වලව්ව දක්වා දෙපස ආරක්ෂා නමා ගොප් ආදියෙන් සරසා හෙල වාලුකා ඉස මග පිරිසිදු කරලූහ. වලව්ව වත්තද ප්‍රසාදවට සුදුසුසේ මල් කලස් ආදියෙන් සරසා තිබුනේය. කැබලි කැබලි ඵලන පියවිලි නොව, මසන්ගස්වීථියේ සන්ධියේ පටන් වලව්ව දක්වා එක කැබැල්ලට ධවල පියවිල්ලක්ද සූදානම් කෙළේය. මෙසේ සකල දෙසම පරිපූර්ණකොට සිටින සමයෙහි එනම්:—වෂ 1871 මේ මැයි මස 31 වෙනි දින කොළඹ ප්‍රධාන දුම්රිය ස්ථානයට මුදලිතුමා සමුප්‍රාප්තව දුම්රිය කළමනාකාර ර්. රොබින්සන් මහතා විසින් එහිම පිළියෙළකර තිබුන විවේචක ගෙට පැමිණ වාසලමුදලි ආභරණ ඇඳ පැළඳ ගත්තේය. මුදලිතුමා පිළිගැන්මට එවෙලාවට එහි පැමිණ සිටි වැදගත් මහත් ඤාති මිත්‍ර මිශ්‍ර පිරිස මුදලිතුමා සමාදරයෙන් පිළිගෙණ අසුන් දෙදෙනෙකු යෙදූ මහැලි රථයට වඩා හිඳුවා පෙරටුකොට, අවශෙෂ රථ පඬුකතිය ඒ පසුපස්සේ ගමන්ගත. මසන්ගස්වීථියේ සන්ධියට ළඟාවූකල, ගාර්දියේ හේවා පන්නක්කාර ජනයා සහිත හේවිසි ආදිය පෙරටුකොට, මුදලි මහත්මාවරයාගේ සහ අවශෙෂ ජනයාගේ රථ හැර මසන්ගස්වීථියේ සන්ධියේ පටන් වලව්ව දක්වා ඵලනලද දිගු පියවිල්ල උඩින් ගමන්ගත්හ. රජ

කුමරු හැඟිකල අගනා සහ දිලිසෙන රන් පටි රන් කණ්ඨාහාර සහ උද්දීප්ත මුතුමිණි ආභරණ පැළඳ සහපත් වෙන මුදලිතුමා ප්‍රධාන පිරිසගේ මෙ ගමන, විජිතපුර විජයගෙණ වැඩමකල ගැමුණු මහරජු ප්‍රධාන රජපිරිසගේ රූ ඉසිලිය.

මෙසේ සම්ප්‍රාප්තවූ මුදලිතුමා වලව්වට සපැමිණිකල, රැස්වසිටි මහත්මීන් සහ මහත්වරුන් විසින් ගඳමල් සුවඳ පැන් ආදියෙන් ගෞරවාදර කොට පරිතුෂ්ටිභාව යෙන් පිළිගන්නාලදි. මෙහිදීද හඟරන්කොහාදී මෙන් කෘත්‍යාන කාවුමේ කොටාතිබුන සරසවි සමූහයා සහ හස්තකඩදසියත් කියවා දුන් ඉක්බිති, රැස්වූ දහස්ගණන් සමූහයා බල්වර හඬදීමට පටන්ගත්හ. පමණෙක් හෙළ, පාලි සංස්කෘත කව ශ්ලෝ කියවා මුදලිතුමට ආශිර්වාද කිරීමට පටන්ගත්හ. පමණෙක් ගී සිඳු කියවා පිළි ගන්වන්ට පටන්ගත්හ. පමණෙක් තූර්‍ය්‍යවාදන් බණින්ට පටන්ගත්හ. පමණෙක් මුදලිතුමා හැඳ පැළඳ සිටි ස්වර්ණමය පටි කණ්ඨාහාර මාල පදක්කම මුතු මිණි ආභරණ දර්ශනයෙන් කම්පිතව සතුටු කඳුලු සලන්ට පටන්ගත්හ. මෙසේ ප්‍රීති උත්සව පවත්වන නොයෙක් ජාතික මහත් ජනතාවට මුදලිතුමා සිංහස්වරයෙන් ආමන්ත්‍රණයකොට පිළිවෙළකර තිබුන අනුරූපස භුක්තිවිඳීමට යටත්පිරි සෙයින් ඉල්ලා සිටියේය. එහිදී බෙසා මහත් සේනාව සරසනලද විශෙෂ අනුරූපස් හලට වැද, රුචි රුචි කෑමෙන් සහ රුචි රුචි බීමෙන්ද විපුල සන්තුෂ්ටියට පැමිණියහ.

රැස්වූ පිරිස අපමණ සතුටු භාවයට පත්වූකල, ලක්රිවි කිරන් කවිඃධුරන්ධර ප්‍රසිද්ධ සී. සී. වීරක්කොඩි මහතා මුදලිතුමාගේ ගුණ කීර්තනය වර්ණනා කරමින් මධුර මනොහර කර්ණරසායන කථාවක් කොට ආශංසනය කෙළේය. මෙසින්ද නිශ්ශබ්දනොවී කොළඹ කම්මෙරියේ ප්‍රවාතිජ ද සිල්වා ජයසිංහ මුහන්දිරම් මහාත්මයා, ප්‍රධානකොට ද සොයිසා පවුලේ ගුණ වර්ණනාකොට

එසේම රමණ කථාවක් නෙළේය. මුදලිතුමා මේ කථා වන්ව සහ සතුතිපත්‍ර ඔප්සුකළ මහතුන්ටද මුදලිතුමා සඳහා පැමිණි සියලුදෙනාටද මහත්සේ සතුතිකොට සම්භරුන්ට සතෙකුගෙ ධනයෙන්ද සඩ්ගුහ කෙළේය. මෙයින් පසු සම්භරෙක් සතුවින් විසිර ගිය නමුත් වැඩිදෙනෙක් රෑ වනතුරු නැවතුනාහ. රෑ කාලයේ නොයෙක් උතුසව ඇතුවගියා පමණක් නොව මහත් රැසක් අලඩ්කාර අගනී ත්‍රිඛාදු එහි පැවතින. වාසල මුදලි සම ලැබූ මුදලිතුමහාදෑ, වලව්වේ පැමිණි තැනහාදු ප්‍රිය මනාපව සතෙකුගෙ ප්‍රකාශකිරීම සඳහා පැමිණුන මහත්මින් සහ මහත්වරුන්ගෙන් රෑ කාලයේ වලව්ව දිවෑ ගන දිවාඛගනින් සමුදාපයික ශෛව මඤ්ර සිරි ඉසිලිය. ශ්‍රීවකානන්නාව හා අනුරූප ප්‍රකෘති ගුණාදරයෙන් යුත් වලව්වේ මහත්ම මෙසේ පැමිණුන මහත්මින් ගැණ වෙසෙසින් සලකා ආදර බුහුමන් කළ පරිදි අතිශය ප්‍රශංසනීයවිය.

මෙදින රාත්‍රි හොජනයට බොහෝ දෙන වාඩිවුහ. රාත්‍රි හොජනයද පොහොසත් ලෙස සුදුනව කරණ ලද්දකි. වාඩිවූ මහත්මියෝදෑ, මහත්වරුද ඉහා රසමුසු ආහාරපාන භුකතිවිඳ මහත් ප්‍රීතියට පත්වුහ. "බැල්විස්" සහාවේ ජේමිස් ද සිල්වා පූජක උන්නාන්සේ සහ මොරටුවේ එඩගලානත සහාවේ එබ්‍රහම් මැන්දිස් පූජක උන්නාන්සේද, මුදලිතුමා සහ වලව්වේ මහත්මයා සම්බඛ්වද ඩඛ්ගිස්ත ප්‍රෝඛ්ස් ද සොයිසා වාසල මුදලිතුමා සහ එම වලව්වේ මැතිනිය සම්බඛ්වදු, චාලිස් හැන්ඊ ද සොයිසා සාමදුන මිනිඛ්සයකාරතුමා සහ ද සොයිසා නෝනාමහත්මින් සම්බඛ්වද ඩඛ්ගිස ගාෂාවෙන් අවිඛාන්විත රසවින් කථාවන්සොට ද සොයිසා පවුලට "දෙවොඛ්තමයානන් වහන්සේනෙන්" ආශීර්වාදු ඉල්ලුහ. ඊට පසු අතිරෙකයින්ටද පොනවට සඩ්ගුහ කර මෙදින රෑ මේ උතුසවය මෙතෙකින් නවතා කළහ.

මොරටුවට පැමිණීම.

සුසෙව් ද සොයිසා චාසල මුදලිතුමා උපන් ග්‍රාමය වන මොරටුවට යහපත්වීම සඳහා වසී 1871 නේ ජූනි මස 13 වෙනි දින ගමන ආරම්භ කෙළේය. මුදලි තුමා චාල්ස් හැන්රි ද සොයිසා සාමදූත ඒනිෂ්ඨයකාර තුමා සහ මුඤ්ඣුබුරු තරුණ් ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා මහතාත් සමඟ අසුන් සතරදෙනෙකු යොදනලද මාහැනි රථයකට නැංගෙ ඉක්බිති බහුමූල්‍ය මහත් සම්භාවය ඇති රථාරූඪව මල්වත සොයා යන භාග්‍යාවලියක්සේ මොරටුව සොයා යාමට පටන්ගත්හ. පිරිවර ජනයා කැටුව මෙසේ යන්නාවූ මුදලිතුමා හිත මිත්‍රාදීන් විසින් අතරමඟ නතරකරවා නොයෙක් තන්හි තන්හිදී නා නා විධ සඬහුන කිරීමට පටන්ගන්නාලදී. මසන්ගස් විවියේ පටන් ඇතුල් කොටුව දක්වා නොයෙක්තැන රැස්ව සිටි ජනයා මල්, සුවඳපැන් ආදියෙන් මුදලි තුමාට සඬහුන කළහ. මුදලිතුමද, සතුනි වචනයන් ප්‍රකාශකරමින් සැකිස්ස හිස පහත්කොට මෙක් කාටත් ආචාරකොට පිටත්විය. රථපෙල ක්‍රමයෙන් ගාල්ලේ දෙරකඩ සමීප පොල් නැති තන් භූමිය ඉක්මවා කොල්ඵට්ටියට සේන්දුවූ තල එකිවාසි නා නා වර්ණක ජනයෝ මුදලිතුමාට මල් ඉසා විනිදිය වහුරුවමින් ආදර බුහුමන් කළහ. මේදිනට දින කිපේකට ප්‍රථමයෙන් චාල්ස් හැන්රි ද සොයිසා තුමගේ මැතිනියට * **සත්වෙනි පුත්‍රරත්නය** ලැබී සිටිය හෙයින් ඒ ප්‍රිය දර්ශනය සඳහා "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වට යහපත්වී සුව පහස් බලා ප්‍රියව එයින් නික්මිණ.

මෙසේ බම්බලපිටිය, වැල්ලේවත්ත, දෙහිවල, ගල් කිස්ස තොඩි පලාත්වාසි නා නා විධ ජනයා මුදලි තුමාට මහත්සේ මලින් ගදින් සඬහන කර සතුට

* ර. ඇල්. ඇල්. ද සොයිසා මහතා.

ප්‍රකාශ කළහ. මුදලිතුම ඉතා ආදරයෙන් සඬ්ග්‍රහ කරුවන්ට ආචාර සමාචාර සතුතිකොට පිටත්වූහ. රත්මලාන වාසි ජනයා විසින් මුදලිතුම මහත් ගෞරවයෙන් පිළිගන්නා අවියෙන්, තන්හි තන්හි හතරැස් තොරන් පඩකති බැඳ එය මොනවට සරසා කොඩිඇද බිම හෙලවැලි ඉස දෙපස ගොප් ආදියෙන් සරසා සකස් කරණලදී. මෙකී සැරසිලි පෙළ කුරුඳුවත්තේ අවබලම දක්වා නොකිනනව පැවතිනි. මුදලිතුම රත්මලානට පැමිණි ඉක්බිති රත්මලානවාසි ජනයා ප්‍රමුඛකොට මහත් සේනාවක් පෙරමුනට අඩුන් පුෂ්ප ගන්ධාදියෙන් ගෞරවකොට ඔල්මර හඬගසා ආදර බුහුමන් දැක්වූහ. ඒ සියලු දෙනාට මුදලිතුමා ආශීංසනයකොට මොරටුවේ කුරුඳුවත්තේ අවබලම ලඟට සම්ප්‍රාපතව රථයෙන් බැස්ස වහාම කුඩ කොඩි සේසත් වල්විදුනා භේවිසි සහ විප්‍රකාර නළුවන්ගෙන් යුත් මහ පෙළහරක් එහි පැමිණ මුදලිතුමා පෙරමුනෙහි සිටගත්හ. මොරටුවාසි ජනයාද පෙරමගට සම්ප්‍රාපතව තම ග්‍රාමීය චිතිය ජන ප්‍රධාන මුදලි මන්ත්‍රීඇමැතිරයාට ආදරයෙන් බුහුමන්කොට අවබලම ලඟසිට මොරටුවේ වලව්ව දක්වා එක පිළියට තනනලද පියවිල්ල මගින් මහත් පෙළහර සහිතව කැඳවාගෙණ ගියහ.

මොරටුවේ වලව්ව සහ එම වත්තද අවවද ඒකාකාර ලක්ෂණට තොරන් ආරුක්කු ආදිය බැඳ ඒ සියල්ල වනස්ස ගොප් කොඩි ගෙඩි මල් ආදියෙන් චිත්තාකර්ෂණයවන ආකාර සරසා තිබුනේය. මුදලිතුම වලව්වට පැමිණි කල පළමුවෙන්ම ජෙෂ්ඨ සොහොවුරු මුදලිතුමාගේ ප්‍රිය භාර්‍යාවවූ වලව්වේමහත්මයා විසින් පිළිගන්නා ලදින්, එකතුවූ සියලුදෙන විසින් මල් සුවඳපෑන් ආදියෙන් බුහුමන් කරණලදී. එතිදිද හක්කාඛදුසිය සහ රාජ කුමාරොත්තමයා තෑගි කළ කස්තාන කඩුවේ කොවා

තිබුන * වාසගම කියවාදුන් ඉක්බිති රැස්ව සිටි මහත් සේනාව බල්වරහඬ පවත්වා ප්‍රීතිඝොෂා කළහ. මුදලිතුමා මොරටුවේ වලව්වට පැමිණිකල වෙලාව සවස හතරවූ බැවින් අතුරුපසක් සූදනම් කරණලදී. නානාවිධ රස කෑම සහ බීමවලින් යුත් අතුරුපස රැස්වූවන් විසින් සිත්වූ පරිද්දෙන් සතුටින් භුක්ති විඳිනලදී. මහනුවර සිට මෙම උත්සවයට පැමිණ සිටි ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ උඩරට මන්ත්‍රී ධුරන්ධරවූ ජේම්ස් ඇඩ්වර්ඩ් දෙහිගම රදළතුමා ඉතා ව්‍යක්තලෙස සිංහලෙන් කථාවක්කොට මුදලිතුමාගේ ගුණ වර්ණනාව කෙළේය. මෙතුමාගේ රම්‍ය කථාව ශ්‍රවනයකළ සියලු දෙන මුදලිතුමගේ විශෙෂ ගුණ සමූහය ගැණ මවිතව වඩ වඩා ප්‍රීතිඝොෂා පවත්වන්ට පටන්ගත්හ. ඉක්බිති කොල්ළුපිටියේ ප්‍රසිද්ධව විසුවාවූද, හෙළදිව් රදනිය, සිසබස් ලකර, ශාස්ත්‍රාලඞ්කාරය යනාදි පොත්පත්වලැ කතෘභූතවූද, උගත් ජෝන් ප්‍රේරා මැතිතුම මේ ලහට ඉතා ව්‍යක්ත කර්ණරසායන කථාවක්කොට ද සොයිසා පවුල ගැණ වර්ණනා කෙළේය. නොයෙක්දෙන විසින් සම්පාදනයකර ගෙණැවිත් තිබුන සිංහල, මගධ, සංස්කෘත, තිපුපුද පත්‍රිකා සමූහය කියවා ඔප්පු කරණලදී. මුදලිතුම සතුති කළපුඃතතන්ට සතුතිකිරීමෙන්ද, ධන පරිත්‍යාගකල පුතතන්ට සනෙතාෂ ධන දීමෙන්ද සඞ්ග්‍රහ කෙළේය. මෙදවසේ හිරු අවරට යනතුරු මෙසේ මහොත්සව පැවැත්වූ සෙනාව අතරෙන් පමණෙක් විසිර

* Presented to Susew De Soysa Dharmagunawardhena Vipula Jayasuriya Karunaratne Dissanayaka on his appointment as Mudaliyar of the Governor's Gate by His Royal Highness the DUKE of Edinburgh in recognition of Susew De Soysa's public liberality & hospitality to His Royal Highness on His visit to Ceylon, April 1870.

මෙහි අදහස.

1870 වෙ අප්‍රේල් මාසේදී ඇඩින්බර්ග්හි ආදිපාදෝත්තමයානන් ලඞ්කාවට සම්ප්‍රාප්තවූ දුෂණාවෙ එතුමානන්ට කරණලද ආගන්තුක සත්කාර ගැණද, පොදුජනතාවග ගැණද සැලකීමක් වශයෙන් සුසෙව් ද සොයිසා ධර්ම ගුණවර්ධන විපුල ජයසූරිය කරුණාරත්න දිසා නායක එතුමානන් විසින් වාසල මුදලි තනතුරට පත්කිරීමේදී තෑගි කරණ ලදී.

ගිය මුත්, පමණෙක් නැවතී රැඳෝ වනතුරු උතුසව කල හෙයින්, මුදලිතුම යම් කෑමක්ද සුදුනම්කරවා එසින්ද මොනවට සඞ්ගහ කෙළේය. නොයෙක්දෙන එසින් බැඳගෙණැවිත් තිබුන චෙසිවලින් අගනි ක්‍රීඩා වක්ද පවත්වා මුදලියුමට ගෞරව කරණලදි. සකල ගෞරව විපුලාකාර විදිනලද මුදලිතුම පතල කරුණාවෙන් සියලුදෙනට යහුයිකොට සුදුස්සන්ට තෑගිදී මේම උතුසවය මෙතෙකින් හමාර කෙළේය.

මෙසින් පසු මුදලිතුම විශෙෂ වශයෙන් පරොපකාර වැඩෙහි යෙදී ක්‍රියා කිරීමට අදහස්කොට ඒ ගැණ වැඩි කාලය මිඩතු කිරීමට පටන්ගත්තේය. මුදලිතුමගේ මිත්‍ර සමූහයා එකතුව රුපියල් හාරදහසක් එකතුකොට රන් මාලයක් සහ * පදක්කමක් 1871 කේ දෙසැම්බර් මස සමපාදනයකොට එය පරිත්‍යාග කිරීමට කාලය පැමිණ්ණ කල, මොරටුවේ ඉඩමේ අවපවිවම් මණ්ඩපයක් තනා එයද ඉතා රමණීලෙස සරසා වරුෂ 1872 කේ පෙබරවාරි මස 24 වෙනි දින අතිගරු **එච්. ඩබ්ලිව්. ජර්මින් බිෂොප්** උන්නාන්සේලවා එම මාලය මහත් උතුසවයෙන් ගෙල පලඳවනු ලැබුවේය. බිෂොප් උන්නාන්සේ මාලය කර ලන්ට ප්‍රථම ද සොසිසා පවුල ගැණ සහ ලොකයාට කරදී තිබෙන මහත් වැඩගැණද උසස්ලෙස කථාකොට මාලය

---

* Presented to Susew De Soysa Dharmagunawardhena Wipula Jayasuriya Karunaratna Disanayaka Mudaliyar of the Governor's Gate, by the native inhabitants of Ceylon, in token of the high esteem in which he is held by them and in appreciation of his patriotic endeavours to promote the public good, and of his munificience in endowing a new Institution in the Island designated "The Alfred Model Farm," December 1871.

සිංහල අදහස.

මහජනයා විසින් ගරුකොට සැලකුම් ලබුණුත් වශයෙන්ද, මහ ජනයාගේ යහපත දිසුණු කිරීමට සර්වදෙශාලයෙන් දරණ උත්සාහයන් ගැණ සහ "ඇල්ප්‍රැඩ් ආදර්ශ ගොවිපල" යන නමින් ලංකාවේ අලුතු වැඩක් කිරීමේ උතුම් තත්ත්විමතාකාම ගැණත් සැලකීමක් වශයෙනුද සුසෙව් ද සොයිසා යම් ගුණවිශිෂ්ට විපුල ජ්‍යසූරිය කරුණාරත්න දිසානායකයා වාසල මුදලි මහත්තෙරයානන්ට ලඞ්කාවාසී සර්වදේශික ජනයා විසින් කැප කරණ ලදි. 1871 දෙසැම්බර් මාසේදීය.

කරලුහ. මෙම මාලය රත්රනින් නානා අගනා මිණිමුතු ආදියෙන් සමලඬකොට තිබුනේය. මෙදිනද නොයෙක් පලාත්වලින් නොයෙක් ජාතික මහත් ජනසමූහයක් රැස්ව මේම උත්සවයද ගරු ගම්භීරාකාරයට පැවැත්නුහ

———:o:———

ලොකාඛ්‍යෂ සඳහා මෙතුමා කල අනගි වැඩ.

———

වාහොල්ලේ විශාල කුඹුරෙන් ලැබෙන අයප්‍රයොජන දුක්ඳත් ජනයා උදෙසා පිනට දීමට මෙතුමා වෙන් කොට තබා ඒ ගැණ වැවසාදා පණිවා කැබුවේය. අද දින දක්වා එයින් ලැබෙන මහත් ප්‍රයොජන ද සොසිසා පළල එයින් පිනට දිගෙණ් එනුලබයි.

———:o:———

හඵුරුදු දනය.

———

වසි 1854 රේ සිට නත්තල් උත්සවයට සහ ජනේරු උත්සවයටත් අතර පැමිණෙන කිවිදින යෙහිදි දහස් ගණින් යාචකයන් රැස්කරවා හාල් සහ මුදල් පරිත්‍යාග කරණ සිරිතක් පැවැත්විය. සිහමන සඳහා යාමට ලජ්ජාඇති පුළුන්නන්ට හාල් සහ මුදල්ද විලිදු දෙන සිරින සඬ්ගීයන වනතුරුම් නොකඩව පැවැත්විය.

———:o:———

බෘඤඛාගාරය.

———

මොරටුවාසි දිළිඳු අයට නොමිලයේ බෙහෙත් ලබා ගැණීම සඳහා බෘඤඛාගාරයක් විකිටුවා දිමෙන්ද, වෙදකම් කරවාගැණීම සඳහා කී. වැන්විවෑවි නම් වෛද්‍යයා පත්කර "රසධා" නම් මොරටුවේ කුරුඳුවත්තේ අගනා

නිවසේ පදිංචි කරවීමෙන්ද, අනාථ රෙජිමේන්තුව සුව පහස් ලෙස විශ්‍රාම ගැන්වීම සඳහා කඳවල කුඩා ආරෝග්‍ය ශාලාවක් තනවා දීමෙන්ද මහොපකාරයක් කර දුන්නේය. හෘද ශීතල සත්පුරුෂ තෙම එම වෛද්‍ය නැන මිය පරලොව යනතුරුම ඔහුට සහ ඔහුගේ කුවුම්බ සන්ධාපණය සඳහාන් වැටුප්දීගෙණ ආවේය.

———:o:———

සම්මාදම්.

එවකට මොරවුවේ ඇතුව ගිය එඩගලනත සහාවේ ශාන්තුශාලාවට හොඳ සම්මාදමක්ද දීගෙණ ආවේය. මේ දීමනාව කරණකොටගෙණ එම ශාන්ත ශාලාවේ දිසු ණුව අතිශයින් උසස්වුනා පමණකුදුනොව බාල පරම්පරාවට විපුල ප්‍රයෝජනයද විය.

———:o:———

ගල්කිස්සේ ඉඩම සහ හොඩනැගිලි.

තම සහෝදර ෆ්‍රෝන්සිස් ද සොයිසා මුදලි මැතිතුමාගේ ඇතුවගිය අදහසවන ශුද්ධ එම්මානුවෙල් දෙවස්ථානයේ නඩත්තුව පිණිස ගල්කිස්සේ ප්‍රසිද්ධ හොජන ශාලාව ඉදිරිපිට ඇති ඉඩම් දෙකක් ගහකොල හොඩනැගිලි සහිතව පිදුවේය. මේම ඉඩම් සහ හෙවල් දෙනද දුනට රුපියල් පණස් දහසකට වඩා අගනා බව දනිමු.

———:o:———

මහ ජලගැල්ම.

වසේ 1872 කේදි ගලනලද මහ ජලගැල්මෙහිදී සුසෙව් ද සොයිසා මුදලිතුමා දහස්ගණන් සේනාවට තම කෝපි ගබඩාවල වාසයට සලස්වා තැම බිම වසහුදී යෙන්ද මුදල් දීමෙන්ද මහත්සේ උපකාර කෙළේය.

මෙපමණකුදු නිශාබද්ධ නොවී ජලගැල්ම නිසා විපතට පත්වූ පලාත්වලට හාල් කරවල තුණ්ඩ යැවී මෙන්ද මහත් ආධාර කෙළේය. එතුරෙන් කෑමි බීමි නිය ගෙවල් නැවත තනාගැණීමට උදව් ඉල්ලා ආ අසරණ ජනයාට පින්වත් පරාක්‍රමී මුදලිතුමා මතු නොකොදුරණසේ උපකාර කෙළේය. තවද ජලගැල්ම කරණකොටගෙන් විනාශවූ මනුෂ්‍යයන්ට මෙතුමා කරණ ලද විපුලොපකාර ඇසූ, උපකාර නොලබපු අන්‍ය පලාත් වලින් පැමිණි ජනයාවද මෙතුමා මහෝපකාර කරපූ සේය. මේ බැව් ඇසූ ආඥුව සහ මහජනයාද මුදලි තුමනේ මෙම දයාවන්ත මහොපකාර ගැණ බොහෝසේ පැසසූහ.

———:o:———

රාජකුමාර සඛ්‍යතය.

සිරිලකට සම්ප්‍රාප්තික නෛකශ්‍රීන් විරාජමාන ඇඩ්‍රියන් ක්‍රිමන් මහා රාජ්‍යයගේ පුත්‍ර ඇඩින්බරෝහි ආදිපාදෙත්තම ඥානන් වහන්සේට දුන් රෑ කෑම සම්බන්ධව ද සොසිසා මහතාන් සමඟ මෙතුමා මහත් මුදලක් වියදම්කොටලඛ්ධා වාසින්නේ නඹුව මොනවට රක්‍ෂා කෙළේය. මේ උතුම් සඛ්‍යතය සිදුවීම හේතුකොටගෙණ අදත් සිංහල ජනතාව ඉතා ප්‍රෞඪභාවයෙන් සිටින බව දනිමු.

———:o:———

ආදර්ශ ගොවිපල.

ලක්වැසි සිංහල ජනයාගේ අභිවෘඛ්‍යය සලකා මහත් වැඩ රාශියක් කරණ අවියෙන් සහ ඇඩින්බරෝහි ආදිපාදයානන් වහන්සේගේ උතුම් නාමය නිතර සිහිවීම සඳහාත් ආදර්ශ ගොවිපල නමින් ගොවිතැන් ආදිය නිස් ප්‍රකාර දියුණුකිරීමට යෝජනාවක් ආරම්භකිරීමට අදහස්කොට ඒ ගැණ රුවියල් දහස් දෙකක් පරිත්‍යාග කෙළේය.

ST. JOHN'S CHURCH AT PANADURA.—පානදුරෙහි ශුද්ධවූ යොහනගේ දේවමන්දිරය.

ශුඛවූ සොහන්ගේ දෙවමඤ්චරය.

පාණ්දුරේ ශුඛවූ යොහන්ගේ නාමයෙන් මහැඟි දෙවමඤ්චරයක් රුපියල් විසි දහක් පමණ වියදම්කර සංස්ථාපිත කෙළේය. "ඉපිස් කොපල්" සභාවේ දෙවි නිවෙස් ඉදිකරණ පිළිවෙළට මෙම දෙවමඤ්චරයද තුරුසාකාරයට ගොඩනඟණ ලද්දකි.

මෙම දෙවමඤ්චරය කැපකිරීමේ මෙහෙය වසේ 1876 සේ සැප්තැම්බර් මස 14 වෙනි දිනට නියමකොට සියලු කටයුතු සම්පාදනය කරණ ලදින් ඉතා ගාම්භීරාකාරයට පැවැත්නුහ. අතිගරු **කොපල්ස්ටන් බිෂොප්** සාමීන් වහන්සේ ප්‍රධානකොට ඇති, ගෞ. එබ්‍රහම් ඔෑන්දිස් උන්නාන්සේ සහ තවත් සුදෙසික දෙවගැතිවරු සමඟ ඉංග්‍රීසි දෙවගැතිවරු කීප නමක්ද එකතුව කැපකිරීමේ මෙහෙය පැවැත්නුහ. මෙම මෙහෙය සඳහා ලකිසුරු **ඩබ්ලිව්. එච්. ග්‍රෑගර් උතුමානන් වහන්සේද** එතුමාගේ අමාත්‍යතුමාද, මහලේකම් ධුරන්ධර ඒ. ඇන්. බර්ච් උප ආණ්ඩුකාර තුමාද, ප්‍රසිඛ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ඇඩිමස් තුමාද වැදගත් අන්‍ය සිංහල ඉංග්‍රීසි දෙමළ ආදි මහත්වරු රාශියක්ද පැමිණ සිටියෝය. මොරටුවේ පාලම සමීපයේ සිට පාණ්දුරේ මෙම අභිනව දෙවමඤ්චරය දක්වාද, එහි සිට මුදලිතුමාගේ වලව්ව දක්වාද, නා නාප්‍රකාර තොරන් වලින්ද ආරූක්කු ආදියෙන්ද, කොඩි ගොප් ආදියෙන්ද පුදුමාකාරයට මහත් මුදලක් වියදම්කොට සරසා තිබුනේය. මේ ඇර වත්තල්පොල හෙන්ද්‍රික් කුරේ මහත්මයා විසින් ඉතා ලක්ෂණ විවිධවණ් කඩදුසිවලින් තනාගලද තොරණක්ද, මිගෙල් සොසිසා මහතා විසින් මොරටුවේ පාලම අසල ඉතා ලක්ෂණ තොරණක්ද බැඳ තිබුනේය. රොමානිස් පීරිස් වණ්ණාකුලසූරිය ගුණවර්ධන මුදලිතුමා විසින්ද අඟනා බිහිදෙරක් තනවා තිබුනේය. උතුමානන්

වහන්සේ සහ පියිස දෙවමෙහෙයෙන් පසු මුදලිතුමාගේ පාණ්දුරේ වලව්වට පැමිණ ඉතා අඟයට පිළියෙළකර තිබුන දවල් කෑම අනුභවකොට ඒ ගැණ මුදලිතුමාට සතුතිකොට මහත් සතුටින් පිටත්වූහ.

——:o:——

පාණ්දුරයේ ආරෝගෘ ශාලාව.

මුදලිතුමා **පනලේගලදී** සිතූ සිතිවිල්ල සම්පූර්ණ කරමැයි අදහස්කොට පාණ්දුරේ දෙවමඳිරය සමීපයේම මහත් මුදලක් වියදම්කොට ආරොගෘ ශාලාවක් තනවා ආණ්ඩුවට භාරදුන්නේය. මෙම ආරෝග්‍ය ශාලාව තනා තිබෙන මහ පොල්වත්තේ මෙවැනිට ඇති වටිනාකම අතිශයින් මහත්ය. මෙම චිත්තද ආරෝගෘ ශාලාවද කරණකොටගෙණ සාමාන්‍යයෙන් මහජනයාටද වෙසෙසින් පාණ්දුරු වාසින්වද සිදුවී තිබෙන විපුල ප්‍රයොජනය ගැණ වණිනා කිරීම දුෂ්කරය.

——:o:——

පාණ්දුරයේ ශාසන ශාලාව.

පාණ්දුරයේ පිහිටවා තිබුන ආණ්ඩුවේ පාඨශාලාව දුර්වලවෙගෙණ යන කාලයේ මුදලිතුමා එම ශාලාව සභාව භාරයට ඉල්ලා රැගෙණ ශ්‍රද්ධාවූ යොහන්ගේ නාමයෙන් ශාස්ත්‍ර ශාලාව ප්‍රකෘතිමත් කර පිහිටුවා දරුවන්නේ ශාස්ත්‍රාභ්‍යාසනය වර්ධනයට ඉවහල්වීය.

——:o:——

මාරම්බ දෙවමඳිරය.

මාරම්බ කඳිම දෙවමඳිරයක් ගොඩනංවා එහිඕවාසි ක්‍රිස්තියානි ජනතාවගේ ලබ්ධි ධර්මානුයොගය මුදුන්පත් කරදුන්නේය. මෙම දෙවමඳිරයද මාහැනි ආකාර මහත් මුදලක් වියදම්කොට කරදෙන ලද්දකි.



THE HOSPITAL AT PANADURE.—පානදුරේ ආතතිහෘ ශාලාව.

මාරාවිල ආරෝග්‍ය ශාලාව.

මාරාවිල වාසීන්ට දෙවමැදුරක් තනවා දීමෙන් පමණක් නොව ආරෝග්‍ය ශාලාවක්ද කරදීමෙන් ඉහලොපා සැපට ඉවහල්වීය. මෙම ආරෝග්‍ය ශාලාවටද මහත් මුදලක් මෙතුමා වියදම් කෙළේය.

———:o:———

හතුරන්කෙත දේවමැදුරය.

හතුරන්කෙත කුඹුරුයායිකාර ජනයා කෙරෙහි කරුණාකර මනොරඤ්ජන දෙවමැදුරයක් කරදීමෙන් උපකාරවූයේය. මෙම දෙවමැදුරය කුඩා නමුත් රට මහත් මුදලක් වියදම්කිරීමට මෙතුමාට සිදුවිය. දෙව මැදුරයට උවමනා දුව්‍ය සැපයීමෙ දුෂ්කරතාවය නිසා සහ කම්කරුවන්ගේ වැටුප් සදහාත් මහත් මුදලක් ඕනෑකළේය. පරාර්ථකාමී මුදලිතුමා වියදම ගැන මැලි නොවී දුටුවන් ප්‍රියකරවන විලස මෙම දෙවමැදුරේ වැඩද හමාරකරලීය.

———:o:———

පාණදුරයේ සොහොන් භූමිය.

පාණදුරයේ දෙවමැදුරය සමීපයේ සොහොන් භූමි භාගයද මහත් මුදලක් වියදම්කොට උස්කර දීමෙන් මළ චුන් භූමදනයට නිබුන මහත් අවහිරයකම් නැතිකරදුවේය. මෙම සුසාන භූමිය ඉතා පහත් බැවින් මිනී වළලෑමට නිබුන මහත් කරදරය මෙතුමා නැතිකර එහි ජනතාවට කළ ශ්‍රේෂ්ඨ සඛ්‍රහය ගැන් අදත් පසසන්නන්ගේ ගණන අප්‍රමාණය.

දුර්භික්ෂය.

වර්ෂ 1877 තේ ලංකාද්වීපට පැමිණුන සාගතයේදී මොරටුව සහ පාණදුරේ වාසයකරණ දහස් ගණන් සේනාවට තවත් හිත මිත්‍ර කෙනෙක් දෙන්නෙකුගේ මද සහයත් ඇතුව නොමිලයේ හාල් සහ මුදල් බෙදූදීමෙන් මෙතුමා කව්දාවත් මතකනැති නොවන මහොපකාරයක් කරලීය.

———:o:———

හිතොපදෙශය.

දඹදිව විසූ සුප්‍රසිද්ධ නීතිශ්වර විෂ්ණු ශර්මන් නම් මහා පණ්ඩිතොත්තමයා විසින් විරචිත හිතොපදෙශ නම් ප්‍රශස්ත පුස්තකය, කළුතර පුලිනතලාරාමාධිපති වැලිගම ශ්‍රී සුමඞ්ගල ගණාචාර්‍ය්‍ය නායක ස්ථවිරපාදයානන් ලවා සන්නකර ලක්වැසි ශාස්ත්‍රාභිලාෂීන් සඳහා රුපියල් තුන් දහසක් පමණ වියදම්කොට මුද්‍රණය කරවා ප්‍රකාශකරලීමෙන් විශාරද සහපතක් කෙළේය. *

———:o:———

කෞතුකාගාරය.

ආණ්ඩුවේ වෛද්‍ය ශාස්ත්‍ර ශාලාව සම්බන්ධ කෞතුකාගාරය ගොඩනැඟීමට මෙම මුදලිතුමා මහත් මුදලක් පරිත්‍යාග කෙළේය. මෙම කෞතුකාගාරයෙන් මීට ප්‍රථමත්

---

* මෙම පොතේ මුලට යොදා තිබෙන ශ්ලෝකය:—

"ශ්‍රීමච් බුද්ධඃ ප්‍රබලො ව්‍යසිතඃ
සූසෙව් ද සොයිසාඛ්‍ය දිශාධිපාඛ්‍යඃ
අනාථ නාථො දිත රාජ මන්ත්‍රි
මිත්‍රාර්පිතා යෙන ඉදං දයාවාන්"

අග ශ්ලෝක තුණ;—

"ශ්‍රීමද්දූසා තත්‍යාග බලාන්විතො යඃ
සූසෙව් ද සොයිසාඛ්‍ය දිශාධිපාඛ්‍යඃ,
ප්‍රශස්ත ශූරො වර රාජ මන්ත්‍රී
ආරාධිතඃ යෙන විචක්ෂණෙන."

ST. STEPHEN'S CHURCH AT MARAWILA.—මාරාවිල ශුද්ධවූ ස්තෙපනුන්ගේ දේවස්ථානය.



THE HOSPITAL AT MARAWILA.—මාරාවිල ආරෝගය ශාලාව.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO

දැනුත් සිදුවී තිබෙන මහත් යහපත ගැණ දත් ලක්වැසි සුනවනාත ජනයා මෙතුමාගේ උතුම් නාමයට නොපසසා සිටිද? මෙසේ තමන් ලැබූ මහත් ධනය ගැණ ප්‍රබුධ භාවයකට නොපැමිණ පරාර්ථය සඳහා එම ධනය විසුරුවා හැරීමෙන් ලොකයාට මහත්වූ උපකාර වුනේය. තවද ජ්‍යෙෂ්ඨ සහෝදර මුදලිතුම විසින් යමක් නියමකර තිබු ණේද, ඒ නියමය මෙතුමා විසින් සර්වප්‍රකාරයෙන් සම්පූර්ණ කෙළේය. ද සොයිසා පවුලට හිමි මහනුවර වතුපිටි රේන්ද ආදියේ ප්‍රධාන කළමනාකාර ධුරයේ යෙදීසිටි හර්මානිස් සොයිසා මහතාට (දැනට මොරටුවේ කුරුඳුවත්තේ වසන හැන්රි ජ්‍රෝජ්ස් සොයිසා මහතාගේ පියා) ඒ මහතා විසින් ද සොයිසා පවුලට අත්කර දුන් මහත් ප්‍රයෝජන ගැණ සහ විශ්වාසකම නිසාත්, තම ජ්‍යෙෂ්ඨ සහොදරයා ජීවත්ව සිටි කාලයේ මොරටුවේ වලව්ව වත්තෙන් කොටසක් වෙන්කොට දැනට තිබෙන කදිම නිවස තනවා ඒ නිවසට උවමනා භාණ්ඩ සකස්කොට තෑගිකල නමුත්, එතුමාගේ හිතට මෙම තෑග්ග මදි බැව් වැටහී තවත් තෑග්ගක් දීමට අදහස්කර තිබෙන අතර ස්වර්ගස්ථවිය. මෙ බව දැනසිටි ගුණවත් මෙතුමා ඉතා අගයඇති එවකට ඉතා ප්‍රසිද්ධ **හාහලේ කෝපි වත්තද** හර්මානිස් සොයිසා මහතාට තෑගි කෙළේය. මෙකී වත්ත පසුකාලයේ පවුම් හතලිස් දහසකට වටිනාකම නැඟ තිබුණේය. මෙ ආදියෙන් මෙතුමාගේ සහෝදරයා නියම්කර තිබුන කටයුතුද, තමන් කළයුතු කටයුතුද කල සුකතන්ට ඉතා හොදින් ඉෂ්ට කෙළේය. ද සොයිසා පවුලේ කටයුතු සම්බන්ධ වැඩට පත්ව

“ශ්‍රී සුමඞ්ගල සංඝෙසො
සබ්බවීරො සත්‍ය තත්පරො
ඛ්‍යාතෙනනං ලිඛිතා විඤ්ඤා
ලොකාභ්‍යාස තපස්විනා.”

“ගතො ගාථො තම් කදු
සිරි එතෙද්‍රා සුමුද්‍රිතා,
හිතොපදෙශ විඤ්ඤාණං
හිත මාගෝප දෙහිනී,”

සුළු විශ්වාසික සියලු දෙනාටම ණයක් ගෙවන්නාක්මෙන් මහත් ගෙවල් වතුපිටි මුදල් ආදිය පරිත්‍යාග කිරීමෙන් මොනවට අනුග්‍රහ කෙළේය. පරහට වැඩකැමති ශෞර විසම්භාදියෙන් යුත් මෙම මුදලි මහාත්‍රීශ්වරයානන් ස්වජාතිය තරයේ ගජනයකල බව ස්ථිරව පෙණේ.

මහම්මදුගම්කාර වැදගත් ජන ප්‍රධානීන්ට මෙතුමා කෑමක් දීමෙන් මොනවට සංග්‍රහ කෙළේය. මහම්මදු ගම්කාර ජන ප්‍රධානීහු මෙතුමාට සංග්‍රහ කරම්හයි සිතා වර්ෂ 1878 වේ ජූනි මස 21 වෙනි දින කොළඹවාසී මහම්මදුගම්කාර ජනයා විසින් මුදලිතුමාට රෑ කෑමකින් සංග්‍රහකරණලදී. මෙම රෑ කෑමට මුදලිතුමා සහ චාල්ස් හැන්රි ද සොයිසා තුමා ප්‍රධාන වෙනත් වැදගත් සිංහල මහත්වරු කිපදෙනෙක්ද පැමිණ මහම්මදුගම්කාර ජනයා මොනවට සතුටු කළෝය.

තමන්ගේ පහසුව සහ ආශාවද, තම පවුලේ පහසුව සහ ආශාවද, තම බන්ධුන්ගේ පහසුව. සහ ආශාවද මිසාහැර පොදු ලෝකයාගේම විපුල පහසුව සහ ආශාව පරිද්දෙන් පරාර්ථකාමී සජේජනේශ්වර මෙතුමාද මහත් ප්‍රයෝජනවත් ලෙස බොහෝ ධන වියදම් කර තිබෙන බැව් මෙයින් මනාව ඔප්පුවෙන හෙයින්, රෝමසකුදු ප්‍රමාණ වස්තුවක් රැගෙණ මියයෑමට අසමර්ථ ජීවිතයක් රක්ෂාකරණ ප්‍රභූ ජනයා මෙතුමා ආදර්ශ කොට ලෝකසංඛ්‍යාට සහපතක්ම ඉටුකිරීමට උත්සාහ වඩනු ලැබේයයි විශ්වාසකරමු.

———:o:———

මෙතුමාගේ විවේක කාලය.

මෙසේ නොයෙක් වෙළඳාම්හිද නා නා විධ කුසල චරිතයන්හිද කාලය ගතකල මෙතුමා, විවේකයෙන් වසන අවියෙන් කලක් පානදුරේ වලව්වේද, කලක් මොරටුවේ වලව්වේද, කලක් කොළඹ වලව්වේද, තවත්

CHURCH AT HANGURANKETA.—හඟුරන්කෙත දෙවිමැදුරු.

DE SOYSA MUSEUM.—ද සොයිසා කෞතුකාගාරය.

SINHALESE DAILY NEWS PRESS

තමුන් සතුටු ඇතිවලදා වාසය කෙළේය. මේගේ වාසය කරණ අතරදා නොයෙක් කුසල ක්‍රියාවල නිසුසුතාවය. මුදලිතුමා මෙහි ශුචරිත ක්‍රියාවන්හි යෙදී සිටින අතර සකල ධර්ම ඉක්මවා උතුතවෙන සඩගාවධර්මයවූ පරිද්දෙන් හෘදය රෝගයට වහල් වූයේය.

—:o:—

රෝගාතුර කාලය.

සුඳුරතර පුණ්‍යපරායණ මුදලිසඳ රෝගාතුරකමින් පෙළීමට පත්වූ නමුත්, ක්‍රශතාවයට හෝ අධික දුබල භාවයට හෝ නොපැමුණුනේය. එසේද වුවත් නොබස්නා යසනේ සයනයට ආසනන බව තේරුමගෙණ එය කාටවත් නොදන්වා පුත්‍ර පුත්‍රීන්ා නොමැත්තේ, තම සතු සකල වස්තු එකම පුත්‍ර පාතිවයට ගැණෙන චාලිස් හැන්රි ද සොසිසාතුමට හිමිකර නිතියට අනුකූල **ඛනඝංරක්ෂණී පත්‍රිකාව** (අනතිම කැමැත්තේ ලියවිල්ල) තනා එහි තම ප්‍රිය භාෂ්‍යාවගේ දිවි තිබෙනතුරු දිය සුනු වැටුප්ද නියමකොට තැබිය. මෙසින් පසු ශෙෂ වශයෙන් තිබ්බිගිය ප්‍රශ්‍රාවාබාධය වර්ධනයවිය. මේව දක්ෂ වෙදුයන්ගෙන් ඖෂධ ගෙණ් එන අතර සැලප වශයෙන් තිබුන හෘදය රෝගය දිසුණුවී හදිසියෙන්ම දික්හහලාවේ සිටින අතර, සිය ලමාඵතනි ප්‍රධාන කොට ඇති බැඳුන්ද දුකී මති ආදින්ද ඛිතමිත්‍රයන් සහ දූසි දසුන්ද දුක් නැමති කලල් විලෙහි පතිතකර වසී එක්දහස් අටසිය අසූ එකේ මැයි මස දෙලොස් වෙනි දින (1881. මැයි. 12) කොළඹ වලවෙදි * මෙහෙර ලොව සමිපත් දුරහැර සුර ලොව නැංගේය.

* "සැල්වේ හවුස්" නම් වලවව.

මුදලිතුමා කලින් කරගිඹුන නියමය ප්‍රකාර මෑන දෙහය පාණ්ඩුරේ වලව්වට මෙදින ඒ කාලයේම හෙණ ගියාහ. ලඬකාවේ සෑම දිශාභාගවලින්ම බඩු මිල සේනාව පැමිණෙන්ට සිටින්සා තුමදුන කෑත්‍ය 14 වෙනි දිනට නියම්කර, ඒ සඳහා උචිතමනා සකල කටයුතුම පිළි යෙළ කිරීම පිණිස චාලිස් හැන්රි ද සොසිසානුමා විසින් කිවිවු බඩු මිලාදීන්ට අවසර දෙනලදි.

———:o:———

අශුභ දින.

එක්දහස් අටසිය අසූ එකේ මැයි මස දසසහරවෙන දින (1881. මැයි. 14) මුළු පාණ්ඩුරයට කිසි කලක මතක නැති නොවන අශුභ දිනක් විය. කාලවණ්ණ හෙහෙලි වලින් පාණ්ඩුර අවකාශය වැසි ගියාක්මෙන් ගෙදෙරක් සල්ලිලන් පාසා කළු කොඩි ඔසවා බඩු මිලාදීහු කාලවණ්ණ ඇදුමෙන් සැරසිගත්හ. මුදලි තුමාගේ අවමඬලඟ පෙළ සරව හාරදහකට වඩා නොයෙක් දිශාවලින් සේනාව අවුත් වැටිගත්හ. මහතුවර, ගම්පල, නාවලපිටිය යන පලාත්වලද කඩ වසා ඒ වෙලඳ ජනයාද පාණ්ඩුරයට මෙදින පැමිණියාහ. වොවුන්න සහ ජය කොන්නයත් අනාථීනවූ රාජිනියක් මෙන් පාණ්ඩුරා අඬහනී තොම දුකට සප්‍රාපතව සකල යසඉසුරු අදුරට පමුණුවා තමාත් මෙදින දුක් නැමති ඝනාන්ධකාර ගෘහයට වැදුනිය

———:o:———

අවමඬලඟ පෙළහර.

කොළඹින් හාර්දිය සහ කළුතොට හේවාපන්න සමුදුවද "පොලිස් බෑන්ඩ" කණ්ඩායමද, හේවිසි කණ්ඩායම්ද විරිවරකොට මහැනි ආකාරයට සරසන ලද මිනි පෙට්ටියේ මැතෙදෙහය බහා රිපිට ආදරවනතයින් විසින් එවනලද ලෑහැණි මල්මාලා අතුරා රන් කඝයානය

සහ රන් පදක්කම් ඒ මතුපිට තබා අසුන් සතරදෙනෙකු යොදනලද ඕගී රථයේ එම අලඞ්කාර පෙට්ටිය තැබුවානුය. ආගම සම්බන්ධ නොයෙක් කොඩි ආදියද, ඉර සඳ කොඩියද පෙරටුකොට වැදගත් මහත් සෙනාවක් පිරිවරාගෙණ මෙතුමා සථාපිත කළ පාණ්දුරේ ශුඛවූ යොහන් නමින් ප්‍රකට දෙවමඳුරුයට පැමිණ එතිදී ඉතා ගරු ගම්භීරලෙස මිලඟුන් සඳහා පවත්වන මෙහෙය අතිගරු කොපොල්ස් වන් ඕනොප්නුමා ප්‍රධාන පූජකවරුන් ඔසින් පවත්වා එම දෙවමඳුරුයතුල ශුම්දුන කළානුය.

කායබල, ඤනබල, ධනබල, සෙනාබල, පුණ්‍යබල යන පඤ්චවිධ බලයෙන් උතතම පරාජ්‍ය කළුයම භජනය කළ මෙම පුරුෂ සිංහ රාජයා එම බල පසම අතහැර මරුමාට වසහවූ රහ මෙසින් දැන ඉගෙණ මෙම පූජිත මැතිවරයාමෙන් ශුචරිතයක්ම ඉවුකිරීමට. සාධුජනතෙම් උතසාහ වඩාවා.

මිනිවල වසා නිමබන ගිලාලෙවනය.

SACRED TO THE MEMORY

OF

Susew De Soyza,

MUDLYAR OF THE GOVERNOR'S GATE

Born, February 5. A. D. 1809.

Died, May 12. 1881.

සුසෙව් ද සොයිසා

ඛමී ගුණවඩන විපුල ජයසූයශ් කරුණාරතන
දිසානායක මුදලි මහත්මයාණන්

උපන්නේ

ක්‍රි. ව. 1809 පෙබරවාරි මස 5 වෙනි දිනදීය.

පරලොව ගියේ

1881 මැයි මස 12 වෙනි දිනදීය.

වයස අවුරුදු 72, මාස 3, දවස් 8 යි.

ඒ රී දූ දන ඉබු සිරදකු හුල් පිංනෙව් සදි නද සුරතුරක් ලෙ ස
තරී දූ සිරී දරු සුසෙව් සොයිසා බිදන් මුදලිදු තුමා පිරී ස ස
ප සි දූ නෙසා දැස කිතුවසින් එක් දහස් අවසිය අසුවක් ව ස
නොමදූ සුව හැර ශ්‍රේ පරලොව දැලොස්වගිතුරුදිහෙහි මැති මි ස

PART VI.

Mrs. SUSEW De SOYSA.

——:o:——

ඝවන අදිඝර.

සුසෙව් ද සොයිසා ලමාඑතනි.

MRS. SUSEW DE SOYSA.—සුසෙව් ද සොයිසා ලොක්කිනි.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

මුදලිතුමාගේ පියාවන ජෝසොප් ද සොයිසා මහතා මෑ ගැණ බාලකාලයේ පටන් දත් බැවින් ස්වකීය පුත්‍රයාට මෑ භාය්‍යාවකොට පාවාදීමට මහත් සතුටකින් සිටියේය. ඒ සතුට ලෙස මෑ සුසෙව් ද සොයිසා මහතාට ප්‍රිය භාය්‍යාව ලෙස පාවාදෙනලදී.

සුසෙව් ද සොයිසා මහතාට වාසල මුදලි තනතුර ලැබෙන්ට ප්‍රථම සහ පසුවද සුසෙව් ද සොයිසා මහතා කරකියන ශුචරිත ක්‍රියාවලට මෑ කිසිසේත් විරුඬයක් නොදක්වා වඩ වඩා එයි ශුචරිත දියුණු කරගෙණ යාමට අනුබලදීමක් වශයෙන් ඉතා සතුටින් නොයෙක් ප්‍රස්තාවලදී තම කැමැත්ත නොමසුරුව දක්නුවාය. මෝතොමෝ ජම්ම වණ්‍ය නමුත් දරුවන් කෙරෙහි මහත් කරුණාවකින් යුක්තව දිළිඳු දරුවන්ගේ අභිවෘඬිය පතා නොයෙක්විට ධනයෙන් උපකාරකළාය. දුක්මත් යාචකාදීන්ට නොකඩවම උපකාර කළාය. මෑ කළපමණක් කුසල ක්‍රියා ඉතා රහසේම කළා මිස ප්‍රතිලාභ ස්තුතිපූජා ලැබීම සඳහා නොකළාය.

කසාද ජීවිතයට පත්වූවාසින් පසු දූරක උගනබය නිසා පොත්පත් කියවීමට හොඳහැටි ඉඩප්‍රස්තා ලැබුනාය. වැදගත් පොත්පත් කියවීමෙන්ද, ගුණ නුවණ ඇති යහපත් වැඩුමහලුන් සමග ආශ්‍රයෙන්ද, සිහි වඩිනයවූ බැවින්, උඩගුව, ක්‍රොධය, මසුරුකම, විපුලාශාව යනාදී අනුචිත එකම ක්‍රියාවක්වත් මෙතුමිතුළ නො පැවතුනිය. තම ස්වාමි පුරුෂයාට මුදලි තනතුර ලැබී තමන් **වලව්වේ මහත්මිය** යන නමින් ප්‍රකටවූ නමුත් ඒ ගැණ කිසි විශෙෂ අභිමානයක් පෙන්නුවේවත්, ස්වාභාවික සුගති, විපයභාශ කරගත්තේවත් නැති බව දැනගත් සියලු නුදිනු මෙතුමීගේ අපදාන ගැණ අභිනන්දන යෙන් ප්‍රශංසා කලාහ.

මුදලිතුමා ඇතමවිට වහා කිපෙනසුලුබැව් හොඳුකාර දත් මෝතොමෝ එසේවූ සෑම ප්‍රස්තාවලදීම ඉතා නුවණින් යුක්තව ක්‍රියාකොට ජයගත්තාය. ස්වාමි පුරුෂයා කෙරෙහි මහත් ප්‍රේමයකින් කල්හැරියා පමණක් නොව මුදලිතුමට

පැමිණි නොයෙක් සුව මදි කාලයන්හි දරුවෙකුට මවෙක් මෙන් උපස්ථාන කළාය. මේහි ගුණ තරණකොටගෙන ම වලව්වේ මහත්මිය **ඇබිගාඇල්** යන ගෞරවාන්විත නාමය දැරිය. මුදලිතුමා මහ ධනවතෙක්ය යනු සිතීමෙන් තමන්ගේ යටහත් පහත්කම බිඳහෙලේය යන හයෙන් ඒ ගැන නොසිතා, සත්චරිත ආදියෙන් උසස්තව හිස ප්‍රකාර කල්යවමින් ලොකයාගේ මනනයනු දිනාගත්තාය. මෝහොමෝ තමැඩාම් මුදලිතුමාත් සමග මහනුවර, කොළඹ, මොරටුව, පාණදුරය යනාදී ගමවල විවිත්වව පදිඤ්ඤව සිටි කාලවලදී ඒ ඒ ගමවාසි දුක්පතුන් කෙරෙහි මහත් සැලකිල්ලෙන් ක්‍රියාකළාය. ඒ තරණ කොටගෙණ බොහෝදෙනාගෙන් ගරුබුහුමන් ලැබීය.

මෙසේ සිතිනුවණින් සුසතව දවස්හරිණ සමයෙහි තම සැඩාම් මුදලිතුමා රෝහාතුර වූයේය. මෝහොමෝ දක්ෂ වෛද්‍යයන් ගෙන්වා නොයෙක් අනුමින් තමැඩාමියා රෝගාතුරකමින් මුදවා ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරිය. නමුත් ඒ සියල්ල නිස්ප්‍රයෝජන වීමෙන් මුදලිතුමා හදිසි මරණයට පත්ව මෑ තනි විය. ගුණවත් සහ ධනවත් පුරුෂයාගෙන් වියෝගවූ වලව්වේ පැමිණිනැන මහත් ශොකයට පැමිණ, අවමඟුල් කටයුතු මොනවට ඉටුකොට කුසල ක්‍රියාවෙහිම හැසුරුණාය.

මෙම වලව්වේ මහත්මියට සහෝදරයින් දෙදෙනෙක් වූහ. එයින් ජෙෂ්ඨභාතෘවූ ප්‍රසිඩ ධනවතෙක්ව සිටු **හේර්නිස් පිරිස්** මහත්මයා සහ දැනට මහනුවර වසන බොහෝදෙන දන්නා හඳුනන **දුවිස් පිරිස්** මහතාත්ය. පුරුෂයාගේ වියෝගයෙන් පසු මෑ තම සහෝදර දුවිස්. පීරිස් මහතා සමීපයට පැමිණ එහි වාසයකළාය. වලව්වේ මහත්මියගේ ජීවිකාවෘත්තිය සඳහා තම සැඩාම් පුරුෂයාගේ ධනයෙන් මසකට රුපියල් දහ බැගින් සහ **සැල්බි හවුස්** නම් වලව්වෙන්ද, සන්ජෝසොප් පිටියේ **ග්‍රෙහම් හිල්** නම් නිවසෙන්ද ලැබෙන මහත් ආදායමද ලැබුවාය. තම සැඩාම් පුරුෂයා විසින් අවරුද්දක් පාසා දුන් මුත් යාචකාදීන්ට

දිහෙන් ආ උතුරතර දූනය වලම්බෙ මහත්මයා ජ්වත්ව සිටිනතුරුම නොනසා පරිපූර්ණ කළාය. වෛධව්‍යක දුක්‍රින්ට සහ වෙනත් දුරිදු ජනයාවද ගුප්තලෙස බොහෝ උපකාර කළාය. එසඟලන්තන සභාවේ සෑම ක්‍රියාකාරියක්ම ඉතා හයානියෙන් ඒ සභාවේ ධර්ම මොනවට රැකගෙන්නාය.

මෙතුමි සියසැම් බුදුලිතුමාගේ නාමය දිගිකාලයක් මතකතිබීම සඳහා ඉතා අගයට තනනලද ලෝහ ලේඛන දෙකක් එකාකාර තනවා එකක් පාණ්දුරේ ශුඛවූ යොහන්ගේ නමින් ගොඩනගා තිබෙන දෙවමැදුරේ බිත්තියේද, අනික කොළඹ පුරුප්පොකුණේ **ක්‍රයිස්ට් චර්ච් කැතිඩ්‍රල්** (Christ Church Cathedral) දෙවමැදුරේ (ගල් පල්ලියේ) බිත්තියේද සවිකර තැබුවාය. මෙයින්ද මෙම උත්තමිය යස ගුණවත් කළ ගුණ සැලකීමෙහි අගය දත් චරගනක් බව මොනවට ඔප්පුවේ.

මෙසේ වසන අතර වෘධභාවය කරණකොටගෙණ රොහාතුරවූයේ මේලෝ සියලු සැප ආත්හැර සත්සෑට වස් සිව්මස් සවසි දිනක් (වෂ් 67. මාස 4. දවස් 26 ක්) ආසුවළඳ, එක්දහස් අටසිය අූනූතුණේ මැයි මස දේසුස් ක්‍රිසතුස්වහන්සේ සඩඹයට නැඟි දින වන ඇසොලොස් (1893. මැ. 11.) වෙනි ගුරු දින සඩඹසාවිය.

——:o:——

අවමඟල්‍ය පෙළහර.

වෂ් එක්දහස් අටසිය අූනූතුණේ මැයි මස දහතුන් (1893. මැ. 13.) වෙනි දින ඉතා මාහැනි ආකාරයට නේක්ක ලැලිවලින් තනනලද මිනිපෙට්ටියේ මෙම ලමා එනනිගේ මෘතදෙහය බහා එය අනෂි පලසකින් වසා රිපිට ආදරවනතයින් විසින් එවන්ලද අනගි මල්මාලා සොඳ කාලවණ් අසුන් දෙදෙනෙක් සොදනලද මිනි රථයේ මිනි පෙට්ටිය තබා කොළඹ මෝදර **විස්ට් බංගලෝ** නම් නිවසේ සිට කොටුවේ දුම්රිය නවතන ස්ථානයට



TABLET.—පළිඟ පලෝමය.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO

පිටත්වුහ. අවමඟුල්ය රථය පසුගාගයේ වහාම මිනු සමූහයා අශ්ව රථවලින් ගමන් ගත්හ. සවස දෙකහමාරට පමණ අවමඟුල් පෙළහර කොටුවේ දුම්රිය ස්ථානයට ලඟාවිය. නියමිතව තිබුන වෙලාවවන දෙක පසුව මිනිත්තු පහකට විශෙෂ දුම්රිය පැමිණියාය. එය පැමුණුන කඩනම්න් රව යාතර තිබුන **ප්‍රින්ස් ඔප් වෙල්ස් ඇට්ලේ** නම රථයේ මිනී පෙට්ටිය තබා කිට්ටුවර ඤාති සමූහයා වටේ වාඩි ගත්හ. අවශෙෂ දනරිස අනය රථවලට නැගගත් වහාම දුම්රිය කොටුවෙන් පිටත්විය.

පස්වරු තුන් පසුව තත්පර හතළිස් පහට පාන් දුරයට දුම්රිය ලඟාවිය. දුම්රිය ස්ථානයේ පවන් පියවිලි සහිතව මිනී පෙට්ටිය මාවතට ගෙන් සුදුනටිකර තුබුන සුදුඅසුන් දෙදෙනෙක් යොදනලද රථයේ මිනී පෙට්ටිය තබා ගවන්ගත්හ. වැන්ගැඩිසල් වෙදුමහතා, ඇල්. පොන්සේකා මහතා, ඔවන් මෝර්ගන් අවකාත් මහතා, රොමානිස් පීරිස් මුදලිතුමා ආදිතු මිනිකරත්තයේ දෙපසින් ගමන්ගත්හ. මෘතදෙහයේ උත්තමාඩිඟ පාර්ව යෙන් මුතු කුඩයද, සුසෙව් දෑ සොඩිසා මුදලිතුමාගේ ශේවාපන්නක්කාරයෝ දෙදෙනෙක්ද, ගමන් ගත්හ. රථයට පෙරහාගයෙන් "වලන්ටියර්" තුන්ය කණ්ඩායමද, මොරටුවේ ශුඛ ඒමමානුවෙල් දෙවමණ්ඩිරයට ඉහි කොඩිය ගත් බී. පී. මැන්දිස් මහත්මයාද ගමන්ගත්හ. ඒ කිට්ටු වෙන්ම ඉරසඳ කොඩිය සහ ආලවට්ටමගත් මහත්වරුද ගමන් ගත්හ. රථයේ පසුගාගයෙන් ලමාඒනතියේ බසිලුහුද, ප්‍රසිඩ නීතිඥ මහත්වරුද, ගුරුවරුද, පනු කතු වරුද, මුදලිවරුද, මුහන්දිරම්වරුද, වෙළඳ ජනයාද, ඉංග්‍රීසි මහත්වරුද, බර්ගර් මහත්වරුද, රේඤ මහත්වරුද, නොතාරිස් මහත්වරුද, සිඤ, බඩහාලි, මරක්කල, පාර්සි, දුවිඩ, කවිසි ආදී සාමානය ජනයාද, දෙදහක් පමණ ජනතාව ගමන්ගත්හ. පාණ්දුරා ගම්වාසින් විසින් වලව්වේ මහත්මියට ගෞරවයක් වශයෙන් සල්පිල් වසා කාල කෙහෙලි ඔසවා වග හුදුවැලි ඉස තිබුනේය. මුදලිතුමා

එසින් පාණ්ඩුරංග් ඝාවිහාකල දෙවමන්දිරය සම්පයට අවමඟහල්ා පෙළහර පස්වරු ගතරහමාරට පමණ සම්ප්‍රාප්තවිය. දෙවමන්දිර චාරයෙහිදී ෆොරවනීය රිඩස් ඩෙල්, ටුචානිස් ද සිල්වා, ජයසේකර, ඩි. ද මැල් යන දෙව ගැතිවරු සහ නායනා තණ්ඩායමත් සම්මුඛවූහ. එහිදී රිඩස්ඩෙල් දෙවගැතිනු ප්‍රධානව දෙවමෙහෙය පවත්වා, මිනිදෙවිවිය එම දෙවමන්දිරයේ ඝඩාම්පුරුෂ මුදලි තුමාගේ මිනිවළට ඍාව චාවපාඨයෙන් සූදුනමකර තුබුන වලෙහි බහා සියලුදෙනා එසින් වලට මල් දැම්මෙන් අනතිම සඩ්ග්‍රහය කරණලදි.

උපන් දින පටන් එසඳ සැප ගැණවත්, රුව පිණ ගැණවත්, පුරුෂ එක්‍රමයෙන් සුත් මුදලි මනත්‍රිඤ්ඣර යෙතුගේ ශ්‍රෙෂ්ඨ ප්‍රිය භාඨ්‍යාවක් බවවත්, ධන සහ බලසම්පනනයකම් ගැණවත් අබැවක් පමණ නොමතැයු කොරවූ මරුවා මේ උතුම්ය තම මුඛ බහාගත් ලීලාව ගැණ සම්රණය කරමින් සකල සත්‍රිනුම ඉවරිනයක්ම වහ වහා පුරුදුකිරිමට වෙර වඩත්වා !

මිනිවල වසාගිවෙන ගිලා ලෙවනස.

THE REMAINS OF

ENGELTINA PIERIS

Dissanayeke Lamaetena

Widow of S. De Soysa

Dissanayeke Gate Mudaliyar

BORN 15th DEC: A. D. 1825.

DIED ON ASCENSION-DAY,

THURSDAY 11th MAY 1893.

AT

"THE WHIST BUNGALOW"

COLOMBO.

AGED 67 Y, 4 M, 26 D.

:o:

This memorial stone is placed

By her affectionate &

Sorrowing Brother

LOUIS PIERIS.

PART VII.

POEMS ON GATE MUDLIYAR,

SUSEW De SOYSA.

—:o:—

සත්වන අදියර.

සුසෙව් ද සොයිසා

වාසල මුදලි තුමා පිළිබඳ ප්‍රබන්ධ.

සු සෙ වි ද යො යි සා

ධර්ම ගුණවර්ධන මිපුල ජයසුන්දර කරුණාරත්න දිසානායක

මුදලි මහත්මාවරයානන්ට

ඔප්පුකරණලද සතුතිපත්‍ර.

(හර්මාන්ස් දිසෙස් මහතා විසින් ඉප්පුකරණලදි.)

ප බෙ ර සිසිර කරහර හරගිරකිරිසිදු ගිජිදු දුව ල
සිසිරසුර බිඳෙන් සුරගඟ සඳිසිනොමද යසරැස දු ල
නොහැර සුදන තුඩතුඩසැදු මෙන් දසදෙසැ සොඳින්පතල
අ ද ර පෙමැති **සුසෙවි සොයිස** මුදලි මැනිදු රජ වාස ල

නි හි න් රඳන බඹකත සිරිකත වතසුතු පුළුලර න ද
සොඳින් දිනු සිය ලකුණෙන් සිත් අලවන බිඳ මද ර ද
ද න න් සැඩොල් කෙරෙන් දුරුවැ සුදනන්හා ඇලුනැමසඳ
සෙහෙන් දිනනු මැනව අනිත් කැල හැම මැනිදුනි ඔද සි ද

ප ම ණ තුදුටු මිහිලොල් යදි නද දෙන දී මුවරද ද න
දෙ ර ණ සරණ කිවි නළු හැම නිසු ත්යෙන් මන පිණ ව න
ක ල ණ පොරෝණ්ඩ්ස් ද සොයිස වාසල මැති මල්බැව න
සොබණ මුදලි නුම වැජඹේ **සුසෙවි සොයිස** නට මන මෙන

නොවන ඉවර දන රැස්නොට තුබූ නිලින වස් සතුටි න
ඵ සි න උඩතු නොවි පරැස දුසිමන් මම උතුමැයි ය න
ස ව ණ මිසුරු පියතෙපලෙන් ඇසු ඇසුවන් සිත් පිණවන
ද ර ණ **සුසෙවි සොයිස** දිසා නායක නම මැනිදු දිලෙ න

නොමද රසැති වාසත් කිසි දිනකත් නොම මහණ මහ රු
ගි ය ද සබා මැදට නොබා බඳින දනන් බසින් මිසු රු
මී ල ද නොතෙක් උවත් සිහින් දෙන සුහුවම් ලොබනොවදු
පැ ල ද දිලේ කස්නානය කුමරු අබින් දුන් මැනි සු රු

ලොවට පින්ට මහදනවත් සුදනතුමෙක ලොබ නොමැකැ ළු
මොහුට දුනට දීම යෙහෙක මැති තනතුර රජවාස ළු
මෙරටැ නොවන හරණ තුමට ඇල්ප්‍රඩ් නරනිදු වදහ ළු
ලෙසට ලැබූ කස්තානය දරා සිටින මැනිසඳ බ ළු

සතුරු දුදන මහත් මතැත් තැත් හළ සිරදෙස් විලු ස
මිතුරු සුදන තඹුරු වනය ඔදකළ පිරි තරිදු නිදෙ ස
ඇසුරු කරන් දන හැම නිති ඔවා අමායෙන් දෙනතො ස
සොදුරු සුසෙවි සොයිස දිසා නායක මැති බබලා ය ස

සබඳ රැස් එක් ලෙසට දුක් සැප දෙක්හි බිහුඳැදි
රුවක් විලසි න
නොමිද බැතියෙන් පිටු නොදී රක්නා මෙතෙම සුව
විදිනු වෙසෙ සි න
නවිද ඇල්ප්‍රඩ් කුමරු අණදුන් ලෙස රොබින්
සොන් උතුම් එනර න
පැහැද සතුවින් දෙවා වදහල මුදලි තනතුර
දරණ ගරුව න

පිසබ සිරිකත පැරැසු කොදරැස ඔදකිර්මෙහි
සඳකිරණය ක
දිගඹ උරසස සදුන් නොවිතර ගැල්වූ අතුබඳ
නැඟීන් නොවැ ල ක
පොලඹ වනදුවු දුවු දනන් හැම රුවින් අඩුනැයි
දෙනේ නොව සැ ක
කොළඹ වාසල මුදලි මැති සොඳ සුසෙවි සොයිසා
දිසානාය ක

රජසතු මුදලින්ම කරවූ උතුනොව න
දුකසිතු ඇලෙන කස්තානය අතහිව න
හිඟිමුතු පැළඳි මෙමැතිදුහට දුනි තුටි න
ඉණිසුතු රොබින්සොන් නරනිදු සියඅහි න

ඉදුරු දෙස මෙමැතිදුට කුදු මහත්ව නා
ලවිරු නොසින් කළ උවටැන් යමෙක් ම නා
අකුරු හලෑ කෙටූ වැනි නොනසී සිහි නා
හිතුරු තුමෙක් කවිදෝ මෙතුම සැදී ව නා

රැකෙන දන මෙතෙක නැත මොනු වෙකැයිදෙසා
කරණ යම් කිව්ව ඇත හරියි නොව්ම සා
උරණ වුන් හවත් දෙගි මුදු බවා බ සා
පුරණ ගුණ මෙමැයි දැක සිත පිණාතො සා

බසින් චත් නොකොට අයදුම් මෙතුම කිසි ත්
රජ්ජුන් විසින් දෙනලද තනතුරු ගරු ල ත්
එසින් මෙමැති සරිවෙක් කව්යේ අප ල ත්
නිහින් මුදලි තුම දැතුමම සැපයි මහ ත්

සුරතුර සිතුරුවණ දෙක නිති පරදව න
සිරිසර වැලඳි දිනැ දිනැ හැම උනු නොව න
වැරසර නෙදුගි බබලන ගුණ මිණිබර ණ
පැණසර මෙතුම ලැබුනේ වාසනාවෙ න

පිරිසිදු සඳකිරණ යස රැස දියේ පෙ ල
මුදලිඳු දිසානායක කොළඹ වාස ල
පිරිසිදු වතින් සැරසි ගොස් පාකම ල
පිරිසිදු අතින් වැඳ සකි දෙන් මෙපත හෙ ල

සුසෙව් දැ සොයිසා ධම් ගුණවතිනා විපුල ජයසූරිය කරුණාරත්නා දිසානායක තොළඹ වාසල මුදලි මහනිලවර යානන් වහන්සේට සතුති වසයෙන් ප්‍රබන්ධකරණලද කාව්‍යයන් සහිතවූ එම මුදල් මහනිලවරයානන් වහන්සේ අප්‍රමාණවූ දෙවියන් විසින් ආරක්‍ෂාකරණු ලබමින් දිසි කාලයක් මුලුල්ලෙහි සකලාගි වාඩියෙන් නොපිරිහි සැප විඳින සේක්වයි ප්‍රබන්ධකොට ඔප්පු කරණ ලද මහලාඛකයයි.

ඇණ්ඩර්සොන් ලකිදෑගෙදුල් කොවිලහින් හෙල්හි බහා
රන්දමක්
මේ ලක්දිවතුල වාසලේ මුදලිදු බැවිහි නැබියේ යමෙක්
සව්සෙත් සුන් මෙකොලොම් රටේ මොරවුවැස් නම් ලත්
ගමෙහි විසූ
පෝසත්වූ දුසි දස් රුවන් මුතුමැණික් ඇතන් සිරින්වුදිමුත්

සොරෝනිස්ද සොසිසා, දහටගුන්, වඩන අෑ නට ද රෑ
නන්දෙස් පසිදුයසා කොලඹ මහ, වාසල මුදලි සු රෑ
කහතුරු ලැබ වෙසෙසා, වැජඹි එම්, මැතිදුගෙ බෑ සොදු රෑ
වෙම් **සුසෙවිද සොසිසා,** හට මෙකල, වාසල මුදලි සු රෑ

සහතුරු දෙහ ලෙයිනා, කුමරසඳ, ඇල්ප්‍රඩ නම පැහෑ ද
වදහල බස මුදුනා, තුටුවැමින්, පිළිගෙණෑ ලක හිරි ද
එසුමිරු අරුකෙමෙනා, රදසතුම්, මහදන රුස්වියි ද
මිණිබැඳ කල සොබනා, සිරිතිපුල්, කස්තානය පබ ද

මහතුවරට හෙන් නා, මේ මැතින්දු ලකින් ද
නොමිරේ නිලදරන්නා, බුමැතින්දු මැදි න් ද
කුමිරිදු අණ පෙන් නා, දිලමින් ඒ නොමින් ද
සුරතිති හෙණ් දුන් නා, රාජවාසල් සබ න් ද

සක නිරිඳු වසින් එක්වා දහස් සත්ඝයක්වූ
සතරතුවෙනි වස්හි හිමිරසා හොන් රුසාවන්
බුදදිනෙහි දෙලොස්වන් ලක්තුමෙක්වූ **රොබින්සොස්**
නිරිඳුගෙ සුරතින් දුන්සේක කස්තාන රත්නේ

එදින කිනුවසින් එක්වා දහස් මන් පිරිලා
තුරු අවසියයක් හා සැත්නෑ එක්වන් වසක්පත්
සුවිසිවෙනි බදදු දුවලැස් මැස් මසේහි
ලොවැසියෙන් දරත්වා සිත්හිලා සොමනසින්බෝ

ලෙනාරුස්තුරු රුස්තියෑස් සුරනිවෙස් පාරුස් නිදස් නි අඹුස්
පුල්සේ පුල්සුරකල් අමා උවිදුකල් කල්හාරතුල් කිත්තුමුල්
දෙස් දෙස්හි පළවූ **සුසෙවිද සොසිසා** දම්අෑබිදන් මිත්සුගත්
රස්ලත් ලක්රද වාසලේ මුදලිඳු දික්කල් විඳිවා මඟුල්

දෙව්අත් දෙවිතුරු සුන්කලස් සුරබිදෙන් සේසත් සිපත්
කිත්සඳුන්
දික්අත් තුම්තෙල ලෙව්දෙවින් කළපසන් සිත්සත්
ගුණේහි යෙදූ
දෙස් දෙස්හි පළවූ **සුසෙවිද සොසිසා** දම්අෑ බිදන් මිත්සුගත්
රස්ලත් ලක්රද වාසලේ මුදලිඳු දික්කල් විඳිවා මඟුල්

කම්සත් දන්දන මේලොපුන් සතරාකුම් ලෙස්නෙන් නිගොස්
ගාවණ්
සව්වත් මීලඟරුස් නවස් පිපිච්ලක් වන් දුන්නලේදී සැදී
දෙස් දෙස්හි පලවූ **සුගසම්ද සොඹිසා** දම්අෑ බ්දන් මිත්සුගත්
රක්ලත් ලක්රද වාසලේ මුදලිදූ දික්කල් විඳිවා මගුල්

සත්අත් කත්විසුවත් සරින් තුරිසුරා මන්යොන් දිනූ රූසරා
පත් පත් සත් නිකරන්ට කප්තුරුසුරා ඉන්වත්ලැබුම් සින්පුරා
දෙස් දෙස්හි පලවූ **සුගසම්ද සොඹිසා** දම්අෑ බ්දන් මිත්සුගත්
රක්ලත් ලක්රද වාසලේ මුදලිදූ දික්කල් විඳිවා මගුල්

පෑපත් පෙම් සුවදැත් දිමුත් හැයුරුමැත් කිමේ දුනිමේ ඊයත්
යාපත්නූ නෙසිරිත්සිතේ දෙන නුමුත් ඒසිත් පැහිමේ උසින්
දෙස් දෙස්හි පලවූ **සුගසම්ද සොඹිසා** දම්අෑ බ්දන් මිත්සුගත්
රක්ලත් ලක්රද වාසලේ මුදලිදූ දික්කල් විඳිවා මගුල්

සත් සත් මත්මන්ඟන්ගෙ දප් සිඳ බ්දිමේ සිරදෙස් වන්විකුම්
සත්සත් සින්කොදරන්හිලිමෙහි සරාකල්හි සදෙක්වන්සුපුන්
දෙස් දෙස්හි පලවූ **සුගසම්ද සොඹිසා** දම්අෑ බ්දන් මිත්සුගත්
රක්ලත් ලක්රද වාසලේ මුදලිදූ දික්කල් විඳිවා මගුල්

ඇල්ප්‍රඩ් නම් නරනින්දු හා රද මැහින් ගෙන් ලත්හය්
නන්රුවන්
පොල්රම් කෙත්වතු දුස්දසුත් කිසනමේ වත් ඇත්නෙමිය්
නුබිමන්
දෙස් දෙස්හි පලවූ **සුගසම්ද සොඹිසා** දම්අෑ බ්දන් මිත් සුගත්
රක්ලත් ලක්රද වාසලේ මුදලිදූ දික්කල් විඳිවා මගුල්

කව්ස්හි සුපසන් හදුහැම්සදු දිමේ මහොස්වූ අදු
සත්බස් අෑ සුසිරින් නිදන්කලසුමන් දෙස්බස් දුනිමේ සපන්
දෙස් දෙස්හි පලවූ **සුගසම්ද සොඹිසා** දම්අෑ බ්දන්මිත් සුගත්
රක්ලත් ලක්රද වාසලේ මුදලිදූ දික්කල් විඳිවා මගුල්.

———:o:———

(ආබ්‍රහම් පුනාන්දු වෛද්‍යාචාර්‍ය මහතා විසින් ඊප්සු කරණලදී.)

ශ්‍රීලංකා ද්වීපයට අග්‍රවූ වික්ටෝරියා නම් එංගලන්ත දේශයේ මහරැජිනින්නේ ප්‍රිය කුමරුවන ඇල්ප්‍රැඩ්, ආර්තැස්ට්, ඇල්බර්ට් නම් දරණ ඇඩින්බරෝ නගරාධිපති ඩියුක් නම් උත්තමයානෝ මෙම ලංකාවට ගොඩබැස හැසුරුණ සමයේහි ලංකාවාසී මහතුන් අතුරෙන් තමුන්නාන්සේ සහ චාර්ලිස් හෙන්රි ද සොයිසා දිසානායක සමාදුන අධිකරණ තැන විසින්ද උන්නාන්සේගේ පිළිගැනීම පිනිස භෝජනෝපකරන හා අනේක ප්‍රකාර නව නාටකාදිය පිලිසෙලකර දක්වීමෙන් උන්නාන්සේගේ සිත සොපමන මහත් ප්‍රීති සන්තෝසයකින් එකාලොක කරනු ලබන්ඩ සෙදුනාද කීවොත්; තමුන්නාන්සේලා දෙනමට උන්නාන්සේට මෙරටේදී දෙවා වදාරන්ඩ හැකි තරම් ඉතා උතුම් නිල ඨානාන්තර දෙකකට පත්කළාට අපි ප්‍රීතිවෙනවා පමනක් නොව මෙම ලංකාවට ඒරෝපා කරෙන් යම්විටක ගොඩබැසපු රාජපුත්‍රයෙක් එකී ඇල්ප්‍රඩ් කුමාරයානෝ වාගේම මෙම ලංකාවෙහි නිලධාරි මහතුන් ගෙන් එකී නිලවලදී පැලඳියසුතු ප්‍රධාන ආභරනය රාජපුත්‍රයෙකුගෙන්ම ලැබුවේ ඔබවහන්සේ පමණක් බැවින් එය අපේ සිත්වලට මහත් ප්‍රීතියක්මය. එකී ප්‍රීතිය ගැන වචන මාත්‍රයක්වත් නොකියා මේ වැදගත් ප්‍රස්ථාව ඉක්මවා යැණීම නොහැකි බැවින් දැන් අප විසින් ඔබ ඉදිරියට පැමිණ මේ වචන ස්වල්පය කියා සිටිනවා පමණකුත් නොව අප රටවාසින්ට ඔබවහන්සේලාගේ මගින් වඩ වඩා ඉසුරුමත්කම් පමුණුවා හැරීමට පුළුවන් වෙන පිණිස, තමුන්නාන්සේට දීඝායු ලැබ නොයෙක් ඉසුරුමත්කමින් හා සැප සනීපෙන්ද පසුවීමට ලැබෙනසේ සර්වලෝකයට නායකවූ **දේවෝත්තමයානන්ගේ** පිහිට හා ආරක්‍ෂාව දෙවාවදාරණ මෙන් අයැද සිටිමුව.

ල ක් තුල රජසිරි පත් රාජනී සුත් ඇල්ප්‍රඩ නම රජ
කුමරු තු මා
නෙක් ඉසුරෙන් ලඟ පත්සඳ මෙහි වැසි අනැති
දනන් සෙයු ඉවතද මා
නෙක් ගුණ පිරි **වාර්ලිස්** මැති උතුමන් නිවසෙහි
බෝජන දුන් මහි මා
නෙක් දන යසසැති අන්තවරෙක්දුස් සිතමින් පැහැදුනි
ඒ උතු මා

මෙලෙසින් තුවු කුමරුන් මන් පැහැදීමෙන් ඒස ද
වෙසෙසින් ලඟ සැමතැන් නඩු විසදුම් දුනි පබ ද
ඒ බැවින් **වාර්ලිස් හැත්තිද සොසිස** උතුම් මැති ද
මෙතු මන් කැර කුමරුන්ගෙන් තවරෙක් නිල ලැබු ද

වි කු ම ඇල්ප්‍රඩ කුමරු කිලෙස ලැබූ තනතුරු පෙවබැ දු
උ තු ම වාසල **සුසෙව් සොසිසා** දිසානායක මුදලි දු
නෙ එම පත දිස බිදුලෙසින් දුක් රෝහ නොතබා මදකු දු
සෙදින් දුරහැර ආවඩා නිති රකිත් තෙදබල සුර නි දු

නෙන නෙන මෙ ලක අතුරු සඳරැස්මෙන් ඔය කින්න ද
වෙන වෙන මේ මැතිදු තුමන් සරිමැතිදෙක් කවද සබඳ
ම න සි න වන තුනුසිරිදර රදවාසල මුදලිදු ස ද
දි න දි න දින රැකදේවා ආයු දෙමින් දෙවිදු නිබ ද

නෙකගුණ සිරි ඇ න් දු වාසලේ මේ මැතින් දු
සි රිලි ය නි ති රු න් දු සෙත්දෙවා සත් සුරින් දු
දෙවිදුව සි න බැ න් දු සත් ගුණෙන් සුන් පසින් දු
ර කු ස ර දැ ල බි න් දු ඡේනසා දුක් ඔමින් දු

ඇල්ප්‍රඩ නම කුමරුන් විසින් තුවුසිහින් දුන් තැගි කස්තාඩය
ලන් ඇප්පේම **සුසෙවිද සොසිස** කරුණාරත්නා දිසානායක
නම සුන්උත්තම වාසලේ මුදලිදුන් රක්නාලෙසින් බෝකලක්
නිත්තෙන් සත් පැරකුම් තෙදුත් දෙවිදු හෙන් බෝසේම
ඉල්වන්නෙවූ.

———:o:———

(රේ. පෙරේරා, (ජේ. ඇන්ඩ්‍රැස්ස්) ඇස්. ජී. ඉලෙක්කින, ජොහාන්ස් පීතර් පෙරේරා, අබ්‍රහම් පෙරේරා සහ ඇල්. ඩී. ඩබ්ලිව් නම මිහතුන් විසින් ඉස්පුකරණලදී.)

මුදලි මැතිඇණෙරයානෙනි,

තමුන්නාන්සේලා සොහොවුරුවූ **ජෝරෝනිස් සොස්ස** මැතතුමානෝ ලඬකාවාසින්ට ඕනෑකරණ ඒ ඒ තැනදී කරණලද උපකාර රාඩියද ආඩුවට තිබුනු ආධාර උපකාරද දුටු අප ලඬකාඞ්කාර ධුරන්ධරයානන් විසින් ඒ සොස්ස උත්තමයානෝ ගෞරව සැලකිලි වසයෙන් වාසල මුදලි ධානාධිකාරයට පත්කරණු ලැබ සත්පුරුෂ උත්තම සිපල්ලන්ගෙන් ප්‍රසංසා ලබමින් ලඬකාවාසින්ගේද, ක්‍රිස්තු යාණි ධර්මයාගේද දිවුනුව සඳහා බොහෝ වැඩ සිදුකර මින් සිටින අතර සමාදුනයෙන් මරුමුවට පැමිණ්යේය.

එමයි **ජෝරෝනිස් ද සොස්ස** ධර්මගුණවන්ත විපුල ජයසූරිය කරුණාරත්න දිසානායක මුදලි මන්ත්‍රීතුමා නන්ගේ ඇවෑමෙන්, ලඬකාවාසින්ට පැමිනෙන්ට තිබුනු හානිය එම මන්ත්‍රීතුමානන්ගේ සොහොවුරුවූ ඔබ සහ පුත්‍රයානෝවන **මාර්ලිස් හැන්රි ද සොස්ස** දිසානායක මහතානන්ද විසින් දුරුකර අපේ දුනිමෙන් කියා නිම කල නොහැකි මහත් අභිවෘඩිය ලඬකාවට සලසවමින් සිටින අතර, අප ඝාම්දුවූ **ඕක්ටෝඩියා** නම් මහරජිනින්ගේ පුත් ඇල්ප්‍රඩ් ආර්නැස්ට් ඇඩින්බරෝහි ඩියුක් උතුමානෝ ලඬකාවට වඩින ප්‍රවෘත්තිය අසා, ඒ වැඩියකල **මාර්ලිස්** දිසානායක මහතානන්ගේ නිවාසයෙහිදී රාජභෝජනයක් හෙවත් බාලක් විලිහැන්වීමට ලභාවෙන හිඟිසුමද වරයද ලඬකාඞ්කාරයානන්ගෙන් ලැබ අපි විසින් බොහෝ දිනක් කියාවත් නිමකරන්ට බැරිතරම් විසිතුරු සහිත මාහැනි බාලක් ඩියුක් උතුමානන්ට (ලඬකාවාසින් වෙතුවෙන්) විලිහන්වා ලඬකාවේ ගොවිතැන්නනය දිවුනුවීමට හේතුවක් වන ආදිස ගොවිපලක් කුමාරයානන්ගේ නමින් තැබීමට මහත් මුදල් රාඩියක්ද ආඩුවට තෑගිකල තැනදී, ඒ

ඔසුක් උතුමානන් සහ ලාඕකාවාසින් ගැනත් තමුන්නාන්සේලා කළ මහත් තෘප්තිවනතාවූ කාරණා ගැන ප්‍රීතියට පැමිණ තමුන්නාන්සේලාගේ උතුම් ගුණයට ඔබින ඝානාන්තර දෙකකට, එනම් ඔබව රජවාසල මුදලි ඝානාන්තරයටද, **චාර්ලිස්** දිසානායක මහතාතන්ව ලේකම් පිපයෙහි සාමදන අධිකරණ ඝානාන්තරයටද පමුතුවා යලින් ලඕකාපුත්‍රයෙක් නොලැබූ රාජ තෘෂ්ණාව වන කෘතඥතායක්ද ලබාගැනීමෙන් ලඕකාවාසි සියල්ලන්ට ගෙනදුන්නාවූ මහන්තත්වය හා ප්‍රීතිය ගැන උසස්ආකාර යෙන් ප්‍රසංසාතර සිටිනවත්ඇර, ඔබ දෙනමට සහ අදාල සියල්ලන්ටද **නිල්ක දෙව්ඣාමිස්ගේ ආශිර්වාද** ලැබ යෙහෙන් පසුවෙන්ට සලැස්වනමෙන් ඒම ඒ උත්තමයා නන්ට බොහෝදෙනා වෙතුවෙන් මෙහි පහත අන්සන් කරණ අපි විසින් යාඥාකර සිටිමුව.

ස ර ද සිසි සදිසි යසසිරි රැසිතු දු ල
සු හ ද ගුණ නැඟින්කුඵණේන් ලෝපතල
මැති දු දිසානායක මුදලිදු විපු ල
සැ ර ද සියන් හා සිරිවිඳ මෙලක් තු ල

මේ ල ක විසු දනවත් දන තිලකෙව් **ජේ්‍රනිස් සොස්සා**
මැතිදු තු මා
දි නෙ ක දන ලොබමින් හැර යදිනට කවිත් පාත උඩ
දෙරටෙහි මා
විද නෙ ක වෙහෙසා අමුතුද පාලම් අම්බලමුත් සදවා
බොහෝ මා
මේ නෙක කරුණෙන් සතහට සුබ වැඩ සිදුකරවන
අතරට නොන් මා

ප සි දු ව මා මෙමැතිදු තුම සලසන සුබ ලොව ටා
නි රි දු තු මා සතුවින් මුදලිදු කර වාසල ටා
සි රි ද තු මා විසි උරපිට කස්නානය පිහි ටා
න රි දු ස මා පුතුගු පෝදින ලකඹිර දිලි යස මා

මෙපුර වරගණ කිරුළ බඳුදෙව් මැඳුරකුත් කරවමින්
විසිතු ර
සතර තොරතුරු ආගමන් දිවුනුවට මහ දන
වියදමුන්ක ර
මිතුරු නෑසිය හා වෙනත් නෙක දනට හඳ දුක්
දෙමින් බල ත ර
විතර නොවනා සැප විඳින්නට එතුම දිවිහැර
ගියේ සුර පු ර

අවෙක වරුස එතුමන්ගේ මරණින් ඉක්ම
යන්නට පළමු ව මා
මෙලක ට ගිම්වූ අප මහ රාජිනී පුත් ඇල්ප්‍රැඩ්
නම් කුමරුතු මා
මෙලක තුලැති සිරිසර නරඹනු වස්වඩිනට යොමු
කරගත් බව මා
නිසැක ව දුනගත් ඔබ සහ **චාර්ලිස් හැන්රි**
සෙ.ය්සඳ මැති දෙන මා

ලස් නොව ගොස් මෙලක් දිවෙහි රජු හමුවට නොසි නා
දෙස් අනුදෙස් නරඹනු වස් එන කුමරුටතුටි නා
තොස් වනලෙළ් බාල් දෙන්ට තම නිවෙසට වඩි නා
ලෙස් නෙන් බස් ගිවිසුම් ලැබ තමන් සිතැති රගි නා

නිම නැති මඩු කුඩම් බඳිමින් විසිතුරු ක ර වා
රස ඇති නෙක බොජුන් සාදමින් පිරිසිදු ක ර වා
රුති ඇති සොඳ නළු නලගණ තැනී තැන රැස් කර වා
ලොව ඇති සැම පෙම්වන දෙය එතනට එක්ක ර වා

නෙලමැති සන්ද දේවගැතින්ද තිලදරයන්ද ගුරු
වරුනු ත්
දනපති සන්ද මහ වෙලඳුන්ද වැඩිසිටියන්ද
නෑසියනු ත්
ඉවුමිතුරන්ද ලෝපසිදුන්ද රැස්කරමින්ද ඇර
හසු නු ත්
දකකුමරින්ද තුටුවෙන මෙන්ද සිටි ජනකන්ද
නැත ගතනු ත්

කු ම රි නු රජ දූතයන් සමඟ ඒත් **මාර්ලිස්** මැහිණිදුන්
නිවෙස්
පු ර ඉ නු ලෙස ආසනේ උඩුමහල් යි ගිමි නිවාලා ඉඳන්
එතුමන්දු තඹිනුත් අනිත් මැහිඳුනුන්හා ගොස් සෙම්න්
සන්තොසින්
මිහි ඉන්දු සුරලෝ යසෙමි යසසිරි සිත්සේ බලාලා ඇවිත්

අම්ලෙස්වූ නෙක බෝජනේ වලඳම්න් සිත්සේ නැවැත්වූපසු
කුමරින්දුහට මෙමැහින් දෙදෙනහින් නෙක්තෑහිදිලායලින්
එතුමන්ගේම නම්න් සිරිත් ගොවිතැනුත් ලක්දිව්
පවත්නා ලෙසින්
ගැණුදුන්නේය පවොන් දහස් දසයකුත් සිත් ලෝබයක්
පත්නොවී

කු ම රි නු සිත තොස්වෙම්න් මෙමැහිදුන්වෙත් දෙන්ව
සුත් තෑහිවූ
මු ද ළි නු කර වාසලේ මේ **සුමෙසව්** නම්ලත් මැහින්දු
උතුම්
මි නි රු නු නඩුපත් රණ්න් කුමරිදුන් ගේ සිත්ලෙසින්
සාදවා
මෙපැලැඳු සිරිලක්දිවේ සෙසුකෙනෙක් වෙත්හි නොවී.
මැසි කියත්

සෑ ම තැන මෙලක්දිවතුලැ නිය ලෙසි නි
කි ම වත් නැහිව මැහිඳුට නිසි ලෙසි නි
නා ම ඇති ඒ **මාර්ලිස්** මැහිඳුට යසි නි
සා ම දූන නඩුකරු තනතුරුද දු නි

තෙද අණද බොහෝවූයෙන් සිතේලා උසස්කම්
මද අගුණයකුත් නෑ කාටවත් පාකරන්නේ
හද තුලට අරන් සුත්වූ සිරිත් ඒ පරිද්දෙන්
සොඳලෙස කරණා බැව් ඇප් කියන්නේ සෙලෙස්හෙන්

මෙම මැති දෙදෙනා සත් දිවුනුවි යන්ට ලෙඹියි
නිම නැතිම දනයි දුන් සිත් පිනාලාම දෙන්නේ
වෙන නැතිම මියක් මිවන් උනුවෙන්ට බෝසේ
සුදු ඇතිම කමක් මේ සුන් විලස්නෙන් කරන්නේ

සොඳින් පල්ලි දිවුනුව තිබෙණා විල ස
උ ස න් වතු පුදු ඒ හැන නොව අල ස
හි ඟ න් නන්ට එකවිට දෙයි නෙදන රු ස
වෙනින් කාට සිත්වෙද දනැතත් මෙලෙ ස

සු තු සු තු ක ම නැණයෙන් බලමින් සොඳු රු
දා න වි ය දා ම තර තැන තැන නොව මසු රු
නිතිකුඑණෙන් දනගැන කරවන ඉසු රු
එ ක මු ව කින් කියනෙමි ඉමි කෙසෙ නිබෝ රු

දෙ න නි ලි නෙ න් සිතුමින කළ තුර න් දු
දා නි සු රු ව න් උරවිඹි නිති සිරි න් දු
ගුණ නැණ කැන් මෙ සොඬිසා මැති න් දු
දි න ක ර ති ම පවතිනු ලෝ පසි න් දු

ස තා හ දු ල සා කොද පුසුදුවමින් නිති න
පු ර ඉදුලෙ සා යස දිවුනුව දිනෙන් දි න
මු දු ලි දු දි සා නායක මැති සඳ සොබ න
සැපවිඳ නොසා පවතිනු හිමි නුබ දෙර න

වෙවෙනි අරුම සුබ සැලසූ අප මැති චරණ වා—ගරු,
ර ජ යි සුනා දුන් තනතුරු රටවපි සත්ත වා
මෙතිනි යිලින කළ කස්තානය පැලඳි නු වා—මැති,
ස දි ත් දිවන මැන ලකඹර පුන්සඳ විලස වා

සි ව් අ ගෙ න් දුරුව නපුරට නොදී ඉ ඛ
ම ව් ලෙ සි න් සතට දිවරු සොඳු වැ ඛ
ස ව් ස තු න් රකින මැතිදෝ දෙදෙන දි ඛ
දෙව් කැ ලු න් ලොවඟ රුකදෙති නොවි ක ඛ

———:o:———

(රත්මලානෙ පදිංචි හෙන්ද්‍රික් පින්තු අප්පුහාමි විසින්
ඔප්පුකරණලදි.)

ශ්‍රීමත් ලඞ්කාධිපයෙහි රාජ්‍යශ්‍රී පදප්‍රාප්ත අප මහ රාජිනීන්ගේ දෙවෙනි පුත්‍රවූ, ඇඩින්බරා නගරාධිපති ඇල්ප්‍රඩ් නම් උත්තම රාජකුමාරයානන්වහන්සේ ලක්දිවට පැමිණි කල්හි, ඒකුමාරයාට මහැගිවූ රාජභොජන පිළිසෙල කිරීම ආදි උත්සවය කොට පවත්වන අනෙකවිධ ගෞරව දැක සන්තුෂ්ටවූ ඒ කුමාරයා විසින් තෑගි පිණිස මෙම මන්ත්‍රීශ්වරයන් දෙදෙනාට, ලඞ්කාධිපයෙහි සමාදන විනිශ්චය තනතුරක්ද, රාජගෘහයෙහි නොහොත් වාසල මුදලි තනතුරක්ද නියම කරණ ලද්දේය—නියොග කරණලද පරිද්දෙන් ඒ තනතුර අනගි ලෙසින් ලබා ස්වකීය ග්‍රාමයට සම්ප්‍රාප්තවූ තමුන්නාන්සේලාට සම්පවාසිවූ අපි ඊර්ෂ්‍යා ක්‍රොධාදිය හැර ස්තුතිපත්‍රයකින් ආදර ගෞරව පැවැත්වීමට වඩා අන්පරිද්දක් නැති හෙයිනුත් පෙර රාජ රාජ මහාමාත්‍යාදීන්ටත් කාව්‍ය ප්‍රබන්ධ ස්තුතිපත්‍ර ඔප්පු කරණ සිරිතක් ඇති හෙයිනුත් ප්‍රස්තාවානුකූල ලෙසින් සංක්‍ෂෙප යෙන් ෂඩ්භාෂාන්තර්ගත සංස්කෘත භාෂාවෙන් බඳනාලද "ප්‍රභද්‍රක ශ්ලෝක නම් සඞ්ගීබන්ධ කාව්‍යයක්" ඔප්පු කරණ්ණෙමු—යේ මෙසේයි—

1 ඇංගලන්තදෙශ ගගණප්‍රභවාමෘතාංශු
ජෛත්‍රාතසනාශුයාලිජනපංකජ සනාභිගායාඃ,
ලංකාපයො නිධිනිභා මුදිතාය යාසෞ
නෛකාවනී පතිශ්‍රිරෙ මණී සම්මිතායාඃ—

2 ශ්‍රීලඞ්කාං සමුපාගතෙඩි කරණං, ඇල්ප්‍රඩ් කුමාරෙසුතෙ
ජ්‍රෝණීස් සොයිස ගතාංපූරාණව භවනෙ, **චාර්ලිස්**
සුසෙව මන්ත්‍රිණෞ
තාභ්‍යාං භූපති මණ්ඩිරෙ මුදලිතාං, තසෙමනරෙන්ද්‍රාශනාං
දත්තුං ත්‍යාගවිශාධිතෙන ගදිතස්තාස්‍යාද්‍යතාංවරම්—

3 තස්මා දත්‍ත නරෙන්‍ද්‍ර මණ්ඩිත ගුහං, නාමාංකිතං කාංචනං
කස්තානං ශත පත්‍ර පත්‍ර කුශවද්ධනාභිලොපද්‍රුවම්;
ශ්‍රාම්ප්‍රාපත **සුසෙව් ද සොය්ස** කරුණං, රත්නාදිශානායකං
ශ්‍රෙෂ්ඨං නාම නෑපෙයුවාස මුදලිං, ලෙබ්බී හො රක්ඛතු—

4 ගුපාල වාස මුදලිං කෘපයා තරණං
තතගෙත නිජ්රතරුං විබුධෙන්‍ද්‍රයෙතම්,
සුසෙන යථා නම උපද්‍රව දුඃඛ සර්වං
හඬාවරං ජනහිතස්සු චිරාය පාතු—

1—2 ඇංගලන්තදෙශ, ඇංගලන්තදෙශ නැමති; ගගණ, ආකාශයෙහි; ප්‍රභව, පහළවූ; අමෘතාංශු, චන්ද්‍රයාගේ; ජ්‍යොත්ස්නා, සිහිල්රශ්මි නැමති; ආඥයා, ධාර්මික රාජාඥයෙන්; පයොනිධිනිභා, කිරිමුහුද වැනිවූ; අසෞලභ්‍යතා, මෙ ශ්‍රීලංකා විපය; යයා, යම් රාජ මහෙසිකාවක් විසින්; ආමුදිතා, මෙසෙසින් සතුටුකරණලද්දීද; අලි, භෘඞ්ග සමූහ නැමති; ජන, සඞ සමූහයාට; පඞ්කජ සනාභිභායාඃ, සුපුෂ්පිත පියුමක් බඳුවූ; නෛකාවනිපති, නොයෙක් රජදරුවන්ගේ; ශිරොමණි සමර්පිතායාඃ, ශිඛාමාණික්‍යයක් බඳුවූ; හෙවත් ඔවුන්ගෙ අග බඳනාලද මාණික්‍යයක් බඳුවූ; තස්‍යාඃ, ඒ වික්ටෝරියා නම් අප මහ රජිනින්වහන්සේගේ; සුතෙ, දෙවෙනි ප්‍රිය පුත්‍රවූ; ඇල්ප්‍රඩ් කුමාරෙ, ඇල්ප්‍රඩ් නම් ඇඩින්බර නගරාධිපති කුමාරයන්වහන්සේ; ශ්‍රීලංකාං, මෙ ශ්‍රී ලංකාවිපයට; සමුපාගතේ, සෙහෙන් සම්ප්‍රාප්තවූකල්හි; චාර්ලිස් සුසෙව් මන්ත්‍රිණෞ, චාර්ලිස් හැන්රි ද සොය්ස දිසානායක මැතිතුමාද සුසෙව් ද සොය්ස දිසානායක මැතිතුමාද යන දෙදෙන; තසෙම, ඒ රාජකුමාරයාහට, ස්වභවනෙ, ස්වකීය භවනයෙහි හෙවත් ඒ මන්ත්‍රීශ්වරයන්ගේ වලව්වෙහිදී; වරං නරෙන්ද්‍රාශනං, උතුම් රාජභොජනය; අදත්තාං, දුන්නාහුය; තෙන, ඒ ඇඩින්බර නගරාධිපති ඇල්ප්‍රඩ් කුමාරයා විසින්; තාභ්‍යාං, ඒ මන්ත්‍රීශ්වරයන් දෙදෙනාට; අධිකරණං, ලංකා විපයෙහි සමාදන විනිශ්චය තනතුරද; පුරා, පූර්වයෙහි; ජ්‍රෝණිස් සොය්සගතාං, මෙ මන්ත්‍රීශ්වරයන් දෙදෙනාට පියවූ සහෝදරවූ ජ්‍රෝණිස් ද සොය්ස ධර්මගුණවර්ධන විපුල

ජයසූර්ය කරුණාරත්න දිශානායක මහාශ්‍රීශ්වරයා එසින පැමිණේනලද; භූපතිමන්දිරෙ මුදලිනාං, රාජමන්දිරයෙහි මුදලි බව හෙවත් වාසල මුදලි තනතුරද; තස්සගවශාත්හි, නැගිවසයෙන්ම; දත්‍වා, දෙන්ව; ගදිතඃ, කියනලද්දේය—3—තස්මාත්, එහෙයින්; අග්‍රහරෙන්ද්‍ර, කියනුලැබූ මෙලංකාවෙ රජවිසින්; මණ්ඩිත, පලදවනුලැබූ; ශුභං, ශොභනවූ; නාමාඞ්කිතං, නම ලකුණු කරණලද; කාඤ්චනං කස්තානං, රත්රන් කඩුතානයක් ඇත්තාවූ; ග්‍රාමප්‍රාප්ත, ඍවකීය ග්‍රාමයට සම්ප්‍රාප්තවූ; සුසෙව් ද සොය්සා කරුණාරත්න දිශානායකංනාම, මෙනම ඇති; ශ්‍රේෂ්ඨංනාඃපෙන්ද්‍රවාස මුදලිං, උතුම් වාසලමුදලි මහාශ්‍රීශ්වරයන්වහන්සේ; ලෙඛර්ෂගඃ, උතුම් දෙවිතෙම; ශතපත්‍රපත්‍ර කුශවත්, නෙළුම්පත දියමෙන්; අතිලොපද්‍රවං, සියළු උපද්‍රව; හත්වා, නසා; රක්‍ෂතු, චිරාත්කාලයක් මුළුල්ලෙහි රක්‍ෂාකෙරේවා—4—ජනහිතඃ, සත්වයන්ට හිතවූ; විබුධෙන්ද්‍රඃ, ශ්‍රේෂ්ඨවූ දෙවිතෙම; ත්‍යාගෙන, ත්‍යාගයෙන්; නරාණාම්, මනුෂ්‍යයන්ට; නිර්ජරතරුං, කල්පවෘක්‍ෂයක්වූ; එතංවරං භූපාල වාසමුදලිං, මෙඋතුම් සුසෙව් ද සොය්සා ධර්මගුණවර්ධන විපුල ජයසූරිය කරුණාරත්න දිශානායක වාසල මුදලි මහාශ්‍රීශ්වරයානන්වහන්සේ; සූර්ය්‍යඃ, සූර්ය්‍යතෙම; තමඃයථා, අන්ධකාරය දුරුකරන්නේ යම්සේද එපරිද්දෙන්ම; උපද්‍රව දුඃඛසර්වං, සියලු උපද්‍රව දුක්; හත්වා, නසා; කෘපයා, කරුණාවෙන්; සුචිරාය, බොහෝ කාලයක් මුලුල්ලෙහි; පාතු, රක්‍ෂාකෙරේවා—

———:o:———

ඉශ්නිසශ.

අලකනම පුරයසුරු නවනිදන් ඇසුරුකල පිරි
සිරින් පසිඳුමෙ දිවයි නෝ
කලක ඉන් ශ්‍රීසි කුමරු ආසැනෙන් බදුරුකල සරි
මෙවන් මැහිඳු පුතු සමයි නෝ
තිලක වන් ඔහු ඇසුරුකර පෙම්න් මහරුදුල
සිරිහරින් පුරුදුලෙස මනමෙ නෝ
සලක මින් වම මිතුරු නවරුවන් පඩුරුකල ගිරි
රදුන්නෝ මුදුනෙ දිලි මැහිම් නෝ

සිත්දුව.

සොබන කනයකිරි මුදුන පැමිනෙමින සුදිලි:
කැන් පතුරණ නිමලි
එදින මැනියකඩිරි ගත් රජවාසල මුදලි: දස අත නිති බැබලි
සොබන කනක තිරි මුදුනත දිලෙනා: එදින මැනික සරි
දන මන දිනනා
නොමින නොයෙකසිරිවිතරණ දෙමිනා: නෙදුනුනෙක
හිරි ලොබවල හරිනා
සුරතුර සඳිසා—පසිඳුවන—සුසෙව් ද සොඩිසා.

ධම්ගුණවතිනා: විපුල ජයසූරිය: කරුණාරත්න දිසා
නායකමුදලිවෙත:
මනරටවන කුමරුන් නොස්පානේ: අනමෙන් දුන් ගණ
රන් කස්තානේ:
අදිමින් යන කල දසඅත දිස්නේ: ගුණකැන්මෙන් පැහි
රෙසි මිනි රැස්නේ:
නන්වැඩසලමේ රන්මිනි කඟපත: සෙඩකඩගල පුර
සේදි පැලඳ ගත:
දුන් තුඩ තුඩ තුගිවිද පිරියෙන් සිත: සෙඩකඩගල සිට
ගොස් හතුරන්කෙත:

නැවති-පෙමැති-පිනැති-මෙමැති
ඇවිත් පුර කොල්ඔට-මෙමැත් සතු නිවසට
මහත් ගරු පිරිසට-සිතත් රිසි විලසට
සත්කාර අත්නෑර-නෙක්වාර-කරමින
ඉස්තිර-චත්සාර-සුත්වාර-පතිමෙන

සිසකුල අම්බරසේ පෙරදිඑනු: දියතලකින් පලකෙරු
කර දිම්නු
සම්දුන නඩුකාර තැනන්ගේ-පෙම්වැඩුසිය මුදලිතුමන්ගේ
පොරණසිටන් පැවතෙන එවලව්වට: සරණකරණ්ණට
රිසිව මොරටුවට
සොහොසුරාව බලනට එන්නාසේ-පියකරුස මුදලිඳු
අද දවසේ—සොබ—

ල බන් ඩ මෙඹුසුරු රදුන්ඩ කිම කෙරුතාර නා—පල
කර න්ඩ කර සුරු දුනෙන්ඩ ලොව සැම් පුර නා
ද කින් ඩ සිරිලක රාජනි නසුන ආ තැ නා—ඒ ඩු
තු මන්ඩ ගරුතර ආදර බුනුමන් පාම් නා

එසෙනකින් සමතුන් ගෙන්නාලා: ලකුගනන් මිල
විසදම් කරලා
දසලෙසින් නිවසත් සරසාලා: පසුපානතුණ්ඩත්පලකරලා
මඟුල් අහර සත්කාරකරන්නට: තුමුල් බලැගි
රාජනියගෙ පුතුහට
සසුර එහර පනිවිඩහැර සැනෙකා: අහරපාන උප
කරණද නොසෙකා
ගෙන්නා ඒ සමගින්නා සුදෙව: දන්නාලෙස රස
අහර උදව්කොට
පහන් සිතින් එලි කනු ඉන්දුලා: පහන් ලකුණ
ගනනක් අවිලාලා
මුදුන් පැමිනි ගරු, රදුන් පුතුට නිසි, සදුන් හරින්
ආසනයක් තනවා
වැදුම් සහිතරජ පිදුම්ඇතුව ඒ මුදුන්පැමිනි කුමරුන්
මනපිනවා
රහිමම කර කන බොන ඒ බාජන-දෙම්මම යස රස
අමවන් බේජන
මහා සැබෑම හඬ නගාදිදී තුහි: රහාකෙරුවෝ
එක රහාවෙහි බැහි

මහබා සිරින් සරි ඉන්දු: පොළඹා දනන් මනකැන්දු
නරඹා කියා ඇසින්දු: සුරඹා සඳිසි කොමල න්දු

ලඹිකාරයෙන්සාර-මන්දිර දසදෙ ස
ගම්බිරයෙන්දිර-ඔන්හාර කර ය ස

ලවුල්ලෙසට කා බී රිසිලෙසිනා: කොවුල් හඬසෙ
තුහි හොසකර නොමිනා
දවුල් රබන් බෙර තවබොරුවෙනා: අවුල් නොකර
පද පසතුරුනානා

වියා නවා නාවක සහ රූකඩ: එයාකාර ගිනිකෙළි
හැර වෙඩි හඬ

එවරා එකලෙස: පතුරා යස හෝ ස
සමිරා සුරු යස: කුමරා කර නෝ ස

නවරුවින් පුදු-කුමරුවන් වැදු-මනකුවන් සදු-පින
වඹින් එදු

පවුන් දස දහසක් දුන්නෙ ආන්ඩුවට: එයින් ලක
ගොවිතැන් දිවිහු කරන්නට

ඉන්පිරියෙන් කුමරුන් මෙමැතින්හට: නන්සිරියෙන්
සතහින් පවතින්නට

ආන්ඩුකාර උතුමානන් ලව්වා: ත්න්දුකරමෙම නිල
ගෙන දෙව්වා

සිහළ දන අතරන්ගේ-දිලි-වාසල මුදලි උතුමන්ගේ
සුරතුර සුරු මහනිලිනෙන් මනමෙන: කරදර දුගි
මගියන් නිගි රකිමින

සුරවර නන් කරුණාවෙන් සතහින: තිරසරකොට
සැරදේ යන බැතියෙන

මෙසඳ විසු සැමනන්වූ නතු වේ
සු හද සිහින් එය රසකර ගෙතු වේ
ස බඳ එසේ දන දම්ගෙතු සතු වේ
ච රද ඇතත් මෙහි දුරහල සුනු වේ

(සුසෙව් ද සොසිසා ධම්ගුණවඩන විපුල ජයසූරිය කරුණාරත්න
දිනකාසක වාසල මුදලි මින්ස්ත්‍රිවෙරගන්ගේ මාලපලදින
මංගල්‍යයෙයිදි පානදුරේ පදින්වී
පො. අර්නෝල්ඩ දිසෙස් මහතා විසින් ඔප්පුකරණලදි.)

සසොඹණ ලක්දිවට පත් ඇල්ප්‍රඩ් කුම රූ
විල්ගෙණ සුසෙව් සොසිසා මැතිදු දිසිසු රූ
අ ම වන බොජුන් දුන්සඳ දන සහ මහ රූ
බ දි මින පෙමද දලවූ නොමිද සිරි දූ

පිරිනි දු වනිතුදුල් කුමරිදු සඳ එස ද
සුසිනි දු පිළිසඳර බස් පවසා පැහැ ද
පරසි දු මෙලක්දිව රදු මැදුරට යබ ද
මුදලි දු කරව් එම **කොඩිසා** මැතිදු ස ද

ඇ ල් ප්‍රඩි නම් උතුමන් වසින් බැති සිතින් දුන් ඒ
මැතිතැන්දරූ
ක ල් සිත්බන් මෙතුමන් යෙරේ හෙළදිවේ ඉන්නා
බොහෝවූ දනෝ
දු ල් වන්වූ විලසින් නිමා අනගිවූ රන්මාලයක් සිත්පෙම්න්
හෙල් යි ලම්හ සිනාමනාමනමන්ගේ අන්මුදුල් රැස්කොවූ

රූ පි ය ල් දෙදහසක් සසිය අඟනා රූවනින් නිමකො ව
පැහැ දු ල් රන්දමක් දිසානා මුදලිදු දුන්නු අන ව
නැණ්දු ල් වූ ජර්මින් නම බිසොප්තුමා ගෙණ් එසත ව
හෙල තුල් යි බහාලුවේ මය මේ මුදලිදුගෙ සොඳ ව

ක ර හර සරලක් වැස්සන් වසින් දුන් බොහෝවූ
මොර වුව සත නවලත් හමියි එවමානුවෙල් නම
සු ර නිල සලදි ඒ දුල් රුවන්දම දූරුගෙල්
සු ර නිදු රැකදෙන්වා දී දිගා මේ මැතින්දු

ද ද ර ද කොඳ යසස් සඳුන් දික් ඉබු කුඹු ඇ න් දු
සු ද න ද වන තුනු සිරිදූරු බඹගණ් මුව ඉ න් දු
හද නද කල දිදි හිලිනා කිව්මන් ලොබ සි න් දු
ව්ඳ ව්ඳ මින් සිරිසැප දිනා වාසල මුදලි න් දු

දි ය ව ඵලු අලුබාකරා ගොස් සකි සුරාගේ වසින් මෙදුව ස
රැස ව කල එක් දහස් සත්සිය සිවතුවෙනි වස්හි නොපිලස
පූ තු ව දිවසුරු තුදුස් වෙනිවූ කොළඹවාසල මුදලිදුගෙයස
පළ ව ජර්මින් බිසොප් උතුමෙක් ගෙලෙහි රන්දම
පැලදවි නො ස

මෙදිනා කිතු සුරින්දු ගේ වසින් එක් දහස් මින්
පිරුණ අටසියක් ඉක්මි දෙසැත්තෑ වසේ පාන්
නම් හා පෙබරවාරි සු මසේහි පැවැත්මෙන්
සුව හා විසි දවස්හි හිල් ඇගාගේ දවස්වූ

ඇප්නිස් ව න් කිරුලක් විලස් පල උතුම පින්වත්
දිසානායක
චාර්ලිස් හ ම මැහිදුගෙ ගෙල් හිද මෙසේ දුල්වූ
මහත් රන්දමක්
පෑ දිස් නෙන් නිමවා තමන් සතු දනින් ලමහස්
මෙලක්දිව දනෝ
සානොස් නෙන් වසනා බවත් පතලවී ඇත්මැය්
නොයෙක් දෙස්හි දුන් *

* මෙම ප්‍රවන්ධ 1872 සේ පෙබරවාරි මස 21 වෙනි දින ලක්රිවි කිරන් කතුරුත සී. පී. වීරක්කොඩි මහතා විසින් කොළඹදී අච්චුගසා ප්‍රසිද්ධ කළ "සොයිසා වර්ණනාවෙන්" උපුටාගත්තු ලැබිය.

PART VIII.

CHAS. HENRY De SOYSA,

JUSTICE OF THE PEACE.

———:o:———

අවවන අදිසර.

චාර්ල්ස් හැන්රී ද සොයිසා

ඝාමදූන මිනිසවගකාරතුමා.

චාල්ස් හැන්රි ද සොයිසා

සාමදන විනිශ්චයකාරතුමා.

CHARLES HENRY De SOYSA Esq.

JUSTICE OF THE PEACE.

චාල්ස්හැන්රි දසොයිසා සාමදුන විනිශ්චයකාරතුමා ශ්‍රේෂ්ඨ ද සොයිසා වාසල මුදලිතුමාගේ එකම පුත්‍ර රත්නයය. මෙතුමා මොරටු ග්‍රාම සෙකිදි උපන. මේ බිලිඳු, පුණ්‍ය ලක්ෂණයන්ගෙන් ගහණවීම කරණ කොටගෙණද කිසි පිඩාවක් නොමැතිව ජනිතවූ හෙයින්ද, ජනිතයෙන් පසු පියාගේ වණ්ඩික්කම් ආදිය වර්ධනයවූ හෙයින්ද, සුපින්වත් පුත්‍ර රත්නයක් බව හැඟි ගියේය. ඉතා ප්‍රේමයෙන් සහ සැලකිල්ලෙන් පුත්‍රයා වැඩීමෙහි වෙසෙසින් මව්තොම ව්‍යාවෘතවූවාය. පියතෙමේද ඇස ඇදි රසාඥනයක්සේ පුත්‍රයා කෙරෙහි මහත් සෙනහයෙන් ඔහුගේ වර්ධනයට හෙතුවූ සකල දෙයම උනන්වයකට නොපමුණුවා සම්පාදනය කෙළේය. දෙදෙනාගේ ප්‍රේමය සහ සැලකිල්ල කරණකොටගෙණ මෙම සුරතල් පුත්‍රයා පෙර සඳමෙන් දිනෙන් දින වර්ධනය වූයේය.

අවසානය.

ලඳුරු ද සොඩිසාට වයස එක්වසර පහළවයි දිනවූ කල අවගාහන මඩගලාය පවත්වා, නම තැබුවාහුය. එහිදී **චාර්ලස් මෙලින්තුමා** සහ **හැන්රි අල්බිස්** මුදලි තුමා පියවරුමෙන්ද, මොරවුවේ කඩලාන යන ගම් වසු මහවිරක්කලුගේ පේදුරු ප්‍රෙරාගේ භාර්‍යාව වන **බස්නි සානා ප්‍රුණන්දු** මහත්මිය මවමෙන්ද පෙණ්සිව වඩි එක් දහස් අටසිය සත් තිස් වසේ මාර්තු මස සත් වැනිවන (1837. මා. 27) දින මොරවුවේ ලංසි පල්ලිය නමින් එව කට ප්‍රකට දෙවසථානයේදී ගෞ. සාමුවෙල් වීලියම් දියස් උන්නාන්සේ විසින් අවගාහනයකර **චාර්ලස් හැන්රි** (ද සොඩිසා) යන නාමය තබනලදී. මේ ලඟදීම මේ ලඳුරු වාගේ පියා මීළඟට ගෙන් තිබුන ඉඩිහඟ වත්තේ ගෙදර නමින් ප්‍රකට ඉඩමේ නිවසේදී හිස අත් තැබුවන්ටද ඒ සඳහා සැදවනලදු මහත්මන්ට සහ මෙහත්වරුන්ටද වෙ දින මානැනිලෙස අවගාහන මඩගලය හොජනයකින් මොනවට සඩිහුන කරණලදී. "රූපෘදර්ශිදිය" පළමුවෙන් මොරවු ග්‍රාමයේ භාග්‍යාකාමි දවස මෙයය. "ඊදී සැන්දෑන් අසවඟත් හැටියේ මේ අවගාහන මඟුල සහ ද සොඩිසා මහතාගේ නාමයත් ඝිහිවෙන්නේය" යි යන වචන අදු වන තුරුත් මොරවුවාසින් තුඩ පවති.

———:o:———

මෙතුමාගේ කුඩා කාලය.

කුඩා කාලයේ මොහුට දෙමව්පියාදිහු **චාර්ලස්** යන නමින් ආමන්ත්‍රණය කලාහුය. චාලිස් යසලෙස වර්ධනයව සිටින අතර, බලාපොරොත්තු නුන කෘශතාවය කට පැමිණීමෙන් උදරයේ පීඩාවක් හටගත්තේය. එවක් පටන් ලවයා සුඛිමත් කරගැණීමට සහ උදර පීඩාය සුවකරලීම සඳහාත් වෙදකම් කිරීමට පටන්



ගත්හ. මෙසේ වෙදෑතම් කරගෙණ ඒමෙන් උදර රෝගය පමණක්දුර වැහැරගිය නිමුත්, කෘශතම් වැහැර නොගොස් පැවතියේය. මෙකී අසනීපකම් නියා ඒ පලලේ වෙනත් දරුවන් සමග කෙළිසෙල්ලමට යාමට රුචිනුවූයේය. පස් ඇවිරිදි සය ඇවිරිදි කාලවලදී මේ තිබුන ගතිය වෙනස්වී වඩාම නොව ඉඳුනිටලා ඒ පලලේ කුඩා දරුවන් සමග කෙළිසෙල්ලම් කෙළේය. මේසේ පසුවෙන අතර සත් හැවිරිදි වයස සපැමිණියේ ශාස්තෘන්ද්‍ර හණ්ය පියාණන් තම පියා ඉගෙණගත් පල්ලිය ගොඩැල්ලේ විහාරස්ථානයට පළමුවෙන් යවනලදී. කනස්කතෙවාසේ **දෙන් අන්ද්‍රිස් ද සිල්වා** (මිරිස්සේ ගුරුන්නාන්සේ) නම් ගුරුවරයෙක්ද සිංහල ඉගැන්නුවෙය. මෙසේ කලක් සිංහල ඉගෙණගැණීමෙකි වහාවෑතව සිට මොරටුවේ **ජෝන් හාර්ත්** නම් ගුරුවරයාගේ පාඨශාලාවට ඉංග්‍රිසි ඉගෙණීම පිණිස වරෂ හැන්නැදීගේ අන්ද්‍රිස් සොසිසා මහතා සමග පැමිණියේය. පළමුවෙන් ඉංග්‍රිසි හෝඩිය ඉගැන්නුවේ මෙම පාඨශාලාවේ විසිය ගුරුවර **ජොහානස් සල්ගාදු ගුණවර්ධන** මහතාය. මෙම පුෂ්ප මහතාගේ ප්‍රවේශම සඳහාද, ඉගෙණීම සඳහාද මේ ගුරුවරයා වලව්වේ නවතාගෙණ සිටියේය. මේ ගුරුවරයාට සකිය සුත්‍රයා වෙනුවෙන් මුදලිතුමා මහත් සවිපත් දයාද වශයෙන් දුන්නේය. පියකලක් මෙසේ ඉංග්‍රිසි ඉගෙණීමට ගොස් එයින් අහක්ව ගල්කිස්සේ "ප්‍රැස්බිටේරියන්" දෙව ස්ථානයේ දෙවගැහිවූ **ඩබ්ලිවාෂ් මැක්ඩිකර්** උන්නාන්සේ සමීපයට ඉගෙණීමට පැමිණියේය. මෙකී පේන සිහිය මෙන් පෙණෙන කරත්තයේ කුඩා ගොනෙක් යොදූ එම කරත්තයෙන් එකී පැමිණි පික කලක් ඉංග්‍රිසි ඉගෙණ ගන්න අතර, මැක්ඩිකර් උන්නාන්සේ සියරට යාමට පිටත්වූහ. මේ කාලයේ ද සොසිසා පුෂ්ප මහතා ආරක්ෂාවට කිපියේ ගල්කිස්සේ ආඩම්බරගේ **ෆෝමිස් අල්විස්** නම් අයෙකි. පියවූ ද සොසිසාතුමා මේ අයට මිස්පතා දීගෙණ ආ වැවුස් හැර, ගල්කිස්සේ මාදන්ගහ වත්ත සහ ඒව අයත් ගෙයද මුදලට රැගෙණ නැතිතෙලේය. පියාට

වාසල මුදලි නෙතහර ලංවෙන කාලයේ ද සොඩිසා සුසපූ මහතාට වඩා සනීප ගෙන්දීම සඳහා වෛද්‍යයන්ගේ නියමිතව කළුතර ගෙයක් කුලියට ගෙන් එහි නතර කරවා සිටියේය.

යලකට පසු නැවතත් **කොඩිලැන්ඩර්ගේ** මහතා එම පවුලත් සමඟ මොරටුවේ නවිනාගෙණ ද සොඩිසා සුසපූ මහතාට ශාස්ත්‍රොද්ග්‍රහණය කරවිය. ඔට පසු තොටලඟට පැමිණ සිටියේ කුඩා පියාවන **සුසෙවි ද සොඩිසා** මහතාගේ නුවරේ නැවතී **ඇන්ඩිරිසන් මහතා** එවෙනට ඉගැන්නූ තොටලඟ, ආණ්ඩුවේ විද්‍යුලයට පැමිණ්වේය. කුඩාවියා සමඟ තොටලඟ නැවත් සිටින කාලයේ, වැඩිය පියතුමා විසින් ඇදුම් ආදිය ගැන්මට විටින්විට දෙනලද මුදල් එකතුකොට, තිබෙන ඇදුම් දුකසේ ප්‍රයොජන ගන්නීමින් අලුත් ඇදුට් නොගෙන් එම මුදල දුන් මත් යාචකාදීන්ට දී දමන සිරින ඇතිකෙළේය. එහිදී කලක් ඉගෙණ ඊටපසු උසස් ඉගෙණීමට තිතැතිම ශුඛවූ තෝමස්ගේ මහශාස්ත්‍ර ශාලාවේ තිබෙන නිවසට බැඳුනේය. මෙසේ බැඳී දැඩරුද්දන් පමණ එහි ශාස්ත්‍රොද්ග්‍රහණය කරණ අතර වැඩිදුර ඉගෙණීම සඳහා වෙහෙසවීම ශරීර සැපයට බාධාය යන දැක්ක වෛද්‍යයන්ගේ දැනමිති කම ලෙස එයින් අත්හරවා පියාට හිමි වතුපිටි සම්බන්ධ කටයුතුවලැ ඔඩඩකු කරවිය.

———:o:———

පාඩගාලාවිල ගතකල කාලය.

———

පළමුවෙන් සිංහල ඉගෙණීම සඳහා විහාරස්ථානයට යන කාලය සුවයේ ගතකල නමුත්, ඉංග්‍රීසි ඉගෙණීම සඳහා විද්‍යුලයන්ට යාමෙන් අවශෙස ඇතම ලමයින් ගෙන් විස කිරිහැරයක් තිබුන බව පෙණේ.

මෝරවූවේ පාඨශාලාවට යන කාලයේ දිනක් අඳිස් නම් ලමයෙක් චාලීස්ගේ ඇඳුම් ගැන රඟහළොව හිත් ඊදෙන අයුරුමට දෙඩුවේය. අඳිස්ව කිසි වරදක් නොකළ චාලීස් මේ ගැන තරහනොවී නිශ්ශබ්දවූතැන නොඉවසිලිවන්ත අඳිස් චාලීස් ලඟට කිට්ටුව තර පැලඳ තිබුන රන්මාලය ඇද තැබුවේය. මේපමණ දුරට අඳිස් විරුද්ධලෙස ක්‍රියාකළ නමුත් චාලීස් කිසිසේත් නොකිපී වචනයකුදු නොදෙඩා සිටියේය. මේ බව දුටු අවශෙෂ ලමෝ රුස්ව අඳිස්ව තරවටුකොට චාලීස් සැනසුවාහුය.

චාලීස්, ඉඩබූ නෝමස්ගේ ශිෂ්‍ය නිවසේ නැවති සිටින කාලයේ එම ශිෂ්‍ය නිවසේම නැවති සිටිය තවත්තර ලමයෙක් එසේම රඟහළොට හිරිහැර කරගිබේ. නිරහඞ්කාර නිර්විකාර චාලීස්, දිනක් ශිෂ්‍ය නිවසේ පසක සිටින අතර කවුතර ලමයා කිට්ටුවී "උඹේ පියා ලොකු කාසිකාරයෙක් නොවේදැ" යි ඇසිය. චාලීස් ඊට කිසි උත්තරයක් නොදී සිටිනකල නැවතත් "උඹේ පොහොසත්කමට මම හයනෑ, උඹ කසාද බැඳීමට අදහස්කරණ මනමාලියක් ඇත්නම්, ඈද මම උදුරා ගන්නෙමි" යි යනාදිය දෙඩුවේය. චාලීස් මේ කිසි කාරණා ගැන නොකිපී මද සිනාවකින් සුහනව "උඹින් මම උදුරාගන්නෙමද? මගෙන් උඹ උදුරා ගන්නෙකිද? සතු දැන් කියන්ට බැරිය" යි පවසා ශිෂ්‍ය නිවසැතුලට වැදුනේය.

ව්‍යායාම අත්තාරාය යනු වෛද්‍යයන් නියම්කර තිබුන නිසා චාලීස් සෙල්ලමට නොගොස් ශිෂ්‍යයන් විසින් පවත්වන පඳුරු ක්‍රීඩාදිය බලා සිටියි. දිනක සවස මෙසේ ශිෂ්‍යයන් විසින් පවත්වන පඳුරුක්‍රීඩා බලාසිටින කල නික්ලස් නම් ලමයෙක් චාලීස්ට අල්ලන්ට පඳුරුක් එසිනෙල්ලේය. චාලීස් පඳුරට මගහැර සිටි කල, නික්ලස් දුවැවිත් චාලීස්ගේ පපුවට අතගසා තල්ලුකර දැම්මේය. නික්ලස් ශක්‍යති සම්පන්න ගැටයෙක්ව සිටි

තමුත් චාල්ස් බිමහෙලන්ට අසම්මිච්ය. චාල්ස් ගල් කතුවක් මෙන් නොසෙල්වුනා දුටු නික්ලස් කිපී පහුව නෑල්ලිම ගැන දෙස් පවරා කථාකෙළේය. චාල්ස් මේ කිසිවකට උත්තර නොදී තුෂ්ණීම්භූතව සිටියේය. මේ ඩබ්බිම හැර පාඨශාලාවලැ ගහනළ කාලවලැ ඇතැම් ලමයින් මෙන් දබරකරගත් බවක් නොපෙනේ.

———:o:———

උඩරට ගහනළ කාලය.

ශරීර සුඛය සඳහා සහ පියාගේ සිය චක්ෂුජ තෘෂ්ණා දුනහැන්ම සඳහාත් පිය තෙමේ චාල්ස් උඩරටට එක්ක ගියේය. උඩරට ගියාට පසු නොබෝ දවසකින්ම වැටීම සම්බන්ධ කටයුතුවල ව්‍යාවෘතවීමට පටන්ගත්තේය. වතුවල ඇවිදීම සඳහා අසුන්පිට යාමටද පුරුදු වුනේය. මෙසේ කාලානික්‍රමණයෙන් පළමු නොමැතිව තිබුන ශරීර සුඛයද කඩිසරකමද, නිවිහිත තාවයද බලාපොරොත්තු නූන අන්දමට වර්ධනවිය. දිනෙන් දින උඩරට වැදගත් ජනයා දුනහැඳින ගැනීමෙන්ද, විවාහාර්ථ හුදී ජනතාව සම්භ සමාගම් පැවැත්වීමෙන්ද, විවේක කාලයෙහි පොත්පත් කියවීමෙන්ද උත්තමයෙකුට අසිහි ප්‍රධාන කටයුතු හොඳ කාර දුන ඉගෙන් ගත්තේය.

සාධුශුණයෙන් හෙබියාවූ පියාගේ අඩිපාරේ ගමන් කිරීමට ප්‍රියාධික්‍ය පුත්‍රතෙම පියතුමාගේ සකල ශුචරිත කුශල ක්‍රියාවන්ට ප්‍රිය වේෂින් එයම පුරුදු පුහුණු කිරීමට සිතට ගත්තේය. එසේදවුවත් තමන් කැමති ශුචරිත ක්‍රියාවන් කිරීමට එවකට මුදලින් කිසි බලයක් නොතිබුන හෙයින් තමන් කරකියන වැඩ කොටසට වැටුප් ලැබෙයේහෝ සත විවිකිච්ඡාවට පැමිණ බෙදා හැහාවකින් සුකතව තමන් කෙරෙහි යම්කි කල්පනා කිරීමට ඔයාට සිතෙන අඳුම්ව වඩ වඩා කඩිසරලෙස සහ අවධානලෙස තම කොටසේ වැඩ මොනවට

ඉවුකෙළේය. මෘගෙන්‍ද්‍රයා තම චක්ෂු ඉන්ද්‍රිය සහ කර්ණේන්ද්‍රිය ඇඩකීය පොකකාතු කම්පිතයෙන් ගිරිලෙන දෙර හැර යන්නාක්මෙන්, පැනසර මුදලිහුතෙම ඇඩකීය චක්ෂු ඉන්ද්‍රිය සහ කර්ණේන්ද්‍රිය සියවිත් කෙරෙහි අනවරතයෙන් විඤ්ඤාපකිරීමෙන් සිවි බැවින්, පුත්‍රඛ්‍යාස දූන ප්‍රිය මනාප සිත් ඇත්තේ; වැටුප් වශයෙන් නොව සුදු වැස්ස මුදලක් වශයෙන් පුත්‍රයාගේ පියෑම් පසුබියට ප්‍රමාණ මුදලක් මසකට වරක් දීමට මුදල් ගෙවීම් සම්බන්ධ කටයුතු කරන්නවුන්ට නියම කෙළේය.

මෙම නීයමය දූනගත් පුසඳ් මහතා පියා මෙන් කුශල ක්‍රියාවන්ට මුදලින් සුළු උපකාර කිරීමට තමාටත් ඉඩලැබුන සෙයින් ඉතා ප්‍රියව ව්‍යාපාර වර්ධනයෙන් සුඛිතව ඉවරිත සෙයි යොදි කාලය ගතකිරීමට පටන්ගත. මේ බව දූන ගත් උඩරට දුක්පත් ජනයෝ මුදලින් සුළු සුළු උපකාර ලබාගැනීමට පුසඳ් ද සොයිසා මහතා සොයා එමටද පටන් ගත්හ. රෝන් රුගෙණ යාමට මල කරා පැමිණෙන භාඩක සමූහයාට මල විරුඬ නොවන්නාක්මෙන් උපකාර ලැබීම සඳහා තමන් කරා පැමිණෙන දුක්පත් ජනයා කෙරෙහි පුසඳ් ඔහත්මයා කිසි විරුඬයක් කවදුවත් නොපෙන්නු වේය. මේ කාලයේදී තමන්කරා පැමිණෙන අසරණයින්ට පතාග තුණ හතර මුදලින් දුන් නමුත් වැඩි මුදලක් දීමට මෙතාක් ප්‍රසාදවක් නොපැමිණි හෙයින් නිශ්ශබ්දව සිටියේය.

———:o:———

පමුඛ දහයේ පූර්ව නිමිති.

දිනක් ගේවාහැවේ තල්මුනේ යන ගම් සිවි කිරි. මැණිකි නම් විධව ස්ත්‍රියක් පුසඳ් මහතා වෙත පැමිණ දූස් පිරුණ කඳුලින් සුඛිතව ඇසුවන් ලය කම්පිත වන ආකාර දුක් මුසු වචනයන්ගෙන්, "පින්වතුනි, මම අසරණ වැන්දඹියක්ය. මට දරුවන් සතරදෙනෙක් ඇතිවූයල

ගිම් තෙම මියගියේය. ඔහු ජීවත්ව සිටියදී ගත් නය මුදලක් ගෙවාගන්ට බැරිවීමෙන් නය හිමියා නඩුපවරා අපගේ ජීවත්වීමට තිබෙන එකම ඉඩම කැබැල්ල විකිණීමට මුලාදුන් එන්ට සිටින බව දැනගතිමි. මෙය ගෙවා ගැනීමට කිසි පිහිටක් නොමැති සෙයින් ඔබ වහන්සේ කරා ආවෙමි" යි පැවසිය. මෑ විසින් කියන්ට යෙදුන දුක්මුසු වචන ඇසූ පුඤ්ඤ ද සොසිසා මහතාගේ ලය ගින්න ඇසුරුකළ වෙඩරු පිඩක් මෙන් හුතුඹුව "ඒ හයෙන් නිදහස්ව දරුවන් සමග සුවසේ සිටපන්නැ" යි පවසා කමින්ට ලැබෙන සුළු මුදලෙන් පවුම් දහයක් (ප. 10.) ණුව දී යැවීවේය. සඳුන් ගහෙන් උපදින ශාඛා තෙම චන්දන ගන්ධයම පතුරන්නාක්මෙන්, ද සොසිසා මුදලිතුමාගේ පුත්‍ර වෙම පුඤ්ඤ ද සොසිසා මහතා එම ගුණයෙන්ම සුක්‍ෂතවූවා යනු මෙසින් මනාව ඔප්පුවේ.

———:o:———

වණිකාරසාගේ ප්‍රවෘත්තිය.

ඉතා සියකරුලෙස ශරීරයේ උෂ්ණාංශය දැනගිය් දෙක දස්වා වණවලින් යුක්ත වූ වණිකාරයෙක් වත්තව පැමිණියේය. මොහුගේ ඇතම් වණයන්ගි තෙල උපලිප්තකොට ආවරණය කිරීමෙන්ද ඇතට වණයන් අනාවරණයෙන්ද ඇතිවිය. මෙසේවූ මොහුගේ පැමිණීම් දුටු අනුජීවීන් පුඤ්ඤ ද සොසිසා මහතා මොහු දැක සියවෙයයි සිතා වත්තෙන් පිට යාමට තර්ජනය කළෝය. උපද්‍රව මොහු, වෙ තර්ජනයට භයකුටුවා පමණක් නොව මොවිනු සමග විවාදයටද පවන්ගත්තේය. මෙකී කලහ ශබ්දය පුඤ්ඤ මහතා සිපි නිවසට ඇසි කලහ පවතින දිශාව බලා "ඔය කිමෙක්ද" යි අසමින් වැඩකරුවන් එකතුව සිටිතැනට පැමිණියේය. වණවලින් අසිහ දුගඳය හමන බැවින් ඉවසිය නොහැක්කවුන් සැකිය නාස්සිදුරු තෂ්ණාඩුලිවලින් අසුරාගෙණ සිටින බව පුඤ්ඤ මහතා දුටුවේය. පුඤ්ඤ මහතා එන බව දුටු කිපදෙනෙක්

ඉදිරියට දුවැවිත් වණිකාරයා ගැණි සහ දුකිනිය ගැණුන් දන්වා ගමන වලකන්ට අභිප්‍රායකල නමුත් එය නොඅසා එන බව දැක, ඇතම් වැඩකරුවෝ, සුවඳවැති මල් පොකුරු කඩා ගෙණැවිත් සිඹ සිඹ යන්වය පවසමින්ද, ඇතම් කෙණෙක් මුව පිස්නාසය ගෙණැවිත්ද දිස්කලාහ. මෝරණ පුණ්‍ය ලක්ෂණයන්ගෙන් භාග්‍යවත පින්වතා එක මලකුදු මුවපිස්නා කඩකුදු අතට නො ගෙණ වණිකාරයා සමීපයට පැමිණ කාරණා පිළිවිසුවේය.

රොගාතුරයා, පුඤ්ඤ මහතාට වැඳ "පින්වතුන්වහන්ස, මගේ ගම සතරකෝරළේය, මගේ නම කිරිසාය, පළමුව සුළු වණ සෑදී ඒ වණ ක්‍රමයෙන් මහත්ව නිසි ප්‍රකාර ඖෂධ ගැණීමට එයසිසදම් නොමැතිව අසරණව සිටිමි. මේ වණරොගය තරණකොටගෙණ පව්ලෙන් අහක්ව වන වැදීමටද සිදුවී තිබේය" යි කියා සිටියේය. පුණ්‍යවන්තා මහතා මේ ගැණ කිසි අප්‍රියභාවයකට හෝ අප්‍රශ්නනයකට නොපැමිණ ලියමණක් ලියා වැඩකරු වෙක් සමග ඔහු ආරොග්‍යශාලාවට පිටත්කෙළේය. එහිදී මොහුට පික සුවයක් ලැබිගෙණ එන අතර ආරොග්‍යශාලාවෙන් කිපවරක්ම පැන ගියේය. ඒ බව දැනගත් පුඤ්ඤ මහතා ඒ කිපවරම මොහු අල්වා එහි යවා සම්පූර්ණ සුවය ගෙණදී මහ විසදම් ආදියත් සලසා ගමට පිටත්කර යැවිවේය.

පිණැත්තවුන් කරකියන කුසල ක්‍රියාවන්ගේ සම්පූර්ණ අර්ථය ලැබීමට නිරවශෙෂයෙන් උත්සාහ කරණ ධර්මය ලෙස, මේ පුඤ්ඤ මහතාද, පැන ගිය රොගියා නැවත නැවත අල්වා ආරොග්‍ය ශාලාවට යවා තමන්ගේ කුසල ක්‍රියාව මහඵලප්‍රාප්ත කරගත් මහිමය ගැණ සියලු නුවණැත්තවුන්ගෙන් ප්‍රශංසා නොඅසන්ද? මොහු ගැණ කල සියලු විසදම්ද එවකට තමන්ට ලැබුන සුළු වැය මුදලින්ම කෙළේය.

උක්කුරාළගේ පුවත්තනිය.

හතරකෝරළයේ උක්කුරාළ නම් අයගේ වැඩුම්හල් සහෝදරයා පැවිදිව සිටියේය. උන්නාන්සේට සතුරුව සිටි කෙනෙක් රහස්ගතව පන්සලට පැමිණ වෙඩිගිබා මැරුවේය. උක්කුරාළ හොඳහැටි දන්න මිනිමරුවාට විරුද්ධ නඩු පමුණුවන්ට අදහස්කොට ඊට උවමනා මුදල් මිහතෙම තීසා පසුබටවී සිටිනාකල ද සොසියා මහත්වරුන්ගේ හුණ මිහිමය ගැණ කෙනෙක් මොහුට දන්වා සිටියේය. මෙය ඇසූ උක්කුරාළ පුසඳ්ධ ද සොසියා මහත්මයාකුත් පැමිණ තම සහෝදරයා මරණයට පත්කළ තොරතුරු කියා නඩුමගට පැමිණීමට කිසිම මුදලක් නැතිසෙයින් පසුබටවී සිටින බව කියාසිටියේය. කරුණාවන්ත මහතා පැවජී කෙනෙකුට කළ අපරාධ ක්‍රියාව සෙසුපවු නොවන බව සිතා, නඩුමගට පැමිණ මිනිමරුවාට දඩුවම් කරවීම සුතුය කියා උක්කුරාළට පවුම් පහක් (ප. 5.) දුන්නේය. මේ මුදලද තමන්ට ලැබෙන පුළු වැස මුදලින්ම දී උක්කුරාළගේ දුක සංසිඳවාලිය.

—:o:—

කිරිමැණිකිගේ පුවත්තනිය.

සාරිස්පත්තුවේ හරන්කහවේ කිරිමැණිකි දිනක් පුසඳ්ධ මහතා සම්බව්මට අවුත් ඔහොමෝ පුරුෂයාගෙන් වියොගව සිටින විධව ස්ත්‍රියක් බවත් ඇගේ නව යොවුන් වයස්ගත දියනියට මඩගලාගයක් තින්දුවී තිබෙන බවත් ඒ සතුට සඳහා මඟුල් කිමටත් යම්කිසි උපකාරයක් ලබාගැණීමටත් ආබව කියා සිරිත්ප්‍රකාර බුලත් දුන්නාහ. පුසඳ්ධ මහතා කටකොනකින් සිනාහවී බුලත් අතට ගෙණ තමන් වසන ගෙතුළට හොස් අවුත් පවුම් පහක් (ප. 5.) දී තවත් උවමනා දෙයක් ඇතිනම් දන්වන්ට නියමකර ඈ ප්‍රතිනිවර්තනය කරවීය.

තලාතුඔයේ කන්කානමගේ පවිලේ පුවානනිය.

තලාතුඔයේ ද සොසිසා මහතුන්ට හිමි වත්තක වැඩ බැලූ, පමණක්දුර ධනවතෙක්ව දවස් ගතකල කන්කානම් නම් අය මැරී ගියේය. ඔහු මියගියාව පසු එම පවිලට නොයෙක් අමාරු අපහසුකම් පැමිණ, තිබුන දේපල සියල්ලම නැතිවීගොස් ඉතා අසරණ භාවයට පත්විය. මේ වැසඳුණු ස්ත්‍රී පුරුෂ මහතා සොයාගෙණැවිත් ඇගේ දුක කීකල ඉතා ශොකයට පත්ව තම වැඩකරුවෙකුගේ ස්ත්‍රිව උපකාර කල යුතුය යන මහඟ කල්පනාවෙන් යුතුනව වෙලඳුමක්කොට දරුවන් රැකගැණීමට අණ කොට පවුම් දහයක් (ප. 10.) දී පිටත් කෙළේය.

———:o:———

දැමින් අප්පුගේ ස්ත්‍රීගේ පුවානනිය.

මසිලපිටියේ දැව්ත් අප්පු නම් කෙණෙක් ද සොසිසා මහත්වරුන් යටතේ කලක් මෙහෙවරකොට සිටියේය. මෙසේ සිට තරුණවූ මොහු ගෘහාබන්ධනයට අසුවුනේය. මෙයින් පසු මොහු විසා කලක් යෙහෙන් කලදවස ගෙවා ගෙණ එන අතර තම භාය්‍යාවගේ ආහාරතාවයකින් උගෙහෝ හදිස්සි රොගයකින් මියපරලොව ගියේය. යනමං නැතිවූ විධව ස්ත්‍රී පුරුෂ මහතා කරා පැමිණ සිදුවූ විපත කීකල යම් කිසිවක්කොට රැකෙන්ට කියා ඈවද පවුම් දහයක් (ප. 10.) දී යැව්වේය.

———:o:———

මළවුන් වළලූ පුවානනිය.

පුරුෂ මහත්මයා මහනුවර නගරයේ සිටින කාලයේ ගැවුඹෙ ප්ලාතේ ප්‍රවන් නෙදේ කියන අය මැරී භූමදන කර ගැණීමට වියදම් නැති නිසා ඔහුගේ

සුදු ආරක්ෂියෙන් සොයාගෙණ අවුත් පුසුදු මහතා සමඟවුසල් ඔවුන්ට පැමිණි විපත් සහ මෑතශරීරය වල ලාහන්ට වියදම් නැති බවත් කියාඩිවියාය. පුණ්‍ය වන්තා මහතා මෑතදෙහය ගුමදුන කරගැණීම් සඳහා පහා තිහක් (පහා. ෂට.) දී යන්ට හැරියේය.

——:o:——

දෙල්නොට උක්කුරුළ ගේ ප්‍රවෘත්තිය.

දෙල්නොට උක්කුරුළ නම් අයගේ පදිංචි ගෙය හදිස්සියෙන් හිතිහෙණ දැහියේය. ඉලුක්වලින් සෙවිලි කරණලද ගෙවලට හිනි ඇවිලිහල සුනුසුලුව දැ යාම් සිදාව හෙයින්, මේ ගෙයද දැසෑමට ප්‍රමාදනූන නිසා හෙතුල තිබුන කිසිවක් පිටකර ගැන්මවද බැරිවිය. පදිංචි නිවෙසක් නොමැති මේම අසරණයා පුසුදු ද සොසියා මහතා සමීපයට පැමිණ තම ගෙට සිදුවූ භයානක පුවත්ද දරුපැටවුන් සමඟ වන වැදීම හැර විසිමට අන්‍ය මාර්ගයක් නොමැති බවද කියා හැඩුවේය. දයාවන්ත මහතා හෙයි ප්‍රමාණය සහ පවිල ගැණ්ද කාරණා අසා කෝපි හබඩා සෑදීමට ඉරවා තිබුන සටලි පරල ආදිය සහ මුදල් පිකක්ද දී ගේ තනාගැණීමට නියමකළා පමණක් නොව ගෙය අවසානවනතුරු අඩුදෙය දිමෙන් වරින්වරද උපකාර වූයේය.

——:o:——

රන්හාමිගේ ප්‍රවෘත්තිය.

උඩදුම්බර පලාතේ රන්හාමි යන අයගේ පවිලට හසානක අන්දමට මසූරිකා රොගයක් වැලඳී ඉතා දුකට පත්විය. ලෙඩුන්ට සාත්තුකිරීමට උදව්වත්, කෑම බීම්ස දුවෑවත්, වියදම් පිණිස මුදල්වත් නොමැතිව රන්හාමි මහත් දුකට පැමිණියේය. කිසිවෙකුගේ කිසි විකිවක් වේ වනතුරා නොලැබූ රන්හාමි අසල්වාසි

ජනප්‍රධානීන් සොයාගොස් උපකාර ඉල්ලූ නමුත් කිසිම පිහිටක් නොලැබ, පුෂ්‍ය ද සොඬිසා මහතා වෙත පැමිණ තමන්ට පැමිණි සියලුම විපත් නොසඟවා කියාසිටියේය. ලය කම්පිත පුෂ්‍ය මහතා රන්හාමිගෙන් තව දුරටත් තොරතුරු අසාබලා ඉතා ශොකපත්ව පතාග සිසයක් ඔහුට (පතා. 100.) දී ප්‍රවේශමෙන් රොස්න් සුවපත් කරගැණීමට නියමකර යන්ට හැරියේය.

පුෂ්‍ය ද සොඬිසා මහතාට මෙවකට වයස අවුරුදු දහහතටත් දහඅටටත් අතර බව කියන්ට හැකිවේ. පියාගේ නියමයපිට ලැබෙන සුළු වැය මුදලක් මිස මෙවකට වියදම් කිරීමට වෙන ලැබෙන මුදලක් නොමැති විය. මෙසේ ලැබෙන සුළු මුදල නිරාහකේ නැතිකර නොගෙණ අසරණයින්ට බෙදාදීමෙන් ඔවුන්නේ දුක් සහනයකර තිබෙන පුදුම සුභාව දැනගැන්ම මෙය කියවන තරුණයින්ට අත්‍යන්තොපකාර වෙතු නිසැකය.

සුකීය මව්ට සහ පියානන්ට ඉතා කීකරුව මේ ආදී කුසල ක්‍රියා කරමින් කාලය ගතකරණ මෙම තරුණ ද සොඬිසා මහතා ගැණ උඩරට වාසිහු බොහෝ ප්‍රශනන වූහ. දෙම්වියන්ගෙන් වෙන්ව සුළප කලක් සිටියේ සුළු පියාවන සුසෙව් ද සොඬිසා මහතා සම්පයේය. මෙම සුළු පියාට සහ සුළු මවටද ඉතා හයපසුව සිටියේය. වයස අවුරුදු විසිඑක විසිදෙක තරම කාලයේදී කොළඹ ඒමෙන්ද, උඩරටට පැමිණීමෙන්ද පියාගේ සහ සුළු පියාගේ වෙළහෙළඳුම් සම්බන්ධ ගණුදෙනු කටයුතුද, වතුවල වැවිලි සම්බන්ධ කාරණාද, හොඳුකාර දැන ඉගෙණ ගත්තේය. තරුණ මහතා ගවසින් කෙරෙහි විශෙෂ ආදරයක් ඇත්තේ ඉතා කරුණාවෙන් සහ මහත් සැලයි මෙන් ගවසින් බෝකිරීම සම්බන්ධවද කාලය ගතකළේය. මේ කාරණාවලගෙණ ගවසින් බෝකිරීම් සම්බන්ධ විශෙෂ

කරුණු දැනගන්ට ලැබුනා පමණක් නොව එයින් මහත් ප්‍රයෝජනද අත්පත් කර ගත්තේය. මෙයී උත්සාහ වනාකම ගැණ පියා සහ මවද, සුළු පියා සහ සුළු මවද සෙසු බඩුහුදු මෙම මහතා කෙරෙහී පැවති ආදරය විපුලාකාර දිසුණු කළහ.

————: o :————

තරුණ කාලය.

වයස අවිරුදු විස්සවුකල ගෘහඥන භූමියට ප්‍රයෝජන වත්වූ කටයුතු විශෙෂලෙස දැන ඉගෙණ ගැණීමේ ආශාවද, පරලොව සුඛීය සඳහා දැනගතයුතු ධර්මයන්හි ආශාවද ඇතිකළේය. වතුවල ආවිද්‍ම සඳහා අසුන්පිට යාමවද පුරුදු පුහුණුවුනා පමණක් නොව අසුන්ගේ සත්‍යපාරක්‍ෂාව සඳහා කළයුතු සකල කටයුතුද දැන ඉගෙණ ගත්තේය. අශ්ව ගව යන සතුන් කෙරෙහි විශෙෂ කැමැත්තකින් සිටියේය.

සිංහල ඉංග්‍රීසි ප්‍රසිඛ පත්‍ර කියවීමෙන්ද පොත්පත් කියවීමෙන්ද, උගතුන් ආශ්‍රයෙන්ද ලැබුන ශක්තිය දිසුණුකර ගත්තේය. තමන්ගේ නුවණ මෙහෙයා කළයී සකල දෙයින්ම ජය සහ ප්‍රයෝජනය ගත්තේය. යුරෝපියට නිස පාත්කිරිමේ ආශාවත් අසුකතව පහරදීමේ ආශාවත් බාලකාලයේ පටන්ම දිසුණු කෙළේය. මෙසේ ශූරවීරත සෙනිද ධාර්මික කෘතඥයන්හිද සෙදී සිටින සමයෙහි මේ තරුණ මහතාගේ පිය මුදලිතුමා කථාශෙෂභාවොපගත විය. මේතැන් පටන් තරුණ මහතා තම මවගේ සහ සුළු විය සුළු මව් යන දෙපොලගේ සෙවනේ සිටියේය. පිය මුදලිතුමා සැදැහැවන කාලයේ මේම තරුණ මහතාට සයවිසිවස් දෙමස පස්වසි දිනකි.—(අ. 26. මා. 2. ද. 25.)

සරණි මඟ ලෙස.

පියාගෙන් වියොහවූ වයොතලෑණි පුත්‍රයා සුදුකලාව නොවිසිම සඳහාද පාදපරිචාරිකාවක් ලහලිමට වයස් පූරණ හෙයින්ද මව සහ සුළු පියා මෙහෙණි සිතූහ. සුවිශිතවූ සහ සුශීලවූද, මහත් ධනසම්භාරයකට එකම හිමි කාරයාවූද තරුණ ද සොඩිසා මහතාට සුදුසු වරහනක් සෙවීමෙහි ව්‍යාවෘතවූවන් නොයෙක් කන්‍යාඩහනාවන්ගේ නාමයන් සහ බලපුළුවන්කම් ගැණ කාරණා කියා සිටි නමුත්, තරුණ මහතාගේ සුළු පියාගේ සහ මවගේ සිත් ප්‍රශනන කරවීමට බැරිවිය. මේ සම්බන්ධ එකම වචනයක් වත් සරලෙස නොලැබ සිටිනා සමයෙහි, මොරටු ග්‍රාමයේ එවකට ප්‍රසිඩ ධනවතෙක්වූ මෙම පොතේ සිතියමෙන් පෙණෙන **ලිඳමුලගේ ඡුසේ ද සිල්වා** මහත්මයාගේ එකම දියනියවූ **කනිනා ද සිල්වා** නම් නවයොවුන් කන්‍යාඩහනාවගේ නාමය ඉදිරියට පැමිණියේය.

පුණ්‍ය ලක්ෂණයෙන් සහ දෙහ ලක්ෂණයෙන් ගහණ වෙම කන්‍යාවරහන ගැණ අසනලද තරුණ ද සොඩිසා මහතාගේ සුළු පියා සහ මවද අවශෙෂ බලමුනුදු පස්වනක් ප්‍රීතියට පැමිණ මේ සම්බන්ධ වැඩිදුරකාරණා ගැණ සාකච්ඡා කර බැලූහ. කරදරයකටමෙන් කළුතොට තරුණියෙකුට මෑ සරණ් විචාරා තිබෙන බව මෙහිදී ප්‍රකටවිය. මනමාලිගේ පියා සහ බාප්පා වන **පාඨුර සිල්වා** රේඤ මහතාත් තරුණ් ද සොඩිසා මහතාට කැමතිව සිටි නුමුත්, ලිඳමුලගේ **සෙලෙස්තිනු** සිල්වා රේන්ද මහතා කළුතර තරුණ මහතාගේ පක්ෂයට මඟුල තීන්දුකර ගැණීමට බලවත් උත්සාහ දැරීම කරණකොටගෙණ පුණ්‍යවන්තා යෞවනිය ලබාගැණීම සඳහා ද සොඩිසා පක්ෂයට සහ කළුතොට පක්ෂයට තරයේ උත්සාහ වඩන්ට සිදුවිය. වචන උපක්‍රම, ධන උපක්‍රම, බල උපක්‍රමාදියෙන් දෙපස විපුලාකාර දිවා යි දෙන්නි

උත්සාහ ගත්තා අතර, ආගම් සම්බන්ධ ප්‍රශ්නයක්ද ඉදිරියට ආවේය. ද සොසිසා මහතුන්ගේ පක්ෂය එඩ්ගලන්තා සහෝදරියන් බැඳුනුත්, ප්‍රූස් සිල්වා මහතාගේ පක්ෂය රෝම සහෝදරියන් බැඳුනුත් දෙවෙනි විරුද්ධයක් හටගත්ත. මේ සම්බන්ධ අවිනිශ්චිත විශේෂ විවාදය හටගෙන් තිබෙන අතර, සකලාධිකාර විචාරයට ඊවිකිරීන් සෙසින් මේ විරුද්ධකම් නැමති හදිසි විනාශයට තරුණ් ද සොසිසා මහතාගේ භාග්‍ය භාණ්ඩරයම් ප්‍රධානවීමෙන් රාජකීය අවකාශ් **ෂිවර්ඩ් මෝර්ගන්**තුමා සහ **කාවෂ්ජි ඇඩල්ජි** නම් ප්‍රසිද්ධ පාර්සි මහතාත් ද සොසිසා මහතාගේ පක්ෂයට ක්‍රියාකිරීමට බැඳී මෙන් රෝමානු සභාවේ දෙවස්ථානයකදීවත් එංගලන්ත සභාවේ දෙවස්ථානයකදීවත් කාරබන්ධනය සිදුනොකොට ප්‍රූස් ද සිල්වා මහතානන්ගේ නිවෙසෙහිදී කාර බැඳීමට සැර ලෙස තිඤ්ඤ කරගත්හ. මෙයි තිඤ්ඤවට දෙපක්ෂය සතුවුව දින වේලාදියද නිශ්චය කරගත්හ. ඔක්ස්ෆර්ඩ් විද්‍යාලයේ ශිෂ්‍ය නිවසට තරුණ් ද සොසිසා මහතා බැඳී සිටින කාලයේ තළුතර ලමයෙකුට දුන්. චිළිවිදන් පරිපුණ්වීම පිණිසයෝ හෝ මෙම චරහන ට තරුණ් **ද සොසිසා** මහතාටම ප්‍රිය භාග්‍යවතකොට තින්දුවීම් ආශ්චර්ය්‍යයක්මෙන් මෙහිදී පෙණ්නොයේද?

සරණ් මඩගලෙන්තසවය සඳහා නියමිතරගත් දින ආසනනවූයේ මොරටුවේ ද සොසිසා වලව්ව මොනවට සරසා සකස්කරණු ලැබුවේය. කෑම්බිම් සහ ආසන ප්‍රබන්ධිද එසේම සකස් කරණුලැබිය. එවකට මොරටුවේ තිබුන ලක්ෂණවූද, විශාලවූද ගොඩනැගිලි දෙක මේම වලව්ව සහ ප්‍රූස් සිල්වා මහතාගේ නිවසත්ය. මේ නිවසද මඩගලෘය සඳහා මනාකොට සරසා කෑම්බිම් සහ ආසනාදියද සකස්කෙළේය. දෙපක්ෂයම කිවිවුවුර බඹුන්ට බුලත්දීමෙන්ද මිතුමහත්වරු ආදීන්ට ලියුම් යවමින්ද මිතුල්කිවෝය. මනමාලිගේ පක්ෂයේ සියලුම බඹු මිතු ආදීනු ප්‍රූස් ද සිල්වා මහත්මයාගේ නිවසට සම්ප්‍රාප්තවූහ.

මනමාලි ඉඞ්ග්‍රීසි පිළිවෙළට සූදානම් කරණලද භූෂා ලඞ්කාර "ගවොම" * හැඳ දියමන්ති බෙරලියන්තු ආදි රත්නමුදු රන් ආභරණ සහ අගනා මුක්තාවලිද පැලඳ කාන්තාරශ්මි මාලාවෙන් භ්‍රාජිතව ලඳරියන් සුවලක් පිරිවරාගෙණ සිටියාය. මනමාල මහතාද ලඞ්කාරට හැඳපැලඳ වරුණ හැන්නැදිගේ අන්ද්‍රිස් ද සොයිසා මහතා සහ හැන්නැදිගේ ලූවිස් පීරිස් මහතා සහලුවන්ලෙස නෝරාගෙණ නෝනා මහතුන් දෙලොස්දෙනෙකු සහිත බන්ධු මිත්‍රාදීන් පිරිවරා ජුසේ ද සිල්වා මහතානන්ගේ නිවසට පැමිණියේය. දෙපක්ෂයේ බන්ධු මිත්‍රාදීන් මධ්‍යයෙහිදී රෝමානු සභාවේ සැලකියසුතු පූජකයෙක් වන **එමලිසානු** ගුරු ප්‍රසාදීතුමා විසින් තරුණ චාලිස් හැන්රි ද සොයිසා මහතා සහ තරුණ කත්‍රිනා ද සිල්වා මහත්මිය යන දෙදෙන දෙව පණනට අනුරූපව වර්ෂ එක්දහස් අටසිය සැටතෙවෙනි වස පෙබරවරි මස සතරවන (1863. පෙ. ම. 4.) දින ලොව සිරිත් ප්‍රකාර ශුභ සරණබන්ධනයට ඇතුළත් කරණලැබූහ.

මෙම උසස් මඞ්ගල්‍යය සම්බන්ධව සිරිත්ප්‍රකාර දෙන දෑයාද ගැණ හෝ සන්තෝෂ ධනයක් ගැණ හෝ දෙපක්ෂයේම කිසි කථාවක් නොමැතිව තුබුන නමුත්, ජුසේ ද සිල්වා මහතා තම එකම ප්‍රිය දුහිතෘ වෙනුවෙන් ඕස්ත්‍රලියාවේ පවුම් නමින් ප්‍රසිද්ධ පවුම්වලින් රත්රන් පවුම් සත්දස් පන්සියයක් (ප. 7500) සන්තෝෂ ධනවශයෙන් මනමාල මහත්මයාට තෑගිකොළේය. මෙවකට පතාග ගණින් නොමැති නමුත් දෑයාද දීම ආදියේදී මෙවනතුරුත් පතාග ගණින සිංහල ජනයා අතර පැවතුන බැවින් පතාග ලක්ෂය සම්පූර්ණ කිරීමත් අභිමතාර්ථකොට මේ ධනය දුන්නේය. †

---

* මොරටුවේ පළමුවෙනි වරට ඉංග්‍රීසි ඇඳුමකින් පෙණී සිටිය මනමාලිය නම් මෙතුමිය.

† මෙකී මුදල මෙවෙලාවේ අන්ද්‍රිස් ද සොයිසා මහතා බාර ගන්නා ලදින්, පසුව සුසේව් ද සොයිසා මහතාට ගැණ බාරදුන්නේය. සුසේව් ද සොයිසා මහතා ඒකී මුදල පවුම් දහදහස වනතුරු (10000) දියුණුකොට චාර්ලස් හැන්රි ද සොයිසා මහතාට බාරදුන්නේය.

මෙසේ ඉටුකරණලද සරණ මඞගලයෙන් පසු මෙම ප්‍රිය සඞගමයට සම්ප්‍රාප්ත පිරිසට පුංසේ ද සිල්වා මහතා සහ එම මහත්මිය විසින් සැලකිලි සහිතව පිළියෙළකර තිබුන මඞගල්‍ය භොජන භුක්තිවිඳීමට සියලුම දෙන වාඩි වූහ. මෙ සමග මනමාල යුවලද වාඩිගත්හ. එවෑනට පැවතුන සිරිත්ලෙස කා බී ඉවරවූවායින් පසු මඞගල්‍ය "කේක්" වලින් සඞග්‍රහ කරණු ලැබූහ. මෙයින් පසු ප්‍රසිඞ වෙළඳ සමාගමක් වන ජෝර්ජ් ස්ටුවාර්ට් සමාගමෙ කොටස්කාරයෙක්වූ **ඇලෙක්සැන්ඩර් මැකැන්සි** මහතා අගිනව යුවලගේ සැප ප්‍රාර්ථනාකර සියබසින් වැදගත් කථාවක් කෙළේය. **රිචර්ඩ මෝර්ගන්** රාජකීය අවකාත් තුමාද ඉතා ව්‍යක්ත කථාවක්කොට අභිනව යුවලගේ දෙමව්පියාදීන්ගේ සැප ප්‍රාර්ථනා කෙළේය. **විල්සන් පිවි** සමාගමෙ කොටස්කාරයෙක්වූ **පිවි** මහතාද කථාවක් කෙළේය. මෙයින් පසු සියලුදෙනම කෑම මෙසේ අත්හැර මොරටුවේ ද සොයිසා මුදලිතුමගේ වලව්වට මනමාල මහත්මිය කැඳවාගෙණ යාමට සූදනම්වූහ. මෙ ගමනට විශෙෂවශයෙන් ගෑණු මහතුන් දොළොස්දෙනෙක් මනමාල නෝනා මහත්මයා ඇරලීමට පිටත්වූහ. මෙසේ දෙපස මොරටුවේ වලව්වට පැමිණිකල මනමාල මහත්මයාගේ මව්වන වලව්වේ පැමිණිතැන මෙම පිරිස ඉතා ආදරයෙන් පිළිගෙණ ආචාර සමාචාර කර යලිදු සූදනම්කර තිබුන රෑ කෑම භුක්තිවිඳීමට දෙපස පිරිස වාඩිගත්හ. මහමරක්කලගේ **ජෝහානස් ප්‍රෙරා** මහත්මයා ස්වකීය භාෂාවෙන් ඉතා රම්‍යොපදෙශයන්ගෙන් යුත් ව්‍යක්ත කථාවක්කොට අභිනව යුවලට ආශංසනය කෙළේය. "සිලොන් රයිපල්" නම් යුඩ හමුදාවේ තූර්‍ය්‍යකාරුවන් විසින් තූර්‍ය්‍ය පැවැත්වීමෙන් පැමිණි ජනයා සතුටු කළහ. මින්පසු කිංනෙෂිත ජනයා විසින් ගෙණැවිත් තිබුන එළු, පාලි, සංස්කෘත කාව්‍යාදිය කියවා ඔප්පුකරණලදී. මනමාල මහතා මෙකී කාව්‍යාදිය පිළිගෙණ ඊට සතුනී දිය යුත්තන්ට සතුනි සහ සන්තොෂ ධන දිය යුත්තන්ට එසේ දීමෙනුත් සඞග්‍රහ කෙළේය. ගිනි ක්‍රීඩාකාර

ජනයා ගෙණැවිත් තිබුන මහත් රශියක් කව්වනු, හුම්වනු, මල්දෙඩම්, මුතුපොල්, මල්වාවර, මුතුකම්බි, ආකාශ ආදිය ගිනිදීමෙන් මාහැගි අගනි ක්‍රීඩාවක්කොට අභිනව යුවල සහ රැස්වූවන් සනතුෂ්ඨියට පත්කලහ. මොවුන්ටද මනමාල මහතා තෑගිදීමෙන් සහ කෑම්බීම දීමෙන් සඞ්ග්‍රහ කරණලදී. මෙසේ මෙම ආශ්චර්ය්‍යවත් මඞ්ගලෝත්සවය මහත් ගරු ගම්භීරාකාරයෙන් සමාප්ත වූයේය. මනමාල මහත්මියගේ පිය නිවසේදී මෙම කරකාර මඞ්ගල්‍යය සිදුවූ නමුත් රෝම සභාවේ පූජක කුමෙකුලවා සරණබන්ධනය සිඞ්කිරීම ගැණ එඞ්ගලන්ත සභාකාර ගුරුවරුන් සහ සභාකාර ජනයා අතර විරුඬතාවයක් ඇති බව දැනගත් ද සොයිසා මහතා සම්‍යක් උපායකින් ඒ පක්ෂයේද සිත් දිනාගත්තේය. මෙයින් පසු මෙම නවයොවුන් යුවල මුළු ලක්වැසි ජනයාගේම සිත් දිනාගනිමින් සුවසේ කුටුම්බ සංස්ථාපණයෙහි යුතුකම කිරීමට පටන් ගත්හ.

———:o:———

ඥාන ශක්තිය.

———

ද සොයිසා මහතාගේ ඥානශක්තිය ගැණ සොයාබැලූ කල ඉතා සතුටුදායක බව තේරුම්යයි. කිසිවෙකු විසින් කියනලද කිසිවක් ගැණ තමන්ගේ නුවණ නොමෙහෙයා කිසිකලෙකත් කිසි දෙයක් නොකෙළේය. යම් දෙයක් කිරීමට ප්‍රථම ඒ දේ ගැණ කල්පනා කරණ සිරිතක්ද ඇතිකෙළේය. මෙසේ කල්පනාකර යමක් කෙළේද සැබවින්ම එයින් ජයගත්තේය. තමන් පටන්ගත් වැඩ ගැණ බාධාකරණ අපියෙන් කොදුරන්නෝ ඇතිවූහ. ඥානවන්ත මහත්මයා ඒ කෙඳිරීම් ගැණ කන් නැත්තෙකුගේ ස්වභාවයෙන් ක්‍රියාකර ඒ ඒ වැඩවලින් ජයගත්තැන් බොහෝය. යම්කිසි පරාර්ථක වැඩක් සඳහා අදහස් කෙළේනම්, ඒ කටයුත්ත එසේ කිරීමෙන් ලෝකයාට

ලැබෙන වල අපල දෙක කැඩපතින් මුව බැලුවාසේ ජේශ නුවණැසක් මෙ ගුණවත් මහතාට ප්‍රකෘතියෙන් පිහිටා තිබුන බව බොහෝ කරුණුවලින් මනාලෙස ඔප්පුවේ. දුප් මත් යාචකාදීන්ට නිතර සඞ්ග්‍රහ කිරීමට රුචි පින්වතා අනාගත වාරවල සඞ්ග්‍රහකොලෙ මතු ලබන අදහසකින් නොව, "ධනවතාගේ ආධාරොපකාරයෙන් දුක්පතා රක්ෂාවිය යුතුය" යන උතුම් ධර්මය නොබිඳ ක්‍රියා කිරීමෙහි යුක්තිය නුවණින් දැනගෙණ බව අතාඹුලක් සේ ඔප්පුවූතැන් බොහෝය. සකල කුශල චරිතයෙහි විපුලාකාරයෙන් තත්පරව ක්‍රියාකල පිය සුළුපිය මුදලි මහාශ්‍රීෂ්වරයන් දෙදෙනාගේ අඩිපාරේ ගමන්කල මෙ මහතාට හිතුවක් මුදුන්පත්වීම දෙවබලයකින්මෙන් ඉතා සරු ආකාර ඉටුවියාම විජෘම්භනයක්ලෙස පැවතින. මහත් ධනසම්භාරයකට හිමිකාරයාවූ වාසනාවන්ත මෙ මහතා ඉතා තියුණු ඥානයෙන් මෙසා මහත් ධනය ආගමටද, ලොකයාටද, තමන්ටද ප්‍රයෝජනවන ආකාරයට ගෙණ එම සුලුපටු ඥනයකින් කල හැකි ක්‍රමයක් නොවන බව විචක්ෂණයන්ම දත් කතීවෘයකි. ධනයෙන් ධන වර්ධනකිරීමෙ යත්නය ගැණ පසුබට නොවී ඒ ඒ කට යුතු ගණු දෙනු වෙළහෙළඳාම් ආදියෙහි යෙදී තම නැණින්ම කලකී සියල්ලෙන්ම මහත් ජය අත්පත්කර ගත්තේය. අහඞ්කාරකමෙන් සිදුවෙන මහත් අනාඑ ගැණ විශෙෂ ඥනයකින් නිතර ක්‍රියාකර නිරහඞ්කාරව මුළු ලොකයාගේම හිත් දිනාගත්තේය. මෙසේ මේ මහතාගේ සියලුම ක්‍රියා සහ කටයුතු ජයෙන් ජයට පැමිණුනේ ධනයේ බලයෙන් නොව සුපරිශුද්ධ **නැනයේ** බලයෙන් බව මොනවට වැටහේ.

———:o:———

ශරීර ශක්තිය.

ද සොයිසා මහතා පෙණීමෙන්, කෘශ කෙණෙක්ව සිටි නමුත් ශරීර ශක්තිය හොඳකාර ඇතුව සිටියේය. දිනක් අසුන් දෙදෙනා යොදන ලොකු රථයක රෝදයක් ගලවා නැවත යෙදීම සඳහා අඩයක් තබා ගණුවස්

රථයේ යාන්ත්‍රයක් උස්සා ගැනීමට අස්ගොව් දෙදෙනෙක් එකතුව කරණ වෑයම මේ මහතා දැන, සිනහවෙවී රට කිව්වුව ඔවුන්ට ඕනෑ කළ රථයේ අංශය ඔබතුමා උස්සා දීමෙන් සුවසේ අඩය තබා ගැනීමට සැලසිය. මහත්මයාට හොඳ ශක්තියක් ඇති බව එදා පළමුවෙනි වරට දුසි දස්සු තේරුම් ගත්හ.

නැවතත් දිනක් මහත්මයා තවත් ශිත මිතුයෙක් සමඟ ගවහල සමීපයේ කථාකරමින් සිටින අතර තරුණ හොන් නාමිබෙක් කැසිමට හිස පාමින් සිටියේය. මේ වස්සාට මහත්මයා ඉතා ආදරයෙන් සිටි නිසා කථාකර මින්ම හිස අතගා අහකට ඵලවා දැමුවේය. උෆ නැවතත් මහත්මයා ලඟට පැමිණ එසේම හිස ඔසවා සිටි බැවින් නැවතත් මහත්මයා හිස අතගා ඵලවා දැමුවේය. වස්සා නැවත නැවතත් අවුත් හිරිහැර කරණ නිසා අත දිගහැර වැරෙන් පහරක් බෙල්ලට ගැසිය. පහරේ වෙරකම කරණකොටගෙන් තරුණ වස්සා බිම වැටුනේය. මේ ගැන් ඉතා කනගාටුවට පත් මහතා චහාම කිව්වුවු කල, වස්සා නැගිට බයෙන් පැන දිව්වේය. කරුණාවන්ත මහත්මයා වැඩකාරයෙක් යවා උෆ අල්වා ගෙණැවිත් අතගා උගේ හිසට මහත්මයාගේ හිස තබා ආදර දක්වා බැඳ දමන්ට නියම කෙළේය. මෙයින්ද මහත්මයාට හොඳ ශක්තියක් තිබෙන බව ඔප්පුවිය.

දිනක් ද සොයිසා මහතා යම් කිසි තවසුකතක් සඳහා කොටුවේ රාජ මැදිරියට (Queen's House) පැමිණි කල, **සර් විලියම් හැන්රි ග්‍රෙගරි** උතුමානන් වහන්සේ ආචාර සමාචාර පවත්වා එතුමාට ලැබී තිබුන කැටයම් වැඩ කළ කළුවර පෙට්ටියක් සහ එහි තුළ තබා තිබුන රිදී රියට් අලි දෙන්නෙකුත් ද සොයිසා මහතාට පෙන්නා ඔය පෙට්ටිය බොහොම බරයයි පැවසිය. ද සොයිසා මහතා සිනහවී දැතින් පෙට්ටිය අයියක් පමණ ඉස්සුවේය.

උතුමාගෙන්වහන්සේ සිතාගෙන් "ද සොඩිසා මහතානනි, තමුන්නාන්සේගේ පෙණීමට වඩා ශක්තිය තිබෙන බව මා දැනගත් පැලමුවෙනි වතාව මෙය" යි ප්‍රකාශ කර "මවිසින් උසුලා බලන්ට සැදු තමුත් නොහැකිවිය" යි පැවසිය.

කැවිතත් දිනක් ද සොඩිසා මහතා ශෝතිශ්ශාස්ත්‍රඥ හැන්හැදිගේ දූනියෙල් පුණ්ණදූ (නම්බිඅප්පු) ගුරු මහතාත් සමග කරගටපිටියේ විහාරස්ථාන දර්ශනයට පැමිණ විහාරය සහ චෛත්‍ය ස්ථාන බලාගෙණ පහලබැස, ලිඳ බැලීම සඳහා හොස් එතනින් නොඩනැඹීමට තිබුන අඩි දෙතහමාරක් පමණ ඇති උස් භූමියට එක පයක් තබා ගොඩවුනේය. ඒ අසල සිටි බොහෝදෙන ද සොඩිසා මහතා පෙණීමට වඩා ශක්තිවන්තයෙක් බව හොඳකාර නේරුම් ගත්තෝය.

ප්‍රසිද්ධ 'චෙන්දේසිකාරයෙක්වූ' ජේ. අව්වි මහත්මයාගේ "චෙන්දේසිපොලට" දිනක් ද සොඩිසා මහතා පැමිණ එහි තිබුන අයෝමය දිය සුදු යතුරක් දැක එය ගන්ට සිතා උස්සා බැලුවෙය. ඉතා බරවූ මේ භාජනය එකතින් ඉස්සු බැව් දුටු එහි සිටි ඉංග්‍රීසිකාර කිපදෙනෙක් ද සොඩිසා මහතාට කථා කර "මහත්මයාව ඔය තරම් ශක්තියක් තිබෙන බව දැන සතුවුවුනෙමු" යි කිවාහුය. මේ භාජනයේ ඇතුලේ බස්සවා තිබුන පිහන් බදුන බිඳී තිබුන බැවින් එය නොගෙණ හැරි ආවේය.

මේ හැර නොයෙක් වාරවල අසුන් පිට යාමෙකිදිද වෙනත් ක්‍රියාවලදිද කවසුතු පැමිණි නැන ඩඹකනියෙන් ක්‍රියා කර ටේ මහතා ජය ගත් නැන් බොහෝය.

———:o:———

නිගමන නාවය.

ද සොඩිසා මහතා නිර්භීත තෙණෙකි. හුදු කලාව ගමන් යාමට හෝ රු කාලයේ ගමන් යාමට හෝ බිය නැත්තෙකි. නොයෙක් හදිසි කරුණු පැමිණි කල, මේ රිය යතු නිත්මත්වත්, එල්ලාක් රැගෙණ එනතුරු

නැවත්මක් ගැණවත් කල්පනා නොකොට නොසිට ඒ කරුණ ගැණ පරීක්ෂා කිරීමට ඉක්මන්වන ගයනැයි කමක් ප්‍රකෘතියෙන්ම පිහිටා තිබුනේය. අශ්වයන් සහ ගවයන් සම්බන්ධව ක්‍රියා කිරීමවලදී හැමි සමූහයා මඛ්‍යයට පැමිණෙන නිර්භීත කෙශර සිංහරාජයෙක්නුමෙන් එකී සතුන් මඛ්‍යයට පැමිණ නිර්භීත ලෙස ක්‍රියා කර ජය ගන්නෙකි. අයිකරු ක්‍රෑරතර ගවයන් සහ අශ්වයන් සියාගින් අල්වා හික්මවීමට ශෛ හයක් නොගිවුනේය. අසුන් විට හිය නොයෙක් වාරවලදී අයිකරුවුදු, යම් යම් දේ දැක හන වුදු, අසුන්, ඔවුන්ගේ පිට උඩ නිදගෙණම් නිර්භීත ලෙස හික්මවා ගත්තා මිස කිසි දිනක එසේ පෙරළී කරණ අසෙකු පිටින් සුවල්ප වේලාවකටවත් බැස නැවත පිට නැගුණ එකම ප්‍රජානාවක් ඇති නුනේය.

දිනක් මේ මහතා අසෙකු පිට නැගී උඩරට තමන්ට හිමි වත්තකට ගොස් එම වත්තේ දිය අගලකින් එගොඩ වීමට අසු මෙහෙයු කල, ඔහු එගොඩ නොවී පෙරළී කිරීමට පටන්ගත්තේය. අසුගේ පෙරළීය බියකරු නිසා වත්තේ වැඩකරුවෝ "මහත්මයා බහින්වය" යි කියමින් කෑගසන්ට පටන්ගත්හ. "දිවි යතත් බූ පිටින් නොබ සිම් නුඹලා එහාට පලයල්ලාය" යි කියා අසුට තල තලා අගලටම ගෙණයන්ට වෑයම් කෙළේය. මේ මහතා අසු යිකරු කොට අගලෙන් එගොඩ ගෙණ යාමට උත්සාහ කිරීමේදී ඔහු වඩ වඩා පෙරළී කිරීමවත් පසින් ගැසීම වත් හෝසාරවය කිරීමවත් පටන්ගෙණ මේ මහතා රැගෙණ වත්තේ නොයෙක් දිශාවල දුවන්ට පටන්ගත්තේය. මේ මහතාගේ ජීවිත භානිය දැන් දැන් සිදුවේය කියා ඇතැම් වැඩකරුවෝ දුවමින් අසු පිටින් පැන්න ලෙස මහත්මයාට යාඥ කර සිටියෝය. මේ කිසි වචනයකට කන් නොදී දෙපැයක් පමණ මහත්ලෙස පෙරළී කළ මේ අසු සංකිරි මෙන්ම එම අගල ලඟටම ගෙණ ගොස් අනතිම වරටත් පැයබාගයක් පමණවෙලා එහි පෙරළිකළපසු එම අගලටම බැස්සෙව්වේය. අගලට බැස්ස තමන්ත් එගොඩ නොවී

අහලේ පෙරළි කිරීමට යටත්ගත්තේය. නමුත් තත්පර කුණ හතරකට වඩා වේ පෙරළිය කිරීමට වේ මහතා ඉඩ නොතිබුා පළමු ලෙසම තරයේ සංකල්ප තැන අසු එගොඩ විය. මහත්මියාගේ වේ දැක්ම භාවය ගැඹුරින් නිරීක්ෂිත කම් ගැඹුරින් තමන්ගේ චතුවල පමණක් නොව, අනෘ චතුවලද ප්‍රසිද්ධව තිබේය. පුණ්‍යවතියන්ගේ අදහස් ඉටුවීම ආශ්චර්යයක් නොවෙතත් වේ මහතාගේ නිරීක්ෂිත භාවය ගැඹු සැබවින්ම ප්‍රශංසා කටයුතු බව මනාසේ හැඟෙන්නේමය.

"ඇල්ප්‍රඩ් හවුස්" නම් වලව්වෙදී දිනයක් වේ මහතාගේ පුත්‍රයෙක්වූ **ඩී. එච්. ඒ. ද සොසියා මහත්මයා** පූර්ව කාලයේ අසෙකු විට නැඟ වලව්වේ වත්තේ දුවවමින් සිටියේය. වේ වේලාවේ මහත්මයා දැකීමට වැදගත් කිප දෙනෙක්ද වලව්වට පැමිණ සිටියහ. වත්තේ එහා මෙහා දුවමින් සිටි අසු පුඤ්චි මහතා රැගෙණ අස්හලට වදින්ට වෙර කළ නැන පුඤ්චි මහත්මයා ඊට ඉඩ නොදීමෙන් අසුගේ පෙරළිය වැඩිවිය. මෙය එහි පැමිණ සිටි වැදගත් මහත්වරු දැක "ලමයාට අනතුරුවෙය, බස්සවාගන්ඩය" යනු මහත්මයාට කිකල, "අසුපිට නැංගානම් අසු හික්මවා ගන්ට ඔනු දැනගන්ට ඕනෑය, එසේ නැතුව අසුගේ පෙරළියට හසුව අසුපිටින් බැස්සොත් මම ඔනුට අවිවු කරමි. අසු හික්මවාගැණීමට ඔනුට නොහැකිව අසු අස්හලට යියොත් ඔනුගේ බෙල්ල කැඩි යනවා ඇත. එසේ අසු අස්හලට දිවීමෙන් ඔනුට අනතුරුවෙය යන හසින් පසුබටවෙනම්, ඊට වඩා ඔනුගේ නැතිවීම ගැණ මම කැමතිය" යි කියා වලව්වේ දෙරටුවට පැමිණ අසු හික්මවාගැණීමට පුත්‍රයාට වචනයෙන් ධෛර්යදුන්නේය. විය මහතානන්ගේ සුභාව දන් පුඤ්චි මහත්මයා අසුගේ කැමැත්තට ඉඩනොදී අසු හොඳකාර හික්මවාගෙණ එදි එවේලාවේ සිටි සියලු දෙනාගෙන් ප්‍රසංශා ලැබිය.

සතර කරුණාව.

ද සොඹිසා මහත්මයා සතු කරුණාව ඇති කෙනෙක් බව ඉතා ප්‍රකටය. මනුෂ්‍යයන් කෙරෙහි පමණක් නොව ගවමහිසාදීන් කෙරෙහිද මහත් කරුණාවක් ඇතුව සිටි උතුමෙකි. සුළු ගවමහිසාදීන් සහ අශ්වයන් දැකිනයවූ කල "ද සොඹිසා මහත්මයාගේ අශ්වයන් වැනිය, ගවමහිසාදීන් වැනිය" යි යන රටවාසීන්ගේ ප්‍රකට ස්වේච්ඡාව මේ මහතා සතු කරුණාව ඇති උතුමෙක් බව මනාව ඔප්පුවේ. ගවයෙක් හෝ අශ්වයෙක් හෝ අන්‍ය සතෙක් හෝ ලෙඩවූ කල තමාගේ දරුවෙක් ලෙඩවුනාක් මෙන් සිතා බෙහෙත් කරවන බව දනිමු. මේ මහතාට හිමි අශ්වගණයා අතුරෙන් හෝ ගවගණයා අතුරෙන් හෝ රෝගාතුරව මියගිය සතෙකු ගැන ඇසීමට ලැබෙන්නේ කලාතුරකිනි. ගව වසංගතකාල පැමිණි කල සඬකීය සතුන් ආරක්‍ෂාකරගැනීම් සඳහා ඉතා උනන්දු ලෙස කටයුතු ඉඟකරවයි. අසුන් වසන අස්හල්ද, ගවසින් වසන ගවහල්ද දුටුකල එහි ඇති ඔවුන්ගේ ගැණ සහ අලඬකාරය ගැණද මහජනයා මවිත වෙනවා ඇත. නිරතුකේ සතෙකුට තැළීමටවත්, නුසුදුසුලෙස ප්‍රමාණයට වඩා සතුන්ගෙන් වැඩගැනීම්වලවත් බැරිලෙස ඒ ඒ දෑසාදීන්ට පමණක් නොව තම පුත්‍ර කලත්‍රාදීන්ටද තද ලෙස නියමකර තිබුණේය. නොයෙක් ප්‍රසාවලදී ගෝ මස් ආදිය උවමනාවූ කල මේ මහතා ආඥාකෙළේ එකිණේමට තිබෙන මස් රැගෙණැවිත් වෑහෙන හැඳිමටය. හැඳ ශිතල පින්වත් තෙම තමන්ට තමන් ඇති ආදරයලෙස සතුන් කෙරෙහිද කරුණාව පැතිරිය. ඉතා සුරතල් ලදරු වසුපැටවුන් කෙරෙහි විශෙෂ ආදරයක් ඇත්තේ ඔවුන්ට රිදේය සිතා ආදරයට අනහෑමිටද ලොහවිය. සතුන් කෙරෙහි මෙබඳු කරුණාවක් ඇති උතුම මේ මහතා

මනුෂ්‍යයන් කෙරෙහි ඇති ආදරය ගැන් කියනුම කිම ! සහ කරුණාවන්තා මහත්මයා නොයෙක්වට නොයෙක් පලාත්වල වැස් මිනුෂ්‍යයන්ට පැමුණුන අමාරු අපහසු වලදී ඔවුන් ට අමාරු අපහසුවලින් ගලවාගෙන් කරුණා කළ හැන් බොහෝය.

—:o:—

මිනිමරුවන් අල්ලා දීම ක්.

වසි එක්දහස් අටසිය සැට සතරේ ජනවාර මස දෙ වෙනි (1864. ජ. ම. 2) දින මෝරවුවේ සිදුවූ භයානක මරණ දෙක ගැන් මේ මහතා ඉදිරියට පැමිණි මිනි මරුවන් අල්ලා දීමට **ඔන, කෂ,** දෙක වෙහෙසා ක්‍රියා කෙළේය. වයස හවුරුදු සැටක් (60) පමණවූ වැඩි වයස්ගත අසරණ ස්ත්‍රී සහ වයස හවුරුදු දහයක් (10) පමණවූ ගැහැණු දරුවාත් මරුදමනලද්දේ කවදද යනු සොයාගැනීමට නිවුන අපහසුව මේ මහත්මයාගේ සතු කරුණාව නැමති කැඩපතින් දැක එකී දෙදෙන මරුදමූ අප්පුතාණි සහ බාලයාත් අල්ලා ආණ්ඩුවට පාවාදී නඩුමගට ගන්ට සැලසුයේය. මෙම නඩුව ජූලි මස එකොළොස් (11) වෙනි දින උතුම්වූ ශ්‍රේෂ්ඨාධිකරණ ශාලාවෙහිදී විනිශ්චය කොට මරණ දෙක කල වේලාවට වගේම, මේදින රෑ දෙළහට (12) මිනිමරුවන් එල්ලා මැරීමට ගරු. **සර්. ඇඩ්වර්ඩ් බුයිස්** විනිශ්චයකාරතුමා විසින් තීන්දුව දෙන ලද්දේය. මෙසිදී මේ පින්වතා ඉදිරියට අවුත් ක්‍රියානොකර සිටියා නම් මේ භයානක ක්‍රෑර මිනිමරුවන්නෙන් තවදුරටත් මහත් භය ජනක විපත් මොරවු ගමට සිදුවෙනවා නිසැකය. සතු කරුණාව ඇති පින්වත් මහතාගේ මෙම යස උත්සාහය කරණකොටගෙන් මොරවුවේ පමණක් නොව නොයෙක් පලාත්වල වසන මැරයින් මිවිවුවිමෙන් එකී පලාත්වල ජනයාට සහජත සිදුවිය. මෙසින්ද මේම පින්වතා සතුන් කෙරෙහි පමණක් නොව මනුෂ්‍යයන් කෙරෙහිද මහත් කරුණාවකින් විසූ බව ඔප්පුවෙමය.

අනාතුරකින් බේරීම.

ගවයන් ගැණ මහත් කරුණාවක් ඇති ද සොසිසා මහතා දිනක් ගව "වෙන්දේසිය" කට ගොස් සිටින කල, හදිසියෙන්ම අසල තිබුන පොල් ගහකින් ගෙඩියක් ගැලුවේ පහිනව ඇහ නැවරීගෙණ බිම වැටුනේය. මේ තැවරීම යම්තමකටවත් රිදීමකට හේතුනොවන තැවරීමකි. මේ ඇර මේ මහතා ජීවත්ව සිටිනතුරුම කිසිම අණතුරක් සිදු නුනේය. මේ මහතාට කිසිකලක සතුරෙක් ඇතුව නො සිටියේය. මේ මහතාගේ ගුණ වැඩ ගැණද ඉසුරුමත්කම ගැණද, කීර්ති ප්‍රශංසා ගැණද, නාඟගිවනතකම ගැණද, ඊර්ෂ්‍යාකරන්නන් ඇතුවගිය නමුත් ඔවුන් සතුරන්කොට මේ මහතා කල්පනා නොකෙළේය. ඒ හෙයින් මේ මහතාට සතුරෝ නොසිටියෝය යනු කියහැක.

———:o:———

අසනීප වීමෙන්.

වෂ එක්වා දහස් අටසිය සැටසයේ පෙබ්‍රවාරි මස (1866. ෙප. ම.) දිනකදී, ද සොසිසා මහත්මයා මොරටුවේ වලව්වේ සිට බහතලේ වලව්වට අසව රථයෙන් එන අතර, මගදී කෙණෙක් රුකසිට රථය නවත්වන්ට කිවේලු. ගුණවතා රථය නැවතූ කල රථයට මේ තැනැත්තා කිව්වුව රුපියල් දෙසිය පණහක් (රු. 250 ක්) නසට ඉල්ලුවේලු. මොනු මත්පැන් බී මත්ගහියෙන් සිපි බැව්න් බිම අත්ඇර ඇවිත් කථා කරපන්නැයි කියා මෙතුමා පිටත්ව ආවේලු. මේ ගැණ කෝපවූ මෙම මිනිහා "පාන් දුරේ උසාවියේ ද සොසිසා මහතාට විරුඬව කෙණෙක් නඩුවක් ගෙණ රුපියල් 50 ක් දඩගසා බරපතල වැඩ ඇතුව නෙමසක් බන්ධනාගාරයේ සිටීමට නියමකෙළේය" යි පතල කෙළේලු. නවද මේ මහතාගේ අස්ගොව්වෙක්ව සිටි ඉංග්‍රීසිකාරයෙකුට යම් කිසි වැරැද්දක් නිසා මේ මහතා

කරවවූකලතැන ඒ ගැණ අවනාපවූ ඔහු මෙසේ බොරු ආරංචියක් පතල කෙලේය, යනු සමහරු කියත්. එසේද උවත් මෙම බොරු ආරංචිය එවකට ප්‍රසිඬවූන ආරංචි පත්‍රවලද, ප්‍රසිඬවූකල පින්වතා සිනාහාවී, “මට සතුරෙක් නැති නිසා ඔය මිතුරෙක්ම කල වැඩක්ය” යි කියා නිශ්ශබ්ද වූයේය. පසුව මෙය සම්පූර්ණ බොරු ආරංචියක් බව එම ආරංචි පත්‍රවලම ප්‍රසිඬවිය. * ඇතම් ධනවත්හුනම් මෙ ගැණ කිපී උසාවියට පැමිණ ධනය සහ කාලයත් වියදම්කොට සමහරවිට එකී බොරු ප්‍රසිඬිය කල තැනැත්තාට දඬුවම් කරවනවා ඇත. කිසිවෙක් සතුරු කරගැණීමට නොමනාප සුනවනාත මහත්මයා මෙ ගැණ ශතයක් වියදම් නොකොට සහ අඩියක් නොසොල්වා සිටීම ගැණ එවකට ලක්දිව මුළුද සිටි සුනවතාසින්ගෙන් බොහෝ ප්‍රශංසා ලැබීය. මෙය කියවන නුවණැත්තනු මෙ මහතාට අදත් නොපසසා සිටිත්ද?

———:o:———

එන්ජෙ වෙදරාලගේ එඩි මඞ්ගලය.

චාලිස් හැන්රි ද සොයිසා මහත්මයාගේ මෑනියන්ගේ අසනීපයක් සඳහා ජෝර්ණීස් ද සොයිසා මහතා තවත් දක්ෂ වෛද්‍යයෙකුගේ කල්පනාවත් ගෙණ වෙදකම් කිරීමට අදහස්කොට බබාසිංඤෝ වෙදරාල නම් කෙණෙකුත්

---

* මිනැණ් 1866 වේ පෙබරවාරි මස 23 දින ප්‍රසිඬවූන ලක්මිණිකිරණේ මෙසේ කියාතිබේ;—“මුන්නැහේට විරුඬව පාණදුරේ පොලිස් නඩු ශාලාවේ නඩුවක් පමුණුන ලදුව එහි මහේස්ත්‍රාත්තැන විසින් මුන්නැහේට පවුම් පහක් දඩගසා තුන් මාසයකට බරපතල වැඩ ඇතුව හිරඅඩස්සියේ සිටින්ට නියමකරන්ට යෙදුනායයි දැනට ඉන්නතර දවසකට පූර්ව කොළඹ පලාතේ නොයෙක්දෙන සාපින් කවට කියනවා ඇසුනු. පසුගිය බදාදා ලක්මිණී පහනේත් එලෙසම ප්‍රසිඬව තිබේයි. නමුත් එය හාවින් කටට ප්‍රසිඬවූ අසත්‍ය කියමනක් බවත් උන්නැහේට විරුඬව එබඳු නඩුවක් යම්කිසිවෙක් විසින් පමුණුවා නොසෙදුන බවත් සොයිසා උන්නැහේලාට කිටවූවරකම් ඇති කොළඹ සිටින සමහර වැදගත් ඇත්තන්ගෙන් දැනගතිමු.” ස.ද.ස.

සමඟ මොරටුවේ දූනට වේල්ස් ශාස්ත්‍රශාලාව තිබෙන ඉඩමේ පදිඤ්චව සිටි එන්ගේ වෙදරාළ නම් වේදැයෙක් සොයා ගියේය. මේ වේලාවේ එන්ගේ වෙදරාළ ගෙදර නොසිටි බැවින් මේ දෙන්නා ඔහු ගෙදර එනතුරු එහි නැවතුනෝය. පික වේලාවකට පසු එන්ගේ වෙදරාළ ගෙදර ඇවිත්, එහි සිටි අමුත්තන් දූක හඳුනා "වහා සිංහෙකු උඹ මහනුවර සිට ආවේ කවදද?" යි ඇසිය. "ඉක්මනට එන්ට ඕනෑවුන නිසා රේගේ කොලඹට එන "මෙල් කෝච්චි" යෙන් ආවෙමැ" යි ජෝඞ්ස් ද සොයිසා මහතා උත්තරවශයෙන් කීයේය. එන්ගේ වෙදරාළ එවකට ඉඩම් ඡම්කාර කාරණාකාරයෙක්ව සිටි නිසා "මෙල් කෝච්චි" යෙන් ආයේය" යි කී වචනයට රිෂ්‍යානොට "කෝච්චියෙන්" "කෝච්චියෙන්" කියමින් මහත් උඩඟුවක් දූක්කුවෙය. ජෝඞ්ස් ද සොයිසා මහතා මොනුගේ විප්‍රකාර රිෂ්‍යාව දූක "සායම් යන කිසිවක් මාලඟ නැහැ" යි කියමින් එක්ව ගිය වෙදරාළත් කැටුව එයින් පිටත්ව ගිය නිවසට පැමිණ, සිදුවූ පුවත් පූඤ්ඣ චාල්ස් මහතාට කියා උඩඟුවේ ඇති වරද පෙන්නා තමාගේ කල්පනාවෙන්ම ඇයිය හාස්‍යාවට වෙදකම් නොට සුවපත්කර හත්තේය. මීට පසු කාලයේදී උඩඟුව ක්‍රියාකල එන්ගේ වෙදරාළ දුක්පත්ව ඔහුට කිම්ව තිබුන ඉඩම් චාල්ස් හැන්රි ද සොයිසා මහතාට විකුණන්ට සිදුවිය. චාල්ස් හැන්රි ද සොයිසා මහතා ඔහුගේ එකී ඉඩම් රැගෙන් ඔහු විසින් දූවූ පදනම් උගුළවා වේල්ස් ශාස්ත්‍රශාලා ගොඩනැංගෙව්වේය. පියාට පෙන්නූ උඩඟුවේ විපාක පුත්‍රයාගෙන් ලැබූ අරුමය බැලුව මැනව.!

චාල්ස් හැන්රි ද සොයිසා මහතා මේ කථා ප්‍රවෘත්තිය ඥාත මිත්‍රාදීන්ට කියමින් උඩඟු නොවෙන්ට අනුශාසනා කෙළේය. ජෝඞ්ස් ද සොයිසා මහතා මොනු ගැන කී කියමන දිවැසින් දූක ජීවාන්මෙන් ඔහුගේ සායම් ගිය බව මෙම පුවතින් ඔප්පුවුන බැවින් උඩඟුව නැමැති සතියාගෙන් බේරී ක්‍රියාකිරීමට නුවණැත්තනු කල්පනා කරත්වා!

පොත්පත් කියවීම.

ද සොසිසා මහතා සංස්කෘත භාෂාවවූ සිංහල භාෂාව හොඳාකාර දන සිටියේය. සිංහල කියවීමටද, ලිවීමට සහ හැඩ වාසගමක් වූවත් කියවා තේරුම්ගැන්මට දන සිටියේය. මෙසේම ඉංග්‍රීසි භාෂාවද ලියන්ට කියන්ට සහ සැමකි වාසගමක් උවත් කියවා තේරුමගැන්මට දන සිටියේය. ග්‍රන්ථ ශාස්ත්‍රයද ප්‍රයෝජනවත්ලෙස දන එයින් හොඳාකාර ප්‍රයොජන ගත්තේය. කිසි පැකිලීමක් නොමැති ලෙස ඉංග්‍රීසි භාෂාව කථාකිරීමටද පුරුදුව සිටියේය. ඉංග්‍රීසීන් සමග ආශ්‍රයෙන් ඒ සිරිත් විරිත්ද මනාලෙස දන සිටියේය. උභය භාෂාවන්ගෙන් පොත්පත් කියවී මෙන්ම තමන්ට ඇතුවකිය නුවණ හැම අතින්ම දියුණු භාවයට පමුණුවා ගත්තේය. මේ මහතා කාමිත වග වාසගම ඇති පොතක් පතක්වත් සඞ්ග්‍රහ සම්බන්ධ පොත් පත්වත් සම්ප්‍රලාප පිශුනාවාචාදියෙන් ගහණ පොත් පත්වත් කිසිකලක නොකියෙව්වේය. වැදගත් ගුණ දනමිත්‍රකම සඳහන් ඉංග්‍රීසි සිංහල කාව්‍ය පොත්ද, එසේම වාසගම පොත්ද, ප්‍රවත් පත්ද නිතර කියවීමෙන් මහත් ප්‍රයෝජන ලැබුවේය. මේ කරණකොටගෙණ ශාස්ත්‍ර දැනීමේ ඇති රසය දිවමැද තැබූ මඩු බිංදුවසේ දන සිටියේය. නොයෙක් වැදගත් කථානාත්‍ර පොත්ද සම්භාවනාකූල පොත්ද නිතර කියවීමෙන් බොහෝ කාරණා ඉගෙණ දෙලොවටම ප්‍රයෝජනවත් වැඩ කිරීමේ අගය හවදුරටත් තේරුමගෙණ සිටියේය. එපමණක් නොව වැදගත් පොත්පත් රවේ සුලභවීම ගැණ ආශාවෙන්ද සිටියේය. ඉකා වචිනා පොත්පත් බොහොමයක් සපයා තැන්පත් කර තැබුවේය. තමන් ආශා.ඇති එසේම ආදරය ඇති නොයෙක් දේවල් මෙන්ම පොත්පත් කෙරෙහිද මේ මහතාගේ ආශාව සහ ආදරය ඇතුවකියේය. පොතකින් හෝ පත්‍රයකින් යම් ප්‍රයෝජනයක් ලැබුණාල ඒ පොත

නොහොත් පක්ෂ ඉතා ගරුලෙස සලකා ඊට නිතරම ඔතෙන් ගෞරව කිරීම පුරුද්දක්ව පැවතිනි. මෙසේ මේ මිහිතා අප්‍රාණික වස්තුවන පොත පත ගැණ සප්‍රාණික වස්තුමෙන් සලකා ගෞරව සම්භාවනා කළ බව මොනවට වැටහේ.

———:o:———

ලිපි ශාලාව.

———

ප්‍රෝබේස් ද සොයිසා මහතා සහ සුසෙව් ද සොයිසා මහතාත් එකතුව වෙණ්දෑම සම්බන්ධ කටයුතු කිරීම සඳහා කොළඹ පිටකොටුවේ හර්බිට්ගේ (Main Street) එවකට අඹක දහය (10) දුරු දූනට අඹක දහතුන (13) දරණ ගොඩනැගිල්ල ගෙන්, වසී එක්දහස් අට සිය තිස්නව (1839) සේදී ලිපි ශාලාව විවෘතකොට වැඩ පටන්ගන්නාලදී. කෝපි, කුරුඳු, කොප්පරා, පොල් තෙල්, ආදී මෙරට ද්‍රව්‍ය විකරට පැවතීමටද, තමන්ට කිම් විශාල පොල්වතු කුරුඳුවතු, කෝපිවතුවලැ වැවිලි සම්බන්ධ කටයුතු දිසිවශයෙන් කිරීමටද පටන්ගන්නාලදී. මෙම ලිපි ශාලාව විවෘත කිරීම සම්බන්ධව ලොක යාට සිදුවූ යහපත ප්‍රමාණාතික්‍රාන්තය. පසු කාලයේ නුව ණැති චාල්ස් හැන්ර් ද සොයිසා මහතා මෙම ලිපි සලට පත්ව අමුතු දිසුඹුහාවයකට ගෙණ ඉංග්‍රීසි ක්‍රම යට ගණන් පොත්පත් තැබීමේ පිළිවෙලද පැවැත්වීය. අය වැය ලෙඛනාදියද, අයපත්, සිකිවිටි පත්, ආදියද ඉංග්‍රීසි ක්‍රමයට ගෙණ වෙළඳුම සම්බන්ධ පවිපාටිය නිස් ක්‍රමයට ගෙණවේය. මෙම ලිපි සල කරණකොට ගෙණ බොහෝ සිංහල තරුණයෝ වෙළඳුම සම්බන්ධ තොරතුරුද ගණන්තැබීමේ පිළිවෙලද පුරුදු පුහුණු කරගත්තෝය. පරදෙශික ජනයා පිවිසර බදව හොස් දුක්පත් අසවලුන් විසින් දුකසේ වවාහදුගෙන් ජීවිකාව සඳහා සපයන කුරුඳු, කෝපි, කර්දමුංගු ආදී ද්‍රව්‍ය වලට යම්තම් මුදලක්දී රවටා හොළඹට ගෙන්වීත්

වැඩි මුදලට විකුණන්නන් නපුර, මෙම ලිපි සල දියුණු කිරීමෙන් බොහෝදුරට මහජාරි හොස් ඔවුනොවුන්ට කිසි හොයෙක් දුවයන් කොළඹ ද සොයිසා මහතුන්ගේ මෙම ලිපි සලට ගෙණැවින්දි රටේ පවතින සාධාරණ ගණනට එවලේම කිසි කරදරයක් නොමැතිව මුදල් රැගෙන් යාමට නිදහස ලැබීමෙන් මහත් යහපතක් සිදුවුනේය. මෙපමණකුදු නොව දුක්පතුන්ගේ නොයෙක් උවමනා සඳහා අත්පිට මුදල් ලැබීමවද, සමහරවිට සුළු පොළියක් ඇතුව එක්කෝ පොළි නැතිව තම තමන්ට කිසි ඉඩම් උකසට තබා මුදල් ගැනීමවද මෙම ලිපි සල දුක්පතුන්ට විශෙෂ වශයෙන් මහොපකාර විය. සැදෙණිය ජනයාට මෙසේ මෙම ලිපි ශාලාව නිසා යහපත වුනාක්මෙන්ම පරදෙසින, නාවුකොට්ට, හම්බන්කාර, අරාබි, මරාවි, හින්දු, පාර්ශි, දෙමළ ආදී වෙළඳ ජනයාටද බොහෝ ප්‍රයෝජන ලැබීමට බෙහෙවින් උපකාරවිය. වෙළඳුම සම්බන්ධ සියලුම ගනුදෙනු කටයුතු මෙම ලිපි සල මඟින් කිරීම කරණකොටගෙණ ලොකයාට මහත් ප්‍රයෝජන ලැබුනාක්මෙන්ම භුවණැති ද සොයිසා මහත්වරුන්වද මහත් වයතු සඬහරයක් නිපදවීමට මෙය කදිම මාණියක් විය.

වම් එක්දහස් අටසිය හැට අවේ (1868) දී පමණ මෙයි ලිපි සල කොටුව තුලට ගෙණ යන කල්පනාවෙන් කොටුවේ "ක්වීන්" වීදියේ (Queen's Street) දැනට, **ෆින්ලේ මුයර් සහ සමාගම** (Finlay Muir & Co.,) පිහිටුවා තිබෙන ගොඩනැගිල්ල ඇති ඉඩමේ ඒ කාලයේ තිබුන ගෙය **ඩොක්ටර් හොට්ල්** මහතුන්ගෙන් කුලියටගෙණ එම ගෙට ලිපි සල ගෙණයනලදී. එහි අවිරුදු කිපයක් තිබෙනා අතර, දැනට **ද සොයිසා ලිපි සල** (කන්තෝරුව) (De Soysa's Office) තිබෙන රෑඩස් තුණකුත් පර්චස් දහසයක ප්‍රමාණ ඉඩම වම් එක්දහස් අටසිය සැත්තෑ එකේ ඔක්තෝබර් මස විසිතුන්වෙනි (1871. ඔක්. මී. 23.) දින



THE HEAD OFFICE, FORT, COLOMBO.

කොළඹ කොටුවේ ප්‍රධාන ලිපි ශාලාව.

රුපියල් **පණිස්දහස් දහසකට** (50,010) ආණ්ඩුවෙන් මිලයට ගෙන් එහි තිබුන පරණ ගෙයි ලිපි සල විකිණූ විය. **සර් හර්කියුලස් රොබින්සන්** උතුමානන්වහන්සේගේ අණ ප්‍රකාර **එච්. ජේ. අල්විස්** මහලේකතුමා විසින් සත කීකයොට අත්සන් කරණලදු මෙම ඉඩමේ ඔප්සුව එතුමා විසින් චාල්ස් හැන්රි ද සොයිසා මහතාට බාරදෙනලදි.

පිය කලක් එහි ලිපි සලේ වැඩ කරගෙණ අවුත්, දැනට තිබෙන ලක්‍ෂණ ගොඩනැගිල්ල කැනීම සඳහා "චැතැම්" වීදියේ (Chatham Street) අඩක 26 දරණ **ඒ. ඇල්. ඉබ්‍රාහිම් ලෙබ්බේ** මරික්කාර්ට හිමි ගෙට (දැනට **ඕ. බී. බ්‍රෝඩ්** මහත්වරුන්ගේ ලිපි සල තිබෙන නිවසට) ගෙණ යන ලදි. එක්දහස් අටසිය සැත්තෑ සතරේ (1874) දී මෙහි වැඩ පටන්ගෙණ එක්දහස් අටසිය සැත්තෑ සතේ (1877) දී මෙයි ගොඩ නැගිල්ල අවසාන වූකල, ගෙවදීමේ මඩහල්‍යය සඳහා ගරු **කොලේස්ටන් බිෂොප්තුමාට** ආරාධනා කරණලදින්, එම් එක්දහස් අටසිය සැත්තෑ අවේ පෙබරවරි මස පස්වසි වෙනි (1878. පෙ. ම. 25) දින බොහෝ වැදගත් උසස් මහතුන් රාශියක් පැමිණ සිටිවෙදි, ගරු. බිෂොප්තුමා විසින් ගෙවදීමේ මෙහෙය පවත්වා එම මඩහල්‍යය මොනවට ඉටුකරණලදී. පැමිණි මහතුන්ට "ෂැම්පේන්" ආදියෙන් සඩහුහකලා පමණක්නොව බිෂොප්තුමාට සතෙනාෂ ධන වශයෙන් රුපියල් **දෙසිය පණහක්ද** (රු. 250) මෙම ගොඩනැගිල්ලේ සිතියම (Plan) සාදූ එගැණ කටයුතු කල **ජොහැන්නැස් මැන්දිස් මතුකුලසූරිය විජේරත්න ජයවර්ධන** වාසල මුහන්දිරම මහතාට සතෙනාෂ ධන වශයෙන් රුපියල් **දෙදහක්ද** (රු. 2000) අසරණ සරණ සමාගමට (Friend-in-Need Society) රුපියල් **සිය‍යක්ද** (100) වෙ ප්‍රසාවෙදි ද සොසිසා මහතා විසින් පරිත්‍යාග කරණලදි. මේ සියල්ල අවසානවූ අනෙතා, එනම් :—එම් එක්දහස් අටසිය සැත්තෑ අවේ මාර්තු මස පළමුවෙනි කිවි (1878. මා. ම. 1) දින ලිපි සලේ ලිවිකම්, සිහියමෙන් පෙණෙන අහිනව ලක්‍ෂණ ගොඩනැගිල්ලේ පටන්ගන්නාලදින් මෙතෙක් එහිම පවත්නේය.

මේ මහතාගේ පුත්‍ර පුත්‍රිකාවෝ.

1. ෆෑන් පෝර්ට්‍යාගා කැතරින් ද සොසියා මහත්මිය, උපන්නේ, එම් එක්දහස් අටසිය සැටසතරේ පෙබරවාරි මස විසිහවෙනි (1864. පෙ. ම. 26.) දින මොරටුවේ වලව්වේදිය.

2. ජෙරෝම්ස් විලියම් චාලිස් ද සොසියා මහත්මයා, උපන්නේ, එම් එක්දහස් අටසිය සැටපහේ මැයි මස දහ නම් වෙනි (1865. මැ. ම. 19.) දින මොරටුවේ වලව්වේදිය.

3. මාර්ගුවි ෆ්‍රැන්සස් මේරි ද සොසියා මහත්මිය, උපන්නේ, එම් එක්දහස් අටසිය සැටසයේ මැයි මස තිස් එක්වෙනි (1866. මැ. ම. 31.) දින මොරටුවේ වලව්වේදිය.

4. පේන් මෙරියා කැරොලයින් ද සොසියා මහත්මිය, උපන්නේ, එම් එක්දහස් අටසිය සැටසතේ ජූනි මස දහ සය වෙනි (1867. ජූ. ම. 16.) දින බම්බලපිටියේ "බ්‍රෝඩ් හවුස්" නම් නිවසේදිය.

5. ඇල්ෆ්‍රඩ් ජෝශප් රිචර්ඩ් ද සොසියා මහත්මයා, උපන්නේ, එම් එක්දහස් අටසිය සැටනවයේ පෙබරවාරි මස පහළොස් වෙනි (1869. පෙ. ම. 15.) දින බම්බල ළඟයේ "බ්‍රෝඩ් හවුස්" නම් නිවසේදිය.

6. ඇන් ලිඩියා චාලෝව් ද සොසියා මහත්මිය, උපන්නේ, එම් එක්දහස් අටසිය සැත්තෑවේ මාර්තු මස දහඅට වෙනි (1870. මා. ම. 18.) දින බම්බලපිටියේ "බ්‍රෝඩ් හවුස්" නම් නිවසේදිය.

7. ඇඩ්වින් ලයෝනල් ෆෙඩ්රික් ද සොසියා මහත්මයා, උපන්නේ, එම් එක්දහස් අටසිය සැත්තෑඑකේ මැයි මස විසිනවවෙනි (1871. මැ. ම. 29.) දින "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වේදිය.

8. ඇලෙක්සැන්ඩර් ඔවන් ආර්තර් ද සොයිසා මහත්මයා, උපන්නේ, වෂී එක්දහස් අටසිය සැත්තෑදෙකේ සැප්තැම්බර් මස විසිනවවෙනි (1872. සැ. ම. 29.) දින "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වෙදිය.

මේ දරුවා රොගාතුරව සිට වෂී එක්දහස් අටසිය සැත්තෑතුනේ සැප්තැම්බර් මස එකොළොස් වෙනි (1873. සැ. ම. 11.) දින සුවපත්විය.

9. තෝමස් හැන්රි ආර්තර් ද සොයිසා මහත්මා, උපන්නේ, වෂී එක්දහස් අටසිය සැත්තෑ සතරේ මැයි මස දසසත්වෙනි (1874. මැ. ම. 17.) දින මොරවුවේ වලව්වෙදිය.

10. ක්‍රෝෆෝර්ඩ් මැක්ඩොනල්ඩ් මාර්ගරිටා ද සොයිසා මහත්මිය, උපන්නේ, වෂී එක්දහස් අටසිය සැත්තෑපහේ ජූනි මස දහසයවෙනි (1875. ජූ. ම. 16.) දින "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වෙදිය.

11. ජොසලින් එමලි ජූලි ද සොයිසා මහත්මිය, උපන්නේ, වෂී එක්දහස් අටසිය සැත්තෑ අටේ අගොස්තු මස පසළොස් වෙනි (1878. අ. ම. 15.) දින "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වෙදිය.

12. සිලිනා ලුවිසා එලිසබැත් ද සොයිසා මහත්මිය, උපන්නේ, වෂී එක්දහස් අටසිය සැත්තෑ නමයේ සැප්තැම්බර් මස අටවෙනි (1879. සැ. ම. 8.) දින මොරවුවේ වලව්වෙදිය.

13. ජේම්ස් සැමුවෙල් චෝල්ටර් ද සොයිසා මහත්මයා, උපන්නේ, වෂී එක්දහස් අටසිය අසූවේ දෙසැම්බර් මස තුන්වෙනි (1880. දෙ. ම. 3.) දින මොරවුවේ වලව්වෙදිය.

14. ලැම්බර්ට් විල්ෆ්‍රඩ් ඇලෙක්සැන්ඩර් ද සොයිසා මහත්මයා, උපන්නේ, වෂී එක්දහස් අටසිය අසූ සතරේ පෙබරවාරි මස විසිවෙනි (1884. පෙ. ම. 20.) දින "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වෙදිය.

15. ඩිස්හෝල්ඩ අර්නැස්ට් ස්ටීෆන් ද සොසියා මහත්මයා, උපන්නේ, එම එක්දහස් අටසිය අසූ හයේ ජනවාරි මස දසවන්වෙනි (1886. ජ. මා. 17.) දින "ඇල්ෆ්‍රඩ හවුස්" නම් චලවෙව්දිය.

මේ පුත්‍ර දුකිතාන් අතුරෙන් අවවෙනි දරුවා හැර අනිත් මහත්මීන් සහ මහත්වරුන් පොහාක් සප්‍රීතියෙන් ඒවිනා බැව් මෙම ප්‍රසාහකයේ සඳහන්කිරීමට ලැබීම ප්‍රීති ජනක කනිවෘයකි.

———:o:———

රාජ කුමාරෝනස වෂ.

———

ක්‍රිසතු වෂ එක්දහස් අටසිය සැත්තෑවේ මාර්තු මස තිස් වෙනි (1870. මා. ම. 30) දින මෙම ලඩකා ඕපයට වැඩමහළ, නෛකක්‍රීන් විරාජමාන සඛී ප්‍රාපත **ඕන්හෝසියා ඇලෙක්සැන්ඩ්‍රිනා** අප මහාරාදීසයන්ගේ ජිතිය පුත්‍ර ඇඩින් බරෝකි ආදිපාදයානන්වූද, කැන්ටි සහ ඇල්ස්වර්ගි සිවානන්වූද කේ. ජී., කේ. ජී., ජී. සී. ඇම්. ජී., ජී. සී. ඇස්. අසි., පී. සී. යන වණෝපලක්ෂිතවූද **ඇල්ෆ්‍රඩ් අර්නැස්ට් ඇල්බට් රාජකුමාරයානන්** පිළිගෙණ සම්භාවනා කිරීමෙන් මුළු ලඩකාවාසි මහජන සමූහයාගේ රාජපක්ෂිකභාවය සහ කෘතිවනතා කමත් ප්‍රකාශ කරමැයි සිතා මේ ගැණ ද සොසියා මහත්මයා තම සුළු පියමහතුන් සමග සාකච්ඡා කෙළේය. ඒ මහතාද මේ අදහස ගැණ පසසා, මුළු ලඩකාවාසීන් වෙතුවෙන් රාජ කුමාරයානන්ට ගෞරව සම්භාවනා කිරීමට සහ **රාත්‍රී භොජනසකින්** සඩග්‍රහ කිරීමටද නියම කරගන්නාලදී. මෙසේ නියමකරගත් ඉක්බිති එවකට ආණ්ඩුකාරයාවූ **සර් හර්කියුලස් රොබින්සන්** උතුමානන්වහන්සේ මඟින් රාජ කුමාරයානන්ට **ආරාධනා පත්‍රය** යවනු ලැබිය. රාජ කුමාරයානෝ ආණ්ඩුකාරතුමා සමඟ මේ ගැණ සාකච්ඡාකොට ආරාධනාව පිළිගත්හ. රාජ කුමාරයානන් ආරාධනාව **ඉතා සතුටින්** පිළිගත් බව දැනගත් විකාම්, රුවියල් **ලක්‍ෂයක්** (රු. 1,00,000) වෙන්කර මේම රාජ කුමාරෝත්සවයේ **කෘත්‍ය පත්‍රය** පිළියෙල කරවූ ලැබිය.

H. R. H. THE DUKE OF EDINBURGH.—ආඩිත්බරෝහි ආදිපාදයාණෝ.

SINHALESE DAILY NEWS PRESS PETTAH COLOMBO

සියගණන් දක්ෂ ශිල්පීන් රැස්කරවා මුළු නගරයට ඇති එකම විශාල බගතලේ වලව්ව සහ අක්තර **එක සිය විස්සක්** පමණ විශාල එම භූමියද සැරසීමට නියම කරණලදී. ගාලුදොරකඩ පවන් බගතලේ වලව්ව දක්වා මාර්ග දෙපස සැරසීමට ආඥාවෙන් අවසර ලදින්, ද සොඩිසා මහතා දක්ෂ ශිල්පීන් ලවා තන්ති තන්තිද, සඝ්ඩි සඝ්ඩිද, නානාවිධ බහිරාරයන් තනවා විලිකුන්ඨලු, විවිධ ධජ විවණි කුසුම් විචිත්‍ර තෝණ විප්‍රකාර තුරුලිය පත්‍රි කාදියෙන් මොනවට සරසන්ට නියමකිරීමෙන්ද, ගාලු දොරකඩ පටන් සිය වලව්ව දක්වා මග දෙපස ගොප් සහ කෙහෙලි ආදියෙන් සරසන්ට නියමකිරීමෙන්ද, සිංහල ඉංග්‍රීසි බර්ගර් ද්‍රවිඩ ආදි උසස් මහතුන්ට ආරාධනා පත්‍ර යැවීමට නියමකිරීමෙන්ද, රාජකුමාර භෝජනය සඳහා **කනක** භාජන තැනීමට රන්කරුවන් නියමකිරීමෙන්ද, වෙනත් උවමනා සකලම දෙය විපුලාලඞ්කාරයට සම්පාදනයකිරීමට සියගණන් දැසිදසුන් නියුක්තකරවීමෙන්ද, දිවා රෑ දෙක්හි මහත් වෙහෙසක් දරිය.

මේ ක්‍රියාවල නියුක්තවූ කම්කරුවෝද, සැබවින්ම මහත් පරිශ්‍රමයක් දැරීමෙන් බලාපොරොත්තුවට වඩා සතල දෙයම චිත්තාකර්ෂණීය වන ආකාර මනා අලංකාර ලෙස නිම කලෝය. මෙදිනයන්හි ගාලු දොරකඩ පවන් බගතලේ වලව්ව දක්වා මාර්ගයන්හිද, වලව් වත්ත තුළද, වලව්වේද සටසුතු කළ සියගණන් සමූහයාගේ ක්‍රියා ලක්ෂණ පුදුම ලෙසවිය.

සැරසිලි සඳහා දඬු ගෙණෙන්නෝය, ඒවි දඬු බාන්නෝය, බෑ දඬු කපන්නෝය, කැපූ දඬු ගාන්නෝය, ගෑ දඬු ඔපලන්නෝය, වළවල් කණින්නෝය, දඬු සිටුවන්නෝය, දඬු බඳින්නෝය, මග මැසීම් කරන්නෝය, මාවත් තනන්නෝය, විධාන කරන්නෝය, උපක්‍රම යොදන්නෝය, අතු ගෙණ්නෝය, මඩු බඳින්නෝය, අතු සෙවිලි කරන්නෝය, ශාලා තනන්නෝය, සිතියම් කරන්නෝය, කණු වටකරන්නෝය, සුණුකම් කරන්නෝය,

කවිපු සාසම් කරන්නෝය, කවිපු සුදුකරන්නෝය, කවිපු පිළි එල්ලන්නෝය, ලෑලි ඔපලන්නෝය, දිය යතුරු තහන්නෝය, ගෙඩිවපු ගෙණෙන්නෝය, එම වපු එල් ලන්නෝය, මල් ගෙණෙන්නෝය, මල් මාලා ගොතන් නෝය, මල් එල්ලන්නෝය, ගොප් ගෙණෙන්නෝය, ගොප් වැඩ කරන්නෝය, මහන්නෝය, ලියන්නෝය, හසුන් ගෙණ දුවන්නෝය, සැරසිලි කරන්නෝය, පහන් සුදුකරන්නෝය, පහන් එල්වන්නෝය, පහන් වැපි කහන්නෝය, කනදෑ ගෙණෙන්නෝය, පිසන්නෝය, අම දින්නෝය, බඩු සුදුකරන්නෝය, මල්කලස් තබන්නෝය, තොරන් බඳින්නෝය, කොඩි එල්ලන්නෝය, කටයුතු හැණ යන්නෝය, රථ බැඳ දුවන්නෝය, පලස් අතුරන් නෝය, දිය ගෙණෙන්නෝය, මග තෙමන්නෝය, මුර සිපින්නෝය, පුලිනිසින්නෝය මෙසේ නා නාවිධ කම්යන්හි යෙදී සිටියාවූ මහත් සමූහයා **රම රාජ කුමාරයා** පිළි ගැණීමට අයොධ්‍ය පුර වාසි දහස් ගණන් ජනයා සුසු සුදුව නුවර සැරසීමෙහි නිසුකතවූවාක්මෙන් විද්‍යමානවිය.

ක්‍රිසතු වසි එක්දහස් අටසිය සැත්තෑවේ අප්‍රේල් මස විසුදෙවෙනි (1870. අ. ම. 22) සිකුරාදා මෙයී විශාල සැර සුලි සහ කලමනා කටයුතු අවසාන කර **සුසෙව් ද සොසියා** මහතා සහ **චාර්ල්ස් හැන්ඩි ද සොසියා** මහතාත් ප්‍රධාන **ද සොසියා පවිල, රාජ කුමාරයා** ගෞරවාදරයෙන් පිළිගැණීමට සැරසුනාහ.

———:o:———

මෙදින සවස.

———

රාජ තේජස පැහිරෙණ කාලය සමීප වන නිසා යේ හෝ, එල්වන ලද දහස් ගණන් ප්‍රදීප දැල්වූ කල්හි සකිය තේජස මැඩපැවතේය යන බියෙන් යේ හෝ සූය්‍ය දිව්‍යරාජයා සියරැස හකුළුවාගෙණ අවරගිර කරවුන්කලා ලව්කා භූමිය පවතින තාක් කිසිවෙකුට

මතකනැති නොවන්නාවූද, ඒතෙක් ලංකා ඉතිහාසයට අනන්‍යාර්ත නුනාවූද මනෝහර සෘතු ගුණයකින් සුත් චිත්‍රා සන්තර්පණ කරණ මධුර මධ්‍යමාරුතයකින් සමන්විත අලඞ්කාර සන්ධ්‍යාකාලයක් ලක්වැසි ජනතාවගේ දර්ශන පථයට මෙදින සම්ප්‍රාප්තවිය. ගාඨදෙරකඩ පවන් බහලේ ද සොයිසා මන්දිරයේ දෙරටුව දක්වා නිල, පීත, ලොහිත, මාංජෙට්ඨ, අවඳුන යන පඤ්ච වර්ණයන්ගෙන් සුත් ප්‍රදීපයන්ගෙන් සමලඞ්කෘත විප්‍රකාර බහිචාරයන් ගෙන් විරාජමානවිය. එසේම ගාඨ දෙරකඩ පවන් වලව්වේ දෙරටුව දක්වා අඛණ්ඩව සරසනලද ආරුක්කු වල දල්වන ලද දහස්ගණන් නා නා වර්ණ පහන් එලි වලින් මහ දෙපස උදෑපා කරවිය. දෙපස එල්වනලද ඉන්දීවරාදී කුසුම මාලා, ජනතාවගේ නයන නන්දනයට ප්‍රතිඝ්‍යාධාර විය. පෞරාණික සිංහල රජදරුවන්ගේ පාලනයට පැවතුන ලඞ්කාම්පයෙහිදී ඒසා රජදරුවන් පිළිගෙණ සඞ්ගහකිරීමට සමර්ථ මහොත්තමයන්ගෙන් සිරිලක හිස්නුන බැව් හඟවා මුළු ලක්වැසි ජනතාවගේ ප්‍රෞඪ ස්වභාව ආරක්ෂා කරගැනීමට ද සොයිසා මහත් වරු දැන් සූදානමය යනු හඟවන්නාක්මෙන් බහිචාරයන්ගේ යොදූ තුබුන සියඹලණින් කෙහෙලි රාශිය මෙදින සන්ධ්‍යා කාලයෙහි චලිතවීමට පවන්ගත.

රාජ දර්ශනයට යොග්‍ය වස්ත්‍රාභරණාදියෙන් සුසජ්ජිතවූ දහස්ගණින් සත්‍රී පුරුෂ සමූහයා මේ පෙදෙසට සම්ප්‍රාප්ත වීම නේපාලිකා වනයට සඳර්ශ්‍ය වැවුනා මෙන් ප්‍රභාඞ්කර වීමට හෙතුවක්විය. ඕතිදෙරක් ඕතිදෙරක් පාසා බඳින ලද මල්වියන් වැද නිස්මෙන මහ මාරුතය, තරුණ වරුනන් විසින් පළඳින ලද සුවඳකැවු පිළිසෙවිනා සුවඳට එකතුවූකල මේ පෙදෙස චම්පක වනාන්තරාභ්‍යන්තර යෙහි සැදුම්ලද නිල්සුල් විල්පෙදෙසක සිරි ඉසිලී.

ගමනා ගමනය කරණ දහස් ගණින් ජන සමූහයා රාජ කුමාරයා ගැන්ම සඟ සැරසිලි ගැන්ද, ද සොයිසා මහත්වරු ගැන්ද කරණලද ගුණ කථන ශබ්ද කරණ කොවගෙණ, මදු මද, මුදින, ලලිත රසකරාදී සුඛර ශබ්ද

යන්ගෙන්ද මෙ පෙදෙස ගැවසීන. රාජ කුමාරයාට දෙන ලද රාජ්‍ය භොජනය සඳහා සූදානම් කරණ ලද වලව්වේ ප්‍රධාන මන්දිර ශාලාවේ අලඞ්කාර දර්ශනය ප්‍රකාශ කිරීමට අපහසුවූ සුදුම දර්ශනයකි. මෙහෙකරුවන්ගේ ධවල ඇඳුම වලින්ද, ප්‍රියජනක සැරසිලිවලින්ද, රත්රන් භාජන, සල්පිකා භාජන, වජ්‍රභාජනාදී භාජන රාශියෙන්ද, දිව බොදුන් සමාන භොජන රාශියෙන්ද උක්ත ප්‍රකාර බැබලුන මෙ ශාලාවේ ප්‍රිය දර්ශනය වෙසවණ බොදුන් හලට සමානවිය. මෙම මන්දිරයට යාව තිබෙන විශාල භූමිභාග යෙහි සුවදෙශිත සඞ්ග්‍රහයට සූදානම් කරණ ලද මහා ශාලාවේ ප්‍රිය දර්ශනය ඉතා මාහැඟිව තිබුනා පමණක් නොව සඞ්ග්‍රහ විඳීම සඳහා එහි පැමිණීමට මහතුන් කැඳවන ආකාර ස්වභාවක්ද ඉසිලීය.

සන්ධ්‍යා කාලයට උවමනා මන්දමාරුතය, චන්ද්‍ර රශ්මිය, තාරකාලොකය, සුරගඟෙන් ඔබමොබ පියාසරකල ශ්වෙත හංශයන්වැනි ඛණ්ඩ වලාපටලාදියෙන්ද නභොමණ්ඩලය බැබලුවාක්මෙන් පහන් රාශියෙන්ද, සැරසිලි වලින්ද, මෙහෙකරු ආදී ජනයාගෙන්ද, භොජනාදියෙන්ද මෙදින සවස මෙම සඞ්ග්‍රහ මණ්ඩලයද පරිපූර්ණව භ්‍රාජිතවිය.

———:o:———

ආලොක කිරීම.

මනා ගන්ධයන්ගෙන් උක්ත රාජ භොජනය ආඝ්‍රාණය කොට ඊට ලොභයෙන් ඉවලා එන ඝණාන්ධකාරය නැමති යක්ෂණිය, ද සොයිසා මැති වරුන්ගේ උරස්ථලයන්හි වාසය කල ශ්‍රී කාන්තාවන් දැක ඒ කාන්තාවන් සැර පැලඳ තිබුන වජ්‍ර, මුක්ත, ප්‍රවාල, වෛදූර්ය, ගොමෙද ලොහිතාංකාදියෙන් සජ්ජිත ශ්‍රීවාභරණයන් උනා, ගනඳුර නැමති යකිණිය පන්නාහැරීමට දම්වාගැසීමෙදී හරගු සිඳී ඒ මිණි මුතු ඈ දසඅත විසිරී ගියාක්මෙන් නොයෙක් වර්ණ ආලොක ඊ කාලයෙහි දශ දිග පැතිරීන. තන්හි තන්හි

විශාලලෙස ආලෝක කරගිඹුන ගිණි තඳ නැරඹූ බොහෝ දෙනාට වැටහුනේ, රකත මාණික්‍ය තඳුවැටකින් ගහණ කුඩා පෙදෙසක් මෙනි. රාජ කුමාරයා සහ පිරිස ඇතුල් කොටුවේ රජ මැදුරෙන් පිටත්වූකල තරණලද සංඝෝ දුටු රත් වයින් ගිස්වෙලා රත්වන් හැඳ සිටි කුඩ කාරයන් තමතමන්ගේ කුඩවලට ගිණිදී ඔසවාගෙණ රාජකුමාරයා වැඩමකරණ මාර්ගයේ දෙපස සිටි අන්දම ඉතින් පහන් වැටකට සදෘශය. ද සොසිසා මඤ්චරයේ උඩුමහලේ සහ පහල මාලේද, බොදුන් හලේ පිට ශාලා සහ ඇතුල් ශාලා වලද දැල්වූ ආලෝකයන්ගේ බැබලීම ආකාස නදියෙහි දිලෙන නීල පීත ලොහිත අවදාත තාරකා රැසමෙන් විදහමානවිය. විශාලවූ වලව්වේ වත්තේ පැවතුන ආලෝක රාශිය ඉරුසියයක් සඳසියයක් පෑව්වා වැන්න. මෙසී ආලෝක ගැණ තවදුරට වැඟුම නොහැක්ක හෙයින් එකී ඇති සඔපුණ් මඤ්මය වැණ්මට අගනී දෙව විමයෙහි තබාහ.

———:o:———

රාජකුමාරයානන්ගේ සම්ප්‍රාපතිය.

———— — —

අලඞ්කාර ලෙස සරසන ලද්දාවූද පුදුම ආකාර ආලෝක කරණ ලද්දාවූද දිසී මානය පොලිස් හමුදුව විසින් ආරක්‍ෂාකරගෙණ සිවින අතර, කුමාරයා සහ පිරිස රැගෙණ රාජකීය රථය, ද සොසිසා වලව්වේ දෙරවුවට සම්ප්‍රාපතවිය. ආදිපාදයානෝ නාවික සුඛ හමුදුවේ **නිල් "පින්න" පමිය** සහිත සවසට හදින අවිවිනු ඇදුමෙන්ද, ආණ්ඩුකාරතුමා **රතු "පින්න" පමිය** සහිත ඇදුමකින්ද සැරසි සිටියෝය. එකල නෙසැත්තෑවෙනි සුඛහමුදුව විසින් ආචාර පැවැත්වීමෙන්ද, ජාතික වෘත්තාසව නුයුදු නාද පැවැත්වීමෙන්ද ගෞරව කරණලදී. රාජකීය රථය වලව්වට ඇතුල්වීම සඳහා විශෙෂ දෙරවුවක් තිබුනේවි නමුත් සම් කිසි හදිස්සියක් නොවිවට එය හෙතුවක් නොවිය. දෙරවුවෙහිදී අසෙකු වැටී රජ පිරිස

ප්‍රමාදවෙන බව හොසලකන්නොයේ උගේ පවී කපා පහරක් හැයීමෙන් නැගුවුවනලදී. ද සොඩිසා මහතානන් සහ එම මහත්මියත් සුසෙව ද සොඩිසා මහතාත් විසින් කුමාරයා සහ පිරිස පිළිගෙන් ඉහල මාලේ මඩහලෑ ශාලාවට කැඳවාගෙන්යනු ලැබූහ. ඒ කැවුව **රොබින්සන්** ආයාවිදා, තරුණ **රොබින්සන්** මැතිනියද හිසාහ. ගරු. **ස්ෝඩ්ක්ලුමාව** අසනීප බැවින් **ආදිපාදෙතුමිසා** **ෙන්ග්** තුමා සමග පැමිණ්යේය. ගරුතර ආණ්ඩුකාර **රොබින්සන්** තුමා රහස් ලේකම්තැනවූ **සමුවර්ටි** මහතාද, කපිතන් **සැන්ට් ජෝන්** මහතාද සමග පැමිණ්යේය. මේ හැම උත්තමයෝ සුසෙව් ද සොඩිසා මහතා ප්‍රධාන ද සොඩිසා මහතා සහ එම මහත්මිය විසින් ගෞරවාදරයෙන් පිළිගනු ලැබූහ.

———:o:———

කුමාරයානන් ද සොඩිසා මන්දිරයේ ගතකල කාලය.

ආදිපාදතුමා ද සොඩිසා මන්දිරයේ ගතකළ කාලයේදී මහත් ප්‍රීතියට පැමිණ්යේය. ආදිපාදතුමා සපැමිණ ඇවලප වේලාවක් යන අතර නැවුම් පවන්ගන්නාලදී. සාමාන්‍ය විදිස මෙම ප්‍රසාදාවට පිළියෙල කරණලද අලඩාර ශාලාවක නැවුහ. ආදිපාදයානන් ප්‍රධානකොට ඇති පැමිණි පිරිසගේ සිතු නෙතු පිණවන ආකාරයට මෙකී ශාලාවේ කවසුතු මොනවට නිමකර තිබුනේය. මෙම ශාලාවේ විතාන තව්වු සහ දැලත් සෙවත රූපත පිළියෙන් සරසා තිබීම මනා දර්ශනයක්විය. හෙසැත්තෑවෙනි සුඛ හමුදුවේ "බෑන්ඩ්" කණ්ඩායම අන්‍ය ශාලාවක තුයෂ්නාද පැවැත්වීමෙනි යෙදී සිටි නිසා "සිලෝන් රයිෆල්" නට සේවා හමුදුවේ "බෑන්ඩ්" කණ්ඩායම විසින් මෙම ශාලාවේ තුයෂ්නාද පවත්වනලදී. නැවුම් ගැණ ආදිපාද තුමා ප්‍රීතියට පත්විය.

ඩෙම් කාර්සන් ගායනා කණ්ඩායම.

මෙම ප්‍රසාදාවට පැමිණි සිව් දෙන ගායනාකාරයින් වන "ඩෙම් කාර්සන්" ගායනා කණ්ඩායමේ ගායනා කිරීම ඉතා මාහැකිවිය. මෙම ගායනා කිරීම ආදිපාදයාගන්ද, ආණ්ඩුකාරතුමාද, රොබින්සන් ආයාව සහ තරුණ රොබින්සන් මහත්මියද, කොමඩෝර් සර් ලියපෝල්ඩ් ජෙත් මහතා සහ තවත් බොහෝ දෙනෙකු ඉදිරියේ පවත් වනලදි. කාර්සන් මහතාගේ සින්දුකීම ගැන් අත්පොළ සන් දීමෙන් සහ සිනාහ පහළකිරීමෙන්ද ප්‍රියිය ප්‍රකාශ කළහ. උෂ්ණමානය සෙන්ටිග්‍රේඩ් අංශක අනූවක් (90) ක් ප්‍රමාණ ශීඝ්‍රව ඉහළය ඇති මඩහලෑ ශාලාවක බොහෝ වෙලා සිනාසෙමින් ප්‍රීතිවීම පහසු නොවන බැවින් ගායනාව අවශන්වූ කෙණෙහිම සියල්ලෝම පිටවූහ.

———:o:———

පාන ශාලා.

යුරෝපිය සිරිත්වලට අවිරුද්ධ ලෙසද, රාජකුමාරාදි උත්තමයන්ට අනුකූල ලෙසද, යුරෝපිය මහා රාජවල පවත්වනු ලබන මහොත්සවයන්හි පිළියෙල කරණ ලද පාන ශාලාවකට දෙවෙනි නොවන ආකාර සුදුනම් කරණලදැ, ද සොඉසා මැදිරියේ එක් පාන ශාලාවකට මෙම උත්තම පිරිස පැමිණියාහ. එහිදී ද සොඉසා මැති වරුන්ගේ සම්මාන වැඩකරුවන්ට පිළිවන්තරම් ඉක්මනින් මිළවූදැ, රසවත්වූදැ, "ෂැම්පින් බෝතල" ඇඹ හැර ආජනවලට වත්කරණ ලදින් රාජකුමාරයා ප්‍රධාන පිරිස ඉතා සතුටින් පානය කළෝය.

———:o:———

නාඩගම්.

එහි එක පසක මනාලෙස පිළියෙළ කරන ලද ශාලාවක නාට්‍යයක් පවත්වනු ලැබිය. මෙම නාට්‍ය කම්සද ඉතා ප්‍රියදර්ශනාකාර පැවැත්වූහ. සිංහල ගායනා පිළිවෙල

ඉතා රමණීයය. නාට්‍යකරුවන් වශයෙන් පෑමිණි සියලුම පුරුෂයෝ නානාවර්ණ ඇඳුම් පැලඳුම් වලින් සැරසී නාට්‍ය දක්වනු ලැබූහ. මෙවර්ෂයේ නාට්‍යයට ගෙණ තිබුණ කථාව ඇහැළපොල සටහන * වේ. මෙය ප්‍රසාරවට ඔබින කථාවක් වුවා පමණක්දු නොව එය තේරුම් ගැණීමට ඉංග්‍රීසි භාෂාවෙන් **නාට්‍යනය** පත්‍ර මුද්‍රණයකොට පෑමිණි මහතුන්ට වෙඳදීමද ප්‍රයෝජනවත්විය. මේ කරණකොට ගෙණ යුප් කුමාරයා ප්‍රධානකොට ඇති ඉංග්‍රීසිමහතුන්ට කථාශරීරය තේරුම් යාමෙන් ප්‍රීතියට පත්විමට ඉඩ ලැබුණේය. කුමාරයා සහ ලඞ්කාණ්ඩුකාරතුමාද පිරිසද මේම නාට්‍යය ගැණ සතුටට පත්වූහ.

———:o:———

දුම්බ නාට්‍ය.

දුම්බ නාට්‍යය සඳහා පිළිලෙළ කරණලද ශාලාවේ ඉතා මිහැරි දෙමල ඇඳුම්වලින් යුත් නාට්‍යය සිදුවූ නැවූහ. මේ නළඟනන් විසින් සුඛකීය ශරීරාඞ්ග විකාරයෙන් දක්වනුලැබූ කාම්ක ලක්ෂණ කරණකොටගෙණ විශෙෂ ලෙස කාමිහොඹිහු සතුටට පත්වූහ. දුම්බ වෘත්තා ගැණ සහ ඒ වෘත්තා අනුව පා තැබීම් ගැණද, ඔවුන්ගේ සුමිහිරි සඞ්ගීතාරාවය ගැණද කුමාරයා සහ පිරිස ඉතා සතුටට පත්වූහ.

———:o:———

නැටුම් කරකවන්නිහෝ.

පසෙක සිංහල සිදුන් රැසුවුවක් ඊ කියමින් සහ තැටි කරකැවිවේන්ද, නැටිමේන්ද යුක්තව සිටියාය. ඉතා ශොභනලෙස ඔවුන් කළ මේ ක්‍රීඩාව දෙස රාජ කුමාරයා

* මේ කථා ශරීරය 1870 වෙ අප්‍රියෙල් · මස · 23 වෙනි දින ඔබ්සර්වර් පත්‍රයේ ප්‍රසිඞ්ධකරනිබේ.

සැලකිලිලෙස බලා සිටියේය. ඔවුන් පුරාණ සිංහල රජ කාලයේ පටන් පෙළහර ඉදිරියේ ක්‍රීඩා දක්වාගෙණ ආ පරම්පරාවෙන් පැවතෙන්නියන් බව ආණ්ඩුකාරතුමා කුමාරයාට කියා දුන්නේය. කුමාරයා මේ ගැණෙද ප්‍රීතියට පැමිණියේය.

———:o:———

රූකඩ නැටීම.

එකලට ලඞ්කාවේ ප්‍රසිඩ රූකඩකාරයින්ට එම ක්‍රීඩාව පැවැත්වීම සඳහා ඊට ඔබිනා ආකාර ශාලාවක් තනා තිබුනේය. එම ශාලාවේ රූකඩ නැටීම පවත්වනලදී. ලක්ෂණ ඇතුව පැලඳුම්වලින් භ්‍රාජ්ත මෙම රූකඩ නැටවීම හොඳාකාර කෙරුනේය. එඛලනතාදි රාජාවල පවත්වන රූකඩ නැටීම් හා මෙම රූකඩ නැටවීම සමානනුත නමුත් රාජ කුමාරයා සහ පිරිස මේ ගැණෙද බොහෝ ප්‍රීතිවූහ.

———:o:———

මිශ්‍රනාට්‍ය.

ආණ්ඩුකාරතුමාගේ වේවාපන්නක්කාරයින්ගේ ඇතුම්ව තුරු ඇතුම්කින් සැරසි රඟපෑ නළුවන් සමූහයක් දැක රාජ කුමාරයා සහ පිරිස සතුටුවූහ. නවත් ශාලාවක සිසෙසක්ඨ් රව්වෝල් මහතා විසින් මායා දක්වනලදී. මෙම ශාලාවද ප්‍රසාවට ඔබින ආකාර මොනවට සරසා මායා උපකරණ ආදියද පිලියෙළකර තිබුනේය. රාජ කුමාරයා සහ පිරිස මෙය බලා සතුටුවූහ. නවත් පසක බොහෝ දෙනාට වාඩි වීමට ආසන පණවා ඒ මඩෑයෙහි භූමණයවන උන්සිල්ලාවක් සවිකර තිබුනේය. මීට නොයෙක්දෙන නැවී කර කැවෙන රඟ දැකීනයට ප්‍රියවිය රාජ කුමාරතෙම මෙයද බලා සතුටුවිය. මෙසේ බැලූ බැලූ දිගාවේ නානාවිධ නාට්‍යයන් සහ නොයෙක් ක්‍රීඩාදියද පැවතින. රාජ කුමාරයා සහ පිරිස මෙකී හැම ස්ථානවලට පැමිණ එකී එකී ක්‍රීඩාදිය බලා සතුටුවූහ.

මේ ඇර සනතියකුම්, රටයකුම්, කොහොඹ යකුම්, ගරා යකුම්, කෝලම් ආදී යක් පාලියට අයිති නානාවිධ නැටුම් ඒ ඒ නැටුම්වලට අයිති බියකරු මුහුණු බැඳ දක්වන ලදින් කුමාරයා සහ පිරිස එකී සියල්ල බලා සතුටුවූහ. තවද පාන්මඩු, ගිනිමඩු, දෙවොල්මඩු ආදිය ගැණද අන්ඇදීම්, පොල්ගැහීම්, රබන් ගැහීම්, කලගෙඩි පිඬීම් යනාදී ක්‍රීඩා ගැණද කුමාරයා සහ පිරිස එසේම සතුටු වූහ.

—:o:—

භොජන ශාලාව.

රාජ කුමාරයෙකුට නොව ඔටුනු පලන් මහරජතුමෙකුට පවා සුඛයිය මාලිගාව මනකනැහිවෙන ආකාර සර්ව ප්‍රකාර විසිතුරු සැරසිලි වලින් බොදුන් හල සම්පූර්ණතා කොට තිබුනේය. මෙහි ආලෝක දැල්වූකල පිළිම්ණේ මැදුරක අභ්‍යන්තරයෙහි දැල්වූ නීල පීතාදී මාණික්‍ය පහන් රාශියකගේ සිරිසිලිය. භොජන ඵලකයද සුරෝපිය සිරිත් ලෙස සරසා ද සොසියා සාමාජිකයන් යටතේ සිටි සූප ශාස්ත්‍රයෙහි දක්ෂ අරක්කැමියන් විසින් ඉතා උසස්ලෙස පිසන ලද භොජන පිළියෙලකර තිබුනේය. එහි වෘත්තිය දියේ සුගන්ධිය, ද සොසියා මණ්ඩිරය තුළ පමණක් නොව ඉන් අවටද පැතිරිනි. අම්බන රසෙව් සකල රස බොදුන් විපුලාකාර පරිපූර්ණවූ කල කාලාරක්ෂණයේහි නිපුණතා කාලාරක්ෂකතැන විසින්, කාලය, සංඥා කරණ ලදින්, කුමාරයානෝ රොබින්සන් ආර්ය්‍යාව සමගද, සර් හර්ක්විලස් රොබින්සන්තුමා තරුණ රොබින්සන් මහත්මිය සමගද කෑමට වාඩිවූහ. රාජ කුමාරයනන්ට විශේෂලෙස සූදානම් කරණ ලද ආහාරයට උචිතවන සුවිණීමය භාජන දෙකක්ද, "ඇම්පෙන්" සහ "වයින්" ආදිය බොන සුවිණීමය පාන කාචක තුණක්ද, සුවිණීමය සැන්ද, සුවිණීමය "ගාර්ලුව" සුවිණීමය පිඟිය යන ත්‍රිවිධ වස්තූන්ගෙන්ද භොජන ඵලකය

විරාජමානවිය. උෂ්ණ ඔඩබංශනය සඳහා පිළියෙල කරණු ලැබූ සුවඳ මුසු මඤ්චාරූඪය දෙන දිසාමොක් විජිතියාවන්ගේ චංචලයෙන් ලැබෙන මද සුලං විඳුනයකොට කොට රාජ කුමාරයානෝ සහ පිරිස රාජ භෝජන අනුභවකර "ඇමිසින්" ආදිය පානය කළහ. රෑ කෑමෙන් පසු, මහරාජිනීන්වද, වේල්ස්හි රාජ කුමාරයානන්වද, ඇඩින් බරෝහි මෙම රාජ කුමාරයානන්වද, ශුභ ප්‍රාර්ථනාකොට පානය කළාලදී. මෙසේ කරණලද ශුභ ප්‍රාර්ථනාවට පිළිතුරුවශයෙන් රාජ කුමාරයානෝ තම හිස පහත්කොට සතුට ප්‍රකාශ කළහ.

.———:o:———

රාජ කුමාරයා පිටත්වයාම.

රෑ කෑමෙන් පසු රාජ කුමාරයානන් නැවතත් නොයෙක් සෙල්ලම් බලමින්ද තැන තැන ඇවිදිමෙන්ද, ද සොසිසා මැදිරියේ ඇතුවගිය සැරසිලි සහ ලක්ෂණ කෞතුක භාණ්ඩ ආදිය දැකීමෙන්ද ප්‍රීතියට පැමිණ බොහෝ වේලාවක් ගතකොට උදය හතරට පමණ සුසෙව් ද සොසිසා මහතා ප්‍රධාන ද සොසිසා පවිල සමඟ ආචාර සම්මාචාර පවත්වා එහි රැස්ව සිටි දහස් ගණන් සේනාව විසින් දෙනලද ඔල්වර ශබ්ද ඇසීමෙන් විරිසත් ස්වඟ රාජ මැදිරියට යහපත්වීම සඳහා පිටත් වීමට සැරසුනකල අඟනී ක්‍රීඩා පටන්ගන්නාලදී. වික වේලාවක් නැවතත් නතරව ගින් ක්‍රීඩා දැකීනයකොට, ඒ ගැණද ප්‍රීතිව පිටත්වූහ. මහත් මුදලක් වියදම්කර සාදවා තිබුන ගිනිකෙළි දැක්වීමට පටන්ගත් වහාම නගරයේ සෑමතැනම වාගේ ආලෝක පැහිරින. මහත්වූ ආකාශ වෙඩිලි අහසේ ඔබ මොබ පියාසර කරණ අතරමට විසුරුවා හරිණ ලදුව එයින් විසුරුණ නානාවණ් ගිනිමල් කුමාරයාට මල්වියනක් හා සමානවිය. නොකඩව ගින්

දෙනලද ලොකු ගිනි බෝම්බවල සහ නිලාවල ආලෝකය හරහා කොටගෙන් සකල සැරසිලි පටන් මාණියද එකාලොකවිය. සැබවින්ම කුමාරයා සහ පිරිස මේ හැණ්ද ඉතා ප්‍රීතියට පත්ව සිහා මුහුණින් යුක්තව මෙම අඟනී ක්‍රීඩාලොකයෙන්ම රජ මැදුරට සමුප්‍රාප්තවූහසි කිම සුපිර ලෙස පිළිගැනීමට සැකයක් නොමැතිය.

——:o:——

නැවතත් ක්‍රීඩා පටන් ගැනීම.

කුමාරයා සහ පිරිස වැඩමකළාසින් පසු පළමුලෙස සියලුම ක්‍රීඩා නැවතත් පටන්ගත. කිණිකෙළිද නොනවත්වා දුක්විමට පටන්ගත. නෝනාවරුන්නේ සහ මහත්වරුන්නේ නැටීමද පටන්ගත්හ. කුමාරයා වැඩමකළාසින් පසුවද මෙම උත්සාහට ක්‍රීඩා කුමය හැර සාමට කිසිවෙක් කැමති නුවූහ.

පියින්වී මහතා, සුසෙව් ද සොසියා මහතා ප්‍රධාන ද සොසියා පවුලේ වණ්නාව වෘත්තලෙස කොට සුසෙව් ද සොසියා මහතාට සහ ද සොසියා මහතාටද එම නෝනා මහත්මියටද ප්‍රීතිසොඟා පවත්වනලදී. වෙනත් දැඟ කර්තෘකාර උසස් ඉංග්‍රීසි මහත්වරුද, වතුකාර මහත්වරුද සුසෙව් ද සොසියා මහතා ප්‍රධාන ද සොසියා පවුලේ ගුණ කර්තෘයකරමින් මහත්සේ ප්‍රීතිසොඟා පැවැත්වූහ. මුළු ලංකාවේ තිබෙන සකල ඉසුරු එකතැනකට රැස්කළාක් මෙන් මෙදින රෑ, ද සොසියා මැදිරිය සහ එම භූමිභාගයද සසඳිරි ඉසිලිය.

පමණෙක් රස ආහාර තහා සතුටුවූහ. පමණෙක් රස බීම බීබී සතුටුවූහ, පමණෙක් නට නවා සතුටුවූහ, පමණෙක් පැනිරස කැවිලිතහා සතුටුවූහ, පමණෙක් පැණිරස බීම බීබී සතුටුවූහ. පමණෙක් කිරි කෝපි බීමෙන් සතුටුවූහ, පමණෙක් කිරි තේ බීමෙන් සතුටුවූහ, පමණෙක් සැරසිලි බලා සතුටුවූහ, පමණෙක්

ආලෝක බලා සතුටුවූහ. පමණෙක් ත් කියමින් සතුටුවූහ, පමණෙක් ආත්මොළඝන් දෙමින් සතුටුවූහ, පමණෙක් ඒ ඒ ක්‍රීඩා කරුවන්ට එක්වමෙන් සතුටුවූහ, පමණෙක් ගිගිරිකෙළි දැක සතුටුවූහ, පමණෙක් ඉල්වර හඬ දීමෙන් සතුටුවූහ, පමණෙක් ද සොඬසා පවුලේ වණ්නාව කියමින් සතුටුවූහ, පමණෙක් නාටාඞ්ගනාවන් දෙස බලාඉඳීමෙන් සතුටුවූහ, පමණෙක් අලංකාර ලෙස සැරසි සිටින නවයොවුන් කනාඇවුන්නේ බොලඳ කොමල වදන් අසමින් සතුටුවූහ, පමණෙක් නවනාට්‍යය රස විදිමින් සතුටුවූහ, පමණෙක් ද සොඬසා මැදිර සෙහි ඇතිවූ පුදුමවූද, ලක්‍ෂණවූද, අප්‍රාණික අහනා වසතු දැකීනයෙන් සතුටුවූහ, පමණෙක් ඉංද්‍රියි නැවුට දැකීමෙන් සතුටුවූහ, පමණෙක් මායාදැක්වීම් දැක සතුටුවූහ, පමණෙක් ඔබ මොබ දුවැවිදින මොලකැවිදුරුකයන්ගේ සුරතල් බලමින් සතුටුවූහ, පමණෙක් දුව්ඩ නාඩගම් දැකීමෙන් සතුටුවූහ, පමණෙක් ශෛව විමානය පොළෝ බවුසේයකි වරදවා සිතමින් සතුටුවූහ, පමණෙක් විෂ්ණු විමානය පොළෝ බවුසේයකි රැවටී සතුටුවූහ, පමණෙක් මත්වී නන්දෙඩන්නන් දැක සතුටුවූහ, පමණෙක් ඒ අත මේ අත වැනෙන්නන් දැක සතුටුවූහ, පමණෙක් ද සොඬසා පවුලේ ශ්‍රෙෂ්ඨභාවය බලා සතුටුවූහ, පමණෙක් ද සොඬසා මහතුන්නේ නිරහඞ්කාර මනොඥ ලීලාව සහ සියලු තරා තිරිසි අසට ඒකාකාර කරකියන සඞ්ගහ ගැණ සහ ආචාර සමාචාර ගැණ සතුටුවූහ, පමණෙක් සිංහල අපේ දූපතට සම්ප්‍රාප්තික ඉංද්‍රීසි රාජ කුමාරයොකුට මෙසේ සිංහල නිවසකට කැඳවා රාජ ලීලාවෙන් මොනවට සඞ්ගහකර මුළු සිංහලයින්ගේ නාඹුව ද සොඬසා මැනිවරු රකා කර දුන් මහිමය ආශ්චර්‍යය, අද්භූතය, කියමින් සතුටුවූහ, පමණෙක් මේ රෑ මෙහි පැවතුන රථශබ්ද, බෙර ශබ්ද, අඩි ශබ්ද, ත් ශබ්ද, තැපි ශබ්ද, සක් ශබ්ද, හේසාර ශබ්ද, වීණා ශබ්ද, ප්‍රිය වදන් ශබ්ද, ආත්මොළ ශබ්ද යන දශවිධ ශබ්ද ශ්‍රවණය කරමින් සතුටුවූහ. මෙසේ ප්‍රමාණාතික්‍රාන්තා ලේස සතුටුවූ දහස් ගණන් සුදු පුරුෂ සේනාව තම තමන්

මිනිවල දක්වා ගමන්කරන්නහුරු මින්පසු නොලැබියහැකි රැයක්වූ මේ රාත්‍රියෑ ඉතා උත්සහතාලෙස උත්සව පවත්නා අතර, අධික ශ්‍රීතිය විපුල දුඃඛයට ආසන්න බැව් දත් කුළුඟුබර ලඟිරුනෙම වහාම සිය කිරුණින් සෑරසි උදයගිරට පැමිණීමෙන් පෙරදින රෑ මෙම උත්සවයට රැස්වූවන් ඒ ඒ විමන්කරා විසුරුවා හලේය.

———:o:———

රන් හාජන.

රජ කුමාරයා අනුභවකල රන් තැටි දෙක සහ පානයකල රන් හාජන තුණින් හැන්ද සහ "ගාර්පු" වත් ද සොඬිසා මහතුන්ගේ දක්ෂ ශිල්පීන් ලවා තනි රත්නරනින් නිමකරවන ලද අගනා දෙයය. එම හැන්දේ ඉතා මහැනි ලෙස මිදිකොල කොටා මිදි ඵල වෙනුවට අගනා මුතු ඔබබානිබේ. පිහියේ සහ "ගාර්පු" වෙත් දෙමිට කැවයට වැඩකොට අගනා රතු කැට අල්ලානිබේ. තැටි දෙකේද මිදිකොල කොටා එක තැටියක වවේ මුදුන ඵල වෙනුවට මහැනි මුතු ඔබබානිබේ. අනික් තැටියේ මැද සිඟින් ලියවැල්කොටා තිබේ. මෙකී අගනා රන් හාජන කුමාරයා නිසාම විශෙෂලෙස සකස්කල බැවින් සිඟිවිමක් වශයෙන් සියරට ගෙණයාම ගැන් ද සොඬිසා මහත්මයා කැමැත්ත දක්වූකල, කුමාරයා ද සොඬිසා මහතුන්ට කරුණාවෙන් කථාකොට "සිඟිවිමක් වශයෙන් නබාගතකැකි මෙබඳු අගනා දෙයක් ගෙණයාමට නො සිතන නමුත් එය මවිසින් මහතුන්ගේ නිවසෙහි ප්‍රිතියෙන් පසුකල සවස් කාලය සිහිපත්වීම සඳහා පරම්පරාගතව පැවතෙන චිහ්නවක් වශයෙන් නබාගැණීම සෑහේය" යි පැවසුහ. ද සොඬිසා මහත්මයා කරුණාවන්ත ප්‍රභූ සම්ප්‍රසාදී රාජකීය මෙ වචන යටත් පිරිසෙසින් ඉවසිය. කුමාරොත්තමයානන්ගේ ඉල්ලීම පරිද්දෙන් මෙම සිතියමෙන් පෙණෙන එකී අගනා සුවර්ණමය හාජනාදිය ද සොඬිසා වලව්වේ ගොනාන් ප්‍රවෙශවිය



GOLD ARTICLES AT THE ENTERTAINMENT.— රන් භාජන.

තිබෙන බව දනිමු. නිධාන්ගතව තිබෙන රාජ සන්තක සමස්ත රන් බඩුනක් හැර, දශින පර්යට ගොචරව මුර් ලංකාවට තිබෙන ස්වකීය ගෘහ සම්ප්‍රාප්තිකව රාජ පාරිභොගික රන් භාජන ශෛඛහල නාමොපලක්ෂිත ද සොයිසා මන්දිරයේ මෙතාක් තිබෙස යනු ඇසීම සකල ශෛඛනලයන් පීණනය කරණ ශබ්දයක් නොවන්නේද?

———:o:——–

රාජ කුමාරයානන් විසින් ද සොයිසා මහතුන් පිළිගැණීම.

———

රාජ කුමාරයාගෙන් සහ ගරුතර ආණ්ඩුකාර උතුමානන්වහන්සේගෙන්ද ලබනලද ආරාධනා ඇතුව සම්ප්‍රාප්ත වූන ද සොයිසා මහත්වරු වර්ෂ එක්දහස් අටසිය සැත්තෑවෙ අප්‍රෙල් මස සිවවිස් (1870 අ. මි. 24.) දින කොළඹ රාජමන්දිරයේදී කුමාරයා විසින් සහ උතුමානන්වහන්සේ විසිනුත් බොහෝ කරුණාවෙන් පිළිගෙණ ආදර බුහුමන් දක්වූහ. කිව්දින සවස එතුමාට කරණලද සංග්‍රහ ගැණද පිළිගැණීම සඳහා තබනලද වටිනා කෞතුක භාණ්ඩයන් සහ කැටයම් ආසනාදිය ගැණද තමාගේ සතුට සහ පිළිගැණීමද ප්‍රකාශ කරණ ලදි. තවද කුමාරයා ලංකාවට පැමිණි බව සිහිවීම සඳහා එතුමාගෙන් යම් යම් තෑගි ගැණීමට ද සොයිසා මහතුන්ගෙන් ඉල්ලා සිටියේය. ද සොයිසා මහතුන් කුමාරයාගේ ත්‍යාගිවනාත ගරු බඳුන්වලට සැලකිලි වශයෙන් තමන්ට කල ගෞරව ගැණ නිසි ආකාර සතුට ප්‍රකාශකල ඉක්බිති කුමාරයා සහ ද සොයිසා මහත්වරු අතිශය සතුටට පත්වූහ. ද සොයිසා මහතුන්ගේ ඉල්ලීම පරිද්දෙන්, කුමාරතෙම සිහිවීමක් වශයෙන් කරුවල ලියෙන් කපනලද දුනු ආදියෙන් සැරසුනු වැද්දෙකුගේ සහ වැද්දියකගේ රූප සහිත කැටයම් කල කළුමැදිරිය තුවක්කු තබන ඉතා අගේවඩන "අල්මාරි" යක්ද, සඳුන් ලියෙන් සාදනලද දික් ගඟලාවක්ද, ලංකාවෙ මාණික්‍ය

හොලෙන් ලද පිඩතුරු ඇත්දත් පෙට්ටියක්ද, ලඩකාවේ තිබෙන අතකි තෙල්වණ අත්තණ්ඩන පෙට්ටියක්ද, කළු මැදිරිය ආසනවල සවියල වටිනා සහ අගනා ඇත්දන් සුවලක්ද, ද සොසියා මහතුන්ගෙන් පිළිගත්තේය. තවද, රජ කුමරුනෙම "දුසියට" හදින දියමනති මාණික්‍යය බැඳි අගනා ඩෙණ්මය "දුසිකටුවක්" (Scarf Pin) ද සොසියා මහතාට තෑගි කෙළේය. කුමාරයා සහ ද සොසියා මහත්වරුද, සතුටු සමාගණ සඛ්‍යාවනාදිය කර ගැනීමෙන් මෙම ප්‍රිය සඩගමයෙන් වෙන්වූහ. ලඩකාව තිබී රජ දරුවන්ගෙන් කෙනෙක්වූ මෙම ඇසින්බරෝහි ආදිපාදෙතුමයාගේ මේ පළමුවෙනි පැමිණීමෙදි ලඩකා වාසි සිංහල මහජනයා වෙතුවෙන් ද සොසියා මහතුන් ඉදිරියට පැමිණ ලක්දිව කුමාරවරුන් මෙන්ද, සිටුවරුන් මෙන්ද මෙසේ නිවේදිතලෙස ක්‍රියාකර ආජ්ඤක සිංහල රජ දරුවන්නේ සොහොන්කොත්වලට සහ සිය සේනාවට මෙසා නටබුවක් ලබා දීම ගැණ ද සොසියා පවුලට අදත් කෘතොපකාර ගෞරව සැලකිලි කිරීමට කවර ඡුනවත්තා කෙක් විසුරු මේද?

———:o:———

ආදර්ශ ගොවිපල.

———

කුමාරයා ලඩකාවට සම්ප්‍රාපනවුන බැව් සිහිවීම සඳහා ආදර්ශ ගොවිපලක් සහ ගොවිකම්හාන ශාලාවක්ද පිහිටුවීම සඳහා පවුම **දහදහක්** තෑගි කිරීමට ද සොසියා මහතුන්ගේ සතුට ප්‍රකාශ කරණ ලදින්, පරාවක්‍රම කම්ය දැනහත් සර් හර්කිවිලස් රොබින්සන් ගරුතර ආණ්ඩුකාර තුමා ද සොසියා මහතුන්ට ස්තුතිකෙළේය. තවද, එයි මුදල් ප්‍රීතියෙන් පිළිගෙණ එම ගොවිපලට **ඇල්ප්‍රඩ් ආදර්ශ ගොවිපල** යයි නම් කිරීමට කුමාරයානන් අවසර දුන් බවද දැනුම්දෙනලදි. "දෙවච්කිටාධාරයෙන් ද සොසියා පවුලට ලැබී තිබෙන මහත් විශ්වාස චේතිය ජනයාගේ ගතපත සඳහා පරිත්‍යාගකල පල්ලුවෙනි චාරය මෙය

නොවන බැව් දනිමැ" යි රෙබ්න්සන්තුමා ප්‍රකාශයොත් වැඩිමහල් ද සොයිසා (සුසෙව ද සොයිසා) මහතාට තමාගේ බලයෙන් දියහැකි ඉතා උසස් නම්බුනාමයවූ **වාසල මුදලි** නාමය දීමෙන් ගෞරව කිරීමට සතුවුබැව් සහ එසේ සතුවුනම් ඊට උවමනා කෘත්‍යානය කුමාරයා කෑගි කිරීමට ප්‍රීතියෙන් සිටින බවත් දැන්විය.

චාල්ස් හැන්රි ද සොයිසා මහතාගේ අදහස් සහ සිහාවත් වැඩිකොටම ඉංග්‍රීසිකාරයකුගේ අදහස්වලට සහ සිහාවටත් සමාන බැවින් ඒ මහතාගේ සුළු පියාට මෙන්ම එකසමාන නම්බු නාමයක් නොදී මුළු ලඬකාවේ **සාමදන විනිශ්චයකාර ධූරය** දීමෙන් ගෞරව කිරීමටද, රාජ කුමාරයා සහ ගරුතර ආණ්ඩුකාර උතුමානන්වහන්ස්ගේත් සතුටු බව ප්‍රකාශ කරණ්ලදි. වැඩුමහල්ලන් ගැන විශෙෂ සැලකීමක් ඇති චාල්ස් හැන්රි ද සොයිසා මහතා එකසමාන ගෞරවයක් දරණ තනතුරකට කැමැත්ත නොදක්වන ලදින් කුමාරයාගේ සහ උතුමානන්වහන්ස්ගේ ඉල්ලීම් වචන ඉවසුවෙය. ද සොයිසා මහතුන්ගේ ඇති රාජපක්ෂිකකම් ගැණ සහ සැකියිය රටවාසීන් ගැණ ඇති විපුල කරුණාව ගැණත් කුමාරයා සහ උතුමානන්වහන් ස්ගේත් තව දුරටත් යහුතිකොට මෙම ප්‍රිය සඬගමයද සමාපත කළහ.

ද සොයිසා මහතුන් සහ ලඬකාවද, ලඬකාවාසි රාජ පාක්ෂික ජනතාවද කුමාරයා ලඬකා වෙරළට පැමිණීමද, ද සොයිසා මහත්වරුන් විසින් පැවැත්නු රාජ කුමාරෙත්ස වයද, සිහිපත් වීමට සෑහෙණ සත්‍ය කරුණු ලඬකා ඉතිහාසයට නොවැරදී ඇතුළත්වීම සවී ප්‍රකාරයෙන් සෑහුණ නමුත්, පරොපකාරී ද සොයිසා මහතුන් මෙයින්ද නිසොල්මන්ව නොසිට ලඬකාවට අවශ්‍යව තිබුන ආදර්ශ ගොවිපල සහ ගොවිකර්මාන්තා ඉගෙණීමේ ශාලාවක්ද විවෘත කිරීම සඳහා පවුම් **දහදහක්** පරිත්‍යාග කිරීම ඒතුමන්ගේ තෘෂ්ණිවනත්‍යතම ප්‍රකට වීමට පමණක් නොව

මුළු ලඬකාවාසින්ගේ විපුල ප්‍රයෝජනයටද මාහැනි කරුණක් බව නුවණැත්තනු විසින් පිළිගන්නා ලද්දකි. මේ පොත ලියන කාලයේ මෙම ගොවිපල අභාවයට පත්වූ නමුත් මෙහි වැඩ සඵලාකාර කරණලද්දේ නම් අදත් මේ කරණකොටගෙන මහත් ප්‍රයෝජන ලැබෙයියාව ලබන්ට තිබුන බව නොදැකාර අපි දනිමු.

———:o:———

ආදශ ගොවිපලේ ගල නැඹීමේ උත්සවයේදී සර් හර්කිවිලස් රොබින්සන් ගරුතුමා කළ කථාව.

———

ද සොසියා මහත්වරු සහ මහත්වරුණි,

ඇල්ප්‍රඩ් ආදශ ගොවිපලේ නිවෙස තිබෙන තැන ශාලාවේ මුල්ගල තැබීමටද, අද දින එලඹ සිටීමටද, එහි භාරකාරයින් විසින් එවනලද කැඳවීම් පත්‍රය පිළි ගැණීම මට මහත් ප්‍රීති දායක කරුණක්විය.

මෙබදු පිහිටුවීමක්, ලඬකාවට කාලයක පටන් ඕනෑව තිබුනේය. අමෙරිකාවෙන් "කැරොලිනා ච්" ගෙන්වීමෙන්ද ඉන්දියාවෙන් ගවයින් ගෙන්වීමෙන්ද, ගව වසංගතය ගැණ කාරක සභාවක් පත්කිරීමෙන්ද, සඬේශක ගොවිතැනද, ගවයින් බෝකිරීමද, ගවයින්ට ප්‍රතිකාර කිරීමද, වැසිදිසුඤ්ඤරවන්ට ආණ්ඩුවද මෑතදී උත්සාහ දැරුවේය. නුමුත් මේ උත්සාහයන්ගෙන් සාමාන්‍ය පොදු ජනයාට යහපතක්වුනේද; ලඬකාවේ ගොවීන් අතුරෙහි බොහෝදෙනෙක්වූ කුඩා ඉඩම් අසිනිකාරයින්ට ඔවුන් හඹුවෙති ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් නොමැති වෙනස්කිරීම් විළිනැන්විමය.

මේ පිහිටුවීම මේ ඕනෑතම පිරිමසන්ට අදහස් කරණ ලද්දකි. මෙහි අනුක්‍රමික අත්හදා බැලීම් විශාලලෙස කල හැකිවා සහ එවායේ ඵල එකම්වූ සත්‍ය පරීක්ෂණයෙන් අත්හදා බැලිය හැකිය. එවායින් ප්‍රයෝජන ලැබේද?

ගවයින් බෝකිරීම සහ තරකිරීමද, ඔක්ෂ කර්මාන්තය තෘණ වගී අලුතෙන් බෝකිරීමට පවත්ගැන්වීමද, වැඩි දියුණුවට ගෙණෙන ලද ගොවිතැනට අයිති ආයුධ සහ යන්ත්‍ර භාවිතාකිරීමද, අලුත් බිජයන්ගේ සහ නොයෙක් වගී පොහොරවල ප්‍රයොජනය සහ වී ගොවිතැනට වැඩි දියුණු කරණ ලද්දාවූ අස්වැද්දවීමේ ප්‍රයෝජනද ක්‍රමික මිමමකට මේහිදී අත්හදා බලන්ට හැකිවා සහ එය සුලු පුද්ගලික ගොවීන්ගේ හිතැයි ක්‍රමයකට නොයොදන ලද උත්සාහයන්ගෙන් ලබාගන්ට බැරි දෙයක. තවද මේ ඵල ඔවුන් ඉදිරිපිට පැහැදිලි ලෙස තබන ලද්දේනම්, ඔවුන්ගේ ගයිය ඔවුන්ගේ පරීක්ෂණයට සහ ප්‍රත්‍යක්ෂ යහපත් කල්පනාවට හොඳය කියා වැටහී යිදේනම් තමුන්නාන්සේලාගේ අත්හදා බැලීමෙන් ප්‍රයෝජනය ගන්ට සැදෙයිකයෝ ප්‍රමාද නොවෙත්ය යන්න ගැණ ඇත්තේ පිස සැකයක්.

මෙම ආණ්ඩුව සෙවනය කරණ කාලයතුළ සැදෙයිකයන්ගේ වැදගත් අන්‍යොන්‍ය තාවය සහිකාරයෙන්ම වර්ධනය කිරීමගැන් මම මහත් සැලකිල්ලෙන් ක්‍රියාකරණ නිසා මගේ පිටත්වී යාමට පෙර මා විශ්වාස කරණ ලෙස හරියාකාර ගෙණයන ලද්දේනම් සැදෙයින්ගේ ගොවිතැනට වැදගත් වැඩ සලසන්නාවූ ආදර්ශ ගොවිපලක් ඇතිබැව් මා ලබ්කාවෙන් යන්ට මත්තෙන් දකිම මට ප්‍රීති ජනකවේ. තවද දැනගැන්මෙන් මට සැනසිම් දෙන්නාවූ කරුණක්නම්, මේ පිහිටුවීම ගැණ මේ රටවාසින් ඔවුන් මෙම සැදෙයින් දෙන්නෙකුගේ නෘගිවන්නාකමට නමස්කාර යන්ව සිටීමය. ආණ්ඩුව ඉඩමක් දුන්නා සැබෑ නමුත් මෙම පිහිටුවීමේ භාරකාරයන් ලෙසද, එම ගොවිපලේ චිරස්ථිත නඩත්තුව පිණිසද ඉතා නෘගිවන්නා පවුම් දශ දහක් තමුන්නාන්සේලාට ද සොයිසා මහත්වරුන් විසින් භාරදෙනලදී. පුද්ගලික ධනය ප්‍රයෝජනවත් ප්‍රදේශ ගොඩ නැඟීම් සඳහාපනයට වඩා හොඳ එකකට කිසිකලක පරිත්‍යාග

කල් නොහැකිය. නවද ඔවුන් අවිදූමානව් දිසි කාලයක් ගියාට පසු මේ මහා ප්‍රහාවිකාම් ප්‍රවෘතිනයට සම්බන්ධවූ **ද සොසියා මිස්ටන්ගේ නාමයත්** අනාගත කාලයේදී ඔවුන්ගේ සැදෙක්කයන් කෑනෑ වශයෙන් සමරණය කරණු ලබන බව මට සන්තකය.

මේම පිහිටුවීමේ ප්‍රසිඛ ආරම්භ මඛලෘය ලඛ්කාණ්ඩු වෙන් මගේ පහවීමට පෙර තමුන්නාන්සේලා විසින් දක්වනලද කරුණු නිසා පවත්වන්ට බැරිකම ගැන් මට කණගාටුය. ඒ කෙලෙස වෙතත් ඇඩින්බර්ග්හි ආදි පාදයානන් ලඛ්කාවට පැමිණීම සිහිකිරීම පිණිස ආරම්භ කරන ලද මෙම ගොවිපල සම්බන්ධව අරමුණු කරන්ලද මේ මඛලෘ රැස්වීම ලබන අගෝසතු මස 26 වෙනි දින එම ආදිපාදයානන් උපන් සාංවත්සරික දිනයේදී සිඛවෙයයි මම බලාපොරොත්තුවෙමි. එවිට මගේ ඇවෑමෙන් පත් වෙන්නාවූ එතුමාගේ ඵලඛිමේ ප්‍රයෝජනය තමුන්නාන්සේලාට ලැබෙනු ඔට සන්තකවත් ඇර එතුමා තමාගේ ප්‍රකට මුළු ජීවිතයම උණුහුම් ඇති හෘදයකින් වැඩකරන්නාවූ අයගේ උසස්වීම සහ වැඩිදියුණුව ගැන් සලකණ බවට සාක්ෂිදෙයි. නවද මාගැන් කියන්ට ඇත්තේ මා එදිනේදී නොඵලඛුනත් තමුන්නාන්සේලා සියලු දෙනාම මතක්කරණ බවයි. නවද මේ ගොවිපල පිහිටුවීමේ දිනය සිහිකර මතු පවත්වන සියලු සාංවත්සරිකයන්හිදී මෙහි සිටින තමුන්නාන්සේලා හෝ තමුන්නාන්සේලා වෙනුවට පැමිණෙන්නෝ හෝ අද දිනේදී පවන්ගන්නා ලද මේ නොඛනැසිල්ලෙකිදී ඇල්ප්‍රඩ් ආදර්ශ ගොවිපලේ නොනඩව පැවතිගෙණ යන්නාවූ සඵලඛය ගැන් සහ එහි ප්‍රයෝජනවත්කමේ සීමා (මර්ඡලය) ගැන්ද ප්‍රකාශ කරන්නානුයයි බලාපොරොත්තුවෙමි.

මට සහ මගේ පවිලටත් තමුන්නාන්සේලා විසින් කරණ ලද ශුභ ප්‍රාර්ථනා ගැන් අන්තිමේදී ස්තුතිකරන්ට ඉඩදෙන ලෙස බුල්ලනවත් ඇර මේ වැදගත්වූ ප්‍රසංගයට

රොබ්න්සන් ආයාචාවට නොවැලකිය හැකි වැඩක් නිසා එලඹෙන්ට බැරිවීම ගැන් ඈ ඉතා කණගාටුවෙන බවත් මම සහතිකවශයෙන් දන්වමි. යනුය.

ඉක්බිති ද සොයිසා මහත්වරු උතුමානන්වහන්සේගේ වෘකත රමණිය කථාව ගැන් සතුටුවූ, ඉතා අනති කැවයෙ සහිත මිටකින් සුත් රිදීමය සුණු සැන්දෑ එතුමාට ආදඟ ගොඩපල සිකිවීමක් වශයෙන් පරිත්‍යාග කළෝය. උතුමානන්වහන්සේ සතුටින් එය පිළිගෙන් ද සොයිසා මහත්වරු සමඟ "ෂැම්පින්" පානයකොට විවත්ව ගියහ. * මෙම උත්සවයද, ගරු ගාමිනිරලෙස පැවැත්නු බව එවකට ප්‍රසිඛවූ ඉංග්‍රීසි, සිංහල ප්‍රසිඛ පත්‍ර මාතියන්ගෙන් දැනගන්ට ලැබී තිබේ.

වඹ එක්දහස් අටසිය සැත්තෑ එකේ දෙසැම්බර් මස තිස්එක්වෙනි (1871. දෙ. ම. 31.) දින සවස "ඇල්ෆ්‍රඩ් ආදඟ ගොවිපල" පිහිටි ස්ථානයේදී මෙම උත්සවය සිදු වුනේය. ගරුතර ආණ්ඩුකාර රොබින්සන් උතුමානන් වහන්සේ ප්‍රධාන, ආණ්ඩුවේ උසස් පහත් සිංහල ඉංග්‍රීසි නිලධාරීන්ද, නොයෙක් තරාතිරම් මහජනයාද, ඉංග්‍රීසි සිංහල වැදගත් නෝනාමහත්වරුන්ද පැමිණ සිටිමෙදී ආදඟ ගොවිපල තලමනාකාර සමිතිය විසින් අලඛාර ලෙස පිළියෙල කරණ ලද සතුටිපත්‍රය ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේට කියවා ඔප්පු කරණලදි. එය උතුමානන්වහන්සේ විසින් පිළිගත් ඉක්බිත්, ගරු. හෙල්වන් බිෂොප්තුමාගේ වැඩබැලූ ජෝන් ඇර්ලැන්ඩ ජෝන්ස් දෙවගැහිතුමා විසින් යාච්ඤාවක් දෙවාඳුරණ ලදින්, සුසෙව් ද සොයිසා මුදලිතුමා උතුමානන්වහන්සේගේ සුරතට බෝතලයක් දුන්නේය. මෙම බෝතලයනම්,

* මේතිදී උතුමානන්වහන්සේ සුසෙව් ද සොයිසා මුදලිතුමාට කථාකොට, ඇඩින්බරෝහි ආදිපාදෙතුමියට බාරදීම විශේෂ එම රාජ කුමාරියා තැගියකළ කඩු කොහොක පැළඳ ජායාරූපය ගෙන් උතුමානන්වහන්සේව එම්මට පෙනිදීම හිතම කළෝය.

ආදර්ශ හොවිපල් සම්බන්ධ සමහන්කරණලදු ලියවිලි සහ එවකට වලංගුවුන මුදල් ආදියත් ඇතුලේ බහාලනලදු නිධන්කිරීමට පිළියෙල කරන් ලද්දකි. උතුමානන් වහන්සේ මෙකී හෝතලය රැගෙන් ගලේ සාරා තුබුන වලේ තබා මානැති ආකාර කැටයම් ඔට සහිත රිදී සුතු සැන්දෙන් වැලි සහ තුතු ගෙන් ගල මතු ඇතිරවිය. එකල ඉහලින් තිබුන ගල බස්සවා අත්තිවාරම සකස් කරණුලැබ, ඒ බව උතුමානන්වහන්සේ විසින් රුස්වූ ජනයාට ප්‍රකාශකරණලදී. එවිට රුස්වූ ජනයා ප්‍රීතියොෂා පැවැත්තුහ. උතුමානන්වහන්සේ මහත්සේ සතුවට පත්ව ද සොසියා මහත්වරුන් සමග "ෂැම්පින්" පානයකොට රජමැදිරියට පිවත්වූහ. පැමිණි ජනයා එහි පිළියෙල කොට තිබුන අතුරුපසින් සහ "ෂැම්පින්" ආදි පාන වර්ගයන්ගෙන්ද, මොනවට සඛ්‍රහවිඳ ආදර්ශ හොවිපලේ තිබුන තොයෙක් පැලවර්, මල්වර්, අලුවර් ආදිය බලා ඇවිද ද සොසියා මහත්වරුන්ට සතුති පැවැත්වීමෙන් එසිරි ගියාහුය.

සුසෙව් ද සොසියා මුදලිතුමා, චාලිස් හැන්රි ද සොසියා ඇමදුන විනිශ්චයකාරතුමා, රාජකීය අවකාශ් මෝර්ගන්තුමා, බස්නාහිර පලාතේ මහඵජනත ලෙයාර්ඩ තුමා, සර්. හැරි දියස්තුමා යන මේ උතුමෝ ආදර්ශ හොවිපල භාරකාරයෝවූහ.

මේ ඇර කළමනාකාර මහතුන්ගෙන් යුත් සමිතියක්ද ඇතිවිය. ඒ සමිතියට බැඳි සිටියේ මෙයි පස්දෙන ඇතුළුව ඩබලිව්. සමිත්, ඩබලිව්. රෝල්ලෝ, සහ ඒ සින්ක්ලේර් යන මහත්වරුය. මෙකී ගෞරවාහි ලේකම තනතුර දරා සිටියේ "ටයිටස්" කතිවූ ජෝන් කැපර් මහතාය. විදෘලතාදිය ගැන් ගුරුකම් ගැන්මට නියම කරගෙන සිටියේ පේරාදෙනියේ මල්වත්තේ තුවේවිස් මහතාගෙන්ය. තෘණාදි විද්‍යුවන් අවබොධ කරවීමට නියම කරගෙන සිටියේ චාලිස් බාර්ඩ මහතාය. මෙම භූමි

ප්‍රමාණය අක්කර දෙසිය හැටකි. (අ. 260.) මෙම මුල් ගල තැබීමේ දිනයේ මෙම භූමිභාගය, තෑග්, උක්, මැද්ඤෙක්සා, අල, මල් ආදියෙන්ද අලංකාරව විපුල ප්‍රයෝජන අන්පත්වෙය යන ලක්‍ෂණයෙන් බබලන බව පත්මඟින් පෙනේ. මෙයි භූමියේ ගවතා ගවනය සඳහා මාවත් ඝ්‍රපයක්ද තනා තිබුනේය. මෙහැණ පවුම් හැටක් (ප. 60) වියදම්විය. නියරවල් බැඳීමට පවුම් දෙසිය පණහක් (250.) පමණ වියදම්විය. සැතැප්ම එකහමාරක් පමණ ප්‍රමාණයට වැටබැඳීමට සහ අගල්දැමීමට පවුම් තිහත් (30.) පමණ වියදම්විය. ඉඩම එලිකිරීමට පවුම් එකසිය අනුවක් (ප. 190.) පමණ වියදම්විය. මෙවැනිව අක්කර දහසක (අ. 10.) ප්‍රමාණ භූමියේ ගොවිතැන්කර තිබුනේය. මීටවඩා හොඳයකියා වැටහුන යාව තිබුන භූමිභාගය පවුම්හාරසිය අසූතුණකට (ප. 483.) මිලයට ගෙණ යාකරණ ලද්දේය. ගොඩනැගිලිවලට පවුම් එක් දහස් දෙසිය පණහක් (1,250.) පමණ්විය. හරක් තුන්සිය පණහකට (350) සෑහෙණ ප්‍රමාණ ගවහලට පවුම් නවසිය සතළිහකි. (ප. 940.) එහි උපකාරතැනගේ ගෙට පවුම් එකසිය පණහක් (ප. 150.) විය. කුලිකාරයින්ගේ ඔඩු වලට පවුම් එකසිය දහයක් විය. (ප. 110.) උෂ්‍රා කොටුවට පවුම් පණස් පහක් (ප. 55.) විය. තෑගි ලැබුන වැඩිමට උවමනා හොඟ ආදිය සහ උපකරණ හැර මේ උතුසව කාලය දක්වා ගොවිකම් ආදි උපකරණ වලට වියදම්වී තිබුන ගණන පවුම් හාරදහස් පන්සියයකි. (ප. 4,500.) ගෘහස්ථලමයින්ට සහ පිරිමි ලමයින්ට පාඨශාලා ගෘහ තනා එහිම නවතා ශාස්‍ත්‍ර දීමට සහ ගොවිකම, ගෘහසංවිධානාදියද, සූප ශාස්‍ත්‍රය සහ පශුවිද්‍යුදියද චාල්ස් හැන්රි ද සොයිසා සාමදූන විතිශ්චයකාරතුමාගේ වියදම්වීම් ඉටුකිරීමට අදහසක්ද කර තිබුනේය. මෙසේ මහත් ප්‍රයෝජනයක් ලැබීමට හැකිව ලඬකා භූමියේ සථාපිත එකම ආදර්ශ ගොවිපල සම්බන්ධ වෘතමාන කාලික ජනතාව අතුරේ දැන් පවතින විපුල දුඃඛය අතිශයින් බැරෑරුම් කතීව්‍යයක්ව පවතින බව මෙම ග්‍රන්ථාරූඪ කොට තැබීමට සිදුවීම මහත් ඛෙදයකි.

දරුවන්ට ශාසන ඉගැන්වීම.

අහෝ කිසි රියක් රහකාවත් ඉහ ඉඳීම නොකොට සිටියත් මෙතුමාට තිබී මහත් ධන සඤ්ඤාරය දරුවන්ගේ විපුල ප්‍රයෝජනයට සැහෙන බව හොඳහැටි දැන සිටි නමුත් ධනය නුසුදුරු අතට වියදම් කිරීමෙන් පැමිණෙන්ට හැකි බලවත් විනාශය ගැන කල්පනාකොට දරුවන්ට නුවණැස් ලබාදීමෙන් තමාමෙන් ඔවුනුත් ලොකයාන් **සැපෙන්වා** යනු ප්‍රාර්ථනාකොට සිසුබස් සහ පරිභාෂාදියද දරුවන්ට සුනුලූ කරවී. ශෘඤ්ඤ දරුවන් පිට ශාස්ත්‍රශාලාවලට නෑර වලවේ වත්තේ පසක පාඨශාලාවක් පිහිටුවා එහි ඉගැන් වීම් සඳහා කුඩාකාලයේ තමන්ට ශාස්ත්‍ර හැදෑරූ ගෙෆ්. මැක් වියර් උන්නාන්සේගේ දියනියවූ ශ්‍රීන් නෝනා මහත්මයා සුරෝපයෙන් ගෙන්වා ඉංග්‍රීසි භාෂාව සහ මැනුම් ගෙනුම්ද භාෂනාදද හැදෑරවී. ඔවෙල් නම් ඉංග්‍රීසි සිතියම්කරු මහතා ලවා සිතියම් ඇඳීමද ඉගැන්වී. දෙහිවල දෙන් ජෝන් එදිරිසිංහ ගුරුවරයා ලවාද, ගල්කිස්සේ ප්‍රසිඛ ජෙෂ්ඨ ශාස්ත්‍රඥ (හැන්නැදියේ දුනියෙල් ප්‍රණාන්දු) තුමා අප්පු ගුරු මහතා ලවාද සිඛාභාෂාව සහ ගණිත ලිඛිතාදියද ඉගැන්වීය. පිරිමි දරුවන්ට සිඛාභාෂාව වලව්වේදීද, ඉංග්‍රීසි භාෂාව පාඨශාලාවලට යැවීමෙන්ද ඉගැන්වී. මේ කෙමෙන් ඇතට ප්‍රත්‍යන්තේ ඉගෙනීම් පමණක් දුර සමුදීවූ කල එඛගලනතයේ මහා ශාස්ත්‍ර ශාලාවලවද යැවීමෙන් උසස් ඉගෙනීම් ගෙණ දුන්නේය. තුමා අප්පු ගුරු මහතාගෙන් ශාස්ත්‍රාදග්‍රන්ථය ලැබූ මේ තුමාගේ ප්‍රිය දුහිතෘන් දෙදෙ නෙක් වන මාර්ත්‍රව් ෆ්‍රැන්සස් මේරි ද සොසිසා මහත්මිය විසින් හෙලදිව් බසින් කල "මුව කවුඩු සිවල් කථාව" සහ ජේන් මේරියා කැරොලසින් ද සොසිසා මහත්මිය විසින් කල ගජ සිවල් කථාව යන නාම ප්‍රබන්ධ පොත් දෙක ගැණ ලඬකාවාසි ගිහි පැවිදි උගතුන්ගෙන් මෙම මහත් මින් දෙපොල සත මෙතුමාත් ලැබූ ගරුබුහුමන් අප්‍රමාණ

බව ඉර සඳ මෙන් ඔප්පුවේ. * ලක්දිව සෙඬගල කාව්‍ය කාරියන්ගෙන් උතුම වූ හිඹුන මේ කාලයේ කාව්‍යකාරියන් දෙදෙනෙක් තම දරුවන් අතුරෙන් තනා සවී සෙඬගල ඝ්‍රන්ථ සවිප්‍රකාරයෙන් නිමිබු ලබාදීමෙන් සහ ගෘහ්‍ය දරුවන්ගේ ඉගෙණීමට මහත් ධෛර්‍ය්‍ය ගෙණදීමෙනුත් ක්‍රියා කළ මේ මැතිවරයා ගැන් වර්ණනා කිරීමට පැකිලෙන එකම නුවණැත්තෙක් ලක්දිව ඇතැයි නොසිතමු.

මෙයී කාව්‍ය පුසාක දෙන පිළිබඳව මෙතුමාට සහ පොත් කතෘවරියන්ට ලක්දිව නොයෙක් පලාත්වාසි විවසණ් ගිහි පැවිදි ජනතාවගෙන් ලැබුන පැසසුම් පිළිතුරු ගදෑ පදෑ වාක්‍යාදිය එකතුකොට පාණ්දුරේ රොමාතිස් පීරිස් වණ්ණකුලසූරිය ගුණවර්‍ධන මුදලිතුමා විසින් පොතක් මුද්‍රණයකර තිබෙන හෙයින් එයී ගදෑ පදෑදිය සම්පූර්ණයෙන් මීට එකතුකිරීම නවතා ප්‍රවෘත්ති පත්‍ර කතෘවරයින්ගේ මතයන් සහ ගිහි පැවිදි ප්‍රසිඬ පණ්ඩිතොත්තමයන් ප්‍රධානයොට ඇති මීට සම්බන්ධවූ නුදී ජනයාගේ නාමයන්ද මෙම පොතට අන්තර්ගත කෙළෙමු.

---

* ඒ කුරුඵ සන්දෙශයේ මේගැණ් මෙසේ කියාතිබේ.—

"උ ප දෙ ස නොදුහැ ගෙණ ඇදුරන් දුන් සිස ල
සි ස බ ස සතර නතු නතුලෙස දුන හිම ල
ස හ තො ස වැඩු පඬිදන මන වෙලඝ කු ල
ද ස දෙ ස පසිදු ඔබ දූ මැතිගින් දෙප ල

නගා දෙව බසින් හෙලදිව බසට සු දූ
රඟා මී සිහිරි නොට කව් කරණ ල දූ
මගා සත් නොදත් දුදනන් හැර අව් දූ
මගා ගිහි පැවිදි අපමන පඬින් වි දූ

අම්බ සතර වන වන අදරින් සෙ ව ව
නැම්ඹ පිළි ඇදුරු නැන සිඝ නද අ ව ව
කුම්බ යොගෙව් ජියගින් සත් සිදු ව ව
නම්බ අප්පු ගුරුමුදුන් අප වෙත එ ව

මුව කඹුඩු ඔවල් කථාව සහ ගජ ඔවල් කථාව.

හෙළදිව රුවන.

මෙහෙම් කව් පොත අපකරු එවන ලදින් සතුතියෙන් පිළිගනිමු. මෙම කථා දෙක කවිකර තිබෙන්නේ ප්‍රසිඛ ඛහවත් සි. එච. ද සොසිසා මහතාගේ දුවරු දෙදෙනෙක් විසින්ය. රෙමානිස් පිරිස් වණ්ඩුලසූරිය ගුණවර්ධන මුදලි තුමා විසින් මෙය අවවුග්ස්වනලදී. මුව කඹුඩු ඔවල් කථාව පදා 86 කි. ගජ ඔවල් කථාවේ පදා 67 කි. යථොක්ත කථා දෙක රසවත්ලෙස කවිකර තිබෙන බැව් පෙනේ. සිංහල ගෘහ්‍ය ලම්ඩින්ගේ සිංහල ශාසෙත්‍රාදග්‍රහණ යෙහි ආසාවැසිමට හෙතුතුත මෙම කාව්‍ය දෙක රචනා කළ මැනිනියන් දෙපොලට සතුති කරමහ.

———:o:———

මුව කඹුඩු ඔවල් කථාව සහ ගජ ඔවල් කථාව.

සත්‍ය සම්මවස.

සි. එච. ද සොසිසා සමාදාන විනිශ්චයකාර මහතුන්ගේ දුහිතෘ මැනිණින් දෙදෙනෙකුගේ විසින් සිංහල භාෂා බඛිනයෙන් රචනා කරණ ලද යථොක්ත කථා කාව්‍ය දෙක මුද්‍රාඛිකිත කරවන ලදින් අප වෙතද තෑගිවසයෙන් එවනුලැබී සම්මදරයෙන් පිළිගෙණ කියවා බැලිමු.

ප නා සුනත වැඩකළ වැස මහතු	න් ගේ
ඉ නා අපල බව පළවන මනර	න් ගේ
සිතා සතුටු ඵලවන ඇසු ඇසු ච	න් ගේ
කතා දෙක ලැබි නරඹා මන ර	න් ගේ
සැ ප න් පළබු දින රිවිසඳ අදුරු බ	ඳ
ඛ ල න් සතගෙ සිත දිනු සතුවවි නොම	ද
නොවැන් තිසනු වස් ඛස් වත් වත් පසි	ඳ
ම න න් සතුවනට මා පත්වූ බව	ද
දෙදිත් වැලුත් තිබි ගෙන ගුරුවරුන් හ	ව
ඛ ධින් ලබා ඉස ඉස කුමරිකන් හ	ව
ඵ ගන් වා සතර සත සුසිරින් රුව	ව
න මින් නව කිසන තිසු ලබනා දිග	ව ”

සිංහල ඉසුරුමතුන් විසින් ස්වභාෂා ශාස්ත්‍ර ගැණ නිරලයව විසීම හෙතුකොටගෙණ ස්වකීය ශාස්ත්‍රයන් පසුබස්නා මෙ කාලයෙහි යථොක්ත විනිශ්චයකාර මහතානන් විසින් තමන් දූදරුවන් ඒ ශාස්ත්‍ර ඉගෙණ්වෙහිද යොදවා මෙසේ පොත්පත් කාව්‍යාදිය රචනා කරණ පමණට පුහුණු කරවූ බව අප පුරාතන ශාස්ත්‍රයන්ගේ දියුණුවට අත්‍යන්තොපකාරයෙකි. ස්වදෙශ වාසීන්ගේ ශාස්ත්‍ර ගෞරවය සලකා මෙ කරණ ලද ක්‍රියාව අනිකුදු ඉසුරුමතුන් විසින් උපදෙස් කොට සැලකිය යුත්තකි.

ඉගෙණ්මෙහි යෙදී සිටින දූ දරුවන්ගේ මෙවැනි ශාස්ත්‍ර සම්බන්ධ ක්‍රියා දකින්ට ලැබීමද යථොක්ත මහතාණන්ගේ වාසනා ගුණයක් බැව් නිසැකය. මේ රචනාද මතු යහපත් කවිත්වයක් ඇතිවීමෙ ලකුණු වසයෙන් සැලකිය හැක්වෙ. මෙහි කාව්‍ය රචනාව කථා ව්‍යවහාර යට නොවෙනස් නොගැඹුරු වචන බහුල කොට ගලපා තිබෙ. එයින් කවි දෙකක් මෙහි දක්වමු.

"75. කි රෙ න දහස්වර දෙව්වෙද කළු අඟු ර
නොව න මෙමම සුදු දුදනන් ගති නොහැ ර
ව ස න බැවින් කළ උවරණ සිහි නොක ර
දූ රි න ඔවුන් හරිනට කිව් පඬිහු පෙ ර

62. ප ය ක ලුවත් මිණ අගයෙන් එමිණ ම ය
ඉ ස ක පැලැන්දත් විදුරු එසැටි ම ය
නොයෙක රස බසින් කීවත් ලෙස අ ම ය
නි සැ ක වම නොහිසිනුගෙ බස නරක ම ය"

ස්වදෙශ භාෂාදියෙහි වර්ධනය පතන සුදනන් විසින් මෙ රචනාද ප්‍රසංසනීය බැව් කියමු. කිසියම් ප්‍රමාද භ්‍රමාදියක් ඇතිවූවත් මෙහි ගුණ පක්ෂයට බාධක නොවේ. ශිල්ප ශාස්ත්‍ර වර්ධනාදි වශයෙන් ධන ශක්තියෙන් කටයුතුවූ නානාවිධ ලොකාර්ථ දායක ක්‍රියා සඳහා නිරන්තරෙද්‍යුක්තවූ සොයිසා මහතාණන්ට ස්වකීය පුත්‍ර වර්ගයාගේ ඥානාභිවෘද්ධිය මෙසේ මතු මතුත් ප්‍රීත්‍යාවහනය කෙරෙමින් දියුණු වේවයි ආශිංසනය කරමහ.

ලක්ඛිණී පහණ.

මුව කවුඩු ඔවල් කථාව හා ගජ ඔවල් කථාව.

ක්‍රිමින් සී. එච්. ද සොසිස මහත්ත්‍රිණිවරයානන්ගේ දුහිතෘවූ ඇම්. ප්‍රන්සිස් මෙරි සොසිස සහ ජේන් ඇම්. සී. ද සොසිස යන උත්තම කාන්තාවන් දෙපල විසින් අම්හැවෙන් කාව්‍ය පද්‍ය බන්ධනය කොට එකට අවවූ ගස්වහ ලද මේ කුඩා පොත් දෙක අපවෙතද ලැබී පිළිගත් බැව් පවිණක් පසුගිය පතුයේ සඳහන් කලාඇත. නමුත් යථාවකාශවශයෙන් පොත බැලූකල මේ පොත අදශයක්කොට පෙන්වා අප සඩජාතික තරුණියන්ට සතපත් උපදෙශයක් දිස හැකි බව පෙනිගිය බැවින් අප රටේ වසන ස්ත්‍රීන්ට ප්‍රයෝජනවත්වූ මේ වාක්‍යය ලියන්ට අදහස් කළෙමු. සිංහල අපි කලින්කලට ඔව්වූ කවිවි සහ ඔහොරි දෑමෙන්ද යෝමන් මලා සහ හැට්ට ඇදිමෙන්ද කලිසං කෝට් සහ සාය ගවුන් ඇදිමෙන්ද කිරි තෙල් එලවලු සහ හෝමස් මත්පැන් කෑම බීමෙන්ද තිදු ක්‍රිස්තියානි ආගම සහ බුඩාගම ඇදහිමෙන්ද යනාදින් ඇඳුම පැලඳුම කෑම පිව ආගම ඇදහිම ආදී සියලු සිරිත් චාරිත්‍රාදිය ඒ ඒ කලට පැමිණෙන පැමිණෙන පරදෙසින්ට අහුව යන්ට නිතාගණ කරගණ් එන්නෙමුස. දැනට උතුරුකොට සලකා භාවිතා කරණ සිරිත් ආගම් ආදිය එන සත වසියේදී පෙරළී පාප්තුමාට යටත්නැති අම්තු රෝමානු ආගම් හෝ මහමත් ආගම හෝ ඔවුන්ගේ සිරිත් හෝ විලිහැන්මට කාලයකුත් පැමිණෙන්ට පුළුවන. නමුත් අපේ කලු හමත් සිංහල ගතියත් භාෂාවත් කිසි කලක වෙනස්කරන්ට නුපුළුවන. කාලයට නිසි අන්දමට ආගම් ඇදහිම ආදියෙන් සිලාචාර වෙමුයසි කියනත් දැනට ලෝකෙ වසන මනුෂ්‍යයන් ජාතිවශයෙන් බෙදන කිසිවෙක් අපි ඉංග්‍රීසින්ටවත් ප්‍රන්ඤසින්ටවත් ජර්මන්වරුන්ටවත්

චීනුන්ටවත් වෙනයම ජාතියකටවත් ඇතුලත් නො කෙරෙයි. කොපමණ සිරිත් චාරිත්‍රාදියෙන් අමුතු වෙස් පෙන්නුවත් අපි බෙදෙන්නේ සිංහල ජාතියටයි. සිය ජාතියකට අයිති නැති ජාති භ්‍රෂ්ට මනුෂ්‍ය වර්ග කොයිරට වලත් පරදෙශින්ගේ හැසිරීමෙන් බෝවී සිටිනත් මනු නීති ආදී පුරාණ ශාස්ත්‍රවල ක්‍රමයට ඔවුන් මනුෂ්‍යාධම යෝ බව ඔප්පුවෙයි. දැනට වසන පොහොසත් සිංහල පවුලක ඇද නැතුව සිංහල කථාකරන්ටවත් කියවන්ට වත් ලියන්ටවත් පුළුවන් ගෑනුකෙනෙක් තබා පිරිමි යෙක්වත් සොයාගැනීම උගහටයි. වැදගත්ය කියන සිංහල පවුල් කීපෙක ගෘහමූලිකයෝ ඔවුන්ගේ දූදරුවන්ට සිංහල ප්‍රවෘත්තිපත්‍රයක් පොතක් පතක් කියවන්ට තහනම්කර තිබෙන බවද නිතර ඉංග්‍රීසියෙන්ම කියවන්ට නියමකර තිබෙන බවද විලිලජ්ජා නැතුව අප සමගත් කී බව මතකයි. සමහර සිංහල මහත්වරු කථාකරගණ අවුත් අහවල්එකේ නම මට ඉංග්‍රීසියෙන් මිස සිංහලෙන් කියන්ට නුපුළුවනැයි කී බවත් මතකයි. සිංහල මහත්වරු ලියන ලියුම්වලත් "ඌරට මරාපන්" "උඹට බලන්ට ආවා" "කරත්තෙට අස්පයා දමාපන්" යනාදි ආයා වරුන්ගේ භාෂාවෙන් ලියා තිබුනාත් මතකයි. ලේ උරුම යෙන් අයිතිවූ සිංහල භාෂාවෙන් ලියකියමන නුගත් ඔවුන් පරභාෂාවකින් නිවරැදිව ලියකියනවාය යන කීම අදහන්ට නුපුළුවන. රජවාසලද උසාවි කච්චේරි වලද භාෂා පරිවර්තනයකිරීමට පත්ව සිටින තෝල්ක මුදලි වරු ඒ ඒ තැන්වල පාවිච්චි කරණ කණවැන්දුම් ගෑණු භාෂාව කීපවරක් අසා බලා සිට පුදුමවීමු. අනිත්අය කොහොමවුවත් ඔවුන්වත් නිවරදි භාෂාව දැන ඉගෙණ ගන්ට එපාද? මෙ අන්දමට ස්වකීය භාෂාව පහත් බැස ගණ යන්නාවූ මෙ කාලයේදී ධනවත් පැණවත් සොයිස මන්ත්‍රීශ්වරයානෝ පමණනැති ගම්බිම් කෙත්වත් දැසිදස් රන්රුවන් මුතු මැණික් යානවාහන ඇත් අස් ගව මහිස ගේදොර යනාදි සවිඤ්ඤාණක අවිඤ්ඤාණ උපභොග පරිභොග සම්පත් ලබා එසේම ධන්‍ය පුණ්‍ය ලක්ෂණවතාන

හෙතුසම්පන්න දු දරු සම්පතුත් ලබා ඒ දු දරුවන්ටද ඔවුහොවුන්ට නිසි නිසි ශිල්ප ශාස්ත්‍ර පුරුදු පුහුණු කරවීමට දහස්ගණන් වියතු විසදූ සුරෝපාදි රටවලට පවා පිටත්කර හැර සත්‍රින්ට සුදුසු ශිල්ප ශාස්ත්‍රාදිය උගැන්වීමට සැකිය වලව්වටම ගුරුවරු ගණනක් හෙන්වා පඩිනඩි දෙමින් දු දරුවන් මනාසේ ශාස්ත්‍රයෙහි හික්මවන බව දනිමු. ඒ දු දරුවෝද අපි සියලු සැපයින් ආසීනයයි සිත් උඩඳු නොවී ඉතා දුප්පත් කුලයක දුදරුවෝ එසිත් ජීවිකාව සපයන අදහසින් බලවත් දුකින් ශාස්ත්‍රාභ්‍යාස කරන්නාක්මෙන් අනලස්ව ඉගෙණගන්නා බවද දනිමු. සොඬිස මැතිතුමනෝ මුලු ලංකාව අත්පත්වූ ධනවතෙකු වුවත් උන්නාන්සේගේ ඇවැමෙන් ඒ වැයතුව අසිරිවෙන්නාවූ දු දරුවෝ නුගත් අලසයෝව සිටියොත් ඔය සම්පත් මසක වියදම්වවත් නොපොහොනේය. පුරාණ ලංකාවෙ සිටි සම්භර මහ ධනවතුන්ගේ දු දරුවෝ මෝඩයෝව සිටි බැවින් ඒ මහ ධනය ඔවුන්ගේ ජීවිකාවට මදිව මංමාවත්වල සිහාකෑසැවි උදුහරණ සිංහයකින් බිප්පුදියහැකි නුමුත් ලියුම දිස්වන බැවින් නොලියමු. නමාගේ ශරීරයෙන් පිටත්ගි තිබෙන සියලු වැතුව හැටිකලම රාජවොර අග්නි ශත්‍රු උදක යන භය පසෙකට යවන්වෙයි. පඩුවම් කෙල ලක්ෂ ගණන් වවිනා පොල්වතු කුඹුරු ගේදොර බඩුබාහිරා ආදිය එක මොහොතකදී කිණිහෙණ හෝ වතුරට යටවී හෝ විනාශවිය හැකිය. රාජපරාධයකට අසුවීමෙන් හෝ සතුරු රජෙක් පැමිනීමෙන් හෝ එසේම විනාසවිය හැකිය. බලවත් සතුරෙක් හෝ සොරෙක් හෝ ඒසිතුත් එසේම කළ හැකිය. එබඳු විපත්තිවලින් මනුෂ්‍ය ජීවිතය මිදී නැති බැවින් සම්භරවිට රොස්චයිල්ඩ් ආදී මහධන සිටුවරු පවා හෙට සිහන්නෙක් වය කැකිය. සම අනුමකින් එබඳු විපතක් පැමිණි කල්හි ශාස්ත්‍රඥයන් අයට නම ඒ විසතුව සහමුලින්ම අත්හැර අන් රටක ගොස් ජීවත්වෙන්ටද නැවත ධනවතාවීමටද පුළුවන. එබැවින් පුරාණ පණ්ඩිතයන් විසින් "උගතමනා සිල්පසාසි මතුරූතෙනා" යනාදීන් වර්ණනා කරණ ලද්දේයි.

ඒ ක්‍රමයට අනුව ගොස් අප සොයිස මහත්තෙරයානෝ විසිනුදු සඩකිය දූ දරුවන්ව මතු රැකීම විශේෂ වෙතුවට වඩා ශාසනු උගන්වාදෙන බව දැක අතිශයින්ම ප්‍රීතිවිමු. සමහර වෝඩ මව්පියෝ පිරිමි දරුවන්ට මුත් ගෑණු දරුවන්ට උගන්වන්නේ කුමටදැයි සිතන නමුත් ඉඤ්ජියාදි රටවල ශ්‍රේෂ්ඨ කනිෂ්ඨ පණ්ඩිත ස්ත්‍රීන් විසූ බව පෙනේ. නොදෙක් ශාසනුවලට අයිති බොහෝ පොත් ඉඤ්ජියාවේ බ්‍රහ්මණ ස්ත්‍රීන් විසින් කරණලද බවද විභත්‍යර්ථය පරමාර්ථ ඕන්දුව යනාදි නොයෙක් පොත් බුරුමරටේ උගත් ස්ත්‍රීන් විසින් කළ බවද අපේ ලංකාවෙද උලකුඩය දේවී ලිලාවති බිසව මැනික්සාමි ගජමන්නෝනා යනාදි ප්‍රසිද්ධ පොත් කනිෂ්ඨ ස්ත්‍රීන් විසූ බවද යුරොපිය රටවල දැනටම නොයෙක් ශාස්ත්‍ර උගත් දහස් ගණන් ස්ත්‍රීන් වසන බවද ලංකාවට පවා පැමිණි බලුවැස්සී නම් රුසියන් ස්ත්‍රී ප්‍රසිද්ධ ග්‍රන්ථ කීපයක් කළ බවද පෙණෙන බැවින් ස්ත්‍රීන්වද ශාස්ත්‍ර උගැන්වීය යුතු බවම පෙනේ. මේ කුඩා කවිපොත් දෙක ගැන මෙබදු වාක්‍යයක් ලියන්ට අදහස්කළේ ඒ කාර්‍ය ගුණයක් ප්‍රකාශ කරගූ කැමැත්තෙන් නොව මේ සිව්මැලි තරුණ ගෑණු මහත්තැන් දෙපල විසින් කරණලද සුරතල් ක්‍රියාවත් විසියත් ලොකයාට පෙන්වා සියලු ස්ත්‍රීන්ගේ සිත් ශාස්ත්‍ර ඉගෙන්මෙහි ඇලවීම පිණිස බව සැලකිය යුතුයි. මෙතරම යහපත් ක්‍රියා ගැන නිතර උත්සාහ වඩන්නාවූ අප සොයිස මැතිතුමාණන්ටද අනලස්ව උගන්වන ගුරුවරුන්වද අනේකවාරයක් සතුති කරමු

———:o:———

දිනකර ප්‍රකාශය.

මුව කමුඹු සිවල් කථාව සහ නත සිවල් කථාව.

මෙතෙක් පොත ලැබී කියවා බලා සතුටින් පිළිගනිමු. මේහි පෙණෙන මුව කමුඹු සිවල් කථාව තිත්තොපදේශයෙන් ගෙණ ඇත. ප්‍රන්සිස් මේරි සොයිසා නෝනා මහත්මයා

එයින්ද දෙවෙනි ගජ සිවල් කථාව එම පොතෙන් ගෙණ පේන් ඇති. සි. ද සොයිසා තෝනා මහත්මයා විසින්ද තමන් ආචාර්ය ගල්කිස්සේ තමන්ගේ අප්පා ගුරුතුමාගේ ආරාධනාව පිළිගෙණ කවිකරණ ලද බැව් පෙණේ.

සිංහල තරුණියන් පෙරදිග ශාස්ත්‍ර ඉගෙණීමෙහි ප්‍රලොභ කරවීම මෙහි පළමුවෙනි අදහසයයි හඟිමු. මේ පොත් විකුණ මොරටුවේ මිතුරු සමාගමට උදව්කෙරීම දෙවෙනි අදහස බැව් පෙණේ.

මෙහි කථා ශරීරය නම් මගධ දෙශයෙහි චම්පකාවත්ත නම් වනයෙහි මුවෙක් හා කවුඩෙක් බොහෝ කාලයක පටන් මහත් සෙනහයෙන් වෙසෙසි එක්තරා සිවලෙක් ඒ මුවා දැක උගේ මස් කනු කැමතිව පළමුකොට විශ්වාසය උපදවා රවටා ගණ්මැසි සිතා ඔහු අභිමුඛයට පැමිණ නුඹට මඩහල්‍යයක් වේවයි කීය. තෝ කවරෙක්දැයි ඇසූ කල මම ඍෂ්‍යබුබු නම් සිවලෙක්මි. නෑයෙක් නැති මම මේ වනයෙහි මළඑකෙක් මෙන් වසමි. දැන් තාකරා එලඹ නැවත ජීවත්වීම නම් ලොකයට ඇතුල්වූයේ වෙමි. යනාදිය කියා මිත්‍රභාවය හඟවා සවස්වේලෙහි ඔහු දෙදෙන මුවාගේ වාසස්ථානයට ගියෝය. එහි සපුගසක සුබුඹි නම් කවුඩා වෙසෙසි. කවුඩු නෙමේ සිවලා දැක මිත්‍රය කරුණක් නැතිව එන්නා හා සමග මිත්‍රවීම නපුරුයි කීය. එකල සිවලා රොස්ව කවුඩාට බැන වැදුනේය. මේ දෙදෙනා බහින්බස්ව ඩබරකරණ කල්හි මුවා එය සමාදානකර වසනාකල්හි සිවලා මුවා කැඳවාගෙණ ගොස් ගොයම් කෙතක් පෙන්නීය. ගොවියා ගොයම් කන මුවා දැක ඔහු ඇල්ලීමට පාසයක් යෙදීය. දවසක්දා ඒ මලෙහි මුවා බැඳුනේය. සිවලා එහි පැමිණ සිතන්නේ අද මගේ අභිමතාර්ථය සිදුවිය. මොහුගේ මාංස හා ලේ තැවරුණාවූ ඇට මට ඉතින් ලැබෙයයි සිතීය. මුවාද මිත්‍රය මේ බන්ධනය කපා මා රැකගණුවයි කීය. සිවලාද මිත්‍රය නහර වලින් කරණ ලද මේ රැහැන් අද ඉරිදා මා විසින් කැපීම

නුසුදුසුය. හෙට තා කී දෙයක් කරන්නෙමියි කීය. සවස් භාගයෙහි වාසස්ථානයෙහි මුවා දකින්ට නොලැබ කවුඩා තැනින්තැන සොයා ගොස් බඹිනයට අසුවූ මුවා දැක මේ කිමෙක්දැයි ඇසූ කල්හි මිත්‍රයා මේ නුබේ මිත්‍ර වාක්‍යය පිළි නොගැණීමේ ඵලයයි කීය. ඒ වචනකාර සිවලා දැන් කොයිදැයි කවුඩා ඇසුකල්හි මගේ මස් කැමැත්තෙන් මෙහිම සිටිනේයයි මුවා කීය. උදය කාලයෙහි ගොවියා පොල්ලකුත් කරතබාගෙන එන බව කවුඩා දැක මුවාට කියන්නේ මිත්‍රය උඹ මළුඑකෙක්මෙන් වාතයෙන් බඩ පුරුවාගෙණ අත් දරදඬුමෙන් තබාගෙණ සිටුව මම තාගේ ඇසෙහි කොට කොටා සිටිමි. මා විසින් යම් විටක ශබ්ද පැවැත්තු කල්හි තෝ නැගිට දුවවයි කීය. ගොවියාද ඇවිත් බලා ආඃ තමාම මළේදැයි කියා සතුටුව බඹිනය මුදා රැහැන ඇකිලීමට මදක් දුරුවූ කල්හි කවුඩා ශබ්ද පැවැත්විය. එකනෙහිම මුවා නැගිට දිව්ය. දුවන මුවාදැක ගොවියා තෝපයෙන් පොල්ල දමා ගැසිය. ඒ පොළුපාර සිවලාට වැදී ඔහු මළේය.

———:o:———

ගජ සිවල් කථාව.

———

බ්‍රහ්ම වනයෙහි කර්පූරතිලක නම් ඇතෙක් වෙසෙයි. ඒ ඇතා බලා සියලු සිවල්ලු සිතන්නෝ මේතෙමේ කිසි යම් උපායකින් ඉදින් මරණු ලබන්නේනම් එකල්හි මොහුගේ ශරීරයෙන් අපට සාර මසකට කැමති පරිද්දෙන් අහාරය වන්නේය. පසුව ඔවුන් අතුරෙන් එක් මහලු සිවලෙක් මා විසින් ප්‍රඥුබුඩි නේජසින් මොහුගේ මරණය සිඹකටයුතු යයි ප්‍රතිඥකොට කර්පූරතිලකයාවෙත පැමිණ අටඟ පිහිටුවා නමස්කාරකොට දෙවියන්වහන්ස බැලීම ප්‍රසන්න කෙරේවයි කීයේය. තෝ කවරෙක්ද කොතනින් ආයෙහි දැයි ඇතා ඇසිය. සිවලා කියන්නේ මම සිවලෙක්මි. වනයෙහි වසන්නාවූ සියලු සිව්පාවුන් විසින් නුඹවහන්සේ ගේ සමීපයට පිටත්කර එවන ලද්දෙමි. රජෙක් නැතුව

සිටීම යුසුදුසු හෙයින් සියලු ස්වාමි ගුණයෙන් යුක්තවූ පින්වත්තෙම අභිශෙක කිරීම නියමකරණ ලද්දේය. සුබ මොහොත ගතවෙන්ට මත්තෙන් වහා එනු ලැබෙවයි කියා තැගිව ගියේය. රාජ්‍ය ලොභයෙන් කර්පූරතිලකා ඇදී සිවලා විසින් දක්වන මාගියෙන් දුවන්නේ මහ මඩෙහි ගිලුණේය. එකල හස්තියා විසින් සහලු සිවල දුන් කුමක් කටයුතුද මම මහත් මඩෙහි ගිලුනෙම්යි කියන ලද්දේය. සිවලා කියන්නේ දෙවයන්වහන්ස මගේ වල්ගේ අග එල්ලී නැගී සිටිය මැනව. නුඹවහන්සේ මගේ වචනය කෙරෙහි විශ්වාස කරණ ලද්දේද මෙ ඒ විශ්වාසයාගේ ඵලයයි සිතායි කීය. මහ මඩෙහි ගිලුනු හස්තිතෙම සිවලුන් විසින් කනලද්දේය.

වැලිගම සුමඞ්ගල තෙරුන්නාන්සේ විසින් ලියනලද හිතොපදෙශ සන්නයෙන් මදක් සංක්‍ෂෙපකොට ලියන ලද මෙ මෙහි කථාශරීරයයි.

මෙහි කථාවල් දක්වා ඉන්පසු හොඳ ගුණදහම්මැති කම් ඇති කවි බොහෝ ගණනක් යොදා තිබෙන්නා. මෙව්‍යයේ ස්වභාව දක්වන පිණිස කවියක් දෙකක් තෝරාහැර දක්වන්නෙමු.

කිපුම ද බොරුකීම රහසෙලි කිරීම ද
නපුර ද සලි නොහෙක් දේ නිති ඉල්ලුම ද
සැලුම ද සිත සුදු කේලියට බැඳීම ද
දනු සොඳ මිතුරු යෙලෙසයි මෙසතින් නිබ ද

ලඟ දී පිය වදන් කියමින් සතුටුකො ට
පිට දී නපුරු කරණා දන පැමිණි වි ට
නොමදී විස පුරා දී ලු කට ලහ ට
දුර දී හරිනු කලයක් මෙන් නියම තො ට

බාල දරුවන් හික්මවීමට සුදුසු මෙ ආදි ගුරුකම් මෙති බොහෝය. සිංහල භාෂාවෙන් මෙ තරම කවි කෙරීමට උගත් මෙ නෝනා මහත්වරු දෙපලගේ උත්සාහය ගැණ අපි මහත්සේ සතුටුවෙමු. සිංහල ගෑනුලමෝ මෙය ආදර්ශකොටගෙණ උත්සාහ දරතැයි විශ්වාස කරමු.

මේ කාලයේදී අව්‌වුහසා ප්‍රසිද්ධතරම් නොහෝ පොත් බාල දරුවන්ගේ අතට දීමට නොහෝදෙනා සැකකරති. කුමක්හෙයින්දයත් එහි සිත් දූෂණය කිරීමින් නොහෝ බැවිනි. නමුත් මේ පොත කිසි සැකයක් නොසොව බාල දරුවන් අතට දෙතබාකි බැවින් ඒ ගැන සතුටුවෙමු. වසතුවෙන් ආඪ්‍යවූ සොඩිසා මහත්මියාගේ දරුවන් එයින් මත්වෙන්ට නොදී ශාසනය අතට සිත් නමවා ක්‍රියාකර ගැන්මද සුලුපටු වැඩක් නොවන බැවි කියමින්ම මෙසද අපරට ජනයාට හොඳ ආදර්ශයක් බැවි කියමු.

මෙවැනි යහපත් වැඩවල නියුක්තවූවන්ගේ සිත්වලට ධෛර්‍යදීමම අපේ සුතුකමයයි සිතමු. එහෙත් මතු වැඩවන පිණිස දුටු වරදක් නොකියා සිටීමත් සුදු නොවේ.

"ඔවුන හවුපදෙස් දීමද යලි සෙවන" යනාදි මේ පොතේ සම්භර තැනක අම්හිරි සඤ්ඤි පෙණේ. එවා එයේ නොගැලපුවා නම් රුචියි. "මෙලෙසට ගයි නිවන් දුදනන් හට නදින" යනමේ ආදි ඇතම් තැනක අප්‍රිය වැයිහිබේ. "නොබසට කළ නදර" යන මේහි සබඳ විඛයින් යෙදුවමනා තැන "නො" යන පෙරවිඛත යොදු තිබේ. පොත නැවත අව්‌වුහස්වනවිට මේ ආදිය ශුඛ කටයුතුයි. මෙසේ සැලප දෙස් තිබෙතත් පළමුවෙන්ම කළ මේ පොත මෙතරම ශුභියක් ඇතුව කරතිබෙනවා දැක්ම සැබවින්ම අපට මහත් ප්‍රීතියකි.

——:o:——

සරසවි සඳරැස.

මුල් කවුඩු ඕවල් කථාව සහ ගජ ඕවල් කථාව.

ඇම්. ප්‍රන්සිස් මෙරි සොඩිසා නෝනා මහත්මයා විසින් කාව්‍ය හාෂාවෙන් ගළපන ලද මුව කවුඩු ඕවල් කථාවද, ජේන් ඇම්. සි. ද සොඩිසා නෝනා මහත්මයා

විසින් කාව්‍ය භාෂාවෙන් ගළපන ලද ගජ සිවල් කථාවද සහ ග්‍රන්ථ දෙක එකට යොදූ රොමානිස් පීරිස් වණ්ණ කුලසූරිය ගුණවර්ධන මුදලිතුමා විසින් එක පොතක් වශයෙන් මුද්‍රණය කරවා තිබේ. මෙයින් පිටපතක් අප කරද එවන ලදින් බැලිමු. කාව්‍ය භාෂාවට ගළපන ලද මෙම කථා දෙක විඝඤ්ඡමීන් පණිවරයා විසින් තිලොපදේශයෙහි යොදූ තිබෙන දැහැනත කථා දෙකකි. මේ කථා දෙක කවියට නගා තවත් තිලොපදේශ පංචතන්ත්‍ර කාව්‍ය සඩ්ග්‍රහාදියෙහි පෙළෙන ඉතා වැදගත් උපදෙස රාශියක්ද අන්තර්ගතකොට පොත් ගළපා තිබේ.

මෙහි ඇතුල්කර තිබෙන උපදෙශවලින් බොහෝසේ ප්‍රකාශවෙන්නේ සන්මිත්‍ර සංසර්ගයෙහි යහපතත් පාපමිත්‍ර සංසර්ගයෙහි අයහපතත් යන දෙකයි. මේ දෙයම ඉතා වැදගත් කරුණකි බව කියන්ට ඕනෑ නෑ. සංස්කෘත ශ්ලෝකයන්හි විද්‍යමාන අභිප්‍රාය සම්හර කාව්‍යවලට සම්පූර්ණයෙන්ම අනන්තර්ගත වී තිබේ. ඇතැම් තැන්වල අසම්පූර්ණවද පෙනේ.

උපදෙශොහි මූර්ඛානාං
ප්‍රකොපාය නශාන්තයෙ
පයඃ පානං භුජඩ්ගානාං
කෙවලං විෂ වර්ධනම්

සතමෙ ශ්ලෝකයෙහි අභිප්‍රාය මෙහි පහත දක්වන සවිසෙකි පෙනේ.

78. දු ද න හට නොඇසු උපදෙස් දුන දෙව නු
කිපෙන මුත් නොවේ සන්සුන් ගති දරු නු
කිරෙන පනිදු විස වැඩි වන ලෙසම ව නු
එ සි න දුදනගෙන් වෙන්වීම නිවස නු

විද්‍ය විවාදය ධනංච මදය
ශක්තිඃ පරෙෂාං පරිපීඩ නාය
ඛලස්‍ය සාධෝර් විපරීත මෙතත්
ඥානාය දානාය ච රක්ෂණාය.

දුර්ජනයාට ලැබෙන විද්‍යාව අනුන් සමඟ වාද කරන්න පිණිස්සත් ධනය මදය හෙවත් උඩඟුවීම පිණිස්සත් ශක්තිය අනුන්ට හිරිහැර කරන්න පිණිස්සත් පවතී, නමුත් මේවා සත්පුරුෂයාට පිහිටියේනම් ඊට විපරීත ගුණ ඇතිවේයි. එනම් සත්පුරුෂයාගේ විද්‍යාභාශය ඥානවර්ධනය පිණිස්සත් ධනය අනුන්ට දෙන පිණිස්සත් ශක්තිය අනුන් රක්ෂාකර ගැනීම පිණිස්සත් පවතී යන ශ්ලෝකාර්ථයි.

80. දුද න හුගෙ සතර වේ දබර පිණි ස ස
ඔද පිණිසද දනය ගතබල වියේ ස ස
තද ලෙස වේය වෙන අය පෙලෙන පිණි ස ස
සුද නව ලැබුනු මෙම දේ ඒයලු යස ස ස

මේ කවියද යට දැක්වූ ශ්ලෝකය උපදෙශ කරගෙන ගලපනලද්දකැයි හැඟේ, නමුත් ශ්ලෝකයේ සතරවැනි පාදයෙහි අභිප්‍රාය කවියෙහි නොයෙදුනේය.

ව්‍යවහාර භාෂාවට ඉතා ආසන්නවනසේ පොත් ගළපා තිබෙන බැවින් මෙහි තිබෙන බොහෝ උපදෙශ ලොක යාට පහසුවෙන් වැටහේයයි සිතමු. ඇතම් නැනක අනු චින යෙදීම් පෙණේනත් කවි භාවයෙහි ඇති ගම්භීරත්වයත් බාලපරයෙහි පිහිටි සත්‍රීන්ගේ ඥානයත් ගැන සිතාබලන විට මේ තරුණ නෝනා මහත්තැන් දෙදෙනාගේ පරිශ්‍රම යට සතුතිකිරීම වටනේය.

මේ ග්‍රන්ථ කතෘවරුන්වන තරුණ නෝනා මහත්තැන් දෙදෙන ධනවත් සොයිසා මහතාගේ දියනියෝයි. තවමි අප්පු ගුරුන්නාන්සේ මහත්මයා විසින් ශාස්ත්‍රාවබෝධ කරවනු ලැබූ අයයි.

පොත ගැලපීමේ අරමය තරුණියන්ට සිංහල ශාස්ත්‍රාව බෝධයට ධෛර්‍යවිදීම බව කියාතිබේ. මේබඳු පොහොසත් තරුණ නෝනා මහත්තැන් සිංහල ඉගෙණ එයින් ක්‍රියා කරන්නේ දැකීම වෙන සත්‍රීන්ටත් ශාස්ත්‍රා ඉගෙණීමෙහි රුචිය ඉපදීමට හේතුවීම නිසැකයි. පොහොසත් වීමෙන්ද නිලතලවලින්ද උසස් බවට පැමිණෙන මහත්තැන් වෙනිය

දරුමල්ලන්ට සිංහල ඉගැන්වීමෙහි නිරුත්සාහයට පැමිණෙන මේ කාලයේ ඔවුන්ට ආදර්ශයක් වශයෙන් ක්‍රියා කරණ ධනවත් සොයිසා මහතාට සතුටින් පසසමු. මේ පොත විකිණීමෙන් ලැබෙන මුදල මොරටුවේ මිතුරු සමාගමට පරිත්‍යාග කරණ බව කියා තිබේ. එබැවින් පොත මිලදී ගැණීම ස්වකීය දරුමල්ලන්ට සිංහල ඉගෙණීමෙහි ආශාව ඉපදීමට පමණක් නොව අනාථ ජනයාට පිහිටවූ මිතුරු සමාගමේ අරමුදල වැඩිවීමටද හේතුවේ.

———:o:———

ග්‍රන්ථ ප්‍රදීපය.

මුව කවුඩු සිවල් කථාව සහ ගජ සිවල් කථාව.

සී. එච්. ද සොයිසා සමාදාන විනිශ්චයකාර තැනගේ දියණියන් දෙදෙනෙක්වූ ඇම්. ප්‍රන්සිස් මේරි ද සොයිසා සහ ජේන් ඇම්. සී. ද සොයිසා නම් මැතිනියන් දෙපල විසින් සිංහල භාෂාවෙන් කාව්‍ය බන්ධනය කරණ ලද ඉහත නම් පෙණෙන කථා දෙක අන්තර්ගතවූ පොතෙන් පිටපතක් අපවෙත ත්‍යාගීකර එවනු ලදුව එය ඉතා සතුටියෙන් පිළිගතිමු. මෙම පොත අපට ලැබී සති ස්වල්පයක් ගතවෙනතුරු එය සම්පූර්ණයෙන් කියවා බලා අප අදහස් ප්‍රකාශකරන්ට අපට අවකාශ නොලැබුනාට කණගාටු වෙමු. කාටත් පිළිගතයුතු අවවාද රාශියක් එම පොතේ අඩංගු බව දැක සතුටුවෙන අතර එවැනිවූ ප්‍රකරණයක් සිංහල සමූහයාට සම්පාදනය කරදුන් පොත් කතෘන්ටද සිංහල ශාස්ත්‍රය සහ කාව්‍ය ශාස්ත්‍රයත් ඔපමණ දුරට සිංහල නෝනා මහත්වරු දෙදෙනෙකුට අවබොධ කළ තම්බි අප්පු ගුරුතුමාටත් සතුති කටයුතු බව මෙහි සඳහන් කරමු. කථාදෙකෙන් පලමු සඳහන්කල කථාව නම් මුවෙක් සහ කවුඩෙක් හොඳින් මිත්‍රව සිටියවිට

මුවාට අනතුරුකරන්ට ආ ගිවලෙක් කාළ පිත්ත දෝෂය කමක් ගැන උපමාවක්ය. ඒම කථාව කවි 48 කින් නිමකර මිනුකම පැවැත්ම සහ මිනුසින් තෝරාගැනීමට අවවාද වශයෙන් කවි 37 ක් අඩංගුකරතිබේ. ඒම ප්‍රයෝජනවත් අවවාද සහ කාව්‍යන්වල සුභාවත් අප කියවන්නන්ට තේරුම් යන පිණිස එයින් කවි තුනක් මෙහි පහත දක්වමු.

මිහිරි න මුත් සීතලවූ හොඳ වතු ර
ගිනි වෙන පත් කල වන විලසින් රුදු ර
දැන යහ පත් දුදනන් සෙවනෙන් නපු ර
වන බැවි නුත් නපුරන් හළ මැනවි දු ර

කරු නක් නැතුව ආයෙද මිතුරු වීම ව
සරු ඇති ලෙසින් කීවෙද බස් සතුවු තො ව
දරු ගුණ නැති ඔහුව උත්පතයක් ලෙස ව
දුරු කරණුව නුවන ඇති අය එවිහස ව

නැත ලොව උදුවවක් නැති ජනයෙක් කිසි ම
ඇත මිදු වරදු යහපත් හුගෙදු ඒලෙස ම
සත හොඳ නොහොඳ බලමින් නිසිසෙ වැඩි කම ම
ඉත කරගණුව සුදනනි ගුණදිස අය ම

පොතේ සඳහන්වූ දෙවෙනි කථාව නම් උපා දැක්ම මහඵ සිවලෙක් විසින් බලසම්පන්න ඇතෙක් මරුමුවට පත්කළ අඳුම පෙන්වා දෙනලද උපමාවක්ය. කථාව කවි 23 කින් නිමකර අවවාද සහිත කවි 41 ක් ගොනා තිබේ, ඒම අවවාදවල සුභාව අප කියවන්නන්ට තේරුම් යන පිණිස එයින් කවි දෙකක් මෙහි පහත දක්වමු.

දුදනන් සෙවුන වෙසි සැම විපතට දෙ ස ය
සුදනන් සෙවුන සුබ සිරි දෙසි විසේ ස ය
මෙලෙස්න් තිබෙන බව දැනැ පෙර පඬි බ ස ය
සතතින් කරව සුදනන් සහ නවා ස ය

ල හ දී පියා වදන් කියමින් සතුටුකොට
පි ව දී නපුරු කරණා දන පැමිණ වී
හෙමි දී විසපුරා දී එෑ කට ලඟ
දු ර දී හරිඤ්ඤ කලයක් මෙන් නියම යොදා

මෙම පොත සිංහල තරුණියන්ට අදහස්කර යොදු යුබෙහා එකක් බව පොතේ අනුගම්පවේ තිබෙන 65 වෙනි කවියෙන් පෙනේ. නමුත් එසින් සිංහල තරුණියන්ට පමණක් නොව සෑම තරම තිරම වල ස්ත්‍රී පුරුෂයන්ට ප්‍රයෝජන ලබන්ට හැකි වෙයයි සිතමු. මේ කාලයේදී සිංහල තරුණියන් විසින් මේ අනුමේ සමාවලෙස ප්‍රබන්ධකර තිබෙනවා දැකීම සිංහල පොදු ජනයාටම නඹුවක් බව කියමු. ඒරෝපාකරේ ස්ත්‍රීහු විසින් ඉතා ප්‍රයෝජන පොත්පත් ලියා ප්‍රසිඛ කරණ මේ කාලයේ සිංහල මැතිනියන්ද සිය බසින් රසවත් ලියවිලි ප්‍රසිඛ කරණවා දැකීම සතුටක් බව කියන අතරම සිංහල ස්ත්‍රීන් අතරේ පොත් කතිෑන් බොහෝ දෙනෙක් සම්භ වෙන්ට හැකි කාලය වඩා ඈත් නොවේවයි ප්‍රාර්ථනා කරමු.

———:o:———

පිටුර ය.

මුව කවුඩු සිවල් කථාව සහ ගජ සිවල් කථාව.

නෛකත්‍රීන් විරාජමානවූ සි. එච්. ද සොසිසා ස්මාඳුන විනිශ්චයකාර තුමාගේ ධිතෘන් දෙදෙනෙක් වන ඇම්. ප්‍රන්ඩිස් ටෙරි සොසිසා සහ ජේන් ඇම්. සි. ද සොසිසා යන තරුණ කුමරියන් දෙදෙනා විසින් අඟිනව කවි කරණලද මුව කවුඩු සිවල් කථාව සහ ගජ සිවල් කථාව යන පොත් දෙක එකට බැඳ අප වෙත තෑගිකර එවා තිබෙයි. අප විසින් ඒ පොත් දෙක ඉතා සතුටින් විදිගෙණ මුවේශමෙන් කියවා බැලුවෙමු. බාල වයසේ

කුමරියන් දෙදෙනෙක් විසින් මේ වර්තමාන කාලයෙහි සිංහල භාෂා රීතියට සහ ව්‍යාකරණ ක්‍රම වලවත් එකඟ වෙන ලෙස මේ පොත් දෙකේ කවි ගළපා තිබෙන අඳුම ඉතාම කදිමයි. වැඩිකොටම මේ වැඩේට ප්‍රසන්සා කරන්ට සෑහෙන්නේ ලාබාල වයසේදී සිංහල අකුරු සහ භාෂාව හොඳ ලෙස ඉගෙණගෙන මෙබඳු වැඩක් කළ එකටයි. තවද මේ පොත් දෙකේ කවිවල භාෂාරීතිය එක අඳුම කටම තිබෙන නිසා මේ දෙදෙනා විසින්ම මේ පොත් දෙක කළ බවට එක වැදගත් සාක්ෂියක්ය. සමහර පොත් අඳුන්ලවා කරවාගෙණ වෙන වෙන අයගේ නම් දමා හෙණ අවවුගස්වා ප්‍රසිද්ධකර තිබෙනවා අපට බොහෝසේ දකින්ට ලැබුනාය. එබඳු පොත්වල හිහරකාත් ඵලහරකාත් එතට ඈදුවා වාගේ හොඳ නරක කවි සොලෝකාදිය තිබුනා සත්තසකය. මේ පොත් දෙකේ එබඳු වෙනස්කම් ඇත්තේම නැත. සියළු කවිම එක විදියට යොදලා තිබෙයි. නමුත් පොත් දෙක දෙදෙනෙක් විසින් කළ බවටත් සාක්ෂි තිබෙයි. ඒ මිස වෙන කෙනෙක්ලවා සාදවාගෙණ නම් දමාගත්තාවූ පොත් දෙකක් නොවේවා සත්තසකය. එම නිසා මේ පොත් දෙක කළාවූ ඒ කුමරියන් දෙදෙනාට අපේ මුළු හෘදයෙන් ප්‍රශංසා කරන්නෙමු. මුව කුවුඩු සිවල් කථාව කියන පොතේ "ගුණ නෙද විකුම් හිර" යනාදී මුල් කවිය විශ්වාසයේ අඳුමට යොදා තිබෙනවා ඉතාම කදිමයි. ගජ සිවල් කථාව කියන පොතේ "සැම ලොව දෙකි වසන" යනාදී මුල් කවියේ මුල පදේ සඤ්ඣ නැති ක්‍රමයට වැඩිය ප්‍රශංසා කරන්ට බැරිය. නමුත් ඒ පොතත් ඉතාම කදිමයි. යළොක්කා උනානම්යන් දෙදෙනා විසින් කළ මේ පොත් දෙකින් බාලවයසේ කුමරියන් බොහෝ ප්‍රයෝජන ලබනවාට කොහෙත්ම අනුමානයක් නැත. මේවා ගුරුකමට ගෙණ අපේ රටේ සිංහල තරුණියන් ඉගෙණගැනීමට පසුබට නොවෙතැයි සිතමු.

තවද චාල්ලිස් ද සොයිසා සමාදන නඩුකාරතුමාගේ පොහොසත්කමට හා ගුණවත්කමට හැපියටම උන්නාන්සේගේ ගෑණු දරුවන්ගේ ශාසනු ධනයත් මනාලෙස සම්භකරහරණ තිබෙන බව යථොක්ත පොත් දෙකින් හොඳටම පෙනේඩි. උන්නාන්සේගේ පිරිමි දරුවොත් වෙසේම වෙතැයි සිතමු.

———:o:———

තවද මේ පොත් දෙක සම්බන්ධව ආචාර්ය ධම්මාරාම නායක ස්වාමිපාදයානන් වහන්සේද, ගණාචාර්ය වැලිගම ශ්‍රී සුමඟල නායක ස්වාමිපාදයානන් වහන්සේද, ආචාර්ය වස්සඩුවේ සුගති නායක ස්වාමිපාදයානන් වහන්සේද, පණ්ඩිත හැන්ර් පෙරේරා මහත්මයාද, හික්කඩුවේ විමලසුණ ස්වාමිපාදයානන් වහන්සේද, ඌව පලාතේ විදුරුපල රතනජොත්‍යාභිධාන නායක ස්වාමිපාදයානන් වහන්සේද, බැදිගම රතනපාල ස්වාමීන් වහන්සේද, මිහඟොඩ සුමඟ්ඵසර උපාචාර්ය ස්වාමීන් වහන්සේද, හාල්ලේ දේවානුප්‍රේ සුධම්මාරාමාධිවාසි සංඝානඥස්වාමීන් වහන්සේද, සිරිදිඝස් ද සිල්වා බෙරුවල ගුරුන්නාන්සේ මහත්මයාද, ගණාචාර්ය දෙඩන්දූවේ පියරතනතිස්ස ස්වාමිපාදයානන්වහන්සේද, උප ආචාර්ය හෙඩියන්නුඩුවේ දෙවමිත්ත අනුනායක ස්වාමිපාදයානන්වහන්සේද, ආචාර්ය වලානේ ධම්මානන්ද ස්වාමිපාදයානන් වහන්සේද, මාතර අග්ගසාර ස්වාමීන් වහන්සේද, ආචාර්ය අවබලමිගොඩ දෙවානන්ද ස්වාමිපාදයානන් වහන්සේද, විද්‍යෝදය පරිවේණාධිපති හික්කඩුවේ ශ්‍රී සුමඟලාභිධාන මහා නායක ස්වාමිපාදයානන් වහන්සේද, දෙන් අඬ්‍රිස් සිල්වා බටුවන්තුඩාවේ පඬිතුමාද, සුගත ශාසනධජ චිනයාවරිය ධම්මාලංකාර නායක ස්වාමිපාදයානන් වහන්සේද, ගොරවාගි ඉලංගක්කෝන් ලමාඨතනින්වහන්සේද, මහනුවර සිරිමල් වත්තේ වෙදකිලවෙද, ඩබ්ලිව්. ඇම්. පෙරේරා ගුරුන්නාන්සේ මහත්මයාද, සාමුවෙල් පෙරේරා ගුණවර්ධන ගුරුන්නාන්සේ මහත්මයාද, කොර්නේලිස් අල්විස් පාදිලි

උන්නාන්සේද, සත්කෝරලේ ඇබෝ නිලමේතුමාද, ජී. එච්. පොන්සේකා මහත්මයාද, කුරුණ විසුම්සේකර කතිසේරු මහත්මයාද, ඒලියස් පෙරේරා උනවටුනේ ගුරුන්නාන්සේ මහත්මයාද, හොඟල ඤාණතිලක සාමි පාදයානන් වහන්සේද, ආචාර්ය කලුතර සුමනතිස්ස සාමිපාදයානන් වහන්සේද, වසුසේකර වාසලමුදියන්සේ ලාගේ නාපාන වෙදඅප්පුහාමිද, කලුතර ඩී. පෙරා මහත් මයාද, ආචාර්ය රත්මලානේ සුමනතිස්ස සාමිපාදයානන් වහන්සේද, කොස්ගොඩ වැලිතන්දේ සුමඟල මහ ස්ථවිරපාදයානන් වහන්සේද, ගරුඤාවසුතු විලියම් ගුණ තිලක පෙරකඳෙරු මහත්මයාද, බෙල්ලන්විල විහාරාධි පති උඩුගම්පල මහ ස්ථවිරපාදයානන් වහන්සේද, බ්‍රිස්සේ සුදර්ශනාරාමාධිවාසී සඛාතිස්ස සාමිපාදයානන් වහන්සේද, කොහගල විමලසාර සාමීන් වහන්සේද, පාමන්කඩ දෙන් හරමානිස් සමරසිංහ කවිරත්නා බස්නායක වෙද ආරච්චි මහත්මයාද, ගල්කිස්සේ පාඩුර් ප්‍රනන්දු වෙදමහත් මියාද, 'වැලිගම' ගණාචාර්ය ශ්‍රී සුමඟල නායක ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍යවූ ශාසනධජ සාමීන්වහන්සේද, තන් ගල්ලේ ජිනරතන සාමිපාදයානන් වහන්සේද, කොර නොට පුරාණ ගල්ලෙන් විහාරාධිපති සොඉන සාමීන් වහන්සේද, ආචාර්ය දෙන් අඳ්‍රිස් කුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මුහන්දිරම් මහත්මයාද, පාණ්ඩුරේ ඤාණවිමල තිස්ස සාමීන් වහන්සේද, පාණ්ඩුරේ රන්කොත් විහාරාධි වාසී ගුණරතනතිස්ස සාමිපාදයානන් වහන්සේද, පාණ් ඩුරේ අර්නෝල්ඩ් දියස් මහත්මයාද, හොරවාගේ සෑමසොන් ද ආබ්‍රේ විජයගුණරත්නා රාජපක්ෂ වලව්වේ මහත්මයාද, මොරවුවේ හොරවාගේ ප්‍රන්සිස්කු ද මැල් මහත්මයාද, මොරවුවේ ජොහැන්නස් සල්ගාදු ගුණවර්ධන "රිජිස්ට්‍රර්" මහත්මයාද, කතරවේ ශාසනධජ සාමීන් වහන්සේද, හොරවනිය ඩී. ඒ. ඊ. මැල් පාදිලි උන්නාන්සේද, කිරිබත්ගොඩ ජයසූරිය ආරච්චිගේ දෙන් පවලිස් වෙද අප්පුහාමිද, වෙල්ස් ශාස්ත්‍ර ශාලාව වෙනුවෙන් සිරිදියස්

සිල්වා ගුරුන්නාන්සේ මහත්මයා සහ ඒ. ප්‍රනාන්දු ගුරුන්නාන්සේ මහත්මයා විසිනුත් ප්‍රබන්ධ කරණ ලදින් මහමරක්කල කුරුකුලසූරිය පටබැඳිගේ ක්‍රිස්තිනා පේ‍්‍රරා මහත්මිය සහ සලමොන් ප්‍රනාන්දු මහත්මයා විසින්ද, කොස්ගොඩ ජිනවරවංශපාල ධිරානන්ද ස්වාමිපාදයානන් වහන්සේද, අහන්ගම බිම්බාරාමාධිපති එළුකැටියේ සීලනන්ද ස්වාමිපාදයානන් වහන්සේද, අලුත්කුරුකෝරළේ දෙන් කරෝලිස් වික්‍රමසිංහ ජයවර්ධන මුහන්දිරම් මහත්මයාද, මෝදර වලව්වේ ජ්. මැන්දිස් ලමාඑතනීන් වහන්සේද, කතෝලික විධිවත් ශාස්ත්‍ර ශාලාවේ ගුරුතනතුර දුරු ජෝසප් ලුවිස් ජයවීර මහත්මයාද, නීලාගිරියේ ඉරිදා ස්කෝලයෙහි ගුරුවරයන් වෙනුවෙන් ඩබ්ලිව්. ජේ. විජයසිංහ මහත්මයාද, ඔව්පිගමුවේ රේවත ස්වාමිපාදයානන් වහන්සේද, ගෞරවාගී එක්නැලිගොඩ දිසාමහතාද, ගෞරවාගී ඇල්. බී. කොබ්බෑකඩුවේ රටේ මහත්මයාද, මාතර සුමණතිලක ස්වාමීන් වහන්සේද, අම්බලම්ගොඩ දේවානන්ද ස්වාමිපාදයානන් වහන්සේද, අනුන්ගල්ලේ සුවණ්ණකාශධ්වජාභිධාන ස්වාමිපාදයානන් වහන්සේද, මහනුවර පත්හිරිප්පුවේ නිවාසී සූරියගොඩ ස්වාමිපාදයානන් වහන්සේද, වැලිතොට අඹගහපිටියේ විහාරයෙහි සුගතශාසනොදය පාඨශාලාවෙහි ආචාර්‍ය්‍ය තැන්පත් මිගමුවේ ආසභාභිධාන ස්වාමිපාදයානන් වහන්සේද, කොළඹ බෞද්ධ පාඨශාලාවේ ජේම්ස් පෙ‍්‍රරා මහත්මයාද, කළුතර තොටමුන වලව්වේ ඇජ්. සී. කරුණාරත්න මහතාද, "සර්" එච්. ඩයස් තුමාද, මහ වලව්වේ සී. පී. ඩයස් බණ්ඩාරනායක මහමුදලි මන්ත්‍රීශ්වරයාද, කොළඹ "ගරු" ඇස්. සී. උබයසේකර තුමාද, ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවේ සයිමන් ද සිල්වා මුදලිතුමාද, වේල්ස් ශාස්ත්‍රශාලාවේ ඩබ්ලිව්. ඇස්. ගුණවර්ධන මහතාද, බම්බලපිටියේ ඒ. ඩබ්ලිව්. ඩී. ජයසූරිය මහතාද, ජ්‍යොතිශශාස්ත්‍රාචාර්‍ය්‍ය දෙන් පිලිප් ද සිල්වා අප්පුහාමිද, විශ්වනාථ ශිවාචාර්‍ය්‍ය කුමාරස්වාමි බ්‍රාහ්මණ පණ්ඩිතුමාද, මාතර තෙපානිස් දියස් ද සිල්වා

ගජවීර ගුරුන්නාන්සේ මහත්මයාදෝ, එක්නැලිගොඩ අනය තිලකරතනාරාමවාසී සුමංගලංකාර තෙරුන්නාන්සේදෝ, පාණ්ඩුරේ පසඤ්ඤසද්ද සාමීන් වහන්සේදෝ, ඩබ්ලිව්. ඒ. ප්‍රනන්දු ගුරුන්නාන්සේ මහත්මයාදෝ, ඇලෙක්සැන්ඩර් මැන්දිස් සේනානායක ආරච්චි මහත්මයාදෝ, පාණ්ඩුරේ කෙහෙල්වත්තේ ඒ. ජෝහැන්නස් ප්‍රනන්දු මහත්මයාදෝ, මහවන්නියේ මුන්නන්කුලමේ නිවාසී එරියාවේ රන්ගෙයි බණ්ඩාර වන්නියිංහ ප්‍රභූප මුදියන්සේලාගේ මුදියන්සේ හිටපු රවේමහත්මයාදෝ, බද්දේගම සරණංකර සාමිපාදයන් වහන්සේදෝ, වැලිතර උපසාක මහාගිසස අරියවංශධජ සුමංගලකිත්ති චූලගණ්ඨි නිකායේ නායක සාමීන්වහන්සේදෝ, අම්බලම්ගොඩ විද්‍යාලඛ්කාර බෞද්ධ පාඨශාලාවේ උප ගුරුවර ජී. ඇල්. ඩී. සිල්වා මහත්මයාදෝ, ගරුකටසුතු අස්ගිරි මහාවිහාරවාසී ගලගෙදර ගුණරතන සාමිපාදයානන් වහන්සේදෝ, ආචාර්ය සිරිනිවාස මලුවේ ධම්මාරාම සාමිපාදයන් වහන්සේදෝ, වේරගම්පිට රේවත සාමිපාදයානන් වහන්සේදෝ, කැලණි විහාරාධිපති දෙමෝදර බුඩරක්ඛිත නායක සාමිපාදයානන් වහන්සේදෝ, එච්. ඇස්. දියස් කොවපල සෙක්‍රේටරි ගුරුවර මහතාදෝ, පණ්ඩිත කේ. ටී. කරුණාරත්න මහත්මයාදෝ, වාරණ විහාරාධිපති අභිධජස්‍යාභිධාන දංගල්ලේ නායක සාමි පාදයානන් වහන්සේදෝ, මාතර කනකහේවාගේ තරෝලිස් සිල්වා මහත්මයාදෝ, ඒ. ඩබ්ලිව්. ජී. ජයසූරිය පාඨශාලා පරීක්ෂක මහත්මයාදෝ, මහනුවර මල්වත්තේ විහාරාධිවාසී වැළගොන්නේ ධම්මරක්ඛිත විපසනාභිධාන නායක සාමි පාදයානන් වහන්සේදෝ, මහනුවර අස්ගිරි විහාරාධිවාසී කපු ලියැද්දේ අනුනායක සාමිපාදයානන් වහන්සේදෝ, මහනුවර පුෂ්පාරාම විහාරාධිපති කිප්පල ධම්මරක්ඛිත සොභිතාභිධාන මහානායක සාමිපාදයානන් වහන්සෙදෝ, මහනුවර කොටුවේ වත්තේ සොභිතාරාමාභිධාන සාමීන්වහන්සේදෝ, මහනුවර අස්ගිරි විහාරාධිපති යටවත්තේ චන්දජෝතනාභිධාන මහා නායක සාමිපාදයානන් වහන්සේදෝ, මහනුවර වැලිකිවිසේ වජිර ඤාණාලඞ්කාර සිරිසුමන මහා ස්ථවිරපාදයානන් වහන් සේද විසින් ප්‍රශංසා කර එවන ලද ලියුම් එකි අනාත්මන කොට තිබේ.

"ඇල්ඩ්‍රඩ් හවුස්" නම් ද සොසියා මන්දිරය.

කොළඹ නගරයට අයත් බම්බලපිටියේ (බගතලේ) අක්කර එකසිය විස්සක් (අ. 120.) ප්‍රමාණ ඇති විශාල රමණීය භූමියේ මෙම මහා උඩුමහල් මන්දිරය හොඩනගා තිබේ.

මෙති භූමිය—පොල් පුවක්, අඹ, දඹ, පනා, තැඹිලි, නාවඩි, රම්බෑන්, කුරුඳු, බෙලි, ජීවුල්, දෙඩම්, නාරම්, ආදී විවිධ රාශියෙන්ද, ලබු, පුසුල්, සුමන ලතා ආදියෙන්ද, ඇඹුළුපුල ආදියෙන් සැදුම්ලද පුෂ්පාරණ්‍යයන් හෙන්ද, මිල් පඳුරු, ආදියෙන්ද, බැබලේ.

ජල සහනු—තන්හි තන්හි සවිකරණ ලද ජල යන්ත්‍රාදියෙන්ද, අනේක ස්ථානයන්ට දිය දුව යන නල රාශිය හෙන්ද, විශාල භූමිය සුසජ්ජිතයොව තිබේ.

මන්දිරාදුනය—තවද දුටුවන් සතුටුවී හාවයට පරිවර්තන වෙන අන්දමට මණ්ඩලාකාරයට සම්පාදනය කරණලද මන්දිරෝද්‍යානය දකිනය කරණලද ඇතැම්හු නන්දනොද්‍යානයයි රුවටෙන ආකාර අලංකාරව තිබේ.

අස්හල් ආදිය—වර්තමාන කාලයෙහි ශිෂ්ටාචාරයෙන් අගතැන්පත්වසි සලකණු ලබන සුරෝපාදි මහරාජ්‍යයන්හි ඇති ශ්‍රේෂ්ඨ ධනවතුන්වසි ප්‍රසිද්ධ රොත්ස්චයිල්ඩ්ස් * වැන් ඩර්බිල්ට් ආදි ධන ශ්‍රේෂ්ඨ කිසිවෙකුගේ අස්හල්, රථහල් ආදියට කිසිසේත් දෙවෙනි නොවන ආකාර මෙම මන්දිරයට භූදුරුව තනාතිබෙන අස්හල්, රථහල් බොහෝ මුදල් වියදම්නොව සහ සුඛාවහොදය දැන කරණ ලද්දක් බව මොනවට ඔප්පුවේ. ජවාඩික අසුන් සඳහා විශෙෂ අස් සලක්ද පසක පිහිටුවා තිබේ.

---

* "The Ceylon Rothschilds" "ලඞ්කාවේ රොත්ස්චයිල්ඩ්ස්" යන අන්වර්ථ නාමය ධනවත් මේම ද සොසියා මහතුන්ට ඒ නිබඳන බැව් ඇඩින්බරෝහි ආදිපාදකානන් ලඞ්කාවට සම්ප්‍රාප්තවීම විස්මිතවූ ජෝන් ඩාල්ටර් ධනපති වීමත් හරණලද ඉංග්‍රීසි ප්‍රතිරණ්‍යයෙන් පෙන්නී.

අග්ගි ඇඳුම—අග්ග ඇඳුම් ශාලාව රට උවමනා සකලොපකරණ ඇතුව විශෙෂලෙස සම්පාදනයකොට තිබේ. එයි කම කරණ අස්ගොව් ආදීන්ට මේ කරණකොට ගෙණ කිසි උනන්වයක් නොමැතිව කවසුනු කිරීමට හැකිව තිබීම ප්‍රිය ඵලවන කාරණයකි.

ගවහල්—ගවහල් පඬකතිද ඒ ඒ පිළිවෙළට සම්පාදනයකොට මනා සැපවිහරණ ඇතුව තණ පිදුරු කෑමට දෝණි සහිතව පිරිසිදු ලෙස පිළියෙළකොට තිබේ. ධෙනුන්නේ ලැබීමටද, කෑමටද නිසියාකාර මෙකී ගල් වෙන්කොට සැප ගෙණදෙන හැටියට සකස්කොට තිබේ. ගව ස්නානය සඳහා තනා තිබෙන සතරැස් ජලාශය ඉතා ප්‍රයෝජනවත් වෙන ආකාරයට තනවා රටම ජල මර්දිරකොට එයින් ජලධාරා තබා දිය ඒමට නල සවිකර තිබෙන මහිමය මාහැකිමය. ගවසින්ට දිය පානයට සහ තාරා පාත්නාදීන්නේ ජල ක්‍රීඩා පිණිසද මණ්ඩලාකාර තනා තිබෙන ජලාශය කරණකොටගෙණ ඒ ඒ සබ ගණයාට ජලයෙන් ලබන විපුල ප්‍රයොජනයට නිලතුරු ඉඩතිබේ. ගව පොතකයන් සඳහා වෙනම ගව පොතක ගෘහයක්ද මනාලෙස ස්ථාපිතකර තිබේ.

ක්ෂීරඛොවන ශාලාව—දෙනුන් බැඳ කිරි දෙවින පිණිස ඉතා පිරිසිදු ආකාර "ක්ෂීර ඛොවන" ශාලාවක්ද ගවහල පසක ස්ථාපිතකොට තිබේ.

තෘණ ආදිය—අසුන්ට සහ ගවසින්ට උවමනා ධානා වර්ග තබන ශාලාවද, පිදුරු තණ ආදිය තබන ශාලාද රට ඔබින ආකාර යස පිළිවෙළට සම්පාදනයකර තිබේ.

මුව හල—ගව හල් වලට ආසන්න කොට මනා දැකුම්ඇති මුවහලක්ද කදිමට ස්ථාපිතකොට තිබේ. මෙම මුව හලද, මුවන්ට උවමනා සකල දෙයින්ම පූර්ණකොට ඉතා ලක්ෂණට කරණ ලද්දනි.

කුකුළු ගෘහ ආදිය—තාරා පාත්තයන්ට සහ කුකුළන්ට සුවසේ විසීමට පසක වෙන වෙනම තනා තිබෙන තාරා පාත්ත කුකුළු ගෙවල් පෙළද මොනවට තනා තිබේ. මෙයි ගෙවල් ඔවුන්ගේ ලැගීමටද, කෑමටද, ඇවිදීමටද, ඉඩඇතුව ඉතා පිරිසිදුලෙස සම්පාදනය කරණ ලද්දකි.

විශ්‍රාම ශාලා—මාලාකාරයන්ටද, උයන් පාලයන්ටද, අස් ගොව්වන්ට සහ එබෙරුන්ටද, සුවසේ විසීමට සුදුසු විශ්‍රාම ශාලා පඞ්ක්තියක් ඔවුන්ට උවමනා සකල භාණ්ඩයන් සහිතව සම්පාදනය කරදී තිබේ. පූජක වරුන්ටද, ආගන්තුකයින්ටද, මෙහි සහ ද සොයිසා පවුලට අයත් වතුවල කළමනාකාරාදීන්ටද නැවතීමට සුවපහස් ඇති ශාලා කුටිකාදියද, සකල භාණ්ඩයන් සමග නොමසුරු ලෙස සම්පාදනය කොට දී තිබේ. මේ ආදිකොට ඇති අනෙක ශාලා ද සොයිසා මන්දිරය පසුභාගයේ සම්පාදනය කොට තිබෙන විපුලාලඞ්කාරය අතිශයින්ම මනෝහරය.

මන්දිරාඞ්ගනය—නවද ක්‍රීඩා මණ්ඩලාදියෙන්ද, පෙන් කෙළැවිදින ගව පැටවුන් ගෙන්ද, පැටවුන්ට කිරි දෙන මව ධෙනුන් ගෙන්ද, හඬලන කුකුළන් ගෙන්ද, ජල ක්‍රීඩාකරණ තාරාපාත්ත සමූහයාගෙන්ද, දුවඇවිදින හොංසුන්ගෙන්ද, හේසාරවය පවත්වන අසුන් ගෙන්ද, අං ඔසවා සිටින මුවන්ගෙන්ද, ස්ථම්භ නැග සිටින වඳුරු රිලවුන් ගෙන්ද, බිම බැස ගොදුරු ගන්නා පාරාවතයන් ගෙන්ද, ඒ ඒ මැදුරුවල සිටින කුරුලු කොබෙයි ආදීන්ගෙන්ද, සුවඳ හමන ලක්ෂණ නා නා වර්ග නා නා වර්ණ මල්වලින්ද, ජල යන්ත්‍රාදියෙන් වැගිරෙණ ජල ධාරාවලින්ද මෙම විශාල මන්දිරාඞ්ගනය සහ ඉන් අවට නිතර කොතුහල මනා දර්ශනීයව තිබේ.

පහල මාල—මෙම මැදුරේ පහල මාලේ, විවිත දීසි පවු ශාලාවේ තන්හි තන්හි නොයෙක් ලක්ෂණ පැල වගී තබා දික් හඟලා ආදි වාඩිවීමට සුදුසු පීඨාදිය නොයෙක් අඟනා ලී වගී වලින් සාදවා පිළියෙල කොට තිබේ. ඒ ලඟ ඇතුල් ශාලාව ඉතා අඟනා මිහා හසුන් දන්ත යුගමයකින්ද, ධවල පාෂාණයෙන් කරණ ලද මණ්ඩලාකාර පෝරුව කින්ද, කඵවර, කඵමැදිරිය, ආදියෙන් කරණ ලද මාහැනි කැටයම් විසිතුරු වැඩ සහිත නොයෙක් ආසන පඩිතිසයකින්ද, මල්කලස ආදියෙන්ද, ඡායාරූපාදියෙන්ද, සිතියම් සහිත අඟනා කැඩපත් ආදියෙන්ද, ශාලාව සුරා බිම අතුරණ ලද මාහැනි පලස් ආදියෙන්ද, පාද පීඨාදියෙන්ද, තුසිමංපුසාදියෙන්ද, ඉතා විසිතුරු වැනුයන්ගෙන් ප්‍රතිමණ්ඩිත පීඨාදියෙන්ද, ප්‍රතිරූප අමුරන් ගුයෙන් හෙත්තම් කරණලද චන්ද්‍රාකාර මෙත්තසන්ගෙන් යුත් අඟනා ආසන පඩිතිවලින්ද, එල්වන ලද අලඬකාර වජ්‍ර ප්‍රදිපාදියෙන්ද, මන නයන පොලඹවන ආකාර සමලඬකෘත කොට තිබේ. මීට යාව පසස තිබෙන ශාලාවද එසේම මහත් ලෙස අඟනා ආසනාදියෙන් භ්‍රාජිතව තිබේ.

ගොල ඵලක ශාලාව—කාලානුරූපව පිළියෙල කරණ ලද ගොල ඵලක ශාලාව මීට වාම පස පිහිටුවා තිබේ. මෙය විශාල ගොල ඵලකයකින්ද ගොල දණ්ඩාදිය තැබීමට සිදුරුපෝරුවකින්ද, සඬඝා පුවරුවකින්ද, ඊට උවමනා අනෘ සකල දෙසින්ද පරිපූර්ණව තිබේ.

කුඩා පොත් ගෙය—මීට යාව පොත් පත් ආදියෙන් යුත් කුඩා ශාලාවක් තිබේ. එය ලොකොපකාරය සඳහා විසින්විට මුද්‍රණය කරණ ලද ඉතිරි පොත් පත් නබන "අල්මාරි" ආදියෙන් යුත් කුඩා ශාලාවකි. එයද මහා දායිනිය එකකි.

පුස්තකාලය—මේහි පිහිටුවා තිබෙන පුස්තකාලය අනගි එකකි. එහි තිබෙන ඉතා ලක්ෂණ කඵමැදිරිය "අල්මාරි" මහත් මුදලක් වියදම්කොට සාදන ලද බැව්

බැල්ල වහාම වැටගේ. ඒ තුළ සිංහල ඉංග්‍රීසි ආදි භාෂාවන් ඔබේ සුත් පොත් පත් පුරවා තිබේ. එම පොත් රන්කම්න් තිම්වින ල්ද කමබ සඟින වවිනා සහ අරුම ලෙස එකතු කරණලද පොත්ය. මනා පිළිවෙළකට මෙම පුස්තකාගාරය තබාගැනේ. දැගතුන්ගේ සහ ශාස්ත්‍රාගිලාඛිතයින්ගේ දර්ශන සව මෙම පුස්තකාලය අතිශයින් රමණිය එකකි. මෙය නිරීක්ෂණය කරණ කවරෙක් උගතමනා ශාස්ත්‍රයෙහි නොඇලේද?

උතුසව මහ ශාලාව—මිට පසු භාගයෙන් "උතුසව මහ ශාලාව" සථාපිත කොට තිබේ. ඊට මහත් මුදලක් වියදම්කොට තිබෙන බව දුටු කෙණෙහිම වැටගේ. මේ අසල තිබෙන මල් උයනෙන් මනුමාරුතය ලැබෙන ලෙස ලඟඟ් කවිළු එක්තරා පිළිවෙළකට මෙහි යොදූ නිම කිරණලදී. මෙම ශාලාවේ බිම ලෑලි අතුරා ඒ ලෑලිඛපදමා ඉහල වහලේ කැටයට සඟින ලෑලි විතාන සථිකර තිබේ. තැවුම ආදිය පවත්වන වේලාවන්හි උවමනා කෑම බිම කබානැඟීමට සුදුසු ගබඩාදිය ලක්ෂණලෙස පසක තනා තිබෙනවත්ඇර මෙම මාහැනි උත්සව ශාලාවට උවමනා රජතමය භාණ්ඩයන්ද වජ්‍රමය භාණ්ඩයන්ද අලඞ්කාර "අල්මාරි" වල තැන්පත්කොට පසෙක තිබේ. ඒල්වන ලද වජ්‍ර පහන් ආදියෙන් උදදීපිතිතවේ. මල් කලස් ආදියෙන්ද මිට උවමනා අනෘ සකල දෙසින්ද රැසිතුනවූ උතුසව පැවැත්වීමට නිතර සූදුනම්ව තිබෙන මෙම ශාලාවට සමෙක් පැමිණිකල උතුසනන උතුසව ගැණ රුචිනොවී හැරියායකි සිතිය නොහැක.

කනිෂ්ඨ කුටිකා—මිට යාව තිබෙන ලක්ෂණ කනිෂ්ඨ කුටිකා පරිකතිය තරුණ ද සොසියා මහත්වරුන්ගේ සතන් ගබඩාය. එක එක ගබඩාවට ඔබනා සකල භාණ්ඩයන්ගෙන් මෙකී ගබඩා පරිපූර්ණ කොට තිබේ. මෙකී ගබඩාවල ඇති විරසිදුකමද, ලක්ෂණ සඛභාවද, සිත් විනවන දේවල අතයද සවිප්‍රකාරයෙන්ම මාහැනිය.

ස්නාන ගර—ස්නානය පිණිස ස්ථාපිතකර තිබෙන ස්නාන ගරයන්ට මහ ජල මැදිරියෙන් දිය එන ලෙස දියනල සවිකර තිබේ. මෙකී නාන ගෙවලට උවමනා සකලම දෙය අනවරතයෙන් පිළියෙලව තිබේ.

පාකාගාරස—මෙය ඉතා විශාලවූ එකකි. අරක්කැවි යන්ට උවමනා සකලමදේ උනන්නයක් නොවැහිව එහි තිබේ. ඉඛ්ත්‍රිසි සූප ශාස්ත්‍රානුකූලව කෑම පිසන අරක්කැවි යන් සහ ඔවුන්ගේ පිරිවර අනුපිළිවෙළින් වසින්ද මෙහි කවසුතු කරණු ලැබේ. නිතර රසමුසු ව්‍යඤ්ජනාදිය පිසීමෙන් සහ මාංශාදිය බැදීමෙන් නික්මෙන සුගන්ධය කරණකොට ගෙණ, නිතර කෑම සුදුනම බව හඟවයි. ඉතා පිරිසිදු ආකාරයට තබා තිබෙන ආහාර ගාර පෙළද දැකිය්ය කට සුකනකි. ඵලවර්ග, ඵල, තුරු ආදි වහි තැබීමට අනෘ ගබඩා පෙළක්ද, පැහිරස කෑමවලි තැනුවට සහ සුරක්ෂිතකොට තැබීමට සොහෘ ගබඩා පෙළක්ද මොනවට සකස්කොට තිබේ. මෙම අගනා මුළුතැන්ගෙය දකින් කවරෙක් උවත් ආහාර වෛකල්‍යය නොදක්වා මෙයින් විට වෙදෝ හෝ අනුමානය.

බීම ගබඩාව—මීට යාව බීම ගබඩාව තනවනලදී. උවමනා සෑම බීම වහි එහි අසුරා තිබේ. කාලිකලෙස ගතසුතු ඉංග්‍රිසි බීම වහි කොළඹ කොටුව තුළ ඇතත් මෙම බීම ගබඩාව ඒ කිසිවකට දෙවෙනි නොවන්නේය.

කාඡවක ශාලා ආදිය—මීට පසු භාගයෙන් කාඡවක ශාලා සහ උත්සවයන් සඳහා උවමනාවූ කල ගතසුතු රිකෂා ශාලාවලින් සුකනය. එකී ශාලාද උවමනා දෙයින් පරිපූර්ණවා පමණක් නොව පිරිසිදුභාවයෙන්ද සුකනය.

උඩුමහල—මෙම මැදිරියේ උඩුමහල, පහළ මහලට කිසිසේත් දෙවෙන් නොවෙය. එහි චාල්ස් හැන්රි ද සොසිසා මැතිවරයාගේ මහා ඡායාරූපය සහ ඇඩින්බරෝහි ආදිපාදු රාජ කුමාරයානන්ගේ ඡායා රූපයද පළමුවෙනි දැකිනුයම්

භික්ෂූන්ගේ සඞ්කර නිබේ. ද සොසිසා පවුලේ වැඩුමහල් ලන්ගේ ඡායාරූපයන් හෙන්ද, අනෂී ආසනාදියෙන්ද නොයෙක්ලෙස සිත් කළඹවන කැටයම් ද්‍රව්‍යාදියෙන්ද ලෑලිමතු අතුරණ ලද මාහැඟි පලස් ආදියෙන්ද, ආලම්බනය කරණලද ලක්ෂණ පහන් වගී වලින්ද මෙහි පළමුවෙනි ශාලාව විරාජමානවිය.

චඞ්ක්‍රමණ ශාලාව—පූර්වභාගයෙන් නිබෙන චඞ්ක්‍රමණ ශාලාව ලක්ෂණ කුඩා ගස්වගීයන්ගෙන් සරසා සක්මන් කිරීමෙන් සැපපහසු ලැබියහැකි ලෙස තනවා නිබේ.

පටු ශාලාව—ඉන් මෙහා පටු ශාලාව ද සොසිසා මහත්මින්නේ මැහුම් ගෙතුම් ආදියටද, සිතියම් කිරීමට උවමනා පෝරු ආදිය තැබීමටද ඉඩ හැර නිබේ. උඩුමහලේ පසක් දුරුවන්ට විවේකව ශාස්ත්‍රාදධ්‍රණය පිණිස පිළියෙළකොට නිබේ. තවත් පසක මහත්මින්ගේ යහන් ගබඩා වෙන්කොටද තවත් පසක සළුවඩන කුටිකා පිළියෙළ කොටද, කරවනලදී. මෙහි සියලුම කුටිකා සහ ශාලාවලට උවමනා සකල දෙයම් ඒ ඒ තන්හි හානියක් නොමැතිව සම්පාදනයකර නිබෙන බැව් පෙනේ.

දිසි ශාලාව—තවත් දිග ශාලාවක විවාහ ජීවිතවලට පත්වූද, නොපත්වූද, ද සොසිසා මහත්වරුන්ගේ සහ එම නෝනා මහත්වරුන්ගේද, නෝනා මහත්වරුන්ගේ සැමිපුරුෂයින්ගේද, ඒ මහත්වරුන්ගේ දරුවන්ගේද, වෙනත් බඳුමිත්‍රාදීන්ගේද ඡායාරූප රාශියක් තබා නිබේ. මෙම ශාලාවට පැමිණීමෙන් ද සොසිසා මහත්වරුන්ගේ පවුල්වල ඡායා රූප සුවසේ දැකගන්ට හැකිව නිබේ. ලුහුඬින්ම ද සොසිසා පවුලට අයත් සියලු මහතුන්ගේ සහ නෝනාමහතුන්ගේ ඡායා රූප ඒ ඒ කාලික වශයෙන් දැකගන්ට හැකිව නිබේ. මෙම උඩුමහලේ තවත් පසක ද සොසිසා පවුලට ලැබුන තෑගි භාණ්ඩයන් පුරවා නිබේ.

ඉන් එහා ශාලාවේ කළුමැදිරිය කළුවර අල්මාරි කිපයක්ද දශිනියවේ. ඕන්එහා කෙළවර දක්වාද ගෑණු ලම සින්ගේ උවමනා සඳහා ඇතිවියයුතු ගුපත කුටිකාදියෙන් සමලඬෘතයි.

අතුරු ගබඩා—මේ ඇර විශෙෂ යහන් ගබඩාද, අන්‍ය ගබඩා ආදියද මෙම උඩුමහලේ රම්‍යාකාර සකස්කොට තිබේ. උඩමහලේ සහ පහළ මාලේද සත්රුවන් ගබඩා විශෙෂ ලෙස තනා එහි අයොමය පෙට්ටි "අල්මාරි" ආදි යෙහි මෙහි නොයෙක් වසතු තැන්පත්කොට තිබේ. තවත් තඹ පිත්තල භාණ්ඩයන් ගෙන් පිරිගිය ගබඩා මෙහි බොහෝය. සැබෑලෙස **මිශාල** ශබ්දය ව්‍යවහාර කළ යුතු මෙම මහා මන්දිරයේ කටයුතු සඳහා ඒ ඒ කම්‍ම සම්පූර්ණ කිරීම ගැණ, බාල තරුණ, මහලු දැසි දැසාදිහු වැටුප්දී නියුක්තකර සිටිත්. මොවුන් සඳහා වියදම් කරණ ලද ධනයද ඉතා මහත්ය.

මෙසේ නිතර මහත් ධනයක් වියදම් වෙන්නාවූද කොළඹ නගරයට තිබෙන මාලිගාවක් වැනිවූද, මෙම ලඬකාව හිමි රජ පවුලේ රාජ කුමාරයෙක් පරිභොග කළ එකම නිවසවූද වර ශොභන මේ මහා මන්දිරයට පළමු තිබුන **බගනලේ නිවස** යනු අහක්කොට ඒ වෙනුවට අන්‍ය නාමයක් තැබීමට ද සොසිසා මහත්මයා අදහස් කොට තිබෙන බව ඇඩින්බරෝහි ආදිපාදයානන්ට සැලව ගිය කල ඒ තුමාගේ නාමය මෙ මහා මන්දිරයට ව්‍යවහාර කිරීමට ඉතා ප්‍රිතිව **ඇල්ප්‍රැඩ හවුස්** (ඇල්ප්‍රැඩ නිවස) යන නාමය ද සොසිසා මන්දිරයට ව්‍යවහාර කිරීමට ඒ තුමා කැමැත්තදෙන ලදින්, වෂ් එක්දහස් අටසිය සැත්තෑවේ මැයි මස පළමුවෙනි (1870. මැ. ම. 1.) දින මෙ බව මුළු නගරයේ ප්‍රකටවිය. මෙතැන් පටන් මෙම මන්දිරය **ඇල්ප්‍රැඩ හවුස්** (Alfred House) නමින් ව්‍යවහාරවිය.

මේ ආදියෙන් බැලූකල කිසිවෙකුට හයේවත්, කිසිවෙකුට වාල් නොවිවත්, කිසි යසසකට නොරුවවිවත්,

කිසි ධනයකට මුලානොව්වත් යම් **සත්පුරුෂයෙක්** සත්‍යය ප්‍රකාශ කෙරේ නම්, ලංකාවෙ **සිමුන්සන** මෙ මන්දිර මස්තකයේ ලෙල දීම සුදු බව පස්වනක් ප්‍රීතියෙන් ප්‍රකාශ කෙරේමය.

——:o:——

සාමදාන විනිශ්චයකාර ධුරය.

ශ්‍රීමත් ඇඩින්බරෝහි ආදිපාදෝත්තමයාගේ ඉල්ලීම පරිද්දෙන් සර් හර්කිව්ලස් රොබින්සන් ගරුතර ආණ්ඩුකාරතුමා චාලිස් හැන්රි ද සොයිසා මහතාට මුළු ලක්දිව සාමදාන විනිශ්චයකාර ධුරය ප්‍රදානය කරමින් ගෞරව සම්භාවනා කොළේය. මෙ බව වර්ෂ එක්දහස් අටසිය සැත්තෑවේ මැයි මස දහසතර වෙනි (1870. මැ. ම. 14.) දින ආණ්ඩුවේ "ගැසැට්" පත්‍රයෙන් ප්‍රකාශකරලූහ. මෙ ගැණ උසස් බොහෝදෙන සතුටට පත්ව **ඇල්ෆ්‍රැඩ් හවුස්** නම් වලව්වට පැමිණ තම තමන්ගේ සතුට ප්‍රකාශ කළහ. මෙතුමා මෙ ධුරය ගැණ වැඩි සැලකිල්ලකට නොපැමිණි හෙයින් මෙ ගැණ විශෙෂ කිසි උත්සවයක් නොපවත්වනලදි.

——:o:——

මොරටුවේ මහා ශාස්ත්‍ර ශාලා දෙක.

ක්‍රිස්තු වර්ෂ එක්දහස් අටසිය හැත්තෑ පහක්වූ දෙසැම්බර් මස පළමුවෙනි (1875. දෙ. ම. 1.) දින මෙසිරි ලක වෙරළට පැමිණියාවූ ශ්‍රීමත් අප මහරාජිනියගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර වේල්ස්හි රාජකුමාරෝත්තමයානන්ගේ සහ එම ප්‍රිය කාන්තාවවූ වේල්ස්හි රාජ කුමාරිකාවියගේත් නාමවය සහ මෙම කුමාරයාගේ ගමන නිතර සිහිකිරීම සඳහා මහා ශාස්ත්‍රශාලා දෙකක් පිහිටුවන්ට ස්වදෙශාලයෙන් මින්වූද, රාජපාක්ෂික තමෙහි අගතැන් පාත්වූද, චාලිස් හැන්රි ද සොයිසාතුම අදහස් කොළේය. මෙවකාට මෙතුමා



THE PRINCE OF WALES' COLLEGE, MORATUWA.
වේල්ස්හි රාජකුමාරයාණන්ගේ ශාස්ත්‍ර ශාලාව, මොරටුව.

ආශ්‍රයකළ උසස් විචක්ෂණයෝද, මෙම මාතෘකා අදහසට සතුතිකොට, මෙතුමාගේ සුනොවිත අදහස මුදුන් පැමිණෙවයි ප්‍රාර්ථනා කළහ. අතිශය විශාලවූද, උසස්වූද මේ ගොඩනැගිලි දෙක ඉදිකිරීමට තම පියා මුදලිදු සහ තමනුත් උපන් මෙවකවත් **දෙවෙනි එඩිංබරෝ** යයි ප්‍රකට සැබවින්ම කාලික වශයෙන් **සාධුජන ගුණාලඞ්කාර** කොටද, **විජය ගුණාලඞ්කාර** කොටද ගැණිය හැකි මොරටු ග්‍රාමයේ රම්‍ය භූමියක් පරීක්ෂාකොට එහි ගෙඹිම නියමිතර ගත්හ. **වේල්ස් රාජකුමාර ශාසන ශාලාව,** (Prince of Wales' College) **වේල්ස්හි රාජකුමාරි ශාසන ශාලාව** (Princess of Wales' College) යන නම් දෙක මේ ශාස්ත්‍රශාලා දෙකට තැබීමේ භාග්‍යය කුමාරොත්තමයානන්ගෙන් ලැබුන විහාම, එහි මූලපාෂාණ හෙලීමේ උත්සවය සඳහා කටයුතු ආරම්භ කළහ.

මේ භූමිතොම වනාහි අක්කර පසළොසක් (අ. 15.) පමණ විශාලවූවාය. ඉරු උදුවන අතට ගාල්ලට යන මහ පාරද, ඉරු බස්නා අතට ලුනාව නම් ඇලද, ඉඹිව තිබේ. මෙයි ඇලෙන් ඒගොඩ අලඞ්කාර වෘක්ෂලතාදියෙන් සමන්විත භූමිභාගය සසුර සම්ප පිහිටා තිබෙන හෙයින් මෙම ශාස්ත්‍රශාලා දෙකට පැමිණෙන බොලඳ සුකුමාර දරු රූසට විපුල සැපදුයක විමෙන් ශාස්ත්‍රොද්ග්‍රහණය මොනවට ඉවුකර ගැණීමට හැකිව තිබෙනු දැක්ම ප්‍රීතියකි.

මෙම ප්‍රස්තාවට උවමනා මඩුකුඩම් තැනීමට සහ සැරසිලි කිරීමට බොහෝ ශිල්පීහු පැමිණියාහ. මෙයින් ඇතමුහු ගෙඹිම සමතලා කිරීමට පටන්ගත්හ, ඇතමුහු දඩු ගෙණ ඒමට පටන්ගත්හ, ඇතමුහු දඩු සැකීමට පටන් ගත්හ, ඇතමුහු වළවල් කැණීමට පටන්ගත්හ, ඇතමුහු කණු සිවුවන්ට පටන්ගත්හ, ඇතමුහු අතුශාලා මැසීම කිරීමට පටන්ගත්හ, ඇතමුහු අතුශාලා තැනීමට පටන් ගත්හ, ඇතමුහු තනනලද ශාලා සෙවිලිකිරීමට පටන් ගත්හ, ඇතමුහු නානා විධ අලඞ්කාදිය තැනීමට පටන්ගත්හ, ඇතමුහු මාවත් දෙපලවර කණු සිටුවන්ට

පටන්ගත්හ, ඇතැම්හු කඩදාසි කර්මාන්ත කිරීමට පටන් ගත්හ, ඇතැම්හු ගොප් ගෙතිලි, මල් ගෙතිලි, ආදිය පටන්ගත්හ, ඇතැම්හු ගොබ, වනස්ස, මල්, ධජ ආදියෙන් සරසන්ට පටන්ගත්හ. මෙසේ සකල කටයුතු නිමාවට ගියකල, නා නා විධ දිශාවලින් සිංහල ඉංග්‍රිසි, බර්ගර්, දෙමළ, බංගාලි, ජා, අරාබි, හෙට්ටි ආදී සේනාව මේ අසලට රැස්වෙන්ට පටන්ගත්හ. මෙදින ද සොයිසා පවුලට සහ බන්ධු මිත්‍රාදීන්ට උත්සව දෙකක ව්‍යාවෘත වීමට සිදුවී තිබුණේය. යුසෙව් ද සොයිසා මුදලිතුමා විසින් ස්ථාපිත කරවන ලද පාණදුරේ ශුද්ධ යොහන්ගේ දේවමන්දිරය දෙව්මෙහෙයට කැපකිරීම සම්බන්ධ උත්සවය මෙදින උදය කාලයේ පාණදුරේදී සිදුවූ හෙයින් මෙඋත්තමයින්ට ඒගැණ ව්‍යාවෘතවීමටද, සවස් භාගයේ මෙම උත්සවය සඳහා මොරටුවේ ව්‍යාවෘතවීමටද සිදුවී තිබුණේය. දසඅතින් සපැමුණු මහත් සේනාව සවස්භාගයේ ඒක්රාශි වීමෙන් මෙම සරසන ලද ගෙබිම මණ්ඩලය මහත් සිරි දැරිනා.

මෙකී උත්සවය දැනගත් නුවණැති සත්පුරුෂ ජනයා පරාර්ථකාමී ද සොයිසා තුමගේ උභයලෝකාර්ථ මෙකී සත් චරිතය මනා අලංකාර කරමෝයයි අදහස් කරණ ලදින්, ගරුතර ආණ්ඩුකාරතුමාගේ ගමනා ගමන ගෞරවය සඳහා වැල්ලවත්තේ කෝන්ගස්ලඟ සංඝිය නම් ප්‍රකට ස්ථානයේ, බස්තියන් ප්‍රණාන්දු මහත්මයා විසින් නානාවිධ පලතුරු සහිත අලංකාර මහ තොරණක් ස්ථාපිත කරවිය ඒ මධ්‍යයෙහි (Welcome Rt. Honourable Sir. W. H. Gregory) **අති වංශාධිපති ශ්‍රීමත් ඩබ්ලිව්. එච්. ග්‍රෑගරි උතුමානන් වහන්සේ ප්‍රශන්නභාවයෙන් පිළි ගණිමු.** යන වචන ඉංග්‍රීසි අකුරෙන් මොනවට සිතියම් කර තිබුණේය. දෙහිවල පාලම සමීපයේ පටන් රත්මලාන දක්වා මහ මාවත දෙපස ගොප්, කොඩි, මල් ආදියෙන් සරසා තිබුණේය. මෙඅතර දෙහිවල පේද්‍රික් ප්‍රේරා විජයරත්න ජයවර්ධන පීස්බපිසර මහත්මයාගේ



THE PRINCESS OF WALES' GIRLS' ANGLO-VERNACULAR SCHOOL, MORATUWA.

මොරටුවේ වේල්ස්හි රාජකුමරියගේ ඕහාමා ගැහැණු පාඨශාලාව.

SINHALESE DAILY NEWS PRESS. PETTAH COLOMBO.

නිවස ඉදිරිපිට මාහැනි මහ තොරණක් තනා එය ගෙඩි වළු වගීයන්ගෙන් සහ ලෑණ ධජ මල් ආදියෙන් විපුලාකාර මොනවට සරසා ඒ මඩයෙහි පෙරභාගයේ (God Bless our Governor) **දෙවියන්වහන්සේ අපේ උතුමානන්වහන්සේට ආශීර්වාද කරණ සේක්වා!** යනු වෙන්ද, පසුභාගයේ (Welcome our Governor) **අපේ උතුමානන්වහන්සේ ප්‍රශනනාවසෙන් පිළිගණිමු.** යන වචන ඉඩ්‍රිසි අකුරෙන් සිතියම්කොට යටොකන පිස් ඔපිසර මහත්මයාද ඒ සමීපයේ පදිංචි නොතාරිස් මහත්මයාද, අන්තෝනි බොතේජු ජයතිලක කරුණා රත්න මුහන්දිරම් මහත්මයාද යන මහතුන් පෙදෙන විසින් මහත් විසදමක් දරමින් කර තිබුනේය.

ගල්කිස්සේ එඩගලන්න සභාවේ දෙවසථානයට නුදුරුව ඉතා අගයැති තොරණක් තනා නිල් තෑණ පුල්මල් ආදියෙන් සරසා තිබුනේය. මෙම තොරණ හැන්රිකස් ප්‍රදිනාන්දු ගුරු මහතා සහ ජොහානස් ප්‍රණාන්දු මහතාත් විසින් කරණ ලද්දකි.

රත්මලානේ බැඳ තිබුන තොරණ ඉතා අලඩකාර දුටුවන් නෙත් සිත් පිණවන එකකි. ජොහානස් ප්‍රණාන්දු සාමදුන මුලාදුනි මහත්මයා ප්‍රධානව මෙම තොරණ කළ බැව් පෙණේ. රත්මලානය පටන් කුරුඳුවත්ත කොළවර දක්වා මග දෙපස ආරුක්කු නමා ගොජ් වැඩ කර තිබුනේය. ද සොසිසා වලව්ව දෙරටුවේ මාහැනි තොරණක් බැඳ ඉතා රුවට සරසා කෙහෙලි රාශියකගෙන් අලඩකාරකොට තිබුනේය. මෙපමණකුදු නොව ඝිතැනි මහතුන් විසින් මාගීයේ තැනින්තැන ලෑණ තොරන් බැඳ එකී තොරන් විවිධාකාර ගෙඩි වළු ආදියෙන්ද, කොඩි ආදියෙන්ද, මල් වුනස්ස ආදියෙන්ද, මොනවට සරසා තිබුනේය. වලව්වේ තොරණ ලඟ සිට මග දෙපස ඉතා ලෑණට සැරසිලිකර තිබුනේය. මෙකී සැරසිලි සිල්වේසත්‍රි ප්‍රණාන්දු විත්‍රමසේකර කරුණාරත්න

විසූන ආරච්චි මහතා ප්‍රධාන ගම්වාසීන් විසින් කරවන ලද සැරසිලි බව දැනගන්ටලැබී තිබේ. තවද ශාස්ත්‍ර ශාලා පිහිටුවීමට නියම රම්‍ය භූමියේ දෙරටු දෙක ලඟ තනාතිබුන තොරන් දෙක ඉතා උසස් විධියේ තොරන් දෙකකි. ඊට මහත් මුදලක් වියදම්ව තිබුනා පමණකුදු නොව මනා දක්ෂිනිය තොරන් දෙකක්විය. එසින් එකක් වන හතරැස් ගෙඩිගෙයි කර තිබුන සමරි වැඩ අතුරෙන් ඉඞ්‍රීසි අකුරෙන් සිතියම් කරණ ලද අක්ෂර ඉතා මාහැගි විය. එම තොරණේ නැගෙණහිර පස (Holy Emmanuel Welcome our Lord Bishop) **බිෂොප් සේමින්ට ශුභ සිඛවේවා!** යනුද, බස්නාහිර පස (Amor Patriac, College of Prince and Princess of Wales') **රටට ඇති ආදරයක්, වේල්ස්හි කුමාරයාගේ සහ කුමාරිගේත් පාඨශාලාව** යනුද, දකුණුපස (Welcome our Governor) **අපගේ උතුමානන්වහන්සේ ප්‍රශනනනාවෙන් පිළිගණිමු.** යනුද උතුරුපස (Welcome Rt. Honourable Wm. our Governor) **අති වංශාධිපති ශ්‍රීමත් විලියම් නම් අපේ උතුමානන් වහන්සේ ප්‍රශනනනාවෙන් පිළිගණිමු.** යනුද ඉතා ලක්ෂණට කර තිබුනේය. වෂී එක්දහස් අටසිය සැත්තෑ සයේ සැප්තැම්බර් මස දසසතර වෙනි ගුරු (1876. සැ. ම. 14) දින පස්වරු දෙකේ කණ්ඩායමට උතුමානන් වහන්සේ සහ පිරිසද, ධම්මා චාර්‍ය්‍ය හොපොල්ස්වන් බිෂොප් තුමාද, ද සොසියා මහතුන් සමග මොරටුවේ ශුඛ ඒම්මානුවෙල් දෙවස්ථාන යට පළමුවෙන් පැමිණියහ. බිෂොප්තුමා ඇතුළු ඉඞ්‍රීසි සඞදෙශික පාදිලි උන්නාන්සේලා රාශියක්ද, ඉඞ්‍රීසි ජාතිකාකාර රාඤවුවක්ද, පිට සමාගම්වලට අයිති දෙව ගැනිවරු සමූහයක්ද, නිනිඳුවරු, පත්‍ර කර්තෘවරු, මුදලි මුහන්දිරම්වරු, ගෝලයින් පිරිවරාගත් ගුරුවරු, ප්‍රසිඛ මහ සභාවරවරු ආදි ගරු පිරිසක් ශුඛ ඒම්මානුවෙල් දෙවස්ථානයේ තුළ සහ දෙවස්ථාන අඞ්ගනයෙහිද අතුරු සිදුරු නැතිව රැස්ව සිටියහ. ගරු බිෂොප්තුමා අවශෙෂ දෙව ගැනිතුමන්ගේ ආධාර ඇතුව ශාස්ත්‍රශාලා සම්බන්ධ දෙව මෙහෙය පවත්වන ලදින් අවසානවූ ඉක්බිති ගල තබන

ස්ථානයට යාමට සැරසුන කල, උඩරට නිලමේවරු මෙන් හැඳ පැලඳගත් සයදෙනෙකු විසින් අලඞ්කාරලෙස සජ්ජිතකළ මුකතණ්ත්‍ර උතුමානන් වහන්සේගේ සහ බිෂොප්තුමගේ ශිෂ්‍යාවරණ කොට අල්වා ගන්නා ලදින් මහත් උත්සවයෙන් ගල තබන ස්ථානය බලා ගමන්ගත්හ.

ඉක්බිති පොලිස් "බෑන්ඩ්" කණ්ඩායම තූර්‍යනාද පවත්වමින් පෙරටුවටද, පිතර් ප්‍රණන්දු තරුණ මහතා විසින් මහත් වියදමක්කොට සූදානම් කරණලද විසිතුරු වැඩ සහිත නා නා වණ්ණ කොඩි හැටක් (60) අත්ගත් ගෑණු ලමෝ දෙසිය හැත්තෑ දෙදෙනෙක්ද, (272) තවත් පිරිසිදු ලෙස හැඳ පැලඳගත් එක්දහස් සතළිස් අටදෙනෙකුගෙන් යුත් (1,048) පිරිමි ලමෝ කාණ්ඩයක්ද, සතරදෙන බැගින් යෙදී ගමන්ගත්හ. කොඩිවල යොදුනිබුන සමහර වචන නම්:—"Prince and Princess of Wales, H. R. H. the Prince of Wales, H. R. H. the Princess of Wales, Long Live the Queen, Union is Might, Union is Light, V. R. Hope" වේල්ස් කුමාරයානෝ සහ වේල්ස් කුමාරිකාවෝය, මහාරාජිනීන් බොහෝකල් ජීවත්වේවා, එකඟකම බලයය. එකඟකම ආලෝකයය, වික්ටෝරියා රාජිනිය, බලා පොරොත්තුව, යනුය. මෙසේ මහත් උත්සවයෙන් මෙම පෙළහර පිරිස ගල තබන ස්ථානයේ තනා තිබුන සරසන ලද මඩුවට සම්ප්‍රාප්තවූ කල්, පලාතේ දෙවගැති තැන්පත් ගෞරවනිය ඒබ්‍රහම් මැන්දිස් උන්නාන්සේ විසින් සතුති පත්‍ර දෙකක් කියවන ලද්දේය.

To His Excellency the Right Honourable

SIR WILLIAM HENRY GREGORY, K. C. M. G.,

Governor and Commander in Chief of the Island of Ceylon and the Dependencies thereof, &c., &c., &c.

Presented on the occasion of his laying the foundation stone of the Prince and Princess of Wales' Colleges at Moratuwa, September 14, 1876.

May it Please Your Excellency,

We, too, the children of Moratuwa and its neighbourhood who have the happiness of being present on this memorable occasion of laying the Foundation Stone of the Prince and Princess of Wales' Colleges, desire to thank Your Excellency for kindly consenting to be present and showing your interest in our welfare.

We feel that it is for us that these buildings are to be erected, and we know not how to express our gratitude for the proof thus afforded that His Royal Highness the Prince of Wales, and your Excellency, are the children's friends.

Mr. C. H. De Soysa, the benevolent founder of these Colleges, deserves far more gratitude and thanks than we can ever hope to show; but we trust that we and our successors by our diligent use of the means of improvement thus provided, will give proof that we throughly appreciate his great kindness towards us.

We will make it our great endeavour to realize that a solemn responsibility rests on us; and in fact, that the success of these Institutions depends in a great measure on our efforts. If we, by regularity of attendance, obedience to our teachers, diligence in study, and practical application of what we here learn to our daily life, make a good use of these Colleges we shall grow up to be good and useful members of society; and the purpose for which these buildings are erected will be realized.

THE PRINCE OF WALES' SINHALESE SCHOOL, MORATUWA.
වේල්ස් සිංහල පාඨශාලාව, මොරටුව.

LARGE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

We trust that our parents will be our best friends in enabling us to derive the full benefits to be obtained here; for we have reason to fear that sometimes we may, child-like, feel inclined to become dilatory and discouraged in the pursuit of knowledge; and then, if by encouragement or rebuke they assist us, we shall renew our efforts to improve.

From the lack of the education to be provided here, we are unable to give adequate expression to our feelings; but we trust that Your Excellency will pardon our deficiencies in this respect, and accept as a proof of our thankfulness that which children are able to give, namely,

Three cheers for their Royal Highnesses the Prince and Princess of Wales.

Three cheers for Your Excellency.

Three cheers for Mr. C. H. De Soysa.

(මෙහි සිංහල පිටපත.)

අතිවංශාධිපති **ශ්‍රීමත් විලියම් හැන්රි ග්‍රෑගර්** ගරුතර ආණ්ඩුකාර උතුමානන්වහන්සේ වෙත ඔප්පුකර සිටින වගනම:—

ගරුතර ආණ්ඩුකාර උතුමානන්වහන්ස,

මොරටුව සහ ඒ අසල ගම්වල සිටින්නාවූ, වේල්ස් කුමාරයානන් සහ කුමාරිකාවන්ගේත් නාමවලින් පිහිටුවන ශාස්ත්‍රශාලාවල අත්තිවාරම් ගල තැබීමේ සිහිකටයුතු මේ ප්‍රසංගවට මෙහි පැමිණ සිටින ලමයිවූ අපිත් අපේ ශුභසිද්ධිය සඳහා තමුන්නාන්සේ දැන් ලහාවී සිටින නිසා සතුටිකරන්ට සතුටුව සිටිමු.

මේ ගොඩනැගිලි සාදන්ට තිබෙන්නේ අප නිසායයි හැඟෙනවාය. තවද වේල්ස් කුමාරයානන්වහන්සේ සහ තමුන්නාන්සේ ලමයින්ගේ මිත්‍රශීන්ව සිටින බව ඔප්පුවී තිබෙන නිසා ඒ ගැන අපි කෙළෙහිගුණ සලකන බව කොයි ආකාරයෙන් පෙන්වා සිටිමුද කියා නොදනිමු.

මේ ශාස්ත්‍රශාලා පිහිටුවන ත්‍යාගිවනන සී. එච්. ද සොසියා උන්නාන්සේ, අප විසින් පෙන්වන්ට බලාපොරොත්තුවෙන තරමට වඩා කෘතොපකාර ලබන්ට වසිනවාය. නුමුත් උන්නාන්සේ අපට පෙන්නුවාවූ කරුණාවනතකම අප සහ අපට පසුව මෙහි ඉගෙණගන්නා ලමයින් විසින් කඩිසරලෙස දියුණුවීමෙන් ඔප්පුකරනු ලැබේයයි විශ්වාස කරමු.

අපපිට පවරා තිබෙන සුසිලවන්තවූ යුතුකම් ඉෂ්ට කිරීමට අපි බොහෝසෙයින් වීර්‍ය්‍ය කරන්නෙමු. ඇත්තටම මේ ශාස්ත්‍රශාලාවල වර්ධනය බොහෝසෙයින්ම අපේ උත්සාහයට දරාතිබේ. අපි නිතර ශාස්ත්‍රශාලාවට ඒමෙනුත්, කඩිසරලෙස ඉගෙණගැණීමෙනුත්, අපි ඉගෙණගන්නා දේවල් නිතර ව්‍යවහාර කිරීමෙනුත්, අපි වැඩිවයසට පැමිණෙනකල ප්‍රයෝජනවත් අයවලුන් වෙනවා ඇත. එවිට මේ ශාලා පිහිටුවනලද අභිප්‍රාය ඉෂ්ට වෙනවා ඇත.

මේ සථානයෙන් ලබාගන්ට තිබෙන සියලුම ප්‍රයෝජන අත්පත්කර ගැණීමට අපේ දෙමව්පියෝ ඉතා හොඳ මිත්‍රයෝ වෙනවා ඇතැයි විශ්වාස කරමු. මක්නිසාද අපි සමහරවිට ලාමකව ඉගෙණගැණීමට අධෛර්‍යවෙන්ට පුළුවන. එවිට ඔවුන් අපට අනුබලදී ආධාර කලොත් වැඩිදියුණුවීමට අපට ශක්තිය ලැබෙනවා ඇත.

ඉගෙණගැණීමට තිබෙන අඩුපාඩුකම් පිරිමසා ඊට ඔනෑකරණ සියල්ල සම්පාදනයකර තිබෙන්නාවූ මේ සථානය ගැණ අපේ හැතිම නිසිලෙස කියා සිපින්ට අපට නුපුළුවන් නමුත්, අපේ අඩුපාඩුකම් සියල්ලට තමුන්නාන්සේ සමාවී ලමයින් විසින් දෙන්නාවූ සතුතිවලට සාක්ෂියක් වශයෙන් වේල්ස් කුමාරයානන් සහ කුමාරිකා වන්ටත් තුන් විටක් ප්‍රශංසා කිරීමද, ගරුතර ආණ්ඩුකාරවූ තමුන්නාන්සේට තුන්විටක් ප්‍රශංසාකිරීමද, සී. එච්. ද සොයිසා උන්නාන්සේට තුන්විටක් ප්‍රශංසාකිරීමද, පිළි ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

To His Excellency the Right Honourable

SIR WILLIAM HENRY GREGORY, K. C. M. G.,

Governor and Commander in Chief of the Island of Ceylon and the Dependencies thereof, &c., &c., &c.

PRESENTED ON THE OCCASION OF HIS LAYING THE FOUNDATION STONE OF THE PRINCE AND PRINCESS OF WALES' COLLEGES AT MORATUWA, SEPTEMBER 14, 1876.

May it Please Your Excellency,

We, whose signatures are hereunto annexed, beg to approach Your Excellency with feelings of profound respect, and to avail ourselves of the present opportunity of giving expression to our sentiments as loyal subjects of the British Crown. We rejoice at Your Excellency's presence amongst us to-day, and the opportunity thus afforded us of testifying our deep sense of the many and great blessings we enjoy under British rule, and the schemes of benevolence for which we are particularly indebted to Your Excellency's administration of it in Ceylon. But the most prominent event, which has characterized Your Excellency's Government and has left a lasting impression on our minds, *viz.*, the visit of His Royal Highness the Prince of Wales to our land, and in connection with it his consenting to honor with his patronage the two Colleges at Moratuwa, specially demand a recognition from us on the present occasion.

With the object of perpetuating the remembrance of His Royal Highness' Visit, and at the same time of manifesting his loyalty, and advancing the interests of his countrymen, morally and intellectually, Mr. C. H. De Soyza resolved to establish, in the names of His Royal Highness and his illustrious Consort, the two colleges the foundation stone of which is to-day so auspiciously laid.

The desirability of having superior educational establishments in a flourishing district like this, has long been deeply felt. The fact that existing Institutions are insufficient to meet the increasing desire for education in the Island, the great expense that is necessarily incurred in the education afforded in

them, the unduly large number of pupils by whom every superior school is crowded, are, in our humble opinion, some of the reasons that point to the desirablity of such an establishment as that now commenced.

We hope that, by means of these Institutions, the memories of their Royal Highnesses will be immortalised as their greatness deserves, while at the same time the enlightenment and the happiness of our countrymen, their loyal subjects, will be promoted

Though His Royal Highness the Prince of Wales was welcomed throughout India with public manifestations of loyalty and dutiful affection, and by tokens worthy of a Prince's acceptance, and although our Island forms but a very small part of the vast dominions of the Queen, yet the present memorial of his visit, we humbly believe, is inferior to none of its kind having regard to the permanent utility of the object aimed at, and the liberality manifested by its founder.

We desire heartily to express our wish for the success of this undertaking, and our hope that it will be crowned with success.

We sincerely thank Your Excellency for the kind interest which your presence on this occasion manifests. And finally we beg to express our feelings of gratitude to His Royal Highness for this special boon conferred on us, and of warm attachment to Her Majesty, our most gracious Queen; and we request that your Excellency may be pleased to communicate these our humble sentiments to His Royal Highness the Prince of Wales, our future Sovereign.

(Sigd.,)

C. H. De SOYSA. &c.

———:o:———

(මෙහි සිංහල පිටපත.)

ගරුතර ආණ්ඩුකාර අති වංශාධිපති **ශ්‍රීමත් විලියම් හැන්රි ග්‍රෑගේ** ලංකාවිපයේ උතුමානන්වහන්සේ සහ ප්‍රධාන සේනාධිපති තැනන්නාන්සේ වෙත ඔප්පුකර සිටින වගනව්.

ගරුතර ආණ්ඩුකාරයානන්වහන්ස,

මෙහි අත්සන් කරණ ලද අපි බ්‍රතාන්‍ය ආණ්ඩුවේ විශ්වාස යටත්වාසීන්මෙන් මේ අපේ අදහස් කියාදෙමින් ප්‍රයෝජන ලබාගන්නා පිණිස තමුන්නාන්සේ ඉදිරියට මහත් සැලකිමෙන් ලහාවෙන්ට අවසර ඉල්ලමු. අද දවසේදී අප අතරට තමුන්නාන්සේගේ ප්‍රවිෂ්ටවීම ගැනත් බ්‍රතාන්‍ය ආණ්ඩුව යටතේ අපි භුක්තිවිඳින්නාවූ අනේක ආශීර්වාද ගැන අපේ විශාල හැගීම ඔප්පුකර සිටීමට ප්‍රසාදයක්ද ඒ ආණ්ඩුව යටතේ ලංකාවේදී තමුන්නාන්සේ ඉෂ්ටකර දෙන්නාවූ කරුණාවන්ත විධි පණත් ගැන අපි නයව සිටින බව දන්වා සිටින්ටද ලැබුන බැවින් ප්‍රීති වෙමු. නුමුත් තමුන්නාන්සේගේ ආණ්ඩුකාරකම යටතේ සිදුවුනාවූ ඉතා ප්‍රසිද්ධ කාරණයක්වන මෙරටට වේල්ස් රාජ කුමාරයානන් වහන්සේගේ සම්ප්‍රාප්තවීම කරණකොට ගෙන උන්නාන්සේගේ ගෞරවය පිණිස උන්නාන්සේගේ නාමයෙන් ශාස්ත්‍රශාලා දෙකක් සෑදීමට කැමැත්ත දීම ගැන ප්‍රධානකොටම මේ ප්‍රසාදවේදී දන්වා සිටිමහ.

ඒ උත්තම කුමාරයානන්ගේ ප්‍රවිෂ්ටවීම සිහි කරණ පිණිසත් රාජපාක්ෂිකකම ප්‍රකාශ කරණ පිණිසත් තමන් රටවාසීන්ගේ සුචරිත ගුණධර්ම්‍ය සහ ශාස්ත්‍ර පුහුණුවීම දියුණුකරණ පිණිසත් ඒ කුමාරයානන් සහ ඒ කීර්ත්‍යාත්මත් කුමාරිකාවන්ගේ නාමයෙන් ශාස්ත්‍රශාලා දෙකක් පිහිටුවීමට බලාපොරොත්තු වෙමින් අත්තිවාරම් ගල අද දවසේදී තැබීමට යෝජනාකර තිබේ.

වර්ණන වෙන්නාවූ පලාතක් වන මෙයාකාර පලාතක උතුම් අඩියක ශාස්ත්‍ර පුහුණුවීම ඕනෑ බව දිසී කාලයක සිට හැඟි තිබුනේය. මේ දිවයිනේ දැනට තිබෙන ශාස්ත්‍රශාලා (ඉගෙණගන්නන්ගේ ආශාවේ තරමට පුහුණු වීමට) ඉඩ නැති කමද ඒවායේ පුහුණුවීමට ඕනෑවූ මහත් වියදමද ඒ පාඨශාලාවලට රුස්වෙන ලමයින්ගේ ගණන විශාලව තිබෙන එකද යනාදිය මේ වැඩේ පටන්ගන්ට ආශාවක් හටගත් කාරණා බව යටත්ලෙස කියාසිටිමු.

මේ ශාස්ත්‍රශාලා කරණකොටගෙණ ඒ රාජකීය උත්තම යින්ගේ නාමයන් නිලතුරු සිහිපත්වෙන අතර උන්නාන් සේලාගේ යටත් වැසියන් වන අපරට වාසීන්ගේ වාසනා වන්තකමත්, වර්ණනයත් සිදුවේයයි ප්‍රාර්ථනා කරමිහ.

ප්‍රසිද්ධ රාජපාක්ෂික කමෙන් හා ආදරණීය ගෞරව යෙන් ඒ කුමාරයානන්වහන්සේ ඉන්දියා වාසීන් විසින් පිළිගත් නමුත්, තවද මහාරාජිනීන්ගේ රාජ්‍ය අතරෙන් අපේ ඒපය ඉතා කුඩා කොඨාසයක් වී නමුත් කුමාරයා නන්ගේ සම්ප්‍රාප්තවීම සිහිවීමට කළාවූ වැඩ අතරෙන් මේ ශාස්ත්‍ර ශාලාව තෑගිවන්න ලෙස ගොඩනගණ මහත්මයා පෙන්නූ ගෞරවය සුළු එකක් නොවේයයි යටත්භාවයෙන් විශ්වාස කරමු.

මේ ශාස්ත්‍රශාලාවේ වැඩ වර්ණන වෙනු දකින්ට අපි මුළු හිතින් අශාවෙන බව කියා සිටිමු.

නමුන්නාන්සේ මේ වේලාවේදී ලහාවී සිටින බැවින් අපි අවංකලෙස සතුති කරමහ. තවද අපට ලැබුන මේ විශෙෂ දිමනාව ගැණ ඒ උත්තම කුමාරයානන් කෙරෙහි තිබෙන ඔකලෙහිගුණ සැලකීමත් අපේ කරුණා භරිත මහාරාජිනින්වහන්සේ වෙත තිබෙන අපේ මහත් සැලකිලිවන්තකමත් දන්වා සිටින ලෙස අනුහිමකොට අපි ඉල්ලා සිටිමු.

(අත්සන්කෙළේ,)

සී. එච්. ද සොයිසාතුම සහ
තවත් මහත්වරු.

බිෂොප් උන්නාන්සේ සමාධිලෙස කථාකොට මේ ශාස්ත්‍රශාලාව පිහිටුවීම බොහෝදෙනාගේ දියුණුවට මහත් ආධාරයක් බවත් මෙ ප්‍රස්තාවේදී මෙපමණ මහත් සමූහයක් රැස්වී සිටින එක බොහෝ ධෛර්‍ය්‍ය උපදවන කරුණක් බවත්, මේ ශාස්ත්‍රශාලාව ද සොසිසා උන්නාන්සේගේ ගෞරවය උදෙසා නොව බොහෝදෙනාගේ ශුභ සිද්ධිය සඳහා සාදුදෙන බවත් උතුමානන්වහන්සේ මේ රැස්වීමට ලහාවී මේ ගල තැබීම ප්‍රීතිවීමට කරුණක් බවත් කියේය. මේ අතරේදී සමූහයා කීපවිටක් ප්‍රීතිඝෝෂා කළෝය.

———:o:———

ආණ්ඩුකාර උතුමානන් වහන්සේගේ කථාව.

———

බිෂොප් සාමිනි, ද සොසිසා මහත්මයානනි, නෝනා වරුණි, මහත්වරුණි,

මේ ප්‍රස්තාවේදී මේ ස්ථානයට පැමිණ මෙ ගල තැබීමට අතිශයින්ම සතුටුව සිටිමි. අද උදේ මම සාක්ෂිකාරයෙක් වුනාවූ ඒ වැඩේ (පාණදුරේ ශුද්ධවූ යොහන්ගේ දෙව ස්ථානය) උතුම් ආදර්ශයක්ය. එනම්, මහත් වස්තුවක් ලබාගෙණ සිටින මහතෙක් එයින් කොටසක් යහපත් අභිප්‍රාවක් පිණිස වෙන්කරණ ලද්දේය. ඒ වැඩේ වර්ධනවීම දකින්ට මුළු හිතින්ම ආශාවෙන්නෙමි. අපි දැන් මෙහි රැස්වී සිටින්නේ ලඞ්කාවාසීන්ට අප්‍රමාණ ප්‍රයෝජන ගෙණ දෙනවා ඇතැයි මා විශ්වාසකරණ ශාස්ත්‍රශාලාවක අත්තිවාරම් ගල තැබීමටය. ඒ ශාලාවෙන් බොහෝ දෙනාගේ සුචරිත ගුණධර්මයත් ශාස්ත්‍ර පුනුරුජ්ජීවීමත් ඉටුවෙනවා ඇත. මෙ අත්තිවාරම් ගල තැබීමට මා මහත් සන්තෝෂයෙන් සිටින බව සත්‍යකරකර කියන්ට පුළුවන. (සමූහයා ප්‍රීති හඬ පැවැත්තුවෝය.)

උතුමානන්වහන්සේගේ කථාවෙන් පසු ගලනැබීම සම්බන්ධ කෘත්‍යයට සුදුසුවම ගොඩනැගිල්ලේ සිතියම (Plan) හොඳුකාර බලා ඉන්න ප්‍රිතිවිය. මින්පසු ගලේ

කොටා තිබුන වාක්‍යය බලා එසේම ප්‍රතිවිය. එහි කොටා තිබුන ඉඞ්ග්‍රීසි වාක්‍යය මෙසේය:—(Founded by C. H. De Soysa, A. D. 1876) මෙහි තේරුම, චාලිස් හැන්රි ද සොයිසා විසින් ක්‍රිසතු වෂ එක් දහස් අටසිය සැත්තෑසයේ (ක්‍රි. ව. 1876) පිහිටුවනලදි—යනුය. තවද නිදන්වලේ තබන පිණ්ස ඒ කාලේ ලංකාවේ වලඬහුවුන මුදල්ද, වීද, එවකට පැවතුන ප්‍රවෘත්ති පත්‍රද වීදුරු භාජනයක අසුරා පිළියෙළකොට තිබුනේය. තවත් වීදුරු භාජනයක රත්රනින් මුද්‍රණය කරණලද ලියවිල්ලක්ද බහා තිබුනේය. ඒ ලියවිල්ල මෙසේය:—

"දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිසතුස්වහන්සේගේ ගෞරවය පිණිස චාලිස් හැන්රි ද සොයිසා විසින් පිහිටුවන ලද වේල්ස් කුමාරයානන් සහ කුමාරිකාවන්ගේ ශාස්ත්‍ර ශාලාවේ කොණේ ප්‍රධාන ගල අපගේ ස්වාමීන්වහන්සේගේ වෂයෙන් එක්දහස් අටසිය සැත්තෑ හයක්වූ සැප්තැම්බර් මාසේ දසසතර වෙනි (ව. 1876 සැ. ම. 14) දින වික්ටෝරියා මහාරජිනීන්වහන්සේගේ ආණ්ඩුවේ 39 වෙනි වෂයේදී වංශාධිපති ඒ. ඇන්. බර්ච උන්නාන්සේද අග්‍ර ගෞරවනීය ධර්මාචාර්‍ය ආර්. ඇස්. කොපොල්ස්ටන් කොළඹ බිෂොප් ස්වාමීන්ද, ඒ. වයි. ඇඩම්ස් උන්නාන්සේද, ගෞරවනීය ඒ. මැන්දිස් මොරටු පලාතේ දේව ගැති තැනද, ඇස්. ද සොයිසා දිසානායක වාසල මුදියන්සේ රාළහාමිද, ඉදිකිරිමේ ශාස්ත්‍රධාරිවූ ජේ. මැන්දිස් ජයවර්ධන වාසල මුහන්දිරම් මහත්මයා සහ තවත් අයද අභිමුඛවේදී ගරුතර ආණ්ඩුකාර ශ්‍රීමත් විලියම් හැන්රි ලුෂිංටන් ලඞ්කාවේ උතුමානන් වහන්සේ විසින් තබන ලද්දේය."—යනුය.

උතුමානන්වහන්සේ මෙකී වස්තු නිදන්වලෙ මොන වට තැන්පත්කොට ගල තැබූහ. (සමූහයා මහත් ලෙස ප්‍රීතිඝෝෂා පැවැත්තූහ.) චාලිස් හැන්රි ද සොයිසාතුම මේලහට කථාකොට, මේ ප්‍රස්තාවේදී උතුමානන්වහන්සේ

මෙහි පැමිණුනාටත් මේ ගැණ උන්වහන්සේ ගත් වෙහෙස මහන්සිවලටත් සතුතිකරණ බවද මේ ශාස්ත්‍රශාලාව සම්බන්ධ බිෂොප් උන්නාන්සේටද, මෙහි සැරසිලි ආදිය සහ වෙනත් වැඩ කළ සියලු මිත්‍රයින්ටද සතුතිකරණ බව සහ බිෂොප් උන්නාන්සේ ප්‍රධානකොට ඇති සියලුදෙනා විසින්ම මේ ශාස්ත්‍රශාලා ගැණ මතු මත්තෙහිත් වෙහෙස ගන්නවා ඇත යනු විශ්වාස කරණ බවද ඉතා මිහිරිලෙස ප්‍රකාශ කරණලදි. (අත්පොළසන්දීම.)

වචන සඵලයක් කථාකරණලෙස බිෂොප් උන්නාන්සේ විසින් ගෞරවනීය ජෝන්ස් උන්නාන්සේගෙන් ඉල්වන ලදින් සිංහල භාෂාවෙන් එතුමා මෙසේ කථාකෙළේය:—

මෙහි රැස්වී සිටින ක්‍රිස්තියානි මිත්‍රවරුන්ට කථා කිරීම උන්නාන්සේගේ යුතුකමක් බවද, ද සොසිසා මහත්වරුන් විසින් ලඬකාවාසින්ට ඉතා ප්‍රයෝජනවූ වැඩ බොහෝමයක් බොහෝ පලාත්වල කරදී තිබෙන බවද, මෙ ශාස්ත්‍ර ශාලාවෙන් මේ පලාත්වාසින්ට අප්‍රමාණ ප්‍රයෝජන ලබන්ට පුළුවන්වෙන බවද, එකී ප්‍රයෝජන අත්කරගණිමින් එයින් දියුණුවීමට සියලුදෙනම උත්සාහ දැරියයුතු බවද ප්‍රකාශකොට ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේ මේ පලාතට වැඩමකර මෙකී ශාස්ත්‍රශාලාවේ ගල තැබීම ගැණ උන්වහන්සේට සතුතිවශයෙන් ප්‍රීතිඝෝෂා කිරීමට සමූහයාගෙන් ඉල්ලා සිටියේය. (සමූහයා මහත්සේ ප්‍රීතිඝොෂා පැවැත්තූහ.)

පලානේ දේවගැති තැන්පත් ගෞරවනීය ඒ. මැන්දිස් උන්නාන්සේ ඉඛ්‍රීසි භාෂාවෙන් කථාකළහ. ඒ කථාව මෙසේය:—

ගරුතර ආණ්ඩුකාරයානන් වහන්ස, බිෂොප් සාමීන් වහන්ස, මහත්වරුණි,

අද දවසේදී තමුන්නාන්සේලා මෙහි ලඟාවී සිටීම ගැණත් වේල්ස් කුමාරයානන්ගේ මේ ශාස්ත්‍ර ශාලාව

පිහිටුවන මෙ ත්‍යාගීවන්ත මහත්මයා ගැණත් අපගේ කෙළෙහි ගුණ සැලකීම් පෙන්වා සිටින පිණ්ස ක්‍රියාතියානි කාරයින් ප්‍රධානව මොරටුවේ සෙනග වෙතුවට කථා කිරීමට මට වඩා වෙන කෙණෙකුට අයිතිවාසිකමක් නැතැයි සිතමි.

ගරුතර ආණ්ඩුකාරයානන් සහ ආණ්ඩුවේ වැදගත් මහත්තැන් කීපදෙනෙකුත් මෙහි පැමිණ සිටින බැවින් ලඞ්කාවාසින්ගේ මනු ශුභසිඞ්ය ගැණ මහාරාජිනින්ගේ ආණ්ඩුව කරුණාවන්ත ලෙස සලකණ බව අපි විශ්වාස කරමු.

මේ ඕපයේ ප්‍රයෝජනය සඳහා කෙරුණ යහපත් වැඩ අතුරෙන් මෙය ඉතා යහපත් එකකි. තවද, ආණ්ඩු කාරයානන් වහන්ස! මෙරට වාසින් අතරේ, ද සොසිසා යන නාමය ප්‍රසිඩවෙන උතුම් තෑගිවන්තකමේ අනේක වැඩ අතුරෙන් මෙය එකක්ය. සි. එච්. ද සොසිසා උන්නාන්සේගේ පියානන් වන නැසිගිය ප්‍රෝඞ්ස් ද සොසිසා වාසල මුදියන්සේ රාළහාමින්නාන්සේ මළ නමුත් තවම කථාකරති. උන්නාන්සේ විසින් උඩරට සහ පහතරට කරනිබෙන්නාවූ නානාප්‍රකාර වැඩ ගැණ, එනම්:—මංමාවත්ද, පාලම්ද, අම්බලම්ද, පාඨශාලාද, මා මෙහෙකරන්නාවූ අර මාහැඟි පල්ලියද (ශුඩ එව්මානුවෙල් දෙවස්ථානය) යනාදිය ඒ උතුම් මනුෂ්‍යයාගේ යහපත් ක්‍රියාවල් ගැණ කථාකරන්නේය. තවද ඒ සියල්ල නිසා උන්නාන්සේ ගෞරව සැලකීමෙන් අප විසින් සිහිකට යුතුව තිබේ. උන්නාන්සේගේ සහෝදරවූ දැන් මෙහි සිටින ඇස්. ද සොසිසා වාසල මුදියන්සේ රාළහාමින් නාන්සේ තම රට වාසින්ගේ ශුභ සිඞ්ය සඳහා කරන්නාවූ වැඩ ගැණ උන්නාන්සේට වඩා ශ්‍රෙෂ්ඨකම්න් අඩු නැත.

මුන්නාන්සේ කර තිබෙන නොයෙක් වැඩ අතුරෙන් අලුතදී සාදන ලද විද්‍යාලයද, ආරොග්‍ය ශාලාවද, සම්පා දනය කර දී තිබෙන මිනිපිට්ටනියද, වැඩි කාලයක්

යන්ට ප්‍රථම ලඞ්කාවාසි තරුණයින් බොහෝදෙනගේ කරුණාවන්ත මව වෙන්නාවූ මේ ස්ථානයට ලඟාවෙන්ට පළමුවෙන් අද උදය දෙව මෙහෙයට කැප කරණ ලද දෙවස්ථානයද සඳහන් කරමු.

තවද සි. එච්. ද සොසියා උන්නාන්සේ තමාගේ පියානන්ගේ සහ උන්නාන්සේලාගේ පව්ලේ සියලුදෙනා කෙරෙහි පිහිටා තිබෙන උතුම් ජිතෘ ධෙය්‍ය අනුව යමින් කරන්නාවූ මේ උත්කෘෂ්ට වැඩේ ප්‍රයෝජනය ලඞ්කාවේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වා පමණක් නොව දුර රාජ්‍යවලටත් විහිදෙනවා ඇත. යනුය.

මීට පසු මැන්දිස් උන්නාන්සේ උතුමානන් වහන්සේ ගෙන් අවසර ගෙණ සමූහයාට සිංහලෙන් කථාකලෝය. ඒ කථාව මෙසේය:—

ඉගෙණ ගැණීමෙන් ලැබෙන ප්‍රයෝජනය ඉතා මහත්ය. නොයෙක් ජාතිවලට අයත් ලොකු කුඩා සමූහයක් මෙය බැලීමට පැමිණ සිටීම මහත් ප්‍රීතියක් සහ එකඟකමේ ලකුණකි. මේ ශාස්ත්‍ර ශාලාව කරණෙකොට ගෙණ ලැබෙන අභිවෘඞ්ය සියලුදෙනා විසින්ම ලබාගන්ට උත්සාහ කටයුතුය. මේ ශාස්ත්‍ර ශාලාව මෙලොව පර ලොව දෙකට ප්‍රයෝජනවත් කාරණා උගන්වන කල ක්‍රියානියානි ධර්මයටම එකඟව ක්‍රියා කරණ බවටද කරුණු ගෙණහැර දක්වමින් කථාව හමාරකොට "හුරා" යන ප්‍රමෝදී ශබ්දයෙන් උතුමානන් වහන්සේට තුන් වරක් ප්‍රශංසා කරණ ලෙස සමූහයාගෙන් ඉල්ලුවේය. සමූහයා තුන් වරක් "හුරා" යන ශබ්ද නගා ප්‍රශංසා කලෝය. ද සොසියා මහත්වරුන්ට එසේම සතුති කිරීමට ඉල්ලීම නමාට අයත් නොවන වැඩක් නිසා සමූහයා විසින්ම එය කළ යුතු බව මැන්දිස් උන්නාන්සේ ප්‍රකාශ කළ තැන සමූහයා ඉතා මහත්සේ හඬ නගමින් ද සොසියා මහත් වරුන්ට සතුති වශයෙන් "හුරා" ශබ්ද පැවැත්තූහ. පිම

පලාත්වලින් පැමිණි සියලුම මහත්වරුන්ට එසේම සතුති කිරීම යුතු බව මැන්දිස් උන්නාන්සේ විසින්ම මතක් කළ කල සමූහය පැමිණි මහතුන්ට සතුති වශයෙන් "හුරා" ශබ්ද පැවැත්නුහ. ද සොසිසා තුමා නැවතත් සමූහයාට කථාකොට, ශාස්ත්‍ර ශාලාවේ වැඩ හොඳින් කරගැනීමටද වර්ධනයකර ගැනීමටද සියලුදෙනම ආධාරවිය යුතු බවද, රුස්වුනාවූ සියලු දෙන සමඟ උන්නාන්සේ ප්‍රීතිවෙන බවද, වැඩ රාශියක් තිබෙන හෙයින් ආශාවේ ප්‍රමාණයට කථාකර ගැනීමට බැරි නිසා කනගාටුවෙන බවද ඉතා ආදර සැල කිල්ලෙන් ප්‍රකාශකොට මැන්දිස් වාසල මුහන්දිරම් මහත් මයාගෙන් වචන සඩලපයක් කථාකරණ හැටියට ඉල්ලුවේය. එවිට මුහන්දිරම් මහතා කථාකොට එක්කෙණෙකුගේ උනසහයට වඩා කීපදෙනෙකුගේ උනසාහ බල බවත් ද සොසිසා තුමාගේ තෘප්තිවෙන්න වැඩ ගැණ අවශෙෂ හැමදෙනම අනුබල දියයුතු බවත්, මේ ගැණ නොයෙක් වැඩපල කර වෙහෙස මහන්සිගත් සියලුදෙනම ද සොසිසා වලව්වට අද සවස හයහමාරට පැමිණෙනමෙන් උන්නාන්සේගේ වචනයෙන් ඉල්ලන බවත් කියා කථාව හමාර කෙළේය. (අන්පොළසන් දිම.)

මෙයින් පසු උතුමානන් වහන්සේ ප්‍රධාන රජ පිරිසද වැදගත් සේනාවගෙන් දුහක් පමණද ද සොසිසා වලව්වට පැමිණ මහත් මුදලක් වියදම් කර තිබුන අගනා අනුරූපස හුකතිවිද "ෂැම්පින්" ආදී බීම වගී පානයකරමින් පැමිණි මහත් සේනාව ඉතා ප්‍රීති මුහුණුවලින් යුක්තව විසිරී යාමට පටන්ගත්හ. *

මෙම උනස ලොකාපී මහා ශාස්ත්‍ර ශාලා දෙක කරණ කොටගෙණ මොරටු ග්‍රාම වාසින්ට පමණක් නොව සාමාන්‍ය ලක්වැසියාට දැනට සිදුවී තිබෙන විපුල ප්‍රයෝජනය අසමසම බව මුළු ලඞ්කාවාසී මහජනතාවටම

* මෙම ප්‍රසාදාවට රුස්වූ පිරිස තුන් දහටත් හාරසියටත් අතර බව පෙණේ. 1876. සැ. 16, 23, දින ලක්රිවිකිරණ.

ප්‍රත්‍යක්ෂ ලෙස වැටහී තිබෙන සත්‍යයකි. මෙපමණකුදු නොව, මේ කාලයේ ලඞ්කා භූමිය පරිභොග කළ නොයෙක ශ්‍රීන් විරාජමාන ශ්‍රීමත් වේල්ස්හි රාජකුමාරොත්තමයානන් සහ සිය මාලිගාවේ සිටි රාජ කුමරියන් සිහිවීම පිණිස සථාපිත කරණ ලද මේ මහා ශාසන ශාලා දෙක හා සමාන මහත් මුදලක් වියදම්කොට කරණ ලද අලඞ්කාර ගොඩ නැගිල්ලක් මේතාක් ලක්දිව නොමැතිය යන ශබ්දය දූනට රාජාධි රාජ පද ප්‍රාප්ත අපගේ ශ්‍රී විභූෂිත **සන්මෙනි ඇඞ්වර්ඞ්** මහරාජොත්තමයානන්වහන්සේ සහ පුණ්‍යාපලක්ෂිත මහාරාජිනියගේත් පුණ්‍ය ශ්‍රවණයන්ට වැකුණ කල ද සොසිසා පව්ල ගැණ පස්වනක් ප්‍රීතියට පැමිණෙනු නිසැකය. හේ කෙසේ වෙතත්, නුවණැස් ලැබූ ලක්දිව්වාසි සියලු දෙනම මෙකී මහා ශාසනශාලා දෙකින් දූනට සිදුවී තිබෙන මහත් ඵලය ගැණ, ද සොසිසා පව්ල සමග විපුල ප්‍රීතියට පත්වෙනු සත්‍යය බව නිසසාඞ්කාය.

———:o:———

ප්‍රසූති කා ගෘහය.

ලඞ්කාවාසි අසරණ සත්‍රී සමූහයා ගැණ විශෙෂ වශයෙන් උපදවන ලද කරුණාවෙන් ඔවුන්ගේ ප්‍රසූතිය සඳහාද ඒ රොගාතුරකම්න් මිදීම පිණිසද, මහත් මුදලක් වියදම්කොට යථොක්ත ප්‍රසූතිකා ගෘහය චාලිස් හැන්ඊ ද සොසියා මැතිතුමා විසින් විවෘත කරණලදී. විශෙෂ වශයෙන් ලක්දිව්වාසි අසරණ සත්‍රින් සඳහා මෙය විවෘතකළ නමුත් පරදෙශික බොහෝ සත්‍රිවරුන්ද මෙයින් ලබන විපුල ප්‍රයොජනය ඉතා මහත්ය. නොයෙක් ප්‍රමාණවලට තැනූ කුඩා තිම්රි ගෘහපඞ්ක්තියකින්ද, ප්‍රසූතිකාව්යන්ගේ සනීපය සඳහා වසන ශාලාවකින්ද මේ සඳහා උවමනා අන්‍ය සකල ගොඩනැගිලිවලින් විරාජමාන මෙම උතුම් ගොඩනැගිල්ල කොළඹ නගරය අලඞ්කාරකරවන ගොඩනැගිලි අතුරෙන් එකක්ය. නගරයේ ඇති ඇතැම්



THE LYING-IN-HOME.—ප්‍රසූතිකා ගෘහය.

ගෙවල පිටශාලාවලද, අඟුවලද, ප්‍රසූත කරණ අසරණ යාචකාදී ස්ත්‍රීන්ට මෙය දිව්‍ය මන්දිරයක් වැනිවිය. * මේ සඳහා වෙන්කරණලද කිසි මුදලක්වත්, ප්‍රසූතිකා ගෘහ යක්වත් මේවනතුරු නොතිබීමෙන් සිදුවී තිබුන මහත් හානිය ද සොයිසාතුමා විසින් පරිපූර්ණ කරදීම අත්‍යන්තොප කාරවිය. ලාඩ්කිත ගර්භිනීන් සඳහා ආණ්ඩුවෙන් හෝ අන්‍ය තෙණෙකුගෙන් හෝ විශෙෂ ගෘහයක් මීට ප්‍රථම ලැබී නොතිබුනේය. මේ එතාම ගෘහය වෘතමානික දුරිද්‍ර ස්ත්‍රී සමූහයාට දැනට මහත් සැනසිමක්ව තිබෙනු දක්ම ආණ්ඩුවට සහ මහජනයාටද ප්‍රීතියක් නොවන්නේද?

මෙම ප්‍රසූතිකා ගෘහය සහ සුසෙව් ද සොයිසා මුදලි මහත්‍රීශ්වරයානන් විසින් ගොඩනංවනලද කෞතුකාගාර යත් යන ගොඩනැගිලි දෙක එතෙවිට ආණ්ඩුවට පරිත්‍යාග කිරීමේ උත්සවය ගරු ගම්නිර ලෙස පැවැත්තු බව පෙණේ.

වෂ්ඨ එක්දහස් අටසිය හැත්තැ නවයේ දෙසැම්බර් මස නවවෙනි (1879. දෙ. ම. 9.) දින රෑ කාලයේ මෙකී සවිස්තොතසවය කෞතුකාගාර ශාලාවෙහිදී පවත්වා තිබේ.

---

* වෛද්‍ය ශාස්ත්‍ර ශාලාවේ තැගි බෙදුවිමේ උත්සවයේදී සර්. විලියම් ග්‍රිෆිත් ලකිසුරුතුමා විසින් මේ ගෘහය ගැන මෙසේ ප්‍රකාශ කරණලදී. "චාර්ල්ස් එච්. ද සොයිසා මහත්මයා විසින් මේ වෛද්‍ය ශාස්ත්‍ර ශාලාවට අඩංගුකර පිහිටුවන්ට අභිප්‍රාකර තිබෙන ශාලාව ගැනත් අසන්ට ඉතා සතුටුය. (ප්‍රීතිශොෂා) ඒ තැන්හ සතුටියෙන් පිළිගැණීම ආණ්ඩුවේ සියලු නිලධාරීන්ගේ අභිප්‍රාවය. තවද සොයිසා මහත්මයාගේ නමින් එය පිහිටුවීමට මම සතුටුය. එවිට (අ) ඒ ස්ථානයෙන් ප්‍රයෝජන ලබන්නාවූ සියල්ලෝම සොයිසා උන්නැහේගේ නාමය කෙළෙහිගුණ සැලකීමෙන් සිහිකරණවා ඇත," යනුය. (ප්‍රීතිශොෂා)

(1876 අගොස්තු මස 12 දින ලක්රිවි කිරණ).

(අ) මෙහි ගෙඩිම ඝීතිනිධර සැම්ප්සොන් ද ආබ්‍රෙව් විජය ගුණරත්න රාජපක්ෂ වාසල මුදලි මහත්ශ්වරයානන් විසින් ආණ්ඩුවට පරිත්‍යාග කරණ ලද්දකි.

වැන්ඩර්ස්ට්‍රාටන් වෛද්‍යාචාර්‍ය තුමාගේ අණ ප්‍රකාර මෙකී ශාලාව මල් වනස්ස, නිල් තෑණ, පොල්කොල, විල්තණ, දුල් සළු, විල්එදැ, තල්කොල, වැල්වඟ, හෙල්ධජ ආදියෙන් ඉතා ශොභන ලෙස සරසවා ලක්‍ෂණ ආසන පණවා මොනවට සකස්කොට තිබෙනාතර, උත්සව වේලාව ආසන්නවූයේ ලඞ්කාණ්ඩුකාර **සර්. රොබට් ලංඩං** උතුමානන් වහන්සේ සහ රජ පිරිස, සැරසීමෙන් දිව්‍ය විමානයක සිරිසුලු නෙතුකාගාරයට සම්ප්‍රාප්ත වූහ.

එහිදී කලින් පැමිණ සිටි ද සොසියා මහත්වරුද කින්සි, වැන්ඩර්ස්ට්‍රාටන් ආදී උතුමෝද ඉතා ගෞරවයෙන් උතුමානන්වහන්සේ සහ පිරිස පිළිගත්හ. "පොලිස් බෑන්ඩ්" කණ්ඩායම විසින් ජාතික වාදනය යොදා තූර්‍යනාද පැවැත්වීමෙන්ද ගෞරව කරණලදී. ගරුකටයුතු පල්ලානි උන්නාන්සේද, චාලිස් පිටර් බණ්ඩාරනායක මහ මුදලි මහාත්‍මාචරයාද වෙනත් ආණ්ඩුවේ උසස් නිලධාරීහුද, ලක්දිව ප්‍රභූ ජනයාද, ද සොසියා නෝනා මහත්මයා, සුසෙව් ද සොසියා ලමාඑනි, මෝර්ගන් නෝනා මහත්මයා ආදී වැදගත් නෝනා මහත්වරු බොහෝ ගණනක්ද, නීතිඥ වරු, විනිශ්චයකාරවරු, මුදලි මුහන්දිරම්වරු, උසස්වෙළඳ මහත්වරු ආදී මහත් වැදගත් පිරිසක්ද මේ රෑ මෙකී උත්සවයට පැමිණ සිටියාහ. ගදඹ ශාස්ත්‍රයෙහි දැඟ නෝනා මහත්වරු සහ මහත්වරු කණ්ඩායමක්ද තූර්‍ය භාණ්ඩ සහිතව පැමිණ සිටියාහ.

කලින් නියම කර තිබුන නය පත්‍රයේ ප්‍රකාර එහි සම්ප්‍රාප්තිකව සිටි සඞ්ගීත සඞ්ගමය විසින් සඞ්ගීතොත්සවය (Concert) පවත්වන ලදින්, රැස්වූ සියලුදෙනම සඞ්ගීත සංතුෂ්ටිජනකයෙන් ඉපිල ගියාහ.

සඞ්ගීතානෙන සූදුනම්කොට තිබුන රාත්‍රී භොජන අනුභවය පිණිස ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේ විසින්, **ද සොසියා නෝනා මහත්මයා** ගෞරව සහිතව භොජන ශාලාවට කැඳවන ලදුව, රැස්ව සිටි

සකල හුදිහුම උතුමානන් වහන්සේ සහ ද සොසිසා නෝනා මහත්මයා ඇතුළුව ද සොසිසා මහත්වරුන් සමග විපුල ප්‍රීතියෙන් යුක්තව රාත්‍රී භොජන අනුභව කරඤ්ඤු ලැබුහ. රෑ කෑම ඉවරවූ කල චැන්ඩර්ස්ට්‍රාටන් වෛද්‍යාචාර්‍ය්‍ය තුම ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේ ඉදිරියට පැමිණ, ද සොසිසා උන්නාන්සේලා වෙනුවෙන් යථොක්ත ශාලා දෙකෙහි යතුරු උතුමානන් වහන්සේට ඔප්පු කර සිටියේය. උතුමානන් වහන්සේ ආණ්ඩුව වෙනුවෙන් එකී යතුරු භාරගෙණ මධුර මනොහර කර්ණරසායන කථාවක් කරණලදි.

———:o:———

උතුමානන් වහන්සේගේ කථාව.

චාලිස් ද සොසිසා මහතුනි, ද සොසිසා මුදලි තුමනි,

මෙම යතුරුවලින් භාරවා දෙන්නාවූ උතුම් තෑගි තමුන්නාන්සේලාගෙන් මෙසේ පිළිගැණ්වීදි පොදු ජනතාව වෙනුවෙන් තමුන්නාන්සේලාට සතුති කරමි. වෛද්‍ය ශිෂ්‍යයන්ගේ ඉගෙණීමට අත්‍යන්නොපකාරවූ මෙම කෞතුකාගාරය ගැණ ඒ ශිෂ්‍ය සමූහයා වෙනුවෙන් (සුසෙව් ද සොසිසා මුදලිතුම දිහා බලමින්) ද සොසිසා මහතුනි, තමුන්නාන්සේට සතුති කරමි.

ඉතා දුක් සහිත ප්‍රසාවලදී ස්ත්‍රීන් බොහෝ දෙනෙකුට රක්ෂස්ථානයක්ව තිබෙන්නාවූ මෙම ප්‍රසූතිකා ගෘහය ගැණ චාලිස් ද සොසිසා මහතුනි, දිළිඳු ජනයා වෙනුවෙන් (චාලිස් හැන්රි ද සොසිසා මහත්මයා දිසාවට හැර) තමුන්නාන්සේට සතුති කරමි.

කින්සි වෛද්‍යාචාර්‍ය්‍ය තුමානනි, නෝනා මහත්වරුණි, මහත්වරුණි,

ලොකොපකාර මෙබඳු වැඩ කරණ ද සොසිසා මහත්වරු (කාය චිත්ත පීඩාදියෙන් විරලව) සුවසේ වර්ධනය වන ලෙස ප්‍රාර්ථනා කරමින් මා සමඟ (මේ සවෝදය) පානය කරණ මෙන් ඉල්ලම්.

ද සොසියා පව්ලේ මහත්වූ කීර්තිය මහජනයා අතර ඉතා ප්‍රකටව තිබෙන බව දනිමි. උන්නාන්සේලාගේ තෘතිවන්තා අනේක වැඩ අතුරෙන් මෙම වෛද්‍ය කෞතුකාගාරයත්, ප්‍රසූතිකා ශාලාවත් පමණ ඉතා ප්‍රයෝජනවත්වූද, යොග්‍ය ලෙස අභිප්‍රා කරණ ලද්දාවූද, අන්‍ය කිසිවක් නැත්තේය.

මෙම කෞතුකාගාරය සාදන්ට යෝජනා කරණ ලද්දේ වෛද්‍ය ශාස්ත්‍ර ශාලාවේ ප්‍රධාන තැනවූ වැන්ඩර්ස් ට්‍රාටන් වෛද්‍යාචාර්‍ය තැන යටතේ වෛද්‍ය ශාස්ත්‍රය අවබොධ කරණ ශිෂ්‍යයින්ගේ අඩුලුහුඩුකම් පිරිමසින පිණිසය.

තවද සමහ වෛද්‍යාචාර්‍යවරුන් නැති හිඟය පිරිමසින පිණිසත් සිංහල වෙදමහතුන් වෙතුවට එබදු තැනැත්තන් මනා ලෙස පුහුණු කර පත්කරණ පිණිසත් පිහිටුවා තිබෙන මෙම වෛද්‍ය ශාස්ත්‍ර ශාලාවට වඩා වැදගත් ශාලාවක් ලක්දිව් වැසියන්ට ඇත්තේම නැත.

වෙදමහතුන්ගේ වවිනාකම් අඩුකිරීමට නොකැමැත්තෙමි. එහෙත් ඔවුන් ඖෂධ කරණ විධියත් ඔවුන් භාවිතා කරණ ඖෂධත් සවිපුණි ලෙස පරීක්ෂා කරණවාට කැමැත්තෙමි. මෙම ශාස්ත්‍ර ශාලාවේ පුහුණුවෙන ශිෂ්‍ය සමූහයා මහජනයාට වෙදකම් කිරීමට යොග්‍යවූ තැනැත්තන් බව සඟකා රහිතය. තවද මෙරට පුහුණු කරණ ශිෂ්‍යයන් සියබස් දන්නා බැවින්ද, මෙරට මනුෂ්‍යයන්ගේ විධිවත්කම් දැන ඉගෙණ සිටින බැවින්ද, තමන් උගත් ශාස්ත්‍රය භාවිතා කිරීමෙන් ඔවුන්ට මහත් ප්‍රයෝජන අත්කර ගැණීමට මාර්ගයන් පෑදී තිබේ. එහෙත් යුරෝපයෙන් මෙහි පැමිණෙන වෙදවරුන් ඒ ප්‍රයෝජන ලබා ගන්ට නම් භාෂාවත් ජනතාවගේ අදහස් උදහස් ආදියත් අවුරුදු ගණනක් පුහුණු කිරීමට උවමනා වේමය. එබැවින් මෙබදු අභිවෘඞ්ධියක් සලස්වා දෙන වෛද්‍ය ශාලාව සහ ඊට ආධාර වශයෙන් සාදන ලද ප්‍රසූතිකාගාරයත් ඉතා උතුම්කොට සලකමි.

මීට ඉදිරිපිට පිහිටා තිබෙන සාමාන්‍ය ආරෝග්‍ය ශාලාව මෙන්ම මේ ශාලාවෙනුත් (ප්‍රසූතිකා ගෘහය) සියලු ගෝත්‍රවලදා, සියලු ආගම්වලදා, සෑමදෙනාටම එක ලෙස ප්‍රයෝජන ගතහැකිව තිබේ. සත්‍රීන්ට බොහෝ සෙයින්ම ආධාර උපකාර ඕනෑකරණ ප්‍රසාවලදී මෙහි පැමිණ ඉතා හොඳට සුවපහසු ගත හැකිවේ. තවද මෙහිදී ආධාර ලබන දිළින්දන් විසින් චාලිස් ද සොයිසා උන්නාන්සේගේ නාමයට ආශීර්වාද කරණු නිසැකය. එබැවින් චාලිස් ද සොයිසා උන්නාන්සේත් සුසෙව් ද සොයිසා මුදලිතුමාත් සුවසේ චිර කාලයක් ජීවත්වන ලෙස මේ "සවෝදය" පුරම්, යනු ප්‍රාර්ථනාකොට පානය කළෝය.

මින්පසු චාලිස් හැන්රි ද සොයිසාතුම උතුමානන් වහන්සේගේ පැමිණීම ගැන සහ එතුමන් ධෛර්‍යවන්ත ලෙස අවඩකව කළ කථාවටද සතුතිකෙළේය.

සුසෙව් ද සොයිසා මුදලිතුම සිංහලෙන් කථාකොට උතුමානන්වහන්සේ මෙහි පැමිණ කළ කී වැදගත් කථාව කරණකොටගෙන මෙහි වෛද්‍ය මැතිවරුන්ට සහ ශිෂ්‍ය සමූහයාටත් ධෛර්‍ය ඉපදෙන්ට ඇති බවත්, කින්සි, වැන්ඩර්ස්ට්‍රාටන් යන ප්‍රධාන වෛද්‍ය මැතිවරුන්ගේ ආධාර ලැබීමෙන් මෙකී ගොඩනැගිලි සම්පූර්ණ කිරීමට ලැබුන බවත්, මෙහි සියලු කටයුතු ඕන් ඉදිරියට ඉතා උනන්දුලෙස කෙරෙණවා ඇත යනු විශ්වාස කරණ බවත්, උතුමානන්වහන්සේගේ කරුණාවන්ත කථාවට ස්තුති කරණ බවත්, වැන්ඩර්ස්ට්‍රාටන් මැතිවරයා මහත් වෙහෙස දරමින් කෙරෙව් ඉතා අලඩකාර සැරසිලි ගැන විශෙෂලෙස සතුතිවශයෙන් තුන්වරක් "හුරා" ශබ්ද පවත්වමින් ඔල්වරහඩ දීමට රුස්වූ මහතුන්ගෙන් ඉල්වන ලදින් සියල්ලෝම මහත් සතුටින් "හුරා" ශබ්ද පැවැත්තූහ.

මෙසේ "ගුරු" ශබ්ද පවත්වන අතරම උතුමානන් වහන්සේ ද සොසියා මහත්වරුන් සමඟ ආචාර සමාචාර කොට පිරිසත් කැටුව ඉතා ප්‍රීතියෙන් නැවත නැවතත් සියල්ලටම හිස පහත්කිරීමෙන් පිටත්ව යියෝය. රුස්සූ මහත් සේනාව ද සොසියා මහත්වරුන්නේ ත්‍යාගිවන්න කම් ගැණ පසසමින් විසිරියන්ට පටන්ගත්හ.

පරම ගුණාඩ්‍යයන්ගෙන් පරිපූර්ණ සත්චරිත්‍රාඩ්‍ය ද සොසියා මැතිවරුන් විසින් ලක්වැසි ස්ත්‍රී පුරුෂ ජනතාවගේ නිරොගීභාවය ගැණ උපදවන ලද මනොප්‍රණීධානය දැන් ඉතින් මුදුන්පත් වේයයි සනිටුහන් කොට ආණ්ඩුවට පරිත්‍යාග කරණලද පරමොත්කෘෂ්ට මෙම කෞතුකාගාරය (වෛද්‍ය ශිෂ්‍ය ශාලාව) ගැණ සහ ප්‍රසූතිකාගාරය ගැණත් නෙක ශ්‍රීන් විරාජමාන ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේ විසින් කර තිබෙන රමණීය කථිකාවෙන් මෙකී ගොඩනැගිලි දෙක ප්‍රමාණාතික්‍රාන්ත ප්‍රයෝජන ගෙණදෙන ගොඩනැගිලි දෙකක් බව මනාව ඔප්පුවිය. ඒ කාලයට වඩා වෛද්‍ය ශිෂ්‍යයන්ගෙන් ගහණ වූද, දුරිදු ස්ත්‍රීන්ගෙන් ගහණවූද, මේකාලයේ යම්කිසි උතුමයෙක් මේ ගැණ කථාකෙරේ නම් සහස්‍ර ගුණයකින් කරුණු දක්වා ඉතා ව්‍යක්ත සත්‍යමය කථාවකින් ද සොසියා පව්ලට මහත්සේ සතුති කරණ බැව් නිසැකය. ඒ හෙයින් සුන්දරතර සමෘති ගුණයන් සිමාකොට උපදවනු ලැබූ සකල මනොප්‍රණීධානයන්ම සඵලාකාර මහජනතාවට විපුල ප්‍රයෝජනව තිබෙන බැව් සත්‍ය නිසා එකී මනොප්‍රණීධානයන්ගෙන් උකහාව සිට පාරලෞකික සැප පතා ගිය **ද සොසියා චරමනම්‍රීන්** කෙරෙහි **කෘතඥ** භාවයෙන් යුකතව කාලික නුවණැති වරසාධු ජනතෙමේ ද සොසියා පව්ලට අදත් දැනුත් ගෞරව සම්භාවනා කිරීමට සිනයෙකිනුදු මැලිවේයයි කවරෙක් කථනය කෙරේද?

බුරුම නානාපතිතුමට කළ සඞ්ග්‍රහය.

චාල්ස් හැන්රි ද සොයිසාතුම මහතුවර නැවති සිටියදී වෂී එක්දහස් අටසිය සැත්තෑ අටවෙ මැයි මස තුන් වෙනි (1878. මැ. ම. 3) දින පෙරවරු එකොළහමාරට බුරුම නානාපතිතුම සහ එතුමගේ පිරිසත් මහතුවරට පැමුණුනාහ. ද සොයිසාතුම මෙම පිරිස ඉතා ආදරයෙන් පිළිගෙණ මහතුවර සඞ්කීය **හරෙම්බ හවුස්** (Haramby House) නම් වලව්වට කැඳවාගෙණ ගොස් කෑම පීම් ආදියෙන් ඉතා අගයට සඞ්ග්‍රහකෙළේය. සඞ්ග්‍රහ විදිනලද බුරුම නානාපතිතුම, ද සොයිසාතුම ගැණ මහත්සේ සතුටට පැමිණ මුළු ලාඞ්කික ජනයා විසින් කළ ගරු සඞ්ග්‍රහයක් ලෙස එතුමා මෙම සඞ්ග්‍රහය ගැණ සතුතිකරණ බවත් ලාඞ්කික ජනයාගෙන් බලාපොරොත්තුනුත සඞ්ග්‍රහ ද සොයිසාතුමගෙන් හුදකලාව ලැබීම සම්බන්ධ කරුණු බුරුම මහරජ ඉදිරියේ ප්‍රකාශකිරීමට ඉක්මන්වෙන බවත්, ද සොයිසාතුම ත්‍රිසතියානි සමයවාදියෙක්ව සිටගෙණ බෞඩ පිරිසකට කරණලද ආගන්තුක සඞ්ග්‍රහ විශෙෂයෙන් සලකණ බවත්, සිංහල ප්‍රභූ සත්පුරුෂයෙක්වූ ද සොයිසාතුම එතුමන්ට පෙන්වනලද කරුණාවෙන් ලඞ්කාවාසි මුළු සිංහල ජනතාවගේ ඇති කරුණාඩ්‍යාශය හැඳිනිගිය බවත් ප්‍රකාශකොට සතුතිකෙළේය. ද සොයිසාතුම බුරුම නානාපතිතුමට මෙරටින් උවමනා දේ කවරේ දැයි අසා උවමනාව නිබුනාවූ යම් යම් දේ සපයා දීමෙන් එම නානාපතිතුමගේ සහ පිරිසගේත් හිත් මොනවට දිනාගත්තේය.

ආගන්තුක සඞ්ග්‍රහකිරීමෙන් තම දෘඪයට හානි නොපැමිණෙන බැව් දත් යුණුවන්තා ද සොයිසාතුම බුරුම නානාපතිතුම සහ පිරිස පිළිගෙණ කරණලද උදාරතර සඞ්ග්‍රහය ගැණ සාමාන්‍ය ජනතාව කෙසේ වෙතත් විශෙෂ වශයෙන් නුවණැති ලාඞ්කික බෞඩ

ජනයා සියලු කල්හි මෙතුමාගේ උතුම්වූ නාමය ගෞරවයෙන් සිහිකරණු නිසැකය. බුරුම නානාපති තුමගේ වැදගත් වදන් රැසින් ද සොසියානුම කරුණාවෙන් කොපමණ මහත්දැයි නිශ්චය කර ගැණීමට අපහසු නොවේමය. සැබවින්ම මෙතුමාගේ මෙබඳු උදාරතර කරුණාවන්තකම් සිහිකරණය කරණලද ලක්වැසි සිංහල ජනතාව ආඩම්බර නොවෙත්ද?

———:o:———

මෙතුමා එඩිගලනතයට ගිය ගමන.

එක්දහස් අටසිය අසූහයේ මැයිමස තිස්එක් වෙනි (1886. මැ. ම. 31.) දින "චුසන්" "Chusan" නම් නැවෙන් මෙතුමා සහ මෙතුමාගේ පුත්‍ර ජේ. ඩබ්ලිව්. සී. ද සොසියා මහතාද, ඒ. ජේ. රිචර්ඩ් ද සොසියා මහතාද එඩිගලනතයට යාමට පිටත්වෙන බව ලක මුළුල්ලේ පතළවිය. මේ ගමන යාමට මෙතුමා අදහස්කෙළේ, තම පුත්‍ර මහත්වරු දෙදෙන ශාස්ත්‍රාදාහරණය සඳහා එඩිගලනතයේ උසස් ශාස්ත්‍රශාලාවල නවතාලිමට සහ දෙශාධිණය පිණිසත්ය. නැව් නගින දිනයට පෙර දවස් තුණ හතරක පටන් මෙතුමා දැක කථා කර, මෙතුමාගේ ගමනට ආශංසනය කිරීම සඳහා ලක්දිව නොයෙක් පලාත්වලින් පැමිණි ඥාතිමිත්‍ර බන්ධුන්ගෙන් "ඇල්ප්‍රඩ් හවුස්" නම් වලව්ව පිරෙන්ට පටන් ගත. මේසේ එනැන්නාවූ සියලුදෙනට කාලික වශයෙන් මෙතුමා මොනවට අනුග්‍රහ කෙළේය. මේ ගමනට කැටුව යාම සඳහා සිල්වේස්ටර් සොසියා මහතාද, වැන්ඩෝර්ට් වෛද්‍ය මහතාද, වැඩකාරයෙක්ද සූදානම්ව සිටියෝය. නැව්නගින දින උදයේ පටන් සවස තුණ දක්වා එන යන සේනාවගෙන් බම්බලපිටි පාරද පිරිනා, වලව්ව සහ වලව්වේ වත්තද සෙනඟගෙන් පිරීගියේය. නැවට පිටත්වීමට පික වේලාවකට මත්තෙන් ද සොසියා මහත්වරුන්නේ පව්ලේ සියලුදෙන විසින් දෙශානතර යන්නාවූ

ද සොයිසා මහත්වරු සිප වැලඳ ගත්හ. මේ වේලාවේ එහි සිටි සියලුදෙනගේ නෙත් කඳුලෙන් පිරිගියේය. විශෙෂයෙන්ම දෙශාඨණයට ඕය සහිත කාගේ සිත්තුළත් ශොක උපන. සමුද්‍ර මාගොපකරණාදිය සහ යුරොපාදී රටවලට යොග්‍යාකාර සම්පාදනය කරවන ලද ඇදුම් පැළඳුම් සහිත සම් පෙට්ටි ආදියද කලින් නැවට යවන ලදින්, ද සොයිසා තුම පුත්‍රයින් දෙදෙනාත් සමග නැව් තොටට යාමට අසුන් සතරදෙනෙකු යොදන ලද මහඟ රථයට නැග පිටත්වුනේය. ඩබ්ලිව්. ජී. වැන්ඩෝර්ට් ඇම්. ඒ. වෛද්‍යතුමද, සිල්වැස්ටර් සොයිසා මහතාද, ජැක්සන් නම් හින්දු දෘසයාද අන්‍ය රථයකින් ගිය්හ. බඹු මිත්‍රාදි මහත් සමූහයක්ද තම තමන්ගේ රථවලට නැඟි ර්ථ සියයක් පමණ මෙ රථ පස්සෙන් ගමන් ගත්හ. නැව් තොටට පැමිණි කල මෙතුමා දැකීමට පැමිණ සිටි බොහෝ උසස් සිංහල, ඉංග්‍රීසි, බර්ගර්, දෙමළ, පාර්ෂි, හින්දු ආදි වැදගත් මහත්වරු රැසක් මෙතුමා වැලඳගෙණ ආදර දැක්වූහ. මෙසේ ආලිඞ්ගන ක්‍රියා ආදියෙන් පසු ඒ සියලුදෙනාට ආචාර සමාචාරකොට මෙතුමා සහ පුත්‍ර මහත්වරුද, පිරිවරද නැවිනැග මෙදින සවස තුණට ගමණ ලඞ්කා වෙරළින් ඈත්වූහ.

පින්වත් තෙම කිසිම කාය චිත්ත පීඩණයකට අසු නොවී සුවසේ එංගලනතයට පැමිණ තම පුත්‍ර මහත්වරුන් දෙදෙන මහ ශාස්ත්‍ර ශාලා දෙකකට භාරකොට එරට දශිනිය කටයුතු කෘත්‍යයන් සඳහා නැවතුනේය.

මෙතුමා කොණ්ඩය බැඳ නැවිපනාව හිසේ ගසන සිරිත හැමදුම ඇහිකළ නමුත්, එඩිගලනතයේදී පිනි කරණකොටගෙණ නිතර ප්‍රතිශ්‍යාව සෑදෙන්ට කොණ්ඩය ආධිරවූ නිසා සහ එහි සෘතු ගුණයට අයොග්‍ය නිසාත් වෛද්‍යයන්ගේ නියමය ප්‍රකාර හිසකෙස් කපා කොටකර ලූයේය. සැබවින්ම මේ කරණකොටගෙණ විශෙෂ සනිපයක් මෙතුමාට ලැබුනේය.

මෙතුමා එඩිගලන්තයේ ගත්කළ කාලයේ එවකට මුර්සියේ ආණ්ඩුකාරයෙක්ව සිටි **සර් එච්. ජ. එච්. ජර්නින් හැම්තුමාගේ** සොහොයුරු **චාල්ස් ඇඩවර්ඩ් ජර්නින්හැම්** මහතා මෙතුමාගේ රහස්ලේකම් ධුරයට පත්කරගෙණ සිටියේය.

මෙසේ නැවතුනාවූ මෙතුමා නොයෙක් ශාස්ත්‍රශාලා බැලීමටද, ආරොග්‍යශාලා බැලීමටද, පැමුණුනා පමණක් නොව ලක්ෂණ මාලිගාවලට වඩා මෙතුමා කැමතිවූ මෙකී ස්ථාන ගැණ මෙහිදිත් මතක නැති නොකොට තම පුරුදු ත්‍යාගිවන්තකම සම්පූර්ණකිරීමට අදහස් කොට මෙකී ස්ථානයන්ට සහ වෙනත් මෙරට පුණ්‍යකර්මයන්ට දීම සඳහා ලොකු මුදලක් එරට සිටින මෙතුමාගේ "ඒජන්ත" මහත්වරුන් වන "අර්බුත්නොට් ලේතැම්" (Messrs. Arbuthnot, Latham & Co.,) සහ සමාගමේ මහතුන්ට භාරදුන්නේය. තවද එංගලන්තයේ පැවැත්තූ "ප්‍රදේශික සහ සිනුදෙශික" මහ ප්‍රදර්ශනයට යවා තිබුන ලක්දිව යාපනු නුවර දෙරටුව සහ වෙනත් මෙරටින් එහි යවා තිබුන පුදුම දේවල්ද මිලයට ගෙණ එරට රාජකීය කෞතුකාගාරයේ තැබීමට භාරදුන්නේය. *

මෙතුමා එඩිගලන්තයේ පිහිටුවා තිබෙන සඩදෙශික සඛගමයේ අඛ්‍යක්ෂකතැනමෙන්ද, අහාවයටගිය ලක්දිව සඩදෙශික සඛගමයේ අඛ්‍යක්ෂකතැන මෙන්ද, ලොන්ඩන්

---

* ද සොසියානුමා මෙම ප්‍රදර්ශනයට ඉතා අගනා අලඛ්කාර බොහෝදේ එඩිගලන්තයට යන්ට පෙර එහි යවා තිබේ. එ කරණ නොවගෙණ එම ප්‍රදර්ශනය බොහෝ අලඛ්කාරවූ බැව් එවකට මුළු ලෝකයේම ප්‍රකාශවිය. තවද 1886 ඒ දකුණු කැන්සින්ටන්හි පවත්වන ලද ප්‍රදෙශික සහ ඉන්දුදෙශික ප්‍රදර්ශනය පිළිබඳ ලඛ්කා දුව්‍ය ලෙඛනය සහ අන්පොතේ 95 වෙනි පිටුවේ සඳහන්වී තිබෙන ප්‍රකාර "මේ ප්‍රදර්ශනයේදී දූක්ෂ්මට අගනා මාණික්‍ය වගී පමණක් නොව ඉතා වටිනා කැටයම් වැඩ ආදියත් දුන් සී. එච්. ද සොසියා මහතාණන්ගේ උනන්දුභාවය හැණ විශෙෂවශයෙන් සැලකිම සුතුවේ" යනු සඳහන්කර තිබීම මුළු ලඛ්කාවටම ගොරවයක් බව වැටහේ.

නුවර හෘදරෝගාරෝග්‍ය ශාලාවේ උප සභාපති මෙන්ද, ලොන්ඩන් නුවර ඇත්තියමහිදී, රාජකීය කෞතුකාගාර යේද ගෞරවාර්හ සාමාජිකයෙක් මෙන්ද බැඳී සිටියේය. මෙතුමා ලඞ්කා වැසියන් අතරේ කෙරෙණ යහපතට පමණක් නොව පිටරට කෙරෙණ යහපත් කටයුතුවලැ පතුකාරයෙක්වද සිටි බව මනාව වැටහේ. තමන් රුචි සියලුස්ථානවලට පැමිණ ඒ ඒ දේ ගැණද ඉඞ්‍රීසින්ගේ අදහස් උදහස් සහ හැඟුණ සැලකීම් ආදිය ගැණද එඞ්ග ලනතයේ නැවතී සිටි සුළප කාලයේදී හොඳහැටි දැනගැඞ්මෙන් ලඞ්කාවට එම සඳහා පිටත්විය. වෂී එක්දහස් අටසිය අසූහතේ ජනවරි මස දහතුන් වෙනී (1887. ජ. ම. 13) දින "ඇන්කෝනා" (Ancone) නම් නැවෙන් ලක්දිව වෙරළට මෙ මැතිවරයා ප්‍රධාන පිරිස සුවසේ පැමිණිකල, නෘදූ මිත්‍ර සමූහයා නැවතොටට පැමිණ ලෝකොපකාර සත්පුරුෂ උතුමා ප්‍රධාන පිරිවර කැඳවාගෙණ "ඇල්ප්‍රඞ් හවුස්" නම වලව්වට පැමිණියාහ.

———:o:———

මෙතුමාගේ ජ්‍යෙෂ්ඨ දුහිතෘගේ සරණ මඞ්ගල්‍යය.

පින්වත් දරු සමූහයා අතුරෙන් **ෆැනි ජෝර්ජියානා කැහෙමින්** ද සොසිසා තරුණ මහත්මිය, (ඇබර්නින්හි) ඇම්. බී. සී. ඇම්. (ඇඞින්බරොහි) ඇල්. ආර්. සී. පී., ඇම්. ආර්. සී. ඇස්. නාමොපලක්ෂිත **සලමොන් ප්‍රඞ්ඩු** වෛද්‍ය තුමට සරණ පාවාදීමේ මඞ්ගල්‍යය ද සොසිසා තුම ඉතා ගරු ගම්භීරාකාරයට පැවැත්විය. මේ ගුණවත් මහතානන්ගේ වාසනාවන්ත පවුලේ **පළමුවෙනි මඞ්ගල්‍යය** මෙයවිය. මේ මඞ්ගල්‍ය ප්‍රීතිය සඳහා මෙතුමා ලොකු මුදලක් වියදම්කර ඤාති මිත්‍ර සමූහයාට දවස් කිපයක්ම සඞ්ග්‍රහ කෙළේය. "ඇල්ප්‍රඞ් හවුස්" නම වලව්ව ඉතා ලක්ෂණට සරසා තිබුනේය. තන්කිතන්හි කොඩි ඇදී මෙන්ද, ද සොසිසා පවිලට ගෞරව වශයෙන් කිත මිත්‍රාදීන් විසින් තනවනලද තෝරණ පඞ්කතිවලින්ද

මෙදින බහාල ලිය යස ශ්‍රියාවක් ඉසිලිය. එඩහලන්තයේ සිට ගෙන්වනලද ඉතා අගනා ලක්ෂණ මඩගල්ය "කේක්" ගෙඩියද දුටුවන් සතුටුවනාකාර රූ ඉසිලිය. මනමාල මහත්මයා ඉතා ලක්ෂණට හැඳ පැළඳ, සඛකීය යහලුවන් සහ ඥාති මිත්‍ර සමූහයා පිරිවරාගෙණ නියම වේලාවට කොළඹ ලුණුපොකුණේ **කැතිඩ්‍රල්** නම් දෙවස්ථානයට (ගල්පල්ලිය) සම්ප්‍රාප්තවිය. මනමාල මහත්මිය යුරෝප යෙන් ගෙන්වන ලද විවිධාලංකාර මාහැඟි පටඇඳුම් හැඳ දිසමන්ති බෙර්ලියන්තු බැදි අගනා ගනුරන් ආභරණ වලින් සැරසි යහලු කන්‍යාඞ්ගනාවන් සහ සඛකීය පියා වන ද සොසිසානුමා පිරිවරාගෙණ දෙවස්ථානයට සම්ප්‍රාප්ත වූවාය. කොළඹ හෙට්ටි වීථියේ වෙළඳ ජනයා මෙදින උදයකාලයේ එම වීථියට බඩු පැවරීම සඳහා එන ගැල්සියල්ල නවතා දියඉස හාරසියයකට වැඩිවූ මඩගල්ය රථ රාශිය සුවසේ ගෙණයාමට මාවත පිළියෙල කර දිමෙන් ද සොසිසා පවුලට ගෞරව කළෝය. බහතලේ පටන් දහස්ගණන් සේනාව මාවත් දෙපස සිට මේ උදුරතර මඩගල්ය පිරිසගේ ගමනා ගමන බලබලා ප්‍රීතිවූහ. උදය එකොළහාමාරට පමණ මෙම අභිනව යුවල ගරු කටයුතු **ඇඩ්වර්ඩ් ප්‍රැන්සිස් මිලර්** තුමා ප්‍රධානයොට ඇති පූජක සමූහයක් විසින් වෂ් එක්වාදහස් අටසිය අසූ හතක්වූ නොවැම්බර් මස තිස්වෙනි (1887. නොවැ. 30) දින ලොව සිරිත්ප්‍රකාර සහ නීති ප්‍රකාර සමයානුකූල ශුභ සරණ බඳිනයට ඇතුලත් කරගුලැබුහ.

මෙයින් පසු මඩගල්ය පිරිස "ඇල්ප්‍රඩ් හවුස්" නම් නිවසට පැමිණියාය. එහිදී "වලන්ටියර්" බෑන්ඩ් තූර්‍ය්‍ය නාද පැවැත්වීමෙන්ද මල්ඉසිමෙන්ද සුවඳපැන් ඉසීමෙන්ද අභිනව යුවලට මොනවට ගෞරවකළ ඉක්බිති මේ සඳහා යුරෝපයෙන් ගෙන්වා සූදානම්කර තිබුන මඩගල්ය "කේක්" ගෙඩිය සහ මෙරට දැඟ "කේක්" සාදන්නන් විසින් තනා තිබුන "කේක්"ද අභිනව යුවල විසින් කපන ලද්දෙන් යහලු තරුණියන් විසින් පැමිණි පිරිසට සඞ්ග්‍රහ කරණලදි. යුරෝපයෙන් ගෙන්නු "කේක්" ගෙඩිය ලන්ඩන් නුවර පීටර් රොබින්සන් නම් මහතුන්

විසින් සාදූ එවන ලද්දකි. උඩුමහල් තලයේ තබා තිබුන මේ "කේක්" ගෙඩියේ බර රාත්තල් 168 කි. මෙරට සාදනලද "කේක්" වලින් එකක් රාත්තල් 672 කි. අනික බර රාත්තල් 168 කි. ලොකු "කේක්" ගෙඩියේ උස අඩි 4 කි. මේ සියල්ල කපා සඩහන කොට අවසානවූකල ගරුකටයුතු ඇඩ්වර්ඩ් ප්‍රැන්සිස් මිලර්තුමා ඉතා රම්‍ය කථාවක්කොට අභිනව යුවලගේ සැප ප්‍රාර්ථනා කෙළේය.

අතිගරු ධර්මාචාර්‍ය කොපල්ස්ටන් බිෂොප්තුමා ද සොයිසා මහතාගේ සහ එම නෝනාමහත්මයාගේත් සැප ප්‍රාර්ථනා කොට වැකෙන කථාවක් කෙළේය. ඒ කථාව මෙසේයි:—

නෝනාමහත්වරුණි, මහත්වරුණි,

ද සොයිසා මහත්මයාගේ සහ එම නෝනාමහත්මයාගේත් මිත්‍ර සමූහයාගේ ගණන ප්‍රමාණ අතිකක්‍රාන්තය. ඒ සමූහයා අතුරේ මටවඩා කිට්ටුවූද, වැඩුමහල්වූද, නැනැත්තන් සිටින නිසා තමුන්නාන්සේලාගේ සැප ප්‍රාර්ථනා කිරීම නැමති ප්‍රීතිමත් කටයුත්තට මට වඩා ඔවුන් යොග්‍යයය. දැනට මේ ශාලාවේ රැස්වී සිටින සියල්ලම කිට්ටුවූ සහ වැඩුමහල්වූ මිත්‍රයන්ව සිටියාහුනම්, මේ ගෞරවනීය වැඩේ ගැණ පසුබටවීමට මට ඉඩ තිබුනි. නමුත් මෙහි පැමිණ සිටින බොහෝ දෙනෙක් මගේ රටවාසින්ව සිටින නිසා ද සොයිසා පවුල සම්බන්ධ කාරණා පිකක් කියා දිමෙන් ශුභ ප්‍රාර්ථනා කිරීමට මිට වඩා හොඳ ප්‍රස්තාවක් මට නොලැබුනේය.

නෝනාමහත්වරුණි, මහත්වරුණි,

ද සොයිසා මහතානන් ධනවතෙක් බව තමුන්නාන්සේලා ස්වයලුදෙනම දන්නා ඇත්තකි. මුන්නාන්සේගේ නාමය කණවැටුන වහාම කාටත් එසේ සිතීයනවා ඇතැයි විශ්වාස කරමි. ධනය අවඩකවූ උත්සාහයකින් සහ ප්‍රඥාවෙන් තමුන්නාන්සේ රැස්කරගත් ධනයක් බව ඉඩ්‍රිසිකාර ජනයා දැන් ඉතින් ඇසිමට රැව්වෙනවා ඇතැයි

විශ්වාස කරමි. (අත්පොළසන්දීම) මෙහි ධනය, ද සොසිසා මහතා කෙසේ වියදම් කෙළේදැයි බොහෝදෙන දන්නවා ඇත. විශාලවූ ඉහ කතිවැයන් ගැණ ඉතා අලඩ්කාරලෙස මෙහි ධන තමුන්නාන්සේ පරිත්‍යාග කෙළේය. (සිනාසීම) කිසි ශබ්දයක්, කිසි ප්‍රසිඩියක් නොමැතිව බොහෝදෙනාට ආධාර කිරීමෙන්ද, බොහෝ තරුණයන්ට ශාස්ත්‍ර දීමෙන්ද මනුෂ්‍යයෙක් විසින් තවත් මනුෂ්‍යයෙකුට දියහැකි හොඳ ත්‍යාගිදීම් කළ බවද, කරණ බවද දන්නේ ඉතා සුළුප කෙනෙකි. (අත්පොළසන්දීම)

නෝනාමහත්වරුණි, මහත්වරුණි,

කාරණාවල අතුමින් තමුන්නාන්සේලාට පෙණී යන්නේ ගරු ගම්භීර ත්‍යාගිවන්තාකම පමණකි. නමුත් තමුන්නාන්සේගෙන් නොව අන්‍ය මාගීයන්ගෙන්, තමුන්නාන්සේ රහසේ කරකියන බොහෝ ඉහපජනක කටයුතුද යහපත් ධාර්මිකදේද මට දැනගන්ට ලැබුනේය. (අත්පොළසන්දීම) ද සොසිසා මහතා එබඳු ප්‍රභාවන්ති විපුලාකාර වියදමක නේජස සහ ත්‍යාගිවන්තාකම මඩ්‍ය යෙහි සිටින බව තමුන්නාන්සේලාට පෙණ්යන තුමුත්, උන්නාන්සේ රාජකීය තත්වයක සිට සැප අනුභව කරණ බවක් නොසිතිය යුතුය. මට තේරුම්ගොස් තිබෙන්නේනම්:—උන්නාන්සේගේ පුදගලික ක්‍රියා සහ අප්‍රකට කල්යැවීමේ ඇති සාමාන්‍ය තත්වය උන්නාන්සේගේ සැපයට හෝ සැනසීමට හෝ ඇතිදේ වියදම්කිරීම උන්නාන්සේගේ ගතිය නුවූයේය. එහි අදහස කල්පනා කළ යුතුය. පුළුදිගහාන්ගේ ධනය සහ සැපජීවිතාව ගැණ අපට එඩගලනතයේදී අසන්ට ලැබුනා පමණක් නොව ඒ ගැණ කථාකරද තිබේ. එඩගලනතයේ සිටින ඇතැම් කෙණෙක් සිතන්නෙ නැගෙණහිර රටක සිටින ධනවත්හු ඉහත කියන ලද්දාවූ නේජවන්තාකමේ වාසය කරණ බවය. ඉන්දියාවේ වසන කුමාරවරු, ධනවත්හු අතරෙත් ලක්දිව වසන ද සොසිසා මහත්මයා අතරෙත් එලෙස සම්මානයක් පෙන්වන්ට ලජ්ජාවෙමි.

නෝනාමහත්වරුණි, මහත්වරුණි,

පූර්වදිග වාසින්ගේ සැප අනුභව කිරීමනම් සෑම තැන්හිදීම තමාගේ සැපතම සලකණ පවිටු ලොභකමය. ක්‍රිස්තියානි මහතෙකුගේ ජීවිතය අතර සහ ඒ වනචර තේජස අතර තිබෙන ප්‍රපාතය සීමා රහිතය. ද සොසිසා මහත්මයා ක්‍රිස්තියානිකාරයෙකි, මේ මහතාගේ පියවරු මුන්නාන්සේට පෙර ක්‍රිස්තියානිකාරයන්ව සිටියෝය. දෙවියන්වහන්සේගේ කාලයේදී, පෙරදිග තිබෙන්නාවූ සියලු රාජධානි ක්‍රිස්තියානිය දිනාගත් කල්හි පූර්වදිග ධනවත්කම ගැණ, තමුන්නාන්සේගේ තාවයෙන් අපටු දකින්ට ලැබෙයයි විශ්වාස කරමි. (අත්පොළසන්දීම)

නෝනාමහත්වරුණි, මහත්වරුණි,

තමන්ගේ දරුවන්ට ඉගැන්වීම දීම ගැණ ඝනවත්ත කෙණෙක් උත්සාහය සහ වියදම අඩු නොකරයි. මෙහිදී ද සොසිසා මහතා සියරටවාසින්ට ආදර්ශයක්ව සිටියේයයි මම විශ්වාස කරමි. ද සොසිසා මහත්මයා සහ එම නෝනාමහත්මයත් පුත්‍රයින්ට මෙන්ම දියනිවරුන්ටත් ඉගැන්වීම සඳහා සැලකිලිවන්තව තුවණින් ක්‍රියාකර තිබීමේ බලය ගැණ, මගේ මිත්‍ර ප්‍රනාන්දු මහතා අද සතුට ප්‍රකාශකරණු ලැබිය යුත්තෙක් බැව් මට සත්තකය. මනමාල මහත්මිය ආභරණයන්ගෙන් ඌනයයි මම නොකියමි. අනේ අඩුකර කථාකිර්මෙන්ද වෙන්වෙමි. මෙහි රැස්ව සිටින්නාවූ ලක්ෂණ වතීයාට එකම පුදුමයක් හා ප්‍රීතියක්ම ගැණවත්, ධනවත් ආදරණීය පියෙකුගේ යුතුකම පරිද්දෙන් ද සොසිසා මහතා මඟුල් ඇඳුම අලංකාරකිර්මට කරණලද අදහස ගැණවත් මම ඊර්ෂ්‍යා වක් බලාපොරොත්තු නොවෙමි. නමුත් මීටත් වැඩියෙන් අලංකාර ආභරණයක් ඈකෙරෙහි ඇති බැව් මම කියමි. (මහත්සේ අත්පොළසන්දීම) ක්‍රිස්තියානි කාරසින්ට ප්‍රියවූද සිංහල ගතියට සහ සිංහල සිරිතට ප්‍රියවූද, සිංහලයින් ප්‍රියකරන්නාවූද, අනගිකොට සිතන්නාවූද, මොලොක් ගුණය සහ නිශ්චලගතිය ඈ වෙත තිබෙන බව මම විශ්වාස කරමි. (අත්පොළසන්දීම)

නෝනාමහත්වරුණි, මහත්වරුණි,

තමුන්නාන්සේලාගේ ශුභප්‍රාර්ථනා සහ ආශිර්වාද ලැබිය යුතු මෙම දෙනම (ද සොසිසා මහතා සහ එම මහත්මි) ගැණ කරුණු මම තමුන්නාන්සේලා ඉදිරිපිට තැබුවෙමි. (අත්පොළසන්දීම) යහපත් මවෙක් නොමැතිව දරුවන් යහපත්කර ගැනීම දුෂ්කරය, (අත්පොළසන්දීම) වැඩි කොටම, සිංහල නෝනාමහත්වරුන් ප්‍රසිඩ සභාවලට පැමිණීමත්, වැඩිපුර කථාකිරීමත් නොපෙනේ. ඔවුන්ගේ යහපත්කම පෙනෙන්නේ ඔවුන්ගේ දරුවන් වර්ධනයවූ කලය. ප්‍රණාන්දු වෛද්‍ය මහතාගේ නෝනාමහත්මයා ගෙන් (මනමාලිගෙන්) ලැබෙන වාසනාවන්තකම ගැණ ඒ මහතාගේ නැඟෙනියන්ට සතුති කටයුතුය. සමහර විට මම තමුන්නාන්සේලා ඉතා ප්‍රමාදයෙලේයයි සිතනවාඇත. මට තව කාරණා ගෙණහැර දක්වන්ට තිබේ, නමුත් ද සොසිසා මහත්මයාට සහ එම නෝනාමහත්මයාටත් දිර්ඝායුෂ ප්‍රාර්ථනාකිරීමට ඕනෑවාටත් වඩා කාරණා මම කියා තිබේයයි විශ්වාස කරමි”—යනුයි. (මහත්ලෙස අත්පොළසන්දීම)

ද සොසිසාතුමා මිට පිළිතුරුවශයෙන් වචන කැලපයක් කිවේය, එනම්:— “මගේ සුවාමිවූ බිෂොප්තුමනි, නෝනාමහත්වරුණි, මහත්වරුණි, මගේ හෘදය අද ඉතා සතුටුව තිබේ. සුවාමිවූ බිෂොප්තුමා විසින් මා සඳහා සහ මගේ නෝනාමහත්මයා සඳහාත් කියනලද කාරණා ගැණද, අප සලකා මෙහි පැමිණ සිටින නෝනාමහත් වරුන් සහ මහත්වරුන් විසින් අපට පෙන්වන ලද කරුණාව නිසාද, මගේ මුළු පවුල වෙනුවෙන් තමුන් නාන්සේලාට සතුතිකිරීමට මාලඟ වචන නොමැතිය” යනුයි.

මෙයින් පසු පාණදුරේ රෙමානිස් පීරිස් වණ්ණකුල සූරිය ගුණවර්ධන මුදලිතුම විසින් වැදගත් කථාවක් සිංහල භාෂාවෙන් කරණලදී.

"නෝනාවරුණි, මහත්වරුණි,

අද දවසේදී ධාම්මික ශුභ සරණ බන්ධනයට ඇතුළත් වෙන්ට යෙදුනාවූ මේ මනමාල මනමාලි යන දෙදෙනා ගැන ප්‍රස්තානුකූලවූ පරිද්දෙන් සහ සභාවට ප්‍රිති උපදවන ආකාරයෙනුත් යමක් කථාකිරීමට මෙය සුදුසු කාලයක්වා පමණකුත් නොව මීට ප්‍රථම කථාකළාවූ අති දක්ෂ පැණවත් උත්තමයන් සියලුදෙනාම කථාකළේ ඉංග්‍රීසි භාෂාවෙන් නිසා දැනට සිංහල භාෂාවෙනුත් යමක් කථාකිරීම සුදුසුයයි සිතමි. ඒ නිසා එලෙස වචන සැලපයක් කථාකිරීමට සොයිසා මහත්‍රීන්වරයාගෙන් ප්‍රධානව අනිකුදු සභාවේ සියලු දෙනාගෙන්ම අවසර ඉල්ලමි.

දැනට ලඞ්කාවාසිවූ වැදගත් සිංහල මනුෂ්‍යයන් අතුරෙන් වැඩිදෙනා තමතමුන්ගේ පිරිමි දරුවන් අවාකර දීමට වඩා ගෑණු දරුවන් විවාහකර දීමෙදී යහපත් ලෙස ඉගෙණගත්තාවූ සත්පුරුෂ සිලාචාර තරුණයින් සෙවීම කාගෙත් සුභාව ධර්මයකි. එසේම දරුවන්ගේ එවැනි අභිවෘඞ්ය දැකීමට වඩා, උතුම්වූ ප්‍රීතියක් වෙන ඇත්තේම නැත. ඉතින් මේ මඞ්ගල්‍ය ප්‍රස්තාව ගැණ කල්පනාකර බලනවිට ද සොයිසා මැතිතුමන් විසින් තම යහපත් පෙම්බර දියනියන් අවාහ කර දීමට වේ වෛද්‍ය මහතා තෝරගන්ට යෙදුනේ ඉතාමත් නිඃක්ෂණවූ, ඝුනයකින් බවටත් උන්නාන්සේගේ නැනවත්, යහපත් තෝරාගැණීම ඉතාම ප්‍රඥාගොචරවූ තෝරා ගැණීමක් බවටත් සාඤ්ඣිවශයෙන් කරුණු රාශියක් ගෙණ හැර දක්වන්ට පුළුවන් නමුත් ඊට කාලය ගතකිරීමට කණගාවු නිසාත් එසින් බොහොමයක් කාරණා මගේ කථාවේදී ප්‍රකාශවෙනවා ඇතැයි සිතෙන නිසාත්, ඒ ගැණ වැඩිදුරට නොකියා දැනට මෙයින් නවත්වමි.

නෝනාවරුණි, මහත්වරුණි,

මේ වෛද්‍ය මහතා ලදරුකාලේ පටන් මම හොඳට දනිමි. ඒ මහතාගේ මව් පිය දෙදෙනාම ඉතා වැදගත් නම්බුකාර පෙළගෝත්‍ර වලට අයිති මොරටුවේ පඤ්චි

කාරයෝය. එසේම පොහොසත්කම්න්ද, පළමුවෙනි පඬිතියේ නොවෙතත් දෙවෙනි තරමට වඩා පහත්ව සිටියේ නැතැයි සිතමි. මුන්නාන්සේ බාලකාලයේදීම සිංහල ඉඞ්‍රීසි භාෂා දෙකම හොඳින් ඉගෙණගෙණ කල්කටාවට සහ නැවත එඩගලන්න දෙශයටත් ගොස් වෛද්‍ය ශාස්ත්‍රය මනාලෙස ඉගෙණගන්ට යෙදුනත් ඇර සම්ප්‍රදායෙක් බවට ආණ්ඩුවෙන් ලබන්ට ඕනෑවූ "ඇම්. බී. සී. ඇම්., ඇල්. ආර්. සී. පී., සහ ඇම්. ආර් සී. ඇස්.," (M. B. C. M., L. R. C. P., M. R. C. S.,) යනාදී නම්බු නාමයන් නොහොත් සහතිකපත්‍ර ලැබගෙණ නැවත ලඞ්කාවට පැමිණ අප අතරෙහි ආණ්ඩුවේ වෛද්‍ය චායෘකෙණෙක් මෙන් රුපියල් හාරදහක් (4,000) නොහොත් පන්දහක් (5,000) පමණ පඩි ලැබෙන්නාවූ ඵානන්තරයකට පත්ව සිටින බව මෙහි පැමිණ සිටින තව්රුත් දන්නවා ඇත. නමුත් මගේ කල්පනාවේ හැටියට වෛද්‍ය කෙණෙකුට ඔය කියන ලද සහතික පත්‍ර පමණක් මදියැයි සිතමි. ඒනම්, ඔය අසූමේම සහතික පත්‍ර ලබාගන්නාලද පෙරකයෝරු කෙණෙකුට හෝ අවකාත් කෙණෙකුට හෝ අපේ නඩුවක් හාරදුන්විට උන්නැහේලාගේ යම් වරදකින් නොහොත් නොසැලකිලිකමකින් අපට සිඞවෙන්ට පුළුවන්වූ අනතුරුයනම් අප සතුටක ගම් බිම් දේපල නොහොත් මුදල් අන්සතුකවීම් ආදි අලාභහානි පමණකි. එහෙත් වෛද්‍යයෙකුට අප හාරදෙන්නේ එවැනි නඩු පණතක් නොව අපේ ජීවිතයය. අපට යම් ආබාධයක් පැමිණිවිට අප වෛද්‍යකෙණෙක්කරා ඵලඹ ඇතිතනුකියා හිපියෑම උන්නැහේලාගේ යම් නොසැලකිමකින් නොහොත් ප්‍රමාද දෝෂයකින් එක්කෝ මුළාවීමකින් අපට ඒ වේලාවට දියයුතු බෙහෙත් බිඳු දෙක නොහොත් තුණක් වෙනුවට සතරක් නොහොත් පහක් දුන්නානම් එසින්ම අපේ ජීවිතය හාන්වෙන්ට පුළුවන. ඉතින් මහතුනි, අපේ මුළු ජීවිතය ඔය අසූමින් හාරදෙන්නාවූ ඒ වෛද්‍ය කෙණෙකුට උගත්තම ගැණ ලබනලද සහතික පත්‍ර වෙනුවට නොපමණ අක්ෂරයන් ලබාගත්තත් ඔහු ධර්මිෂ්ඨවූ

සත්පුරුෂයෙක් සහ යහපත්වූ ගුණවන්තයෙක්වී දෙව්යන් සතුටුකරගෙණ ඒ ගැණ දෙව්යන්වහන්සේගෙන් ආශිර්වාද නැමති සහතික පත්‍ර ලබාගත්තොත් මිස ඒ නැත්තම් ඔහු වෙදකමට වරින්නෙකැයි කිය නොහැකිය.

ඉතින් මහත්වරුණි, මේ තරුණ ප්‍රණාන්දු මහත්මයා ඊවැනි සහතික පත්‍රයක් ලබාගත් වෙද කෙණෙක් දැයි පරීක්ෂාකර බලමු. සත්‍යතාවම මුන්නාන්සේ ඒ ආශිර්වාදය ලබාගෙණ සිටින බව නිසැකව කියන්ට පුළුවන. එනම්, උන්නැහේ ඉතා බාලකාලයේදීත් පළමුවෙනි තරමේ ධර්මිෂ්ඨ යහපත් ලමයෙක්ව සහ අවඩක ක්‍රියාශීලී යැයි ඇදහිලිවන්තයෙක්වත් සිටි බව දනිමි.

උන්නැහේගේ ඒ බාලකාලයේදී තිබුනාවූ සත්පුරුෂ ගුණයද, සියල්ලන් කෙරෙහි ඇත්තාවූ ප්‍රේමයද ඇදහිල්ලෙහි භක්තිවන්ත කමද, යනාදි ගුණාඩම්බරයන්ගෙන් එකක්වත් වෙනස් නොකර මේ දක්වාම අවඩක හැටියේ සහ ස්ථිරලෙසත් පවත්වාගෙණ ඒම සහ උන්නැහේගේ සාමාන්‍ය කල්ක්‍රියාවේ අනාසීකමත් ගැණ ලෝකයාගෙන් ගෞරව සහිත ප්‍රශංසා ලැබීමට සහ දෙවියන්වහන්සේගෙන් කරුණා නැමති සහතික පත්‍රය ලැබීමටත් මුන්නාන්සේ ඉතාම සුදුස්සෙක්වාට කොහෙත්ම අනුමාණ නැත.

තවත් රට සාක්ෂියක් නම්, දැනට මේ ලඞ්කාවේ සිටින සියලුම ජාතිවල මනුෂ්‍යයන් අතරෙන් මේ ද සොයිසා මහත්‍රිශ්වරයානෝ ලෝකේ ප්‍රසිඩවූ සිවුතුමෙකි. ධන සම්පත, දරු සම්පත, සේනා සම්පත, ගව සම්පතයයි යන සතර සම්පතින්ගෙන්ම එකාකාර ආඪ්‍යවූ කෙණෙක් මේ සිවුතුමා මිස ලඞ්කාවේම වෙන නැතැයි විශ්වාස කරමි. මුන්නාන්සේගේ මේ ගුණාඩම්බරයන් මම මගේ මේ එක මුවෙන් වර්ණනා කිරීමට උතුසාහ කිරීම හරියටම මදුරුවෙක් උගේ දළින් මහාමේරු පර්වතය සිදුරුකිරීමට තැත්කරන්නා වාගේයයි සිතමි.

ඉතින් මෙවැනි බලවත් ධනවත් උතුමෙකුගේ දියනි යෙක්වූ පැණවත් ගුණවත් මේ තරුණ නෝනාමහතුන් සමඟ යහපත් සරණ සම්බන්ධයට ඇතුළත්වීමට නැන වත් පින්වත් මේ වෛද්‍ය මහතාට පුළුවන් වූනේ දෙවියන්වහන්සේගෙන් ලැබුනාවූ ආශීර්වාද නැමති සහතික පත්‍රය නිසාම බව වැඩිදුර කියන්ට ඕනෑ නැත. මහත් වරුණි, වැඩිදුරට කථාකිරීමට මට සනීප මදිනිසා මෙසින් නවත්වමි.

ඒ නිසා මහත්වරුණි, අද දවසේදී මේ සරණ බන්ධනයට ඇතුළත්වූ වාසනාවන්ත, දෙදෙනාවද ද සොසිසා මැතිතුමාට සහ සිය පවුලටද, දැනට එඩගලන්ත දෙශ යෙහි සිටින තරුණ ද සොසිසා මහතුන් දෙදෙනාටද දෙවියන්වහන්සේගෙන් ආශීර්වාද සහ දීර්ඝායුෂද සියලු යසෙශ්වර්යයන්ද ලැබ බෝවාකාලයක් යෙහෙන් ජීවත් වෙත්වා කියා ප්‍රාර්ථනා කරමින් ප්‍රීතිඝොෂා පවත්වන ලෙස සෑමදෙනාගෙන් ඉල්ලමි.” යනුයි.

මෙයින් පසුද පිළියෙළකර තිබුන අනෂී රසකෑමෙන් සහ බීමෙන් පැමිණි ජනයා ඉතා ප්‍රීතියට පත්ව ප්‍රීතිඝොෂා පවත්වමින් විසිරී ගියාහුය. ලඬකාවේ එවකට සිටි ඵසස් නිලධාරික සිංහල, ඉංග්‍රීසි, දෑමිළ, ලංසි, මරක්කල, පාර්සි, හිඳු ආදිහුද, සිංහල ඉඬග්‍රීසි පත්‍ර කතිෘ ආදිහුද, මුදලි, මුහන්දිරම් ආදිහුද, වෛද්‍ය, නීතිඥ ආදිහුද, වෙළඳ ජනයා ආදිකොට ඇති සියඟණන් වැදගත් සමූහයාද මෙම මඩගල්‍යානසවයට පැමිණීමෙන්ද නොයෙක් තෑගිඵොග එවීමෙන්ද, කාව්‍ය ප්‍රබන්ධ ඇතුනිපත්‍රාදිය ඔප්පුකිරීමෙන්ද ද සොසිසා පවුලට මාහැනි ලෙස ගෞරව සම්භාවනා කළාහුය

මෙතුමා කළ අගනා ලෝවැඩ.

ලොඅත්වැඩෙහි නියුක්ත ද සොයිසා මුදලි මහත්ඡ්වර දෙදෙනාගේ සත්චරිත උල්ලඛ්ඝනය නොකොට මෙතුමා එය මොනවට ආරක්ෂාකරමින් බොහෝ ලෝවැඩ කෙළේය.

එක්දහස් අටසිය හැටහයේ (1866.) අවුරුද්දේ මහත් මුදලක් වියදම්කර මොරටුවේ කටුබැද්දේ පාර සාදවා එහි ගමනා ගමනය කරණ දහස් ගණන් ජනයාගේ විපුල ප්‍රයොජනය පිණිස විවෘතකර ආණ්ඩුවට භාර දුන්නේය. සඬකීය පිය මුදලිතුමා සහ සුලු පිය මුදලිතුමා යන දෙනම විසින් ලෝවැඩ තකා කළ සියලු ගොඩනැගිලිවලැ ජී.ඤී සථානයන් මෙතුමා ප්‍රති සංස්කරණය කිරීමෙන් කළ ගුණ සැලකුවේය.

ජී.ඤී.බූ මහවේ, කුඩාවේ, පාලම්, ඡේදඩු, ලිං, වැව්, පොකුණු, ආවාසඅාදිය ප්‍රකෘතිමත් කිරීමෙන් එසේම සඬකීය වැඩුමහලුන් කාලිකව සිවින්නාක්මෙන් දැක්කුවේය. තමන් විසින් සහ තම වැඩුමහල්ලන් විසින් ආණ්ඩුවට පරිත්‍යාග කළ මෙකී ගොඩනැගිලි මංමාවත් පාලම් ඡේදඩු ආදිය ගැණ විශෙෂ පරීක්ෂාවකින් සිට එකී දේවල ඇතම් ජී.ඤී සථානයන් නැවත ප්‍රකෘතිමත් කිරීමට තමන්ම මුදල් දුන්නේය. දුප් මත්තන්ට නිතර වතින් බතින් සහ මුදලින් අනුග්‍රහ කෙළේය.

දිළිඳු භාවයට පත් තරුණියන් සිරිත් ප්‍රකාර පුරුෂ යන්ට පාවා දීමට අපහසු බැව් කියා ආ සියලුදෙනාට සනෙතාෂ ධන දීමෙන් ඒ කෘත්‍යයන්ද ඉටු කෙළේය.

මළවුන් වළලෑමට අපහසුය කියා ආ සියලු දෙනාට මිදිය නොකිමට මුඛවාඩම් බැඳ ධන දුන්නේය.

කරුණාබර පියෙකු සමාන සත්පුරුෂ මෙතුම තමන්ට සිංහල ඉගැන්නු ගුරුවරයෙක් වන, කනක්ක හේවාගේ දෙන් අන්ද්‍රිස් ද සිල්වා මහත්මයා (මිරිස්සේ ගුරුන්නාන්සේ) දස අවුරුද්දක් පමණ වලව්වේ නවතා ගෙන උපස්ථානකොට රෝගාතුරව අශාඛ්‍යවූකල ආරොග්‍ය ශාලාවට යවා වෙදකම් කරවන අතර මියගියේය. ඒ බැව් සැලවූ කඩිණම්න්, මෘතශරීරය තහනම්කොට ඉතා දුකට පත්ව, "මගේ ගුරුවරයා ආරොග්‍ය ශාලාවෙන් දෙන නොවපින පෙට්ටියක බහා වළලෑමට ඉඩහැරීම සුත්‍ර නැතැ" සි කියා ඒ ගැන ක්‍රියාකිරීමට තමුන්ට අප්පු ගුරුමහත්තා කැඳවා බුදුසමයේ ප්‍රකාර කටයුතු සිදුනම් කිරීමට නියමකොට, ඉතා ලක්ෂණට ඕනිපෙට්ටියේ වැඩ නිමවා රැගෙණගොස් ආරොග්‍ය ශාලාවෙන් එම මෘතකලේබරය රැගෙණ පෙට්ටියේ බහා වලව්වට ගෙණ්වා, එහිදී මෘතදෙහයට ගරු සත්කාර පවත්වා පුත්‍ර මහතුන් සමග කනත්තේ සොහොන් භූමියට ගෙණගොස් භික්ෂූන්වහන්සේලා ලවා ආගමේ කෘත්‍යයන් ඉටුකරවා වළලෑවේය. තවද මේ ගුරුවරයාගේ පව්ලට උපකාර කිරීමටත් දරුවන්ට රක්ෂාවන් දීමටත් පුත්‍ර මහත්වරුන්ට නියම කෙළේය. සැබවින්ම මේ මැහිවර තෙම තළුගුණ සැලකීම කොපමණ දුරට ආරක්ෂාකර සිටියේද යනු සහ මෙම මැහිවරයාගේ විපුල ගුණ රාශියේ ප්‍රමාණය හැඳිනීමට මෙයම ලක්ෂණයක් කොට නුවණැත්තන්ට නොවැටහේදැයි අසමු.

ශ්‍රීමත් මෙතෙම එක්දහස් අටසිය අසූ නමයේදී (1889.) පමණ මහපාරේ සිට ලුනාවේ දුම්රිය පොල දක්වා දූනට තිබෙන පාලම සහ පාර තනවා දීමෙන් විපුල යහපතක් කර දුන්නේය. *

---

* එවකට ආණ්ඩුවේ මහ දිශාපති ඇල්. ආර්. සොන්ඩර්ස් තුමා මේම පාලම උඩට පැමිණ, ද සොසියා තුමාගේ පරාමික වැඩ ගැන කථාවක්කොට පාළම විවෘත කෙළේය.

T. R. H. THE PRINCE AND PRINCESS OF WALES.

වේල්ස්හි රාජකුමාරයාණෝ සහ කුමාරිකාවෝ.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO

තවද ලුනාවේ දුම්රියපල තැනීම සඳහා එම ඉඩමද ආණ්ඩුවට ත්‍යාගිකෙළේය.

දැනට ස්ත්‍රී සමූහයාට අපමණ ප්‍රයෝජනව තිබෙන ප්‍රසූතිකා මන්දිරය සඳහා මහත් මුදලක් වියදම්කොට එයද ආණ්ඩුවට භාරදුන්නේය.

ඇඩින්බරෝහි ආදිපාද රාජ කුමාරයාට අනුත්තර අනුග්‍රහයක් කොට සකල ශෛඛුන ජනතාවගේ ගෞරවය මොනවට රැක්කේය. *

වේල්ස්හි ආදිපාදෝත්තමයා ලඛ්ධාවට සම්ප්‍රාප්තික සමරණය සඳහා මෙහි සිතුවම්වලින් පෙණෙන එම උත්තමයා නමින් සහ එම උත්තමිය නමින් මහා ශාස්ත්‍ර ශාලා දෙකක් ස්ථාපිත කොට දිවා රෑ දෙක්හි මෙම උතුම් නාමයන් ලක්දිව් වැසියාගේ තුඩ තුඩ පැවතීමට මාර්ග සාදුදුන්නේය.

දහස් ගණන් සිය රට වැස්සන්ගේ රැකීම සඳහා රක්ෂස්ථානයන් තබා රැකීම දුන්නේය.

ලක්දිව නොයෙක් පලාත්හි විවින්විට හටගත් ජල භය, ගිනිභය, වසංගත භය ආදියෙහිදී බොහෝ වස්තු වියදම්කොට එකි එකි භීතීන්ගෙන් දුකටපත් ජනතාව ගළවා ගත්තේය.

විවින්විට ලක් වැස්සා අතරට පැමිණි දුර්භික්ෂ භය දුරුකොට සාපිපාසික අප්‍රමාණ ජනයා තම දරුකයන් මෙන්ම රැක්කේය.

---

* මේ ගැන බෙරුවල්ලැසිරිදියස් ද සිල්වා පඬිතුමාගේ ප්‍රබන්ධයක්.

කොල්ලු පිවිවතු කෙරවලේ සිට ගෙඕ ගෙවල් බන්දමින් පියක රු
ගැල්ලු දිගු ලිස පියසුරේ යස සදුන් චාරිලිත් සොවිස මැනි සු රු
දුල්ලු නෙද මෙකොළොම්පුරේ විසි අනින් සියලුම පොහොසතුන්ව
තල්ලු කරමින් දුන් අඟේඇනි බාල කෙලෙසින් කියමි විසි තු රු

සම්පත් නැති දිලිඳුන් ගැවසුනු මෙම ලක තු ල් ලේ
දුප්පත් අසරණ කම අපෙ නැතිකර එකැසි ල් ලේ
සම්පත් කුමරිදුට උතුම් නම්බු දුන්නු දු ල් ලේ
සෙන්වෙත් වා ඔබට දිගා සිරි වැඩීවී තු ල් ලේ

වලපනේ සහ වෙනත් නොයෙක් පලාත්වල අසරණ භාවයට පත්වූ පවුල් සියයක් (100) පමණ ගෙන්වා ඔවුන්ට සරුසාර කුඹුරු දීමෙන්ද, ගෙවල් තනවා දීමෙන්ද, බටු මිරිස් ආදිය වවාගැනීමට අක්කරය අක්කර බාගය පමණ ඉඩම් නොමිලයේ දීමෙන්ද විපුල උපකාර කෙළේය. මෙසේ ගෙන්වන ලද පවුල් සහ ඔවුන්ගේ දරුවන්ද දැනට ඉතා වැඩිව මෙකී පරම්පරා බෝවී මෙතුමාට අසීමි සපරගමු පලාතේ වතු කුඹුරුවලින් තවමත් ජීවත්වන බව සත්‍යයකි.

නානාප්‍රකාර රෝගාතුර ජනයාගේ ඇවිපිලි යාචඤ්ඤ වන්ට කන්දෙමින් ඔවුන් ආරෝග්‍ය ශාලාවලට යවා ඔවුන්ගේ වියදමට ධන දෙමින් රෝගාතුර සඞ්ඛ්‍යාවට ඉවහල් වූයේය.

විදෙශිවූ ජනයාට මාර්ගෝපකරණ සහ ධන දීමෙන්ද, මුහුදෙන් එතර යන්නවුන්ට නාවික ප්‍රවේශ පත්‍ර රැගෙණ දීමෙන්ද, ධන දීමෙන්ද උපකාර කෙළේය.

සැදෙශිකයින්ගේ ශුභ මඞ්ගල්‍යයන්ට උවමනා නොයෙක් වටිනා රන්රිදී බඩු දීමෙන්ද, යාන වහනාදිය සහ සනෙනාෂධන දීමෙන්ද, අවමඞ්ගල්‍යයන්ට උවමනා ද්‍රව්‍යාදිය දීමෙන්ද බොහෝ ආධාර කෙළේය.

ආණ්ඩුවේ රාජකාර්‍යයින් ලබාගැනීමට කැමැත්ත වුන්ට එකී රාජකාර්‍යයන් ලබාගැනීමට බොහෝසේ ආධාර කෙළේය.

දුක්පත් දරුවන් පාඨශාලාවලට යවාගන්ට මුදල් නොමැතිව ලතවුන දුක්පත් දෙමව්පිය ආරක්ෂාකාරාදීන්ට නොයෙක් ප්‍රකාරවන්හි මුදල් දීමෙන් දරකයින්ගේ ශාස්ත්‍රාධ්‍යාහරණයන්ට ඉවහල් වූයේය.

වෛද්‍ය අසරණ පවුල් පොෂණය සඳහා මෙතුමා බොහෝසේ අධාර වූයේය.

මෙතුමාගේ වැඩුම්හල් මුදලි දෙනමගේ පමණක් නොව මුතුන් මුත්තන් කාලේ පටන් **ද සොසියා පරමෂන වට** ආධාරවූද, දස්කම් කළාවූද ඇත්තන්ගෙන් පැවතෙන බොහෝ දෙනාට මස්පතා පින් පඬි දීමෙන් ආධාර කෙළේය.

මෙතුමාගේ වතුවලද, ලිපි ශාලාවන්හිද කම්කරුවන් වශයෙන් පත්ව සිටි වුන්ට සහ මෙබන්දන්ගෙන් පැවතෙන ඇතම් ඇත්තන්වද පින් සඳහා දිවෙල් දීමෙන්ද එකෑවර මුදල් පරිත්‍යාග කිරීමෙන්ද මහොපකාර කෙළේය.

මේරට ගොවිතැන් දියුණුකර ගැනීමේ ප්‍රයෝජන සලසන සිතින් (ආදෘශ ගොසිපලට හැර) ලඬිකාවේ නොයෙක් දිශාවන්හි ඇති ගොවියන්ට විශේෂයෙන් ආධාර කෙළේය.

වැවිල්ල සම්බන්ධ මහත් පරිශ්‍රමයක් දරා එයද සපලකර තමන් ප්‍රයෝජන ගත්තා පමණක් නොව බොහෝ දෙනට අනේක ප්‍රයෝජනද අත්පත්කර දුන් නේය. "චාර්ලිවැලි" නම් වූ එඩගලනනාදී දෙශයන්හි ඉතා අගයකොට සැලකූ බැවින්ද, ඉතා උසස් ගණනට විකුණුන බැවින්ද මෙතුමා ප්‍රසිඩ **වැවිලිකාරයෙක්** හැටියට ලොකුයා විසින් පිළිගන්නාලදි. මේ මහින්ද සඩදෙශික වැවිලිකාර ජනයාට මහත් ආධාර කෙළේය.

ආණ්ඩුවේ ඉල්ලීම පිළිගෙණ නගරාලඬිකාරය පිණිස කොළඹ කොටපොකුණු විපියේ **ද සොසියා ගොඩනැගිල්ලද** සඩකිය කල්පනාවපිට "ගෝල්ෆේස්හි" (කොල්ලුපිටියෙ) ගොඩනැගිලි සයද (6) මහත් මුදලක් වියදම්කර ගොඩ නංවන ලද්දේය.

සානත තෝමස්ගේ ශාස්ත්‍රශාලාවට රුපියල් තිස් දහස් (රු. 30,000.) දීමෙන් විපුලොපකාරයක් කෙළේය.

කොක් වෛද්‍ය මහත්මයාගේ දරුවන්ගේ දියුණුව සඳහා රුපියල් හාරදහස් (රු. 4,000.) දීමෙන් ඒ පවිලට උපකාර කෙළේය.

මොරටුවේ වේල්ස්හි කුමාරයා, සහ කුමාරිගේ නමින් පිහිටු පාඨශාලා වෙනුවෙන් රුපියල් තුන් ලක්ෂයක් (රු. 3,00,000.) දිමෙන් එකි විශාල ගොඩනැගිලි කෙරෙව් වේය.

වසි 1868 වේ දී හාල් ගණන ඉතා උස්වූ බැවින් දුක්පතුන්ට අනුකම්පා කරමැයි සිතා, වියෙන් හාලෙන් සහ මුදලෙන් රුපියල් පන්දහක් (5,000.) වියදම්කොට උපකාර කෙළේය.

මොරටුවාසී දහස් ගණන් සේනාවට පොලිස් බද්ද ගෙවාගැණීමට නොහැකිව තම තමන්ගේ ඉඩම් විකුණ යන්ට එන බව දැනගත් උත්තරීතර සත්පුරුෂ මෙතුමා ඒ සඳහා ආණ්ඩුවට ගෙවන්ට තිබුන මහත් මුදල ගෙවා දුක්පත් ජනතාවට ඉවහල් වූයේය.

අයර්ලන්තයේ සාගතය සඳහා මෙරටින් යවනුලැබූ මුදලට රුපියල් දහක් (1,000) දිමෙන් අන්‍ය දෙශවාසීන්ට එතුමාගේ ඇති කරුණාව පෙන්නුවේය.

අපගේ ශ්‍රීමත් මහාරාජීනීන්ගේ **ජුබිලි මඩහලඅස** සිහිවීම සඳහා ස්ථාපිතකළ කෞතුකාගාරයට ලාඕකික කිසිවෙක් කිසිවක් නුදුන් හෙයින්, රත්රන් පවුම් දහක් (ර. ප. 1,000.) දිමෙන් මුළු ලඩකාවට නමිබුව ගෙණ දුන්නේය.

යාපනේ මහ ශාස්ත්‍ර ශාලාවට රුපියල් දෙදහක් (රු. 2,000.) දිමෙන් යාපන පලාත්වාසී බාල දරුවන්ගේ ශාස්ත්‍රාදග්‍රහණයට ඉවහල් වුනේය.

මේ දිමනා හැර අඩක එක, දෙක, තුන, හතර, පහ (1, 2, 3, 4, 5) දරණ කොළඹ ප්‍රධාන ලිපි ශාලාවේ ප්‍රධාන ගණන් පොත්වලැ පෙණෙන හැටියට මෙතුමා විසින්විට පින්සලකා මුදලින් කළ පරිත්‍යාග මෙසේය:—

වසි 1873 නේදී රුපියල් දහහත්දෑස් අටසිය දහ තුනක් සහ ශත හැත්තෑ එකක් (රු. 17,813. ශ. 71.) ද, 1874 රේදී රුපියල් පන්දෑස් දෙසිය දහහතක් සහ ශත

හැත්තෑ දෙකක් (රු. 5,217. ශ. 72.) ද, 1875 දී රුපියල් තුන්දහස් හාරසිය දහහතක් සහ ශත අසූහතක් (රු. 3,417 ශ. 87.) ද, 1876 දේදී රුපියල් දහහතරදහස් හයසිය විසි පහක් සහ ශත හැත්තෑ පහක් (රු. 14,625. ශ. 75.) ද, 1877 දී රුපියල් විසිහතරදහස් හාරසිය විසිහතරක් සහ ශත හතළිස් එකක් (රු. 24,424. ශ. 41) ද, 1878 වේදී රුපියල් හාරදහස් නවසියයක් සහ ශත දහයක් (රු. 4,900. ශ. 10.) ද, 1879 දේදී රුපියල් එක්දහස් හාරසිය අසූතුනක් (රු. 1,483) ද, 1880 වේදී රුපියල් පන්දහස් එකසිය හතළිස් පහක් සහ ශත දහහතක් (රු. 5,145 ශ. 17.) ද, 1881 කේදී රුපියල් දෙදහස් තුන්සිය පණස් හයක් සහ ශත හතළිස් හතරක් (රු. 2,356 ශ. 44.) ද, 1882 කේදී රුපියල් අටසිය අනූහතක් සහ ශත පණහක් (රු. 897. ශ. 50.) ද, 1883 නේදී රුපියල් තුන්දහස් තුන්සිය දසසතරක් සහ ශත තිස්තුනක් (රු. 3,314. ශ. 33.) ද, 1884 රේදී රුපියල් පන්දහස් හත්සිය පණස් අටක් සහ ශත හැත්තෑතුනක් (රු. 5,758. ශ. 73.) ද, 1885 තේදී රුපියල් දෙදහස් සත්සිය සතළිස් දෙකක් සහ ශත අසූනවයක් (රු. 2,742. ශ. 89.) ද, 1886 යේදී රුපියල් දෙදහස් අටසිය හැටහතක් සහ ශත දහසයක් (රු. 2,867. ශ. 16.) ද, 1887 තේදී එක්දහස් නවසිය එකොළහක් සහ ශත නවයක් (රු. 1,911. ශ. 9.) ද, 1888 දී රුපියල් එක් දහස් තුන්සිය පණසක් සහ ශත තිස්තුනක් (රු. 1,350. ශ. 33) ද, 1889 යේදී රුපියල් තුන්දහස් විසිදෙකක් සහ ශත දහහතක් (රු. 3,022. ශ. 17.) ද, 1890 වේදී රුපියල් දෙදහස් හයසිය හැටහයක් සහ ශත හැටක් (රු. 2,666. ශ. 60.) ද පිණවදී තිබේ.

කුශලකාම් මෙතුමාගේ මෙසා මහත් දිමනා ලිපි ශාලාවෙ ගතකල කාලයන්හි දුන් දිමනාය. ඒ හෙයින් ඒ ඒ වෙලාවලදී එයි දිමනා පොතපතේ ඇතුල්කර තිබේ. මේ ඇර මෙතුමා අනන්තවරට රොගාතුරවන තුරු සැකිය වලව්වේ ගතකල වේලාවල තාන්පරයෙන්

තත්පරයට පැමිණුන දුක් මත් යාචක සමූහයාට සහ නොයෙක් අසරණ අමාරු කියාගෙන් ආ අයවලුන්ට කරතිබෙන ධන පරිත්‍යාගය අප්‍රමාණය. ප්‍රථම සඳහන් කළ ගණන්වලට වඩා මහත් ගණනක් අවිරුදුපතා ඩොකිය වලව්වේදි පිණවදි තිබෙන බව වැටහේ. වී, හාල්, පොල් පුවක් වත්, බත්, බුලත් ආදියෙන් ධන විරහිතයන්ට මේ නිවසේදි මෙතුමා කළ පරිත්‍යාග ප්‍රමාණාතික්‍රාන්තය.

මෙතුමාට හිමි වතුපිටි ගෙවල් ආදියට අවුරුද්දකට වරක් රුපියල් දහහතර දහක් පමණ (රු. 14,000.) නාගරික බදුමුදල ගෙවා ආණ්ඩුවේ අණ රැක්කේය.

තවද දිවා රෑ දෙක්හි ලොකාභියම ප්‍රාර්තනා කරන්නේ කළුතර පුලිනතලා රාමාධිපති වැලිගම ශ්‍රී සුමඟල ගණාචාර්‍ය නායක මහා ස්ථවිරපාදයන් වහන්සේ විසින් පරාවිසුමරණයෙන් ලියනලද **තුන්වෙනි පාඩම් පොත** මුද්‍රණයකිරීම පිණිස උවමනා මුදල දීමෙන් විපුලොප කාරයක් කෙළේය. *

ශ්‍රී ලඬෙකශ්වරවූද, ශෛඛාල මහා කවීශ්වරවූද කුමාරදාස නරපතිහු විසින් රචනා කරණලද **ජානකී හරණ** නම් සංස්කෘත මහා කාව්‍යය මුද්‍රණය කිරීම සඳහා

---

* "මෙම පොත චාල්ස් හැන්රි ද සොසියා දිගානාශක ලංකාවේ සමාදන නවුකාර මහතානන්ට දක්වනලදි. එසැල්ගි එම මහතානන් සතතක මුදලෙන් මේ පොත කැනීම සඳහා වුනාවූ සියලු වෙහෙසද, තවත් රට ලැබියසුතු ප්‍රයෝජනද ලොවැඩ පිණිස පරිත්‍යාග කට සුතුයයි රොමියෙල් ප්‍රණන්දු යන මට යථොක්ත මහතාගෙන් අවසර ලැබුනා ඇත.

තවද, මෙම පොත මුද්‍රාඩකණ කරවීම පිණිස කළාවූ සියලු වියදම් රුපියල් 798. ශ. 15 සි. පොත් දෙදහසක් බැවින් එක පොතක වියදම ශත 39½ සි. අප විසින් මේ පොත ගැණ අය කරන්නේත් ශත 39½ ක් පමණයි."—යනු එම පොතේ මුලට යොදා තිබෙන දැන්වීමෙන් පෙණේ.

උචමනා සම්පූර්ණ වියදම විද්‍යාලඞ්කාර පරිවෙණාධිපතීන්ද්‍ර ශ්‍රී ධර්මාරාම නායක ස්ථවිරයානන්ට පරිත්‍යාග කිරීමෙන් පුරාණ සිංහල කවීන්ද්‍රයන්ගේ සංස්කෘත කවිත්වය සිහිවීම පිණිස සහ ශාස්ත්‍රාභිලාෂික ආධුනික ජනයාගේ විපුල ප්‍රයෝජනයට මනෝහර උපකාරයක් කෙළේය. *

———:o:———

එංගලන්තයේදී කළ පරිත්‍යාග.

මෙතුමා එංගලන්තයට ගිය ගමනේදී ස්වකීය පුත්‍ර ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා මහතානන් කේම්බ්‍රිජ්හි "ට්‍රිනිටි හෝල්" (Trinity Hall) නම් ශාස්ත්‍රශාලාවෙහිද, ඒ. ජේ. ආර් ද සොයිසා මහතානන් හේස්ටිංග්ස්හි

---

* මේ ගැණ, මුද්‍රණය කරණලද, ජානකීහරණ මහාකාව්‍ය සංඥපනයේ මෙසේ සඳහන්කර තිබේ:—

"මෙසේ පූර්වොක්ත වෘත්තවිශෙෂයන්ගේ වශයෙන් පුරාතන ව්‍යාඛ්‍යාතෘ කුශලයන් අභිනව විරචිතවූ එක්දහස් පන්සැටක් ශ්ලොකයෙන් යුත් මෙම මහා කාව්‍ය ග්‍රන්ථය ආධුනික විද්‍යාර්ථීන්ට සුලභවනු සඳහා පුරාතන පදගතාර්ථ සන්නය හා සමග එක පොතක්කොට මුද්‍රාඞ්කනය කරවූවහොත් එය ලොකාභිවෘද්ධි කාරණයෙකැයි අප විසින් ලියායවන ලදින් ඊට සතුටුවූ ස්වදෙශ ශාස්ත්‍රාභිවෘද්ධිකාමීවූ ලඞ්කාවීපයෙහි සමාදෘත විනිශ්චයකාර ධුරන්ධර චාර්ලස් හැන්රි ද සොයිස දිශානායක මන්ත්‍රීන්ද්‍රයාණන් විසින් කරවනලද ධන වියදමින් මේ මහාර්ඝ කාව්‍ය ග්‍රන්ථය ප්‍රසිද්ධියට පමුණුවන ලද්දේය.

1. ශ්‍රියාංහිඝිස්සජ්ජන ගිත කීර්ති
මීහාශයශ් චාර්ලස සොයිසාබ්‍යඃ
විද්‍යාභිවෘද්ධෙ විහිතප්‍රයත්නො
විනිශ්චයාධ්‍යක්ෂ ධුරන්ධරො'සෞ.

ශ්‍රී සිංහලාධීශ කුමාරදාශ
මහා කවේඃ කාව්‍ය මතල්ලිකායාඃ
චකාර මුද්‍රාඞ්කන සිඩයෙ ධන
ව්‍යයං ධරණ්‍යාං ධනදූසිතො 'ස්‍යාඃ'.

"හයිබරි හවුස්" (Highbury House) නම් ශාස්ත්‍රශාලා වෙතින්ද ශාස්ත්‍රාදග්‍රහණය සඳහා නවතා එරට ආරොග්‍ය ශාලා ආදිය නැරඹීම සඳහා එකී ස්ථානයන්ට පැමිණියේය. ඒ ස්ථානයන්හිදී දුකටපත්වූ නානාප්‍රකාර රෝගීන් දැක, කම්පිත හෘදය ඇත්තේ එකී ස්ථානයන්ගේ අභිවෘද්ධිය පිණිස ඉතා පුරුදු ත්‍යාගිවන්ත භාවය පෙන්වීමෙන් තම ත්‍යාගිවන්ත භාවය සහ ලඞ්කාවාසී සකල සිංහල ජනතාවගේ නම්බු වද ආරක්ෂා කරගත් බව නුවණැත්තන්ටම වැටහෙන කරුණකි.

අපේ මේ දූපතේ වසන විප්‍රකාර රොගාතුරයන් විඳින දුකේ ප්‍රමාණය දැන් ලතෙත්වූ මෙතුමා එඞ්ගලනත දූපතේ වසන රොගාතුර ජනයා ගැණ සහ අන්‍ය දුක්පත් ජනයා ගැණත් කරුණා උපදවා මෙම ග්‍රන්ථයේ හාරසිය දසවෙනි (410) පිටෙන් පෙණෙන මෙතුමාගේ ඒජනත මහතුන්ට භාරදුන් මහත් මුදල හැර කර තිබෙන ධන පරිත්‍යාගය අවිරල ප්‍රශංසනීය කරුණකි.

(Guys Hospital) "ගයිස්" නම් ආරොග්‍ය ශාලාවට රත්රන් පවුම් සියයක් (ර. ප. 100.) ද, (London Hospital) "ලන්ඩන්" නම් ආරොග්‍ය ශාලාවට රත්රන් පවුම් සියයක් (ර. ප. 100.) ද, (Gt. Osmonde Street Hospital for Children) විශාල "ඔස්මන්" නම් ළඳුවන්ගේ දුරකයන් සඳහා පිහිටුවා තිබෙන ආරොග්‍යශාලාවට රත්රන් පවුම් සියයක් (ර. ප. 100.) ද, (St. Georges Hospital) "සැන්ට් ජෝර්ජ්" නම් ආරොග්‍ය ශාලාවට රත්රන් පවුම් පණසක් (ර. ප. 50.) ද, (Middlesex Hospital) "මිඩ්ල්සැක්ස් නම් ආරොග්‍ය ශාලාවට රත්රන් පවුම් පණසක් (ර. ප. 50.) ද, (University Hospital) "යුනිවර්සිටි" නම් ආරොග්‍ය ශාලාවට රත්රන් පවුම් පණසක් (ර. ප 50) ද, (St. Mary's Hospital) "සැන්ට් මේරි" නම් ආරොග්‍ය ශාලාවට රත්රන් පවුම් පණසක් (ර. ප. 50.) ද, (Charing Cross Hospital) "චාරින් ක්‍රෝස්" නම් ආරොග්‍ය ශාලාවට

රත්රන් පවුම් පණසක් (ර. ප. 50.) ද, (Westminister Hospital) "වැස්ට් මිනිස්ටර්" ආරොගෘ ශාලාවට රත්රන් පවුම් පණසක් (ර ප. 50.) ද, (Victoria Chest Hospital) "වික්ටෝරියා චැස්ට්" නම් ආරොගෘ ශාලාවට රත්රන්පවුම් විසිපහක් (ර. ප. 25.) ද, (Hospital for Women) සත්‍රීන්ගේ ආරොගෘ ශාලාවට රත්රන් පවුම් විසිපහක් (ර. ප. 25) ද, (Queen Charlotte's Lying in Hospital) චාලොට් රාජිනිය නමින් පිහිටුවා තිබෙන ප්‍රසූතිකා ගෘහයට රත්රන් පවුම් විසිපහ (ර. ප. 25.) ද, (Seaman's Hospital) නාවිකයන්ගේ ආරොගෘ ශාලාවට රත්රන් පවුම් විසිපහක් (ර. ප. 25.) ද, (Hospital for Accidents to Dock Labourers) නැව් සෑදීමේදි අනතරායට පැමිණියන්ගේ ආරොගෘ ශාලාවට රත්රන් පවුම් විසිපහක් (ර. ප. 25.) ද, (Victoria Hospital for Children) වික්ටෝරියා නමින් පිහිටුවා තිබෙන බාල දරුවන්ගේ ආරොගෘ ශාලාවට රත්රන් පවුම් විසිපහක් (ර. ප. 25.) ද, (Brompton Hospital) "බ්‍රම්ටන්" නම් ආරොගෘශාලාවට රත්රන් පවුම් පණස් දෙකක් සහ සිලිම් දහයක් (ර. ප. 52. සහ සි. 10.) ද, (Royal Free Hospital) රාජකීය නිදහස් ආරොගෘ ශාලාවට රත්රන් පවුම් පණසක් (ර. ප 50.) ද, (Great Northern Hospital) උතුරුදෙශ පිහිටි මහා ආරොගෘ ශාලාවට රත්රන් පවුම් පණසක් (ර. ප. 50.) ද, (St. Andrew's Hospital Clewer) "සැන්ට් ඇන්ඩෘ" ගේ ආරොගෘ ශාලාවට රත්රන් පවුම් විසිපහක් (ර. ප. 25.) ද, (Royal Opthalenic Hospital) රාජකීය නයනාරොගෘ ශාලාවට රත්රන් පවුම් විසිපහක් (ර. ප. 25.) ද, (Gordon Boys Home) ගෝර්ඩන් බාලකාවාසයට රත්රන් පවුම් විසිපහක් (ර ප. 25.) ද, (House of Charity, Soho) සොහෝහි පුණ්‍ය ගෘහයට රත්රන් පවුම් විසිදෙකක් සහ සිලිම් දහයක් (ර. ප. 22. සහ සි. 10.) ද ප්‍රදානය කරණලදී.

සූයෂ්කානතිය ලැබූ වසතු සමූහයාගේ ප්‍රභොදය යම් සේද, මෙතුමාගේ දර්ශනය ලැබූ දුන් මනි යාචකාදීන්ගේ සතුවත් එසේමයසි නිශ්චය කල හැකිය. මෙතුමා ආගිය යම් ප්‍රදෙශයක් ඇතිවේද, ඒ ප්‍රදෙශවාසි දුක්පතුන්ට මහත්

ආශිර්වාද ප්‍රයෝජන ලැබුන බව සත්‍යකය. මෙසේ මෙතුමා මසුරුකම නැමති කලල් විලෙහි නොනිමගනව කුශල කර්මයෙහි වඩ වඩා ව්‍යාවෘතව සිටිනා සමයෙහි මෙම කීර්තිය මුළුලොව දශදිග පැතිරින. මෙසේ පැතුරුණාවූ කීර්තිලතාවේ හටගත් කුසුමකට ප්‍රකටවූ නාමයක් මෙන්, **ද සොසිසා** නාමය මුළු ලොකයාගේ තුඩ තුඩෙහිද පැවතින. පෙර පටන් ලොව විද්‍යමාන අද්භූත ශබ්ද අතුරට **ද සොසිසා** නාමයද අන්‍යතමීතවූ බව මෙම ශබ්දය අද්‍යත්, දැනුත්, ලොකයාගේ තුඩ පැවතීමෙන් සාක්ෂිවිය. පරමොත්තෘෂ්ට පරාර්ථ වැඩ කෑමති පරම සත්පුරුෂ, පරමශිලී මෙතුමා වෙසෙසින් හෙලදිව් ජනයා සහ පරජනයා උපලාලනයකොට කොට නිරුපද්‍රව සුවසේ වාසය කෙළේය.

සහස්‍ර රශ්මි මාලාවෙන් විරාජමාන සුසූර්යයාට පවා රාහුගෙන් අනතුරු පැමිණෙන්නාක්මෙන් යසොකීර්ති ලතාවෙන් වෙර්‍යනයව් සිටි මෙතුමාටත් මේ කාලය අපල කාලයක්විය. ප්‍රසිද්ධ ජෝතිශශාස්ත්‍රඥයෙක්වූ ගල් කිස්සේ තම්බිඅප්පු ගුරු මහතා මෙතුමාගේ කේන්ද්‍රය පරීක්ෂාකොට මේ කාලය එනම්, එඩගලනතයෙන් ලංකාවට ආනැන් පටන් ඉතා අපලකාලයක් බවත්, විෂදෝෂ ආදියෙන් සහ සිව්පා සතුන්ගෙන් අනතුරු පැමිණීමට හෙතු ලක්ෂණ පේණ නිසා ඉතා ප්‍රවෙශම් විය යුතු බවත් කීවේය.

බොහෝ ගවයන් ඇති මෙතුමාට කිසි කලකත් ඉතා රෞද්‍ර ගවයෙක්වත් අශ්වයෙක්වත් විරුඩනූන නමුත්, දිනක් මෙතුමාගේ ගවයෙක් අනින අදහසින් මෙතුමා පසු ඵලෙව්වේය. මේ අනතුරෙන්ද මෙතුමා බේරුනේය.

උඩරට යාමට ඉතා ඕනෑව තිබුන නමුත් යම් යම් කරුණු නිසා එයද කල්දමා තිබුනේය. මෙසේ මාස දෙකක් පමණ ගතකර දිනක් කළුතර පුලිනතලාරාමාධි පති වැලිගම ශ්‍රී සුමඩගල ගණාචාර්‍ය්‍ය නායක ස්ථවිරපාදයන් වහන්සේ හමුවෙහිදී, තම්බිඅප්පු ගුරුමහතාට කථාකොට

"දැන් ඉතින් නවතින්ටම හැකි නැති නිසා මේ සුමානයේ උඩරට ගොස් එම සඳහා යාමට සිදුවී තිබේය" යි කීවේය. මෙසේ කීකල තම්බි අප්පු ගුරු මහතා, "මහත්මයා, කොපමණ අලාභහානි පැමුණුනත් මේ සුමානයේ නම් යන්ට එපාය. නපුරු දවස් කීපයම ඇත්තේ මේ සුමානයේය" යි කියා ගමන වැළකුවේය. මෙසේ මේ කථාව කළ දින එක්දහස් අටසිය අනූවේ ජූලි මස තිස්වෙනි (1890. ජූලි. ම. 30.) බුදදිනදීය. මෙදින රෑ මෙතුමා මෙසේ ස්වපනයක් දර්ශනය කෙළේය.

උසස්වූ දත් සහ මහත්වූ ඇස් ඇති දිඝී නිය සහ අවුල්වූ හිසකේ ඇති ඉතා කෘෂ්ණවර්ණ මහ දෙහය ක්න් යුත් ස්වභාව ඇති භයානක පුරුෂයෙක් ආයුධ සන්නද්ධව මෙතුමා සපා කෑමට පැනීමය. * මෙතුමා මීට මහත්සේ භයවූයේ, පහන්වූ කල **ඔමරු බාස්** නම් මෙතුමාගේ ගෙවල වැඩකරවන මරක්කල මිනිහාට පළමුකොට සිහිනය කියා කරබා හුන්නේය.

ලැබූමස එනම්, වර්ෂ එක්දහස් අටසිය අනූවේ අගෝස්තු මස දෙවෙනි (1890 අ. ම. 2.) ශනිදින අති උදය සෙනසුරු හෝරාව තිබියදීම "ටැරියර්" නම් වර්ගයේ සුනඛ පෝතකියක් යම්කිසිහෙයකින් වලව්වේ පිට ශාලාවට පැමිණ සිට මෙතුමා උඩුමහලෙන් බැස ආ හැටියේ පියගැට හිනමුල සිට මෙතුමාගේ ග්‍රීවයට පැන්නාය. මෙතුමා බැල් ලගේ බෙල්ල අල්ලාගත් කෙණෙහි දක්ෂිණහස්තාඞ්ගුෂ්ඨය සම්පූර්ණයෙන් සැපීය. එකෙණෙහි මෙතුමා වමතින් බැල්ල බෙල්ලෙන් උසුලාගෙණ වාසල මුරකරුවූ **බ්‍රම්පි** නම් තැනැත්තාට කථාකොට, වහාම යකඩ කූඩුවක්

---

* "කරාලෙ විකටෝඃ කෘෂ්ණඃ, දූරුෂෛරූඪ තාම්‍රකෝඃ පාෂාණෛශ්ශස්තාඩ්‍යතෙ ස්වප්නෙ සද්‍යෝ මෘත්‍යුර්භවෙන්නරඃ" භයානකවූ නොහොත් උසස්වූ දත් ඇති, ඇස්රැව්ම් ආදි විකාර ස්වභාවෙන් යුක්තවූ, කළුපාට ඇතිවූ, උස්කොටගත් ආයුධයන්ගෙන් හෝ ගල්වලින් හෝ පුරුෂයන් විසින් සිනයෙන් තළණු ලැබේ නම්, ඒ කාලයෙහි මනුෂ්‍යයාගේ මරණයවෙයි. යනු මාර්කණ්ඩෙය පුරාණයෙහි පෙණේ.

ගෙණ එමට අණකොළේය. **බ්‍රම්සි** නම් අය, යකඩ කූඩුව ගේන්ට ගිය කොණෙයි **දුමින් සිඤ්ඤෝ බාස්** නම් අය පැමිණ මෙතුමා වමතින් උසුලාගෙණ සිටි බැල්ල රැගෙණ **බ්‍රම්සි** නම් අයට දුන් කල, ඔහු යකඩ කූඩුවේ ලෑවේය. මෙහිදී **බ්‍රම්සිගේ** අත බැල්ල සැපීය. මෙතුමාගේ බෑණන්ඩිවන සලමොන් ප්‍රණාන්දු වෛද්‍ය මහතා ශොධක ජලෞෂධයෙන් ("කොන්ඩිස් ප්ලුයිඩ්") (Condy's Fluid) සපාකෑ ඇඟිල්ල සෝද දහනකෞෂධයෙන් ("කෝස්ටික්") (Caustic) පිලිස්සුවේය.

මෙ ආරංචිය පැතිරගිය ක්‍ෂණයෙහිම උසස් උතුමා පටන් පහත් යාචකයාද, මහත් දුක්ඛිත භාවයට පත්වූහ. නොයෙක් තරාතිරම් ජනසමූහයා මෙතුමා ගැණ සෙවීම සඳහා රැස්වීමට පටන්ගත්හ. ද සොයිසා මැතිනිය සහ පුත්‍ර මහත්වරුද, දුහිතෘ මහත්මින්ද අන්‍ය බන්ධූන්ද මෙ ගැණ දුක්වූ අන්දම සිමා රහිතය. බැල්ල විසරුද, නෑද්ද යනු නිශ්චයකර ගැණීමට අපහසුවූ නමුත්, පැරිස් නුවරට පැමිණ "පැස්චියර්" ගෙන් මිට ප්‍රතිකාර ලැබීමෙ ඇති වැදගත්කම දක්‍ෂ ඉඞ්ග්‍රිසි වෛද්‍යයන් කීකල ඊට කැමතිව ඒනුවර යාමට නෞක ප්‍රවෙශ පත්‍ර ගැණීමටද සූදනම් විය. මෙ අදහස පසුව වෙනස්විය. දක්‍ෂ සිංහල වෛද්‍ය යන්ගේ මත ප්‍රකාර මුහුදේ ගමන අගුණ බවද, පැරිස් නුවරට පැමිණෙනතුරු ඖෂධ කිරීමට බෙහෙත් සපයා ගැන්ම දුෂ්කර බවද, මෙම ප්‍රස්තාවෙහිදී බන්ධුමිත්‍රාදීන්ගෙන් වෙන්වීම සැපතක් නොවන බවද, සිංහල වෙදකමෙන් පිස්සු බල්ලන් විසින් සැපූ බොහෝදෙන සුවපත්වූන බවද; මුහුදු ගමනේදී ඉඞ්ග්‍රිසි වෛද්‍යයන් නියමකල මස් මාංශ "බිප්ටි, ෂැම්පින්" ආදිය සිංහල වෙදකමට අපත්‍ය බවද, පැරිස් නුවරට යන ගමනට සිංහල වෙදෙක් ඕනෑ නැති බවද, කියා සිටි කල මෙතුමා ඊට සතුටුව පැරිස් නුවර යාමෙ අදහස අතහැරියේය.

තවත් මෙහිදී සිදුවූ කරුණක් නම්:—මෙ සැපූ බැල්ල විසරුවෙන්ද? නැද්ද? යන සන්දෙහයය. ඇතැමුන් ඈ විසරු නොවන බව කීමෙන්ද, මෙ සන්දෙහය උපන.

සභාවයෙන්ම සිංහල වෙදකමට විරුද්ධ ඉඞ්ග්‍රීසි වෛද්‍යයන්ගේ සහ මෙතුමාගේ මිත්‍ර ඉඞ්ග්‍රීසි ප්‍රභූ ජනයාගේත් මත ප්‍රකාශකෙළේ ඉඞ්ග්‍රීසි ප්‍රතිකාර ලැබීමටය. නිරවද්‍ය ස්ථිර නියමයක් නොමැතිව දෙඛනලද එක්එක්කෙණාගේ විප්‍රකාර අදහස්වලට වාල්වීමේ ඇති නපුර **නියවතුන්** විසින් මෙතුමාට නිරවද්‍යලෙස පෙන්නාදෙනලද්දේ, එම විප්‍රකාර අදහස් නිරවශෙෂයෙන් නසා දක්ෂ සිංහල වෛද්‍යයන් අතට භාරවූනේය.

මෙසේ සිංහල වෙදවරු අතට භාරවීම ගැණ ද සොසිසා මහත්මිය ප්‍රධාන පවිලද සතුටුවූහ. මේ අතර අයෝමය මැදිරියේ සිටි බැල්ලද මියගියාය. වියරු ලක්ෂණ සියල්ලම මෙම බැල්ලගෙන් පේන්ට තිබුන නිසා මෑ වියරු බැල්ලක් බව සමහර වෛද්‍යයෝ එත්තුගත්හ. ඇතම් වෛද්‍යයන් මෙය එත්තු නොගෙණ එකමත නුවූ හෙයින් වියරු බැල්ලක්ද නැද්ද යන්න ගැණ මෙතුමා සහ තවත් බොහෝ දෙන අදුරේ සිටියාහ. ඒ කෙසේ වෙතත් වියරු බලු විෂට නියම ඖෂධ මෙතුමාට කරණලදී.

සිංහල වෙදකමට උවමනා බෙහෙත් සපයාගැණීමට පහසු නිසාත්, නිරායාසයෙන් විසිම මෙබඳු රොගයන්ට හිත නිසාත්, ද සොසිසා පවුලේ මුල් ස්ථානයවූ මොරටුවේ වලව්වට මෙතුමා යාමට සතුටුවූයේ, අගෝස්තු මස සය වෙනි (6) දින එහි පැමිණීයේය. වලව්වේ ඇතුවහිය ලිපිශාලාවේ ලිපිභාණ්ඩාදිය අහක්කොට කිසිවෙකුට එහි ඇතුල්වෙන්ට බැරිලෙස මුරකරුවන් තබා වලව්ව ඉතා ශුඛලෙස තැබීමට සියලුම විධි විධාන ඤුනින් සහ අනු ජීවින් විසින් කරවන ලද්දේය.

මොරටුවේ වලව්වට පැමිණ නිසිප්‍රකාර සිංහල බෙහෙත් ගෙණ එන අතර, එනම් මොරටුවේ වලව්වට පැමිණි තුන් වෙනි දිනවූ නමවෙනිදා රෑ කාලයේ නිද්‍රාවේදී මෙතුමා කෑගැසීමට පටන්ගත්තේය. එහි සිටි වෙදවරු කෑගැසීම ගැණ සෙවිකල කුරුල්ලෝ කිපදෙනෙක් පියාසරකර

අඬුත් මෙතුමාගේ තුවාල කොටා කණ බැව් සිනෙන් දැන හයවූ බව කීවේය. සඬපනය කිකල සඬපන දක්වන සවිසථානයන්හිම නිරවද්‍යව අගුහ * ලක්‍ෂණම ප්‍රකාශ කරණ දුෂිත සඬපන දර්ශනය තේරුම්ගත් දැඟ සෙඬහල වෛද්‍යයෝ මෙතුමා ගැණ මනෙතසාහයයට පැමිණ නැවතත් මෙතුමා කළ මහා පරාජික කම් මෙනෙහි කොට සහ රොගියාගේ අවසානය දක්වා බෙහෙත් කිරීම අවශ්‍ය බවට වෛද්‍ය ශාසත්‍රයෙහි කර තිබෙන ආඥාවට කීකරුවීමේ යුතුකමුත් සලකා, සිනය ගැණ බිය නොවන්ට මෙතුමාට අවවාදකොට සැනසෙවිවෝය. ශුනීගේ සැපීමට ප්‍රථම දර්ශනය කළාවූ සිනය ගැණද, සැපීමෙන් පසු දර්ශනය කළාවූ මේ සිනය ගැණද, ඇතම් නුවණැත්තහු මෙසේ නිශ්චය කරගත්හ.

"මේ බියකරු බැල්ල වලව්වේ මුළුතැන්ගෙට ගොස් එහිදී අරක්කැමියන්ගෙන් ගල්පහර ලබාගෙණ ඉන් එකෙතුදු නොසපා, දුව එන අතර බිලිඳෙක් වඩා හුන් දැසියක් සමීපව ඇයද නොසපා ඇගේ වෘත්‍රයේ සැපීගෙණ අවුත්, තැන තැන දුවද්දී සමීපවූ මෙසා මහත් වලව්වේ ඇති අශ්ව වෘශභාදින්ද, පක්‍ෂීන්ද නොසපා, එහා මෙහා යන සියගණන් අනුජීවින්ද නොසපා, මෙතුම උඩුමහල් නලයෙන් බැස එන අතර එහි පියගැට කිනමුල රුකා සිට මෙතුමාගේ ග්‍රීවයටම පැණීම මවිත්‍යටම කරුණක් බවය."

---

* "පතනං පඨිකාදිභ්‍යා--බනධනංච පරාජයම්
කාකාදෙර්ලුංඛපනම්පාතං--තාරාදිනාං නශස්‍යතෙ,"

පඨිකාදියකින් වැටීම, බැඳීමකට අසුවීම, යමකින් පරාජයවීම, කාකාදිකොට ඇති පක්‍ෂීන් කෙවිමහෝ කඩාකැම, අහසින් තරු ආදිය වැටීම, යමෙක් සිනෙන් දකිනම්, ඔහුට අගුහ බව, ත්‍රිංශද් ඔපජඛ්‍යයෙ සඬපනාධිකාරයෙන් පෙණේ.

ත්‍රියතෙ ශ්‍රොත සාඛොවා--ඛොවාමොණ්ඩ්‍ය මවාපනුයාන්
පරාජියෙන බධ්‍යෙත--නාකාදෙර්වාඨියුසතෙ.

යමෙක් ජලශ්‍රොතසින් ගෙණයනු හෝ ලබාදී, යමෙක් හිස මුඩු ලැබේද, කපුටු ආදි පක්‍ෂීන් විසින් හිංසා කරනු ලැබේද, යමෙක් විසින් බඳිනු සෙන් යමෙක් දකිනම්, ඔහුට ඉන් අගුහ බව වෘහන් නිසණ්ඩු රත්නාකර

"මෙකී සත්‍යා වලව්වේ සිටි හැමදෙනාම අතහැර මේ උත්තමයාම සොයමින් සිට තම දැඟිත පථයට හමුවූ වහාම ශ්‍රීචයට පැණීම පෙර සසර බඳිනලද වෛරයක් ලෙසම තේරුම් ගැණීමට නිරවද්‍ය බොහෝ කරුණු තිබෙන බව ප්‍රත්‍යක්ෂලෙස සැලකීම වටනා බවය. යලිදු නක්ෂත්‍රානුකූලව සකස් කරණලද මෙතුමාගේ ජනම පත්‍රයේ ග්‍රහ සංයොගාදියෙන් මේ කාලයේ මේ රූපීක වඩයකටම පැමිණෙන්ට හෙතු තිබෙන බැව් ප්‍රකාශවීමද, පූර්ව ප්‍රාර්ථනාව ඉටුකර ගැණීමට බැල්ලට ලැබුන සිමාව නොවේයයි කීමට සසර සැරිසැරීම විශ්වාසික ඥනවන්ත යින්ට කිසිසේත් ඉඩ නැති බවය. තවද මේ විසරු සත්‍යාගේ හදිසි පහළවීමෙන් සිදුවූ අනතුර **කම්ඵලයක්** නොවේයයි කීමටද එකඳ සමර්ථයෙක් මේ මිහිපිට නොමැති බව සථිරලෙස කීමට ඉඩ බොහෝ බවය."

ඒ කෙසේවී නමුත් යම් යම් ව්‍යසනයන්ට යම් යම් ඖෂධ මන්ත්‍ර තන්ත්‍රාදි කම් ඇතමවිට සහයවීමට හේතු වාසනා ඇද්ද, නැද්ද යනු නිශ්චය කිරීමට **වර සමීක්ෂ** නුවූ කිසිවෙකුට නොහැකි හෙයින්, වඩ වඩා ප්‍රවේශමෙන් බෙහෙත් ආදිය කිරීමට පටන් ගන්නාලදී. බෙහෙත් කරණ තොටගෙණ අනේ වණ වියලිගොස් මද සුවයක් පෙණී ගියේය. මෙහිදී උමතුවන බෙහෙත්දීම යුතුව තිබුන හෙයින්, ඒ බෙහෙත දීමට කවර වෛද්‍යයෙක් තෝරනුද යන විවාදයක් හටගැණුනේය. බොහෝ දුර විවාද කළායින් පසු **මිනිවන්ගොඩ වෛදමහත්මයාගෙන්** ඒ බෙහෙත දීමට තීන්දුවිය. විවාදක මහතුන්ගේ තෝරා ගැණීම පිට ඒ බෙහෙත එසේ දුන් නමුත්, බෙහෙතින් ලැබියයුතු ඵලය නිරර්ථකවිය. බෙහෙත් දුන් ප්‍රමාණය ඉතා මදවූහෙයින් උමතු නොවී ගියේයයි සමහර වෛද්‍යයන් කියමින් අරගලක්ද පැවතින. මේ ආදිය කෙසේ වෙතත් සැපු දින පටන් දෙමසක් පමණ ගතවුනායින් පසු එක්දහස් අටසිය අනූවේ සැප්තැම්බර් මස විසිඅට වෙනි (1890. සැ. මී. 28.) ඉරු දින විසරු බලු විෂ බලාපොරොත්තු නූනාවූ ක්‍රමයට

මුළු ශරීරයේ පැතිරිණ. බැල්ල වියරුද නැද්ද යන ප්‍රශ්නය මෙහිදී වියරු බැල්ලක් බවට නිශ්ශාඛ්කාලෙස වැටහුනිය. සපාකෑ අත සම්පූර්ණයෙන් ඉදිමී වේදනා සහිතවිය. වතුර බීලීමද අමාරුවිය. හිඟැස්සීමද ඇතිවිය. ජලත්‍රාසයද ඇතිවිය. එලිය බැලීමද අප්‍රියවිය. නුවණැති මෙතුමා එතුමාගේ මරණය ආසන්න බැව් නිශ්චයකොට දැන, එතුමාගේ නීතිඥවරුවන **ලෝස්** සහ **වැන්කොසිලැන්බර්ග්** මහත්වරු කැඳවීමට පණිවුඩ හැර ශුද්ධ එම්මානුවෙල් දෙවමැදුරේ ප්‍රධාන ගෞරවනීය **ජොහානස් ද ඕල්වා** උන්නාන්සේ කැඳවා **ලබ්ධිශාන්ති කෘත්‍යය** කරවා ගත්තේය. මෙය හමාරවූ කල කැඳවන ලද නීතිඥවරු ලවා පුරාණ **ධන සංරක්ෂණ පත්‍රිකාව** අවලඛ්කර අභිනව **ධන සංරක්ෂණ පත්‍රිකාවක්** ලියවා එහි අන්තිම අත්සන යෙදුවේය.

THE LAST WILL.

THIS is he Joint Last Will and Testament of us, Charles Henry De Soysa Dissanayake hereinafter called the Testator and Catherina De Soysa hereinafter called the Testatrix, husband and wife, of Alfred House Colombo, at present residing at Moratuwa.

1. We and each of us do and doth hereby revoke all previous wills and other Testimentary Dispositions heretofore made by us jointly or by either of us separately.

2. We hereby nominate and appoint the survivor of us and our eldest surviving son to be the sole Executors of this our Last Will and Testament and we give unto them full power and authority to sell lease and otherwise deal with our properties as to them may seem most advantageous.

3. We do hereby will and declare that in the event of the Testator surviving the Testatrix all our property Estate and effects of each of us whether in possession reversion or expectancy shall without any reservation devolve upon or become the absolute property of the Testator

4. In the event of the Testatrix surviving the Testator the Testatrix shall retain the whole of our property Estate and effects save as is hereinafter provided and take and enjoy the rents and profits thereof during her natural life and apply the same towards her maintenance and support and the maintenance support and education of our minor children.

5. On the marriages of our daughters during the lifetime of their mother it is our wish that to each of our daughters shall be given real and personal property of the value of Rupees Two hundred thousand (Rs. 200,000) upon the same terms and conditions as are contained in the Deed of Gift executed in favour of our daughter Fanny on her marriage with Dr. Solomon Fernando. Should however the mother die before all our daughters are married, then it is our wish and desire that to each daughter shall be set apart and given real and personal property of the same value and upon the same terms and conditions as she would have received, on her marriage if the mother was alive, and our daughters shall take and accept such property as their full share of inheritance from both or either of us. If upon the death of the mother any of our daughters shall be minors, the Guardians hereafter to be named shall apply the rents and profits of the share to which such minor daughter shall be entitled or so much thereof as may be considered necessary towards her maintenance and advancement.

6. We have given our daughter Fanny on her marriage with Dr. Solomon Fernando, property of great value but if the value thereof be under Rupees Two hundred thousand (Rs. 200,000) it is our desire that the deficiency should be made up in real and personal property, and she should hold such property upon the same terms and conditions as the property already gifted to her.

7. It is our wish and we do hereby desire that our eldest surviving son shall have the sole control and management of the Institution founded by us called and known as the Prince and Princess of Wales College at Moratuwa and so long as the Testatrix shall enjoy the rents profits and income of our property she should pay a sum of Rupees Three thousand (Rs. 3000) per annum for the maintenance and support of the said Institution.

8. It is also our will that so long as the Testatrix shall enjoy the rents profits and income of our property she should give to each of our sons an allowance of Rupees Three thousand (Rs. 3000) per annum on attaining their majority.

9. Upon the death of the Testatrix it is our wish and desire that all the rest and remainder of our property moveable as well as immoveable whatsoever and wheresoever the same may be shall be divided in share and share alike amongst our sons whom we nominate and appoint our heirs.

10. It is also our wish that the Testatrix jointly with our eldest surviving son and our Cousin Solomon Peter De Soysa shall be Guardians of our minor children.

In witness whereof we do set our hands to two of the same tenor as these presents at Moratuwa on the Twenty ninth day of September in the year of our Lord One thousand Eight hundred and Ninety.

(Sigd.) C. H. De SOYSA.
,, C. De SOYSA.

Signed published and declared by the said Testator and Testatrix as and for their last will and Testament in our presence, who in their presence and at their request and in the presence of one another all being present at the same time have subscribed our names hereto as Witnesses.

(Sigd.) RICHARD H. MORGAN,
,, J. G. C. MENDIS,
,, L. H. EPHRAIMS,
,, HECTOR VAN CUYLENBURG.

(Sigd.) F. C. LOOS,
N. P.

I Frederic Charles Loos of Colombo in the Island of Ceylon Notary Public by lawful authority duly admitted do hereby certify and attest that the foregoing Last Will and Testament having been duly read over and explained by me unto Charles Henry De Soysa Dissanayake and Catherina De Soysa therein named in the presence of the Witnesses Messieurs, Richard Hilleband Morgan, John George Charles Mendis, Lanselot Henry Ephraims, and Hector Van Cuylenburg all of Colombo, all of whom are known to me, the same was signed by the said Charles Henry De Soysa Dissanayake and Catherina De Soysa and by the said Witnesses and by me the said Notary in the presence of one another, all being present at the same time at Moratuwa in the District of Colombo aforesaid, on the Twentyninth day of September in the year of our Lord One thousand Eight hundred and Ninety.

SEAL.

F. C. LOOS,
Notary Public.

Date of attestation,
29th September 1890.

True Copy

(Sigd.) JNO. J. DE FRY,
Notary Public.

One Stamp of Rs. 1- (one) Official.

අනාගම කැමති පත්‍රයේ පිටපත.

කොළඹ ඇල්ෆ්‍රඩ් හවුස් නම් වලව්වේ පදිංචිවූද, දැනට මොරටුවේ පදිංචිව සිටින්නාවූද සර්වාම්පුරුෂයා සහ භාර්‍යාවන් වන මින් පහත බූදලේ අයිතිකාරයාලෙස සඳහන්වන චාල්ස් හැන්රි ද සොයිසා දිශානායක සහ බූදලේ අයිතිකාරි ලෙස සඳහන්වන කැතරින් ද සොයිසා යන අපේ සම්බන්ධිවූ අනාගම කැමැත්ත සහ බූදලේත් මේය.

1. අප දෙදෙනා එක්ව නොහොත් වෙන් වෙන් වශයෙන් මිට ප්‍රථම කරණලද සියලුම කැමති සහ බූදලේ සම්බන්ධ ලියවිලිත් අප දෙදෙනා එක්ව සහ වෙන් වශයෙනුත් මෙයින් අවලංගු කරණලදී.

2. අප දෙදෙනාගෙන් වැඩිකල් ජීවත්වෙන තැනැත්තා සහ ජීවත්ව සිටින අපේ වැඩිමල් පුත්‍රයාත් මේ අපේ අනාගම කැමැත්තේ සහ බූදලේත් බලකාරයන් ලෙස නම් නියමකර පත්කරමු. ඔවුන්ට ප්‍රයෝජනවත්යයි කල්පනාවන පරිද්දෙන් බූදලේ ඉඩම්කඩම් ආදිය විකිණීමටද, බදුදීමට සහ වෙනත් කාරණා කිරීමටත් ඔවුන්ට අපි මෙයින් සවිපුණි බලය දෙමහ.

3. බූදලේ අයිතිකාරි අයිතිකාරයාට ප්‍රථම මිලෙන් අප දෙදෙනාටම අයිති එම බූදලේ සම්පූර්ණයෙන්ම අයිති කාරයාට අත්පත්වේ.

4. බූදලේ අයිතිකාරයා අයිතිකාරිට ප්‍රථම මිලෙන් එම බූදලේ සම්පූර්ණයෙන් එම අයිතිකාරිට අත්වනු පමණක් නොව එම බූදලයෙන් ලැබෙන බදු ආදායම් ආදිය අයිතිකාරි ජීවත්වනතුරු භුක්තිවිඳීමට සහ අපේ බාල දරුවන් රක්ෂාකිරීමටත් ඔවුන්ට උගැන්වීම්ආදියටත් හැකිවීමට නියම කරගන්නාලදී.

5. මෑනියන් ජීවත්ව සිටියදී සිදුවන අපේ දියනි වරුන්ගේ සරණම්ඔහල්ය වලදී හැනී නම් අපේ දියනිය වෛද්‍යවරයකු සලමොන් ප්‍රනාන්දු මහතාට සරණපාවා දීමෙදී දුන් තෑගි ඔප්පුවේ සඳහන්වන ගිවිසුම් සහිතව

අපේ එක එක දියනියන්ට රුපියල් දෙලක්ෂයක් වටනා (රු. 200000.) ඉඩම්කඩම් දේපලාදිය නියම පරිද්දෙන් දීම අපේ කැමැත්තවිය. නුමුත් අපේ දියනිවරුන් සියලු දෙනාම සරණපාවා දීමට ප්‍රථමයෙන් මව් මළහොත් එක එක දියනියන්ට එම ගිවිසුම්පිටම එම ප්‍රමාණ වවිනා දේපල වෙන්කර දීමත් එය අප දෙදෙනාගේම බූදලයෙන් අසිනිවන සම්පූර්ණ කොටස වශයෙන් පිළිගැණීමත් අපේ කැමැත්තවිය. අපේ දියනිවරුන්ගෙන් යමෙක් බාල කාලයේදි මව් මලොත් එම දියනියන්ට ලැබෙන බූදලේ කොටසින් අත්වෙන බදු ලාභ ප්‍රයෝජන පහත නම් සඳහන්වන ආරක්ෂාකාරයන් විසින් ඇගේ නඩත්තුවට සහ ඇති දැඩි කිරීමටත් ගතයුතුවේ.

6. අපේ ෆැනි නම් දියනිය වෛද්‍යවාර්ය්‍ය සලමොන් ප්‍රනාන්දු මහතාට සරණ පාවාදීමේදී බොහෝ වවිනා දේපල දුනිමු. නුමුත් එහි වවිනාකම රුපියල් දෙලක්ෂයට (රු. 200000.) අඩුනම් එම අඩු ගණනත් සම්පූර්ණ කිරීමට ඈට දුන් තෑගිපත්‍රයේ ගිවිසුම්පිටම නියම දේපල දීම අපේ කැමැත්තය. .

7. අප විසින් වේල්ස්හි රාජකුමාරයානන්ගේ සහ කුමරියගේත් නමින් මොරටුවේ පිහිටුවා තිබෙන ශාස්ත්‍ර ශාලාවේ කාරණා පිළිවෙලකිරීම් ආදිය ජීවත්ව සිටින අප වැඩිමල් පුත්‍රයා විසින් කිරීමත් බූදලේ අයිතිකාර් එම බූදලේ බදු ලාභ ප්‍රයෝජන භුක්තිවිඳිනාතුරු එම ශාස්ත්‍ර ශාලාවේ නඩත්තුව සඳහා ඈ විසින් අවුරුද්දකට රුපියල් තුන්දහස බැගින් (රු. 3000.) දීමත් අපේ කැමැත්තවිය.

8. බූදලේ අයිතිකාරි විසින් එහි බදු ආදායම් ලාභ ප්‍රයෝජන භුක්ති විඳිනාතුරු අපේ පුත්‍රයන් එක්කෙනාට අවුරුද්දකට රුපියල් තුන්දහස (රු. 3000.) බැගින් ඔවුන්ගේ දිවුරුණුවට ඈ විසින් දීම අපේ කැමැත්තය.

9. බූද්ලේ බලකාරී මලකල අපේ බූදලේට අයිතිව ඉතුරුව තිබෙන සියලුම වස්තුවල නිශ්චල දේපලාදිය අපේ බූදලේ උරුමක්කාරයන් වශයෙන් නියම කරණු ලබන අපේ පුත්‍රයන් විසින් එකාකාර කොටස්කර බෙදා ගැනීම අපේ කැමැත්තවිය.

10. බූදලේ අයිතිකාරිත් ජීවත්ව සිටින අපේ වැඩිමල් පුත්‍රයා සහ අපේ මස්සිනා වන සොලමොන් පීටර් ද සොයිසාත් අපේ බාල දරුවන්ගේ ආරක්ෂාකාරයන්වීම අපේ කැමැත්තය.

මීට සාක්ෂි වශයෙන් මෙයාකාරම් ලියවිලි දෙකකට අපේ ඇටෝර්නිවහන්සේගේ වහිසෙන් එක්දහස් අටසිය අනූවක්වූ සැප්තැම්බර් මස විසිනවවෙනි දින මොරටුවේදී අපේ අත්සන් තැබීමු.

(අත්සන්කළේ)

ඔ. එච්. ද සොයිසා,
ඔ. ද සොයිසා,

යටකී බූදලේ අයිතිකාරයා සහ අයිතිකාරී විසින් ඔවුන්ගේ අන්තිම කැමැත්ත සහ බූදලේත් වශයෙන් අප ඉදිරිපිටදී අත්සන්කර ප්‍රසිඛ කොට ප්‍රකාශ කරණලදි. අපිද ඔවුන් ඉදිරියේ ඔවුන්ගේ කීමපිට සහ අපි එකිනෙකාත් ඉදිරියේ එම වේලාවේම මීට සාක්ෂිකාරයන් වශයෙන් අත්සන් තැබීමු.

(අත්සන්කළේ)

රිචර්ඩ එච්. මෝර්ගන්,
ජේ. ජී. සී. මැන්දිස්,
ඇල්. එච්. යුප්‍රේම්ස්,
හැක්ටර් වැන්කයිලැන්බර්ග්.

(අත්සන්කළේ)

ඇප්. සී. ලෝස්,
ප්‍රසිඛ නොතාර්ස්.

ලඤ්ඤාවිපයේ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ධුරය දරණ ෆ්‍රෙඩ්‍රික් චාල්ස් ලෝස් නම් මා ඉදිරිපිටදී යට දැක්වූ අන්තිම කැමැත්ත සහ බූදල් පත්‍රයත් සාක්ෂිකාරයන් වන කොළඹ මා අදුනන රිචර්ඩ් ඕලිබැන්ඩ් මෝර්ගන්, ජෝන් ජෝර්ජ් චාර්ල්ස් මැන්දිස්, ලැන්ස්ලට් හැන්රි ෂුප්‍රේම්ස්, හැක්ටර් වැන්කසිලැන්බර්ග් යන මහතුන් ඉදිරියේ චාලිස් හැන්රි ද සොසිසා දිශානායකට සහ කැතරින් ද සොසිසාටත් කියවා විස්තරකර දුන් පසු එම චාලිස් හැන්රි ද සොසිසා දිශානායක සහ කැතරින් ද සොසිසා විසින්ද, යටකී සාක්ෂිකාරයන් විසින්ද, යටකී නොතාරිස් වන මා විසින්ද අප සියලු දෙනාම එක්ව සිටිද්දී එක වේලාවේදී කොළඹ දිස්ත්‍රික්කුවේ මොරටුවේදී අප සැමගේ වහන්සේගේ වශියෙන් එක්දහස් අටසිය අනූවක්වූ සැප්තැම්බර් මස විසිනමවෙනි දින අත්සන් කළ බැව් මෙසින් සහතික කරමි.

මුද්දරය

ඇප්f. සී. ලෝස්,
ප්‍රසිඛ නොතාරිස්.

සහතිකයේ දුනම්,
1890 සැප්තැම්බර් මස
29 වෙනි දින.

සැබෑ පිටපත බවට,
(අත්සන්කළේ)
ජෝන් ජේමිස් ද ප්‍රසි,
ප්‍රසිඛ නොතාරිස්.

(රූපියලක මුද්දරයක්පිට)

C. H. DE SOYSA.

Colombo, 3 මැයි 1877



MR. C. H. DE SOYSA'S HAND-WRITING.—සී. එච්. ද සොයිසාතුමාගේ අත්අකුරු.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO

විසිනව වෙනි (29) සඳු දින අසනීපය තව දුරටත් බලවත්විය. රොගය බලවත් වෙගණ ආ නමුත් සිහියට ශෙෂ හානියකුදු නුවූයේය. වෙදවරු පුළුවන් තරම් කඩිනමට බෙහෙත්කලා පමිණියත් නොව මරණය වෙතත් තව කල් ගතවී බව සැලකුවෝය.

———:o:———

අන්තිම අනුශාසනා.

පින්වත් උතුමා තම අනුජීවීන් කැඳවා ඔවුන්ට පියෙකු පරිදි අන්තිම අනුශාසනාව කෙළේය. නෑදෑ මිත්‍රයින්ටද, කියයුතු කිවේය. සිංහල වෙදවරුන්ටද ඉතා ආදරයෙන් කියයුතු කිවේය. අවවාද කළ යුකනන්ට කෙණෙහි පාසා ගෙන්වමින් අවවාදද කෙළේය. මරණ මංචක ප්‍රාප්ත මෙතුමාගේ මෙකී අවවාද හෘදය කාවදින අවවාදයන්වී සියළුදෙන කඳුලු වගුරුවමින් අවනතව සිට පිළිගත්තාහුය.

ඉක්බිති මෙතුමාගේ පුත්‍ර පුත්‍රිකාවුන් ලඟට කැඳවා මෙසේ කිවේය. "නුඹලාට දැන් ඉතින් කිසිම අඩු පාඩු යමක් නැත. ලොකයාට හිස පාත්කරමින් නිරහඞ්කාරව, ශුචරිතයන්හි හැසිරීමෙන් හොඳින් ජීවත් වෙයල්ලා! ඕනෑවාට වඩා රථවාහන සහ අසුන් තබා නොගණිල්ලා! කොටුවේ තිබෙන "කන්තෝරුව" වලව්වේම තබාගණිල්ලා! මරණයනම් කාටත් නියම එකකි. ඒ මරණය මාතරද දැන් එයි, ඒ ගැණ නුඹලා කිසිවෙක් දුක් නොවෙල්ලා! එඩගලනනයේ සිටින මගේ දරු තුන්දෙනාටත්, මම මේ කීදේ කියාපල්ලා! මගේ මලකඳ ශුඛ ඒවමාතුවෙල් දෙවස්ථානය සමග තිබෙන සොහොන් බිම, මගේ පුතා වළලා තිබෙන ඉඩමට යාව වළලා පල්ලා! මිට වඩා යමක් නුඹලාට කියයුතු නැහැ" සි කියා කථාව නවත්වාරකොට මෙතුමාගේ නෝනාමහත්මයා ලඟට කැඳවා මෙසේ කිවේය.

"මගේ වසතුවෙන්, වැඩි පඩිහුව මගේ පියාගෙන් ලැබුනේය, ඊට පිකක් අඩුවෙන් මගේ සුළු පියාගෙන් ලැබුනේය, ඊටත් අඩුවෙන් නුඹේ පියාගෙන් ලැබුනේය. මෙකී වසතු සියල්ලමත්, නුඹත්, දරුවනුත් අත්පැර යන්ට මට සිදුවී තිබේ. (නෝනා මහත්මයා මුහිණුවම) සිහිවුනාසින් පසු, නැවතත් නුඹ පැයක් පමණවත් මා සමග විරුඩව සිටි බවක් මට දැනගන්ට ලැබුනේ නෑ. ඒ ආශ්චර්යයම නුඹට ඇත. මා මේ යන දිහාවට උඹ එන විටත් මේ වසතු සියල්ලට ආලය නොකොට අත්හැර වරෙන්න! (නැවතත් නෝනා මහත්මයා. මුහිණුවම) "කළුවෝ" * මොකද කරන්නේ!" මෙසේ (කළුවෝ) කී කෙණෙහි එවකට වයස **සිව්පණස් හවුරුදු සමසක්** ආයුවැලඳුවාවූද, මුළු ලඹකාව ඒකාලොක කරමින් ඒතාක් විදුමානවූද **චාලිස් හැන්රි ද සොසියා** නැමති මාණ්ඩිකාමය මේ මහා ප්‍රදිපසතමහය ශෙෂ කෘතයද භාවයකුදු නොසැලකූ ඝොරවූ මාරයා විසින්, එක්දහස් අටසිය අනූවේ සැප්තැම්බර් මස විසි නමවෙනි (1890. සැ. ම. 29) සඳු දින රෑ නවයට (9) කඩා හෙළමින් මුළු සිරිලක ඝනාඛ්කාර කරණලදී.

පුණ්‍යවන්ත පියෙකුට යුව එසේම පුණ්‍යවන්තියක් කුසෙහි උපන්නාවූ පුණ්‍යවන්ත උතුම් පියාට සහ සුළු පියාට සමානරූපව ප්‍රමාණාතික්‍රාන්ත කුශල ක්‍රියාවන්හි යෙදෙමින්, මහත් ධන සම්භාරයක් ඔයදම්කොට විපුල කීර්තියක් ලොව පතුරවමින් පරාජි ධම්ය ඉතා රම්‍ය ලෙස මෙතුමා රැක සිටි බව මෙම පොත කියවන්නන්ට එකහෙලා වැටහි යන බැව් දනිමු.

---

* මෙතුමා "කළුවෝ" කියා මේ අන්තිම කථාවේදී ආමන්ත්‍රණය කෙළේ, එවකට සත්‍යාවිරිදි සත්මස් නවදවසක් වයස්ගත දුනට සුවසේ වසන මෙතුමාගේ පුත්‍ර ලැම්බර්ට් විල්ප්‍රඩ් ඇලැක්සැන්ඩර් ද සොසියා නම් පුණ්‍යවිමහනාථය.

මෙකී සියලු යස ඓශ්වර්‍යත් ද, ප්‍රිය භාර්‍යාවද, යසොකීර්ත්‍යත් ද, පුත්‍ර දුහිතෘ බන්ධු මිත්‍රාදීන්ද, තනතුරුද අත්හැර පරලොව යාමට, තමන් අප්‍රියකළ නීචවූ වියරු බැල්ලක් මුල්වීමේ හේතුව හුනවනතයින්ගේ හිස් සොලව සොලවා කලපනා කටයුතකි. ලඞ්කාවීපය පරිපාලනය කළ කුශලකාම් ඇතම් සිංහල මහරජවරුන්ගෙන් පසු අතුන් කෙරෙහි කම්පිත මෘදු හෘදයකින් සහ ත්‍යාගී වන්න කම්න් මුළු සිංහල සමූහයා අතුරේ බබලමින් සිටි මේ උතුම් පවුලේ **හුන්වෙනිසා** හෙවත් පරාපි ධර්මාහරණාදියෙන් භ්‍රාතෘන් ලක්දිව **එකම ධනවත් මහොන්නතිසා** කළ කී කුශල ක්‍රියාවන් මෙනෙහි කළ කල, දිඝීඝාසුෂ වලදී සකල සත්වයන්ට සුභාවෙන් පැමිණෙන ජරා ව්‍යාධියකින් මියයාම සුතුව තිබුන නමුත්, සිව්පණස් හවුරුදු සමසකින් මියයාමට පැමිණීම **බෙදජනක** කාරණයකි. වියරු බලු විෂ උසුළාවීමෙන් අවසානයට යන මනුෂ්‍යයා අනන්තිම සථානයේදී එම වියරු බලු සුභාවටම පැමිණ ඒ ක්‍රියාවන් එසේම කර මහත් වදවේදනා විඳ බියකරු සහ දුඃඛිත මරණයන්ට පැමිණීම වියරු බලු විෂයෙහි අනන්තිම ලක්ෂණ බව වෛද්‍ය ග්‍රන්ථවල ප්‍රකාශව තිබේ. සුභාව එසේම බව සියලුදෙනාද දනිත්, නමුත් මේ පින්වතාගේ අවසානය එසේ නොවී පිරිසිදු සිතියකින් යුකතව තමන් විසින් කළයුතු සකල සුතුකම් අනන්තිම දක්වා මොනවට ඉටුකොට උතතරිතර උදෘත්තයෙන් යුකතව කථාශෙෂ භාවයට පත්වීම, මෙතුමා කරණලද අපමණ කුශල ක්‍රියාවන් කරණකොටගෙණ මෙලොවදීම දක්වනලද මහත් ආනුභා සම්පනන අශ්චර්‍ය්‍ය! අද්භූත!! කර්මයක්ම බව නුවණැත්තනු එකහෙලා නිරවද්‍යයෙන් නිශ්චය කළහ.

ඒ හෙයින් මේ සත්චරිතය භජනය කරණ ජනී ජනයුදී සමූහය දෙනිස් කුණපයෙන් යුත් අනිසුද්‍ර කාය චිත්තාදි නිරුඞ්ඛ මරණ සීමාව සෙවීමෙහි නොනියුකතව කිසිම පමාවෙක්නිද නොඇරැ මෙම ශ්‍රීමත් මහාසුදර්ශනයාමෙන්

උභය ලොකාර්ථ සාධක කුශල කර්මයෙහි නිලතුරු ව්‍යාවෘත වීමෙන් දුර්වල ස්ථානයන්හි පවා ජයග්‍රහණය මුදුන් පමුණුවාගෙණ මෙතුමා සම්ප්‍රාප්ත පාරිතුෂ්ටික පරලො ගමන නිමලාකාර ඉටුකරගැණීමෙහි උත්සාහ වඩත්වා!

———:o:———

මරණය ගැණ ලක්දිව ඇතුවගිය කැලඹීම.

———

මාලිස් හැන්රි ද සොයිසාතුම, කථාශෙෂ භාවයට පැමුණුනේය, යන ශබ්දය එක්දහස් අටසිය අනූවේ සැප්තැම්බර් මස තිස්වෙනි (1890. සැ. ම. 30) දින උදය කාලයේම, කොළඹ මුළු නගරයේ සහ මහනුවර ගාල්ල, මාතර, මීගමුව, රත්නපූරය, හලාවත, ආදි පලාත්වලද, ඉතා පිටිසර බදවද පැතිරගොස්, ඇතැම් අය මෙය විශ්වාසකරමින්ද, ඇතැම්හු විශ්වාස නොකිරීමෙන්ද, මහත් කැලඹීමක් ලක්දිව සෑම දිශා වන්හිම ඇතිවිය. මේ අතර මෙතුමාගේ මරණය දන්වා බන්ධුන් විසින් ලක්දිව සහ පිටරට නා නා දිශාවන්ට යවන ලද විදුලි පණිවුඩ කරණකොටගෙණ මේ කැලඹීම නැවති මහාජනයෝ විපුල දුඃඛයට පත්වීමට පටන් ගත්හ.

ඇතැම්හු **මෙතුමාත් මැරුණාද** යනු කථනය කොට දුක්වූහ. ඇතැම්හු **ලඞකාව ඉතින් අවසානය** යනු කථනය කොට දුක්වූහ. ඇතැම්හු **ද සොයිසා මහා දන ශාලාව බිඳවැටුණේයයි** කථනය කොට දුක්වූහ. ඇතැම්හු **අපගේ පියානන් වහන්සේ නැතිවුණේයයි** කථනයකොට දුක්වූහ. ඇතැම්හු **දිළින්දන්ගේ එකම පියා ඉවරයයි** කථනයකොට දුක්වූහ. ඇතැම්හු **නිලෝභ දයාවන්ත හිමුවරයා විනාශව ගියේයයි** කථනය කොට දුක්වූහ. ඇතැම්හු මෙතුමාට වෙදකම්කළ වෙදවරුන්ට **දොස්** කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු මෙතුමා සැපූ **බැල්ලකෙරෙහි** වෛරකරමින් දුක්වූහ. ඇතැම්හු ලක්දිව සිංහලයින්ගේ එකම **ත්‍යාගිවන්තයා මළේයයි** කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු මෙතුමාගේ

පුත්‍ර මහත්වරු මෙසේ **න්‍යාගිවනනව** සිටිත්දෝහෝ කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු **මාරසා** කෙරෙහි ක්‍රෝධ බස් කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු ද සොයිසා මහත්මිය ප්‍රධාන **පවිල ගැණ** කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු එඩගලනතයේ සිටින **පුත්‍ර මහන්වරුන්** දෙදෙන මෙහි නොසිටීම ගැණ කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු මෙතුමාගේ **ගුණසහපන්කම්** කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු මෙතුමාගේ විශෙෂ **නිරහඞ්කාරකම** ගැණ කථනයකරමින් දුක්වූහ. ඇතැම්හු **පැරිස්** නගරයට ගොස් ප්‍රතිකාර නොගැන්ම ගැණ කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු මෙතුමා ගැණ ඉංග්‍රිසි ආණ්ඩුව කළ සැලකිලි බොහෝ මදයයි **ප්‍රශංසොපගණන** කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු මෙතුමාගේ ජෙෂ්ඨ පුත්‍ර ද සොයිසා මහතානෝ පියා මෙන් **පරිපීසෙති** ඇලි සිටිත්දෝහෝ කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු මෙතුමට සඟි සැප ලැබෙවා යනු කථනය කරමින් දුක්වූහ. ඇතැම්හු මෙතුමාගේ **කොකාලල්** චරිතයෙහි අභාවය ගැණ කථනය කරමින් දුක් වූහ. මේසේ ලවකාව මුළුල්ලේ නානා දිශාවන්හි දුක්වූනාවූ ජනිජන රාශිය අප්‍රමාණය.

—————:o:—————

මොරටුව.

මෙතුමාගේ මරණය සිදුවූ තත්පරයේ සිට, තත්පර යක් පාසා මොරටුවේ සකල දිශාම කාළවණි වස්ත්‍රයන් ගෙන් සැරසුන දහස්ගණින් සේනාවගේ ගමනා ගමන යෙන් කාළහංශ සහස්‍රයින්ගෙන් වැසුන තටාක ලක්ෂණ යෙන් මුළු මොරටුවම අඳුරුවිය. ඔවුන්ගේ මුහුණු මලා නිකව පරමල් හා සමානවූ හෙයින්, මධුලෝල්ලයෝ මුළාවී ඔව්හුද සඛියි කුපිකා අත්නොහැරියෝය. විශෙෂයෙන් ඔවුන් ඔවුන් ගේය කියන **ජන ප්‍රධානිසාද ධන ප්‍රධානි සාදවූ** මේ මහොත්තමයාගේ වැවීමේ මහත් ශබ්දයට

ඔවුන් තිගැස්සුනවිට, ඊටද මුළාවූ කුරුවි පරුවි පක්ෂි ගණයෝ සඩකිය සථාන අභ්‍යන්තරයටද ගතවූහ. ඔවුන්ගේ අත් දිග ප්‍රමාණයට කෘෂ්ණ කෙහෙලි එසවීමෙන් මොරවූ කාවන නොපෙනී ගියේය. ඔවුන් වැගුරූ නෙත්‍රජල කරණකොටගෙණ මාවත්වල ධූලි නොනැංගේය. ඔවුන්ගේ හෘද චලනයෙන් සමුද්‍ර ඝොෂාව මැඟෙඬිය. ඔවුන්ගේ හිස් සැපීම් නිසා තුරුලතා චලනය කිසිවෙක් නොනැරඹුවේය. ඔවුන්ගේ හිස් බැඳි අත්නිසා ලක්‍ෂණ ගොඩ නැඟිලි වැසුනේය. ඔවුන්ගේ වියලුන කට තොල තෙමීමට ලිංදිය මදවූයේය. ඔවුන්ගේ කණීයන් අනේක ජනයාගේ බෙදා ප්‍රතිරාවයට ආකර විය. ඔවුන්ගේ හෘද ගිනි ඇවිලි පිටතට නොපෙණෙනාකාර ඔවිහු දහනයවූවෝය. ඉම් වේදනාවෙන් ඔවුන් උදෙෂ්ෂණයකල කල, ඔවිහු ඇසුරු කල තුෂ්ටිදායක සාරඤ්ඤ භෘඩග සමූහයෝ, ශොක ලක්‍ෂණ ධූම ඝිතියට පැමිණ ඔවුන් අත්හැර අතුරුදහන්වූහ. ඔවුන්ගේ මසතුලුඛගයන්හි දැල්වී තිබුන නියපහන් ඔවුන්ගේ ගහන්වලින් ආග්‍රහණය කරණුලැබූ දුක් සුලඟින් නිවී ඝනාඬ්ඛාරවිය. ඔවුන්ගේ පුත්‍ර පුත්‍රිකාවෝ සිය පිය ආදර නීය මව්වරුන්ගෙන් කිරි වෙනුවට කඳුලු බී දිවි රැක්කෝය. ඔවුන්ගේ ලිප්වල පුරුදු ගිනි නොනැගිවීමෙන් ගෙවල අඳුරු ඇතිවූයේය. ඔවුන්ගේ ආහාරපාන ඒ ඒ දෑ විසින් සොඅා ගියාමිස ඔවිහු ආහාරපාන නොසෙවිවෝය. මොරවූ අඬගනාවගේ දුහිතෘහු මෙදින සඩකිය කරකණ ඝිස් කිර්ම කරණකොටගෙණ ශ්‍රීතොමෝ බැඳි වැදුනිය. ඔවිහු සපයාගෙණ සිටි කුශල ක්‍රියා මෙතුමාගේ නාමයට කැප කලෝය. ඔවුන්ගේ යාවඤ්ඤ ඔවුන්ගේ පින් දිවි ඉතුරුකර නොගෙණ මෙතුමාගේ නාමයට පිදුවෝය. අන්තිමකොට ඔවුන් ඔවුන්ගේ ජන ප්‍රධානියා සමඟ මියයාමට බලවත් ව්‍යසනයක් කෙළේවී නමුත් සඩහා ධර්මය මෙඝිදී සතුරුව නැඟිට ඔවුන්ට විරුඬව සටන් කොට දුක් නිවෙස් වැදීමට නියම කළ හෙයින් ඔවිහු දුකින් දුකට පෙරළුනෝය.

කාරක සභාව.

කථානායක හාවොපගත මෙතුමාගේ අවමඟහල්‍ය පෙළහර ආදිය ගැණ කටයුතු ඉටුකිරීම සඳහා වැදගත් මහත්වරුන් දසසත් (17) දෙනෙකුගෙන් යුත් කාරක සභාවක් පත්විය. ඒ මහත්වරු දසසත් දෙනනම්:—

එච්. ජේ. සොයිසා මහතා,

අර්නෝල්ඩ් දියස් මහතා,	ජුවන් ප්‍රනාන්දු මහතා,
පිතර් ප්‍රනාන්දු මහතා,	අඳ්‍රිස් පීරිස් මහතා,
අයිසෙක් ද සිල්වා මහතා,	පේකබ් ද සිල්වා මහතා,
ජොශෝප් ප්‍රනාන්දු මහතා,	ජොහානස් ද සල්ගාදු මහ.
ජේ. කෙල්විස් ද සිල්වා මහ.	ජේ. ජී. සී. මැන්දිස් මහතා,
ජොහානස් ද මැල් මහතා,	විලියම් කුරේ මහතා,
මානුවෙල් ද මැල් මහතා,	ඇස්. ඒ. ප්‍රනාන්දු මහතා,
අඳ්‍රිස් සොයිසා මහතා,	පේදුරු මැන්දිස් මහතා.

මෙම කාරක සභාවේ විධි විධාන පිට අවමඟුල සම්බන්ධ සියලුම කටයුතු පිළිවෙලාදිය ඉතා අගයට ඉෂ්ටකරණු ලැබිය.

———:o:———

ඔක්තෝබර් මස පළමුවෙනි බුදදින.

මෑතදෙහය අභාවයට නොයන පිණිස වෛද්‍යයන් විසින් බෙහෙත් කරණලදින්, එක්දහස් අටසය අනුවේ ඔක්තෝබර් මස පළමු වෙනි (1890. ඔ. ම. 1.) දින එම මෑත දෙහය මොනවට සරසා, සිහින් සුදු සේද වස්ත්‍ර ආදියෙන්ද ඉතා ලක්ෂණ සුදු මල්මාලාදියෙන්ද, සුදු "රේන්ද" පවි ආදියෙන්ද, විසිතුරු ලෙස සරසන ලද මළයහනෙහි පළමුව දෙහ තබා ඉන්පසු, තේක්ක ලෑලිවලින් මාහැනි ආකාර තනන ලද ඇතුළත විල්ඵද බහාලූ මිනීපෙට්ටියේ බහා මහාජනයාගේ

අන්තිම දර්ශනයට තබනාලද්දී "අපේ උත්තමයා අපේ ජන ප්‍රධානියා, අපේ සැමියා, අපේ ධනවතා" යන රාවයෙන් සුත් ලාඩ්කික ජනතාව නානා දිශාවලින් පැමිණ දුක්මුසු වදන් පවසමින් මෙතුමාගේ දෙහය අන්තිමවරට දර්ශනය කිරීමට පටන්ගත්හ. මොරවුවේ විශාල වලව්වද, එම විශාල වත්තද, ඒ අසල මාවත්ද, මෙතුමා දර්ශනයට පැමිණි දහස් ගණන් සමූහයාගෙන් ගහණවිය. මෙතුමාගේ **මහා දන් දෙමින්** රැකුණාවූ දහස් ගණන් දුක්පත් ජනයා මෙදින පැවැත්තූ දුක්මුසු විලාප මෙඝ ගර්ජනා බඳුවිය. රාජ්‍ය ලොභයකින් නොව, ධන ලොභයකින් නොව, ඥානාන්තර ලොභයකින් නොව, තිසුපුද ලොභයකින් නොව, වෙසෙසින් ලාඩ්කික ජනතාවගේ ශුභවැඩ සඳහා සහ දුක්පතුන්ගේ දුක්පත්කම මැඩපැවැත්වීම සඳහා යුඩකළ දිළිඳුන්ගේ **රජ්ජුරුවන්** අද සුවසේ සැතපී සිටින ලීලාව බලත්වා! යන ඉතා දුඃඛිත ශබ්ද නැඟීමෙන් මෘතදෙහය බලබලා තදුලූ සැලූ ජනතාවගේ ප්‍රමාණය ඉතා මහත්විය.

——:o:——

අවමඟුල් පෙළහර.

ඔක්තෝබර් මස පළමු වෙනි බුදාදින උදය පටන් උඩරට නොයෙක් දිශාවන් ගෙන්ද, ගාල්ල, මාතර, දෙවුන්දර, රත්නපුරය, සබරගමුව, මීගමුව, හලාවත, නිරිකුණාමල, ආදි දුරස්ථානයන්ගෙන්ද, ජන සමූහයෝ මොරවුවට පැමිණෙන්ට පටන් ගත්තෝය. * මෙතුමාට අන්තිම ගෞරවය සඳහා විශෙෂලෙස පිළියෙල කර තිබුන දුම්රිය, මෙදින මරදූනේ සන්නියේ සිට සවස දෙක හමාරට පිටත්ව, කොළඹ නොයෙක් දිශාවලින් සේනාව රැගෙණ තුන්කුත් තත්පර හතළිස්පහට (3. 45.) ලුනාවට

* ලක්දිව නොගෙක් ගම් නියම්ගම්වාසී ජනයා මෙදින සවසින මාරඝන්ධිද සල්පිල් ආදියෙහිද කළු කොඩි ඔසවා මෙතුමාට ගෞරව දුන් බැව් ප්‍රසිඛ පත්‍ර මාර්ගයෙන් පෙණේ.

පැමිණුනාය. ආණ්ඩුවේ උසස් ඉංග්‍රීසි නිලධාරිහුද, සිංහල නිලධාරීහුද, ඉංග්‍රීසි, සිංහල පත්‍ර කතෘවරහුද, මුදලිවරු සහ මුහන්දිරම්වරුද, විදුන ආරච්චිවරු සහ විදුනවරුද, ඉංග්‍රීසි, සිංහල, දුම්බ, මරක්කල, ජා, බඩහාලි, පාර්සි, හින්දු, පරවර, වෙළඳ සමූහයාද, රේන්ද මහත්වරුද, ඉංග්‍රීසි, සිංහල, බර්ගර්, දුම්බ නීතිඥවරුද, ගම්රාළලා සහ වැව්ලිකාර ජනයාද, නොයෙක් ජාතික ලිපිකරුවෝද, නොයෙක් තරාතිරම්වල, නොයෙක් ජාති සාමාන්‍ය ජනයාද, මෙම දුම්රියෙන් සම්ප්‍රාප්තවූවෝය. මෙතුමාට අයිති වතුවලද වෙනත් කම්හන්තවලද යෙදී සිටි, අනුජීවීන් ගෙන්ද, ගුරුවරු සහ නෝලයින් ගෙන්ද, පුලන්නන් ගෙන් සහ යාචක සමූහයාගෙන්ද, මොරටු වැසි ජනයා ගෙන්ද මොරටුව ඉතිරින. වෙරළින් ඉක්මුනු මුහුදෙහි දහදුහක් පමණ සේනාව එතැවිට මොරටු භූමියට පැමිණිම ගැන මොරටු අඬගහනි ශෙෂ වචනයකුදු නොදෙඩා මදහස කුදු නොදක්වා කාළවණ් පිළියෙන් සැරසි කඳුලු සල සලා තුෂ්ණීම්භූතව සිටිමෙන්ම මෙදින සාමාන්‍යයෙන් මුළුලකට සහ වෙසෙසින් මොරටුවට පැමිණි විපුල දුකෙහි ප්‍රමාණය විචක්ෂණ ජනයෝ නිශ්චය කරගත්හ.

මොරටුවේ වලව්වේසිට ශබ්ද එම්මානුවෙල් දෙවස්ථානය දක්වා මාවත දෙපස කළුකොඩි ඇද තිබුනේය. මාවත්, හෙලවිසූ ඇතුරුවාක් මෙන් ධවල වාලුකයෙන් සම්ලඬ්කෘත කොට තිබුනේය. මහා ශාස්ත්‍ර ශාලා සහ කුඩා පාඨශාලාද වසා තිබුනේය. සල්පිල් ආදියද එසේම වසා තුමුනුමු අවමඟුල් වෙස්ගෙණ සිටියෝය. සවස හතරවූ කල අන්තිම වරට තම ආදරවන්ත ස්වාමීන්ද්‍රයා උසුලාගෙණ සොහොන් භූමියට යාමට ප්‍රාර්ථනා කරගෙණ සිටි දුවුවන් සතුටු කරවන දෙහ ලක්ෂණයන්ගෙන් විරාජමාන කඳුලු පිරුණ අක්ෂීයකින් යුත් අසුන් සතර දෙන යොදනලද අවමඟුල්‍ය රථය ගෙණ එන ලදින් කෘෂ්ණපක්ෂයට ලැබුන මහ මෙඝයක්සේ දර්ශනයවීමෙන් ද සොසිසා කුටුඹ ප්‍රධාන දහස්ගණන් සේනාව දුක් නැමති නීල සාගරයෙහි කිඳා බැස්සාහුය.

THE REMAINS OF THE LATE C. H DE SOYSA. සී. එච්. ද සොයිසා මහතාණන්ගේ මෘතකලේබරය.



COFFIN.—මිනිපෙට්ටිය.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO

ඩබ්ලිව්. හැමිල්ටන් මහතා, **ඩී. ඇප්. වික්‍රමරත්න ජයසූරිය** මුදලිතුමා, වැඩබලන දිසාපති නඩුකාර **ජේ. ග්‍රැනියර්** මහතා, **ආර්. එච්. මෝර්ගන්** මහතා. නීතිඥ **ධම්මරත්න** මහතා. යන මහාත්වරු සයදෙන නියමකොට පෙළහර පිටත්වීමට සංඥාකරණ ලදින් පිටත්වූයේය.

රථය පසුපස්සේ මෙතුමාගේ පුත්‍ර පුඤ්ඤ මහත්වරු සහ බන්ධු මිත්‍ර ආදී **දශදූහක්** පමණ සෙනාව * ගමන්ගත්හ. "වොලන්ටියර්" වරුන් විසින් ගායනා කරණුලද දුක් නාලයට පා තබමින් කඳුලු සල සලා ගිය දහස් ගණින් සෙනාව වේල්ස් ශාස්ත්‍ර ශාලාව අසලට ලහාවූ කල **සනර වළිගසෙන්** † අටදෙනෙක් තෝරා රථයෙන් පෙට්ටිය බා ඒ මහාත්වරු ඇඹිය අත්වලින් උසුලාගෙණ අතුරණ ලද පියවිලි මතුපිට ගමන් ගත්තෝය. වේල්ස් ශාස්ත්‍ර ශාලාව ඉදිරිපිටදී අවමඟුල් පෙළහරේ **ජාඝාරූපඝද** ගත්තේය. එතැන් පටන් නැවතත් පිළිවෙලකට ගමන් ගත්තේ, පෙළහර ශුඛ එම්මානුවෙල් දෙවස්ථානයට සම්ප්‍රාප්තවූයේය.

දෙවස්ථානයතුළ සූදානම්කරණ ලද ආසනය මතුපිට මිනිපෙට්ටිය තබනලදින්, අති ගරුකටයුතු කොපල්ස්ටන් බිෂොප්තුමා ප්‍රධාන කොට ඇති ඉඛ්‍රැසි සිංහල දේව ගැතිවරු **විසිදෙනෙකු** විසින් මළවුන් සඳහා පවත් වන මෙහෙය පවත්වනලදී. මෙසේ මෙහෙය අවසාන වූකල ශුඛ එම්මානුවෙල් දෙවස්ථානයට අයත් සොහොන් භූමියට මිනිපෙට්ටිය ගෙණගොස් තම පුත්‍රයාගේ වළ

---

* සේනාවගේ මහත්කම කරණුකොටගෙණ ඇතැම් ඉංග්‍රීසි මහත්මින් පවා සිරවී සිරවී ගමන්කිරීමෙන් මෙතුමා කෙරෙහි ලොක යාගේ ඇති මහත් සැලකිල්ල මනාව ඔප්පුවිය.

† සම්ඛිසත චාල්ස් හැන්රි ද සොයිසා තුමාගේ පියා පක්ෂයෙන් දෙදෙනෙකි. එතුමාගේ මව් පක්ෂයෙන් දෙදෙනෙකි. මෙතුමාගේ ප්‍රිය භාර්‍යාවවූ ද සොයිසා මැනිනියගේ පියා පක්ෂයෙන් දෙදෙනෙකි, මව් පක්ෂයෙන් දෙදෙනෙකි.

THE FUNERAL PROCESSION.—අවමඟුල්ල පෙරහැර.

වෂී 1890 වේ ඔක්තෝබර් මස 5 වෙනි රිවිදින
මොරටුවේ ශුද්ධ ඵම්මානුවෙල් දෙවස්ථානයේදී

කොළඹ අභිෂේක

කොපල්ස්ටන් බිෂොප්තුමා

විසින්

මෙතුමා ගැණ කරණලද දෙශනාව.

(මෙම දෙශනාව නොලියා කරණ ලද්දකි.)

"දෙව භකතිය, මහත් ලාභයකි"

(1. තිමෝති iv. 6.)

අපෝස්තුළුවරයා දෙවභකතිය මහත් ලාභයක කියයි. නුමුත් ලාභය දෙව භකතියයයි නොකියයි. දෙව භකතිය සියලුම වසතුවට වඩා ලොකු ලාභයක. මේ ප්‍රසතාව අපට මහත් කනගාටු ප්‍රසතාවක්ය. මෙවැනි ප්‍රසතාවකදී කනගාටු නොවීම බැරිය. නැසිගිය ප්‍රිය සහොදරයාගේ මරණයන්සා, භායශ්‍රාව ඉතා ආදරවන්න පුරුෂයා ගැණද, දරුවෝ; කරුණාවන්න පියාගැණද, නෑදෑ මිත්‍රයෝ; කරුණාවන්නවූ හිතැති නෑයෙක් හා මිත්‍රයෙක් ගැණද, මහජනයා, යහපත් නගරික යෙක් ගැණද, සියල්ලටම වඩා දුක්පත්තු, මහත් ත්‍යාගිවන්න උපකාරික සැමියෙක් ගැණද, දැන් ශොකවෙමින්, ඔහුහා ගැහුදෙනුකළ අය; ඉතා සෘජු සාධාරණ කටයුතු කළ තෙණෙකුගෙන්ද, මෙලොව පිහිටි සහාව එහි ඉතා යහපත් ආදෘශයන් තැබූ කෙණෙකුගෙන්ද, වෙන්වූහ.

අප විසින් මෙසේ දුක්වෙන්නේ මන්දයි යමෙක් අස නොත්, දෘවිත්ගේ වචනවලින් "ඊශ්‍රායෙල්හි මහත් මනුෂ්‍ය යෙක් වැටුන" බැවිනැයි උත්තර දෙමු. මා මැරුණ කල්හි අනුන්, ප්‍රධාන කොටම, දුක්පත් මිනිස්සු කනගාටුවෙන්ද කියා එක් එක්කෙණා තම තමුන්ගැණ කලපනා කරපල්ලා.

හොඳ කෙණෙක් මැරුණාම සියල්ලෝම කණගාවුය. නපුරුමිනිහෙක් මැරුණාම මිනිස්සු සන්තෝෂවෙත්. දුඃඛවූ හෙරොද් මැරෙන්ට ප්‍රථම, තමන්ගේ මරණයගැන මිණිස්සු ප්‍රීති වෙතැයි සිතා, තමන් සඳහා මිනිස්සු කනගාවු වෙන්නාක්මෙන් පෙන්වීම පිණිස, තමාගේ මරණයට ප්‍රථම මෙසේ නියෝග කෙළේය:—

දෙශයේ උත්තමයන්ගේ ලමයින් රැගෙණ කිරගණනේ තබාගෙන සිට තමා මැරුණ වහාම එකී දරුවන් මරණයට පත්කිරීමට තම සෙවක ජනයාට නියමකෙළේය. ඔහු ජීවත්ව සිටියදී ඔහුට භයෙන් ලමයින් කිරගණනට ගත් නමුත් ඔහු මැරුණාසින් පසු ඔහුට භය නැතිනිසා නොමරා නිදහස්කර හැරියෝය. ඉතින් ඔහුගේ මරණය ගැන කිසිවෙක් ශොක නුවුවෝය. "ඉර්කස්" යයි කියනලද තක්තාගේ මරණයගැන බොහෝ දෙන දුක් වුනෝය. ඈ වැඩි වසතුකාරියෙක් බව නොපෙණෙන නමුත් ඕ තොමෝ ලද පමණින් දුක්පතුන්ට උපකාර කළාය. ඈ මැරුණකළ ඇගෙන් උපකාර ලැබුවෝ අඩා වැළපුනෝය. ඒ නිසා අපේ ශොකය නරක නෑ, නමුත් අපි බලාපොරොත්තු නැති තැනැත්තන්ගේ ශොක නොවෙමු. අප කණගාවුවෙන්නේ, අපට පැමිණි අලාභය ගැනය, නමුත් ඔහුගැනම කල්පනා කරමෝ නම් ප්‍රීති වීමට තරුණු තිබේ.

වසතුකාරයෙකුට සාගීරාජ්‍යයට ඇතුල්වීම අමාරුය කියා අපේ ගැලවුම්කාරයානන්වහන්සේ කියේය. නුමුත් දේවහකනිකවූ සමහර පොහොසත් අය ගැන දේව වාක්‍යයේ සඳහන්ව තිබේ. අරිමාතියේ යෝශප්, එක් කෙණෙක. අපි දැන් යම් කෙණෙක් ගැන ශොක වෙමුද, ඒ තැනැත්තා, තවත් කෙණෙක, ඔහු දිළිඳු දුන්වද, සහාවවද, සියලු යහපත් වැඩවල උපකාර දුන්නේය. ඔහු තමාගේ වසතුව ගැන උඩඟුව සිටියේ නැත. එය නුඹලා නිතරම දුටුනිසා නුඹලාට අරුමයක්

ෂනාවේය. තමන් වසතුව ගැණ උඩගුව සිටියේ නම් ඔහුගේ වසතුව වෙන අසුමකට පාවිච්චි කරණු ලැබේ. ඔහු එකී වසතුව දෙවියන්වහන්සේට ගණන් දියයුතු විශ්වාස ගබඩාකාරයෙක්සේ යටහත් පහත්කමින් භාවිතා කෙළේය.

දෙවියන්වහන්සේගේ බැල්ම සහ ආරක්ෂාව ගැණ ඔහු බොහොම විශ්වාස කෙළේය. කොළඹ ගෙයක් ගොඩනගන්ට පටන්ගණ්ඩදී "ඩොම්න්වහන්සේ ගෙය නොසාදනසේක් නම් සාදන්නෝ නිසඵලේ වෙහෙසති" යි දූන මා කැඳවා ඒ වැඩේට ආශිර්වාද ඵවනලෙස දෙවියන් වහන්සේට යාචඤ්ඤ පැවැත්තුවේය. මෙය අහඞ්කාරකමට නොව ඉතා යටහත් පහත් අන්දමින් තද විශ්වාසයෙන් යුක්තව කරණ ලද්දක.

ඔහු ක්‍රිසතුස්වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් කවදූවත් වෙනස් වූනේ නැ. ඔහුගේ විපත්ති කාලයේ සහ මරණාසනනයේදී ඔහුට ධෛර්‍ය්‍ය ලැබුනේ මෙයින. ඔහුගේ ජීවිතයේදී ඔහුට ලැබුන ඉතා උතුම් අශිර්වාදය කුමක්දැයි අපට අහන්ට ලැබුනා නම් "දෙවහකනිය මට මහත් ලාභයක්ව තිබුනාය" යි ඔහු කියනු ලැබේ.

ඔහුට තදබල අනතරාවක් පැමුණුනේවී නමුත් ඉතා නිශ්චල ලෙස සිටියේය. ඊට හේතුව කුමක්ද? ඉතා සමීප වෛදූවාර්‍ය්‍යයන් ගෙන්නවාගන්ට පුළුවන්වූයේ වසතුව තිබුන නිසාය. සි බොහෝ දෙනාට සිතීමට පුළුවන, නමුත් ඔහුගේ සෑම වසතුවෙන්ම කිසි පිහිටක් ලබන්ට බැරිවිය. මේ රොගයේදී ඔහු දිළින්දෙක්සේම අසරණව සිටියේය. ඔහුගේ අනතිමය මේ රොගයෙන් මැරෙණ බොහෝ දෙනෙකුගේ මරණය මෙන් භයානකව තිබුනේ නැත. හොඳ සිහියද, කල්පනාවද, ධෛර්‍ය්‍යයද ඇතුව තමන් කටයුතු කරමින් ඒ මහත් අවසිම වෙනසට සූදූනම්විය. ඔහුගේ අනතිමය දූනගත් ඔහු "මම දෙවියන්වහන්සේ ලඟට යමි" යි කීය. මිට බොහොම වෙනස්වූ පොහොසතෙක් ගැණ අපේ ඩොම්න්වහන්සේ උපමාවක් කියේක.

ඔහු තමාගේ වයසුව කෙරෙහි විශ්වාස කෙළේය. "අද රාත්‍රියේ නෝ නසිනවා ඇතැ" යි දෙවියන්වහන්සේ කී කල්හි, "අනේ! මගේ මේ සියලුම වයසුව අත්හැරදමා යන්නේ කොහොමද" යි කියා බොහෝ කනගාටුවෙන්ට ඇත. නමුත් අපේ ප්‍රිය සහෝදරයා තමාගේ සිත ප්‍රසුවට යොමුකර තිබුන නිසා ඔහුට සියලුදේ අත්හරින්ට අමාරුවක් නොතිබුනේය. "ප්‍රසුවට සිත යොමුකරණ පිණිස අපේ දවස් ගණින්ට ඉගැන්නුව මැනව" කියා යාචඤ්ඤ කරමු. සමහරවිට දවසක ඔහුගේ මරණය ගැන කලින් දැනුම්දෙන්ට දේවදූතයෙක් ආවාවැනිය. එදුපටන් ඔහු මරණය ගැන සූදානම් වුනේය. අපි හදිස්සි මරණයට නොපැමිණෙන ලෙස යාචඤ්ඤ කරමු. මරණය මොහුට හදිස්සියක් නොවීය. මරණයට දවස් දෙකකට පමණ ප්‍රථම ඒ ගැන ඔහුට අනුමාන නැති ලකුණු ඇතිවිය. ඒ අතරතුරේ ඔහු හොඳකාර මරණයට සූදානම් වූයේය.

නුඹලාගේ අනතිමයන් ලංව තිබෙනවා වෙන්ට පුළුවන. මේ ගැන "සූදානම් වෙයල්ලාය" යි දෙවියන් වහන්සේ මාලවා නුඹලාට කියවනසේක. මේ අනුශාසනාව පිළිගෙන නුඹලාත් සෑදී සිටපල්ලාය, "ගැලවීමේ දවස දැන්ය" හැමදාම අපට මරණය ගැන සිහිකරවන දෙයක් තිබේ. එනම්, නින්දය, අපි නිද්‍රාවට යන්ට ප්‍රථම මරණයට සූදානමද කියා නිතරම සෝදිසිකරන්ට ඕනෑය. අපි සැමොම ජීවත්ව සිටිනාතෙක් සියල්ලන්ට යහපත්කම් කරමු. සියල්ලන් හා සමඟිකමෙන් සිටිමු.—යනුය.

DE SOYSA MONUMENT.

චාල්ස් හෙන්රි ද සොයිසා තුමාගේ සොහොන්කොත.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

PART IX.

LADY De SOYSA.

——:o:——

නවවන අදියර.

ද සොයිසා ආයතිය.



LADY DE SOYSA.—ද සොයිසා භාර්‍යාව.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO

ද සොයිසා ආයාව.

LADY De SOYSA.

ලඞකා වීපයේ සාමදන

විනිඡයකාර ධුරන්ධර ධන ශ්‍රෙෂ්ඨව විසූ චාල්ස් හැන්රි ද සොයිසා මැති තුමාගේ ජීවනිය කලත්‍ර **කැතරින් ද සිල්වා** අම්තගුණලක්ෂණ ආඪ්‍යාව උපන්නේ, වෂී එක්දහස් අටසිය සතළිස් පහේ අප්‍රෙල් මස තිස්වෙනි (1845. අ. ම. 30.) දින මොරටු ග්‍රාමයේ **දිගරෙල්ල** නම් පියසේ දීය. මෝනොමෝ ප්‍රසිඛ "චැවලියර්" කෙණෙක්ව විසූ **ලිදමුලගේ ජුසේ ද සිල්වා** "නයිට්" තුමාගේ සහ **විර හැන්නැදි විරබල ජයසූරිය පටබැඳිගේ ආනා ප්‍රණාදු** මහත්මියගේත් එකම නන්දනියය.

කුඩා කාලය.

මෑ කුඩා කාලයෙහි කදිම සුරතල් දරුවෙක්ව සිටියාය. මෑ ඉතා ශෝක කරුණාකදි පවා හැඬීමට දක්ෂියක්ය කඳුලු වැගිරීමට කිසි ප්‍රමාදයක් නොවන්නීය. දිනක් මැගේ ආච්චි මෑ වඩාගෙණ අසල තම ගෙට ගෙණැවිත් සිටින අතර, මෑ පොල්කටු දෙකක් රැගෙන් වැලිකෙළියට පටන්ගත්තාය. මෙසේ වැලිකෙළීමින් නැලවෙන අතර ආඩිගුරෙක් යමක් ඉල්ලාගන්න අදහසින් මේ ගෙට පැමිණියේය. ඒ පැමිණි මොහු වාලික ක්‍රීඩාවෙන් පසුවෙන මෙම සුරතල් ලදරුවා දෙසබලා මැගේ ආච්චිට කථාකොට මෙසේ කීවෙය. "මෙම දරුවා වැලි ගොඩේ මෙසේ සිටීමට ඉඩහැරීම වරදය, මේ ලදුරිය මහා වාසනාවන්තියක, මුක්තා මාණික්‍ය මිශ්‍ර රත්රන් ගොඩක් මතු ක්‍රීඩාකරන්නියක්වන ලක්ෂණාදියෙන් විරාජමාන මේ උතුම් ලදරුවා මින් රැගෙණ ඇඟ නාවා පිරිසිදු පිළි හඳවා තබාගත යුතුය" යි යනුය.

මෑ කුඩා කාලයේ ඇතුවගිය සුරතල්කම් ගැණ සහ සුකුමාලකම් නිසාත් බොහෝදෙන මෑට ඉතා කරුණාවෙන් සිටියෝය. මැගේ පිය පරම්පරාව සහ මව් පරම්පරාව දිගි කාලේක පටන් **රෝමානු** සභාවට අයත් කතෝලිකයන්වූ හෙයින් ආඩිගුරුකි කරුණු වැඩි සැලකිල්ලකට නොගන්නාලදි. නමුත් මෑ වර්ධනය වෙන්ට පටන්ගත්කල සැබ වින්ම වාසනාවන්තියක් බවට ලකුණු ඔවුන්ටම පෙණී ගියේය. පුක්කු කැහැරින් පස්අවුරුදු වයස්වූකල හිතුහැටියේ වගුරුවන්ට හැකිව තිබුන කඳුලු නැතිවිය. කෑමක් හෝ සෙල්ලම් කරණ ක්‍රීඩා භාණ්ඩයක් හෝ යමෙක් ඉල්ලුවිට දෙන සිරිතද ඇතිවිය. මෙබදු යසගුණ ලක්ෂණ දකිණු ලැබූ බොහෝදෙන මෑ දැඩිවූකල **දූනෙඟි** සමාධියක් වෙයයි විශ්වාස කලෝය. කැහැරින්ගේ වර්ධනය දිනෙන් දින දිසුණු වෙන්ට වෙන්ට දෙමව්පිය වැඩිහිටියන්ට

යටහත් පහත් විමද, පිරිසිදුකමද, රූකසුරුවම්කමද, වර්ණනයවිය. එසේම මව් පිය දෙදෙනාගේ සියලු කටයුතු දින දින දියුණු අතට හැරී ඔවුන්ට මහත් ධනයද සම්භවිය. ගුරුවර ගුරුවරියන් සැකිය නිවසට ගෙන්වා සිංහල, දෙමළ, ඡන්දී, ඉඩ්‍රීසි භාෂාද, මැහුම්, හෙතුම් ආදියද ඉගැන්නුවේය. ගෘහශාස්ත්‍රාදි පරිපාටියද, පිසීම් ආදියද සැකිය මවම ඉගැන්නුවාය. විශෙෂවශයෙන් ගෘහ්‍ය කර්මාන්ත සහ ජීවිතවෘත්තියට උවමනා, වර්ණනය කිරීමෙහි ඇතිවියයුතු සුදුසු ප්‍රභූව ඉපදවීමෙහි ප්‍රයත්නය ගුරුවර ගුරුවරියන් ලවා හැදෑරවිය. මෙකී ඉගෙනීම් ගැණ කිට්ටුවර නෑදෑ මිත්‍රයන් විසින් ප්‍රචුර විරුඬයක් දක්වනලදි. හේ මක් නිසාද යත්හොත්, කැතරින්ගේ පියා මෙවකට ධනපති යෙක් බවට රටේ ගැණී ප්‍රසිඬව සිටි නිසා සහ මේ මහත් ධනයට එකම හිමිකාරිවී සිටියේ කැතරින් නිසාත් ඉවිම් මැහිම් ඉගැන්වීම් ගැණ ඈ නොවෙහෙසා වැඩුනකල දැසි දැසාදින්ගෙන් එකී උවමනා කරගැණීමට ඕනෑවාටත් වඩා ධනොපකාරය මැතේ පාමුල තිබෙන බැවින් එය නොසලකා ඈ වෙහෙසන නිසාය. මෙකී විරුඬකම් ගැණ මැතේ මවගේ පිළිතුරුනම් මෙසේය:—

"ධනය දුනට තිබෙන බව සැබෑය, නමුත් මේ ධනය කුමකින් කුමක් වේදකියා කිය නොහැකිය. දුනගත් දෙයනම් නැති නොවන දෙයක, දැස දැසියන් ගෙන් ඈට උවමනා කෘත්‍යයන් පිරිමසා ගැණීමට මෙම ධනය නොනැසී පැවතියේනම්, එසේ කරගැණීමට බාධාවක් නොමැතිය. අපට කියයුතු අපවාදයකුදු නැත. යම්හෙයකින් ධනය අනතුරට ගියේනම් **"මගේ මව මට උවමනා කටයුතු නොඉගැන්නුවාසින් මේ දුක මම විඳිමි"** යි යන නිතිජනක අපවාදයට අසුනොවීම අපගේ සුකුසම නිසා සහ ප්‍රකෘතියෙන්ම හිමිවන ලොකාපවාදයෙන් මිදීම පිණිසත් මේ කාලයේ මෑ වෙහෙසවීම අවශ්‍යය" යි යකුය. මැතේ ඥාතිවතුන මියතුමා සහ මෝතුම් මෙසේ කිට්ටුවර බැඳුන්ගේ වරද අදහස්වලට මුලා නොවී වෙසෙසින් දුක්පත් සත්‍රියක්

විසින් දැනගතයුතු සියලු කම් වෙහෙසදිදී ඉගැන්වීම කරණකොටගෙණ ඇතම් ධනවතියන් ලෙස ධන මදයට නොපැමිණීමෙන්ද, නිව අහඞ්කාරයකට නොපැමිණීමෙන්ද, පමණට වඩා ඇදුම් පැලඳුම් නොහැඳීමෙන්ද, මුහුනාමාණික්‍යාදි ආභරණ ගැණ දෙගුරුන් නොවෙහෙසීමෙන්ද, නම්බුකාර ගෑණු ලමයෙකුට අසිති ඉරියව් නොබිඳීමෙන්ද, අශිලාචාර නොවීමෙන්ද, අකීකරු නොවීමෙන්ද, අලස නොවීමෙන්ද, සම්පප්‍රලාප නොදෙසීමෙන්ද, ගුරුවර දෙමව්පියාදින්ට පැවතියයුතු සීමා උල්ලඞ්ඝණය නොකිරීමෙන්ද, ආගමේ වතාවත් නොසිඳීමෙන්ද, මසුරුමල සිඳදැමීමෙන්ද, නුසුදුසු අඞ්ග විකාර නොදැක්වීමෙන්ද, දුටු දුටු දේවලට රුචි නොවැඩීමෙන්ද, අනුජීවීන් වෙහෙස නොකිරීමෙන්ද, සත්ව හිංසාවට නොකැමැත්වීමෙන්ද, කිසිවෙකු කෙරෙහි සිනයෙනුදු නපුරක් නොසිතීමෙන්ද, ශික්ෂාකාමී තාපසියෙකුගේ ලීලාවෙන් යුක්තව ඉතා ඥනවන්තලෙස සඞ්කීය ජීවිතය පවත්වා ගෙණ යාමට පුරුදු කළාය.

———:o:———

තරුණ කාලය.

මෙසේ වැඩෙන කැතරින් වියපැමිණීමේ වයස සම්පූර්ණවූයේ, විය පැමිණීයාය. මෙතැන් පටන් තරුණ කැතරින් මහත්මියගේ පුරුදු ශුචරිත වඩ වඩා දියුණු කළ යුතු බව ගුරුවරුන්ලවා දෙමව්පියන් විසින් දුන් නුවණැසින් දැක, තරයේම එකී කම් වැඩුවාය. තමන් දැන සිටි මැහිම සම්බන්ධ විචිත්‍ර වැඩ ආදි අත්කම්වලද ගෙකම්වලද, කියවීමෙහි සහ ලිවීමෙහිද, මවහා අන්‍ය වැඩවලද නියුක්තවූවාය. පියා සහ මවද මේ එකම ප්‍රිය දියනියන් ගැණ මහත් සෙනහයකින් පසුවුනෝය. තරුණ මහත්මියට උවමනා සකලමදෙය සම්පාදනය කළෝය. මේ තරුණ මහත්මිය තමා ප්‍රිය දෙසින් ඒ හා

සමාන අසල යෞවනියන් සන්තර්පනය කිරීමට ඉතා සතුටු බැව් තම පියාට සහ මවට හඟවා ඔවුන්ටද එසේම ඇදුම් පැළඳුම්වලින් අනුග්‍රහකළවාර බොහෝය. තරුණ කැතරින් මහත්මිය **ලසඳෘස්** දින දින වර්ධනය වීමෙන් **පුරසඳෘස්** ප්‍රසිද්ධ භාවයට පැමිණියාය. ස්ත්‍රියෙකුට උචමනා සකල කම්යන් ගෙන්ද, රූපලාවන්‍යයෙන්ද, ප්‍රිය ශීලයෙන් සහ ශිෂ්ටාචාරයෙන්ද, උපකෘත ප්‍රකට ශබ්ද කරණ තොටගෙණ ශාස්ත්‍රයෙන් සහ ධනයෙන් තර බලපුළුවන් කාර තරුණයෝ මෑ සරණකර ගැනීමට තැත්කළෝය. මොවුන්ගේ යතන ගැණ මෙම වාසනාවන්ත කන්‍යා වියගේ නුවණැති දෙමව්පිය බන්ධුමිත්‍රාදිහු එකමතව පිවිපෑවාහ.

මෙසේ කල්යන අතර කාලත්‍රිතයේ බලපුළුවන් කාර තරුණයෙක්ද, මොරටුවේ බලපුළුවන්කාර තරුණ යෙක්ද, මේ වරහන කෙරෙහි ලොබ බැඳ සරණබන්ධන යට යතන කළෝය. මෙකී උත්සාහ මෙසේ කරණ අතර පියුමට හිරුසෙසින්ද, කුමුදට සඳසෙසින්ද, මොරටුවේ බලපුළුවන්කාර තරුණ මහතා ශ්‍රී සම්පත් ශ්‍රේණියෙන් ශ්‍රේෂ්ඨයා ලෙස නිශ්ශඞ්කාවම හැඟුණ බැවින් සහ සෙසේ තරුණ ජීවිතයක් පසුකරන්නෙක් නිසාද අලුත් වැඩියා කළයුතු ගුණාදියෙන් විනිර්මුක්ත සුභාවිත සත් ගුණාදියෙන් යුක්ත සත්පුරුෂ තරුණයෙක්වූ හෙයින්ද, නිරවද්‍යලෙස ගණන්ගෙණ මෙම තරුණ මහතා කෙරෙහි මෙතුමාගේ දෙගුරුවර බන්ධු මිත්‍රාදිහු රිසිවූහ. මේ රිසිවූ තරුණයානම් අප අනුරෙන් වෙන්වූ පරාර්ථකාමී සාධු සත් පුරුෂ **මාලීස් හැන්ඩ් ද සොසිසා** මහත්මයාය. කැතරින් ද සිල්වා යොවුන් මැතිනිය මෙම මැතිතුමා සමග සරණ බන්ධනයට පැමිණ සකල ශ්‍රී විභූතිය කරමින් දිවසාති ක්‍රාන්ත කළාය. පොළව හිමිකර ගැනීමේ තෘෂ්ණාවෙන් යුක්ත රාජ පුත්‍රයෙක් වහ වහා යුද්ධකෙරේද, සඟිය හිමිකර ගැනීමෙහි තස්නායෙන් යුක්ත ද සොසිසා අභිධාන මනුෂ්‍ය පුත්‍රයාද, දිමෙහි වහා වහා නියුක්තවෙන අතර, එසේම

දිමෙහි එබිතාර ආශාවකින් යුක්ත මනුෂ්‍ය පුත්‍රියක් ද සොසිසා මන්දිරයට ඇතුල්වීම කරණකොටගෙණ දුගී මග් යාචකාදීන් අතුර පවා නා නා බිණ්ඩිම් ඇතිවිය. එනම්:—"මහා සාගරය සමඟ යමුනා නදිය මිතුවුනා වැන්න, ඒහෙයින් දුනය ඕගුණ වේයයි කිසිවෙක් කීවෝ, සඳුන්තුර වැලඳගත් සුමන ලතාවක් වැන්න, ඒ හෙයින් දුනය සුගන්ධයෙන් උග්‍රවේයයි කිසිවෙක් කීවෝ; තණුක රූපයකට රත්නාභරණ පැලඳුවා වැන්න, ඒහෙයින් දුනය ඉතා අගයවේයයි කිසිවෙක් කීවෝ; කිරට පැනි මුසුවුනා වැන්න, ඒහෙයින් දුනය ඉතා රසවේයයි කිසිවෙක් කීවෝ" යනුය.

ද සොසිසා මහත්මිය දිමෙහි රැති ඇත්තියක් බව දුනගත් දුගී මග්-යාචකාදිහු සතුටින් ඉපිළ මෙසේ ප්‍රිය වචනයන් බිණූහ. එසේම ඔවුන්ගේ අදහස් ඔවුන්ට හැඟිගියාක්මෙන්ම දිනෙන්දින මැතිවරයා සහ මැතිනිය දෙන දුනය උකහාවීමෙන් මොවුන්ට ජයමඬලාභයක්ම වීය.

නව යොවුන් දෙදෙන වර දිලිප, සුදක්ෂිණා ලක්ෂණයෙන් ඇලී අනේක ශුචරිත ක්‍රියාවන්ගෙන් යුක්තව සුවසේ වාසයකරණකල; ද සොසිසා මහත්මිය පුණ්‍ය ලක්ෂණයෙන් හෙබියාවූ ප්‍රිය දුහිතෘවක් පළමුවෙනි වරට ප්‍රසූතකළාය. මෙකී ප්‍රිය දුහිතෘ ලැබුනකල එම ලදරියට පමණක් නොව අවශෙෂ අවට දරුවන් කෙරෙහිද මහත් කම්පීත සිතක් පහළකරණුලදී, ප්‍රසූතිකාවන්ට සහ දරුවන් වද, උවමනා කටයුතු මොනවට ඉටුකළාය. පින්කිරීමෙහි, යම් ආශාවක් ඇතුවගියේද? එකී ආශාවන්ට වඩා සහස්‍ර ගුණයකින් පින්කිරීමටද, දන්දීමටද කැමැත්ත ඉපදවුවාය, එපමණකුදු නොව ඒ සත්කෘත්‍යයන් ගැණ පරිවාරයින්ද, මෙහෙයුවාය.

මෙසේ මේ පරම සුන්දර මැතිනිය සිය සැම් මැතිවරයාමෙන් පරාර්ථයෙහි ඇලුනේ, වතින් බතින් සහ මුදලෙන් දෙන දීමනා දිනදින දියුණු කළාය. දිනපතා දිනානතය දක්වා පැමිණෙන දුක්පත් කිසිවෙකුට අනුග්‍රහ

නොකොට යාමට ඉඩනොමහැර, වත් බත් බුලත් මුදල් ආදි වසතුවෙන් සතුටුකලාය. මෙතුමිට පුත්‍ර දුහිතෘහු ලැබෙන්ට ලැබෙන්ට දුක් මත් යාචකාදින්ට මඩගල්‍යයක්ම සිදුවිය. එපමණකුදු නොව සැකියය සැමිපුරුෂ මැතිසදුගේ වෙළ ඳුම් කටයුතුද, දින දින දියුණු භාවයට පැමිණීමෙන් ධන වර්ධනයදවිය. තමන් ධනවතියක්වූ න්‍යායවෙන්වත් තම භිමියා ධනපතියෙක්වූ නියාවෙන්වත් තම බන්ධුහු බලපුළුවන්කාරවූ නියාවෙන්වත්. අන්‍ය සැභාවයකට නොපැමිණ නිහතමානිව නිර්‍මාපණයෙන් දවස් යැවීමේ අගය කරණකොටගෙණ මේ හුදී මැතිනිය නොයෙක්වර නියවතුන්ගෙන් අනෙක පැසසුම් ලැබීම කාලික සත්‍රීන්ටද මනොහර ආදර්‍ශයක් කොට ගැණේ.

පැසසුමෙන් බර, වර මැතිනියට නොයෙක් වාරයන්හි ලැබුන අපමණ තෑගි හොග ගරුනම්බු නියුපුදුදිය නිසා කිසියම් චාවු කම්‍මැදියකටද නොබැඳිනිය. මේ අරබයා දුක්වූ විශෙෂ ප්‍රෞඪභාවයකුදු නොමැතිය, මාතා ගුණොප ලාලනයෙන් උපලක්‍ෂිත මැතිනිය තම දරකයන්ට මෙන් දැසි දසුන් ගැණද සැලකුවාය. ඇතැම්විට සැකිය දරකයන් ගැණ නොසොයා අනු ජීවින්ගේ විපත් සඳහා තමාම මිඩංගු වීමෙන් ක්‍රියාකොට ඔවුන්ගේ විපත් නිම්මූලනය කලාය.

වරසුන්දරිය ලොවසැභාව දන්නී, දුගඳ සුවඳ දන්නී, කල් නොකල් දන්නී, චරිත චරිත දන්නී, පින් පව් දන්නී, ගුණ ගුණ දන්නී, තරම තිරම දන්නී, සතතයෙන් තම සැමි පුරුෂොත්තමයා උසස්කොට සැලකීමෙන් දැසි භාවස්‍ථකගේ නොමඩු උතතුඩගචරිත භජනය කිරීමෙන් සිත දිනාගත්තාය. මෙසේ මෙහෙකරණලද්දේ සිය සැමිගේ ධන කීර්‍ති බලආදියට වාල්වීමෙන්වත් පුත්‍ර දුහිතෘ බන්ධු මිත්‍රාදින්ට හයේවත් නොව සත්‍රියෙකු විසින් සැකිය පුරුෂයාට කළයුතු සියලු සත්කාර ගරුකාරකොට ඒ නයෙන් සම්‍පූර්‍ණලෙස මිදි සැගිය අත්පත් කරගන්න අවියෙන්ම බව මෙය කියවන හුදී ජනයා ස්ථිරලෙස අදහත්වා.

තවද සිය මැතිවරයා විසින් රාජ රාජ මහාමාත්‍ය දින්ටද, ප්‍රභූජනයාටද, අනේකවිට සඞ්කීය නිවසේදී කළ කී අනුග්‍රහ ආදියට කිසිවිටකත් මෙතුම් පිටුනොපා ඒ ගැණ සම්ප්‍රකාරයෙන් පඩුකාරි වීමෙන් ක්‍රියාකර එකී උත්තමයන්ගෙන් ගරුබුහුමන් ලැබිය.

විශෙෂ වශයෙන් මේ මැතිනිය ගැණ මෙහිදී කියයුතු ඉතා වැදගත් කරුණක්නම්:—මෙතුමිගේ සහොදරියක මෙන්ද සුසෙව් ද සොසිසා මන්ත්‍රීන්ද්‍රයාත් රාජකුමාරොත්සවයේදී විසුරුවා හරිණුලැබූ එහා පිටේ පෙණෙන කැඳවීම් පත්‍රය පිළිගෙණ මෙම උත්සවයට පැමිණි නා නා ජාතික සිය ගණන් නෝනා මහත්මින්ගෙන්, කිසිවෙකුටත් කිසිම අඩු ලුහුඩක් ප්‍රකාශකිරීමට ඉඩ නොතිබා තමන්ම යෙදී මවකු මෙන්ද, සහොදරියෙකු මෙන්ද ඒ ඒ නෝනා මහතුන්ට කළ කී උදුර සඞ්ග්‍රහයන් ගැණය. සැබවින්ම මේ කරණකොටගෙණ මෙම මැතිනියට අදත් දැනුත් පසසන නා නා ජාතික සත්‍රී සමූහයා බොහෝය. තවද ගෘහිණී කර්මය පිරිහෙළා නොගෙණ ප්‍රසිඩ සභාවන්හි දැක්ෂලෙස ක්‍රියා කිරීමෙන් සහා ඊශ්වරාදින්ගෙ මන නුවන් දිනාගත් වාර බොහෝය. කුශල දන්නී රොගයන්ගෙන් පෙළෙන්නන් කෙරෙහි විපුල කරුණා උපදවා වෙසෙසින් සඞ්ග්‍රහකරන්නී පුණ්‍ය ලක්ෂණදත් පැණවතුන්ගෙන් නොයෙක්වර පූජා ලැබිය. විපුල ගුණෝපෙත පරාර්ථකාමී ප්‍රිය නෑන්දනී යන්ගේ කුශල ක්‍රියා උගත්තී ඒ සමාන රූපිකව සකල සත්චරිත වර්ණනයෙහි තත්පරවීමට පරම සන්තුෂ්චිත්තා ප්‍රබොධයෙන් රැහිවඩන්නී ඒ ලක්ෂණයෙන්ම පින්කිරීමෙහි ව්‍යාවෘත වූවාය.

මේ අතර තම පියෙකුලෙස ගරුකළ සුසෙව් ද සොසිසා වාසල මුදලිතුම කථාශෙෂ හාවොපගතවූයේය. මෙය මේ තුමි ඉතා ශොක කරවන කරුණක්විය. මේ ශොකයගැණ නුවණ මෙහෙයා කල්පනාකොට ශොක නිවාරණය කරගණ්මින්, තමන් ගුරුකොට සැලකූ නෑන්දනියගේ ජරා ව්‍යාධිගැණ මිඩඩුවීමෙන් කාලය

His Excellency the Governor,

AND

HIS ROYAL HIGHNESS

The Duke of Edinburgh,

Having graciously consented to honor with their presence an entertainment at Bagatelle on Friday the 22nd instant at 9 p.m.

Warschennedigey Seosew de Soysa

AND

Warschennedigey Charles Henry de Soysa Dessanayake

request the company of

Mr & Mrs Hermann's Boyse & family

on that occasion

Bagatelle, 7th April, 1870.

THE INVITATION ISSUED AT THE ENTERTAINMENT TO H. R. H. THE DUKE OF EDINBURGH.

ඇඩින්බරෝහි ආදිපාදයානන් සමඛ්ඛි උනසවයෙදි විසුරුවාහරිණලද කැඳවිම් පත්‍රය.

ගතකිරීමට පටන් ගත්තාය. * තම නැන්දම්මා ජරා ව්‍යාධියෙන් පෙළෙන්නී කැඳ, බත්, බෙහෙත් ආදියදීමෙන් සහ අන්‍ය සැලකිලි කිරීමෙන් සුවපත්කර ගැනීමට යතන කළාය. නිසිවේලාවට සාපිපාස සංසිඳවාගැනීම ගැණ පමා නොවීමෙන්ද, නිදි නොගැනීමෙන්ද, නැන්දනියන්ගේ යහන ලහම සිම සියලු මෙහෙ කළාය. ව්‍යාධි ලක්ෂණ උකහා වීම කරණකොටගෙණ සිහි විකලවියද නැන්දනියන්ට ඇතිවිය. මේ කරණකොටගෙණ වරින්වර ලැබුනු ඉවසිය නොහැකි කරදර හිරිහැරගැණ ශෝකයකුදු චිත්තදූෂිතකර නොගැනීමෙන්, හිස ගිනිගත් කෙණෙකුමෙන් මෙකී රොගයන්ගෙන් සුවපත්කරගැනීම සඳහා මේ පින්වතී මහත් පරිශ්‍රමදරමින් උවටන් කළාය. මසක්, දෙමසක්, තෙමසක් නොව **සතිස් මසක්** පමණ කාලයක් දිවා රෑ පරිශ්‍රම දැරීමෙන් වැළඳිතිබුන රෝගයන් බොහෝදුරට බැහැරකර ගත්තාය. ප්‍රකෘති සිහිද ඇතිකලාය. තම උත්සාහය බොහෝදුරට සඵලවීමෙන් ඝකීය නැන්දනියන් බොහෝදුරට සුවපත්වුනාදැක සතුටු වුනාය. එසේද උවත් අන්තිම කාලයට පැමිණෙන, ජරා ව්‍යාධි, මරණ යන සථාන තුණ ඉක්මවීම කිසිවෙකුට නුපුළුවන් හෙයින් තමන් ප්‍රියකළ පින්වත් මේ නැන්දනිය මරුවාගේ අතට අසු වීමෙන් ශොකයට පත්වීමට මේ පින්වතියට සිදුවිය. ඝකීය නැන්දනියන් ගැණ මෙම පින්වත් යෙහෙළිනියකළ ගරුකාර සැලකිලිගැණ නුවණැති බොහෝ දෙනාගෙන්, මේ පින්වති අප්‍රමාණ සතුති ලැබුවාය.

පුණ්‍යවන්ත ගුණ ලක්ෂණාදියෙන් ප්‍රබොධ මෙම මහත්මිය ඝකීය නැන්දනියන් ගරුකොට සලකා දිගී කාලයක් අප්‍රමාණලෙස දුක්ගණිමින් කළකී උපසථාන සවිප්‍රකාරයෙන් මහාඝී බව නුවණැත්තහුට මනාවවැටහෙන

* නැන්දනින්ගේ සහ යෙහෙලිනින්ගේ විරුඬතා ගැණ නොයෙක් ග්‍රාම්‍ය කථා ඇති නමුත් මේ නැන්දනිගේ සහ යෙහෙලිනියගේත් සමගි භාවය හොඳින් පැවතුන බව ප්‍රකටය.

බැවින් මේ ප්‍රියතර යෙහෙළිනියවූ ද සොසිසා ආර්‍යාව ආදර්ශයට ගෙණ නැන්දනියන් සමග සාමාග්‍රියෙන් පසු වෙන්ට නොදත් යෙහෙළිනියෝ අසඞ්ඛ්‍යාතව මෙයින් සම සම දේ ඉගෙණ පරම සාමාග්‍රි ධර්මය, භජනය, පයුරුපාසනය කරත්වා!

ගුණයහපත් ප්‍රියතර මවකුගෙන් වියොගවූ තම සැමි පුරුෂයාගේ විපුල දුකද, තමාගේ දුකද, එක සමාන බරට ඇතුවගියේ වීනමුත් ඥානවන්ති සියලු දුක් සහවා පුරුෂොත්තමයා මොනවට සැනපෙව්වාය. මරණ යෙහි ඇති අස්ථිර භාවයගැණ මෙනෙහි කරමින් වඩ වඩා කුශල කර්මයෙහි තත්පරව් ක්‍රියා කරන සමයේ තෙල් බදුනෙන් ගිණි උදුනට පතිතවූ අයට මෙන් ප්‍රියාදර සැමියා මවගෙන් වියෝගවීමට සිදුවීමේ දුකට නැවතත් මෑ පරිවර්තනය විය. මව් පිය හඳුනන හොඳ නුවණැති දුවකු විසින් කටයුතු සකලම ගෞරව මවට දීමෙන් වළලා, වැඩිදුරටත් මනුෂ්‍ය ජීවිතයේ අනිස්ථිර භාවය මෙනෙහි කරමින් කුශලයෙහිම ඇලුනාය.

මෙසේ සියසැම් මැතිවරයා සමග අනෙක කුශල කර්මයෙහි තත්පරව්මෙන් දුටුවන් සහ ඇසුවන් කම්පිතවන ආකාර දැනධර්මිකිරීමෙහි ව්‍යාවෘතවූයේ, සැමියා පියතුමාවන කිතිනිමත් ප්‍රසේද සිල්වා "නෙව්" තුම මරණ මඤ්චක ප්‍රාප්තවූයේ ඒ ගැණ ව්‍යාවෘතව් සකල උවටන් කිරීමෙන් ඥානවන්ත දියනියකගෙන් සැමියා උතුම් පියෙකු ලැබියයුතු සියලුම සුකුසම් සම්පුණ්‍රියෙන් ඉටුකළාය. මරණ මඤ්චක යෙන් නැගිටුවාගැණීමට හැකි සියලු උත්සාහ කෙළේ වීනමුත් ඒ සියල්ල නිෂ්ඵලව් පියතුම සැමියාණන්ව.

ෂෝතොම සහ සැමියා සැමි මැතිවරයානෝ මේ ගැණ උවමනා කටයුතු මොනවට සම්පාදනය කොට අවසාන කෘත්‍යය අගයට ඉටුකළාහ. මෙසේවූ දුඃඛයද තුනීකර ගෙණ වඩ වඩා කුශල චරිතයෙහි ව්‍යාවෘතව් කලදවස

ගෙවනා සමයේ අවාසනාවට මෙන් සිය සැමිවරයා වියරු බැල්ල විසින් සපාකනලදින් නොවිතර ශොකයට පත්ව දිවා රෑ දෙක්හි කඳුලින් පසුවීමට සිදුවිය. සැබවින්ම මේ විපත මේ මහත්මියට පමණක් නොව පුත්‍ර දුහිතෘන්ටද ලොකයාටද බලවත් දුකඛයක්විය.

සඛකීය සිම්හුගේ මේ බලවත් ව්‍යසනයගැණ දුක්වෙවී එසින් මුදවාගැණීම සඳහා තුරුල්ලේම සිට මවකු විසින් පුත්‍රයකු කවන පොවන පරිදි නොනසා බෙහෙත් දිම් කෑම පීම දිම් ආදියෙන් ගරුලෙස සැලකුවාය. දෙමසක් පමණ මෙසේ හිරිහැර කරදර දුක්පිඩා වින්ද නමුත් ඒ ක්සිවකට කිසි අනුකම්පාවක් නොපානලද ඔොරවූ මරුවා විසින් සිය සැමි මැනිවරයා වශඟකරණලද්දේ පුරුෂ වියොගයට පත්ව, **විධව** වාචක ශබ්දයටද පැරළිනි.

මෙම වියොග නැමති ඝන වනෙහි මුලාවූ වර මැනිනියගේ චිත්ත විපර්‍යාසයද සුලුපටු නොවීය. සඛකීය රම්‍ය මන්දිරය ගනදුරෙන් වැසුන ඝන වනයක රෑ වැටහිනි. එහිවූ අගනා කනක රජත මණිමුක්තා ආදිය වනඛිම ඇසුරු පුරාණ පණ්ඩි රෑ වැටහිනි, එහිවූ ලක්ෂණ භාණ්ඩ මල් නොමැති නිල්වන මැකුණ තණ රෑ වැටහිනි, එහිවූ පවිට ජවනිකා ආදිය දුක් තික්වලින් කිළිටි රෑ වැටහිනි, එහිවූ ප්‍රදීපාලොක කදෝ කිම් රෑ වැටහිනි, එහිවූ ප්‍රිය ලක්ෂණ අගනා සයනාසන නොදහන ගින්නෙන් සැරසුන රෑ වැටහිනි. එහිවූ කොට්ට මෙට්ට ඇතිරිලි ආදිය වෘක්ෂලතාදියෙන් විසුරුණ කණ්ඨක රෑ වැටහිනි, එහිවූ මන්දරොද්‍යානය වියලුන තණ පඳුරු සහිත තැන තැන මාන්වූ කලල් භූමියකගේ රෑ වැටහිනි, එහි පෙම්කෙළන අශ්ව ගව මුව පොල්ලහු මුල් සතරින් ඉසුලු ජරපත් තුරු සමූහයකගේ රෑ වැටහිනි, එහිවූ පාරාපත සැවුල් තාරා පාත්ත ආදිහු මළගිය මණ්ඩූක රෑ වැට හිනි, එහිවූ රථ ආදිය ජීණ්ව වැටීගිය තුරු රෑ වැටහිනි, එහිවූ මුළුතැන්ගෙය මලින් දියෙන් සුන් පුෂ්කරණී රෑ වැටහිනි, සඛකීය දුරක ගණයා ශෛලසානුහ රෑ වැටහිනි,

එහිවූ රසබොදුන් තියාන කිදිරු වැටහින, මෙහිහානිවූ එහිවූ සකල වසතු වන තැන් තැන්වූ කාළවණී උපවිකා ගෘහ රූ වැටහින, පුරුෂ වියොගය කරණකොටගෙණ මෙසේ ලක්ෂණයන්ගෙන් චින්තා විපයය්‍යාස ද සොයිසා මැතිනියගේ විපුල දුක් රාශිය මෙසේ අතිශයින් උකහාවිය.

ඉක්බිති පුත්‍ර දුහිතෘන්ගේ ඉදිරි අභිවෘඛිය සඳහා සකල කටයුතු කර්මටද, වතු පිරි ගවමහිෂාදීන්ගේ දියුණුවට කටයුතුකිරීමටද, තමන්ට සිදුවීමෙන් මේ සඳහා මහත් පරිශ්‍රමයක් දරන්ට සිදුවිය. යලිදු තම තෙවෙනි දූරක මාර්ශ්‍රට් ෆ්‍රැන්සිස් මේර් ද සොයිසා නම් තරුණ මහත්මියට, පරණ පටබැඳිගේ ඉලාරියන් මාර්කස් ප්‍රණන්දු වීරසූරිය අභයවික්‍රම රාජකරුණාරත්න (ඇම්. නි., බී. ඇස්. සී. ලොං., ඇම්. සී. බී. ආර්. ඒ. ඇස්.) (M. D., B. SC. Lon., M. C. B. R. A. S.,) වෛද්‍ය මහතා සඟම් පුරුෂයා කොට එක්දහස් අටසිය අනූඑකේ ජූනි මස විසිදෙවෙනි (1891. ජූනි. ම. 22.) දින සරණපාවා දිමෙන්ද, සතරවෙනි දූරක, පේන් මෙරයා කැරොලයින් ද සොයිසා තරුණ මහත්මියට, පරණ පටබැඳිගේ චාලීස් මැතිව් ප්‍රණන්දු වීර සූරිය අභයවික්‍රම රාජකරුණාරත්න (බී. ඒ., ඇම්. සී. බී. ආර්. ඒ. ඇස්., ඇම්. ඇම්. සී., බී. ඇල්.) (B. A., M. C. B. R. A. S., M. M. C., B. L.) නීතිඥ මහත්මයා සඟම් පුරුෂයා කොට එක්දහස් අටසිය අනූඑකේ ජූලි මස දෙවෙනි (1891. ජූ. ම. 2.) දින සරණ පාවා දිමෙන්ද, සිහි නුවණැති මව් පිය දෙදෙන විසින් සිදුකළයුතු මෙලොව බැරුරුම් වැඩ කොටස සුදකලාව මෙම නුවණැති මැතිනිය විසින් ප්‍රශංසනිය ලෙස ඉටුකරණලදි.

———:o:———

ශ්‍රීමත් අප මහා රාජිණ විසින් ගෞරව කිරීම.

ද සොයිසා මැතිනියගේ ප්‍රිය සඟම්පුරුෂොත්තමයාවූ ද සොයිසා තුමට "සර්" යන නාමයෙන් ගෞරව කිරීමට ලඞ්කාණ්ඩුව සහ එඞ්ඝලනතාණ්ඩුව විසින් සම්මතකොට ශ්‍රීමත් අප මහා රාජිනීන්වහන්සේගේ කැමැත්තගෙණ

සුදුනම්වනකල ද සොයිසා තුම ඇඟිස්සුවුනේය. මේ කරණකොටගෙණ දුකටපත් මහාරජිනිය විසින් ස්වාමියා වෙනුවෙන් ලැබියයුතු සකල ගෞරවයන්ට ආලිස්සම් නොකොට "නයිට්" තුමෙකුගේ වැඳඹු කාන්තාවකට අයත් සියලුම ගෞරව අසිහිවාසිකම් ද සොයිසා වරහනට ඉතා සතුටින් දෙවාවදුරණලදී.

———:o:———

Numb. 26253. Folio. 543.

THE LONDON GAZETTE.

———:o:———

PUBLISHED BY AUTHORITY.

———:o:———

No 1. Tuesday, February 2, 1892.

———

Whitehall January, 22, 1892.

THE Queen has been graciously pleased to ordain and declare that Catherina de Soysa, the widow and relict of Charles Henry de Soysa (Dharma Gunawardene Wipula Jayesooria Karunaratne Dissanayeke), Esquire, in the Commission of the Peace for the Island of Ceylon, deceased, shall henceforth have, hold, and enjoy the style, title, place, and precedence of a Widow of a Knight Bachelor of these Realms in as full and ample a manner as she would have enjoyed the same had her husband received the dignity of a Knight Bachelor:

And to command that the said Royal order and declaration be registered in Her Majesty's College of Arms.

No. 2. COLLEGE OF ARMS,
5th July 1892.

SIR,

I have the honour to forward herewith, for transmission to Lady De Soysa, Her Majesty's Warrant, under the Royal Sign Manual, granting to her the style, title, place and precedence of a Widow of a Knight Bachelor of these Realms.

Her Majesty's Royal Concession has been duly recorded in this College and is otherwise completed.

I am, etc.

(Signed.) ALBERT W. WOODS,
GARTER.

The Under Secretary
of State, &c., &c.
Colonial Office.

———:o:———

COPY OF TELEGRAM FROM GOVERNOR.

No. 3.

To
COLLUPITIYA
31st July 1891
LADY DE SOYSA,
ALFRED HOUSE,
COLLUPITIYA.

From KANDY.
Urgent,
From
GOVERNOR.

I have much pleasure in informing you that the Queen has been graciously pleased to grant you the rank style and precedence of a Knight Bachelor's widow.

COPY OF LADY DE SOYSA'S REPLY.

No. 4. From COLOMBO.

To LADY DE SOYSA.

HIS EXCELLENCY THE GOVERNOR.

Lady De Soysa sends His Excellency her grateful acknowledgement of his Telegram announcing the honour graciously bestowed upon her by Her Majesty the Queen.

July 31st 1891.

———:o:———

No. 5. COLONIAL SECRETARY'S OFFICE,
Colombo, 15 September 1891.

Madam,

I am directed to inform you that His Excellency the Governor has received a Despatch from the Secretary of State for the Colonies, wherein Lord Knutsford informed His Excellency that Her Majesty the Queen has been graciously pleased to approve of the rank, style and precedence of a Knight Bachelor's widow being conferred upon you, in consideration of the late Mr. Charles Henry De Soysa's acts of munificence and philanthropy.

I am, Madam,

Your Obedient Servant,

(Sd.) H. L. CRAWFORD,
for Colonial Secretary.

LADY DE SOYSA.

No. 6.

THE PAVILION,

Kandy, 9th August 1892.

Madam,

I have much pleasure in forwarding to you Her Majesty's Warrant, under the Royal Sign Manual, granting you the style, title, place and precedence of a Widow of a Knight Bachelor, together with a copy of a letter from Garter King of Arms, enclosing the Queen's Warrant.

I have the honour to be,

Madam,

Your most obedient Servant,

A. E. HAVELOCK,

Governor.

LADY DE SOYSA.



LADY DE SOYSA'S WARRANT.

ද සොයිසා ආඥාවගේ අයිතය.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO



Victoria R I

Victoria by the Grace of God of the United Kingdom of Great Britain and Ireland, Queen, Defender of the Faith To Our Right trusty and Right Entirely beloved Cousin Henry Duke of Norfolk Earl Marshal and Our Hereditary Marshal of England, Knight of Our Most Noble Order of the Garter, Greeting Whereas We have thought fit to confer upon Our trusty and well-beloved Catherina de Soysa the Widow and Relict of Charles Henry de Soysa (Dharma Gunawardene Wijeula Jayesooria Karunaratne Dissanayake) Esquire, in the Commission of the Peace for the Island of Ceylon, deceased, a mark of Our Royal favour in recognition of the valuable services and many acts of munificence and philanthropy of her

Warrant granting the title, rank and precedence of the Widow of a Knight-Bachelor to Mrs Catherina de Soysa

LADY DE SOYSA'S WARRANT.—ද සොයිසා ආර්‍යාවගේ අඥාව.

SINHALESE DAILY NEWS' PRESS, PETTAH, COLOMBO



said husband: Now Know Ye that We of Our special Grace and Favour do hereby ordain and declare that the said Catherina de Soysa shall henceforth have, hold and enjoy the style title, place and precedence of a Widow of a Knight Bachelor of these Our Realms in as full and ample a manner and to all intents and purposes as she would have been entitled to enjoy the same had her husband the said Charles Henry de Soysa received from Us either personally or by Letters Patent under the Great Seal of Our said United Kingdom the degree style and title of a Knight Bachelor of these Our Realms.

Our Will and Pleasure therefore is that you Henry Duke of Norfolk to whom the cognizance of matters of this nature doth properly belong do see this Our Order observed and kept

LADY DE SOYSA'S WARRANT.—ද සොයිසා ආඥාවලිය අයුරය.

SINHALESE DAILY NEWS PRESS. PETTAH, COLOMBO.

and that you do cause this Grounds to be recorded in Our College of Arms to the end that Our Officers of Arms and all others upon occasion may have knowledge thereof; And for so doing this shall be your Warrant.

Given at Our Court at St James's this Twenty-second day of January 1892 in the fifty fifth year of Our Reign

By Her Majesty's Command

Henry Matthews

Recorded in the College of Arms, London, pursuant to a Warrant from the Earl Marshal of England.

William A. Weldon
Windsor Herald, Registrar

LADY DE SOYSA'S WARRANT.—ද සොයිසා ආඥාවගේ අඩංගය.

SINHALESE DAILY NEWS PRESS. FETTAH, COLOMBO.

ඉඛ්‍රීසි ලියුම්වලැ සිංහල පිටපත්.

1892 පෙබරවාරි මස 2 වෙනි දින

"ලන්ඩන් ගැසට්" පත්‍රයෙන්

ගන්නා ලදී.

අඞ්ක 1. 1892 ජනවාරි මස 22 වෙනි දින
"වයිට් හෝල්" මැදිරියේ දිය.

ලඞ්කා ද්වීපයේ සාමදූත චිනිඥවයකාර ධුරන්ධරව සිට කාලයාත්‍රාකළ චාල්ස් හැන්රි ද සොසිසා (ධර්ම ගුණවර්ධන විපුල ජයසූරිය කරුණාරත්න දිඝානායක) මහතානන්ගේ වැන්දඹු කැනරින් ද සොසිසාට නම සඞ්ඝමිත්‍රයානන් නයිට් නාමය දැරීමෙන් යම් උත්තෘෂ්ට භාවයක වාසය කිරීමට පිළිවන්ව තිබුනේද, එකී සියලුම උත්තෘෂ්ට භාවය සම්පූර්ණයෙන් ගැනීමින් මේ රාජ්‍යයෙහි නයිට් තුමෙකුගේ වැන්දඹු මැනිනියක් වශයෙන් අනුභව කළයුතු සකලම යශෝභව්‍ය විභූතිය කිරීමට මහාරාජිනීන්වහන්සේ කරුණාමහිම තාවයෙන් අවසරදී ප්‍රකාශකොට දෙවාවදුරණ ලද්දහ.

තවද එකී රාජකීය අසතය සහ ප්‍රකාශයත් මහා රාජිනීන්වහන්සේගේ සනනාහ ගාරයෙහි ලියා පදිංචි කර තැබීමට අණ දෙවාවදුළසේක.

———:o:———

අඞ්ක 2. 1892 ජූලි මස 5 වෙනි දින
සනනාහාගාරයේදිය.

මහත්මයානනි,

මේ රාජ්‍යයන්හි "නයිට්" තුමෙකුගේ වැන්දඹු කාන්තාවකට අයිති සියලුම ගෞරව සහ අයිතිවාසිකම් මහාරාජිනීන්වහන්සේ විසින් රාජකීය අත්සන් හසතය යටතේ දෙවා වැදූර්මේ හසත්‍යය ද සොසිසා අයත්‍යවට ප්‍රදානය කිරීම සඳහා මේ සමග එවිම්.

මහාරාජිනීන් වහන්සේගේ මේ රාජකීය දිමනාව නියම පරිද්දෙන් මේ සනනාහාගාරයේ සඳහන්කරණ ලදී.

මේවගට,

(අත්සන්කෙළේ) ඇල්බට්. ඩබ්ලිව්. වූඩ්ස්,
සනනාහ රාජ වම්හ.

ප්‍රදෙශහාර කන්තෝරුවේ
උප මහා ලේකම්තුමා වෙතටයි.

———:0:———

ගරුතර ආණ්ඩුකාරතුමා එව් විදුලි පණිවිඩය.

අඩක 3.
1891 ජූලි මස 31 වෙනි දින
කොල්ලුපිටියේ "ඇල්ප්‍රඩ්
හවුස්" නම් වලව්වේ
ද සොසියා ආයතනය වෙතටයි.

ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේ මහතුවර සිට එවන ලදී.

"නයිට්" තුමෙකුගේ වැන්දඹු කාන්තාවකට ලැබිය යුතු සියලුම ගෞරව අසිතිවාසිකම් ආදිය ඔබට කරුණා බ්‍යාශයෙන් මහාරාජිනීන්වහන්සේ විසින් දෙවාවදුල බැව් දැනුම්දීමට මම ඉතා කැමැත්තෙමි. *

---

* "නෙට්" තුමෙකුගේ වැන්දඹු වරාඛනාවකට ලැබියයුතු ගෞරවානවිත නාමය ද සොසියා නෝනා මහත්මයාට දිවට මහා රාජිනීන් කැමතිබැව් දැනුම්දී අද උදේ ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේ විසින් යවනලද විදුලිපණිවිඩයක් කාලයාත්‍රාකළ සී. එච්. ද සොසියා මහතානන්ගේ වැන්දඹු ද සොසියා නෝනා මහත්මයාට ලැබුන බැව් දැනගැණීම අපට මහත් ප්‍රීතියකි. ද සොසියා මහතා විසින් ලඛනාවිපයේ අභිවෘඛිය සඳහා දරණලද අනේක උත්සාහයන් ගැණ සැලකිමක් වශයෙන් මේ කළ ගෞරවය බොහෝ ප්‍රමාදවුවත් ඒ මහතාගේ මිත්‍රයන්ගේ සහ රටවැසියන්ගේත් ප්‍රීතියට කාරණයක් වීමය. මේ ලැබූ ගෞරවයගැණ ද සොසියා ආයතනය සහ සියපවිලත්

ද සොසියා ආයත්නාව සැම් පිළිතුර.

අඩික 4.

මහනුවර—ගරුතර ආණ්ඩුකාර
උතුමානන්වහන්සේ වෙතටයි.

කොළඹ—ද සොසියා
ආයත්නාවගෙනි.

මහාරාජිනීන්වහන්සේ විසින් ද සොසියා ආයත්නාවට කරුණාඩම්බරයෙන් දෙවාවදුළ ගෞරවය ගැන දැනුම්දී එවනලද විදුලි පණිවුඩය ගුණ සැලකීමෙන් පිළිගත් බැව් ඔතොමෝ මෙයින් දැනුම්දෙයි.

1891 ජූලි මස 31 වෙනි දිනදිය.

1891 සැප්තැම්බර් මස 15 වෙනි දින
කොළඹ මහ ලේකම් තුමාගේ
නන්තෝරුවේදිය

අඩික 5.

මැතිනියනි,

කාලයාත්‍රාකල චාල්ස් හැන්රි ද සොසියා මහතා විසින් කරණලද ලොකොපකාර වැඩ සිහිපත්වීම සඳහා තමුන්නාන්සේට "නෙවි" නමොපලක්ෂිත ගරුතර උත්තමයෙකුගේ වැන්දඹු කාන්තාවකට අයත් සියලු අයිතිවාසිකම් භුක්ති විඳීමට එම උතුම් ධානන්තරය

සමග අපිද ප්‍රීති වෙමු. ද සොසියා මහතා විසින් කරණලද ලෝකාඵලයක් වැඩගැණ සිහිසි පරිද්දෙන් "නෙවි" නාමයක් දිමෙන් ගෞරවකිරීමට අදහස්කර තිබුනේ, ඒ මහතා ජීවමානව සිටින කාලයේදිමය. තුමුන් සර් ආතර් ගෝර්ඩන් තුමාගේ විසාරකළ නොහැකි තත්වයනිසා මිට පෙර කිසිකලක සිංහල ජාතියට නොලැබුන මේ ගෞරවය දිම ප්‍රමාදවිය. එබැවින් මේ ගෞරවය සොසියා ආයත්නාවට හිමිවිය.

(1891 ජූලි මස 31 වෙනි දින ඔබ්සර්වර්)

නෙකශ්‍රින් විරාජමාන අප මහාරාජිනීන්වහන්සේ විසින් දෙවාවදුල බැව් නට්ස්ෆෝඩ් සාමින් විසින් ගරුතර ලඩ්ඩෙකඤ්චරයානන්වහන්සේට දැනුම්දුන් බව දන්වා ප්‍රදෙශ භාර මහාලේකම්තුමාගෙන් ලියවිල්ලක් ලැබිතිබෙන බැව් තමුන්නාන්සේට දැන්වීමට මට අවසර ලැබිතිබේ.

මේවගට, ඔබවහන්සේගේ යටහත්
මෙහෙකරු,

(අත්සන්කෙළේ) එච්. ඇල්. ක්‍රොෆෝඩ්,
මහලේකම්තුමා වෙනුවට.

ද සොසියා ආයතනය වෙතටයි.

———:o:———

අඩික 6. 1892 අගොසතු මස 9 වෙනි දින
මහනුවර රාජමන්දිරයේ දීය.

මැතිනියනි,

"නෙට්" තුමෙකුගේ වැදෑඹු කාන්තාවකට අයත් සියලුම ගෞරව අසිහිවාසිකම් මහාරාජිනීන්වහන්සේ විසින් දෙවාවැදූරීමේ රාජකීය අත්සන යටතේ අකුනය, මහාරාජිනීන්වහන්සේගේ අකුනය සමඟ සනනාඟ ගාටර් රාජයානන් විසින් එවන ලද ලියුමේ පිටපතකුත් ඔබට මෙසේ එවීමට මම ඉතා කැමැත්තෙමි.

මේවගට, මැතිනියනි ඔබගේ
ඉතා යටහත් මෙහෙකරු,

(අත්සන්කෙළේ) ඒ. ර්. හැව්ලොක්,
ආණ්ඩුකාරතැන.

———:o:———

අඩික එක (1) දරණ ලියවිල්ල එඩහලනතා ආණ්ඩුව විසින් ප්‍රසිඩ කරණලද "ගැසට්" පත්‍රයේ පළමුව පළ කිරීමෙන්ද, අඩික දෙක (2) දරණ ලියවිල්ල "ගාටර්" තුමා විසින් ප්‍රදෙශ භාර උප මහා ලේකම්තුමාවෙත යවනුලැබ ප්‍රදෙශ භාර මහා ලේකම්තුමා විසින් ඒබව ලඩ්කාණ්ඩුකාර උතුමානන්වහන්සේට දන්වා එවනලදී.

මෙවකට ලඬකාණ්ඩුකාර සර්. ආර්තර් ඇලිබැන්ක් හැව් ලොක් තුමා මහනුවර විසූ හෙයින් අඬක තුණ (3.) දරණ විදුලි පණිවුඩය ද සොසිසා ආයතනයට එවී මෙන් මේ බැව් ප්‍රකාශ කෙළේය. ද සොසිසා ආයතනය විසින් අඬක හතර (4) දරණ විදුලි පණිවුඩය ඊට පිළිතුරු වශයෙන් ආණ්ඩුකාරතුමාට යවනලදි. මේලඟට අඬක පහ (5) දරණ ලියවිල්ල කොළඹ මහලේකම් තුමාගේ "කන්තෝරු" වෙන් එවනු ලැබුවේය. එඬග ලන්න ආණ්ඩුව විසින් මෙම උසස් ධානන්තරය පිළිබඳ දෙනලද මහාරාණියගේ ශ්‍රී හස්තයෙන් අත්සන් කළ රාජකීය මුද්දරය දරණ අක්ෂරයද, අඬක දෙක (2) දරණ "ගාර්ටර්" තුමාගේ ලියවිල්ලේ පිටපතද, ගරුතර ලඬකාණ්ඩුකාර උතුමානන්වහන්සේවෙත එවන ලදින් එම උතුම් ලියවිලි සමඟ අඬක සය (6) දරණ ලියමන ද සොසිසා ආයතනය වෙත ගරුතර ආණ්ඩුකාර උතුමානන් වහන්සේ විසින්ම එවනු ලැබුවේය.

———:o:———

ආණ්ඩා නාම අක්ෂරය.

සිංහල පිටපත.



මහාරාණියගේ අත්සන.

මහා බ්‍රිතාන්‍යය සහ අයර්ලන්තයත් ඇතුළු එක්සත් රාජධානියෙහි ශ්‍රද්ධාරක්ෂක වික්ටෝරියා වන අප විසින් දේවෝත්තමයානන්ගේ සරණින් ඇරුල් මාෂල් නාමෝපලක්ෂිතවූද, අපේ එඬගලන්නයේ උරුමක්කාර මාෂල් අභිධාන, අපේ ඉතා ශ්‍රේෂ්ඨ "ගාර්ටර්" පඬිකතියේ "නෙට්" කෙණෙක්වූද, අපේ අති විශ්වාසික, අති දයාබර

යොහොවුරුවූ නෝර්මෝක්හි හෙන්රි ආදිපාදයානන්ට ආචාර කිරීමෙන්, ශ්‍රී ලඞ්කා ඒපයෙහි සාමදූන බලය දරමින් සිට කථාශෙෂභාවොපගතවූ චාලිස් හැන්රි ද සොසිසා (ධම්ඝුණවඩන විපුලජයසූරිය කරුණාරත්නා දිඝානායක) මහතාගේ වැදඹුවූ අපේ විශ්වාසික පෙම්බර කැතරින් ද සොසිසාට යට කියන ලද ඇගේ සැමි පුරුෂයා විසින් කරණලද වපිනා වැඩද, උතුම් ත්‍යාගි වනතකම සහ ගුණාඩ්හයන්ද, යනාදිය පිළිගැණීමෙන් සලකණු සඳහා අපේ රාජකීය ආඩාරදීමේ ලකුණක් වශයෙන් අපේ විශෙෂ කරුණාධාරයෙන් යටකී කැතරින් ද සොසිසාට යටකී ඇගේ සැමිපුරුෂයා වන චාලිස් හැන්රි ද සොසිසා මහතාට අප විසින්ම හෝ අකන කඩදසියකින් හෝ අපේ රාජධානියේ "නෛව් බැචිලර්" නම් ගෞරවාන්විත නාමය දුන් කලෙක්හි මෙන්ම එම ගෞරවාන්විත නාමයට අයිති සියලුම අයිතිවාසිකම් සම්පූර්ණයෙන් භුක්තිවිඳීමට සම්පූර්ණ බලය දෙවාවදුළ බව මෙයින් සකල ජනයා විසින් දතයුතුයි.

මේ කාරණා ගැන තත්වූ පරිද්දෙන් දන්නා නෝර්මෝක්හි හෙන්රි ආදිපාදයානන්වූ ඔබවහන්සේ මේ අපේ නියමය සැලයිමෙන් පැවැත්ම ගැණත් අපේ වංශ ලක්ෂණ විද්‍යාලයේ මූලාදූනින් සහ අනික් සියලුදෙනාත් විසින් යොග්‍ය ප්‍රසාවන්හිදී ගරුකිරීම සඳහා එම බව වංශ ලක්ෂණ විද්‍යාලයේ ලියා තැන්පත්කර තැබීම ගැණත් සලකා ක්‍රියාකරණු දැයිම අපේ බලවත් කැමැත්තවේ.

අපේ රාජ්‍යානුශාසනයේ පණස් පස්වෙනි සංවත්සරයවූ එක්දහස් අටසිය අනූදෙකේ ජනවාරි මස විසි දෙවෙනි (1892. ජ. ම. 22.) දින "සැන්ට් ජේම්ස්" හී අපේ රාජමන්දිරයේදී දෙවාවදුරණලදී.

මහාරාජිනීන්වහන්සේගේ ආඥාවපිට,

(අත්සන්කෙළේ) හැන්රි මැනිවිස්.

එඩගලනතයේ "ඇරල් මාෂල්" තුමාගේ ආඥා පත්‍රයකට එකඟව ලන්ඩන්හි වංශලක්ෂණ විද්‍යාලයේ ලියා තැන්පත් කරණලදි.

(අත්සන්කෙළේ) විලියම් එච්. වැල්ඩන්,
චීන්ඩිසර් හැරල්ඩ් රෙජිස්ත්‍රාර් වම්හ.

කැතරීන් ද සොසියා නෝනාමහත්මයාට "නෙට් බැච්ලර්" තුමෙකුගේ වැන්දඹුවක ලෙස ගෞරවාන්විත නාමයදීමේ අකුනය.

—:o:—

ද සොසියා ආශ්‍රය.

ජූසේ ද ඔල්වා මහතාගේ අවා ජීවිතය හේතුකොට ගෙණ දරු දෙදෙනෙක් නිපන. මෙයින් පළමුවෙනි පිරිමි දරුවා උපන් දවස් ගණනකින් මියගියේය. දෙවෙනි දරුවාවූ **කැතරිනා ද ඔල්වා** මහත්මිය, පරෝපකාර ශ්‍රීමත් **චාර්ලස් හැග්ඩ් ද සොසිසා** මහත්තුරුයාට විවාහකර දුන්නේය. **ජූසේ ද ඔල්වා** ධනවත් මහතාගේ මහත් වයතු රාශියට මේ එකම දියනිය හිමිකාරිවිය. **ජූසේ ද ඔල්වා** මැනිවරයා රෝමාඥ කතෝලික දෘෂ්ටිය තදලෙස විශ්වාස කළ **"ශුඛවූ රෝම සභාවේ වවිනා ධර්මාභිසමයෙක්ව"** සිරි බැවින් එම සමයාභිවෘධිය සඳහා බොහෝ ධන විසුරවූ වේය, අනේක විට අනන්ත දුක්පතුන්ගේ විපත්වලට පිළිසරණවීමෙන් ධන, කය, ඥන වෙහෙසා ක්‍රියාකර දුක්පතුන් සතුටු කෙළේය. සඳුනේ සිසිල සඳුන නොහැර සඳුනහා එකාබඩව සිටින්නාක්මෙන්, මෙම කරුණාබර මහත්මයා දුක්පතුන් අත්නොහැර ඔවුන්හා ඇලුම්ව සිටි යේය. ලතෙත්වන් සත්පුරුෂයා සත්ගුණ පාමින්, වත් බත් බුලතින් දුන් මත් සැනපෙව් ප්‍රසාදා බොහෝය.

ඉක්බිති තම ලබඩියට මනා සිතැත්තේ; කොටගේනේ ශුඛවූ ලුසියා ආසන දෙවමඳිරය ගොඩනැඟීමේ මුදලට වරක් රුපියල් හාරදහක්ද (රු. 4000.) වරක් රුපියල් හය දහක් (6,000.) දිමෙන්ද, මොරවුවේ ශුඛවූ සෙබස්තියන් මුනිඳුන්ගේ දෙවස්ථානය ස්ථාපිතකිරීම සඳහා රුපියල්

හතළිස් දහක් (රු. 40,000.) පමණ මුදලක් දීමෙන්ද, මෙම දෙවස්ථානයටම තවත් විටින් විට දුන් මුදල් හැර මේ මහත්මයාගේ අභාවයෙන් පසු හතළිස් අවිරුද්දක් ගතවනතුරු අවිරුද්දට රුපියල් එකසිය විසිපහ බැගින් (රු. 125.) ගෙවීමටද, එසේම මොරටුවේ කතෝලික පාඨ ශාලාවලට විටින් විට දීපු මුදල් හැර මේ මහත්මයාගෙන් පසු එම පාඨශාලා හොඳ පැවැත්මකින් තිබේ නම්, විසි අවිරුද්දක් ගතවනතුරු අවිරුද්දකට රුපියල් දෙසිය පණහ බැගින් දීමට නියමකිරීමෙන්ද, විපුලතර ආධාර කෙළේය. තවද, පාලකුඩාවේ "සාන්ත ආනා" දෙව මඳිරයට රුපියල් දහක්ද (රු. 1,000.) ආත්ම ගැලවීම සඳහා පවත්වන පූජා පිණිස කතෝලික "බිශොප්" තුමට රුපියල් දහක් (රු. 1,000.) දීමටද, කොටගේනේ මඩවේ පාශලට රුපියල් දහක් (රු. 1,000.) සහ යාචකයින් සඳහා රුපියල් දෙදහක් (රු. 2,000.) ද දීමට අන්තිම කැමති පත්‍රයෙන් මේ මහත්මයා නියමකර තැබුවේය. මේ නියමය ලෙස මෙකී දීමනා නිසි ප්‍රකාර දුන්නාත් හැර අවිරුදුපතා දීමට නියමකළ දීමනා කඩ නොකොට අදවන තුරුත් **ද සොසියා පවිලෙන්** ඉටුකරණබැවි ඇසිම යහපතට කැමති සියලුදෙන ප්‍රියකරවන කාරණයකි. සිහමනෙන් ජීවත්වීමට ලජ්ජාවෙන් පෙළුන නම්බුකාර අසරණවූ ජන යාට ඉතා සැලකිල්ලෙන් මහොපකාර කෙළේය. අසරණ තරුණියන් දිග දිම සඳහා එකී දුක් පත් පවුල්වලට මේ පින්වතා විටින්විට දිතිබෙන මහත් ධනය සියගණන් නොව දහස්ගණන් බව වැටහේ. නිවෙස් නැත්තවුන්ට නිවෙස් ගොඩනංවා දීමෙන්ද, වතු කුඹුරු දීමෙන්ද, බොහෝ උපකාර කෙළේය. රොගාතුරයන්ට බෙහෙත් වලින් සහ ධනයෙන්ද උපකාරකොට ජීවිත දුනය කළ වාර බොහෝය. **දුගීන්ගේ පියා** යන අනවද්‍ය නාමයක්ද මේ මහතා ගැණ දන්නවුන් විසින් තබා තිබුනේය. මේ ඇර ලව්කාවේ නොයෙක් පලාත්වල දේවස්ථාන තැනවීම ටද, එකී දේවස්ථානවල නඩත්තුව සඳහාද මහත් ධන දුන් වාර අනන්තය, ශාස්ත්‍රශාලා අනත්දරු නිවෙස් නඩත්තුවටද,

එකී නිවෙස් තැනවීමට සහ ප්‍රකෘතිමත්කිරීමටද, රුපියල් දහස්ගණන් විවින්විට දී තිබේ. මළවුන් සඳහා සහ ලොකයාට උවමනා ප්‍රයෝජනවත් යහපත් වැඩ ගැණත් රුපියල් දහස් ගණන් දී තිබෙන බව මනාව ඔප්පුවේ.

මේ මහතා බොහෝ පුණ්‍ය කර්මයන්හි නියුක්තාව සිටි බව එපමණ ප්‍රසිද්ධ නුනේ එකී පුණ්‍ය කර්ම රහසේ පැවැත්ම ගැණ ඒ මහතා ආශාවෙන් සිටි බැවින. **ජූසේ ද ඔල්වා** මහතා අශීස් රොගයෙන් පෙළෙන්නෙක්ව සිටියේය. මේ වේදනාව නිසා නිතර මුහුනේ රෞද්‍ර ලක්ෂණයක් ඇතුව හිටියේය. නෙත්‍ර සුගමයද, රළුඤාවක්ව විනිවිද යන අන් දමේ දෘෂ්ටි පතාකින්ද, සුක්ෂ්ම කෙණෙකි, කටහඬද, හිඟුම් දෙන සුභාවක්ව පැවතුනේය. නමුත් කථාකරණ කල අමිහිරි තුවූයේය. මෙකී ගති කරණකොටගෙණ ඇතම්හු මේ මහතා ක්‍රෑර ගති ඇත්තෙක් ලෙස සිතුවෝය. මේ මහතා ආශ්‍රය කළ ගුණවතුන්ට හැමදුමත් නැතිගියේ කරුණාවන්ත මේ මහතා කපටි ප්‍රයොගකාරයින් නැමති සපියින්ට මයුරයෙක් මෙනුත් හුදිජනතාවට මාතෘවකුත් වැනිබවය. මෙසේ ගුහ ලක්ෂණයන්ගෙන් විරාජමාන ධනවත් **ජූසේ ද ඔල්වා** මහතා උභය ලොකයට ප්‍රයොජනවත් වැඩ කරගෙණ එන අතර, වම් එක්දහස් අටසය අසූහතේ (1887) දී චක්ෂු ඉන්ද්‍රියයන්ගේ දෘෂ්ටිය ඌණ භාවයට පෙරළී ගෙණ ආ බැවින් මෙලෝ සියලුම ගණුදෙනු කටයුතු ආදියෙන් විශ්‍රාම ගැණීමට සිතා එකී කෘත්‍යයන් අත්හැර විවේක ගත්තේය. තමන් කළ කී බාහිර ගණුදෙනු වෙළඳුම් ආදියෙන් මේ මහතා විවේකගත් නමුත්, පුරුදු කරගෙණ ආ දැන ධර්මාදි ශුචරිත ක්‍රියාවන්ගෙන් විවේක නොගත්තේය. එකී කුශල කර්ම නොකඩව කිරීම නිසා දහස් ගණන් දුක්පත් සේනාව මේ සත්ගුණවත් මහතාට සැබෑ සැප ලැබෙත්වා! යනුවෙන් ඔවුන්ගේ ආත් ඉහලට ඔසවා දිඝායුෂ, ශරීර ශක්තිය සහ සැපද ප්‍රාර්ථනා කලෝය.

ඉක්බිති සැප දුක දෙක පෙරළෙන සුභාව නො නැවැත්විය හැකි බැවින් සුවසේ කලදවස ගෙවාගෙණ ආ මේ කාලය දුකින් බරවීමට හෙතුවිය. තමන්ට ඉතා ප්‍රේමයෙන් උපස්ථාන කළාවූද, තමන් කළ වෙළඳුම්

ආදියේ දියුණුවට මහෝපකාරවූද, තමන් කළ කුශල චරිත වඩවඩා දිපති කළාවූද, තම ප්‍රිය භාර්‍යාව කථාශෙෂ භාවොපගතවීමෙන් දුකට පත්වීමට සිදුවිය. යහපත් පුරුෂයකු විසින් එසේම යහපත් භාර්‍යාවකට මේබඳු ප්‍රසාදවන්හි කලයුතු සියලු යුතුකම් ඌනත්වයක් නොමැතිව කරලීමෙන් නුවණැති ජනයාගෙන් බොහෝ ප්‍රශංසා ලැබුවේය. මේහිදී මනුෂ්‍යත්වයේ අනිසයිර සුභාව මේ මහතාගේ හිතට වඩවඩා කාවැදීමෙන් බොහෝ කුශල චරිත කිරීමට පටන්ගත්තේය. සුරතුරක්, සුරභිධෙනුවක්, සිතුමිණක් පෘථිවිතලයට පහළවූවාක් හා සමානව දුගී මඟී යාචකාදී ධන විරහිත ජනයාට මේ මහතානන්ගෙන් හිතූ හිතූ සම්පත් ලැබීමට හෙතුවිය.

මෙසේ කීර්ති සොඹා ලබමින් කල්යවන අතර අති ගරු **ක්‍රිස්තෝපර් බොන්ජන්** අග රාජගුරු සාමීන් වහන්සේ විසින් මේ මහතාගේ සත්ගුණ දන්වා රෝම පුර "අත්‍ර උත්තම දශතුන්වෙනි **ලෙඔ්** නම් ශුද්ධ පියානන්ට" හසුන්පත් යවනලදින් ශුද්ධවූ මහා **ග්‍රිගරි** පඩිතුමාගේ "නෙව්" ඝානනාතරය ඒ පාප්වහන්සේ විසින් දෙවා වදුලේය. ඒ බව **ජූසේ ද සිල්වා** මහතාට අති ගරු **බොන්ජන්** රාජගුරුතුමා විසින් දන්වනලදී.

———:o:———

ඒ ලිසමන.

" Colombo, Borella, 3rd March, 1888.

My Dear President,

I am most happy to be the bearer to you of a piece of news which a letter received yesterday from the Very Rev. Father C. Augier, the Procurator General of the Oblates in Rome, has brought me, and which, I am sure, will gladden your heart.

His Holiness, Pope Leo XIII. has, on my earnest recommendation, selected you for the high dignity of a Knight of St. Gregory the Great

It will take some little time before the Apostolic Brief, raising you to the Order reaches our hands here, owing to the extraordinary amount of work which presses on all Roman Congregation in this Jubilee season; but the Very Rev. Father Procurator General will do all in his power to hasten the expedition of the Brief and will send it to me without loss of time.

I need not say how proud and truly deligted I feel at my having been the means of obtaining so eminent a distinction for a member of the Sinhalese nation which forms the bulk of my faithful flock; nor need you be told with what feelings of intense joy my hands will place on your brow in your old age this wreath of honour of which the innumerable good deeds of a long life-time have made you so worthy.

I intend to fix a day soon after Easter at your own convenience to invest you most solemnly with the badges of the Order, either in the Metropolitan Church or in your own St. Sebastian's Church in Moratuwa, at your choice. On the same occasion, it is my wish to appoint you honorary President of St. Lucia's, a dignity which was held by the late Mr. James VanLangenberg and to which your large benefactions to the Mother Church of all the Catholic churches in Ceylon so fully entitle you.

With my heartiest congratulations to you for the singular proof of his loving benevolence which the Holy Father has bestowed on you.

I remain, my dear President and old friend, ever most effectionately yours in J. C. & M. I.

† Christophorus O. M. I.,

Archbp. of Colombo."

මෙහි සිංහල පිටපත.

"1888 ක්වූ මාර්තු 3 දින
කොළඹ බොරැල්ලේ දීස.

මාගේ දයාවන්ත ප්‍රියෙන්නි තුමාතනි,

රෝමයේ ඔබ්ලේට් පඬිතනියේ ප්‍රොකියුරේටර් ජනරල් තැනවන අති ගෞරවණීය සී. ඕජියර් පූජාප්‍රසාදි තුමාගෙන් ඊයේ ලැබෙන්ට යෙදුන ලියුමක සඳහන්වූ ආරංචියක් තමුසේ වෙත දන්වා සිටින්ට ඉතා ප්‍රීතිවෙමි—තවද එය තමුසේගේ හෘදය සොම්නස්භාවයට පමුණුව තැසි විශ්වාසකරමි.

මාගේ ජවලිත ඉල්ලීම පිට ශුඛොත්තම දශතුන් වෙනි ලියෝ පාප්වහන්සේ, ශුඛවූ මහ ග්‍රිගෝරි පාප්වහන්සේගේ "නෙට්" නම් උත්තම ඥානාන්තරයට තමුසේව නෝරා ගෙණ තිබේ.

මෙම ප්‍රබ්ලි කාලයේදී සෑම රෝමානු සමාගම්වලටම ඇතිව තිබෙන්නාවූ මහත් වැඩ රාශිය කරණකොටගෙණ තමුසේව යථොක්ත පඬිතනියට පත්කෙරීමේ අපොස්තාලික සනනස් පත්‍රය අපවෙත සේනුවෙන්ට සැලප කලක් ගත වෙනවා ඇත—නුමුත් සනනස් පත්‍රය පිටකෙරීමේ වැඩය අති ගෞ. ප්‍රොකියුරේටර් ජනරල් තැන විසින් පුලුවන් පමණ ඉක්මන්කරණවා සහ එය ලැබුන කඩිනමින් අපවෙත එවනවත් ඇත.

මාගේ විශ්වාස රැලේ මහත් කොඩිසයවූ සිංහළ ජාතියේ අවයවයෙකුට මෙම උතුම් තනතුර ලබාදීමට කැමැත්තූවූ මට ඇතිවන්නාවූ සැබවින්ම මහත්ප්‍රසන්න ප්‍රීතියේ ප්‍රමාණය කියන්ට ඕනෑනැත—තවද තමුසේගේ දිගී ජීවිත කාලයේදී කරතිබෙන නිමක්නැති යහපත් ක්‍රියාවන් කරණකොටගෙණ යොග්‍යව සිටින්නාවූ මෙම ගෞරවාන්විත මල්දම තමුසේගේ වෘඩ වයසේදී තමුසේගේ හිසපිට මාගේ අත්වලින් තබන්ට යෙදුන්නේ කොපමණ ප්‍රීති සොම්නසකින්දැයි තමුසේට දන්වා සිටින්ට ඕනෑනැත.

යථොක්ත පඩිකතියේ ලාංජනවල් තමුසේට පලඳවන මෙහෙය තමුසේට පහසුවෙන අඳුමකට ක්‍රිස්තු උත්ගතයට ඉක්බිති දිනක් නියමකරගන්ට අභිප්‍රාකරම්—තවද එය තමුසේට වඩා සතුටු අඳුමකට නායකාසන දෙවිමැදුරෙදී මහවත් මොරටුවේ ශුඛවු සෙබස්තියන් නමින් පිහිටි තමුසේලාගේම දෙවසථානයේ සිදුකළහැක—ලඩ්සාවේ කතෝලික දෙවසථාන අතුරෙන් මව් සභාවවූ තමුසේගේ ත්‍යාගිවනතකමින් එපමණ ප්‍රයෝජනලත් ශ්‍ර. ලූසියාසන දෙව්මැදුරේ ජේම්ස් වැන්ලැන්ගන්බර්ග් මහතා දරාසිටි ප්‍රසිදෙන්නි තනතුරට සුදුස්සා තමුසේ බැවින් එම ප්‍රසථාවේදී එම තනතුරටත් තමුසේව පත්කෙරීම මගේ ආශාව වේ.

ශුඛොත්තම පියානන් විසින් තම ආදරණීය ප්‍රේමයේ ලකුණක් වශයෙන් තමුසේට දෙවිවදුල උතුම් සාක්ෂිය ගැණ තමුසේ සමග ප්‍රිති සොම්නස් වෙමි.

මේ බවට,
තමුසේගේ පරණ මිත්‍රයෙක්ද
ජේ. ක්‍රි. සහ නි. ම. තුළ
ඉතා සෙනහවනතාවූද
ක්‍රිසෙන්තපර්.
කොළඹ අග රාජගුරුප්‍රසාදි වම්හ.

කොළඹ පොරොත්තු
ශ්‍ර. මහ ග්‍රිගෝරි පඩිකතියේ "නෙවි" වන
පුංසේද සිල්වා මහතා වෙතටයි."

———:o:———

REPLY.

"Colombo, 5th March, 1888

MAY IT PLEASE YOUR GRACE.

Your Grace's most valuable letter which gladdens my heart reached my hands last Saturday, and my heart is so full that I cannot find proper words to thank Your

Grace. All this time I received from your venerable hands all the favours and kindnesses which can be expected, or rather more than I could expect, from Your Grace. And now you have obtained from the Vicar of Christ, the great Pope Leo XIII., for me, the high dignity which is a great honor, not only for me and my people, but also for the Sinhalese nation and generally all the members of the Catholic Community. This consolation which I obtain in my old age is beyond description. The news which I have received when I am laid up with the infirmities of old age, and with a heavy heart, have reduced my sorrows and heaviness of heart. Further, I see not only that Your Grace obtained for me the most distinguished dignity of Knight of St. Gregory the Great, but Your Grace wishes to appoint me honorary President of St. Lucia's the Mother Church of all the churches in Ceylon. As I am to converse with Your Grace personally, I conclude this letter by blessing the name of the Lord and thanking our great Pontiff Leo XIII. And as a grateful member of your flock, thanking with the depth of my heart, Your Grace who was pleased to recommend me, an unworthy member, to a very high dignity of the Holy Catholic Church.

I beg to remain,
Your Grace's most obedient Child in Xt.
J. D. SILVA.

To His Grace,
The most Rev. Chr. Bonjean, O. M. I.
Archbishop of Colombo."

———:o:———

පිළිතුරු.

"1888 ක්වූ මාර්තු 5 දින කොළඹදිය.

වැඳනෙයාවූ ඇබාම්න්වහන්ස,

මගේ හිත සොමනසට පත්කළ නමුන්වහන්සේගේ ඉතා අනගිවූ ලියුම පසුගිය සෙනසුරාදා මට ලැබුනේය— මාගේ හෘදය සෝපමණ පුණ්‍ය නිබේද යනහොත් නමුන්

වහන්සේට සතුතිකිරීමට යොග්‍යවූ වචන මට සොයාගන්ට නොමැත්තේය—මේ කාලය වනතුරුත් තමුන්වහන්සේ ගෙන් බලාපොරොත්තු වියයුතුවාටත් වඩා කරුණාව හා උපකාර ලැබුවෙමි—දැනුදු දශතුන්වෙනි ලියෝනම් උත්තම පාප්වන ක්‍රිසතුසාානි තුමාගෙන් මට සහ මාගේ මිනිසුන්ට පමණක් නොව සිංහල ජාතියටමද මුලු කතෝලික සමුහ යාටමද මහත් ගෞරවයක්වූ උත්තම ධානාන්තරය ලබා දුන්නේය—මාගේ වැඩ වයසේදී ලැබුනාවූ මෙම සැනසිල්ල කියනොහැකි තරම් මහත් වන්නේය—වැඩ වයසේ ව්‍යාධි වලින්ද කණගාටු හිතකින්ද පීඩිතව සිටින විට මේ ලැබුනු ආරංචියෙන් මාගේ දුක් කණගාටු හෘද පීඩිතාවල් හුහක් සහනය වුනේය—නවද ශුඛවූ මහ ශ්‍රීගෝරි තුමාගේ "නෙට්" නම් උතුම් ධානාන්තරය මට ලබාදුන්නා පමණක් නොව ලඞ්කාවේ සියලුම සභාවල මාතෘ සභාවවූ ශ්‍ර. ලුසියාසන දෙව්මැදුරේ ප්‍රිසිදෙන්ති තනතුරට පත් කරන්ටත් සතුටුව සිටින්නෙහිය—තමුන්වහන්සේ දැක කථාකරන්ට සතුටුව සිටින බැවින් ඞාමින්වහන්සේගේ නාමයට සතුති ප්‍රසංශාකර අප උත්තම පියානන්වූ දශතුන් වෙනි ලියෝ පාප්වහන්සේට සතුතිකරමින් මෙම ලියුම අවසානකරමි—නවද තමුන්වහන්සේගේ රුලේ නොවටින අවයවයෙක්වූ මා ශුඛවූ කතෝලික සභාවේ ඔබාහෝ උතුම් තනතුරකට පිළිගන්වන්ට සතුටුවූ සෙසින් මාගේ හෘදභ්‍යානතරයෙන් ඔබවහන්සේටද සතුතිකරමි.

මේ වගට,

ක්‍රිසතු තුමන්තුළ ඔබ
වහන්සේගේ ඉතා
කීකරු දරුවෙක්වූ,
ජේ. ද සිල්වා.

කොළඹ අගරාජගුරුප්‍රසාදිවූ
අති උත්තම ක්‍රි. බොන්ජන්
ඞාමින්වහන්සේ වෙතටයි."

වහි එක්දහස් අසූ අටේ මාර්තු මස තුන්වෙනි සතරවෙනි, පස්වෙනි (මා. ම. 3, 4, 5.) දිනවල මෙබැව් මුළු ලක සතරදිග පැතිරගොස් මේ උත්සව දින කවදා ලැබේද යනු මහජනයා පුළා පුළා සිටියෝය. මෙසේ සතුටින් ඉපිළ සිටින ජනයා අතුරෙන් විශෙෂ ලෙස කතෝලික ජනයාට චන්දන කල්කාලිපතයකු සමී සංහාර සුසන්ඛ භාජනයක වැටුනාක්මෙන් ප්‍රීතියෙන් ප්‍රීතියට පත් වීමට තවත් වැදගත් කරුණක් ප්‍රකටව ගියේය. මේ මහතානන්ගේ යස ගුණ ප්‍රමාණාතික්‍රාන්ත නොවන බව දුනගත් අතිගරු අගරාජ ගුරුතුමා සිල්වා මහතා "නෙට්" ධුරයට පත්කරණ වේලාවේදීම කොටගේනේ ආසන දෙව් මැදුරේ ගෞරවාහී **ප්‍රිසෙනති** මුහුජ්ජු තනතුර දෙවා වදුරණ බව දුනගැණීමය. වහි එක්දහස් අටසිය අසූ අටේ (1888 වේ) මැයි මස මුලදී පාප් වහන්සේ විසින් "නෙට්" ධුරයේ හසත කරදුසිය කොළඹ අතිගරු අග රාජගුරුතුමා වෙත එවනලදින් පුසේ සිල්වා මහතා සහ අතිගරු අග රාජගුරුතුමාත් සම්මුඛව මෙම ගරු ධුරය දීම සඳහා සථානය සහ දින වේලාවත් ගැණ නිශ්චයට පැමිණ වහි එක්දහස් අටසිය අසූඅටේ මැයි මස විසිහතර වෙනි (1888. මැ. ම. 24.) දින පස්වරු හතරට (ප. 4.) කොළඹ කොටගේනේ ශුඛවූ ලුසියා ආසන දේවසථාන යෙහිදී මෙකී ගරු උත්සවය සිදුකිරීමට නියමකරගන්නා ලදී.

මේ බව කතෝලික මහජනයා අතර පැතිර යාමෙන් මෙදින සිල්වා මහතාට විපුලාකාර ගරු සැලකිලි ආදර පෙන්වීම සඳහා කතෝලික ජනයා සූදානම්වූහ. මෙවකට මේ මහතා විසුවේ "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වේ බැවින් එහි මෙම උත්සවය සඳහා ගරු ගම්භීරාකාර කටයුතු සූදානම් කෙළේය. වලව් දෙරවුවේ විශාල බහිවාරයක් ගොඩනඟා එය ඉතා ලක්ෂණාකාරයට සරසා තිබුනේය. වලව්ව සහ වලව් වත්තද කාලයට සහ ප්‍රස්තාවට ඔබින ආකාර මනොරඤ්ජනලෙස සැරසිලිකොට තිබුනේය.

කෑම් බීම් ආදියෙන්ද, වලව්වේ විශාල භොජන ශාලා පූර්ණ විය. භොටහේනේ ශුඛවූ ලුසියා විජිය සහ ඒ අවට සැරසිලි කුතුහල දර්ශනයක් වූයේය. තොට සමීප කතෝලික ජනයා විසින් ශුඛවූ ලුසියා විජියේ සඤ්ඤේ ඉතා අලඞ්කාර තොරණක් බැඳ සරසා තිබුනේය. එහි සිට ශුඛවූ බෙනදික්කු සතර හල ඉදිරිපිට සඤ්ඤ දක්වා වේ දෙපස ලා නෙරළු පත් ආදියෙන්ද, දුටුවන් සතුටුවන ආකාර සරසා තිබුනේය. දෙවමඳිරයේ මහ දොරටුව සමීපයේ හඤ්ඤි සුවලක් නැවති සිටින ආකාර පඹවලින් බැඳ තිබුන හඤ්ඤි රූප දෙකින් ඒ පසම උපලක්ෂිතවිය. ගෞරවනීයවූ **රෝසරි** ගුරු ප්‍රසාදින්වහන්සේගේ විධිවිධානලෙස නායක ආසන දෙව් මැදුර තුළ සැරසිලි චිත්තාකර්ෂණයවන ආකාර පිළියෙළ කොට තිබීම පුදුමවූ දර්ශනයක්විය. දෙවසථානයේ මධ්‍යම කොටස වාඩිවීමට සූදානම්කොට කදිමට ආසන පණවා තිබුනේය. විසිහතරවෙනි ගුරු දින සවස තුණේ සිට කතෝලික ජනයා දෙවමඳිරයට රැස්වෙන්ට පටන් ගත්හ. පෑ යතුරේ හතර තට්ටුවූකල රැස්වූවන්ගෙන් මුලු දේවමඳිරය ඉනිරින. හතර පසුවී විනාඩි විස්සට සිල්වා මහතා සහ සිරිවර ජම්පටාර විජියේදී සම්මුඛවූ කොඩි ගත් ලමෝ රැසවුවක් සහ මහත් සෙනාවත් සමග දෙවමඳිර සමීපයට සමප්‍රාපනවන කල දෙවසථානයේ ගණ්ඩාරය ශබ්දකිරීමට පටන්ගත්තේය. තුරඟ යුවල බැඳින් යෙදූ රථ වාහන සතර පෙරටුකොට රථ රාශියක් පැමිණියේය. පළමුවෙනි අලඞ්කාර රථයේ, සිල්වා මහතා නෝද, දුහිතෘ වන ද සොයිසා මහත්මිය සහ බෑනා වන චාල්ස් හැන්රි ද සොයිසා සාමදුන විනිශ්චයකාර තුමාද, අවශෙෂ රථවලැ බැඳුම් මිත්‍රාදිහුද පැමිණියෝය. සිල්වා මහතා පූජාසනය ඉදිරිපිට සූදානම්කර තිබුන ආසනයේ වාඩිවිය. අවශෙෂ පිරිස ඒලඟ ආසන ගත්හ. දෙවෙනි වර ගණ්ඩාරය ශබ්දකළ ඉක්බිති, අතිගරු අගරාජ ගුරු තුමානන්ද, ගරු **සෙසෙනි** රාජගුරු තුමාද, ගුරුප්‍රසාදින්

සහ සහෝදර ගුරුවරුද, පෙළහර සහිතව දෙවමඳිරයට ඇතුල්වූහ. "වොලන්ටියර්" හමුදුවේ තූයම් ආදියද පැවැත් තූහ. කොළඹ අග රජගුරු පදවියේ සිටුපදෙනකු හැර ගුරුප්‍රසාදින් වහන්සේලා සියල්ලෝද, මහනුවර පදවියේ රාජ ගුරුතුමා සහ ගෞ. **වැන්තුරින්** ගුරුප්‍රසාදින් වහන්සේද, යාපනේ පදවිය වෙතුවෙන් අති ගෞරව නීයවූ **ලෙලෝන්ස්** ගුරුප්‍රසාදින් වහන්සේද පැමිණ සිටි සේය. මේ ඇර, ශුඛවූ බෙනදික්තු ශාසන ශාලාවේ පරික්ෂක තැනද, එහි අධ්‍යක්ෂක තැන ඇතුළුව සහෝදර වරුද, පූජාසනයේ දකුණුපස පුරුදු ආසනයන්හි වාඩි ගත්හ. කොටගේනේ මඩමේ කන්‍යා සත්‍රිවරුද, මොරටුවේ මඩමේ සහ බොරැල්ලේ ආරොග්‍ය ශාලාවහාරේ සිටි කන්‍යාස්ත්‍රීවරුද සිල්වා මහතා වාඩිව සිටි ස්ථානයට උතුරු පසින් වාඩිවුනාහ. මුදලිවරුද, මුහන්දිරම්වරුද, ආරච්චි වරුද, ඔවුනොවුන්ගේ නිසි ආභරණවලින් සැරසි අවුත් පසෙක සිටියෝය. මේසා මහත් සෙන රුස්ව සිටි නමුත් හිස් දෙව්මැදුරක්සේ නිශ්ශබ්දවිය. අගරාජ ගුරු සාමි තෙම නියම ආභරණයෙන් සැරසි සහාකාර ගුරු තුමාමෙන් **චුනවෙල්** විගාරි ජනරාල් උන්වහන්සේ පිරිවරාගෙණ පැමිණි කල, අති ගෞරවනීයවූ **ලොලෝන්ස්** ගුරුප්‍රසාදින් වහන්සේ, තේවාචාරි සහ උප තේවාචාරීන් මෙන් ආසන දෙපස සිටියාහ. **පඤ්ඤානි** රාජගුරු සාමීන්ගේ ආසන දෙපස අති ගෞරවනීය ගුරුවරු වන **පුලිකානි** සහ **පෞෂ** යන උතුමන් සිටියෝය.

"චේති ක්‍රියෙතෝර්" නම් "සත්‍රිතු සාන්තු" ශ්‍රීතිකාව පළමුවෙන්ම ගුරුප්‍රසාදින් වහන්සේලා විසින් ගායනා කරණලදී. එවිට අගරාජ ගුරු සාමි "නෙවි" තනතුරේ පදක්කමට ආශිර්වාද කළ ඉක්බිති "ශුඩොතතම පියතුමා" විසින් එවනලද හසුන කඩදුසිය ගෞරවනීය **ගුලිඇල්මි** ගුරුප්‍රසාදිතුමා ලතින් භාෂාවෙන්ද, ගෞරවනීය **විල්කින්සන්** උන්වහන්සේ ඉංග්‍රීසි භාෂාවෙන්ද, අති ගෞරවනීය **චුනවෙල්** විගාරි ජනරාල් උන්නාන්සේ සිංහල භාෂාවෙන්ද, කියවන ලදුහ.



CHEVALIER'S MEDAL.

චැවලියර්තුමාගේ පදක්කම.

SINHALESE DAILY NEWS PRESS. PETTAH COLOMBO.



LEO PP. XIII.

Dilecte Fili salutem et Apostolicam Benedictionem. Quae ad Nos de eximia pietate tua deque tuis in re catholica gestis retulit Venerabilis Frater Christophorus Ernestus Bonjean Archiepiscopus Columbensis, ita ut bene de ejus Dioecesi meritus dici et haberi queas, Nobis suadent ut splendido te exornemus titulo quo habeas Nostrae erga te propensissimae voluntatis testimonium et ad potiora in dies ad Columbensis Ecclesiae utilitatem peragenda incitamentum. Praecipuo te igitur honore decorare volentes, et a quibusvis excommunicationis, et interdicti aliisque ecclesiasticis sententiis censuris et poenis quovis modo vel quavis de causa latis, si quas forte incurreris, hujus tantum rei gratia absolventes et absolutum fore censentes, Apostolica, auctoritate Nostra harum Litterarum vi te Equitem S. Gregorii Magni classis civilis facimus, instituimus et renuntiamus, atque in amplissimum hujusmodi Equitum coetum numerum referimus. Proinde tibi, dilecte fili, concedimus, ut propriam Equitum istius Ordinis vestem induere, ac proprium item insigne, auream nempe Crucem octangulam rubra superficie imaginem S. Gregorii Magni in medio referentem, quae taenia serica rubra ad extremum oras flavas ad pectus ex communi Equitum more sinistro vestis latere dependeat, gestare libere liciteque possis et valeas. Ne quid vero discriminis tam in veste, quam in Cruce gestanda intercedat, appositum schema tibi tradi iussimus. Datum Romae apud S. Petrum sub Annulo Piscatoris die XX Martii MDCCCLXXXVIII Pontificatus Nostri Anno Decimoquinto.

M. Card. Ledóchowski

LEO XIII PONT. MAX.

WARRANT.—සන්නස.

SINHALESE DAILY NEWS PRESS. PETTAH COLOMBO



Dilecto Filio

Josepho Susa de Silva

E Dioecesi Columbensi

LEO PP XIII.

Dilecte Fili salutem et Apostolicam benedictionem. Quae ad Nos de eximia pietate tua, deque luis e re catholica gestis retulit Venerabilis Frater Christophorus Ernestus Bonjean, Archiepiscopus Columbensis, ita ut, bene de ejus Dioecesi meritus dici et haberi queas, Nobis suadent, ut splendido te exornemus titulo, quo habeas Nostrae erga te propensissimae voluntatis testimonium, et ad potiora in dies ad Colum-

WARRANT.—ඉඩකඩ.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO



bensis Ecclesiae utilitatem peragenda incitamentum. Praecipuo te igitur honore decorare volentes, et a quibusvis excommunicationis, et interdicti, aliisque ecclesiasticis sententiis censuris et poenis, quovis modo, vel gravi de causa latis, si quas forte incurreris, hujus tantum rei gratia absolventes et absolutum fore censentes, Apostolica Auctoritate Nostra harum Litterarum vi te Equitem S. Gregorii Magni classis civilis facimus, instituimus et renuntiamus, atque in ornatissimum hujusmodi Equitum coetum et numerum referimus. Proinde tibi, dilecte fili, concedimus, ut, propriam Equitum istius Ordinis vestem induere, ac proprium item insigne, auream nempe Crucem octangulam

WARRANT.—ඡේදය.

SINHALESE DAILY NEWS PRESS PETTAH COLOMBO

rubra superficie imaginem S^ti Gregorii Magni in medio referentem, quae taenia serica rubra ad utramque oram flava ad pectus ex communi Equitum more sinistro vestis latere defendeat, gestare, libere licitegue possis et valeas. Ne quod vero discrimen tam in veste, quam in Cruce gestandis contingat, appositum schema tibi tradi jussimus.

Datum Romae apud S^tum Petrum sub Annulo Piscatoris die XX Martii MDCCCLXXVIII Pontificatus Nostri anno decimo primo.

M. Card. Ledóchowski

Concordat cum originali
Columbi 23ª Maii 1883
+ Christophorus OMI
Archiepus Columben.

WARRANT.—ඇඳ ඔඩ.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

To our Beloved Son,

Jusey de Silva,

of the Diocese of Colombo;

Leo XIII. Pope.

Beloved son

Health and Apostolic

Benediction

What Our Venerable Brother Christopher Ernest Bonjean Archbishop of Colombo has related to us of your eminent piety, as well as of the deeds in the promotion of the Catholic cause, by which you have earned for yourself the praise of

WARRANT.—අණසන.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

our Apostolical authority, We elect create and declare you a Knight of the Order of St. Gregory the Great of the civil class and we receive you into this most exalted Company of Knights.

For this reason, We grant you, Beloved son, to put on the dress proper, and to wear the proper insignia of the Knights of this Order: viz. a golden octagonal cross, showing in the middle of its red surface the picture of St. Gregory the Great which is suspended by a red silk ribbon with yellow borders on the left side; after the common fashion of Knights. Lest however any difference in wearing the vestment and cross should happen, we have given Orders

WARRANT.—ඇණවුම.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

having well deserved of that Diocese, has prompted us to decorate you with some honourable title as a token of Our favourable disposition towards you, and as an encouragement to you to perform from day to day still more excellent works in behalf of the Church of Colombo.

Wishing therefore to confer on you a special honor, we absolve you for this purpose only and hold you absolved from all sentences whatever of excommunication and interdict, and from all other ecclesiastical pains and censures whatever their form or their cause should you have incurred any, and by virtue of these Letters, of

SINHALESE DAILY NEWS PRESS PETTAH, COLOMBO.

having well deserved of that Diocese, has prompted us to decorate you with some honourable title as a token of Our favourable disposition towards you, and as an encouragement to you to perform from day to day still more excellent works in behalf of the Church of Colombo.

Wishing therefore to confer on you a special honor, we absolve you for this purpose only and hold you absolved from all sentences whatever of excommunication and interdict, and from all other ecclesiastical pains and censures whatever their form or their cause should you have incurred any, and by virtue of these Letters, of

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

that the annexed model be handed over to you.

Given at Rome in St. Peter's under the Fisherman's ring the 20th day of March 1885 and the eleventh year of Our Pontificate.

(L. S.) M. Card. Ledóchowski.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

සිංහල පිටපත.

"තෙලෙස්වෙනි ලෙසෝ පාප්වහන්සේ විසින.

කොළඹ පදවියේ අප සෙනහවන්න පුත්‍රයා වන ජූසේ සිල්වා වෙතවය.

සෙනහවන්න පුත්‍රයෙනි, නුඹට අභිවාදනය හා අපොස්තලික ආශීර්වාදයත් ලැබේවා—අප අති ගෞරවණීය සහෝදරවූ හා කොළඹ අග රාජගුරුප්‍රසාදිවූද **ක්‍රිස්තෝපර් එර්නැස්ට් බොන්ජන්** සංඝාමින්වහන්සේ නුඹගේ උත්තම භක්තිය ගැණත් නුඹ විසින් කතෝලික කාරණා උදෙසා ඉටුකළාවූ ක්‍රියාවන් ගැණත් අපට දන්වා දුන් අන්දමට මේ අග රාජගුරු පදවියට අයිතිවූවන් අතරෙන් නුඹ උත්තමයෙක් කොට ප්‍රශංසා කරණු ලැබීමට හිමිකාර යෙක්වූ බැවින් නුඹ කෙරෙහි අපට ඇති අධික ප්‍රේමයේ සාක්ෂියක් නුඹට ලැබෙන පිණිසත් කොළඹ සභාව වැඩි වැඩියේ දියුණුවීම සඳහා තව වඩා යහපත් කෘත්‍යයන් ඉටුකිරීමට නුඹට ධෛර්‍ය්‍ය දෙන පිණිසත් මාහැඟි උතුම් තනතුරක් නුඹට දෙන්ට අභිමතවුනිමු—එබැවින් විශෙෂ ගෞරවයකින් නුඹව පලඳවන්ට අභිප්‍රායෙන් යම් අන්දම කින්. සහ යම්කාරණාවකින් නුඹ ශුඛවූ සභාවේ දණ්ඩනය වන සභාවේ ධර්ම්ලාභයෙන් හෝ බලයෙන් අහක්කරණු ලැබීමට වරදකාරයෙක් වුනෙහිනම් අපි ඒවාගින් නුඹ මුදවාගෙණ නුඹට ක්ෂමාකර අප අපොස්තලික ආණ්ඩුවේ මේ හසුන බලයෙන් ශුඛවූ මහා ග්‍රිගෝරි පඞ්කතියේ ගිහි කොට්ටාසයෙහි නේවි නම්වූ වංශාධිපතියෙක්ව නුඹ තෝරාගණිමු, පත්කරමු, ප්‍රකාශකරමු, සහ මේ උතුම් වංශාධිපතිවරුන්ගේ පඞ්කතියට නුඹව ඇතුළත් කරමු—එසේහෙයින් සෙනහවන්න පුත්‍රයෙනි, වංශාධිපති වරුන්ගේ පඞ්කතියට අයිතිවූ සහ සුකීය පලඳනාව වන අඳකෝන සඟිනවූද මිඛ්‍යයෙහි රන්වණ් පිට ශුඛවූ මහ ග්‍රිගෝරි සුරූප ඇතිවූද දෙපැත්තේ කහපාටවූ තුනී රන්

පාට පවියකින් බැඳුනාවූද රන් කුරුසිය වංශාධිපති වරුන්ගේ සිරිත ලෙස ලයේ වම්පාඤ්ඤයේ එල්ලා පලදින්ට නුඹට අවසරදෙමු—එහෙත් මේ පලඳනාවෙහි හෝ කුරුසියෙහි කිසිම වෙනසක් නොයෙදෙන සැටියට මේ එක්කම මිට සදෘසව තිබෙන සලකුණ නුඹට ආත්කරදෙන්ට අණකළෙමු.

රෝම නුවර ශුඛවූ පේදුරු මාලිගාවේ මත්ස බන්ධකයාගේ මුදු මුද්‍රය ඇතුව ක්‍රිසතු වෂී 1888 ක්වූ මාර්තු මස 20 වෙනි දින අප පාප් තනතුරේ එකොළොස් වෙනි අවුරුද්දේ දීය.

ම. කර්දිනල් ලෙෆ්ෝ කෙස්කි

තෙළෙස්වෙනි ලෙයෝ පාප්වහන්සේ.”

———:o:———

අපෝස්තලික අසන කඩදාසිය, භාෂා තුණෙන් කියෙව් යලිදු අගරාජ ගුරුතුමා ප්‍රූසේ සිල්වා මහතා දේවාසනය සමීපයට කැඳවා හැඳගෙණ සිටිය “කෝට්” එකේ ලය පස පදක්කම ඔලොම්බා ඉතා වැදගත් ව්‍යකත කථාවක් කෙළේය.

ඥානාලෝක ප්‍රදීප ප්‍රසිඛ පත්‍රයේ කතෘ ධුරයෙහි නියුක්ත තෝමස් අම්බ්‍රෝස් මැන්දිස් මහත්මයා විසින් චැවලියර් ප්‍රූසේ ද සිල්වා තුමා ගැන ප්‍රසිඛකළ පොතේ තිබෙන ආකාර ඒ කථාව එයින් උපුටා ගනිමු. ගේ මෙසේයි:—

“මාගේ ගරුකටයුතු ප්‍රේමනීය මහළු මිත්‍රවූ ප්‍රූසේ ද සිල්වා මහත්මයානනි,

මාගේ යටහත් ඉල්ලීම පිට 13 වෙනි ලියෝ පාප්තුමා විසින් තමුන්නාන්සේ වෙත පවරන්ට නියම කරණලද මේ උතුම් ශුඛවූ ග්‍රිගෝරි පන්තියේ නයිට්

නම්වූ නාමය අද තමුන්නාන්සේ වෙත පටබැඳීමෙන් මාතුල අටගත් ප්‍රීතිය කියා නිමකළ නොහැකිය—කුමක් හෙයින්දයත් පොළවතලේහි ශ්‍රේෂ්ඨ තැනැත්වහන්සේ විසින් දෙවාවදුරණලද එම ධුරය මෙපමණ පැහැදිලිවූ ආකාරයකට එය පිළිඅරන් තිබෙනවා දකින්ට සිදුවූ බැවිනි—තවද මා තුල නම්බුකාර විධියේ ආඩම්බරයක්ද මේ සම්බන්ධව අටගෙණ තිබේ—ඒ මක්නිසාද කීවොත් මෙසේ නම්බුනාම පටබඳිනුලැබූ ජූසේද සිල්වා මහතා මගේ රැලෙන් එක්තෙනෙක්වූ ලොකයා එකහෙලා නම්බු සහ ප්‍රේමකරන්නාවූ මාගේ ප්‍රිය මහළු මිත්‍රයෙක්ව සිටින බැවින්ය—තවද ක්‍රිස්තියානි යහපත්කම සහ නම්බුවය යන අර්ථ දක්වන්නාවූද තමුන්නාන්සේ සම්බන්ධව මේ යටහත් ක්‍රිස්තියානි ජීවිතයේද සභාවට සථිරවූ විශ්වාසයේද, සභාවේ උසස් තැනැත්තන්ට ඇත්තාවූ ආදර යටහත් පහත්කමේද, ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට අයිතිවූ අමාරු තිහකම්වලටපත්වී සිටින්නාවුන්ට සැනසිම දෙන පිණිස සහ සභාව දියුණුකිරීම පිණිසද කරණලද ගනන්කළ නොහැකි යහපත් වැඩවලද විඵාකයක්වූ මේ කුරුසිය තමුන්නාන්සේගේ විශ්වාසවූ ලැපැත්තේ මාගේ අත්වලින්ම තබන්ට සිඩවීමෙන් මාගේ ප්‍රීතිය ඉතාම උසස්විය දුප්පතුන්ගේ පියා සහ සභාව සම්බන්ධ යහපත් වැඩකරන්නා හැටියට තමුන්නාන්සේගේ නාමය ලංකාවේ සෑම තැන්හිම පැතිරීමට හේතුවූ තමුන්නාන්සේ විසින් කරණලද යහපත් වැඩ මම දැන් කියන්ට උත්සාහ නොකරමි—තවද ඒවා කියාකරදීම ඉතාම අමාරුවූ වැඩක් වෙන පරිද්දෙන් තමුන්නාන්සේ ක්‍රියා කරතිබේ—එනම් තමුන්නාන්සේගේ දකුණු අතින් දුන්නාවූදේ වම් අතට දැනගන්ට ලැබුනේ කලාතුරකින්ය—සමහරක් කවදුවත් දැනගන්ට ලැබී නැත—දුප්පතුන්ට දෙනලද සියළු දැන දෙවියන්වහන්සේගේ සැඟවීමයවූ පොතේ මුරකාර දේව දූතයා විසින් සම්පූර්ණයෙන් ලියාතිබෙනවා විනා අපනම්

දන්නේනැත—තවද තමුන්නාන්සේ මේ දූනාදිය දිමේදි එලිදරව්වේය කියා කොපමන භයෙන් සිටියාද කීවොත් හොරෙක් තම අත අනුන්ගේ සාක්කුවකට දැමීමෙන් අසුවේය යන භටගන්න භයට සමානය.

නුමුත් තමුන්නාන්සේගේ වැඩ බුසලෙන් වසන්ට බැරුව ඉතුරුව තිබේ—එනම් තමුන්නාන්සේ විසින් කොළඹ සහ ඉන් පිටත් සාදවාපු හෙවත් සාදන්ට උපකාරකරපු පල්ලියය ඒවායින් එකක්නම් මොරටුවේ සන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ පල්ලියය—තවෙකක් නම් මේ අප දූනට රුස්ව සිටින පල්ලියය—ඒවා දෙවියන් වහන්සේගේ ගෘහය කෙරෙහි තමුන්නාන්සේගේ තිබෙන විශ්වාසයනොමැකි තිබෙනලෙස පිහිටවන්ට පුළුවන්කම් නොවේද? තමුන්නාන්සේගේ නම වෙන්කරන්ට බැරි ලෙස ඒවා සමග සම්බන්ධවී තිබෙනවා නොවේද? ලංකාවේ කතෝලිකවරු මේ නම්බු නාමය ලැබූ පුංචේද සිල්වා මහතා තමන්ගේ මුදල් යහපත් වැඩවලට පාවිච්චි කළ අන්දම ගැන පරම්පරාවෙන් පරම්පරාව ප්‍රසංසා නොකරත්ද.

අප ලංකාවේ දුර්භික්ෂ පැමිණ උණ වසංගතයෙන් ගහනවූ පලාත්ද කොටහේන මොරටුව යන මේ පලාත් වල තිබෙන කන්‍යපංක්ති්වල සිටින දෙමවු පියන් නැති දරුවන්ද කාගේ ආදරයෙන් පවතිනවාද? තවද කන්‍ය පංක්තිවල සිටින්නාවූ ක්‍රිසතුස් වහන්සේට අයිති බාල යන්ටද අප සෙක්ල සහ උසස් පඩිහතියේ උගැන්වීම කරණ ස්ථානවල්ද එහුඹින්ම දූනට පවතින ආගමානුකූල ගෘහයවල් සහ ශාස්ත්‍රානුකූල ගොඩනැගිමද යන මේ සියල්ල (දෙවියන්වහන්සේ හැර) කානිසා පවතිනවාද මේ සියල්ලම පවතින්නේ අප ගරුකටයුතු අළුත් නසිවි නාමයලැබූ පුංචේද සිල්වා මහත්මයාගේ ආධාරය කරණ කොට ගෙණ බව මම නිර්භිතව කියම්—තවද උන්නැහේ ගේ නාමය මේ කතෝලිකාගමේ උත්තමවූ වැඩ

සම්බන්ධව—එනම් මෙ සමාගමට සමාජවූ දෙවියන් වහන්සේගේ වැඩට කැපවුනාවූ දේවගැතියන් ගණනක් සපයාදීමෙන්ද පරලොවදී වාසනාවන්තකම සහ මෙ ලොවදී දියුණුවට හේතුවූ සියල්ල උගන්වනුලැබූ මතු කාලයට ප්‍රයෝජන වන්නාවූ තරුණ පරම පරාවක් නැගුවුවාදීමෙන්ද සම්බන්ධවී තිබෙනවා දැකීමට මෙහි සිටින අපි සියල්ලෝම ප්‍රීතියෙන් සිටිමු.

ඉතින් මගේ ප්‍රේමවන්ත ගරුකටයුතු මිත්‍රය, මුළු ලඞ්කාවේ සිටින්නාවූ සියළුම කතෝලිකාගමේ දේව ගැතියන් තමුන්නාන්සේ වටකර එකාකාර සැලකීමකින් සහ යුතුවනතාකමකින් රැස්වී සිටිනබව තමුන්නාන්සේට පෙනෙනවා ඇත—කොළඹට අයිති දේවගැතිවරු සියළු දෙනාම මෙහි සිටිත්—තමුන්නාන්සේගේ ඉතා ප්‍රේමනීය මිත්‍රයෙක්වන මහනුවර ගරුකටයුතු බිෂොප්තුමාද මෙහි පැමිණ සිටි—උන්නාන්සේගේ පැමිණීමෙන් අද අපේ කෘත්‍යයන්හි වැඩිවුනාවූ ප්‍රීතිය ගැණ උන්නාන්සේට මම මුළු හෘදයෙන්ම සතුතිකරමි—යාපනේ බිෂොප්තුමාට මෙහි පැමිණීමට නුපුළුවන් තරමට වැදගත් බරපතල වැඩක් නිසා උන්නාන්සේ වෙනුවෙන් උත්තම දේව ගැතියෙක් මෙහි එවනු ලබාසිටි තමුන්නාන්සේ වටකර මෙහි අප සියළුදෙනාම රැස්ව සිටින්නේ තමුන්නාන්සේ උසස්කරනු ලැබුවාට අප ප්‍රීතිය දක්වන්නත් තමුන්නාන්සේට සතුතිකරන්ට සහ ආශීර්වාද කරන්නත් තමුන්නාන්සේ වෙනුවට යාවඤ්ඤුවෙන්ටත්ය—දැන් අප අතරේ සිටින සියලු සිංහල ජනයාම සන්ත පීතර් මුනින්ද්‍රයාට ඔවුන් ලන්වී සිටීමේ සාක්ෂි දකින්ට ප්‍රීතිව මෙහි සිටිසි—ඒ සාක්ෂිවලින් එකක් ඔවුන්ගේ ජාතියේ ආඩම්බරයවූ සෑම දෙනා එකහෙලා ප්‍රේමකරන්නාවූ කෙනෙකුගෙන් අද ප්‍රකාශවෙයි.

තවද මේ ලඬකාවේ සිටින බර්ගර් හෝ දෙමළ ජාතිකයෝද මේ ප්‍රීතිය ගැණ නිස්චලව නොසිට එහි පංගුකාරයෝ වෙති—එහුඤෙන්ම ලංකාවේ සිටින්නාවූ දෙලක්ෂ හතලිස් දහක් (2,40000) සියළුම කතෝලිකා ගම්කාරයෝ එතහඹින් අප උත්තම නාමය ලැබූ ප්‍රසේද සිල්වා මහතාට "දෙවියන් වහන්සේ ආශිර්වාද කරාවා" කියා මොරගසති.

තවද ඒ මහතා තමන්ට ලැබුනාවූ ගරුවූ නාම ඉසිලීමටද ලංකාවේ කතෝලික සභාවේ යහපත් වැඩ කිරීමටද දුප්පතුන්ගේ පියාවී සිටීමට සහ සෑම කතෝලිකාගම්කාරයන්ට ආදර්ශයක් පිණිසද දිඝායුස ලැබේවා"—යනුයි.

"පදක්කම ලැපැත්තේ පැළඳවූ පසු කාලතුවක්කු වෙඩි කීපයක්ද පත්තුකළෝය—ඉක්බිති මෙහි පහත දක්වන ප්‍රකාශ පත්‍රය ඉංග්‍රිසි සිංහල භාෂාවලින් කියවනලදී."

CHRISTOPHER ERNEST BONJEAN

O.M.I.

By the Grace of

GOD

and of the Holy Apostolic See

ARCHBISHOP OF COLOMBO

Domestic Prelate

OF HIS HOLINESS

Assistant to the Pontifical Throne,

To all who the present shall See
Greeting in the Lord.

Whereas after the death of
Chevalier the Hon'ble James Van

WARRANT.—අණපත්‍රය.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

Langenberg, the post of President of our Metropolitan Church of St Lucia has remained vacant.

And whereas Mr Juseyp de Silva whom the Holy Father has on the 20th of March 1888 raised to the dignity of Chevalier of St Gregory the Great, has by his munificent donation of Rs 10,000 towards the building of the said Metropolitan Church of St Lucia caused the Sacred edifice to be brought to that relative state of completion which has permitted its being thrown open for Divine Worship, to the great advantage and contentment of the whole catholic community; and wishing besides

WARRANT —ඩිප්ලෝමය.

SINHALESE DAILY NEWS PRESS FETTAH COLOMBO

to recognize in the most marked manner, the many and important services rendered and the constant assistance given to the Catholic Mission at large by that gentleman.

We have been pleased to appoint him and by these We do appoint him to be President of the said Metropolitan Church of St. Lucia conferring upon him all the privileges and entrusting him with all the duties annexed to that office.

Given at Colombo under our hand and seal on the 23d day of May 1888

+ Christopher O.M.J.
Archbp of Colombo

By His Grace's Command

C. Collin O.M.I.
Secretary

WARRANT —අණපත්‍ර

SINHALESE DAILY NEWS PRESS. PETTAH, COLOMBO.

Published in St Lucia's Metropolitan
Church on the 24th May 1883
accepted

C. Chounavel O.M.I.
Miss. Apost. Vicar General

WARRANT.—අණපත්‍ර.

SINHALESE DAILY NEWS PRESS. PETTAH COLOMBO.

සිංහල පිටපත.

"දෙවියන්වහන්සේගේ සහ අපෝස්තලික ශුඛාසනයේද
අනුග්‍රහ වරප්‍රසාදයෙන් කොලඹ අගරාජ ගුරු
ප්‍රසාදිවූ ශුඛොත්තම පාප්වහන්සේගේ ග්‍රහසථ
අධිපතිවූද උන්වහන්සේගේ සිංහාසනයේ
සහකාරකවූද නෙත්‍රේෂ මරිය
තුමන්ගේ පඛ්‍යනියෙහි
පැ වි දි වූ
ක්‍රිසෙන්තස් එර්නැස්ට් බොන්ජන්
ධර්මාචාරිවන අප විසින.

මේ හසුන කියවන සමස්තයින්ට සතුටු අභිවාදනය කරමු.

ගරුතර නෛවි නම්වූ වංශාධිපති ජේම්ස් වැන් ලැන්ගැන්බර්ග් තුමා අපත්වූ බැවින් සන්ත ලුසියා මුනිශ්වරීගේ නායකාසන දෙව්මැදුරේ ප්‍රිසෙන්තිකමට කෙනෙක් පත්කරන්ට ඕනෑවිය.

එසේ හෙයින් ජූසේද සිල්වා මහත්මයා මේ ක්‍රිසතු වර්ෂ 1888 ක්වූ මාර්තු මස 20 වෙනි දින ශුඛොත්තම පාප්වහන්සේ විසින් ශුඛවූ මහා ග්‍රිගෝරි පඛ්‍යනියෙහි නෛවි නම්වූ වංශාධිපති තනතුරට පත්කරණු ලැබූ බැවින්ද මෙම ප්‍රධාන ආසන දෙව්මැදුර පමණක් දුරට සම්පූර්ණකිරීමට ඒතුමා මහත් ත්‍යාගිවන්තකමින් රුපියල් දශදහක් දුන්තැන කතෝලික සභාවට ඉතා ප්‍රයෝජනය හා සන්තෝෂයක් ලැබෙන ලෙස එහි දෙව මෙහෙය පවත්වන්ට හැකිවුන බැවින්ද ඒතුමා කතෝලික මිසමට කළ වැදගත් අනේක උපකාරවල්ද නිරතුරු පිහිටාදුර වල්ද උදෙසා විශෙෂ ප්‍රකාර සැලකීමක් වශයෙන් මේ සන්ත ලුසියා නායකාසන දෙව්මැදුරයේ ප්‍රිසෙන්ති තනතුරට ඒතුමා පත්කරන්ට අප අභිමතවිය—මෙම තනතුර සම්බන්ධ බලයද කටයුතුවල්ද ඒතුමාට භාරදෙමු.

අප හස්තයෙන් අත්සන්කර මුද්‍රය තබා ක්‍රිස්තු වර්ෂ 1888 ක්වූ මැයි මස 24 වෙනි දිනදී දෙවා වදාරණලදී.

අගරාජගුරු සාමීන්ගේ අවසරය ලෙස,

සී. කොලිං.
සක්‍රතාරි.

24 වෙනි දින ශුබවූ ලුසියා නායක ආසන දෙව් මැදුරේදී ප්‍රසිඛකළ බවට,

සී. චුනවෙල්,
විගාරිජනරල්."

———:o:———

"මෙසින් පසු ටී. ඒ. මැන්දිස් මහත්මයා විසින් චැවිලියර් සිල්වා මහත්මයා වෙනුවට සතුති ලියවිල්ලක් කියවන ලදී—එහි අදහසනම් ආගම වෙනුවට තමන් විසින් කරණලද සියල්ල තමන්ගේ සුකුසම් බවත් මින් මත්තටත් ඒ සුකුසම් දෙවාශිර්වාද පෙරදැරි කොට කරන්ට උත්සාහ දරණ බවත් තැහ්ග ලබා ගුන්නාට අග්‍ර බිස්පු උන්නාන්සේට සතුති කරණ බවත් පඤ්ඤානි බිස්පු උන්නාන්සේ ප්‍රධාන කොට පාදිළි උන්නාන්සේලා වද එහි පැමිණි අනිකුදු මහත්තැන්වදා සතුති කරණ බවත් කීවේය."

"මෙසින් පසු සතුති ගායනාකර බිෂොප් පඤ්ඤානි උන්නාන්සේ විසින් ආශිර්වාද මෙහෙය පවත්වනලදී."

"ඉක්බිති ජෝන් තෙලිවිස්ද සිල්වා මහත්මයා විසින් මොරටුවාසි කතෝලිකවරුන් වෙනුවෙන් අග්‍ර බිස්පුතුමා හමුවෙහි සතුති පත්‍රයක් කියවන ලද්දේය—මෙහි අග්‍ර බිස්පුතුමා විසින් ආගමේ ප්‍රයෝජනය පිණිස කරණලද වැඩ ගැණද වැන්ලංගංබර්ග් උන්නැහේට නෙට් තනතුර ලබාදුන් බවද දැනට චිවලියර් පුසේ සිල්වා මහත්මයාට එම නෙට් තනතුර ලබාදුන් බවද එසින් සෑමදෙනාගේම සිත්වලට ආහමේ වැඩ ගැණ උත්සාහ දැරීමට ධෛර්‍ය්‍ය ගෙණදුන් බවද කියා තිබේ."

"අග්‍ර බිස්පුතුමා ඊට ප්‍රත්‍යුත්තර දුන්නාට පසු ප්‍රති. ග්‍රහණයක් පවත්වන ලද්දේය—ඉන්පසු ජයඝොෂා පවත්වා රාස්ත්‍රීම හමාරකරණ ලද්දේය."

"මෙහෙයේ ඉහතකී කොවිඨාසය නිමවූ ඉක්බිති සත්ප්‍රසාද ආශිර්වාදය දෙවාවදාරණ පිණිස පඤ්ඤති රාජ ගුරුප්‍රසාදින්වහන්සේ නියම ආභරණවලින් සැරසී පූජා සනය ඉදිරිපිටට විත් පළමුවෙන් "තේදේවුම්" නම් සතුති සංහිතය ගායනාකර ඊට පසු සත්ප්‍රසාද ආශිර්වාද දෙවාවදාලේය—මේ ප්‍රඝතාවේදී පිටකොටුවේ සහ කොට හේනේ කන්තාරු කණ්ඩායම් එකසත්ව ඉතා සුම්ඛිරී අන්දමට ඒ කෘත්‍යයද ඉඤ්ඣකලෝය—සත්ප්‍රසාද ආශිර්වාදයට පසු ජූසේද සිල්වා මහතාට මේ "නෙට්" තානතුර ලබාදුන් කරුණ ගැණ සතුතිකරණලද සතුති පත්‍රයක් මොරටු මිසම වෙතුවෙන් ජෝන් කෙලිවිස්ද සිල්වා මහාත්මයා අග රාජගුරුප්‍රසාදින්වහන්සේට කියා ඔප්පු කලේය—අගරාජගුරු සාමීන් මෙම පදවියට විත් තවම අවුරුදු පහ සම්පූණී නැති නමුත් එම කාලයේදී උන්නාන්සේ ආගම අනුකූලවූ වැඩ පමණක් නොව මෙරට වැසියාගේ සුශිල ධර්මයන් ආදි නොයෙක් දේ වර්ධනාවීම සඳහා ගන්නාවූ උතසාහයන් ගැණත් එහි සඳහන්ව තිබුනේය—තවද ජූසේද සිල්වා මහත්මයාට නෙට් තනතුරදීම ගැණ ඔවුන් ශුඛොත්තම පියතුමන්ට සතුති වන්නාව සිටින බව උන්නාන්සේට දන්වනමේන් ඉල්ලන අතරම ශුඛාසනයට වඩ වඩා ලැදිව සිටින්ට වරප්‍රසාද ලැබෙනමේන් නිතර ඔවුන් දෙවියන්වහන්සේට යාචඤ වෙන බවත් සඳහන්කරමින් ශුඛොත්තම පියතුමන්ටද, අග රාජගුරුසාමීන්ට සහ මහශ්‍රීගෝරිපඬිතියේ අලුත් නෙට් තුමාටත් දීඝ ආයුස සහ චාසනාවනතකමත් ලැබේවයි ප්‍රාර්ථනාකර ඉහතකී සතුති පත්‍රය නිමකර තිබුනේය—ඊට උත්තර වසයෙන් අග රාජගුරුප්‍රසාදින් වහන්සේ කථාකොට ජූසේද සිල්වා මහතාට මේ තානතුර ලැබීම ගැණ සාමාන්‍ය සතුටක් දකින්ට උන්නාන්සේ

බලාපොරොත්තුවුන බවත් උන්නාන්සේ බලාපොරොත්තු වුනාවත් වඩා විශාල ලෙස එය ඉඟවුන බව දැකීම උන්නාන්සේට මහත් ප්‍රීතියක් බවත් කීය—තවද ශුඛාසනයට වඩ වඩා ලැදිව සිටින්ට ඒ සමූහය වී තිබෙන පොරොන්දුව සුර රාජ්‍යයේ දෙවියන්වහන්සේගේ පොතේ සටහන්වේවයිකියා අපි පමණක්නොව සත්‍යවූ ආගමෙන් පිටව සිටින සියලුදෙනාම මුලු ලඞ්කාවම එකම එඞ්ඩරා යටතේ තිබෙන එකම ගාලට පැමිණ ශුඛාසනයට යටහත් වේවයි ප්‍රාර්ථනාකළේය--අගරාජගුරු සඞ්ඝරාජින්ගේ ඒ කථාව නිමවුන ඉක්බිති පළමුවෙන් අලුත් නෛව් තුමාද, ඒ ලඟට ගුරුප්‍රසාදින්වහන්සේලාද, ඊට පසු පඤ්ඤානි රාජගුරුඝඞ්ඝරාජින් සහ අගරාජගුරුඝඞ්ඝරාජින්ද පෙළහරින් ලැගුම්ගෙට ගමන්කර නෛව් තුමා සහ අග රාජගුරු, රාජගුරු, ගුරුප්‍රසාදින්වහන්සේලා සඞ්ඝ වචන කථාකොට උන්නාන්සේලා සියලු දෙනාම නෛව් තුමා සමඟ ප්‍රීති වෙන බව ප්‍රකාශකලාට පසු නැවත බම්බලපිටියට නික්මයන්ට සූදානම්වුනේය—ඒ අතරේදී නෛව් තැනට කියා ඔප්පුකරන්ට සතුති පත්‍ර කීපයක් ගෙණත් තිබුන නුමුත් ඒවා කියවන්ට කාලය නොලැබුන බැවින් ඒ සියල්ල අලුත් නෛව් තුමා අතට දුන්නේය.

සවස 5·45 ට පමණ "නෛව්" තුමා සහ පිරිසත් කොටගේනෙන් පිටත්ව "ඇල්ෆ්‍රේඞ් හවුස්" නම් සොයිසා මහත්මයාගේ වලව්වට ගමන්කළේය—පැයකින් පමණ එහි සේන්දුවී බැලුවිට ඒ විශාලවූ වලව්වත් සෙනඟගෙන් පිරී තිබෙනවා දුටිමු—එම වලව්වද ඉතා අලඞ්කාර අන්දමට ආලෝකකරලත් තිබුනි—එහිදී කීප දෙනෙක් විසින් සතුති පත්‍ර නෛව් තුමාට ඔප්පුකළේය—රුස්ව සිටිය සෙනඟ එහිදී කරණලද සංග්‍රහ බුහුතිවිඳ බොහොමයක් බම්බලපිටියෙන් රාත්‍රියේ 8·8 ට පිටත්වුන දුම්රියේ නැඟී ගිය නුමුත් වැඩිදෙනෙක් එහි තියන්ට යෙදුන ගිනිකෙළි ආදිය බැලීමට නතුරව බොහෝ රෑවී තම නිවස්වලට නික්ම ගියෝය—ලඞ්කාව පවතිනතුරු තිබෙන්ට ලඞ්කා කථානායකරයේ සටහන්කර තබන්ට යෙදෙන දවසක්වූ වෂී 1888 ක්වූ මැයි මස 24 වෙනි දින ඉහතකී අන්දමට පසුවී ගියේය."

"නෙට්" තුමාගේ මොරටු ගමන.

මොරටු ග්‍රාමවාසි බොහෝ දෙනකුගේ ඉල්ලීමපිට "නෙට්" තුමා මොරටුවට යහපත්වීම සඳහා වෂී එක්දහස් අටසිය අසූඅවේ මැයි මස විසිනවවෙනි (1888. මැ. ම. 29.) කුජදින නියමකරගත්හ. මෙසේ දින නියමකරගත් බව දැනගත් මොරටු වාසීන් පමණක් නොව, වැල්ලවත්ත, දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, ආදි ගම්වාසිහු "නෙට්" තුමාට මහත්සේ ගෞරව කිරීම පිණිස කටයුතු සූදානම් කළෝය.

විසිනවවෙනි අහහරුවාදා සවස දෙක පසුවී විනාඩි හතළිස් පහවූකල, පිළියෙළකර තිබුනු මාහැඟි තුරඟුන් සතරදෙනකු යොදනලද අලඞ්කාර රථයට "නෙට්" තුමාද, එතුමාගේ බෑණා වන ද සොයිසා තුමාද දියනියන්වන ද සොයිසා නෝනා මහත්මයාද ඇරූඪවූහ. තුරඟුන් දෙදෙන බැඟින් යොදූ පිළියෙළකර තිබුන රථවලට සහ අන්‍ය රථවලට බන්ධුමිත්‍රාදීන් නැඟී බම්බල පිටියේ "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වේ සිට මොරටුව බලා මේ පිරිස පිටත්වූහ.

මෙකී රථ පඞ්කතිය වැල්ලෙවත්ත වාසි ජනයා විසින් කරතිබුන අලඞ්කාර සැරසිලි මඩ්‍යයට වන්කල, එහි රැස්ව සිටි සෙනඟ මල් පිනිදිය ආදියෙන් "නෙට්" තුමාට ගෞරව සම්භාවනා කිරීමට පටන් ගත්හ. ඒ සමූහයාට "නෙට්" තුමා සතුති කොට එයින් නික්මුන. දෙහිවල දෙවසථානයට අයිති සමූහයා දෙහිවල රැස්වසිට එහි ඉහා අගයට සරසනලද සථානයට "නෙට්" තුමා සහ පිරිවර පැමිණිකල, මේ පිරිස නොයෙක් තූර්‍යාදිය පවත්වමින් "නෙට්" තුමට මලින් සහ සුවඳ පැනින් ගෞරව කළෝය. "නෙට්" තුමා මේ කරුණාවනාසින් වදා, සතුති කොට එතැනින් නික්මුන. ගල්කිස්ස වාසි ජනයා එහි ඔවුන් සරසාපු සථානයට රථපඞ්කතිය

පැමිණි කල, කොඩි අත්ගත් ලමෝ ඒ කොඩි සල සලා ගෞරව කිරීමටද, වැඩිමහල් ජනයා මල් පිනිදිය ඉසි මෙන්ද, අපමණ ගෞරව කළෝය. මෙහිදී සන්ති සමූහයක් රබන් ගැසීමෙන් "නෙව්" තුමා සහ පිරිස සතුටු කළාහ. "නෙව්" තුමා මෙකී පිරිසටද සිතුනිකර එසින් නික්මින. රත්මලානේ දෙවස්ථානයට හැරෙණ සන්ධියේ මාහැඟි බහිවාරයක් තනා එය මොනවට සරසා එහි මහත් රාශියක් සෙනඟ රැස්ව "නෙව්" තුමාට ගදින් මලින් සම්භාවනා කළහ. "නෙව්" තුමා මේ සේනාවටද සතුනිකොට එසින් නික්ම කුරුඳුවත්තේ උතුරු කෙළවරට පැමුණුනේය. එතැන්සිට රුවතාවත්ත දක්වා සැහැල්ම දෙකහමාරක් පමණ දිසී මාගීයේ දෙපස පුළුප්පත් සහ වනස්ස ආදියෙන් සරසා "නෙව්" තුමාගේ සහ ද සොසිසා මහතුන්ගේ වතුවල කටයුතු කරණ අනු ජීවික සෙනාව රැස්ව සිටියෝය. "නෙව්" තුමා එකී සැරසිලි මඩ්‍යයට සම්ප්‍රාප්තවූකලී මෙකී සේනාව ඔල්වර හඬදීමෙන් සහ මලින් ගෞරව කළෝය. කුරුඳුවත්තේ ද සොසිසා විශ්‍රාම ශාලාව සමීපයේ ඉතා අලඞ්කාරලෙස සරසනලද ඇඟෑයක් තනා එහි කොඩි ගත් ලමෝ රංචුවක් රැස්වසිට "නෙව්" තුමා පැමිණි වහාම, කෙහෙලි රාශිය පහතට නැමීමෙන් සහ මල් ඇතිරීමෙන්ද ගෞරව කළෝය. මේ දරුකැලට සහ මිට බූලිකවූ සියලුදෙනට "නෙව්" තුම සතුති කොට, එතැන්සිට තන්හි තන්හි සිටවා තිබුන කුරුස ලකුණු සහිත කොඩි පෙළ සහ සැරසිලි බල බලා ප්‍රීතිවෙමින් ගොස් ඇස්. පීටර් ද සොසිසා මහතානන්ගේ නිවස සමීපයට පැමුණුනේය. ඒ මහතා ප්‍රධාන අවශෙෂ මහතුන් විසින් කරණලද අලඞ්කාර සැරසිලිද, ජොහානස් සල්ගාදු ගුණවර්ධන "රෙජිස්ත්‍රාර්" මහත්මයා විසින් තනවාතිබුන රමණීය තොරණද, බලාගෙණ මොරවුවේ ද සොසිසා වලව්වේ දෙරවුවට සම්ප්‍රාප්තවිය. එහිද ඉතා විශාලවූ සහ අනඝිවූ සැරසිලිවලින් යුක්ත

තොරණක් බැඳ ඒ අවට සැරසිලිකර තිබුනේය. එකි රථ නවතා බොහෝදෙන මෙම ප්‍රසාදයට රැගෙණැවිත් තිබුන සතුති පත්‍ර කියවීමට කාලය දුන්නේය. සතුති පත්‍ර කියවා "නෙට්" තුමට ඔප්පුකළ ඉක්බිති, එතුමා සතුති කොට එය පිළිගෙණ ශුඛවූ පේදුරු පාව්ළු, අපෝස්තුළුවරයින්ගේ දෙවස්ථානයට අයිති ජනයා සහ ගොරහගහ මංකඩ අන්තෝනි මුනිදුන්ගේ දෙවස්ථානයට අයිති ජනයා විසිනුත් තනා තිබුන අනගි බහිමාර යුවල සමීපයට පැමිණ එය නැරඹීමෙන් ඉතා සතුටට පත්වුනේය. තවද, "නෙට්" තුමා එකී කරුණාවන්ත ජනයාට තුතිකොට, මයියොක්කා වත්තේ ශුඛවූ ජූසේ මුනිඳුයාගේ දෙවස්ථානයට හැරෙණ සන්ධියට සම්ප්‍රාප්තවූහ. මෙම දෙවස්ථානයට අයිති කතෝලික සහෝදරයන් විසින් කරතිබුන නානාවිධ සැරසිලිද, "වොලන්ටියර් බෑන්ඩ්" තූර්‍යයියද, ෂේවිසි ශබ්දද, රබන් ශබ්දද, අන්‍ය ක්‍රීඩා ආදියද, "නෙට්" තුමා නිරීක්ෂනයකරමින් මෙකී "බෑන්ඩ්" තූර්‍ය ආදියෙන් යුත් පෙළහර සමඟ ශුඛවූ සෙබඵතියන් දෙව් මැදුරේ සන්නියේ තනා තිබුන විශාලවූද, ලක්ෂණවූද, සතරැස් තොරණ ලඟට පැමිණ "නෙට්" තුමා ඇතුළුවූ සියලු දෙන රථවලින් බැස්සාහුය.

එකල **පාර්බෝස්** සහ **බෙෂර්** යන ගුරුප්‍රසාදීන් වහන්සේලා "නෙට්" තුමා කැඳවාගෙණ ඇතුන් තිදෙනෙක් සහිත පෙළහරකින් දෙවස්ථානයට ගමන් කළෝය. "නෙට්" තුමා සහ පිරිස දෙවස්ථානයට ඇතුල්ව සකස්කොට තිබුන ආසන පිළිගත්හ. නියම ආහරණාදියෙන් සැරසුන ගුරුප්‍රසාදීන් වහන්සේලා ඇතුළුව සහෝදර ගුරුවරු පස්විසිදෙනෙකු පූජාසනය සමීපගතවූකල අතිගෞරවනීය සාමාන්‍ය ප්‍රති ගුරුප්‍රසාදී තුමා "නෙට්" තුමට ආමන්ත්‍රණයකොට එතුමාගේ සත් චරිතය සහ ත්‍යාගිවන්නාකමගැණද, පරාර්ථික ක්‍රියා ගැණ සහ දුක්පතුන් කෙරෙහි ඇති දයානුකම්පාව ගැණද, ඉතා ව්‍යක්ත කථාවක්කොට, "නෙදේවුම්"

ඒතිකාව ගායනාකොට සත්ප්‍රසාද ආශීර්වාද දිමෙන් දෙවමෙහෙය හමාරකළහ. "නෙව්" තුමා ගුරුප්‍රසාදින් වහන්සේලාට සහ මෙගැණ වෙහෙසගත් සෑමදෙනාටත් සතුතිකොට සුළුපවේලාවක් ලැගුම්ගෙයි නැවතී, ගුරු ප්‍රසාදින් වහන්සේලා සමග සතුටු සම්භාෂණයකොට ආචාර සමාචාර කරගණ්මින් පහමාරට එයින් නික්ම සුඛයිය ගෘහයට පැමිණියහ. එම විශාල ගෘහය, මලින්, කොලින් හා කෙහෙලි ආදියෙන්ද චිත්තාකර්ෂණය වන පරිද්දෙන් සරසා තිබුනේය. ගෙ දොරටුවේ විශාල බහිවාරයන්ගෙන් සහ දෙපස සැරසිලිවලින් විරාජමාන විය. මුළු ගෘහය සහ ඒ ගෘහාඞ්ගනය දහස්ගණන් සෙනාවගෙන් පිරිගියාහුය. රුස්වූවන් විසින් නානාවිධ ගද්‍ය පද්‍යයන්ගෙන් සරසනලද සතුති පත්‍රාදියෙන්ද, මලින්ද, සුවඳ පැනින්ද, සතුති කථාවන්ගෙන්ද, ආත් පොළසන් දීමෙන් සහ ඔල්වර හඬ පැවැත්වීමෙන්ද "නෙව්" තුමා මොනවට පුදනලදී.

ඉක්බිති එහි එවේලාවට සූදානම්කර තිබුන රසවත් ඛාද්‍ය භොජ්‍ය ආදියෙන් පැමිණි ජනයා තෘප්තියට පැමිණෙනතුරු සඟරා විඳ මෙම උදාරතර ප්‍රිය සඞ්ඝා කාලය අවශාන කලෝය.

"නෙව්" තුමා කීපදිනක් මොරවුවේ නැවතී බොහෝදෙනාට ධනයෙන් උපකාර කෙළේය. දෙදුස් හයසියයක් පමණ යාචක සමූහයාට හාල්, පොල්, සහ මුදල් බෙදා දුන්නාහ. ඉල්ලීම් පත්‍ර දෙසියයක් පමණ පරීක්ෂාකරබලා ඔවුනොවුන්ගේ ඉල්ලීම් ඉටුකරලූහ. ශුඛවූ පේදුරු අපෝස්තුළුවරයින්ගේ දෙවමැදිරියට රුපියල් සියයක් දුන්නේය. රත්මලානේ දෙවස්ථානයට යාව ඉඩම් කැබෙල්ලක් ගැණීමට රුපියල් එකසිය තිහක් දුන්නේය. මේතුමා මෙආදි කුශල කර්මයන්හි වඩ වඩා යෙදෙමින් කලදවස් පසුකෙළේය.



SINHALESE DAILY NEWS PRESS PETTAH COLOMBO.

රෝගාතුර කාලය.

සැඩ පවන කරණකොටගෙණ චන්‍දන වෘක්ෂයට පවා හිරිහැර ලැබෙන්නාක්මෙන් සුරතුර ලක්ෂණයෙන් යුක්තව විසූ මේ උතුමාද; ව්‍යාධි නැමති සැඩ පවනට අසුවීමෙන් පීඩා විඳින ස්ථානයට සම්ප්‍රාප්තවිය. මේ තුමාගේ චක්ෂු ඉන්ද්‍රියයන්ගේ දුර්ලභාවය වර්ධන වේගණ ඒමෙන් පීඩාවිඳින අතරට "කෘච්ඡ්‍රශ්‍රෝෂනම්" ව්‍යාධියද වැලඳුනේය. මෙයින් සුවපත්වීම සලකා, සිංහල, ඉංග්‍රීසි, දක්ෂ වෛද්‍යයන්ගෙන් ඖෂධ ගත්තේවිනමුත් ඉන් කිසි සුවයක් නොලැබ රොගය අරිෂ්ටවීමෙන් මාරකාසනයට සම්ප්‍රාප්තවිය. මෙතුමාගේ ප්‍රිය දියනියවූ ද සොසිසා මහත්මිය සහ බෑණනුවන්වූ ද සොසිසා මහත්මයා ප්‍රධාන කොටඇති බන්ධුමිත්‍රාදීන් විසින් එම ආසනයෙන් බස්වා ගැණීම් සඳහා මහත් පරිශ්‍රමයක් දරූනමුත් එකී සියලු යත්න මාරයා විසින් විධ්වංශනයකොට වෂී එක්දහස් අටසිය අසූනමයක්වූ අප්‍රේල් මස අට වෙනි (1889. අ. ම. 8.) දින රොමානු කතෝලික සමයේ උසස් දෙව මන්දිරයක මූලස්ථානයක්වැනි මෙතුමා එම මරුතෙම ගිලගත්තේය.

මෙතුමාගේ අවශානය "ඇල්ග්‍රඩ් හවුස්" නම් වලව් වේදී සිදුවූ නමුත් එම මෘත කළේබරය එදිනම රෑ මොරටුවේ මෙතුමාගේ නිවසට ගෙණගියේය.

———:o:———

අවමඞගල්‍යය.

මෙම අවමඞගල්‍යය සඳහා විසුරුවාහරිණලද දහස් ගණන් අවමඞගල්‍ය පත්‍ර ලක්දිව දශඅත පැතිර යාමෙන් දුරස්තර නානා දිසාවාසි මහත්වරුද, කොළඹ, ගල්කිස්ස, දෙහිවල, වැල්ලෙවත්ත, මොරටුව, පානදුරේ, කළුතර ආදි නොයෙක් පලාත්වල, ඉංග්‍රීසි, සිංහල, බර්ගර්, හෙට්ටි,

දෙමළ, ජා, මරක්කල ආදි දහස්ගණන් ජනයා මොරටු ග්‍රාමයට රැස්වූහ. මෙම "නෙවි" තුමාගේ නිවසේ සිට ශුද්ධවූ සෙබස්තියන් දෙවමන්දිරය දක්වා මාගීය කළු කොඩි ආදියෙන් සරසා සුදු වැලි ඉස මනාසේ සජ්ජිත කර තිබුණේය. කලින් නියම්කරතිබුන වේලාව වන නම වෙනි දින පස්වරු සතර (4) පැමිණී කෙණෙහිම මෘත ශරීරය මහත් පෙළහරින් ගෙණයාමට පටන්ගත්හ. එම අවමංගල්‍ය පෙළහර පෙරමුන, දුක්තාලයට තූර්යනාද පවත්වන "වොලන්ටියර් බෑන්ඩ්" කණ්ඩායමද, මොරටුවේ කතෝලික සභා කීපයක් වෙනුවෙන් එවනලද කුරුසි අත් ගත් ජනයාද, ඊලඟට ශුද්ධවූ සෙබස්තියන් දෙවස්ථානයේ කුරුසි, සිරියස් ආදිය රැගත් ජනයාද, ඉන්පසු ක්‍රිස්තියානි සහෝදරවරුද, රෝමානු කතෝලික දෙවගැතිවරු විසිපස්දෙනෙක් පමණද, මනා පිළිවෙළට ගමන් කළෝය. ඒ සමගම ප්‍රස්තාවට ශෝකාකාර සැරසුන අට දෙනකු විසින් අලංකාර මිනීපෙට්ටිය නවවතින් පිළියෙළ කළ පියවිලි මත්තෙන් උසුලාගෙණ යන ලද්දේය. පෙට්ටිය දෙපැත්තේ, සමරවීල්, මෝර්ගන්, වෛද්‍යාචාර්ය වැන්ගැසිෂල්, ඇස්. ආර්. පොන්සේකා, යන මහත්වරු ගමන් කළහ. චාර්ල්ස් හැන්රි ද සොයිසා මහතා ප්‍රධාන දරුවෝද අන්‍ය කිට්ටු බන්ධුන්ද, මිනීපෙට්ටිය පසුභාගයෙන් ගමන්කළෝය. මෙම අවමංගල්‍ය පෙළහර දෙවස්ථානය ඉදිරියට පැමිණ විනාඩි ස්වල්පයක් එහි නැවතුන කලී, **ස්කීන්** මහතා විසින් මෙම පෙළහරේ ඡායාරූපය ගන්නා ලදී. ඡායාරූපය ගත් පසු දෙවස්ථානයට ඇතුල්ව එහි ඉටි පන්දම් ආදියෙන් ආලෝකකර සකස්කොට තිබුන ආසනය මත්තේ මිනීපෙට්ටිය තබනලදී, එහිදී දෙව මෙහෙයක් පැවැත්වූ ඉක්බිති අග්‍ර "බිෂොප්" **බොන්ජීන්** උන්නාන්සේ ප්‍රධාන දෙවිගැතිහු විසින් මළවුන් උදෙසා පවත්වන මෙහෙය පවත්වන ලදුව, අග්‍ර "බිෂොප්" උන්නාන්සේ මිනීවළ ලඟට වැඩ "ස්වාමින්වහන්සේ තුළ නසින්නෝ වාසනාවන්තයෝය" යන ආදර්ශ පදයපිට

විශේෂ කථාවක් කෙළේය. එනම්:—"නැසිගිය මහතා පුණ්‍ය වන්ත වැඩ උදෙසා තෑගිවන්ත ලෙස ක්‍රියාකිරීම ගැන ලඞ්කාවේ හොඳකාර ප්‍රසිඛ කෙණෙක්ව සිටියේය. සොරා ගන්ට පිළිවන්වූද, මළබඳින්නාවූද, කාවුන් කන්නාවූද, වසතුව පෘථිවියෙහි රුස්කර නොගණ්ඞිල්ලාය. නමුත් මළ නොබඳින්නාවූද, කාවුන් කා විනාශ නොකරන්නාවූද, සොරසතුරන්ට ගතනොහැකිවූද, ඛයීශ්‍රය වසතු රුස්කර ගණ්ඞිල්ලාය. "නුඹේ වසතුව යම් තැනකද, එතන නුඹේ හිතත් ඇත" යන ශුඛවූ මතෙව්ගේ ශුභාරාධ්‍යයේ ලියා තිබෙන වචන මේ මහතා හිතේ තබාගණ ක්‍රියා කෙළේය. යම් තැනක අග හිග පැවතුනේද, එතැන්හි සාගින්නේ සිටිවුන්ට මෙතුමා විසින් ආහර පාන දිමෙන්ද, වසත්‍ර නැත්තන්ට වසත්‍ර දිමෙන්ද, උපකාරකෙළේය. යම් දෙව ස්ථානයක් හොඳනැතිමට මුදල් හිඟවූකල ඒබැව් "නෙවි" තුමාට සැලකළ කෙණෙහිම මුදල් පරිත්‍යාග කිරීමෙන් ආධාර කෙළේය. මෙම දෙවමැඳිරයද මෙතුමාගේ ත්‍යාගී වන්නකමගැණ සාක්ෂිදරන්නිය. මෙම දෙවමැඳිරය ස්ථාපිත කිරීමට උවමනාවූ මුදලේ පළමුවෙනි කොටස මෙතුමා විසින් හෙවනලදී. සියලු දෙනාගෙන් කරුණාව ලබාගත් මනුෂ්‍යයෙකි, එතුමා දුන් අප අතුරෙන් පිටත්ව ගියනමුත් එතුමාගේ යහපත් ආදර්ශ අප අතුරේ පවතී" යි යනුය.

තවද අගිහරු කටයුතු **මුලිකානි** විගාරි ජනරල් උන්නාන්සේ සිංහල භාෂාවෙන් මෙතුමාගේ ගුණ වර්ණාවක්කෙළේය. **බොන්ජියන්** අග්‍ර "බිෂොප්" තුමා සහ **මැලියන්** "බිෂොප්" තුමාද ප්‍රධානකොට ඇති පූජක සමූහයා විසින් නැවතත් දේවමෙහෙය පැවැත්තූ පසු, මිනිපෙට්පිය දෙවස්ථානය තුලම පිළියෙළ කොට තිබුන වළට බානලදී. අග්‍ර "බිෂොප්" **බොන්ජියන්** තුමා විසින් යාඥාවක් ඔප්පුකොට දෙවමෙහෙය හමාරකළහ. අග්‍ර "බිසොප්" තුමා මිනිවළට මල්මිටක් දැමූ ඉක්බිති රුස්වසිටි, සෑහි මිත්‍රාදිනු එසේම සුදුමල් වළට දැමූහ. එම මල්වලින්ම වළ වැසිගියේය. දහස් ගණන් සෙනාව නැවතත් මෙතුමාගේ නිවසට පැමිණ අවමඞගල්‍ය චරිත්‍රාදිය විඳ ඉතා ඛෙදයෙන් විසිරී ගියාහුය.

කථාශෙෂ හාවොපගත මෙම "නෙට්" තුමා සඬශකතියෙන් ධන සම්භාරයක් රැස්කරගෙණ ප්‍රභූ සම්ප්‍රයුකත මහා විචක්ෂණයකුසේ සඬකීය සතුණශකතිය මෙහෙයා, සොරසතුරන්ගෙන්ද, ගිණි ජල ආදියෙන්ද, මියන්, කාවුන් ආදින්ගෙන්ද, මිදිමක් නොමැති ධනය ගැණ කලයුතු මෙයසි නිශ්චයලෙස දැන, සිය සමය වර්ධනය සඳහා සහ ශාසන දියුණුව සඳහාත්, දුකී මත් යාචකාදින් සඳහාත් බොහෝ ධන පරිත්‍යාගකොට මෙලෝ සැප විඳ, පරලෝ ගෙණයායුතු පුණ්‍ය රාශියද, සුරතින්ගෙණ මෙම මනුෂ්‍යලොකයෙන් නික්මිගිය මහිමයගැණ අසන බලන ගුදී ජනතාව ධන තෘෂ්ණාදි නීච පාපයන්ගී නොනියුකතව විහා වහා සත්චරිතයෙහි හැසිර සාධු සත්පුරුෂ මෙම "නෙට්" තුමාගේ ශුචරිත මාගී යෙහිම ගමන් කිරීමෙන් මී ලොක ජය ග්‍රහණය කරත්වා!

සුදුනම්කර තිබෙන මිනිවල් ලෙඛනය.

SACRED TO THE MEMORY OF

LINDAMULAGE

JUSEY De SILVA

Knight of the Order of St. Gregory the Great
PRESIDENT MUPPU
of St. Lucia's Cathedral, Kotahena and
St. Sebastian's Church, Moratuwa

BORN 2ND SEPTR. 1816—DIED 8TH APRIL 1889.
AGED 73 YEARS.

THIS MEMORIAL STONE WAS PLACED ON THE GRAVE
BY HIS AFFECTIONATE DAUGHTER

CATHERINE

AND

SON-IN-LAW C. H. De SOYSA J. P.

— R. I. P. —

මෙම ශුඛවූ සෙඛසනියන් මුනිඳුන්ගේ දේවස්ථානය සහ
ශුඛවූ ලුස්යාසන දේවස්ථානයත්
ප්‍රිසෙන්හි මුහුජ්සු තනතුරුලත්
ශුඛවූ මහා ග්‍රිහෝර් පාඛන්යේ නෛටිනාමාභිධාන

ලිදමූලගේ ජූසේද සිල්වා

වයි 1816 ඛූ ස.ප්තැම්බ්‍ර මස 2 දින ඉපිද අවුරුදු 73 ක්
ආයුවලදු-1889 ඛූ අප්‍රෙල් මස 8 දින කළුරියකොට
මෙතැන්හි භූමදාන කලබව සිඛිවිමපිණිස
ඔහුගේ ප්‍රේමවන්ත දියනියවන

කත්‍රිනා

සහ බෑනනුවන් වන

වාලිලස් හැවිඩ් ද සොසිසා දිසානායක

සමාදාන නඩුකාරතැන විසින් මෙය පිහිටුවනලදී.

මේ පෙම සමාදානයේ සැහැපෙකු ලැබිවා.

මිනිවල වෘත්තිබෙන ගිලාලෙඛනය.

SACRED TO THE MEMORY OF

WIRAHENNEDIGE

ANA FERNANDO

BORN 3RD OCT. 1825—DIED 14TH DECR. 1887.

AGED 62 YEARS.

THIS MEMORIAL STONE
WAS PLACED ON THE GRAVE
BY HER BELOVED HUSBAND

CHEVALIER JUSEY De SILVA

KNIGHT OF THE ORDER
OF
ST. GREGORY THE GREAT.

— R. I. P. —

වීරහැන්නැදිගේ ආනා ප්‍රනාන්දු

වඹි 1825 ඇවු
ඔක්තෝබර් මස 3 වෙනි දින ඉපිද
අවුරුදු 62 ක් ආයුවළඳා
1887 ඇවු දෙසැම්බර් මස 14 වෙනි දින කළුරියකොට
මෙහැන්හි භූමයුනාකළබව
සිහිවීම පිණිස
ඇගේ කරුණාවන්ත සුරුෂයා වන
ශුඛවූ මහ ග්‍රිගෝරි පඩිකුලයේ නෙවි නැන්පත්

චැවලියර් ජූසේද සිල්වා

වී සි න්
මෙය පිහිටුවනලදී.

ඇ සමාදුනයේ සැනපෙන ලද්දේවා.

THE LAST WILL.

———:o:———

No. 4130.

This is the joint last will and Testament of us, Lindamulagey Jusey De Silva (hereinafter called Testator) and Weerahennedige Ana Fernando (hereinafter called Testatrix) husband and wife residing in Moratuwa.

We do hereby will and declare that in the event of the Testator surviving the Testatrix all our property estate and effects and the property estate and effects of each of us whether in possession reversion or expectancy shall with the reservation hereinafter mentioned devolve on and become the absolute property of the Testator, who shall have the power to sell alienate or otherwise deal with or dispose of such property as he pleases. In the event however of his leaving at his death any property otherwise undisposed of all such property shall devolve on and become the absolute property of our only daughter Lindamulagey Catherine De Silva and of our Son-in-law Charles Henry De Soysa Dissanayaka and we do further hereby will and declare that in the event of the Testatrix surviving the Testator then all our property estate and effects aforesaid and the property estate and effects of each of us shall on the death of the Testator devolve on and become the absolute property of our aforesaid daughter and Son-in-law subject however to a life interest in one half of the revenue rents and profits thereof which is hereby reserved for and shall be payable to the said Testatrix during the term of her natural life, and which rents and profits shall on the death of the Testatrix revert to our aforesaid daughter and Son-in-law.

And we further desire that after the death of the Testator the sum of Rupees 125/- to be paid annually for the expenses of St. Sebastian's Church in Moratuwa which said annual payment to be paid regularly out of our estate for forty years.

The sum of Rupees 250/- to be paid annually for the Catholic Schools in Moratuwa which said annual payment to be made for twenty years if the schools were properly kept up.

The sum of Rs. 6000/- be paid to St. Lucia's Cathedral at Kotahena in Colombo.

The sum of Rs. 1000/- for St. Anna's Church at Palakudawa in case the proposed improvement of the said Church be commenced.

The sum of Rs. 1000/- to be paid to our Roman Catholic Bishop for masses and other religious ceremonies performed for the benefit of souls.

The sum of Rs. 1000/- to be paid for the Convent School at Kotahena.

The sum of Rs. 2000/- to be paid for beggars.

We do hereby nominate and appoint our Son-in-law Charles Henry De Soysa Dissanayaka to be the Executor of this Will.

In witness whereof we the said Lindamulagey Jusey De Silva and Weerahennedige Ana Fernando do set our hands and seals to these presents at our own residence in Moratuwa on this 3rd day of October in the year One Thousand eight hundred and eighty one.

Signed and declared by the Testator and Testatrix as and for their Last Will and Testament in our presence who in their presence and in the presence of one another and in the presence of the Notary all being present at the same time and place have hereunto set our hands as witnesses on the day month & year above-written.

(Sd.) J. De Silva.

(Sd.) Ana (in Sinhalese)

(Sd.) A. Soysa.

(Sd.) A. Dias.

(Sd.) D. M. Arsecularatna, N. P.

(Sd.) J. Don Marsalis.

I Don Marsalis Arsecularatna of Colombo Notary Public do hereby certify and attest that the foregoing last wil and Testament having been duly read over and explained by me to Lindamulagey Jusey De Silva and Weerahennedige Ana Fernando the Testator and Testatrix therein named who are known to me in the presence of Warusahennedige Andris Soysa of Grandpass in Colombo, Ponnahennedige Arnolis Dias of Panadura the subscribing witnesses thereto both of whom are known to me the same was signed by the said Testator and Testatrix and by me the said Notary and by the said witnesses in the presence of one another all being present together at the residence of the Testator and Testatrix in Moratuwa aforsaid on the 3rd day of October 1881.

(Sd.) D. M. ARSECULARATNA,
N. P.

———:o:———

No. 4107.

This is a codicil to the Last Will and Testament of Lindamulagey Jusey De Silva and Weerahennedigey Ana Fernando made on the 3rd day of October 1881, No. 4130 and attested by Don Marsalis Arsecularatna Notary Public.

We declare that we have paid in advance the sums respectively of 1000/- Rupees to St. Anna's Church at Palakudawa and 6000/- Rupees to St. Lucias Cathedral at Kotahena in Colombo: and we therefore revoke the legacies bequeathed to the said Churches by our said Will.

In all other respects we confirm our said Will.

In witness whereof we do set our hands to two of the same tenor and date as these presents at Colombo on this eleventh day of September in the year of our Lord one thousand eight hundred and eighty five.

Signed & published and declared by the said Lindamulagey Jusey De Silva and Weerahennedigey Ana Fernando as & for their codicil to the Last Will and Testament dated 3rd October 1881 in our presence who in their presence and at their request and in the presence of one another all being present at the same time have subscribed our names hereto as witnesses.

(Sd.) J. De Silva.

(Sd.) Ana (in Sinhalese.)

(Sd.) S. Peter Soysa.

(Sd.) M. D. Cockburn.

I Fredrick Charles Loos of Colombo in the Island of Ceylon Notary Public by lawful authority duly admitted do hereby certify and attest that the foregoing codicil having been duly read over and explained by me unto Lindamulagey Jusey De Silva and Weerahennedigey Ana Fernando therein named in the presence of the witnesses Solomon Peter Soysa and Montague Dundas Cockburn both of Colombo all of whom are known to me the same was signed by them and by the said witnesses and by me the said Notary in the presence of one another all being present at the same time at Colombo on the 11th day of September in the year of our Lord one thousand eight hundred and eighty five.

Date of attestation 11th Septr. 1885.

(Sd.) F. C. LOOS,
Notary Public.

අන්තිම කැමති පත්‍රයේ පිටපත.

අඩක. 4130.

(මොරටුවේ පදිඤ්ඤි මෙහි පහත හිමිකාරයාය කියන) ලිඳමුලගේ ජූසේ ද සිල්වා සහ (මෙහි පහත හිමිකාරිය කියන) වීරහැන්නැදිගේ ආනා ප්‍රනාන්දු යන පුරුෂයා සහ ස්ත්‍රිත් වන අප දෙදෙනා එකතුව ලියවනලද අන්තිම කැමති පත්‍රයයි.

හිමිකාරයා සිවියදී හිමිකාරි මලොත් අපේ සියලුම දේපල සහ අප එකිනෙකාගේත් දේපලත් මෙහිපහත දක්වන කාරණාවලට ඉඩඇතිව හිමිකාරයාට සම්පූර්ණයෙන් අයිතිවන ලෙසද ඔහුගේ කැමැත්ත පරිද්දෙන් එම දේපල විකිණීම දීම ආදිය කළහැකි ලෙසද අප විසින් කැමැත්ත දෙනලදි. ඔහුගේ මරණින් පසු තිබෙන සියලුම දේපල අපගේ එකම දියනියන්වූ ලිඳමුලගේ කැතරින් ද සිල්වා සහ අපේ බෑනාවන චාර්ල්ස් හැන්රි ද සොසිසා දිසානායකටත් අයිතිවේ. හිමිකාරි සිවියදී හිමිකාරයා මලොත් ඉහතකී සියලුම දේපල සහ අප එකිනෙකාගේත් දේපල ඉහතකී අපේ දියනියන්ට සහ බෑනාවත් සම්පූර්ණයෙන් අයිතිවේ. එසේද වුවත් මෙයින් වෙන්කර තබනලද දේපලවල බදුවලින් ලාභවලින් සහ ආදායමෙනුත් දෙකෙන් පංගුවක් හිමිකාරි ජීවත්වනතුරු හෙවිය යුතුවේ. හිමිකාරිගේ මරණින් පසු එම බදු සහ ලාභආදියත් ඉහතකී අපේ දියනියන්ට සහ බෑනාවත් අයිතිවේ.

හිමිකාරයාගේ මරණින් පසු මොරටුවේ ශුඛවු සෙබඤ්ඤියන් මුනිදුන්ගේ දේවස්ථානයේ වියදම් සඳහා අවුරුද්දකට රුපියල් 125 බැගින් ගෙවීමටද, මේ දීමනාව හතළිස් අවුරුද්දක් මුළුල්ලේ නියමාකාරයට ගෙවීමට වැඩිදුරටත් අපේ කැමැත්ත ප්‍රකාශ කෙළෙමු.

මොරටුවේ කතෝලික පාඨශාලාවලට අවුරුද්දකට රුපියල් 250 බැගින් ගෙවීමටත් එම දීමනාව පාඨශාලා හොඳකාර පවත්නම විසි අවුරුද්දක් පැවැත්වීමටත් කැමැත්ත ප්‍රකාශ කරණලදී.

කොළඹ කොටගේනේ සාන්ත ලුසියා ආසන දෙව් මැදුරට රුපියල් 6000 ක් දීමටද කැමතිවීම්.

යෝජනාකර තිබෙන පරිද්දෙන් දිසූඤු කිරීමේ වැඩ පටන්ගත්තොත් පාලකුඩාවේ සන්ත ආනා දේවස්ථානයට රුපියල් 1000 ක් දීමටද කැමතිවීම්.

ආත්මගැලවීම පිණිස පවත්වන පූජා සඳහා අපගේ කතෝලික බිෂොප්තුමාට රුපියල් 1000 ක් දීමටද කැමතිවීම්.

කොටගේනේ මඩමේ පාඨශාලාවට රුපියල් 1000 ක්ද, යාචකයන්ට රුපියල් 2000 ක්ද දීමට කැමතිවීම්.

මේ අන්තිම කැමති පත්‍රයේ බලකාරතැන ලෙස අපේ බෑනාවන චාර්ල්ස් හැන්රි ද සොසිසා දිසානායක පත් කරගැණීමට කැමතිවීම්.

මිට සාක්ෂිවශයෙන් ලිඳමුලගේ ජූසේ ද සිල්වා සහ වීරහැන්නැදිගේ ආනා ප්‍රනාන්දු යන අපි දෙදෙනා එක් දහස් අටසිය අසූ එකක්වූ අවුරුද්දේ ඔක්තෝබර් මස 3 වෙනි දින මොරටුවේ අපේ නිවසේදී අපේ අත්සන් සහ මුද්දර තබනලදී.

මේ අන්තිම කැමති පත්‍රයේ හිමිකාරයා සහ හිමිකාරි විසින් ඔවුන් ඉදිරිපිට සහ එකිනෙකා ඉදිරිපිටද, නොතාරිස් තැන ඉදිරිපිටද සිටියදී සියලු දෙනාම ඉදිරියේ එකවර ඉහතකී අවු රුද්දේ මාසේ දිනයෙහි සාක්ෂි වශයෙන් අපේ අත්සන් තබන ලදී.

ජේ. ද. සිල්වා.
ආනා (සිංහලෙන්)

ඒ. සොසිසා.
ඒ. ඩයස්.

නි. ඇම්. අර්සකුලරත්නා
නොතාරිස්.

ජේ. ඩෙන් මාර්සේලිස්.

යට දැක්වූ අන්තිම කැමති පත්‍රය කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැනවන දෙන් මර්සේලිස් අර්සකුලරත්න වන මවිසින් හිමිකාරයා සහ හිමිකාරිවන මාඅදුනන ලිඳමුලගේ ජූසේ ද සිල්වා සහ වීරහැන්නැදිගේ ආනා ප්‍රනාන්දුත් ඉදිරියේ මා අදුනන සහ මිට සාක්ෂිකාර කොළඹ ග්‍රෑන්ඩ්පාස්හි වරුෂ හැන්නැදිගේ අන්ද්‍රිස් සොයිසාද පානදුරේ පොන්නහැන්නැදිගේ අර්නෝලිස් ඩයස්ද ඉදිරියේ කියවා තේරුම්කරදී ඒසියලු දෙනාම එක්වසිපියදි 1881 ඔක්තෝබර් මස 3 වෙනි දින මොරටුවේ හිමිකාරයාගේ සහ හිමිකාරිගේත් නිවසේදී එම හිමි කාරයා සහ හිමිකාරි විසින්ද, ඉහතකී නොතාරිස් තැන වන මවිසින්ද, ඉහතකී සාක්ෂිකාරයන් විසින්ද අත්සන්කළ බැව් මෙසින් මම සහතිකකරමි.

(අත්සන්කළේ)

ඩී. ඇම්. අර්සකුලරත්න,

ප්‍රසිද්ධ නොතාරිස්.

———:o:———

අන්තිම කැමති පත්‍රයේ ඒනාතිදේකය.

අඩංග. 4107.

මෙය 1881 ඔක්තෝබර් මස 3 වෙනි දින දෙන් මර්සේලිස් අර්සකුලරත්න නොතාරිස් තැන විසින් ලියා සහතික කරණලද අඩංග 4130 දරණ ලිඳමුලගේ ජූසේ ද සිල්වාගේ සහ වීරහැන්නැදිගේ ආනා ප්‍රනාන්දුගේත් අන්තිම කැමති පත්‍රය සම්බන්ධ පත්‍රයයි.

පාලකුඩාවේ සන්තාන පල්ලියට රුපියල් 1000 ක්ද, කොළඹ කොටගේනේ සාන්ත ලුසියා ආසන දෙවිමැදුරට රුපියල් 6000 ක්ද අත්පිට ගෙවිබවත් එකී අන්තිම කැමති පත්‍රයේ එම දෙවස්ථානවලට නියමකර තිබෙන දිමනා ඒනිසා අවලංගු කළ බවත් ප්‍රකාශ කරමු.

අන්තිම කැමති පත්‍රයේ අනික් සියලුම කාරණා අපි සථිර කරමු.

මීට සාක්ෂි වශයෙන් එක්දහස් අටසිය අසූපහක්වූ සැප්තැම්බර් මස එකොළොස්වෙනි දින කොළඹදී එකාකාර එකම දූතම දරණ ලියුම් දෙකකට අපේ අත්සන් තැබිමු.

ලිඳමුලගේ ජූසේ ද සිල්වා සහ විරහැන්නැදිගේ ආනා ප්‍රනාන්දු ගේත් 1881 ඔක්තෝබර් මස 3 වෙනි දින දරණ අන්තිම කැමති පත්‍රය සම්බන්ධ පත්‍රය ලෙස එම දෙදෙනාද එකිනෙකාද ඉදිරි පිටදී එක වේලාවේ සාක්ෂි වශයෙන් අපේ අත්සන් තැබිමු.

ජේ. ද සිල්වා.

ආනා. (සිංහල)

(අත්සන්කළේ)

ඇස්. පීටර් සොසිසා.

(අත්සන්කළේ)

ඇම්. ඩී. තෝබර්න්,

ලංකාවේ ප්‍රසිඛ නොතාරිස් ධුරය දරණ කොළඹ පේදුරු චාර්ල්ස් ලෝස්නම් මා විසින් මා අඳුනන කොළඹ සලමොන් පීටර් සොසිසා සහ මොන්ටේගු ඩී. තෝබර්න් යන සාක්ෂි ඉදිරිපිට ඉහතකී ලිඳමුලගේ ජූසේ ද සිල්වාට සහ විරහැන්නැදිගේ ආනා ප්‍රනාන්දුටත් කියවා තේරුම් කරදී 1885 සැප්තැම්බර් මස 11 වෙනි දින කොළඹදී ඔවුන් සියලු දෙනාම සහ එකිනෙකා ඉදිරිපිටදීත් ඔවුන් සහ සාක්ෂිකාරයන් විසින්ද ඉහත සඳහන්වන අන්තිම කැමති පත්‍රයට සම්බන්ධ පත්‍රයට අත්සන්කළ බැව් මෙයින් මම සහතික කරමි.

(අත්සන්කළේ)

ඇල්. සී. ලෝස්,

ප්‍රසිඛ නොතාරිස්.

සහතික කළ දිනය 1885 සැප්තැම්බර් 11 දින දීය.

———:o:———

PART XII.

Mrs. JUSEY De SILVA,

MOTHER OF

Lady De Soysa.

———:o:———

දෙලොස්වන අදියර.

ද සොයිසා ආයත්‍යාවගේ මැනියන් වන

ජූසේ ද සිල්වා මැතිනිය.

MRS. JUSEY DE SILVA.—ජූසේ ද සිල්වා මැතිනිය.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

ජූසේ ද සිල්වා මැතිනිය.

Mrs. JUSEY De SILVA.

රහැන්නැදි විර බල ජයසූරිය පවබැදිගේ ආනා ප්‍රනාන්දු නෝනා මහත්මයා උපන්නේ:— වෂී එක්දහස් අටසිය විසිපහේ ඔක්තෝබර් මස තුන්වෙනි (1825 ඔ. ම. 3.) දින මොරටුවේ මොරටුවැල්ලේ මාදන්ගහවත්තේ පිහිටි නිවසේ දිය. මෝතොමෝ ජූසේ ද සිල්වා "නෛට" තුමාගේ ප්‍රිය භාර්‍යාවය, ද සොයිසා ආර්‍යාවගේ මාතාවන්ය, මැගේ පියා මුහුප්පු මහතා නමින් ප්‍රසිඛව විසූ වීරහැන්නැදි වීරබල ජයසූරිය පවබැදිගේ **ජේදුරු ප්‍රනාන්දු මහතාය.** මැගේ මව් මෝදර පවබැදිගේ **බසතියානා සිල්වා නෝනා මහත්මයාය.**

ආනා ප්‍රණාන්දු නෝනා මහත්මිය කුඩාකාලයේදීම දුසිරිත සුසිරිත දැනැදින සුසිරිතයේ ඇලීමෙන් එය පුරුදුකරගෙණ ආවාය. විය පැමිණි කල ගෘහසංවිධානාදි කටයුතු දැනගත්තාය. පිසීමෙහි නියුක්තවන්නී, සිංහල චරිත්‍රානුකූල මුළුතැන් ගෙයි වැඩකොටස මනාව ඉගෙණගත්තාය. සැමියෙකුට උවමනා ඉදිකටුවේ වැඩද

දැන ඉගෙණගත්තාය. සිංහල ලියන්ට කියවන්ට හොඳට දැනසිටියාය. ගුරුවර දෙමව්පිය වැඩිසිටියන් ගැණ සැලකිලිභාවයෙන්ද, හික්මීමෙන්ද, සඩ්ග්‍රහාදිය කිරීමෙන්ද, එවකට ආශ්‍රයකළවුන්ගේ හිත් නෙත් දිනාගත්තාය. කුශලයෙහි ඇලෙන්නී, එවකට ඇතුවගිය ධනවත්කමේ ප්‍රමාණයට දන්දීමෙන් පින්කළාය. අහඞ්කාර නැත්තී, නිරහඞ්කාරකමෙහි ඇති අගය දැන නිහතමානිව විසුවාය. මෝතොමෝගේ පියා එවකට පමණක් දුරට ධන සම්පන්නව සිටි ගම් ප්‍රධානියෙක් හෙයින් දියනියගේ කැමැත්තලෙස කුශල කටයුතුගැණ ධන වියදම් කිරීමේ නිදහසට ඉඩහැර තිබුනේය. මැගේ මව් පක්ෂය එවකට බෞද්ධයන්ව විසූ නමුත් මැගේ පියාගේ සම්බන්ධතාවය කරණ කොට ගෙණ කතෝලිකාගම වැලඳගත්හ. මෑ උපන්නාට පසු මැගේ පියා කල කී කටයුතු මහත්සේ සඵලවීමෙන් ධනවත් වූබව පෙණේ.

රූපලක්ෂණයෙන්ද, ගෙකම් දැනීමෙන්ද, වාසනා බලයෙන්ද, මේ කන්‍යාඩහණාව සුවිරබැව් දැනගත් තරුණ ජූසේ ද සිල්වා මහතා මෑහා කරබඳනයට සතුටුව, එවකට පැවති සිරිත් ප්‍රකාර මෑ පාවා ගත්තේය. මෑ ප්‍රිය භාර්‍යාවලෙස පාවාගත් පසු සැබවින්ම මැගේ මහත් වාසනා බලය, සැකිය සැමියාට දිය ගලන්නාක්මෙන් ධන ගැලීමෙන් එකෑවරම ඔප්පුවිය. සැකිය පුරුෂයා විසින් නොයෙක් යහපත් කටයුතුගැණ විපින්විට පරිත්‍යාග කළ මහත් ධන ගැණ විරුඩ නොවීමෙන් මේ නෝනා මහත්මයා පින්වතියක්බවටද වැටහේ. ධන හින තරුණියන් ගැණ කම්පා සිත්ඇත්තී, සිය ධනය වියදම් කොට එකී තරුණියන් පුරුෂයින්ට පාවාදීමේ කටයුතු ඉටුකෙරෙව්වාය. ලෙඩවුන් සහ මළවුන් සඳහා බොහෝ ධන පරිත්‍යාග කළාය. ප්‍රසූතිකාවියන් සඳහා සහ දුගී මග් යාචකාදීන් සඳහාද මහත් ධන දුන්නීය. මෙසේ මෝතොමෝ සුවසේ වසනා සමයෙහි දූරිඇනිවූයේ,

ඒගැණ ප්‍රවෙශම්ව ක්‍රියා කළාය. ගැබ මෙරීමෙන් ප්‍රසූත කාලය ලංවූයේ ප්‍රථම වරට පිරිමි දරුවෙක් ප්‍රසූත කළාය. මේ දරුවා ජනිතවූ දිනගණනකින් බාලග්‍රහණී රොගය වැළඳී මියයාම කරණකොටගෙණ ඉතා දුක් කාලයක් පසු කිරීමට සිදුවිය.

දරුසෙනහ අධික ලේස ඇත්තී දරුලත්තියන්ට සහ බාලයන්ට අනෙක උපකාර ධනයෙන් සහ වෙනත් මාර්ගවලින් කළාය. වඩවඩා කුශල චරිතයන්හි යෙදෙමින් වාසය කරණ අතර දෙවෙනි වරට දූරි ඇතිවිය. පළමු වෙනි දරුවා නැතිවූ හෙයින් දෙවෙනි දරුවා ඇතිකර ගැණීම සඳහා ඉතා ප්‍රවෙශම් ලෙස කල් පසුකරමින් කුශල ක්‍රියාම කළාය. දෙවෙනිවර ගැබ මෙරීමෙන් ප්‍රශව කාලය ලංවූයේ පුණ්‍ය වාසනා බලයෙන් අගපත් ගෘහිණීලදරියක් ප්‍රසූත කළාය. මේ පින්වත් ලදරිය ඇස ඉදුරසේ ප්‍රවෙශමෙන් හදූ වඩා උගන්වා පරොපකාර කිතියි ධන බලාදියෙන් ප්‍රකට **ද සොසිසා** පව්ලේ එවකට විසූ ප්‍රධානියාවූ **චාල්ස් හැග්ගි ද සොසිසා** තුමට සරණ පාවා දින.

මෙසේ සැකිය දියනියන්ගෙන් නිදහස්ව වෙසෙසින් කුශල චරිතයන්හි හැසිරෙන්නී, සියලුම ශනි දිනයන් පැමිණීකල දුප් මත් යාචකාදීන්ට මහදන් දෙන්නිය. ධනයෙහි ජීණී ලක්‍ෂණ දන්නී, දුකට පත් ඤතීන්වද ධනඥතීන්වද, පින්පඩි නියම කොට සතියකට වරක් පැමිණෙන ශනි දිනවල පින්පඩි දීම නොකඩව කළාය. ධනවන්තී සැකිය ධනය ගැණ ස්ත්‍රීනයක්නුදු මසුරු නොවී වමතට හොරා දකුණත පුරා ධනහීන සත්‍රී පුරුෂ දෙපක්‍ෂයට ධන බෙදූ දීමෙන් ඔවුනොවුන් සන්තුෂ්ටියට පමුණුවා සැබෑ සැප පැතුවාය. මෙසේ අනල්ප කුශල චරිතයෙහි හැසිරෙමින් වසන සමයෙහි, සැබෑ ධර්‍මයවූ පරිද්දෙන් මෙම උත්තම සත්‍රිය රොගාතුරවූවාය. රොගාතුරවූ මේ පින්වතීය ගැණ සැකිය දියනියවන **ද සොසිසා** මැතිනිය මවසමීපයේම නැවතී සියලු සත්කාර

ගරුකාර කළාය. විපින්විට පැමිණි අසනීප කාලවලදී සැකිය ප්‍රිය දියනිය මව්පිය නිවසට පැමිණ එහිම නැවතී සුවපත්කරගන්නීය. පසු කාලයේ සිල්වා නෝනා මහත්මයාගේ කණ හොඳකාර නොඇසෙන බැවින් නොයෙක් ප්‍රශ්නාවන්හි එකතුවුන පව්ලේ සමාගම්වලට හැර ප්‍රසිඩ සභාවලට පැමිණීම අඩුකළාය. මෙසේ වසන අතර පළමු වෙනි මිනිබිරියවූ **ෆැනිජෝර්ජියානා කැතරින්** මහත්මියගේ ශුභ සරණ මඩගල්‍ය සඳහා සැකිය දියනිය ගොස් "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වට කැඳවා ගෙණ ආවාය. මෙසේ එනකලදී, මදක් අසනීපෙන් සිටියාය. මඩගල්‍යය අවසානවී දවස් ගණනක් යනඅතර නැවතත් මෙහිදී රොගාතුරවූයේය. රොගයද බලවත් විය. තම සැමි පුරුෂ "නෙට්" තුමාද, සිය දියනිය සහ බෑනනුවන්ද අවශෙෂ බන්ධුමිත්‍රාදින්ද මෙම රොගයෙන් මේ පින්වත්තිය මුදවාගැනීම සඳහා සිංහල, ඉංග්‍රීසි දක්ෂ වෛද්‍යයන් කැඳවා ඖෂධ කෙරෙව්වේ වීනමුත් පින් කමෙහි නියුකත වර පින්වතිය බව නොසලකා රැදුරුවූ මාරයා පැමිණ වහි එක්දහස් අටසිය අසූහතක්වූ දෙසැම්බර් මස දහහතර (1887. දෙ. ම. 14.) වන බුදදින පස්වරු එකහමාරට ඔහු මුඛ හයාගත්තේය.

ඉතා ආදරවනතවූ තම ප්‍රිය භාය්‍යාව ගෙන් වියොගවූ පුසේ ද සිල්වා "නෙට්" තුමා මහත් ශොකයට පත්ව මෙම මෘත කලෙබරය "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වෙන් මොරවුවේ සැකිය නිවසට ගෙණගියේය. මෙම නෝනා මහත්මයාගේ මෘතශරීරය මොරවුවේ සිය නිවසට ගෙණ එන බැව් ඇසූ දහස්ගණන් මොරවු වැසියෝ, එහි අතුරු සිදුරු නොමැති ලෙස රැස්ව සිටියාහ. "නෙට්" තුමා මෘත දේහය සිය නිවසේ තබා තම ප්‍රිය භාය්‍යාවගේ අන්තිම කෘත්‍යය සඳහා විසයුතු සකල කටයුතු ඉටුකිරීමට අනු ජීවික සමූහයා සහ බන්ධුමිත්‍රයන්ද නියුකතකරවීය.

පසු දින එනම; 15 වෙනි ගුරු දින උදය පටන් කොළඹින්ද, ගල්කිස්සෙන්ද, කළුතරින්ද, පසියාගලින්ද, මිගමුවෙන්ද, මාතිච්ල පලාත් වලින්, සහ වෙනත් ඈත් පලාත්වලින්ද දහස් ගණන් සේනාව මොරටුවට පැමිණ මොරටු වැසියන් සමග එකතැනට රැසිතුනවීමෙන් සවස් වෙන අතර මහත් සෙනගක් දර්ශනයවිය. පුණ්‍යවන්ත මෙම නෝනා මහත්මයා ගැණ දුක ප්‍රකාශ කිරීම සඳහා දෙහෝ භූමදානය පිණිස මෘත දෙහය ගෙණයාමට ඉතා ආසනනවෙනකල අකාල මෙඝයක් ඇතිවීමෙන් රැස්වූ මහත් සේනාවට විකෘ භීරිහැරයක්ද විය. එසේද උවත් වළිඹාව ගැණ කිසිවෙක් කිසි සැලකිල්ලකට නොපැමිණ සිටියදී මළවුන්ගේ මෙහෙයට කලින් මොරටුවට පැමිණ සිටි ගුරුප්‍රසාදින් වහන්සේලා ගෘහයට පැමිණ මෘත කලෙබරය "බෙන්සාරු" කළහ. එකල කිට්ටුවර වැදගත් කිපදෙනකු විසින් අලඞ්කාරයට තනනලද මිනිපෙට්ටිය කරපිට නංවාගත් ඉක්බිති, පෙරටම "වොලන්ටියර් බෑන්ඩ්" කණ්ඩායමද, ඒ ලහට මිසමේ නොයෙක් දෙවස්ථානවලට හිමි කුරුස සිරියස් කොඩිගත් සමූහයාද ඒ එක්ක ගුරු ප්‍රසාදින් වහන්සේලාද, ඒ ලහට මෘත දෙහය බහාලූ මිනිපෙට්ටියද, ඒ පසු මහත් සමූහයද පපි පාපිය නොබිඳ ගමන්කළ ලිලාව ඉතා අගය වඩන අන්දමට සිදුවිය. මොරටුවේ ශුඩවූ සෙබස්තියන් දෙව්මැදුරට මෘත දෙහය ලූ මිනි පෙට්ටිය ගෙණ සුදුනම් කරණලද අලඞ්කාර ඉපිපංදම් ආලොකයෙන් බබලනලද මළස්න (ආසඤ්ඤය) මතුපිට තැබූ ඉක්බිති විගාරි ජනරාල් දෙනම ඇතුළුව ගුරු ප්‍රසාදින් වහන්සේලා සොළොස් නමක්ද, ගුරුවෘතතිය පුනුඹුකරණ සහොදරයෝ දෙලොස්නමක්ද, ක්‍රිස්තියානි සහොදරවරු තෙනමක්ද යන එක්තිස් නමකගේ ආධාර ඇතුව අතිගරු **ක්‍රිස්තොප්පර් අර්නැස්ට් බොන්ජන්** ධර්මාචාර්‍ය අග රාජ ගුරු ස්වාමීන්වහන්සේ විසින් ගරු ගම්භීර ලෙස මළවුන්ගේ මෙහෙය පවත්වනලදී. *

* වර්ෂ එක්දහස් අටසිය අසූහතේ දෙසැම්බර් මස විසිදෙවෙනි ගුරුදින (වර්ෂ 1887 දෙ. ම. 22.) නිකුත්කළ ඥානාලෝක ප්‍රදීපයේ පෙණෙන ආකාරයට මෙබඳු ගරු ගම්භීර ලෙසට පැවැත්වූ මළවුන්ගේ මෙහෙයක් මීටප්‍රථම කවර කලකවත් සිදුවූ බව නොපෙණේ.

"ගුරුප්‍රසාදින් වහන්සේලා ප්‍රසන්නානොචිත ශ්‍රුතිකා ගායනා කළ පසු අතිගරු අගරාජ ගුරුප්‍රසාදින් වහන්සේ ආසනයෙන් බැස දෙවස්ථාන අභ්‍යන්තරයේ කපා සූදුනම් කළ වළ සමීපයට සපැමිණ "ඝ්‍රාමීන්වහන්සේ තුළ නස්න්නෝ භාග්‍යවන්තයෝය" යන "පත්‍යෂ පොතේ" වාක්‍ය මාතෘකාවට ගෙණ දෙශනාවක් කෙළේය. "මරණය සියල්ලම මනුෂ්‍යයන්ට අසිනිවූ බැවින් අපේ නෑදෑ මිත්‍රයෝ නැසි යන විට එය අපට පුදුමයක් නොවන බවද, ඝ්‍රාමීන්වහන්සේ තුළ නැසී යාම අවාසනාවක් නොව, වාසනාවක් බවද, පාඩුවක් නොව ලාභයක් බවද, දෙවියන්වහන්සේට මෙහෙවර කරමින් සිට නැසියාම පරාජයවීමක් නොව ජයගැම්මක් බවද, මරණය නම් කනගාටු කරදරයන්ගෙන් මිදී, නිත්‍ය වාසනාවන්තකමට පැමිණීම බවද මේ ලොකයේදී අපි කරන්ට යෙදුන සියලුම යහපත් කාරණා සඳහා ලැබෙන්ට යුතු තෑග්ග අත්කරගැණීමට යාම බවද, මළගිය නෝනා මහත්මයා ගැණ කථාකරණ අතර ඇගේ ගරුකටයුතු ඝ්‍රාමී පුරුෂයා විසින් කළාවූ ගණනාතික්‍රාන්ත යහපත් වැඩ වලින් ඈවද කොටසක් ඛ්‍රිම්බවද මෙම සිල්වා නෝනා මහත්මයාගේ මෘතශරීරය භූමදාන කිරීමට යන මේ දෙවස්ථානය සිල්වා මහතාගේ ත්‍යාගිවන්ත භාවයට සාක්ෂියක් බවද, මේ මිසමේ මේ මහතානන්ගේ ආධාර නොලැබුන දෙවස්ථානයක්, පාඨශාලාවක් සඳහන් කිරීමට බැරිබවද, පොදුජනයාට පැමිණී විපත්ඛිද, අසරණකමින් සෙනග පෙළෙන තන්ඛිද, සිල්වා මහතා ඔහුන්ගේ සහයට පැමිණෙන අන්දම ගැණද, අගරාජ ගුරුප්‍රසාදින් වහන්සේ සඳහන්කොට ඝ්‍රාමීන්වහන්සේගේ නාමයෙන් දෙන්නාවූ ඇල්දිය කුස්ලානයට පවා විපාක නොලැබී යන්නේ නැතිබවද දෙවා වදුරමින් "ඈ සාමදූනයේ සැතපේවා" යන වචනයන්ගෙන් ව්‍යකතවූ සහ මිහිරිවූ ඉංග්‍රීසි දෙශනාව නිමකර වදුලේය."

මෙසින් පසු අතිගරු චූනවෙල් විගාරි "ජනරාල්" උන්නාන්සේ සමූහයාට ආමන්ත්‍රණයකොට සිංහල භාෂාවෙන් ඉතා සැනසිලි දායක වචන සඵලපයක් ප්‍රකාශ කල ඉක්බිති දෙව්මැදුර තුල සූදානම් කරතිබුනු වලට නෑ ජනයා විසින් මිනිපෙට්ටිය බා අන්තිම කෘත්‍යය අවශාන කරණලදී.

රුස්වූ සේනාව නැවතත් "නෙට්" තුමාගේ නිවසට පැමිණ දුක් ප්‍රකාශ කිරීමෙන් විසිරී ගියාහ. මෙදින සවස හයේ පටන් රෑ අටවනතෙක් "නෙට්" තුමාගේ නිවස ලඟ හඬ හඬා සිටි යාචකයින් අට සියයකට පමණ ශත දෙලහාමාරේ රිදීකාසිය බැගින් මළගිය මහත්මිය වෙනුවෙන් එතුමා විසින් බෙදා දෙනලදී. පසුවදා පෙරවරු අටහමාරට ගුරුප්‍රසාදින් වහන්සේලා පස්නමක් විසින් මළගිය මහත්මියනමට "ඔපිස් පූජාවක්" ඔප්පුකලායින් පසු පෙරදින සවස මෙන් ශත දෙලහාමාර බැගින් යාචකාදීන්ට "නෙට්" තුමාගේ සහසායෙන්ම බෙදා දෙනලදී.

තවද නෝනා මහත්මයා නැසිගිය අට වෙනි දින ඒ පින්වති නමට "නෙට්" තුමා විසින් උදය කාලයේ දහේ පටන් බොහෝ සමූහයාට කෑම් පීම් ආදියෙන් සඬ්ග්‍රහ කරණලදී. දවල් දෙලහේ පටන් සවස අට වනතුරු යාචකයන් තුන්දහකට පමණ රෙදි කවිච් එකසිය විසිපහක්ද, හාල් බුසල් සියයක්ද, මුදලින් ශත දෙලහාමාර බැගින්ද, ලමයින්ට ශත පහබැගින්ද, බෙදා දුන්නේය. මේ සඳහා නොයෙක් දිශාවලින් මොරවුවට පැමුණුන එකම යාචකයෙකුටවත් වචනයක් කොදුරන්ට ඉඩ නොතිබා ඉතා ප්‍රශංසනීයලෙස මේ දානමය පුණ්‍ය කර්මය මොනවට සමාර කෙළේය.

ජූසේ ද සිල්වා "නෙට්" තුමාගේ මෙම නෝනා මහත්මි, කරුණා ගුණයෙන් කොපමණ මහත්ද, යනු සඛකීය සඛාම් පුරුෂයා විසින් පිණට පරිත්‍යාග කළ මහත්

ධන රාශියට මෙම උත්තමියගේ විරුඩයක් නොමැති වීමෙන්ම ඔප්පුවේමය. සඳුන්තුර වෙළනලද සුමනලතාව කරණකොටගෙණ යුවලම සුවඳ බවට සම්ප්‍රාප්තවෙන් නාක්මෙන් පුංසේ ද සිල්වා "නෙට්" තුමා සහ මෙම උත්තමියගේත් සම්බන්ධය නිසා දැනමය සුවඳ පැතිරීමෙන් දුප් මත් යාචක සමූහයාට මඩගල්‍යයක්ම සිදුවූ බව පෙණේ. මෙම මැතිනියගේ ප්‍රිය දුහිතෘ වන **ද සොසිසා ආය්‍යාව** දුප් මත් යාචකාදීන්ට හැම දෑමත් සරණ වීමට හේතුවූයේ, ඈකීය මවගේ ධර්ම මාර්ගයන්හි තම දියනිය ඇසුරුකළ අගය නිසා බව වැටහේ, තම එකම දියනිය මුළු ලොකයා ගෙන් ගෞරව ලබන ස්ථානයට ගෙණ ඒමට කොපමණ පරිශ්‍රමයක් දරන්ට ඇත්ද යනුත්, මේ මැතිනිය බොහෝසේ සුචරිත ධර්මයන්හි පුරුදුව සිටි නිසාම ඈකීය දියනිය ඒ මගට පරිවර්තනය කරලූ බවත් නැනවතුන් විෂයෙහිම ප්‍රමාණ බව පෙණේ. මෝනොමෝ මෙසේ ගුණ යහපත්කමින් උත්තරාඤ්ඣව විසූ කල්‍යාණ වරඟනක් බැව් මැගේ සත් චරිතයෙන් කැඩපතින් මුව බැළුවාසේ පෙණෙන හෙයින් මෙය කියවන සකල සාධූහුම මැගේ මේ උත්තම චරිත අනුව ක්‍රියා කිරීමෙන් මෙලෝ ප්‍රශංසා සහ පරලෝ සැප අත්පත්කර ගණිත්වා!

PART XIII.

POEMS ON
CHEVALIER JUSEY De SILVA.

———:o:———

තෙළෙස්වන අදියර.

ජූසේ ද සිල්වා "චැවලියර්" තුමා
පිළිබඳ ප්‍රබන්ධ.



ප්‍රබන්ධ කාණ්ඩය.

"පානදුරේ අර්නෝල්ඩ් දියෙස් මහත්මයා විසින්
ඔප්පුකරණලද පාළි ගාථා සහ එළු කාව්‍ය.

Pali and Elu Stanzas by Mr. Arnold
Dias of Panadure.

පාළි ගාථා.

සරද සිසිරකනති තාරකා දෙවදනති
සුමන සුරසවනති බිර සිඹු ‘මිපනති
කුමද තුහින තුලේ‍යතතුඛහ කිතනිපප සිඩො
ජයතු ජයතු ඩිමා මනති නසිවි සිල්ව නාමො

සමය නයපවිණො සතහු මතොත හසිහො
සකකුල තිලකාහො ලොක සමහාවනියො
විබුධ ජනවතංසො මනති නසිවි සිල්ව නාමො
හතනි බිලුප සගෙහා දිඝකාලං විහාතු

සුචරිත රත චිතෙතා ධඤඤ පුඤඤ ධිවාසො
විර සතිමති යුතෙතා සඛසිලො සුසිලො
විපුල ධනි ධනිඤ්ඤ කාමදෙ කපපරුතෙකා
හජතු හජතු ලකඛිං මනති නසිවි සිල්ව නාමො

පරිවුතවර බහිඹු ඡපප දෙඹඹු ජාහො
සුජන කුමද දයං පිණයනෙතා සසිව
මනුජ නයන භූතො මනති නසිවි සිල්ව නාමො
සිරිමනු භවමානො දිඝ කාලං විහාතු

එළු කාව්‍ය.

ස ර ද සසඳරහාර සුරගහ නිහර කොඳවන එකබ දු
ස ර ද යසරුස තිලක දසදිගු අගන නලලත ගාමු දු
ස ර ද පඬිමුව කමල පුබුදන නිමල දිනි සුරුවනබ දු
ස ර ද සුරවර කුලුණු ලැබ ලැබ පුසේ සිල්වා මැතිස දු

ප ත ර සුරවර වදන් සිතුලෙස ඉගෙණ සියසින තොස්ක රා
ස ත ර දිගයදි දුබික් ගිමිරුස නොයෙක් දන් කිරණින්ව රා
නි ත ර දුරුකර කුලුඟු හිමපිරු නොයෙක් තැනදිලි සසඳ රා
ප ත ර වමදින නෙවි නමලද ප්‍රසේ සිල්වා මැනිව රා

ස ර ණ ගෙණ නිති තියෙක සුරිදුන්ගේ පසන්කර සිතස රෑ
හ ර ණ මිසදිවූ අදුරු ලකතුල නන්නෙදින්වන් දිනිසු රෑ
පු ර ණ සුසිරින් දහම් සැමදින දනිදු වැනි දින දිනග රෑ
ද ර ණ තුමවන නෙවි නාමය ප්‍රසේ සිල්වා මැතිස රෑ

ලෝසත් දුබික් දුක මහත් තිලිනෙන් නිවාලූ
තුල්වූ නෙවි නමදුරු ඔබවෙත් සතොස් නෙන්
මෙ කව්මඳක් ගුණ වැණුම් සඳහා කෙරෙව්වේ
අර්නෝල්ඩ ඩයස් නමැති මාවිසිනි මැතින්දේ"

———:o:———

"තව්බි අප්පු ගුරුණාන්සේ විසින් ඔප්පුකරණලද
කවි කාව්යන්.

Stanzas composed in honor of the Chevalier
by Tambi Appu Gurunnanse.

———

වි පු ල සිරිපිරි සතැනි තුවුනිති මිහිබටෙව් පුර සුරණි දු
පු ව ළ ගජහය වැහැප්රිය සහ මැදුරු පෙළයෙනි දුලසු දු
ප බ ල මිණිමුතු රජතරන් ඈ දනට ආකරයක් බ දු
ලක ල සුදනට රුසිවූ පියසෙකි මොරවූ නමයුත් පරසි දු

දෙසේ අනෙක පැතුරුණු බය පසැතුවි පිද සකකිරි ලෙ ස
ද සේ දිගුන් බබලන නැගූ කිතුරන් දද පෙළැති නිදෙ ස
ප්‍ර සේ සිල්ව බිදන්සේනා නායක මැතිඳු වෙසෙ ස
ය සේ අනෙක ලැබුවිලසින් තිළිණ ගුණෙන් අගට පිවි ස

ත ම කතොලික සෙබෙකි නෙතැන සැදුමට දෙව්මැදු රෑ
නි ම නැති දනදී සතදිරි වඩවා නෙක අසු රෑ
එ ම ලඟ මඩමුත් සැදුමට සමහර තැන සොදු රෑ
පෙ ම යෙන මිළදී තව කිහ අසා බසින් මදු රෑ

වි ම න් සදෑ ගැණුමට සහ රෝගින් සුවකිරීමට ද
ලු දු න් තරුණ විවා බැදුම් පිණිසෑ නෙක දේට නිබ ඳ
පෙණෙන් ට දෙන පමණට වැඩි සියගුණයක් රහසින්සොඳ
සි ති න් පිනට දෙමින් සතට සිතු මිණමෙන් වැජඹෙනස ඳ

ල බ න් ති බෙ න් නාවු දන්නැති නොක ර
අ ර න් සු ර න් ලොව වදිනා සිතිනිව ර
පෙ මි න් එ දු න් දේ වැඩිවිමෙන් නොහැ ර
ත ම න් වෙනෙන් නට පෙර නිම්නෙව් පව ර

දනෙන කුලෙනගුණනැණයෙන උසස්ව මැතිඳෙක් මනනඳ
ව ස න මෙතතු දැන සෙබපිය වෙසෙස් නසිවි නම දුන් සඳ
පෙමි න මෙලක සෙබිඳු පැවරු සෙටු පිරිසෙන්නී නමල ද
ක ල න මෙ අප මැතිඳු වණනට හැකි නරයා කවුරු ද

ප සු කො ට කිවි බැඳුම් නැන ඇති ඔබගෙ ගු ණ
ව ණ න ට බැර් සෙසින් නිමකොට නිසි ලෙසි ණ
නි ය ග ට සමුදුරෙන්ගත් ජල බිඳක් මෙ ණ
මු සු කො ට තතුකියම් සෙත් කව් යැද සුර ණ

හිහන්නන් පුලන්නන් ලෙඩැත්තන් දනෙක්ලෙස්
පැමිණ්නාවු කල්හි තමාමෙන් සිතාලා
පෙමින් දුක් සියල්ලක් අසාලා විපත් ඒ
මිදුම් වස් මුදල්දෙයි එඒවාට නිත්තෙන්

සුදුස්සක් කියා ආ කලේහි කෙණෙක් යම්
නැතැයි ඒ නොදෙම් ඈ බසක්නම් නොමැත්මැයි
එක්වා සැබෑ බස් විනම් රිට සුත්වූ
දෙයින් නොස් සලස්වා යවයි ඒ තැනැත්තා

දනැත් මැයි වසැත්මැයි බලැත්මයි උසස්වූ
නොමැත් තෙන් සිතක් සව් සතුන් දු පුතුන්වෙව්
මහත්වූ මෙතින්සුත් මැතින්දු උතුම මේ
තෙදුත් දෙව්තුමා නිත් රකීවා සියක්වස්

දෙ ස නොව සියලු වරා පවතින නන් දෙසයෙහි සපුරා
ගො ස යට නෙකි වි වරා තියුණි දිව්රඟ හලසොඳු රා
බෑ ස යස ඟන නො වරා නටනු ලැබූ දන සිත සතොසපු
නො ස යෙන මෙමැති වරා රකිවා නිදුකින් දෙව් පව රා

දිගුලිය ගෙලෙ බන්දූ යස දම් මුතු සිරි උර රන්දූ
සමකොට කුවෙරින්දූ දනයෙන් නරනිදු පෙම් බන්දූ
ගරුතර මෙමැතින්දූ සමගින් දරු මුනුබුරු බන්දූ
රකී නිති සුරඹින්දූ නිදුකින් හිමකොට රිවි ඉන්දූ

සරකර මෙන් ගුණගණ යෙන් පසැ සක්කර
තරසර වන් සැම ඉසුරෙන් වෙසෙ සක්කර
වරසුර පෙම් කොට දුකයෙන් වෙන සක්කර
හරගිර ඔම් රකී මෙතුමන් සතො සක්කර

බිඳ නොයන මුලැත්වූ බෝ මැතින්ගේ උදවතුල්
සොඳ ගුණ සුවදින්හා නෙක් යසස් මල් පලින් යුත්
තෙද සුරණිඳු පෙම්පැන් සිත්විලස්නෙන් ලබාලා
සඳ හිමට බෙජේවා මේ මැතින්දූ සඳුන් රුක්

ගුණ සපිරි රුසින් දෙස් පස් මරුන් බුන්කළාවූ
මන කිරණව තොස්දුන් නෙක් සතන්ගේ මනාසේ
පිනැති මෙමැතිදින්දූ සිනෙකින්වත් නොවී දුක්
දිනක රැතිතුරා සිත්සේ බෙජේවා සිරින් සව්

දූන වැසිව ලා—වෙනි නෙක
දිළිඳු ලොබ ද ළා
මියර බ්දහෙ ළා—සිවු සිරි
ඇතුව පැහැදි ලා

නිමල පුන් ස දූ—විලසින්
නෙදන හඳ කො දූ
නිතින කර න දූ—වැජඹෙන
මෙමැති තුම සො දූ

ලැබූ මෙම දි නා—පරසිදු
නසිවි නම ගැ නා
සතුටු නැති ද නා—කවුරුද
සුගුණ අදුන නා

පළමු වෙනි ව රේ—සිහලෙක්
ලැබූ මෙම දු රේ
සිහලයන් සි රේ—කිරුළක්
වැන්න මනහ රේ

මෙසේ ගුණ යුතා—අප සැම
සතුටුකළ යුතා
සොබන මේ මහ තා—තට අපි
කුමද කටයුතා

පිදුම වතකි නා—පලනැති
සෙසින සතුටි නා
සුරිදු යදිම් නා—නිති සෙත
පතමු බැතියෙ නා

සිල්ව මැති සදා—අද දින
නසිටි නම ලදා
නොසින හැම ලෙදා—බෙපෙවා
සමට දින රදා

පැහැදී වදනිසු රා
සුබැඳී විසි පව රා
වී සුදි මුව තබ රා
සුසැදි ඇති නිත රා

කලඹා දුකු දුරු රා
සුලබා දෙඹිනිසු රා
දුලබා උර මැදු රා
කළඹා ඇති නිත රා

ඇදහුම් කළ පෙම් ණා
සදහම් කර සව ණා
සැබවින් එම ලෙසි ණා
පැවතුම් ඇති සොදි ණා

යුතු වන් සැම කරුණා
තතුමෙන් සිදු කර ණා
පැතුම න් තොසවඬ ණා
මිතුරන් ඇතිසොබණා

සියලා රුපු වෙවු ලා
වැඳලා යන ඇකි ලා
විපුලා තෙද අන ලා
බබලා ඇති නිස ලා

දරණා ගුණ අරු මා
පමණා දූනදිනැ මා
දෙමි නා දන බොහො මා
වසනා මෙම උතු මා

නිරිදුන් හරි සදු නා
විලසින් තම වද නා
බොරුවෙන්නට නොදෙනා
ගරුවන් සිත තිබෙ නා

ගත යෙන් ලෙඩ පිස දා
ඉසුරෙන් තව පහ දා
වැජඹෙන් නට නිබ දා
නිදුකින් රකි සුරි දා

සතර අගනි දුරුර වසන සමවන් ලකහණ මතම් ණ
නිතර දනට උවරණ ඇති මෙමැතිදු අප සතුටු කර ණ
පතර ඉසුරු උතුරුවම්න් දුක්නොව සිහිනෙකින් පම ණ
ලතර කරම රක්වා සුරණ්දු දරු මුනුබුරු සමගි ණ

ස ර ක ර මෙන් බ ද ක ළ මින් පඬිහද කිරිසි න් දු
හි ර ස ර පි න් ඇති මෙමැතින් දුදපිරිවර බ න් දු
සු ර පු ර යෙන් බ ට වි ල සි න් කරුලොව ඉසුරි න් දු
ක ර ද ර පෙ ම නිති නිදු කි න් රකිවා සුරණි න් දු

තැ න තැ න සත රුකුමට කටයුතු ක ර
මනපිනවන බස් පවසන හැමව ර
ගුණ නැ න යුතු මෙමැතිඳු සහ පිරිව ර
දි න දි න වැඩි සිරිදී රකිවා සු ර

වි ක සිත කුසුමෙව් ගුණමොදයෙනි ක ල
ල ක නෙක සතපියවන් මෙමැතිඳු බ ල
නෙ ක සිරිදී සහ දරු මුනුබුරු කැ ල
එ ක නෙත මෙන් රකිවා දෙව් සුනිම ල

ලෙ සි න නිදෙසවූ පුර පස තරි න් දු
කෙ මෙ න ඉසුරුදී කරමින් පඬ න් දු
නි නි න මෙතුම දරු මුනුබුරු සබ න් දු
පෙ ම් න ඇසෙව් රකිවා තෙද සුරි න් දු

නි තර ඉතිරි යසඳුන් සෑම දිගු ලිය නෙත ඇ න් දු
ප තර නසිටි නම ලැබු අප සිල්වා මෙමැති න් දු
න තර නොවම තව සිරි ලැබ බලයෙන් සුරනි න් දු
ස තර දිගුන් අලුකරමින් බෙපෙවා හිමි ඉ න් දු

පි ණ් වූ න දිනසිට කනොලික සබය මොරවූ පිය සේ
සෙ වූ ත න තුර එහි ලැබුගොත් මිණිවැල අග වෙසෙ සේ
සසොබ න මැණිකෙව් මෙමැතිඳු නසිටිව අද දව සේ
නොපමණ තුවු දුනි අපහට පෙරනොම සිදුවූ සේ

ඉ සේ දුරු කිරුළුවැනි අපගේ සොබ න
පු සේ සිල්වා මැතිතුම නසිටි වූ න
වි සේ සයෙන් වණනට බැරියෙන් සුගු න
මෙ සේ නිමකෙළෙම් සෙත ඉල්ලා බැති න

ග ව කු ර දියසිදු සෙවනනෝය කිව්ව ර
ස ම හ ර දන පවසතත් මේ නොවේ එසු ර
මැ නි ව ර මෙම ගුණෙන් අසෙකින සක්විත ර
ගෙණහැ ර පෑම් යන්තම් දැනෙනට හස ර

කි තු ව ස එක දහසට සිය අසූ අටෙන් පැම් නී
මැ සි ම ස සූ විසි වෙනි ගුරුදින විදිවූ ලෙසි නී
සත නො ස ලෙස පුංසේ සිල්වා මැතිතුම නොම් නී
නෙකදෙ ස යස පුරා නසිටි විය සිහලුනතුරෙ නී"

———:o:———

"දෙන් චාර්ලිස් ගුණවර්ධන මහතා විසින් ඔප්පුකරණලද කවි කාව්යන්.

Stanzas in honor of the Chevalier by Mr. Don Charles Goonawardena.

———

ඉන් නි සේ

සදවසෙහි උඩයකුල පිරිසිදුව කිරණවට සඳරැසෙව් පැවතො නා
යැදෙනදන සතුටු සිරි ලබන නිති සිතුම්ණෙව් මෙලක තුළ සතපිනෙන් බබල නා
නදනකළ නිහින අපෙ පුංසේ සිල්වා, මැතිඳු නෙටි වුන බව නිසැකලෙස දැ නා
නෙද සුරිදුහට අයැද සෙත ලැබෙන තුති වදන් පැවසුමට ආමු අවසර ලැබෙණු කුලුණෙ නා

———

සින් දු ව

පුංසේද සිල්වා සේනා නායක මැතිඳුට ජයවේවා.

බෙලන් දෙව්.

වැ ඩ සිදුවෙන සැපි දැන තතු ලෙසි නා
දි ඩ දන්දී යමෙකුට නැති දෙව නා
තු ඩ තුඩ ඇති කිතු ගොස නොව පම නා
මැ ඩ අකුසල් නිවසන මන තුටි නා පුංසේ

සි ත නුල නිරතුරුවම ඇති පත ලා
මෙ ත බලයෙන් සැමසිරි ලැබ නිම ලා
වෙ ත පත් සතුටු කරවන නුමු ලා
ම ත දුරු කිරුළක් වැනි අපි සිය ලා පුසේ

දෙ ව් බස විලසට පිළිපැද සත නී
ස ව් කල දෙනදන් දකිමින් බලැ නී
එ ව් ලෙස සුර පුර යෙන් සිරි කැම නී
ලෙ ව් හිද මෙම සෙවුවිය අප මෙමැ නී පුසේ

ඇ ස ඇ ස රස දුන් වන් දුටු ඇම ගේ
බ ස බ ස තොස යුතු වම ඇති දිව ගේ
අ ස දි ස යස නිර තුරු මෙමැතිඳු ගේ
ද ස දෙස ගොස වැදෙවා සුර පුර ගේ පුසේ"

———:o:———

"අල්විස්ද සිල්වා මහතා විසින් යොදනලද
සංස්කෘත ශ්ලෝක.
Sanskrit verses in honor of the Chevalier by
Mr. Allis De Silva.

———

සුභ්‍රාංශවශැනිහෙතු නිර්මල කුලෙජාතඃඤ්ච වංශධ්වජඃ
පූජ්‍යඃසෛංහල වනීය මඬලපතිඃ කාරුණ්‍ය රත්නාකරඃ
සත්ත්‍වාගෛඃ සුරවෘක්ෂ ජීඅවර ධනී ඤුනිවවාචස්පතිඃ
සෙනා නායක මන්ත්‍රීජීවතු පුසේ සිල්වාභිධානශ්චිරම්.

චන්ද්‍ර රශ්මිය මෙන් ඉනා පිරිසිදුවූ වංශයෙහි උපන්නාවූ සඞකීය වංශයට කේතුවක් බඳුවූ ගරුකටයුතුවූ සිංහල මනුෂ්‍යයන්ගේ සඞාම්වූ කරුණා නමැති මානික්‍යයන්ට උත්පත්තිස්ථානවූ හෙවත් කරුණාවට සමුද්‍රය බඳුවූ යහපත් වසතු පරිත්‍යාගයෙන් කල්ප වෘක්ෂය ජයගත්තාවූ උතුම් ධන ඇත්තාවූ බෘහස්පති සමාන නුවණැත්තාවූ පුසේ සිල්වා සේනානායක මන්ත්‍රීශ්වර තෙම දීඝ කාලයක් ජීවත්වේවා

ධනෙෂා නෂාඟි ප්‍රතිතඃ සුවිපුල යශවා නිලිතඃ සජජනොඝොඃ
ශාස්තුර්විනාං තදථෙවෂය ධන නිකරඃ ශාන්තදරිද්‍ර ශොකඃ
මුකතාමණ්‍යාදිද්‍රවෙෂඩිනපති සදෘශොා නිතෂ සංතුෂ්ටචෙතඃ
මනත්‍රී ජිවෂාත් සදෙවඤ්ච ජන පරිවෘතසෂාකත සමොනා

•රායඃ

පින් ඇත්තාවූ නෂාඟිවන්තාවූ ප්‍රසිඛවූ ඉතා මහත් කීර්ති ඇත්තාවූ සත්පුරුෂ සමූහයා විසින් සතුතිකරණ ලද්දාවූ ශාස්ත්‍ර ඉගෙණගන්නවුන්ගේ ප්‍රයෝජනයෙහි වියදම්කරණ ධන සමූහයක් ඇති සංසිදුවනලද දිලින් දන්ගේ ශොක ඇති මුතු මැණික් ආදි වසතුවෙන් වෙශ්‍රවනයා සමවූ නිරන්තරයෙන් සතුටු සිත් ඇති මේ සේනානායක මනත්‍රීශ්වර තෙම දුරුකරණ ලද සියලු අන්තරාය ඇතිව දරු මුනුබුරු ආදි ඞකීය ජනයා විසින් පිරිවරණ ලදුව සැමකල්හිම ජීවත්වේවා."

——:o:——

"වත්තල පදිඤ්ඤි කන්නන්ගර ආරච්චිගේ දෙන් සාම්යෙල් ප්‍රේරා ගුරුතුමා විසින් ඔප්පු කරණ ලද කවි කාව්‍යයන්.

Stanzas in honor of the Chevalier by
Mr. K. Don Samuel Perera of Wattala.

———

පි ය සු ර ණා ආ සි රි දෙ ම් ණා ලක සැම දිලෙ ණා
සි ල් වා මැ නි ණා
රෝමයෙ ණා නුව රෙහි වස ණා ලියො නම් දර ණා
පා ප් තු ම් වි සි ණා
අ න ඝි ව ණා නෙක රන්කම් ණා නි ම වා නි බෙ ණා
ආ බ ර ණ යෙ ණා
ප ල ඳ ම් ණා නසිරි නම්දර ණා තන තුර දෙම් ණා
බිස් කොප් විසි ණා

දින්දුසෙ නෑ ර ලෑ යපිට දී ර පතුරණ සා ර
රැස්මී යෙ නො
අ න ගිවි සා ර මැනිකක්නෑ ර රී පි ට දී ර
කරති බු නා
ලකනුල නෑ ර රස්මිනු සා ර විහිදන සා ර
පති ලෙසි නා
ලෑ යපිට දී ර මැ නික උදෑ ර ලක සැමතා ර
ලෙ ස දිළු නා

ශුසියා නා ම මුනිවරි පේ ම යෙන් සැ ම දෑ ම
වැඩ වස නා
ආසන සෑ ම දෙව මැදුරේ ම බොන්ජන් නා ම
ගැනි විස නා
ආසිරි බෝ ම දෙවිඳුන් ගේ ම දී ඉ ල් ලා ම
සිතු ලෙසි නා
වටසිවි සෑ ම මන පින වා ම නෙවිනවි නා ම
දුනි එදි නා

සිංහල ඉංග්‍රිසි ලන්දෙසි බන්ගලි ජාවො මරක්කල
සියලු ද නෝ
සන්නසි තුප්පසි වඩුග දෙමළ යන නොගෙක් සෙනග
රැස්වී පිරු නෝ
රංආබරණින් සැරසි පොහොසත් නෝනා මහත්වරු
පිනැති ද නෝ
සන්නොසකින් මේ දනෝ රැස්ව ගොස් මොරවු ග්‍රාම
යෙකි මැදපිරුනෝ

රැලිං රැලට සත් මහ සමුදුර ජල මාරුතයෙන් තුගු
රැල පෙල සේ
පෙලිං පෙලට මහතුන් සහ ජනපෙල අසුපිට නැගු රථ
රිය බොහෝ සේ
පවන් වේගයෙන් ගුදන මදින්මද පියාසරින් බඹරුන්
හඬ සේ
නම්සැ පරසිදු සිල්වා නෙවෙ තුම මොරවු ගමට
පැමිණිය සැප සේ

දේව පනනට යටත් දෙව්දුනු හටත් ජයසිරි මහල ම
දේව සම්මුක ලැබූ මුනිඳුන් හටත් නිති ජය මහල ම
දේව සිරි සබයේ නොයෙක් ගුරු ශ්‍රෙෂ්ඨ ගුරුහට මහලම
දේව ආසිරි වාද ලැබ සිල්වා නෙව් හට මහල ම"

———:o:———

"දෙහිවල පදිංචි කෝට්ට ගොඩගේ ජුලියන් ප්‍රේරා මහතා විසින් ඔප්පුකරණලද කවිකාවියන්.

Stanzas in honor of the Chevalier by Mr. Kottagodage Julian Perera of Dehiwala.

———

ඉන්නිසේ.

චිනර කිතු යුගසසුර තරිද්‍රහර කෙළෙස් කුළ සුරිදු ගජ
කොදලෙසින් අනෙක කිතු ඇතිම නා
පනර මෙම ලක අන්න කිරුළ සිරසෙහි පැලදි උදුල
මැණිකෙව් නිමල අනෙකලෙස රුස්චිහිද බබල නා
පවර සිරි පිරි අමිත ජුසේ සිල්වා මැනිදු නෙව්නම්
උතුම් තනතුරට පත් බව දූ නා
අදර බුහුමන් සහිත දෙව්දුගෙන් සෙත ලැබෙන පබඳ
පවසන පිණිස මෙදින මෙහි පැමුණුනෙමු සතුටි නා

සින්දුව.

සේනානායක ජුසේද සිල්වා මැතිඳුනුමා රකීවා.

දෙවිනුම.

දී න සතට කප්තුරු සිරි උසු ලා
ධ න දෙමින් ලොබ මුල සිඳහැර ලා
මා න ගුණෙන් උතුමන් සිතු ඇද ලා
පා න සදිසිවුන ලකගෙයි නිම ලා සේනා

න න් දෙස ලකනුළ ඇතිදෙව් මැදු රා
පි න් සලකා දිවුරුවු ගැණ නිත රා
ස න් තොස යෙන් දනදී නැති විත රා
ම න් පිනවා නිවසන එක අසු රා සේනා

ම ත් තට සත දියුණා ලන අපි නා
ස ත් සල් සැදුමට දනදුන් නොමි නා
කි ත් ඇති මෙමැතිඳු සිහලුනතුරෙ නා
ප ත් වී නෙවි බුරයට පළමුවෙ නා සේනා

ස ත හ ට වැඩසැදු අපමණ ලක ලා
සි ර ස ට ලූකිරුලෙව් අප සිය ලා
මැ නි ඳු ට සැම සිරිදි පෙමකර ලා
ර කි න ට අයදිමු සුරිඳුන් නිම ලා සේනා

දෙ ස් ලොබ එඩිමද සමගින් පිසු නා
ප ස් මරු බිඳැපිරි යසවක් වලි නා
නො ස් කළ දන කොඳවන ගුණ රැසි නා
දෙ ස් පරසිදුදින මෙමැතිඳු තුරු නා සේනා

දෙ සේ යව ග නිරතුරු බැඳ නිබෙ නා
වි සේ ස කිතුරන් දද ඇති සොඛ නා
ය සේ නිබෙන බෙදම්න්දි නිති නා
නො සේ ලැබී අප මෙමැතිඳු නොමි නා සේනා

ල ක තුල සිහලුන් සැමදන අත රේ
එ ක මෙමැතිඳුමය ලැබුවේ මෙදු රේ
නෙ ක සිරි දෙලොවෙම රැසිනම් මිතු රේ
සැ ක නොව හැසිරෙනු මෙතුමා හස රේ සේනා

ඔ ද කරම්න් සැමදන කිරි සි න් දු
න ද ඉසුරෙන් තව වෙම්න්පසි න් දු
සො ඳ දරු මුනුබුරු සමගින් බ න් දු
මැ ඳ නිදුකින් බෙපෙවා මෙමැති න් දු සේනා"

———:o:———

"ඇප්. ජී. කැතරින් ප්‍රණාන්දු නෝනා මහත්මයා
විසින් රචනා කරණලද එලු සොලෝකයක්.
An Elu Verse by Mrs F. G. Catherine Fernando.

———

දන පල ලබම්න් සත සියොතුන්නෙක්
තුවු රුව් දෙන දිගු තුරුමතැ වෙසෙසේ
අප සියන්ඩ කප්තුර සතවස්
නිදුකින් දෙව් පෙම ජල ලැබැ බෙපෙවා"

"ජේන්. ඇම්. සි. ද සොයිසා නෝනා මහත්මයා
විසින් රචනා කර්ණලද එලු සොලෝකයක්.
An Elu Verse by Miss Jane M. C. de Soysa.

සෙබපියනටුවෙන් හා නෑ සුම්ත්පත් පෙතින්යුත්
ගුණ මොදුනි නසිවිවූ ඇප් මෙසියා සිලිල්දන්
නිරිදු පෙමුදකෙන් යුත්වි සදුකල් මෙලක්විල්
සිදුහි මට බෙජේවා දෙව් බෙලෙන් දුක් නොවිපත්"

———:o:———

"ඇම්. ඇෆ්. මේරිද සොයිසා නෝනාමහත්මයා
විසින් රචනාකරණලද එලු සොලෝකයක්.
An Elu Verse by Miss M. F. Mary de Soysa.

දෙව් පෙම් තෙල් උතුමන් සතොස් වැවින් බෝ
ලැබෑ ලක විමන සදුකලේ උදුල්වා
අප සියන්නි නසිවිසුපාණ ලෙව්හිම්
රුසුපලඟ නසා සිරින් බෙජේවා"

———:o:———

"හැ. සිසිලියා ප්‍රණාන්දු නෝනමහත්මයා විසින්
ඔප්පුකරණලද එලු සොලෝකයක්.
An Elu Verse by Miss H. Cicilia Fernando.

සක කොඳහර ඉන්ද්‍ර මෙන් යසස්පා නසිවිවූ
අප සිරස ඔටුන්නක්වන් මෙ සිල්වා මැහින්ද්‍ර
සියලු ලෙඩ දුකින් වෙන්වී සියක් වස් බෙලෙන්දෙව්
දරු මුනුබුරු හා සිත්සේ බෙජේවා සිරින් සව්"

———:o:———

"හැ. මොරී ලැයිසා ප්‍රණාන්දු නෝනා මහත්මයා
විසින් ඔප්පුකරණලද එලු සොලෝකයක්.
An Elu Verse by Miss H. Mory Leisa Fernando.

ගුණ අමෙන් සතොස්වා සව් සතුන් ලෙව් මනාසේ
රුසුතම යදියන් දුක් ගිම් නසාලා වෙසෙස්නෙන්
මැනිදු සඳපගේ සිල්වා නමින් යුත් නසිවි මේ
බදුතුරු මැදෙහි දෙව් පෙම් ලැබීමෙන් දිලේවා"

"චැවලියර්තුමා පිළිබඳව නාගලුගොමුවේ ජෝන්ද සිල්වා උන්නැහේ විසින් ප්‍රබන්ධකරණලද පොතකින් උපුටාගන්න ලද්දක්.

An Extract from a book on the Investiture of Chevalier Jusey de Silva as Knight of St. Gregory the Great, by Mr. John de Silva of Grandpass.

නි ව් දු ගි න් මනදුක් නොමින් දනයෙන් විපුල්
කලඹක් සදිස්ව න
ස ව් ස ත න් වෙත මෙත් සිතින් යුතු පින්කමින්
සරසා තමන් ම න
මැ ව් ලෙව න් දෙව්දුන් දහම් රැක චෙවලියර්
සිල්වා මැතින් දු න
ස ව් සි රි න් වැජඹේ කියම් සතොසින් මදක්
කවියෙන් මෙලෙස්නෙ න

මෙ මැ තිඳු න් දෙව්දුන් වදන් මුදුනෙන් බැහින්
පිළිගෙණ මෙලක්කු ස
ස ද ව ම් න් සුරමැදුරු සන්තොසයෙන් මුදල්
දෙවම්න් නොයෙක් ලෙ ස
දු ගි ද න න් ලොබ දුරලම්න් තිළිණෙන් උතුම්
සොඳ සිතුම්ණක් ලෙ ස
ත නි මු වෙ න් කෙලෙසක කියම් මෙහි කල නොයෙක්
සුබවැඩ මෙලෝකු ස

එ ක් දහ ස් අටසිය අසූඅටෙ මැයි මසේ සුවිසි වෙනිදි න
නෙක් දහ ස් ගණනක් දනන් කොටහේනේ දෙව්
මැදුරේ සිටිතැ න
ද ක් වම් න් එවූ සන්නසක් ලියොනම් පියා සිල්වා
මැතින් ගැ ණ
එ ක් සැනින් කියවා උතුම් නම දැපි ඒ අගරාජ ගුරුතැ න

මින් පෙරත් අප ලක්දිවේ කිසි සිංහලෙක් නො
ලැබූ මෙ නා ම ය
දැන් උනත් ලැබගන්ට නම් නිසි කවිද මේ පින්
වත් මැනී ම ය
දැන් දෙතත් බුසලෙන් මිසක් ඔය හුන්ඩුවෙන්
මැතුමක් නොමැත් ම ය
දැන් කියත් තුති නෙක් දනෝ පතුරා මැතින්දුගෙ
නෙක් මහි ම ය"

——:o:——

"ඒ. මැන්ඩිස් ලමානැනි විසින් නෙවි තුමාට
ඔප්පු කරණලද එලු කව් සිලෝ.
Verses composed by Mrs. E. Mendis.

ස පැ මි නි නෙවි නම් පුසේ සිල්වා පත ර
ද කි මි නි ගොසින් බුහුමන් අදර බෝක ර
ව දි මි නි යුවල පදසර මුදුනදී ක ර
දෙ ව මි නි මෙපත අවසර රැගෙණ තෝව ර

පිරිසිදු දෙකුලෙන් යුත්වූ සරත් පුන්සඳුන්සේ
පිරිතිරි සැප ලද්දාවූ පුසේ සිල්වා නම් ලත්
මෙමැතිදුට නෙවි නම් නාමයක් ලත් පසන්නා
අප දෙවිදු මවුන් රක්නේ සියක් වස් දිදිසෙත්

මහතුමනි පුසේ සිල්ව නෙවි නම් උතුම්වූ
ඔබ මෙලොව ලබන්නාවූ පසංසා මෙලෙස්නෙන්
ලැබ පරලොවදිත් ඒමේ විලස් දෙවිමවුන් ගෙන්
අප හැම දෙනටත් පිහිටක් ලබා දෙන්ට ඉල්ලම්

පරදෙස ගොස් සිටින ඔබ මුතුපුර න් නේ
පෙරවන දියුනුවත් බලමින් තොසි න් නේ
ගරුවන මෙම නමේ සිරිවිඳ එමේ න් නේ
දෙරනත සියක් වස් දෙවිමව් රැකදෙ න් නේ

තුවි න් සිත ඔබට ලැබූ නාමයට මෙ ම
බ සි න් තුති එවන සුළුවූ මෙම ලියූ ම
කිවි න් බස් ලෙසට ඇතිමුත් වරද සැ ම
සිති න් හැරදමා ගනු මගෙ සතුටු ක ම"

"ගාබ්‍රියෙල්ද සිල්වා මහතාගේ අයදීමෙන්
කොලමෙන්ති පෑලිස් අභයගුණතිලක උන්නැහේ
විසින් රචණාකරණලද කාව්‍ය.
Verses composed by Mr. C. F. Abeyagoonatilaka
at the request of Mr. Gabriel De Silva.

පෙර ලිඳමුල මුල්තැන්පත් මහත්මාට පුත්වූ
වර මැහිඳු පටන් ඒ පේදුරු සිල්ව නම්සුත්
ප්‍රසිදු උතුමෙක්වූ මේ පුංසේ සිල්ව දක්වා
සුර ඇදහිලි ගත්කල් තුන්සියක් වස් පෙණෙන්නා
මෙම පමණ ඉතා දික්වූ මහත්කල් මුළුල්ලේ
වැලඳ ගණ ගෙණාවාවූ කතෝලික නම්ලත්
සමය ගැණ එකී ගොත්හි දනෝ බෝ පෙරේමෙන්
නොව පමණ නෙදුක් පීඩා ලැබූ ලන්දෙසින් ගෙන

එබඳු රුදුරු පීඩාවන් ලබාගත් කැනැත්තෝ
මැතිඳු පෙලපතේ බෝවූය එබැව් බලාලා
දෙවිඳු තුම විසින් විස්වාසයේ ගල්ටැඹක්මෙන්
පසිඳු පුංසෙද සිල්වා පත් කලේයයි හඟිමි මම්

ගුණ නැන මෙදෙකින්හා කිත්රැසින් තේජසින්හා
අප මණ දනයෙන් එක්වන් වැඩි සිත්පරිද්දෙන්
පැමිණෙන නොසමාගම්හි කතාබස්කිරීමෙන්
කොටල න වෙලඳම් ආදි සියල්ලෙන් දිනාලා

එමෙණ දවසරින්නාවූ උතුම් මේ මැතිඳු
පමණ නැතුව එන්නාවූ දුඃදුප්පතුන්වෙත්
ගණන කල නොහැක්කාවූ නොයෙක් දේද දීමෙන්
සදන පිණිස දුන් බෝවූ මුදල් දෙව්විමන් ඈ

මේ අන්දම් නොයෙකුත් කුසල් කරලමින් ඉන්නා
කලෙක්හි සොඳින්
බෝ සන්නොස් සුරිඳුන් විසින් පිරිසිදුවූතුම් පියානන්
කෙරෙන්
මේ දැන් හෝ පෙර සිංහලෙක්හට නුදුන්නාවූ නසිටි
නම් නමක්
දුන්නෙන් බෝ බුහුමන්ලබා මොරවූපත් මේ පින්වතා
නින් බලව්

ඉ ති න් මෙ නසිවිනම් උතුම්වූ මැතින්දු
දු ගි න් හා මගින්වෙත් පෙරේමෙ කිරිමෙන්
ස කි න් නැසියන් හා හිතේසින් මැදිමෙ
බෙලෙ න් දෙව් නිදුක්වි දිනේවා දිනේවා

උ තු ම් දෙවිමැදුරේ පිරිසෙන්නිනම් යුත්
සු ර ම් වූ නිලේලුත් පසන් මේ මැතින්දු
බි ර ම් රෝදුකක් ලංනොවිමෙන් මදක්වත්
නොහිම් කල් බෙලෙන් දෙව් දිනේවා දිනේවා

මෙ ල ක් දිව් උසස් පෝසතුන්හා සමානැයි
නොයෙ ක් සත් කියත්මුත් නිලිනෙන් මදක්වත්
ය මෙ ක් එක්නුවූ මේ නසිවිනම් මැතින්දු
පි යෙ ක් වී දුගින්ගේ දිනේවා දිනේවා

නොයෙ ක් දෙව් විමන් සිප්සැලන්හා මඩම් ඈ
නැ ත ක් දේ මුදල්දි කෙරෙව මේ මැතින්දු
ම ද ක් වත් කිසින් හානියක් ලංනොවිමෙන්
උ ද ක් දෙවිබෙලෙන් නිත් දිනේවා දිනේවා

ලි ඳ මුල කුල ආකාසේ සදුනන් සදිස්නා
සො ඳ සිහළ දනන්ගේ එක් ඉතා උස් කොතක්වූ
තෙ ද යස පතළාවූ මේ නසිවිනම් මහත්මා
ම ද නොවන සිරින් බෝවාකලෙක්හි දිනේවා

සි රි ලක වැසියන්ගේ සත්කතෝලික නම්ලත්
දි රි තරවූ ටැඹක්සේ මේ නසිවිනම් මැතින්දු
පි රි යස ඉසුරෙන් දුල්වා සුරක්නා ලෙසින් ඈප්
පි රි සිදු තියඑක්නම් දෙවිතුමානන් යදිමෙමු”

—:o:—

“ලි. සෙත්වන්ද සිල්වා අන්නවි මහතා විසින් “නෙට්ටි” තුමා ගැන රචනාකරණලද ප්‍රබන්ධයක්.

A song sung before the Knight by Mr. Stephen de Silva Annavi.

—

රා ග ය.

ගුවන්තල පුණි සොම් උදුවූ ලෙස අනගි සව සිරින් පසිදුවම නම්දුරු මොරවු නම් පුරවරට කප්තුරසෙ නේක ලංකාරෙණා.

විකුන් අගනරපතිසෙ පබල ජන පිරිවරා සතතකල් ක්ෂිරබර මොවෙකුයුර දුගිදනට සරණදෙන බවඅනේක දේසවල පතලවී යාමෙනා.

නමින් ගරු රෝමපුර උතුම් ලියෝ තෙළෙස්වෙනි පාප්තුමා සුඛාසනයෙ අනුශාසනෙන් "නෙව්" නමදී එවව ඉතා සොමනසයෙනා.

උතුම් වංශාධිපති ලිඳමුලගේ පුසේද සිල්වා ප්‍රසිදුනත මනත්‍රීශ්වරයානන්ට සකලාඟි වෘධි ජය අසතුවේ ප්‍රන මිතම් දින දිනා.

සිංහල.

කිත් යුත් සුර ජයසතු—පිත් පුත් සප්‍රිතු සාන්තු—ති එක දෙවිදු රැකදෙන්—මේ අග්‍රමනත්‍රී—කිත් යුත් සුර ජයසතු—පිත් පුත් සප්‍රිතු සාන්තු—තියෙක දෙවිදුනිති—සෙත්දි දිරකිනුමැති, නරතුරු නිග පහකරමින් එකහින—දිනි සුරුමෙන් සෙත සලසා දිමෙන—නැන දුරු යුතු චිත්‍රම මැති සත්ගුන—සුරමුරුබලපා රැකදෙනු අදරින—කිත් යුත්.

සඳට සමන පරසිදු මොරවුව යන මෙම පියසේ—ගජ මැදට පැනපු සිහරදෙකු සමන බලදුරු බොහොසේ—නිබඳ මෙලඟ දුගිමයි රැක පින් කරණ යසසේ—ලිඳ මුලගේ පුසේ සිල්වා පිරිසේනනිද මනත්‍රීශ්වර සතොසේ, ඉන්ඩ ගෙවල් වතු ආහර පැලදුම්—දෙන්ඩ සරණ මිලනැති කනාවන්—වෙන්ඩ පිහිට ඉල්ලන දුගි දිලිදු—වන්ඩ දෙමින් මිල බොහො ශබ්දවෙන්—කිත් යුත්.

සොමනස් බරිතගුණ—මනත්‍රීශ්වර සොභන—ගිම රැස් ලෙස සුරණ—දෙමනස් නිවාරකින, සත්‍යා වේද විශ්වාසව ඇදහිලි වඳනා—කර—නිත්‍ය ජිවතුන් වෙත ධම්බල පෙන්වනා—මිත්‍යා දෘෂ්ටි අන්සමයන්වල අය පහදනා—එක චිත්‍ය සමාදුනය ඇති මනත්‍රීශ්වරනා තනන්ඩ දේව විමන් දස දෙස්වල—දෙමින් පවුඩ සිය දහස් ගණන් මිල—මෙපින් කරණ බව රෝමෙට තද බල—ලෙසින් පතලවී ගිය සඳ සිතුලොලු, නමින් ලියෝ දසතුන්වෙනි පැවතෙන—උතුන් පාප්තුම සොඳලෙස දුනගන—මෙවංශා ධිපති "නෙව්" නාමෙ ගෙන—දුනින් සිහළ ජනහට පෙර නොලැබුන—කිත් යුත්.

රන්මිනි බැඳිමකුට මෙන්සිරි ලකසැමට—වංශාධිපති මැතිට—දෙන්නට අනලෙසට, අති ගෞරවණීයවූ බොන්ජන් යන—රැති අගරාජ බිසොප් සාමිද ගුන—මැතිට එව්ව අසතයදී නොලසින—නිති දරණ හකනියෙ සොමිනස ගැණ—කිත් යුත්.

නගා තිබෙන කොටගේනෙ සන්ත එසි ආසන දෙව මැදුරත්—මෙම—විගාරි පදවියෙ බිසොප් සාමිහට අසිති විමන් සැමටත්—ලඟාවෙමින නිසිලෙස විමසා කටයුතු කාරණා විණිසත්—එකරහාම අරමුනුකරදී එ පිරිසෙන්තිද යණ නිලයත්, පිනාද පුන් සප්‍රිතු සාන්තු බල—මෙතා ත්‍රී එක උත්තම මුරුදේ වාදුළ—සත්ප්‍රසාද ආසිරිදී ඛිමකර—චක්‍ර මෙමම තෙද කුමරෙකු ලෙස සුර—සාර චන්ද්‍ර රැස්විහිදු විලසින—තාරපති සෙගුන දූරු මැති සසොහන—දිර තුරඟ බැඳි වාහන නගිමින—නෑර ගමන්ගත් කල දෙපසේ ජන—කිත් යුත්.

කීර්ති ගොඝනිලෝ දස දෙස පැතිරෙණලෙස චිකුමැති සොහනා—සිත—ප්‍රීති වඩන පඤතුයෂා නද කරමින් නෙක සිරිහර්නා—මෙලෙසින් සකල සිය—බන්ධු මිතුරුවර—ඒකඝින් මැහි වැලඳ ගනිමින් සතුටුකර—කල්‍යාන බෑන තුවන් පුන්සඳමෙන—තුල් තෙද නඩු අදි කරණ සත ගැන—ලොල් වන සොසිසා මැතිදුගෙ සෝභන—කොල්ඵ පිටියෙ ඒ වලව්වට සැපමින, වසින් ඒක්වා දහසින් අටසිය අසූ අවට පැමිනි මැසි විසිනමවෙනි දින—සොඳින අහර පානද ලැබ විද පසු නොසිට මෙවෙනි සියපුරයට වැඩ මුන—කිත් යුත්.

සිසිරකර විලසිනු—සුසිර බබලවම්නු—සසර සැප සුර නිනු—පතර මැතිට නොරනු—ඉදුසැව් රිවිසොම් මඩලද—සුරලෙවු දියතුන් අහසද—සැම මැවු සුරවරමින් සොඳ ගුණලැවු මැති රකිනු නිබඳ, කමාවදී පවුකාර සතට රුදු—සමාදයට වැඩි ජේසුස් සුරනිදු—පෙමා සිතින් නෙත් යොමවා පරසිදු—නිමා දුඃඛ රැකදෙනු මේ මැති සදු—ලෝකරු පුත්සැදු සුඛ සභාවට—පේදුරු අපෝසතුළු පන්කලෙ මුල්කොට—ඒ ගරු ශ්‍රධාසනයෙන් නිකුත් කොට—මේ වරලැබු ප්‍රසේ සිල්වා මනත්‍රීට—කිත් යුත්.

මම හැනි පමණ නැන—යෙන් ගොතා කියන මෙන—යන්දෙෂ සිත නොගෙන—වෙන්කමා පඬි විසින, මැතිඳු වංශ අදිපති උතුමානන්—පසිඳු දරුවො මුතුබුරු සැම බදුවන්—කෙබඳු දිනකවත් දුක් ලංනොවෙමින්—සුරිඳු බෙලෙන් ආසිරි සලසා දෙන්, සකල සතට පිහිටන ගරු ප්‍රේමෙන—නිමල කානනි මවුමරි ඔබ කුළුණෙන—සකල සුභා සිරිසෙතදී දින දින—විපුල මෙමැති රූකදෙතුකර අදරින, යන්තමවත් නිග නොදෙනා ලෙස ලැය—නන්ත දේව අදහාසෙට ඇති ප්‍රිය—වන්ත කරුණ ගුන දරණ මහිමය—සන්ත ආන මව්වනි මැති රකිතුය, රක්ෂාදිකාර පිතා සන්පුසේ නම්—ඉෂ්ට ප්‍රේම ඔබෙ සාන්තු වරතුම්—මෝක්ෂවාදි හගවත් මුන්වරයන්—දුක්ෂ නොදි රකුදෙවු දුතු සමගිත්—මහද නැනින් බස් මෙවන් අල්වා—පබඳ මැතිට සතුතින් ලොල්වා—මෙපද කලේ විශ්වාසෙන් ඉල්වා—නමද අන්නවි ඉස්තේවන් සිල්වා—කිත් යුත්.”

———:o:———

උපමා රත්නාදර්ශය.

“(මෙවක් පටන් පොත අන්තිම දක්වා සිංහල භාෂා තත්වජ්ඤනයෙහි අති දක්ෂ දෙන් අද්‍රිස් තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මාතර පලාතේ මුහන්දිරම් මැතිතුමාගේ ශිෂ්‍යවූ කොළඹ කොටහේනේ කතෝලික ශාස්ත්‍ර ශාලාවේ ගුරු තනතුර දරු ජොශප් ළුවිස් ජයවීර නොහොත් සුවාරිස් ජයවීර මහත්මයා විසින් කරණ ලද ප්‍රබන්ධ බව සැලකිය යුතුයි.)

(Stanzas by Mr. Joseph Louis Jayawira, the late Teacher of the Normal School, Kotahena.)

සෙලෙසුවම්.

සරණ ලෙව් නිර තු රු
හරණ තම සැම දියතු රු
පුවල නෙද බල දු රු
නැමද අප සුරවරණ දිවසු රු

දෙමින් බැතින් නෙක් තුති දෙව මවුන්හා
උතුම් ප්‍රසේ ඈ මුනිඳුන්හටත් සව්
උවම් රුවන්දම් මෙනමින් දැතුම්ලෙස්
කරවි පොතක් මම් හෙලදිව් බසින් ක්‍රව්

ප්‍රවරතර සකල ශ්‍රී සෞභාග්‍යෝපලක්ෂිත මොරවු ග්‍රාමවාසි විමල ගුණාභරණ විභූසිත ධනවත් ප්‍රසේද සිල්වා මහත්මයාට අප ගුඩොත්තම පියානන් විසින් ශුඛවූ මහ ශ්‍රීගෝරි පඤ්ඤතියේ නෙවි නම් උතුම් තනතුර නමැති කිරුළ පැලඳවීම අරභයා එකී මහතාට සතුති වසයෙන් මෙම කුඩා සඞ්ග්‍රහය කරණ බව ආදිකොට දක්වා, මෙහි ව්‍යාකරණාදි යම් යම් දෙස් ඇතද පඬි දනෝ ඒ ඉවසා ගණිමින් මේ ගැන මා විසින් ගෙන තිබෙන උත්සහයට සොම්නස්වෙත්වා යන ප්‍රාර්ථනාවෙන් පළමුකොට පතර තුඹ විමන් සෙල් යනාදි ශ්ලෝකයෙන් ප්‍රාරම්භකරම්.

පත ර තුඹ විමන් සෙල් නෙක් දනන් කැන් රුසින් මින්
නත ර රිය නැවින් දුල්වූ සැපත් යුත් අඹුස්නෙන්
අඹ ර ලෙල විමන් කොත් නිරදෙව් ලෙව් හුවන්ගත්
ප ව ර මොරවුවැස් නම් ලත් විසල්වූ ගමෙක්වේ

සු රා දු ගුණ රුසින් සත් ලෙව් දනන් සිත් කොඳන් නොස්
නොම දු තුති වදන් සත්සේ වෙලින් නිත් වැසෙන්නා
මැ ති දු වර ගහන් සෙව් සත් අහිත් රුස් නමස් බුන්
ප සි දු මැතිසදෙක් ඒ ගම්විසත්හි වසන්නේ

සුරිදු බස බසින් පුල් නෙක් සැපත් පත් පෙලින් දුල්
නැනිදු කෙමින් යුත්වූසේ කමල් තුල් දිමුත්වූ
කුලඟ පහ දෙදෙක්වන් සත්කෙරේහි මවෙක්වන්
මෙමැති සඳ නමින් යුත්වේ ප්‍රසේ සිල්ව යුත්සත්

සකලිසුරෙනි යුත්වූ මේ මහත්මා පසන්නා
සසුරුගුණ අඹුස් කව් බස් සැවින් දෙව් ලකල්වූ
රුගෙණ ලඟ දනන්ගේ සිත් සරන්හි පිරුම්වස්
මෙලෙස මම කරම් තැත් රොස්නොවත් අන් මැතින්දෙ

මෙමැති සඳ විමල් කිත් රැස්වෙවි රැස් දිමුත්වූ
උලැඟිව දිවයත් ඒ යානොදී ඇප් සුරින්දු
මුදුලොවට පෙණෙන්නාසේ අහස්කුස් ගහන්රැස්
පිඩු පිඩු කොට තිබ්බාදෝ හඟිමි මම් වෙසෙස්නෙන්

මැති සඳ කැළුමන් කිත්ලෙව් සියල් තැන් පිරී ගොස්
සුහද දන කොඳන් නොස්වූ සඳේහි වෙසෙස් නෙන්
සමහර මැහිදුන් සිත්සේ කමල් පුල් අහිත්වූ
නොහැර පෙර දිලුම් බැව් කොස් විලස්නෙන් සිරිදෝ

පිවිතුරු ගුණරුන්දූ දෙස්හි දෙස්හි පසින්දූ
යසඟිය මෙමැතින්දුගේ පුංසේ සිල්ව නම් යුත්
පසිඳු මැති සබාතුල්හි රැහුම්ගත් සඳේහි
නොගයනට සමත්වෙත් කොස් කෙනෙක් ලෙව සමත්මේ

යස යස නි ලී සිරි ලක්දිව් රජේ නි නී
රඟ තෙද දි ලී ගඟව් බෙර නදින් රැ නී
බැමු සඳ සෙ ලී දිසි අඹරත ගහන් පෙ නී
වි සු රැ ණ තු ලී මුතුහරවෙල දවල ව නී

යස සුවඳ අසාලා මේ මැතින්දු පියුම්පුල්
කිවිගණ බිහුකැන් සිත්සේ නිතින්වෙත් සැපත්වී
දෙන විතරණ රොන් ගන්මින් නිකුත්වී සතොස්පත්
මනහර තුති කව්ය රැව්දිදී යත් වෙසෙස්නෙන්

රැ ස සේ නිහරහර කොඳ පැර යුර සස ර
ය ස සේ වරණ මෙදියත රණකර තස ර
වි ය සේ සිඟල් කැල යස විරිදු මැතිව ර
මෙලෙසේ කෙනෙක් කොඳ අන් තැනක ලොවතු ර

තෙද අගිනි විකුම් තුන් සෙල් මතේහි විමල්වූ
යසහර පැසුනාවූ මේ මැතින්දුගෙ දුල්වූ
බහනලද මෙසේ කව් රන්තලන්හි වෙසෙස්නෙන්
ගෙණ සවන අතින් නොස් පත්නොවන්නෙක් සිරිදෝ

මැ ති ඳු න් ශසස අණවතුරු උතුරු සුවිය ත
කි වි ඳු න් පොරණ කව් නැව්වත් නොහැකය ත
ම වි සි න් ගොතන ලද කව් යතුරු නොනැව ත
කෙලෙසි න් යතුරු කළහැකි නොගිලී එක ත

හිරු ගහණ දවස් පුන් ඒ පෙදෙස්හි නිවස්නා
සියලූ දන වෙලාරුස් ඒ බලත් තන්හි තන්හි
අදිසිව යත මිපන් යස් සිතාලා සොමානෙත්
මැතිඳු රිය නැඟී යන්නා බලා උන්හ සිත්සේ

මෙ මැ ති මි තු රු තෙද විකුමුද යගට ප ත
රු ඳු රු ස තු රු ගන ගණ්ඳුරු කෙලෙස ව ත
ම් තු ද නෙ තු රු කැල පිරියස ඔවුන ස ත
නො ප ත මි තු රු සර පොබ කිවි බිඟුට සෙ ත

ශිමි ස ඳ සඳ කිමසර කුමුදු පියස ද
හැ ම ස ඳ ඔබ පසෙක ඇති කැලල මැනව ද
මැ ති ස ඳ ප්‍රසේ සිල්වා නමැති තඳ තෙ ද
අ ග වැ ද දූවිනි කහටත් නොකිය තතුලෙ ද

දිනිඳු මඩල කෙම් පුතුවන ලකා ලා—එම
කිරණ කෙසරු දල දල අග වත ලා
පවර මෙමැති සඳ තෙද රත කම ලා—මෙදි
යත සර නිති පවත්වම සුපු ලා

සුරුන්දු විමල් කිත් සඳුන් දික්බිතන්හි
විකුම් සි රදුන් මෙ මැතින්ඳු පසින්දු
මෙලක් දිව් අරන්හි සරත් අන් මැතින්දුන්
විකුම්මත් ගජන් ලෙස් නොවන්නේ කෙසේදෝ

ගසත මැතින් නොමතුල් විකුම් යඳණ්ඩෙන්
පසිඳු නොයෙක් පරදෙස් මැතින් අසුන්ටත්
නොහැකි රුඳුම් නොමවත් මෙලක් මැතින් අන්
කොටලු රැලක් කිම ලෙස් රුඳුම් කෙරේදෝ

පැවති මෙලක්දිව කුස් අහස් මැහින්ගේ
පලහ විකුම් තෙද රැස් සහස් රුපුන්ගේ
ගහණකෙළේ නොව තැන් යලින් ඔවුන්ගේ
යසද නිසා කර ඒ ලෙසින් කෙළේ අත්

සඳට වදින ඇත්තෝ මේ මැහින්දුගෙ දුල්වූ
සොම් ගුණ දකිමින් ගොස් පුන් සඳෙක්මැයි සිතාලා
පිළි මිණි දපනින් දිස්නා සඳේසේ විමල්වූ
දෙපලටම වදින් මේලෙස් කොතැන්හි කෙරේවෝ

ප සි දු නෙදෙස දෙස තුරු උතුරු සරුව න
මෙ බ දු යස තෙදග විකුමෙන් යුතු සුගු න
කි වි දු සැම දිවග රහ තුති ලිය රහ න
මැ නි දු හැර කෙනෙක් කොඳ සිරි ලක වස න

තවද මෙමැති සුරුතුම්වන සැමටම අති පිරිසිදුව න
එකම කතෝලික ආගම කෙරෙහි මහත් සිතුබැතියෙ න
පුදුම ලෙසින් බොහෝ දන වියදම්කරමින් එහි වැඩ ගැ න
පවති යෙහෙන් ලක රදනිය මුදුනත මිණි කිරුළක් මෙ න

ප තර කොළඹ කොටහේනේ ලුසියාසන දෙව්මැදුර ට
අ ද ර බැතින් රුපියල් දසදහසක් පුදකෙළේ සතු ට
ප ව ර මොරටු ගම් සුපිහිටි සෙබස්තියන් සුර මැදුර ට
නි ත ර කරණ පුද සමගින් වැඩිවෙයි හැත්තෑ දහක ට

මෙව න් තවත් දෙව්මැදුරන්හි දිසුණුව සලකා ග ණ
ප වු න් පනහ සියේ දෙසියද තුන් සිව් සියේ බැගි ණ
සි කි න් අදර සුමුකර එකිනෙකට පුදු තිබෙන ගන ණ
ලෙසින් කවර පවසති ලොව කවරෙක් තතු ලෙස දැනගණ

ත ව ත් නොයෙක් වර අප රට සඳෙහි දුබික් දුක් පැමුණුන
ලෙසින් සිරද අබිරුව හිඳ කැඳවා දුගි දන නොපම ණ
දෙමින් සහල් පිලි ඈ උපකරණ සමග මුදල් නොමි න
ප හ න් කෙළේ මේ ලෙස වෙන කවරෙක් ලක් දිවෙහි වසන

මෙසේ ශරීර වශයෙන් ඉතා ලුහුඬින් දක්වා අලඞ්කාර මාත්‍රයකින්ද ඒ මෙසේ හඟවමි.

ගනබ මෙමැතිදුන්ගේ යුත් උතුමවූ පිනෙන්මින්
නිලිනට පැරදීමෙන් පත් ලදින් මෙන් මහත්වූ
කලුව පොද සිලිල් සක් නිත් හෙලීමෙන් නොහිමසේ
මෙන දිනි වලපින්නා වැන්න දක්වා බලාදත්

පි න ව න සුමුදු ගුණ පිපි කුසුමැති අර ද
සැ දි ග න දල ඉසුරු යුත් සර හරින් සො ඳ
ම න ඉම න මෙම මැතිදු සඳ තුරග වෙතට ද
නොමගෙ න නිලින පලයති කවර කිවි ද ද

දෙන මිණ මිණි රැස් යුත්වූ මනාවත් රළින්හා
සර පැන දන කව සෙව්මේ මැතින්ද ගුණැත්සත්
චිතරණ ගහ තුල්ලේහි ගිලිලා වෙසෙස්නෙන්
යන එන දන කැන් දුක් ගිමි නිවා යත් සනොස්නෙන්

ස ඳ කත පහණ වන මන රුවන රිසිව න
ස ඳ මැති නිලින ගුණයට පෙරදි කල ම න
කො ඳ වෙන පහණ එවිලස නොවන එබැව් න
වැ ද ලද නොමින සිරිසිලි කඳුලු වගුර න

රැඳි කුළුණු ගුහානුල්හි රුවන් සෙල් දිමුත්වූ
නිය නිය සිරි රෙම් යුත් මේ මැතින්ද මිගින්ද
නිලින නදකරත් වෙත් පත් දුගින් සිත් පවත්නා
දළ ලොබ මදුනුන් දප් කොය් විලස්නෙන් රඳයේ

සමහර කිවිදෝ ලක් දිව් උතුම මේ මහත්මා
නිලිනට සුරදුම් සිත්මින් විලස්යය් කියත් නම්
සුරදුම සිතුමින් ඒ රුක් පහන්වූ බැවින් ඒ
කෙලෙස සමනුවම්වේ ලෙව් කොතැන්වත් උවමවේ

පින්වත් උතුම මෙමැතිදුන්ගෙ විලස් වෙසෙස්දත්
සත් සත් සමත් මිගිදු නෙල් රකිනා එරන් පා
යුත් බොන්ජියන් රදුදුරුන් අග ක්‍රිස්තොපර් නම්
දෙස්හි ඉතාලිය පසත් පුර රෝම නම් යුත්

සුදසුන සතුලෙව් සව සත් දනන් දුන් මුදුන්පා
තිදසවෙනි ලියෝ නම යුත් ගුණෙන් සත් සුමින්වත්
පරසිදු සුදෙතුම්වූ ඇප් පියානන්ට ඒ බැව්
සතුටු ලෙස දැනුම් දුන් කල්හි සිත්හි වඩා පෙම්

මෙමැති සඳ සුපින්වත්වූ පියානන් විසින් ඒ
තනතුරග නසිවි නම රන් ඔටුන්නෙන් සරලා
සිරිලක සිහසුන් මත් පත්කිරීමෙන් එවූ පතු
අප රදදුරුතුම් ඒ ක්‍රිස්තොපර් බොන්ජියන් නම

දහසසු අටවන් ඇප් පුත් සුරින්දු වසින් එක්
මෙවස එවිසි සිව්වන්මැය් මසේහි මෙපස්වන්
ගුරුදින කොටගේනේවූ අසුන් දෙව්සලේදී
දෙන බව ක්‍රියාදැන්වූ කලින් පත් මඟින් නෙක්

වසන පුරු කොලොම් නෙක් දැ දනෝ සත් එබැව් දත්
විලස සිදු රුසින් සේපා නදන් පත්වෙමින් සිත්
පැවති පෙර සිරිත් ලක් දිව් මෙසේවූ දවස්හි
එකිනෙක තතු ලෙස් සිත්හි කිරීමෙන් වෙසෙස්නෙන්

ගම් ගම්හි නෙක් දන පිටත් කරවා බොහෝසේ
සින්දු පුවක් නෙරලූ රුක් සමගින් කෙසෙල්ගස්
ගෙන්වා නොයෙක් කරුදු කම් කැඳවා සමාන්වූ
දීමෙන් මුදල් ඔවුන සිත් කරමින් සතොස් පත්

බන්දු තොරන් එකටෙකක් පෙණෙනා පරිද්දෙන්
ගොප්පත් පිලී සහ බඩල් වනසින් සරලා
ලම්බා සහස් බුබුලු රන්වලුමල් දිලුම් පත්
රන්දු විමල් දද එවෙත්හි තබා සිහැන්රූ

ඉස්වා වැලිත් හෙල එමත් ලද පස් කුසුම්දි
ගොප්පත් ලකල් දෙපසවේ ඇද සව් තැනන්හි
බන්දු ඇතමතැන වියන් ගඳදම් කුසුම් දම්
ලම්බා රුවින් පියවිළිත් අතුරා තැනෙක්හි

සු පු න් කුඹුන් තබා කෙමෙන් තැන තැන සිර්දුල් වා
යෙහෙන් සිතින් නිතින් දනන් මන නෙත් කර ලොල් වා
ප ට න් එකොටගේන කොළඹ කොල්ලු පිවිය දක් වා
ලෙ සි න් නොයෙක් නුදුටු විරූ ලෙසට සැරූ තුල් වා

එබව කළ සවන් ලක්දිව් නොයෙක් ගම නියම් ගම
නුවර වැසි දනන් ඒ ඒ පෙදෙස්හි වෙලා රුස්
එදින මැනි දැකුම්වස් යන්ට බෝසේ කතාවෙන්
යමු යමු මෙවදන් මුත් අන් බසෙක් කි කෙනෙක් නැත්

එ ම බ ස අසාලා උදයහන සිරිස ර
එ ව් ග ස අදුරුවත කිලුටැති ඉවරක ර
පි පි ය ස පඬෙර සරසුදු සළු ඇඳ පව ර
ගණ්ලෙ ස කරගා අරුණ්ලු කොකු මඟ ර

ම න හ ර කැකුළු කොඳ මුතුහර කර පැල ද
සැ ඩ ක ර උදය සඳවරකර යුවල පෙ ද
ර ත ස ර සුපිපි මල්දම් හිස සරා සො ද
පි ය ක ර තුසර නද ගඳ දල ඉස නොම ද

ද කි න ලෙසින් මෙන් තම මැති සඳ පෙම ද
ප ව න සුසුම් හෙලම්නෙ දිනදි වත ද ද
ක ර න විමල් නද පිය බස් දෙමින් සො ද
හි දි න සඳ අවුත් රුස්වූ දන නොම ද

මැදුර සුර මහත් ඒ ගොස් පිරිලා විසල්වූ
මලුවද එම ලෙස්වි කොය් තැනෙක්වත් ඉඩක්යම්
නැතිවරිය නැති පස්සේ සැපත්වූ මහත්තැන්
තදව එකිනෙකා උන්වේතුරේහි තැවුල්ලෙන්

පසුව එසින් දහවල් වෙතද රසහ ස
කිරණ එගිම රුස වෙතපත් ගෙණ විග ස
මැතිදුතුමන් එනබව දන්වා සතො ස
කරණ ලෙසින් මෙන් දන මගතුර දෙප ස

පැමිණ මදක් තල් පසුගියසඳ මෙමැ තී
නොමිණ මිතුරු සියමැතිසෙන් සහ පෙමැ තී
සතන සසුර ඔදකරපත ගුවන්ව තී
ලෙසින එසුරමැදුරුතුලට වියරු තී

එවර එබොන් පියන් පසිදු අපගේ අගරදුදුරුතු ම
අදර සිතින් පැමිණෙහි බොහො ඇදුරන් සමගින් දලපෙම
විදිවූ ලෙසින් නොවරදවා සැමකටයුතු නිමවා එ ම
පතර අරන්ක්‍යවාලා දුන් සඳ මැනිදුට එවලෙ ම

සමගින් ඒ රදුදුරුතුම පිය බස්කර අමවිලසි න
බුහුමන් කරමින් නොමදින ඒ උතුමන්හට මන මෙ න
සියසෙන් සමගින් විකුමැති මිගරද සිරිසරපාමි න
පාමින් යන සඳනෙක සියස යස දස දෙස පලකර මි න

සෑදී තමන්ටැති ලෙසින් සතුවින් පිනා ගොස්
තන් තන්හි ලක් දන පිරිරහමින් බොහෝසේ
කන් කන් අමාබිදු සෙවත් යස ගී පවත්මින්
මෙලෙස් ඉතාම වෙසෙසින් බුහුමන් කලෝනෙක්

මැහිදු දකිනු වස් යන්වෙස් සිනා උන් ලියක්එක්
එනබව අසමින් පත්වූ සනොස් මේ නදින් සිත්
මියුරහනක ලෙස්වී ඒ කෙණේහි සැපත්වේ
බලත සිට අසිත් රෑයස් සිතූ ඈ නොදත්තෝ

නවත් ලියක් මේ එනවා අසාලා
ලෙනේ ඇකේ උන් බිලිඳු වැවිලා
අඩන් කොතෙක් ඒ නොදැනුම්ව නොස්පත්
කළා බැලුම් සිත් විලසින් පුරා ඇස්

එක්වී යුරෝප දනනෙක් වග තන්හි තන්හි
බිලා සුරා වෙරිවෙලා රහ ගී පවත්මින්
ඉන්නා සඳේ මැතිතුමා වෙත පත් කෙණේහි
හිස් හිස් හුරා කිය කියා බුහුමන් කලෝනෙක්

පීරා වරල් ගවසමින් කුසුමන් මනාසේ
නානාරුවන් අබරණින් සැරසී උතුම්වූ
ඉනාඋවන් සිතූ කොඳන්කරමින් නදන්පත්
නෝනාවරුන් තැන තැනා සුමුව් බලාඋන්

ත ව ද මුදලි මුහන්දිරම්වරු සහ ලිපිකරු ගුරුව රු
වෙ ල ඳ බමුණු මහතුන් සහ රෙපරමාදු පාදිලිව රු
ක රු ද රුවන් කඹුරුඇම ඈ දන සෙන්නොව අතුරු සිදුරු
නොම ද තුවින් රැස්ව බලාඋන්නු මැතිඳු වඩින අයු රු

පසිදු කොලොම්පුර වැසියන්ගෙන් සොඳ ට
මෙබඳු උතුම් ඛුනුමන් ලබම්න් සතු ට
සුරිඳු තුමන් අබිලස දිනිසුරු රැස ට
පොබසරමෙන් සපැම්ණ කොල්ලුපිටිය ට

ලක රදනියගේ දුල්වූ මුදුන් රන් ඔටුන්නෙව්
පිරිසස කැලුමෙන් නිත්ලෙව් සියල්තැන් වෙසෙස්නෙන්
පරසිදු අප චාර්ලස් හැන්රි සොසිසා දිසානා
මැනිසඳු වහසල් පත්වී ලකල්වූ සිරින්නෙක්

මනහර සැදැකල නලහන එම සඳි න
මැනිඳුට අනෙක රහ පානා ලෙසින් මෙ න
විට විට පෙණෙනතුරු වැලහර පැලඳඟ ණ
ගිය හිරමද කැළුම්හිඟ ලන්පසෙකගෙ ණ

ඇ ඳ ග න සැදැ වෙලවන මැද කොඳ දස න
ඔ ද ව න තරඟ ස්දුනරුපට තබාඟ ණ
න ද ව න සොදුරු හසලැම පිරි වසාඟ ණ
දෙස ව න විදුලි සිරි කොඩලන් බහාඟ ණ

පැම් නෙ න තිම්ර මද කියඹුව තබාඟ ණ
පි ය ව න කුසුමසර සිය හිමි කැඳවම් න
ග ණ් මි න රබානද සඳ පෙර දිග අති න
ක ර මි න කිරණ එම මදහස අවුත්ව න

සොඛ මන් වන මෙමැතිඳු සඳ එම ස ඳ
ස තු පින් දෙන තුති ශී රසවිඳ ඉ ඳ
සි ය සෙන් මැතිවර සමගින් ලෙද ස ඳ
අ ම වන් බොජුනෙන් තුටුව සිටින ස ඳ

සොයන ලෙසින් මෙන් මැතිසඳ නිසව න
රද සඳ පෙනහැල්ලද අලුකරග න
නොමින විදුලි සිරි සඳ තද සොවගි න
අද අද තුසරන් කඳුලෙන් සැමතැ න

ලව මින දෙර ගුලු එනු දැක ලසි නා
කි ය මි න සුරවැකි සැතපුනි යහ නා
එ බැ වි න සඳ තද රොසපත් ලෙසි නා
නොමදි න තම සැමතැන වියා දිසු නා

පසු දින මෙමැති ස ඳ
හෙළසර පොබව ගිය ස ඳ
කිවිදන බිහු නොම ද
අවුන් රුස්වූ දෙමින් තුනින ද

එසඳ වෙම් නද න ද
දෙමින් විතරණ මුවර ද
සතුටුකර ඔවුන ද
පැවති සිය මැති හස ගණන් මැ ද

පසුව විසි නවව න
දිනෙක් සියසෙන් සමගි න
මොරටුවට සතුටි න
පැමිනෙනා බැවි පළවි සැමතැ න

ගම් ගව්හි නෙක්දන කලින් දැනගත් පවත්මේ
තන් තන්හි නෙක්වග තොරන් බැඳ සිත් නුවන්ගත්
දුල්වූ සුනිල් දවල රන් දදකැන් සුරන්දු
එල්වා රුවන් කිකිණි දැල් සමගින් කුසුම්දම්

තල් පොල් පුවක් තැඹිලි නෙක් වළු මල් මනාලෙස්
එල්වා තැනින් තැන තබා කුඹුපුන් ලකල්වූ
ලම්බා මුවන්කදලි රුක් සිටුවා වෙසෙස්නෙන්
ඉස්වා රිදී වැලි සියල් තැන වේතුරේහි

ඇද මග දෙපසේ ගොප්පත් ගවස්වා මලින්පස්
දෙර දෙර වගසි ඇත් ඈ නොයෙක් රූ තබාලා
වහසලසිට චාර්ලස් හැන්රි සොයිසා මැතින්ගේ
මොරවුව ගම දක්වා මේ විලස්නෙන් සරලා

සම හ රූ සිරියෙල් සහ දැලිගුරු ඇඟ සැම තවරාග ණ
සම හ රූ කොල ඇඳ දුකුසර ගණිමින් වනසර විලසි ණ
සම හ රූ බෙර දවුල් රබන් වයමින් නටමින් නොපම ණ
මෙමයු රූ මග අතුරුනැගිව සිටියෝ නෙක සැණ වෙස්ගෙණ

එ දි න මැනිදු නුරුගණ සහ යන සොම් සිරි ප ත් වී
සොබ න තුරඟ සතරදෙනෙක් යෙදුරියට ප ත් වී
දෙ ව න අනෙක පසතුරු නද අසමින් තොස ප ත් වී
පෑ ම් න මොරවුවට සමගින් සිය නිවෙසට ප ත් වී

එහි පැවති මනන ද
අනත විසිතුරු ඇති ලෙ ද
එක මුවකින් කෙලෙ ද
කියා නිමකළ හැකිද පිරිසි ඳ

මෙබඳු තව මැනිදෙ ක්
පසිඳු මෙම දිව් සිරි ල ක්
ඇතොත් දනවත් එ ක්
තුමෙක් මිස වෙන නොමැත කිසිවෙ ක්

පවතු මෙමැනිදු සඳ; සිරි ලක් මැදුර පහනෙව්;
නොවඩුව තෙලිනිසුරු; නිබඳ දිසිවම තෙදඟ සිළුරිස්

සපිරි යස කැළුම් දුල්ලෙව් සියල්තැන් වෙසෙස්නෙන්
පතල කුළුණු මෙන් යුත් සත් කෙරේහි ලෙසින් එක්
මවුනි සුර උතුම් ඇප දෙව් පියානන්ට සව්ලෙව්
යදිනුමැන රුකුම්වස් මේ මැනින්දු දිදිසෙත්

සපිරිගුණ කුසුම් සව් සෙත් පෙලින් යුත් මවුන් දෙව්
රණලිය වැලඳුම් හෙමිදුම් විලස්ගත් ජූසේ නම්
මුනිඳුසඳ උතුම් ඇප් දෙව්පියානන්ට සව්ලෙව්
යදිනුමැන රැකුම්වස් මේ මැතින්දු දිදීසෙත්

ගුණනද ගඳයුත් දෙව් බස් බසින් පුල් කමල්සේ
පරසිදු වන සන් ප්‍රන්සිස්කු සාලිස් මෙනම්යුත්
මුනිඳුසඳ උතුම් ඇප් දෙව් පියානන්ට සව්ලෙව්
යදිනුමැන රැකුම්වස් මේ මැතින්දු දිදීසෙත්

තනතුරු සමගින් නෙක් සව් සැපත් අත්හැරීමෙන්
බැතිනසඳ තවුස් වෙස්ගත් එබෙර්නාදු නම්යුත්
මුනිඳු සඳ උතුම් ඇප් දෙව්පියානන්ට සව්ලෙව්
යදිනුමැන රැකුම්වස් මේ මැතින්දු දිදීසෙත්

සුරිඳු බස රැඳු සිතෙල් දිමුත් රන් බඳුන්වන්
පිරිසිදු නැණවත් ඇප් සන්න අන්තෝනි නම්යුත්
මුනිසඳ ගුණවත්වූ දෙව් පියානන්ට පෙම්සිත්
යදිනුමැන රැකුම්වස් මේ මැතින්දු දිදීසෙත්

දන දල වහරෙන් ලෙව්හි දුගින් සිත් සරන්හි
ලොබමියර හෙලුම්වස් මේ රදෙක්වූ ප්‍රුවන්නම්
මුනිඳුසඳ උතුම් ඇප් දෙව්පියානන්ට සව්ලෙව්
යදිනුමැන රැකුම්වස් මේ මැතින්දු දිදීසෙත්

දුරුකල වන රෝදුක් ගිම් යදුම් දෙව් රසින්දෙව්
යස තෙදබලයෙන් යුත් ලාසුරුස්නම් උතුම්වූ
මුනිසඳ ගුණවත් ඇප් දෙව් පියානන්ට පෙම්සිත්
යදිනුමැන රැකුම් වස් මේ මැතින්දු දිදීසෙත්

දුගිනට වෙත පත්වූ සව් සැපත්දී සනොස්පත්
වනතුරට වැදීමෙන් ගත් තවුස් වෙස් උතුම්වූ
මුනිඳුතුමනි රෝකුස් දෙව් පියානන්ට පෙම්සිත්
යදිනුමැන රැකුම්වස් මේ මැතින්දු දිදීසෙත්

මෙකී නොකී සව් මුන්තුම මැතින්මේ
නොදී කිසිත් සිත් බිය සිනෙකින්වත්
දිදිනොහිමි සෙත් රකිනා පරිද්දෙන්
නිතින් යදිත්වා සුරිදුන්ට යව් දිව්

මෙමැතිදුට තුනිලෙ ස
දැනෙනා විලස හෙලුබ ස
මෙසේ සඳ පිරිතො ස
කෙළේ මෙවුවම් රුවන් දමය ස

යුත්මින් ගුණ යසින් දස දිගත හොබව න
මන්මෙන් සකු මගද් හෙලු වියරණ දැනෙ න
දෙන් අන්දිස් තුබාවේ පඬි ගුණවඩ න
නම් පින්වත් එමැතිදු සදුගෙ සිසුව න

සුර්දු මැදුරවෙත කොටගේනේ තිබු න
පසිදු එවිදිවත් සතසලැ සොදුරුව න
සේසිත් ඇදුරු තනතුරදැරු යුතු සුගු න
ජෝසොප් එවිස් ජයවිර නමැති ම විසි න

THE LAST WILL.

No. 3727.

This is the Joint Last Will and Testament of us Susew De Soysa Dissanayeke Mudaliyar of the Governor's Gate (hereinafter called Testator) and Engaltina Peries Lama Etane (hereinafter called Testatrix) husband and wife residing at Grandpass in Colombo.

We do each of us doth hereby revoke our Joint Last Will bearing date the 25th November 1876 executed before D. M. Areseculleratne Notary and all other Testamentary depositions made by us jointly or either of us.

And we do hereby confirm the several deeds of Gift heretofore executed by the Testator in favour of Charles Henry De Soysa Dissanayake nephew of the Testator.

And we do hereby will and declare that if the Testator shall survive the Testatrix all the immoveable property which has been or may hereafter be devised to or inherited by the Testatrix by or from her parents or either of them shall upon the death of the Testatrix devolve upon her heirs at law exclusive of the Testator and the whole of the residue of our Estate and effects, and the Estate and effects of each of us whether in possession reversion or expectancy shall become the absolute property of the Testator. And the Testator doth hereby further will and declare that in the event of his surviving the Testatrix all the Estate and effects which he may be possessed of or entitled to shall devolve upon and become the absolute property of his said nephew Charles Henry De Soysa or if he shall be then deceased shall devolve upon and become the absolute property of

such person or persons being the issue of the said Charles Henry De Soysa as the said Charles Henry De Soysa shall by Last Will appoint and in default of such appointment or so far as such appointment shall not extend shall devolve upon and become the absolute property of the children of the said Charles Henry De Soysa then living and the issue then living of such children as shall then be dead as tenants in common in course of distribution according to the stocks and not to the number of individual objects and so that the issue of the deceased children may take by way of substitution the share or respective shares only which the parent or respective parents would if living have taken.

And we do hereby will and declare that if the Testatrix shall survive the Testator the Testatrix shall be entitled absolutely to all the Jewels and personal ornaments worn by her and also to all the immoveable property inherited by or devised to her from or by her parents or either of them and shall further be entitled to a life interest in the house and garden and in all the furniture and moveables in the said house in which we live at Grandpass Road and in our house and garden at St. Joseph's Street and to an annuity of Rupees Twelve thousand (Rs. 12,000) a year payable by equal monthly payments to her during her life which said annuity shall be charged on the residue of our Estate and effects of us and each of us shall upon the death of the Testator if the Testatrix shall survive him devolve upon and become the absolute property of the said Charles Henry De Soysa or if he be then deceased shall devolve upon and become the property of such person or persons being the issue of the said Charles Henry De Soysa as the said Charles Henry De Soysa shall by Last Will appoint and in default of such appointment or so far as such appointment shall not extend shall devolve upon and

become the absolute property of the children of the said Charles Henry De Soysa then living and the issue then living of such children as shall then be dead as tenants in common in a course of distribution according to the stocks and not to the number of individual objects and so that the issue of deceased children may take by way of substitution the share or respective shares only which the parent or respective parents would if living have taken.

We hereby nominate and appoint the survivor of us the said Charles Henry De Soysa, Warusahannedege Harmanis Soysa and Solomon Peter Soysa to be the executors of this our Last Will and Testament.

In witness whereof we the said Susew De Soysa and Engaltina Peries do set our hands and seals to three of the same tenor as these Presents at our own residence in Grandpass aforesaid on this Eighth day of October in the year of Our Lord one thousand eight hundred and seventy seven.

Signed and declared by the Testator and Testatrix to and for their Last Will & Testament in our presence and in the presence of one another and in the presence of the Notary all being present at the same time and place have hereunto set our hands as witnesses on the day month & year above written.

(Sd.) S. Soysa.

(Sd.) Engaltina Peries.

(Sd.) A. Soysa,
(Sd.) Arnold Peries,
(Sd.) D. M. Areseculleratne,
N. P.

I Don Marsalis Areseculleratne of Colombo Notary Public do hereby certify that the foregoing Last Will and Testament having been duly read over and explained by me to Susew De Soysa Dissanayake Mudaliyar and Engaltina

Peries Lama Etane the Testator and Testatrix therein named who are known to me in the presence of Messrs. Arnold Peries of Moratuwa and Andris Soysa of Grandpass the subscribing witnesses thereto both of whom are known to me the same was signed by the said Testator and Testatrix and by me the said Notary and by the witnesses in the presence of one another all being present together at Grandpass in Colombo this eighth day of October in the year of Our Lord one thousand eight hundred and seventy seven.

(Sd.) D. M. ARSECULLERATNE,
Notary Public.

———:o:———

අනන්ම කැමති පත්‍රයේ පිටපත.

අංකය. 3727.

කොළඹ මාළුදන්ඩ වීථියේ පදිඤ්චි (මෙහි පහත නෙසතමේන්තුකාරයාය කියන) රජවාසල මුදලි පදවි ප්‍රාප්ත සුසෙව් ද සොයිසා දිශානායක සහ (මෙහි පහත නෙසතමේන්තු කාරිය කියන) එන්ගල්තිනා පීරිස් ලමා එතනි යන පුරුෂයා සහ ස්ත්‍රීත්වන අප දෙදෙනා එකතුව ලියවනලද අන්තිම කැමැත්ත සහ "නෙසතමේන්තුව" සි:—

වරුෂ 1876 නොවැම්බර් මස 25 දින දරන, නී. ඇම්. අර්සකුලරත්නා නොතාරිස් තැන ඉදිරිපිටදී අප දෙදෙනා එකතුව ලියවාදුන් අන්තිම කැමැත්තේ පත්‍රය සහ, වෙනත් එබදු අප දෙදෙනා එකතුව හෝ වෙන් වෙන්ව හෝ ලියවාදුන් "නෙසතමේන්තු" ලියවිලි සියල්ලද, මෙසින් අවලංගු කළා ඇත.

තවද, "නෙසතමේන්තු" කාරයාගේ බෑනා * වන චාර්ලස් හැන්රි ද සොයිසා දිශානායකගේ නමට මේ දක්වා "නෙසතමේන්තු" කාරයා විසින් ලියවා දී තිබෙන නොයෙක් නෑගිපත්‍ර මෙයින් සථිරකළා ඇත.

* ඉඛග්‍රීසියෙන් සිංහලට භාෂා පරිවර්තනය කරණකල "බෑනා" යනු යෙදෙතත්, සිංහල ව්‍යවහාරයට සහෝදරයාගේ පිරිමි දරුවා අනික් සහෝදරයාට "පුතා" වන බව සැලකිය යුතුයි.

තවද "නෙසතමේන්තු" කාරීගේ මරණින් පසු "නෙසත මේන්තු" කාරයා ජීවත්වෙන්ට යෙදුනොත්, "නෙසත මේන්තු" කාරීගේ දෙමව්පියන් හෝ, ඔවුන් එක් එක්කෙණා හෝ, ඈට ලියාදී තිබෙන හෙවත් මිට පසු ලියාදෙන හෝ, ඔවුන්ගෙන් හෝ ඔවුන් එක් එක්කෙණා ගෙන් හෝ ඈට උරුම්වතිබෙන හෙවත් මිට පසු උරුමවනු, නිශ්චල දේපල සියල්ල, ඇගේ මරණින් පසු, "නෙසතමේන්තු" කාරයා, හැර, ඇගේ නිති ප්‍රකාර උරුම්කාරයන්ට හිමිවනු ලැබේ. තවද, දැනට භුක්තිවිඳින හෝ, භුක්තියට පැමිණෙන්ට තිබෙන හෝ, භුක්තිය බලාපොරොත්තුවන හෝ, අපේ බූදලයට අයිතිව ඉතුරුව තිබෙන සියල්ල සහ අප එක් එක්කෙණාගේ බූදලයට අයිති සියල්ලද "නෙසතමේන්තු" කාරයාට සම්පූර්ණයෙන්ම අයිතිවේ. තවද, "නෙසතමේන්තු" කාරීගේ මරණින් පසු "නෙසතමේන්තු" කාරයා ජීවත්වෙන්ට යෙදුනොත්, ඔහුට අයිතිව තිබෙන හෝ අයිතිවන මුළු බූදලය ඔහුගේ බෑනාවන ඉහතකී චාර්ලස් හැන්රි ද සොසිසාට සම්පූර්ණයෙන්ම අයිතිවේ. තවද ඉහතකී චාර්ලස් හැන්රි ද සොසිසා එවකට ජීවත්ව නොසිටියොත්, ඒ දේපල ඉහතකී චාර්ලස් හැන්රි ද සොසිසා තමාගේ අන්තිම කැමැත්තෙන් තමාගේ දරුවෝ හැටියට දක්වා තිබෙන අය වඵන්ට සම්පූර්ණයෙන්ම අයිතිවේ. තවද, එසේ අන්තිම කැමැත්තකින් එබන්දක් දක්වා නොතිබුනොත්, ඒ දේපල ඉහතකී චාර්ලස් හැන්රි ද සොසිසාගේ එවකට ජීවත්ව සිටින දරුවන්ට සහ නැසිගිය යම් දරුවෝ ඇත්නම්, ඒ දරුවන්ගේ එවකට ජීවත්ව සිටින දරු වන්ටත්, ඒවා වෙන්වසයේ නොබෙදා, ඒවායේ ප්‍රයෝජන වල හැටියට බෙදීමෙදී පොදුවසයෙන් භුක්තිය අයිතිවේ. මෙසේ නැසිගිය දරුවෙකුට ජීවත්වසිටියදී යම් කොටසක් හෝ කොටස් අයිතිවේද, ඒ දරුවාගේ දරුවන්ටද, ඒ කොටස හෝ කොටස් පමණක් අයිතිවේ.

තවද, "නෙසතමේන්තු" කාරයාගේ මරණින් පසු "නෙසතමේන්තු". කාරී ජීවත්වුනිනම්, ඈ පලඳින මුතු මැණික් ආදිය සහ වස්ත්‍රාභරණාදියත් ඈට සම්පූර්ණයෙන්ම අයිතිවෙනවාත් හැර, ඇගේ දෙමව්පියන් හෝ ඔවුන් එක් එක්කෙණා හෝ ඈට ලියා දිනිබෙන හෝ, ඔවුන්ගෙන් හෝ, ඔවුන් එක් එක්කෙණා ගෙන් හෝ ඈට උරුම වෙන සියලු නිශ්චල දේපලාදියත් ඈට සම්පූර්ණයෙන්ම අයිතිවේ. මේ ඇර, මාළුදන්ඩ විජීයේ අපි පදිංචිව සිටින ගෙයි සහ වත්තේද, ඒ ගෙයි තිබෙන ඇඳ පුටු ආදිය සහ වෙනත් සියලු චංචල බඩු බාහිරාදියේද, සන් ජෝසප් විජීයේ තිබෙන අපේ ගෙයි සහ වත්තේද, ජීවිත භුක්තිය ඈට අයිතිවේ. ඇරත්, අපේ බූදලේ ඉතුරුව තිබෙන දෙයින්, ඈ ජීවත්ව සිටිනතුරු අවුරුද්දකට රුපියල් 12,000 ක මුදලක්, එක සමාන ගණනකින් මාස්පතා ලබාගැනීම පිණිස, ඈට ගෙවිය යුතුවේ. තවද, අපට සහ අප එක් එක්කෙණාට අයිති සියල්ල, "නෙසතමේන්තු" කාරයා නැසුනවිට "නෙසතමේන්තු" කාරී ජීවත්වසිටියත්, ඉහතකී චාර්ලස් හැන්රි ද සොයිසාට සම්පූර්ණයෙන්ම අයිතිවේ. තවද, ඉහතකී චාර්ලස් හැන්රි ද සොයිසා එවකට ජීවත්ව නොසිටියොත්, ඒ දේපල ඉහතකී චාර්ලස් හැන්රි ද සොයිසා තමාගේ අන්තිම කැමැත්තෙන් තමාගේ දරුවන්හැරියට දක්වාතිබෙන අයවළුන්ට සම්පූර්ණයෙන්ම අයිතිවේ. තවද, එසේ අන්තිම කැමැත්තකින් එබන්දක් දක්වා නොතිබුනොත්, ඒ දේපල ඉහතකී චාර්ලස් හැන්රි ද සොයිසාගේ එවකට ජීවත්ව සිටින දරුවන්ට සහ නැසිගිය යම් දරුවෝ ඇත්නම් ඒ දරුවන්නේ එවකට ජීවත්ව සිටින දරුවන්ටත්, ඒවා වෙන්වශයේ නොබෙදා, ඒවායේ ප්‍රයෝජනවල හැටියට බෙදිමේදී පොදු වශයෙන් භුක්තිය අයිතිවේ. මෙසේ නැසිගිය දරුවෙකුට ජීවත්ව සිටියදී යම් කොටසක් හෝ කොටස් අයිතිවේද, ඒ දරුවාගේ දරුවන්ටද ඒ කොටස හෝ කොටස් පමණක් අයිතිවේ.

නවද, අපේ මේ අන්තිම කැමැත්තේ සහ "නෙසසා මෙන්තු" වේ බලකාරයින් හැටියට, අපෙන් පසු ජීවත් වෙන ඉහතකී චාර්ලස් හෑන්රි ද සොසියාද, වරුස හෑන්නැදිගේ හර්මානිස් සොසියා සහ සාලමොන් පීටර් සොසියාද මෙයින් පත්කරණ ලද්දෙය.

මීට සාක්ෂිවශයෙන්, මේ වරුස එක්දහස් අටසිය හැත්තෑහතක්වූ ඔක්තෝබර් මස අටවෙනි දින ඉහතකී මාළුදන්ඩ වීථියේ අපේම නිවසේදී, එකාකාර ලියනලද ලියවිලි තුණකට, ඉහතකී සුසෙව් ද සොසියා සහ එන්ගල්තිනා පීරිස් වන අපි, අපේ අත්සන් සහ මුද්දරත් තබමු.

මේ අන්තිම කැමැත්තේ පත්‍රයේ සහ "නෙසසාමෙන්තු" වේත් හිමිකාරයා සහ හිමිකාරිවිසින් ඔවුන් ඉදිරිපිට සහ එකිණෙකා ඉදිරිපිටද, නොතාරිස් නැන ඉදිරිපිටද සිටියදී, සියලුදෙනාම ඉදිරියේ, එකවර එක ස්ථානයේදී, ඉහතකී වරුසේ, මාසේ, දිනයේහී, සාක්ෂිවශයෙන් අපේ අත්සන් තබන ලදී:— (අත්සන්කළේ,) ඇස්. සොසියා. (අත්සන්කළේ,) එන්ගල්තිනා පීරිස්

(අත්සන්කළේ,)—ඒ. සොසියා.
(අත්සන්කළේ,)—අර්නෝල්ඩ් පීරිස්.
(අත්සන්කළේ,) ඩී. ඇම්. අර්සකුලරත්න
(ප්‍ර. නො.)

යට දැක්වූ අන්තිම කැමැත්තේ පත්‍රය සහ "නෙසසා මෙන්තු" වත්, කොළඹ පදිංචි දෙන් මර්සේලිස් අරසකුල රත්න ප්‍රසිද්ධ නොතාරිස් වන මා විසින්, හිමිකාරයා සහ හිමිකාරිද වන මා අඳුනන සුසෙව් ද සොසියා දිශානායක මුදලිතැනට සහ එන්ගල්තිනා පීරිස් ලමාඑතනිටද, මා

අදුනන සහ මට සාක්ෂිකාර, මොරටුවේ පදිංචි අර්නෝල්ඩ පීරිස් සහ මාළුදන්ඩ වීථියේ පදිංචි අන්ද්‍රිස් සොසිසාත් ඉදිරියේ කියවා තේරුම්කරදී, ඒ සියලු දෙනාම එක්ව සිටියදී එකිණෙකා ඉදිරිපිටදී වරුෂ එක්දහස් අටසිය හැත්තෑහතක්වූ ඔක්තෝබර් මස අට වෙනි දින කොළඹ මාළුදන්ඩ වීථියේදී, එම හිමිකාරයා සහ හිමිකාරී විසින්ද, ඉහතක් නොනාරිස් නැන වන මා විසින්ද, ඉහතකී සාක්ෂිකාරයන් විසින්ද අත්සන්කළ බව මම මෙයින් සහතික කරමි.

(අත්සන්කළේ,) ඩි. ඇම්. අරසකුලරත්න
ප්‍රසිඛ නොතාරිස්.

PART XIV.

THE PRESENT

HEAD OF THE De SOYSA FAMILY.

:o:

තෑස්වන අධිකාරය.

දැනට ද සොයිසා පවිලේ ප්‍රධාන මැතිතුමා.

J. W. C. DE SOYSA ESQUIRE., J. P.

ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා සාමදාන විනිශ්චයකාරතුමා.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

දැනට

ද සොයිසා පවිලේ ප්‍රධාන මැතිතුමා.

THE PRESENT

HEAD OF THE De SOYSA FAMILY.

නතාභ්‍යාස සත්ගුණ ක්‍රියා දියෙන් ව්‍යාපත යිරියි ශ්‍රී ප්‍රභාඝර යෙන් විරාජමානව විසූ **චාල්ස් හැන්රි ද සොයිසාගිධාන** ලඞ්කා ද්වීපයේ සාමදූන විනිඡ්ඡයකාර මනත්‍රීන්ද්‍රයානන්ගේ වර කුවුම්බාඛ්‍යාඤ්ඤික පුත්‍ර රත්නයවූද, මුලු සිරිලක සාමදූන විනිශ්චයකාර ධුරන්ධරවූද **ජෙරෝනිස් විලියම් චාල්ස් ද සොයිසා ධම්ගුණවර්ධන විපුල ජයසූරිය කරුණාරත්න දිශානායක ශ්‍රී රාජගුණෝත්තම කුරුකුලශේඛර** වාසල මුදලි මනත්‍රීශ්වරයා වෂි එක්වා දහස් අටසිය සැටපහක්වූ මැයි මස දසනව වන (1865. මැ. ම. 19.) දින සකල සිරිරුදි මොරවු ග්‍රාමයේ ඝඨකීය පවිලට හිමි වලව්වේදී උපන.

ලදරු කාලය.

CHILDHOOD.

ලදරු වයසේම මේ ලමයාගේ දෙහ ලක්ෂණ නරඹන ශාස්ත්‍රඥයන් පැවසුවේ, දැඩිවූ කල වැඩිසිටිය ද සොසියා මැනිවරු මෙන්ම පරාජියෙකී ඇලී වාසනා වන්ත කීර්තියකින් යුත් ලොකයා විසින් ගරු කරණ සත්පුරුෂ මැනිවරයෙක් වෙන බවය. පුත්‍ර ප්‍රේමයෙන් හරිත මව්පිය දෙදෙනා ඉතා සැලකිලිලෙස ප්‍රවේශම් කළ බැවින් සහ කිරිමවුන්ගේ ක්ෂීර ශුද්ධ කම්නුත් රොග පීඩාදි ව්‍යසනයන්ගෙන් මිදී බාල කාලයේ වර්ධනය සුන්දරතර විය. පුණ්‍ය ලක්ෂණාදියෙන් යුක්ත හෙයින් ඉතිහෝ බාල කාලයේ කිසිම අදිස්සි අනතුරක්ද සිදු නොවිය. ප්‍රිය වඩන ශරීර වර්ණයකින් හා දීප්තිමත් ලක්ෂණ කුඩා නෙත්‍ර යුවලකින්ද යුත් මේ ලදරුවා කෙරෙහි දෙමව්පිය බැතුන් පමණක් නොව දුටු දුටු සියලු මනුෂ්‍යයෝම තරයේ ප්‍රිය කළහ.

———:o:———

අවගාහන මංගල්‍යය.

BAPTISM.

ලදරුවා අවගාහනය කළයුතු කාලය සම්පවුසඳ මේ උත්සවය ගම්භීරලෙස පැවැත්වීම සඳහා පියතුමා කටයුතු සම්පාදනය කිරීමට අනුජීවීන්ට නියමකෙළේය. මේ සඳහා උවමනා සකලම පරිපූර්ණවූයේ වෂී එක්වා දහස් අවසිය සැටපසක්වූ ඔක්තෝබර් මස නමවෙනි (1865. ඔ. ම. 9.) දින මොරටුවේ ශුද්ධ එම්මානුවෙල් දෙව මන්දිරයෙහිදී අති ගරු **ජිෂර්ස් ඕ. කෙල්වන් පාදිදේශික** තුමා විසින් ගම්භීර දෙවමෙහෙයක් පවත්වා අවගාහන කෘත්‍යය මොනවට ඉටුකෙළේය. මෙම අවගාහනයේදී

ඇප වෙන පියවරු දෙදෙනාට ආණ්ඩුවේ ප්‍රධාන වෛද්‍ය වායම් **විලියම් පාර්කර් වාලිස්ලි** තුමා සහ **ජෙරෝනිස් පිරිස්** මහතාද, මවට, ජෝර්ජ් සටුවර්ට් සමාගමේ කොටස් කාරයෙක්ව සිටි **ජෝර්ජ් ඇලෙක්සැන්ඩර් මැකැන්ඩ්‍රි** මහතාගේ නෝනා මහත්මයාවන **ලුවිසා මැකැන්ඩ්‍රි** මහත්මිය නෝරාගත්තු ලැබිය. ලදරුවාට "**ජෙරෝනිස් විලියම් වාලිස්**" යන නාමයද තැබිය.

මෙසේ කරණලද අවගාහනකටයුතු අවසානවූ ඉක්බිති අතිගරු පාරිදර්ශික තුමා සහ සාන්තා තෝමස්ගේ ශාස්ත්‍ර ශාලාවේ ප්‍රධාන ගෞරවනීය **බේකන්** තුමා ඇතුළුව බොහෝ දෙනද මොරටුවේ වලව්වට පැමිණියහ. එහි ඉතා අඟයට පිළියෙළ කර තිබුන අතුරු පසින් පැමිණි මහත්වරු සහ නෝනා මහත්වරු සඩ්ගහ ලැබූ කල්හි, පාරිදර්ශික තුමා ද සොයිසා පව්ලේ ගුණ වර්ණනා ප්‍රමුඛ වැදගත් කරුණු සහිත ඉතා ව්‍යක්ත කථාවක් කෙළේය. මේ කථාවට පසු සුසෙව් ද සොයිසා මහතා කථාකොට **ජෙරෝනිස් ද සොයිසා** වාසල මුදලි තුමා ප්‍රධාන මෙම බූදලේට නියම උරුමක්කාරයා දෙවෙනි වරට ලැබුන මේ වාසනාවන්ත සුරතල් පිරිමි දරුවා බැව් කියමින් පාරිදර්ශික තුමට සතුති කොට කථාව නිමාරකෙළේය. මෙහි උත්සවය සඳහා පැමිණි වැදගත් පිරිස නැවත නැවතත් සඩ්ග්‍රහවිඳ අවගාහනය ලත් සුරතල් ලදරුවාට දීඝායුෂ ප්‍රර්ථනාකරමින් ප්‍රීතියෙන් බරව විසිරි ගියාහ.

———:o:———

කුඩා කාලය.

BOYHOOD.

මව්පිය ආදිහු මේ ලමයාට සුරතල් වශයෙන් "වාලිලි" යන්නෙන් ආමන්ත්‍රණය කළාහුය. වාලිලි කුඩා කාලයේ ක්‍රීඩා වශයෙන් කැමැත්තේ හරකුන්ට සහ අශ්වයින්ටය, හරක් එලවීමටද, අසුන්පිට යාමටද,

කැමතිව එයි දෙය සෙල්ලම් පිණිස කෙළේය. පුඤ්ඤි චාලීලිගේ පුදුම ගුණයක්ව තිබුනේ දෙමව්පියන්ට ඇතිවූ ඉතා කීකරුකමය. පියා හෝ මව් හෝ යමක් ඇසුවොත් ඊට ගරු ආකාර උත්තර දුන්නා මිස වැඩි කථාවක් නොකෙළේය. ඇතම් දරුවන් මෙන් යම් යම් දේ ඉල්ලා එකම විටකවත් නොහැඩුවේය. කිසිම කාරණයක් ගැණවත් මව් පිය දෙදෙනා නොවෙහෙසුවේය. කිරි මවුන්ට හෝ අන්‍ය වැඩකරුවන්ට හෝ කුඩා කාලයේ හිත් වේදනා වෙන කිසිම වෙනසක් නොකෙළේය. මේ කරණකොටගෙණ කාගෙත් හිත් මේ පුඤ්ඤි චාලීලි කෙරෙහි පැහැදීමෙන් වඩ වඩා ප්‍රවේශමෙන් බලා කර ගත්හ. මෙසේ හිතැනිව බලා කරගැන්ම කරණකොට ගෙණ පුඤ්ඤි චාලීලිගේ වර්ධනය සැප දායක විය.

———:o:———

ශාස්ත්‍රාදිග්‍රහණය.

EDUCATION.

පුඤ්ඤි චාලීලිට ශාස්ත්‍රාදිග්‍රහණය කළයුතු කාලය ආසන්නවූ කල වලව්වේම නැවතී සිටිය **ග්‍රීන්** නෝනා මහත්මයා පළමුවෙන් ඉංග්‍රීසි හෝඩිය ඉගැන්නුවාය. සිංහල හෝඩිය **හර්මානිස් සොසියා** මහත්මයා ඉගැන්නුවේය. මීට පසු සිංහල ඉගෙණගැන්ම, **ඩී. ජේ. එදිරිසිංහ** ගුරුමහතාගේ මාර්ගයෙන් දැනගත්තේය. සිංහල ලිඛිත, ගණිත, ව්‍යාකරණාදි උසස් ශාස්ත්‍රයන්, **නම්බිඅප්පු** ගුරු මහතා ගෙන් ඉගෙණ ගත්තේය. ශාස්ත්‍ර ඉගෙණීමේදීද ගුරුවර ගුරුවරියන්ට භික්තිමෙන් සහ සැලකිල්ලෙන් ඉගෙණගත් බව වැටහේ. ගුරුවරුන්ට ඇති කීකරුකම ගැණ කුඩා කාලයේම ප්‍රශංසා ලැබිය. ඉඩ්‍රිසි දෙවෙනි පොතට එනතුරු **ග්‍රීන්** නෝනා මහත්මයා ගෙන් ඉගෙණ, **සිල්වේසන්** **සොසියා** මහත්මයත් සමග සාමාන්‍ය නෝමස් ශාස්ත්‍ර ශාලාවට ගියේය. එහි විසි කාලයක්

ශාස්ත්‍රාදග්‍රහණයකොට පසුව මොරවුවේ වෙල්ස්හි ශාස්ත්‍ර ශාලාවෙන් ඉගෙණීම ලැබුවේය. මීට පසු මෙම ශාස්ත්‍ර ශාලාවෙන් අහක්ව රාජකීය විද්‍යාලයට බැඳී ඉගෙණීම ලැබුවේය. මෙහිදී (Cambridge) "කේම්බ්‍රිජ්" නම් විහාරයට සූදානම්වන කල, එවකට කිසිම රොග ලක්ෂණයක් නොතිබුන මෙතුමාගේ ශරීරයේ ඉදුරන් වෙනස්වීමෙන් දෙහෝ තරයේ ශාස්ත්‍ර හැදෑරීමේ දෙෂයෙන්දෙහෝ නිතර නිතර ඝලානතවීමක් හැදී ඒ අපහසුව නිසා එම පාඩම් විභාගයට නොසිටියේය.

මෙසේ ඉගෙණීම් ලබාගෙණ එන අතර ඇඩකීය පිය තුමාවන **වාලිස් හැන්ඩ් ද සොයිසා** ලඬකාවේපයේ සාමදූන විනිශ්චයකාර තුමා, එඩගලන්ත දෙශාටනය පිණිස යන ගමනේදී ඒ කැවිව මෙතුමාද, මෙතුමාගේ දෙවෙනි සහොදර **ඇල්ෆ්‍රඩ් ජෝශොප් ඩිවර්ඩ් ද සොයිසා** මහතාද, වඹි එක් දහස් අටසිය අසූහයේ ජූලි මස තිස්එක් වෙනි (1886. ජූ. ම. 31.) දින විද්‍යාභිලාෂයෙන් එඩගලන්තයට යාම පිණිස ලඬකා වෙරළින් පිටත්විය.

සුවසේ එඩගලන්තයට පැමිණ පිය තුමාගේ නියමය ලෙස එහි උසස් විද්‍යාලයකට බැඳී ඉගෙණීම ලැබුයේය. ද සොයිසා තුමගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර මේ මහතා (Cambridge) "කේම්බ්‍රිජ්" නම් උසස් විද්‍යාලයෙන් ඉගෙණීම ලබා එක් දහස් අටසිය අසූනම (1889.) යේදී එහි උසස් විභාගයකින් සමථිව (B. A.) "බී. ඒ." නම් ගෞරවානවිත අක්ෂරවය ලබාගත්තේය. දිනෙන් දින ශාස්ත්‍රයෙන් පණ්ඩිතවේගෙණ ආ මේ කාලයේ ඇඩකීය පියතුමගේ අවසානය දැනගන්නා ලදින්, සොහොයුරු **ඇල්ෆ්‍රඩ් ජෝශොප් ඩිවර්ඩ් ද සොයිසා** මහත්මයා සමග වඹි එක්දහස් අටසිය අනූවේ නොවැම්බර් මස සවෙනි (1890. නො. ම. 6.) දින **ජැමිනා** (Djemnah) නම් නැවෙන් ලක්දිව පැමිණියේය.

සාමදන විනිශ්චයකාර ධුරය.
JUSTICE OF THE PEACE.

ඉගෙණීමෙන් සම්පාදිත නිසා සහ සඟකීය පියතුමා විසින් කළ පරෝපකාර මහත් කුශල ක්‍රියා ගැණ සැලකීමක් වශයෙනුත් වෂී එක්දහස් අටසිය අනූදෙකේ මුළු ලබ්කාවේ සාමදන විනිශ්චයකාර ධුරයට ලඛ්සාණ්ඩුව විසින් පත් කරණලදී. මෙසේ ආණ්ඩුවෙන් ගරු බුහුමන් ලැබූ මෙතුමා **ද සොසිසා** පව්ලේ ප්‍රධානියා වීමෙන් තම පියතුමාගේ වෙණදුම් කෘත්‍යයන්හි යෙදී ආත්මාර්ථ පරාර්ථය සඳහා වසතු සපයනා අවියෙන් සහ සඟකීය වෘතු ප්‍රවෙශම් කොට දිසුණු කරණ අවියෙනුත් වෂී එක්දහස් අටසිය අනූවේ නොවැම්බර් මස හත්වෙනි (1890. නොවැ. 7.) දින සඟකීය ලිපි ශාලාවේ සිය පියතුමාගේ ගරු **ආසනය** පිළිගත. එතැන් පටන් වණ්ක් කර්මාදියෙහි යෙදෙමින් දූහැමින් සෙමින් දවස් යවන්ට පටන් ගත්තේය.

——:o:——

පරාර්ථය සඳහා පළමු වෙන් දුන් රුපියල් දශදහස.
FIRST DONATION OF Rs. 10,000.

විපුල කීර්තියක් ඉසුලූ ද සොසිසා පව්ලේ ජ්‍යෙෂ්ඨ **ද සොසිසා** මැතිවරුන්ගේ සත්චරිත මාර්ගයන්හි ගමන් කිරීමේ අගය දත් මෙතුමා, ලොකයාට මහත් ප්‍රයොජනවීම සඳහා සහ සඟකීය පියතුමාගේ නාමය චිරස්ථායිව පැවත්ම සඳහාත් ලක්දිව් ජනතාවට අවශ්‍යව තිබුන **"මානුෂික" ශරීරගත සඤ්ඤ ප්‍රාණිපරීක්ෂක** ශාලාවක් (Bactereological Institute) ගොඩනැංවීම සඳහා ත්‍යාගීවනතභාවයේ පටන් ගැණීමවන පළමුවෙනි වර, එනම්:—වෂී එක්දහස් අටසිය

අනුදෙකේ මැයි මස හවෙනි (1892. මැ. ම. 6.) දින රුපි යල් දශදහක් (රු. 10,000) ආණ්ඩුවට පරිත්‍යාග කෙළේය. එසේ ගොඩනැගිල්ලක් කිරීමට මේ මුදල මද බව ප්‍රසිඛ වැඩ දෙපාර්තමේන්තුවෙන් ආණ්ඩුවට දන්වනලදුව මෙකී දීමනාව ආණ්ඩුව විසින් ප්‍රතික්ෂෙප කරණ ලදී.

———:o:———

මෙතුමා එඛඟලන්නසට යාමේ දෙවෙනි ගමන.

THE SECOND TRIP TO LONDON.

———

ශ්‍රී මත් මහා **රාජිනීන්ගේ දියමන්නි ජුබිලි** මඛග ලෙහාත්සවය සඳහා ලඞ්කාවෙන් යවන්ට ආණ්ඩුව විසින් නියම කළ නියොජික සඞ්ඛ්‍යාවට මෙතුමාත් ඇතුළත් කරණ ලදින්, මෙතුමාගේ ගමන ගැණ ශුභ ප්‍රාර්ථනා කිරීම පිණිස එක්දහස් අටසිය අනූහතේ මැයි මස පළමු වෙනි ශනි (1897. මැ. ම. 1.) දින සියලුම වර්ගයන්ගෙන් යුත් මහත් සමූහයක් කොළඹ හුණුපිටියේ (Public Hall) "පබ්ලික් හෝල්" නම් ප්‍රසිඛ ශාලාවට රැස්වූහ. එහි තොරතුරු එක්දහස් අටසිය අනූහතේ මැයි මස තුන්වෙනි (1897. මැ. ම. 3.) දින දරණ **දිනපතා ප්‍රවෘත්ති** පත්‍රයේ ප්‍රසිඛවී තිබෙන්නේ මෙසේය:—

"ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා
ආමදන විනිශවයකාරතුමා සමබන්ධ
පැවැත්තු උත්සවය.

FAREWELL "AT HOME" TO
J. W. C. DE SOYSA ESQ.

———

මේ මස පළමුවෙනි දිනවූ පසුගිය සෙනසුරාදා පස්වරු තුණහමාරට කොළඹ හුනුපිටියේ පබ්ලික් හෝල් නම් ප්‍රසිඛ ශාලාවෙහිදී මෙම උත්සවය පවත්වන ලදී. මෙය ඉතා ගරු ගම්භීරාකාරයට පැවතුනා දැක්ම

සැබවින්ම ප්‍රීතියකි. මෙපමණ අගයට මෙම උත්සවය පවත්වන්වූ හෙතුව නම් පොදු ලොකයාට මහත්සේ ප්‍රයොජනවත් අනන්තයේ කළ උසස් ද සොසියා පව්ලේ ප්‍රධාන පුත්‍ර රත්නයවූ ජේ. ඩබ්ලිව්. සී. ද සොසියා මැතිවරයා ලබන ජූනි මස එඩ්ගලන්තයේ පවත්වන්ට යන අප මහා රජිනියගේ දියමනති ජුබිලි උත්සවයට ලඞ්කාවාසින් වෙනුවෙන් පෙනී හිටීමට යන මැතිවරුන් අතුරෙන් මෙතුමාත් කෙණෙක්කොට පිටත්කරයැවීම සඳහාය. ධනයෙන් තර වේ මැතිවරයා නැවකට නැඟි රහස්ව මේ ගමන යනවාට වඩා මහ ජනයාගේ කැමැත්ත අකමැත්ත දැන යාමේ ඇති විපුල ප්‍රයොජනය මෙතුමාගේ මිත්‍ර මහත්වරු කල්පනාකොට මෙකී උත්සවය පවත්වනලදී. ඇත්තටම මෙය ඉතා කදිම ඡුනවන්ත කල්පනාවකි. මේ ගැණ **විල්ෆ්‍රඞ් පී. ගුණවර්ධන** සහ **ඩබ්ලියු. ආර්නර් ද සිල්වා** යන ගෞරවාහි සෙක්‍රටාරිස් වරු දෙනම ප්‍රධාන මුළු කොමිටියට, රුස්වූ කව්රුත් සතුති කරණවා ඇසුවෙමු.

මෙකී ශාලාව ඉතා රම්‍යාකාරයට සරසා තිබුනේය. තැනින් තැන ලක්ෂණ ගස්වඟී තබා ඒවායේ අතු පතර ධවල වණ් කුරුවි කොවුලන් ලැගඉන්නාකාර ගොක්වලින් තනනලද පක්ෂිරූප සවිකර තිබුනේය. ඒ සමීපයේ ආසන රංචුවශයෙන්ද මනා පිළිවෙළකට වාඩිවීමට සලසා තිබුනේය. හික්තිවල සහ කව්ළුවල නීලවණ් වනස්ස වඟිවලින් නොයෙක් වැඩකර නා නා වඟී මල් ඔබ්බා ප්‍රියතර සුභාවකට සරසා තිබුනේය. සමහර හික්ති කණු, නිල්, රතු, සුදු, කහ, යනාදි වණ් කොඩි වලින් මනා ලෙස සරසා තිබුනේය. ගැලරි නම් මහල් තලයද මල් වනස්ස ආදියෙන් සරසා තිබුනේය. එහි වොලන්ටියර් බෑන්ඩ් කණ්ඩායම වාඩි ගෙණ විවින් විට තූයඃශබ්ද පැවැත්තුවෝය. ශාලාවට නඟින දෙරටුවද කොඩි, පඹ, මල් ආදියෙන් මහත් ගෞරව ලෙස සරසා තිබුනේය. ශාලාවේ පිට ශාලා දෙකේද, එහි ඇතිවූ

නෘත්‍යය මණ්ඩලයේද, තැන තැන මේස තබා නොයෙක් රස මුසු කැවිලිවලින්, අයිස්ක්‍රීම්වලින්, ෂැම්පේන් ආදි බීමවලින් පැමිණි ජනයාට සිත්වූපරිද්දෙන් භුක්තිවිඳීමට පිළියෙල කරතිබුනේය. තුණහමාරේ පටන් නොයෙක් වගීවල නෝනා මහතුන් සහ මහත්වරු රැස්වෙන්ට පටන්ගත්හ. හතර පමණ වෙනකොට ලක්දිව දූනට ඇති වැදගත් උගත් ධනවත් ගෑණු මහතුන්ගෙන් සහ පිරිමි මහතුන් ගෙන් ශාලාව පිරිගියේය. මෙම ශාලාවට අයත් පිට්ටනියේද මනා පිළිවෙලකට ආසන පණවා තිබුනේය. ඒ ආසනද, පිරිගියෝය. හතර පසුව සුළප වේලාවක් ගිය අතර ජේ. ඩබ්ලිව්. සි. ද සොයිසා මැතිවරයා එහි පැමිණියේය. මෙතුමා පැමිණි වහාම කදිම වෘත්තයකින් යුත් බෑන්ඩ් තූර්‍ය්‍ය පවත්වනු ලැබුවෝය. කොම්පිය ප්‍රධාන තවත් වැදගත් මහත්වරු ඉදිරියට පැමිණ ගෞරවයෙන් ශාලාව ඇතුලට කැඳවාගණ ආයේය. සියලුම පිරිමි මහතුන් ආසන වලින් නැගිට ගෞරව කරණු ලැබූහ. මිලහට සුදු ඇදුමෙන් සැරසී සිටිය වැඩකරුවෝ නොයෙක් රස කැවිලි බන්දේසිවල තබා ගෙණැවිත් නෝනා මහතුන්ට සඬ්‍රහකිරීමට පටන්ගත්හ. පිරිමි මහතුන් පිළියෙළකර තිබුන ස්ථානවලට පැමිණ කෑමට සහ බීමට පටන්ගත්හ. පහ පසුව පික වේලාවක් ගියාට පසු ගෞ. ජේ. ද සිල්වා උන්නාන්සේ විසින් ඉතා අගයට සරසනලද සතුති පත්‍රය කියවන්ට යෙදුනේය, එය මෙසේය:—

"සාමදූන විනිශ්චයකාර, ජේ. ඩබ්ලියු. සී. ද සොයිසා මහතානන්වෙත ඔප්පුවෙන පිණිසයි,

මහතානනි,

සිංහල මහා ජනයා වෙනුවෙන් මේ ශාලාවට පැමිණ සිටින අපි, වැලකිය නොහැකි කාරණා නිසා මෙහි නොපැමිණි මහතුන්ත් සමග තමුන්නාන්සේ කෙරෙහි පවත්නා ගෞරවයත් සැලකීමත් ප්‍රකාශ කරණු සඳහා

මෙ ප්‍රඥාවෙදී පැමිණියෙමු. තමුන්නාන්සේගේ මුත්ත නුවො සහ නැසිගිය පියානෝද, ත්‍යාගීවනතකම සහ සඳදෙශාල භාවයත් හෙතුකොට ගෙණ සිත් දිනාගෙණ වාසය කලෝය. ඒ මහතුන්ගේ අඩිපාරේ ගමන් කිරීමට තමුන්නාන්සේ සුදුස්සෙක්ව සිරිනු දැකිම තමුන්නාන්සේගේ දියුණුව ගැණ මහත් සැලකිල්ලෙන් බලා සිටින අපට ප්‍රීතියකි.

සොසිසා පව්ලෙන් මේ ලඞ්කාවට සිදුවී තිබෙන මහත් වැඩ ගැණ මහා රජතීන්වහන්සේගේ දියමනති ප්‍රඛ්‍යාත පැමිණීමේ අවරුද්දේ තමුන්නාන්සේ එඞ්ගලන්තයට සම්ප්‍රාපනවූ අතර සලකනු ලැබෙයයි විශ්වාස කරමු.

තමුන්නාන්සේට ශුභ ගමනක් වේවයි කියාද, නැවත අප අතරට ප්‍රවේසමෙන් ලහාවේවයි කියාද ප්‍රාර්ථනාකර සිටින්නේ තමුන්නාන්සේගේ යටහත් මෙහෙකරුවූ අපිය.

මැයි මස 1 වෙනි දින කොළඹ දීය.

ඊට සොව්සා මැතිවරයා තමන් වෙතුවෙන් සහ සොව්සා පව්ල වෙතුවෙන් සතුති කෙළේය. ඇස්. වීරක්කොඩි මහත්මයාද, සී. දෙන් බණියන් මහත්මයාද, ජී. එච්. පෙරේරා මහත්මයාද මේලහට කථා තුණක් කර සොයිසා මහත්මයාට ආශිංසනය කළහ. මේ කථාවලින් සහ පැමිණි, වැදගත් මහත් නා නා ජාතික පිරිසගෙතුන් විදුලි පණිවුඩ ආදියෙතුන් මෙතුමාත් ඒරෝපයේ පවත්වන්ට යන මහත් උත්සවයට යවන්ට සුදුස්සෙක්ම බව කිසි විරුඩයක් නැතිව මනාව ඔප්පුවිය. පැමිණි ජනයා නැවතත් ප්‍රීතියෙන් ඉපිල කෑම බීමට පටන්ගත්හ. මේ වේලාවගැණ මෙඝයාද ප්‍රීතියට පැමිණ සතුටුදායක වෂාවක් වැස්සුවාක්මෙන් බලාපොරොත්තු නුවූ වැස්සක් ලැබුනේය. වත්තේ වාඩිගෙණ සිටිය මහතුන්ද, ශාලාවට ඇතුල්ව නැවතත් කාබී ප්‍රීති ඝොෂා පවත්වමින් සවස හත වෙනතුරු පමණ ප්‍රීති වීමෙන් කාලය පසුකර සොයිසා මැතිවරයාගේ ගමන ගැණ ශුභ ප්‍රාර්ථනාකරමින් විසිර ගියාහ.”

මෙතුමාගේ එඩහලනත ගමන ගැණ මොරටු සඞඝමය විසින් පැවැත්තූ උත්සවය.

"AT HOME" BY THE MORATUWA ASSOCIATION.

වෂ් එක්දහස් අටසිය අනූහතේ මැයි මස තුන්වෙනි (1897. මැ. ම. 3.) බුදදින මොරටු සඞඝමයෙන් ලබන ලද ආරාධනාව පිළිගෙණ මෙතුමා එහි පැමිණියේය. එකල මොරටු සඞඝමයේ සාමාජික මහතුන් විසින් සමාදරයෙන් පිළිගන්නාලදි. **ද සොයිසා** මැතිතුමාට ශුභ ප්‍රාර්තනා කරන්නන්ගෙන් එම රැස්වීම පරිපූර්ණව තිබුනේය. දුම්රිය සථානයේ පටන් මාර්ගයේ අතුරණලද හෙල පියවිලි උඩින් **ද සොයිසා** මැතිවරයා මොරටු සඞඝමයේ සභාපති ධුරන්ධර කොර්නේලිස් ප්‍රනාන්දු, ලේකම් තැන්පත්, නීතිඥ ජී. ඇම්. සිල්වා, ඇම්. ඒ. අක්ෂර ලක්ෂණයෙන් යුත් ජේ. ජී. සී. මැන්දිස්, වෝල්ටර් ද සොයිසා, ඉමෑනුවෙල් ද සිල්වා යන මහතුන් සමග ගමන්කලහ. මග දෙපස සිටි ජනයාගේ ප්‍රීති ඝොෂාව සහ "වොලන්ටියර්" හමුදුවේ "බෑන්ඩ්" තූර්‍යනාදයද දස දිග පැතිර පැවතියේය. ශුඛවූ සෙබඵතියන් පාඨශාලාව දෙරවුවේ අලඞ්කාර තොරණක් බැඳ තිබුනේය. එම ශාලාවද මල් කොල ආදියෙන් මාහැඟි ලෙස සරසා තිබුනේය.

ද සොයිසා මහතා එහි පැමිණෙන ලදුව සමාදරයෙන් පිළිගත් වහාම ජී. ඇම්. සිල්වා මහත්මයා විසින් සඞඝමය වෙනුවෙන් සතුති පත්‍රයක් කියවනලදි. ඉන් පසු අසිසෙක් ද සිල්වා මහත්මයා විසින්ද, නිකලස් මැන්දිස් වාසල මුදලිතුමා විසින්ද, වෛද්‍යාචාර්‍ය්‍ය, ඊ. ඒ. රොබර්ට්ස් මහතා විසින්ද **ද සොයිසා** මැතිතුමාගේ සහ එම පවිලේත් ගුණ වර්ණනාකරමින් ව්‍යක්ත කථා පවත්වනලදි. ඊට **ද සොයිසා** තුමා විසින් ලුහුඬින් පිළිතුරු දුන් ඉක්බිති, අතුරු

පසකින් සඛ්‍රහා කරණලදී. ඉන් පසු රුස්ව සිටි ජනයා සවස පහට පමණ අතිශය ප්‍රීතියෙන් යුකතව **ද සොසියා** නුම යන ගමන **ජයවේවා** යන රුචිපවත්වමින් විසිර ගියෝය.

———:o:———

මහාසි "ඇම්. ඒ." නම් අක්ෂරවය.

THE TITLE "M. A."

———

වසි එක්දහස් අටසිය අනූහතේ (1897.) එඩහ ලනතයේ පැවැත්තූ ජුබිලි මහොතසවයට ගිය ගමනෙ හිදී මහානසී ආඛ්‍යානවිත "ඇම්. ඒ." නම් අක්ෂරවය මෙතුමා ලැබුයේය. මෙසින්ද මෙතුමා ඉඛ්‍රීසි භාෂාවන්හි උගතෙක්කොට ගැණේ. මානුෂික වක්ෂු යුවලකට වඩා "ඳුන" චක්ෂු යුවලක් ලබාගැණීමේ ඇති මහත් පරිශ්‍රමය ගැන නිශ්චයකල යුතෙන්නම්, වර ඳුන චක්ෂු ලැබූ උතුමෝමය. මෙම උතුමන් විසින් සමාදරයෙන් පිළිගතූ ලැබූ මෙතුමාත් මේ උතතම සඛ්‍යාවට ගැණෙන හෙයින් විශෙෂයෙන් අප සිරිලක ජනයාට දැනට අත්පත්ව සිටින මෙතුමා සුරතුරක ලක්ෂණයෙන් භාජිතව සිටිනවා දැක්ම මහත් සනතුෂ්ඨියක කරුණකි.

———:o:———

වාඝල මුදලි ගුරා.

GATE MUDLIYAR.

———

මෙතුමා එඩහලනතයේ නැවතී සිටින කාලයේ, එනම්:—එක්දහස් අටසිය අනූහතේ (1897.) දී මෙතුමාගේ යහපත් ලෝ වැඩ ගැණ සැලකූ ලඛ්කාණුව විසින් **ජොරෝනිස් විලියම් වාලිස් ද සොසියා ඛම් ගුණවඩන විපුල ජයසූරිය කරුණාරතන දිසානායක ශ්‍රී රාජගහගහෙශ කුරුකුලශෙඛර රජවාඝල මුදලි**

යන නාමොපලක්ෂිත අක්ෂරය දෙවා වදුරා, ඒ බැව් ලියා යවනු ලැබූහ. මෙතුමාගේ **මුත්තාලා** දූරූ මෙම උසස් තනතුර මෙතුමාටද ලැබීම කවුරුත් ප්‍රිය වඩන කරුණකි. තවද සඟ්ගීමය "පුබ්බලි" පදක්කමක්ද ලබාගණ්ඩුව විසින් එඩගලන්නයට යවා එහිදී මෙතුමාට හාරදෙන ලදී. ලක්දිව වාසින් විසින් ඉතා ගරුකරන්නාවූ වාසල මුදලිකම මෙතුමාට දිමෙන්ද, රන් පදක්කමක් පිළි ගැන්විමෙන්ද, ගෞරව කරණ ලද මෙතුමාගැණ අප උතුම් ඉංග්‍රීසි ආණ්ඩුවේ ඇති සාධාරණතාවය සහ සැලකිල්ල, මොනවට ඔප්පුවේමය. ආණ්ඩුව විසින් මෙතුමාගැණ මෙසේ සලකනකල අවශෙෂ ජනයා මෙතුමා කෙරෙහි ඇති සැලකිල්ල ගැණ කියනුම කවරේද?

ද සොසියා පවිල ගැණ සහ වෙසෙසින් මෙතුමා ගැණත් ප්‍රශංසනීය කරුණු දක්වමින් මෙරට ප්‍රසිඩ පත්‍රවලැ පමණක් නොව "ගෙලොබ්" "ඩේලි මේල්" "ඩේලි නිවුස්" "ඩේලි ක්‍රොනිකල්" "ඇකෝ" "සටාර්" "ක්‍රොසිඩන්" "ක්‍රොනිකල් කොලෝනිස්" සහ "ඉන්ඩියා" "සන්" "ටික්ලි ඩිස්පැච්" "පීපල්" "ටෘත්" "කෝර්ට් ජර්නල්" "කෝර්න්වල් ටයිම්ස්" "ඩේලි ටැලිග්‍රැප්" "ගේස්පිං" "සැන්ට් ලියොනාර්ඩ්" "ඇඩ්වර්ටයිෂර්" "ඊස්ට් බෝර්න් සටැන්ඩර්ඩ්" "ග්‍රැෆික්" ආදි ලොක ප්‍රසිඩ ඉංග්‍රීසි පත්‍රවල සහ සඟරා ආදියේ සිතියම් සඩගතවූද, වාක්‍යයන් මෙ කාලයේ මුළුලොව පතලේය. "පුබ්බලි" සඳහා එඩගලන්නයට ගොස් සිටි සඩදෙශික යුඩ හමුදුවට මෙතුමා එහිදී ආහාරපානාදියෙන් මොනවට සඩග්‍රහකර විපුල කරුණාවක් පෙන්නුවේය. එඩගලන්නයේ ගරුකොට සලකන උතුමන්ගේ සඩගමයක්වූ "කාර්ල්ටන් කලබ්" හි සාමාජික සඩඛ්‍යාවටද, "රෝයල් කොලෝනියල් ඉන්ස්ටිටියුට්" "ඉම්පීරියල් ඉන්ස්ටිටියුට්" යන සඩගමයන්හි

ගරු සාමාජිකයෙක් මෙන්දැ, මෙතුමා පත්කොට ගෙණ ගෞරව කරණු ලැබූහ. මෙසේ එඩගලනතා ගමනින් ලබනලද ගරුකාර ඇතුව වෂී එක්දහස් අටසිය අනූ අටක්වූ ඔක්තෝබර් මස විසිවෙනි (1898. ඔ. ම. 20.) දින එඩගලනතායෙන් පිටත්ව සුවසේ ලඞ්කාවට පැමිණියේය.

———:o:———

ACCEPTANCE OF THE Rs. 10,000 ONCE REFUSED.

වරක් ප්‍රතික්ෂේප කළ රුපියල් දහ දහ පිළිගැණීම.

———

වෂී එක්දහස් අටසිය අනූහතේ මැයි මස හවෙනි (1897 මැ. ම. 6.) ශනි දින මහා රාජියගේ "ජුබිලි" මඞගල්‍යය සඳහා මෙතුමා එඩගලනතායට යාමට "ජී. ඇන්ඩ් ඕ." නම් සමාගමේ "බලරුට්" නම් නාවිකයෙන් පිටත්විය. ජූනි මස 14 වෙනි දින ආණ්ඩුවට මෙතුමා දුන් රුපියල් දශදහ, නැවත මෙතුමාගේ වැඩබැලූ සහෝදර මහතුන්වෙත එවමින්, අදහස්කළ ගොඩනැගිල්ල මෙම මුදලෙන් කරවන්ට ආණ්ඩුවේ කැමැත්ත ප්‍රකාශකෙළේය. එඩගලනතායට ගිය ගමනේ කටයුතු ඉටුකොට මෙතුමා ලඞ්කාවට පැමිණිකල මේබැව් සහොදර මහතුන් විසින් දන්වනලදුව, එකී ගොඩනැගිල්ලේ වැඩ ආරම්භකෙළේය. නොබෝකලකින් එහි වැඩ අවසානකොට වෂී එක්දහස් නමසියේ ජනවාරි මස තිස්එක් වෙනි (1900. ජ. ම. 31.) දින මහ ජනයාගේ ප්‍රයොජනය සඳහා මෙය ලඞ්කාණ්ඩුකාර ශ්‍රීමත් **සර් ජෝෂප් වෑස්ට් රිජ්වේ** තුමා විසින් මහත් වැදගත් සමූහයක් හමුවේදී විවෘත කරණලදී.

වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නැන්පත් උගත් **ඇලන් පැටි** තුමා, මෙබදු ශාලාවකින් ලැබියහැකි අප්‍රමාණ ප්‍රයොජනගැණ වැදගත් කරුණු ගෙණහැර දක්වමින් ව්‍යක්ත කථාවක් කෙළේය. මේ කථාවෙන් පසු ගරුතර ආණ්ඩුකාර උතුමානන්වහන්සේ කථාවට පටන් ගෙණ මෙසේ කථාකෙළේය, ඒ කථාව:—



THE BACTERIOLOGICAL INSTITUTE.—සූදු ප්‍රාණී පරීක්ෂණ ශාලාව.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

"ක්ෂුද්‍ර ප්‍රාණී පරීක්ෂක ශාලාවකින් ලැබිය හැකි මහත් ප්‍රයොජනගැන ලොව මුළුදු ප්‍රකාශව තිබේ. මීට පෙර මෙබදු ක්ෂුද්‍ර ප්‍රාණී පරීක්ෂක ශාලාවක් ලක්දිවට අවශ්‍යබව ආණ්ඩුකාරයෙක් කියා තිබේ. (ඒ මම නොවෙමි) මෙබදු ප්‍රයොජනවත් ශාලාවක ඇති වැදගත් කම දත් ද සොසිසා මහතානන්ගේ දීමනාව ආණ්ඩුව විසින් පිළිගන්නාලද්දේය. ලක්දිව කරතිබෙන බොහෝ වැදගත්වූද, ප්‍රයොජනවත්වූද, කෘත්‍යයන්හි ද සොසිසා නාමය යෙදී තිබෙනබව මම දනිමි. සැලකියයුතුවූ සැකියිය පියාගේ ආදර්ශ ඉගණීමෙන් මුළු ලඬකාවාසින්ටම ප්‍රිය දයක සැහෑවට මෙම ගොඩනැගිල්ල කරතිබේ. මේ කරණකොට අප වෛද්‍යයෝ බොහෝ ප්‍රයෝජන ලබනවා ඇතැයි බලාපොරොත්තුවෙමි. ද සොසිසා මහතාගේ නොමසුරුවූ ත්‍යාගිවන්තකමගැන පැසසුම් ලැබියයුතුය" යි යන්නෙන් කථාව හමාර කෙළේය. (අන්පොළසන්) ද සොසිසා තුමා පළමුවෙන් මෙම මුදල ආණ්ඩුවට පරිත්‍යාගකෙළේ පිස්සු බලු රෙගාදියෙන් මෙරට පෙළෙන ජනයාට නිරවුල්ව ඖෂධ කරවාගැණීමට සථානයක් ඇතිකිරීම අවශ්‍යබව සිතා සහ උමතු බැල්ලක ගෙන් අනතරුයට පත්වූ සැකියිය පියතුමාගේ නාමය සිහිවීම පිණිසත්ය. නමුත් නිසි කාලේදී මෙකී ගොඩ නැගිල්ල, ගොඩනැංවීම සම්බන්ධ කටයුතු නිරවුල්ලෙස ආණ්ඩුව සමග කරගැණීමට ප්‍රමාදවීම හෙතුකොටගෙණ අතපසුවූ බැවින් ඒ අදහස අත්හැර මෙ කාලයට සුදුසු සිතිවිමක්වන, මහා රාණියගේ **දිසමනනි ජුබිලි මගුල** සිහි වීම සඳහා මෙම ගොඩනැගිල්ලකොට එහි මෙම ග්‍රන්ථයේ අටසිය එකොළොස්වෙනි පිටේ පෙණෙන ශිලාලෙඛනය පිහිටුවාලූහ.

ජෝන්ස් ද සොසිසා වාසල මුදලිතුමාද, **සුසෙවි ද සොසිසා** වාසල මුදලිතුමාද, **චාලිස් හැන්රි ද සොසිසා** සාමදූන විනිශ්චයකාර තුමාද, තමතමන්කල් පුණ්‍ය කම් ලොකයාට ඉතා ප්‍රයෝජනවත් වෙනාකාරයෙන් සහ

දීර්ඝකාලයක් පවතින්නාක්කාරයෙන් මහත්වේ ධන පරිත්‍යාග කොට විශාලඅොඩනැඟිලි සථාපිතකරවීමෙන්ම ආරම්භ කරනිබෙනබව මේම ගුහාවේ නොයෙක්තැන සඳහන්ව තිබේ. සිවවෙනිව පෙණෙන මෙතුමාද, එම ජෙෂ්ඨ සිහින්ගේ එකී සත්චරිත අනුභව ක්‍රියා කිරීමට අදහස් කොට, මේතුමාගේ පුණ්‍යකම්වල ආරම්භයද ලොකයාට අනිශසින්ම අවශ්‍යව තිබුන ක්ෂුද්‍ර ප්‍රාණිපරීක්ෂක ශාලාවක් සථාපිතකරවීමෙන්ම පටන්ගෙණ නිමාවට පමුණුවා ලබිකා ඉතිහාසයට අනන්‍යතාකරවීම මුළු ලක්වැසි ජනතාව ආඩම්බරකරවන උතුම් කතිවෘක්බව වැටහේ. පඤ්චමහා ගංගාවන්ගේ ජලසකඹය මහා සාගරයකරා කෙතරම් ධාවනයකළත් හේ සසුර වෙරළ ඉක්මවා නොයන්නාක්මෙන්, ධන බල, නිල, කීර්ති, ප්‍රශංසා කෙතරම් ලැබුනත් ජෙෂ්ඨ **ද සොසිසා** මැතිවරුන්නේ සත්චරිත සීමා උල්ලඞ්ඝනය නොකොට මෙතුමාද ක්‍රියා කරණුදැක්ම ප්‍රධානකොට මෙතුමාගේ භ්‍රාතෘන්ට සහ සාධු ජනයාටද දෙලෝසැප අනුභවයට හේතුවන උතුම්ඛ ආදර්ශයක්වනු නිසැකය.

INSCRIPTION.

THE DE SOYSA BACTERIOLOGICAL INSTITUTE.

PRESENTED

TO THE GOVERNMENT OF CEYLON BY

J. W. CHARLES De SOYSA Esq., J. P.

IN COMMEMORATION OF THE DIAMOND JUBILEE

OF HER MOST GRACIOUS MAJESTY THE QUEEN.

OPENED BY H. E. SIR JOSEPH WEST RIDGEWAY,

K.C.B., K.C.S.I., GOVERNOR.

JANUARY 31st 1900.

A. E. L. ROST.

ශිලාලේඛනයේ පිටපත.

නෙකඟින් විරාජමාන

මහාරාජිනීන් වහන්සේගේ

දිසමනි ජුබිලි මඩුලාසය සිහිපත්වීම

සඳහා

ජේ. ඩබ්ලියු. චාල්ස් ද සොයිසා

ඝාමදූන විනිශ්චයකාරතුමා

විසින්

ලඩකාණඩුවට පරිත්‍යාග කරණලද

ක්ෂුද්‍ර ප්‍රාණී පරීක්ෂක ශාලාව

ගරුතර ආණඩුකාර

සර්, ජෝෂප් වැස්ට රිජ්වේ,

කේ. සී. බී., කේ. සී. ඇස්. අස්.,

උතුමානන් වහන්සේ

විසින්

එක්දහස් නමසියේ ජනවාරි මස තිස්එක් වෙනි දින

(1900. ජ. ම. 31.)

විවෘත කරණලදී.

ඒ. ඊ. ඇල්. රොස්වී.

යෞවන පදප්‍රාප්ත මෙතුමා මෙසා මහත් මුදලක් තමන්ගේ ප්‍රයොජනය සඳහා තබානොගෙණ **ද සොසිසා** පව්ලේ වැඩුමහල් පින්වතුන් යිය මහ යාමට අදහස්කර ලන්දිවට අවශ්‍යව තිබුන මෙම විශාල ගොඩනැගිල්ල කරවා ආණ්ඩුවට භාරදීම අවශෙෂ ජනයා කෙසේවෙතත් ප්‍රඥ සම්ප්‍රයුක්ත ජනතාව තරයේ ප්‍රිය කරණ ආශ්චර්‍යමයවූ ක්‍රියාවක්බව මෙහි සඳහන් කරලීමට ලැබීම අපටද මහත් ප්‍රීතියක් බව කියමු. වර්තමාන ලඞ්කා ඉතිහාසයේ මේතාක් නොපෙණුනාවූද, කාලික කිසිම ප්‍රභූ යෞවන යෙකුගෙන් සිදුනුනාවූද උත්තරිතර මෙ දීමනාව ගැණ සුචරිත ධර්මයට කැමති කවර වර නුවණැත්තෙක් මෙතුමාට නොපසසා සිටිද? මේ උදුරතර දීමනා කරණ කොටගෙණ මුළු ලඞ්කාවිප වාසි සකල සෞඛ්‍යල ජනතාවගේ ප්‍රෞඪතාවය පරදෙශයන්හි නොපැතිරේද? නුවණම මුල්කොට හුදීහු විනිශ්චය කරත්වා!

———:o:———

දෙවෙනි දීමනාව.

SECOND DONATION.

ලඞ්කාවාසි සිංහල ජනතාවගේ ජාතික භූමියවූ ජම්බුවිප වාසින්ට වර්ෂ එක්දහස් අටසිය අනූනතේ (1897.) පැමිණි දුර්භික්ෂය සඳහා ලක්දිවින් එකතු කළ සම්මාදම් මුදලට මෙතුමා රුපියල් එක්දහස් පන්සියයක් (රු. 1,500) පරිත්‍යාග කෙළේය. ධනවතකු විසින් මෙසේ ධනයක් පරිත්‍යාග කිරීම අරුමයක් නොවෙතත්, වර්තමානකාලයේ අප රට ඇතම් ප්‍රභූන්ගේ ධන පරිත්‍යාග ගැණ කල්පනා කර බැලූකල කාලික තරුණයෙක්ව සිටින මෙතුමාගේ ත්‍යාගශීලත්වයකමේ පටන්ගැණීම ඉතා ශ්‍රේෂ්ඨ බැව් නොකියාම බැරිය. මෙතුමාගේ අගය වඩන පරිත්‍යාගවල

ආරම්භ මෙසේ බැවින් ලක්දිව ලිලෝපෙත කළ **ද සොසියා** පවිලේ මුදලි මැතිවරු දෙදෙනාගේ සහ මෙතුමාගේ පියතුමාගෙත් විද්‍යමාන ඡායාත්‍රයම දැනට ජීවනීය මෙම වාසල මුදලි මනත්‍රීශ්වරයාගෙන් නො පෙණේයයි කවරෙක් කියයිද?

———:o:———

රා ජ. ගෞ ර ව ය.

ROYAL HONOUR.

වෂී එක්වාදහස් නමසිය එකේ අප්‍රෙල් මස 12 වෙනි (1901. අ. ම. 12.) දින අපගේ මෙම ශ්‍රී ලඞ්කාවීපයට වැඩමකළ නෛකශ්‍රින් විරාජමාන මහාබල පරාක්‍රම රාජාධි රාජ ශ්‍රීමත් සත්වෙනි **ඇඞ්වර්ඞ්** මහාරාජොත්තමයානන් වහන්සේගේ ඔෟරස පුත්‍රරත්නයවූද, පියමහ රජුගේ ඇවෑ මෙන් බ්‍රිතාන්‍ය ක්ෂිතියට එකම හිමිකාරවූද මනා ගුණ ලක්ෂණ විපුල තෙජසපරාක්‍රමාන්විත යෝර්ක්වෝල්හි සහ යෝර්ක්හි **ආදිපාදෙතකම** ශ්‍රී රාජ කුමාරයානෝ සිය පිය **රාජකාන්තාව** හා එක්වාදහස් නවසිය එකේ අප්‍රෙල් මස පසළොස් වෙනි (1901. අ. ම. 15.) දින සවස නගර ලක්ෂණ දර්ශන සඞ්ඛ්‍යාත සඤ්චාරණ යෙහි නියුක්තවව **බඟතලයට** ප්‍රවිෂ්ටවූයේ, එහිදී සඞ්කීර්ණ කණ්ඩායම පිනෑ ප්‍රවිෂ්ට සුප්‍රසිඞ්ධ (ඇල්ග්‍රඞ් හවුස් නම්) **ද සොසියා** මන්දිරය නරඹා ගෞරව වශයෙන් රාජකීය රථ නැවැත්තූහ.

එකෙණෙහි, එම රාජකීය රථයෙහි පසක වාඩිගෙණ සිටි, නෛක කීර්ත්‍යුද්ධර කරුණා ගුණයොග සෞඛ්‍යාල නිකර නායක ශ්‍රී ලඞ්කාවීප සාමදූන විනිශ්චයකාර ධුරන්ධර **දෙන් සොලමොන් ඩයස් අභයවික්‍රම ජයතිලක සෙනෙවි රත්න රාජකුමරුන් කඞ්කානම්** බණ්ඩාරනායක **මහාමුදලි**

මන්ත්‍රීශ්වරයානන් විසින් දශරාජ ධර්ම ලක්ෂණ විරාජමාන මහ ඈපානන්ට සහ එම කාන්තාවට **ද සොසිසා** තුම සහ එතුමාගේ සොහොයුරී වන තරුණ **ද සොසිසා** මැතිනිය හඳුන්වා දෙනලදී රාජ හස්තඳුනයෙන් ගරු බුහුමන් කළහ. *

එකල, **ද සොසිසා** ආයතීවගේ එම කණිෂ්ඨ දුහිතෘවූ **සෙලිනා ලුවිසා එලිසබෑත් ද සොසිසා** තරුණ මැතිනිය ඉතා ලක්ෂණ පූර්ණ ප්‍රකරයක් ඒ රාජ කාන්තාවට ත්‍යාගි කරණලදී, හේ රාජකාන්තාව ගරුබුහුමන් ප්‍රදානයකොට පිළිගත්ති රාජ හස්තඳුනයෙන්ම සන්තුෂ්ට ප්‍රකාශ කළාහ.

ඉක්බිති මෙසේ නගර සංස්කාරණයෙහි නියුක්තවූ පසුකල ස්ථාන බොහෝ නමුදු එකතැනකවත් මෙකී රාජකීය රථ නොනවත්වා **ද සොසිසා** මැදිර වාරයෙහි පමණකුදු නවත්වා ආචාර සමාචාරයෙන් යුත් රාජ ගෞරව කොට කළ ගුණ සැලකූ මහිමය ගැන සිතන බලන කවරෙක් **ද සොසිසා** පව්ල ගැන් කළ ගුණ සැලකීමෙන් ආචාර සමාචාර කිරීමට කිසිසේත් ලොභ වේයයි නොසිතමු.

ද සොසිසා පව්ලේ ජ්‍යෙෂ්ඨ මැනිවරු සඟගිසුවූ නමුදු, ලොකයාගේ විපුල ප්‍රයෝජනය සඳහා කළකි අප්‍රමාණ ශුභ වැඩ කරණකොටගෙණ රජුන්නේ මන නුවන් ඇදිමද සිදුවූබව **ද සොසිසා** මැදිරවාරයෙහි රාජ කීය රථ නැවැත්වීමෙන්ම විදහමානවිය. එකිනෙකට ඇදෙන ද්‍රව්‍යබල කරණකොටගෙණ මහත් පුදුමදේ සිදුවෙන්නාක්මෙන්ම, සත්චරිතයන්ගි නියුක්ත සිත්මුදු සත්පුරුෂ ගණයාගැණ එසේම සිත්මුදු සත්චරිත රැති වඩන විවජජන, රජ, ඇමති, සිටු ආදී උත්තමයන්නේ

* මෙදින ද සොසිසා ආගන්තුව අසනීපයෙන් සිටිබැවින් වලව්වෙන් එලිනොබැසීය. කුමාරයාට සහ කුමරියට ගෞරව වශයෙන් අන්‍ය ස්ථානවලමෙන්ම මෙම වලව්වේ දෙරවුව සම්පයේද සරසා නිබුන බැව් දනිමු.

ඇදීමද සිදුවීමෙන් ගෞරව සම්භාවනා ආදිය සහ මහත් ලාභද අත්වීම සඟහාවධර්මයකි. පඤ්චමහා භූතයින්නේ විපයාසය හේතුකොටගෙණ මනුෂ්‍යයාගේ ශරීරගත ලේ, සෙම, ඇට, නහර, මස්, සම විපයාසවන්නේ යම්සේද, එසේම හොඳ නරක ක්‍රියාවන් කරණකොටගෙණ මනුෂ්‍යයාද විපයාසවීමෙන් යහපතට පෙරළී යහපතද, නපුරට, පෙරළී නපුරද සිදුකරණ බැව් සත්‍යයකි. **ද සොසිසා** පවිලේ ජ්‍යෙෂ්ඨමැතිවරු පරිපීයම භජනයකොට පර ජනයාකෙරෙහිම කම්පිත චිත්තයන්ගෙන් යුක්තව ධන, කය වෙහෙසුවාද, හේ ආනුභාව සම්පන්න සත්කම්යට විපාකවශයෙන් පෙරළී සත්කම් ලක්ෂණයෙන්ම දැනුදු ජීවමාන **ද සොසිසා** මැතිවරුන්ට සහ මැතිනියන්ට යහපත් විපාකම් ලැබෙනබැව් සත්‍ය ලක්ෂණ කොට විසකුණන් හමුවෙහිම ගිණිීයහැකි හෙයින් දැනට ජීවමාන **ද සොසිසා** මැතිවරු සහ මැතිනියන් විසිනුදු අකුශලයන්ගෙන් තොරව, අනුන්කෙරෙහි උපද්‍රවනලද කරුණා සම්භාරයෙන් යුක්තව මෙලෝ පරලෝ දෙක්හි ජයග්‍රහණය පිණිස කුශලයෙහිම නියුක්තව දිවාරාත්‍ර දෙක්හිම ක්‍රියා කිරීමෙන් කාලය ගතකෙරේ නම් අනාගතයෙහි මීටවඩා සහස්‍රගුණයකින් මහරජුන්ගෙන් මහා කරුණා ආදර සම්භාවනා මල්දම්න් භ්‍රාජිතවත්ව නිසැකබැව් පැණවතුන්ගේ නැනවත් ලකාවේ හටගෙණ තිබෙන කනක පුෂ්පයක් බව බුදිජනතාවගේ තුඩ තුඩ පවත්නා සුමිහිරි කණීරසායන ශබ්දයක්බැව් මෙහි සඳහන්කර ලිමට ලැබීම ඉතා ප්‍රීතිමත් කරුණක්බව කියමු.

පිය මුතුන් ඇවෑමෙන් ලක්දිව භූමණ්ඩලය විරාජමාන කරවන භූනවන්ත පරාර්ථකාමී සුසීල ධනපතියෙක් ලෙස වර්තමාන ලඞ්කා ඉතිහාසයේ සඳහන් මෙතුමා ඉතා ප්‍රිය ශීලී දෙහලක්ෂණයෙන් භ්‍රාජිත නිතර සිනා මුසුණකින් යුත් සෞඛ්‍යබල යෞවන මැතිවරයෙකි. සකල සම්පතින් අනූනව ඒ මධ්‍යයෙහි සිටින මෙතුමාගේ අති විශිෂ්ට

MESSRS. A. J. R. DE SOYSA, E. L. F. DE SOYSA & T. H. A. DE SOYSA.

ඒ. ජේ. ආර්. ද සොයිසා, ඊ. ඇල්. ඇෆ්. ද සොයිසා, ටී. එච්. ඒ. ද සොයිසා,
යන මහත්වරු නිදෙන.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO.

MESSRS. J. S. W. DE SOYSA, L. W. A. DE SOYSA & R. E. S. DE SOYSA.

ජේ. ඇස්. ඩබ්ලිව්. ද සොයිසා, ඇල්. ඩබ්ලිව්. ඒ. ද සොයිසා,
ආර්. ඊ. ඇස්. ද සොයිසා යන මහත්වරු තිදෙන.

SINHALESE DAILY NEWS PRESS, PETTAH, COLOMBO

විසම්භ ප්‍රධාන ගුණයනම්, **නිරහඞ්කාරකම්ය.** මනුෂ්‍යයකු විසින් තවත් එසේමවූ මනුෂ්‍යයකුට කළයුතු ආචාර සමාචාර මුදුබස් ආදි චරිත්‍රයන්ගෙන් මෙතුමා පරතෙරට පැමිණ සිටින්නෙක් හැටියට නිශ්චයකිරීමට ඇති බාධාවක් නොපෙණේ. වැඩුමහල් උතුමන් මෙන් මෙතුමාද සඞ්දෙශාලයෙන් ක්‍රියා කරගෙණ යනබැව් අසන දකින නුවණැති ජනයා මෙතුමා * කෙරෙහි දැනටම පැහැදී සිටින බව අප හමුවෙහි නොයෙක්වර විද්‍යමානවිය. හොර බොරු ප්‍රයොගකාරයන් කෙරෙහි මෙතුමා අතිශය පිළිකුල් කරන්නාක්මෙන් සත්‍යයෙහි ඇලී මනා ගුණයෙන් ක්‍රියාකරන්නන් කෙරෙහි මහත් සැලකිල්ලක් ඇති කරන්නෙක්. වප්, ඉල්, දෙමසේ පායන චන්ද්‍රයාගේ දීප්තිය යම්සේද, පුණ්‍යකාලයේ හැසිරෙණකල මෙතුමාගේ ලක්ෂණත් එසේමය. දැනට ද සොයිසා පව්ලේ ප්‍රධාන මෙතුමාගේ පටන් ලොකාර්ථයසඳහා අනන්‍ය ශ්‍රම වැඩ කිරීමට ඉදිරියට එමට සිටින සදාචාර ගුණාදියෙන් යුක්ත **ද සොයිසා** සහොදර මහතුන් සදෙන මෙතුමා පිරිවරගෙණ සිටීමේ ලක්ෂණ සෞඛ්‍යයි්බව විවඥජනයාව බොධ හෙයින්, **ද සොයිසා** නාමය සහ අභිප්‍රේත පරාර්ථික කම්ත් නොඅනුමානව ඉරසඳමෙන් නොළිහී පරම් පරානුගතවයේයැයි නිශ්චය්කළහැක.

තවද, නෙක ගුණාඞ්ගයන්ගෙන් හා පුණ්‍යඍියෙන් හෙබියාවූ **ජෝරෝනිස් විලියම් චාලිස් ද සොයිසා ඛම් ගුණවර්ධන විපුල ජයසූරිය කරුණාරත්න දිසානායක**

---

* අතිශය කථවණින් යුත් වළාපටලයන් කරණකොටගෙණ ඇතම්විට හිරු සඳුගේ ආලොක මිරිකී යන්නාක්මෙන් පසුගිය කාලයේ බෙලෙන් පැමිණ ආශ්‍රයකළ පාප මිත්‍රයන්ගේ පාසයන්ට මෙතුමාත් අසුව වික කරදර හිරිහැර විඳින්ට සිදුවුනේ වීනමුත් දැන් එයින් මිදී ප්‍රිය තරලෙස මෙතුමාට කාලය ගතකිරීමට හැකිවුනා දැක්ම කාටත් ප්‍රිය දෘශ්‍ය කරුණක්බවද මතක්කරමු.

ශ්‍රී රාජගහනගරෙහි කුරුකුලගෝත්‍රය සරිලක සාමදූත විනිසුරය බුරඹර වංසල මුදලි ප්‍රවර මහත්තිගෝවර ලක්ෂණ සුපුෂ්පිත සෙවන පදමය, දශ දිගාබහ්‍යන්තරයෙහි කුළුඟු ගුණ ලක්ෂණ සුගන්ධය පැතිරීමෙන් බඩු මිත්‍රාදීන් ලක්ෂණ රතෙනාපල, නීලොත්පල පිරිවරකොටගෙණ හුදිජන ගණ ලක්ෂණ භෘඩග ගණයා ත්‍යාග ලක්ෂණ මධුවෙන් ප්‍රීණනයකර, ගරු සතුති ප්‍රශංසා ලක්ෂණ බමර රුව දශදෙශ රඳවා ශ්‍රී ලඬකාවිප නැමති වරතටාකයෙහි සකල ජන මනොනන්දනය කරමින් ශතවර්ෂාධික කාලයක් ශොභමානවේවයි ආශීංසනයකිරීමෙන්, හුදිජනතාවගේ ප්‍රසාද සංවේග සඳහා කළ **"ද සොසිසා චරිතය"** නම් මේ ග්‍රන්ථය මෙයින් සමාපත කරවිහ.

ගුණසිරි රත්න.

GLOSSARY.

——:o:——

ග්‍රන්ථපදවිවරණය.

GLOSSARY.

ග්‍රන්ථපදවිවරණය.

අ.

අකාල—නිසිනොවනකාලය.
අඛණ්ඩව—නොකඩව.
අගනා—වටිනා; අගය ඇති; වටිනාකම් ඇති.
අග—කෙළවර; කොණ.
අගිල්—සුවඳ වගීයක්.
අගනී ක්‍රීඩා—ගිනිකෙළි.
අගනීදෙව්—ගිනිදෙවි (ගින්නට අරක්ෂත් දෙවියා).
අගඹිකා—තොරන් විශෙෂයක්.
අඩික—ඉලක්කම්; නොම්මර.
අඩග—අව යව; (ශරීර අවයව, ශරීරයට අයිති අත පය ආදිය).
අඩහුල්‍යාභරණ—ඇඟිලිවල පළඳින ආභරණ; මුදු.
අජීවික—ජීවත්ව නොමැති.
අඳුන—කුවණ මද; මෝඩ.
අපියෙන්—කැමැත්තෙන්; කැමති පරිද්දෙන්.
අවිටාලය—අටලුව; මැස්ස.
අනැඹුල—අනාගත නෙල්ලිගෙඩිය; * අනාගත නෙල්ලි ගෙඩියමෙන් නිසැකව දැනගැණීම.
අන්‍යූනන—අධික; ඇතරක් නොමැති.
අන්‍යොන්‍යොපකාර—අනිශයින් උපකාර; බොහෝ වැදගත් උපකාර.
අන්‍යථා—බොහෝසේ.

---

* සමහරු මැණිකයයිද කියති.

අත්තනොමත—තම මතය (අනම් මනම් දෙඹිම; ඕනෑනැති කථා).
අතිරෙකසින්ට—ඉතුරු ඇත්තන්ට.
අතිශයින්—බොහෝ සෙයින්.
අතුරුපස—අතර කෑම් පීම් (සවසට කන කැවිලිආදිය).
අතුරුදහන්—අනන්තර්ධාන; නොපෙණීයාම.
අත්තිවාරම්—පදනම්; ගොඩනැඟිල්ලක මුලින්දමන හුණු ගල් බැම්.
අත්ල—අල්ල; අත ඇතුළත මැදභාගය.
අත්පොළසන්—අත්පුඩිගැසීම; අත් තැළීම.
අත්දණ්ඩ—හැරම්පිය; බස්තම.
අත්කම්—අතින් කරණ වැඩ.
අදහුත—පුදුමය; මවිතය; විසමය.
අඳේට—පංගුවට; කොටස දීමට.
අධම—නීච; නරක.
අධර්‍මිෂ්ඨ—ධර්‍මිෂ්ඨ නොවන; යහපත නොවන.
අධිකොෂ්ණ—අධික උෂ්ණ; තද උෂ්ණය; ඉතා රස්නය.
අධිකාරම්—අත්තිකාරම්; කලින්දෙන මුදල් කොටස.
අධිකරණාඛ්‍යෂකතැන—නඩුකාරතැන; විනිශ්චයකාරතැන.
අධිකරණශාලාව—නඩුඅසන සථානය; උසාවිය.
අධෛර්‍ය්‍ය—ධෛර්‍ය්‍ය අඩුකම; ධෛර්‍ය්‍ය අඩුකම.
අඛ්‍යක්ෂක—ප්‍රධාන.
අනවරත—නිරතුරු; නිතරම.
අනර්‍ඝ—නපුරු; අර්‍ඝය නොවන; අවැඩ.
අනල්ප—කෙළවරනැති; කම්මුතුනැති; ඊක නූවූ.
අනලස්ව—ලස්නොව; ඉක්මන්ව.
අනර්‍ථදුරට—අනර්‍ථය නැමති අඬකාරයට.
අනන්ත—නොයෙක්; කෙළවරක්නැති; බොහෝ.
අනාවරණ—වැලකීම්ක් නැති; වැසීමක් නොමැති.
අනාථ—අසරණ; පිහිටක් නොමැති.
අනාථනාථ—පිහිට නැතිවුන්ට පිහිටන; අසරණයින්ට පිහිටන.
අනාගත—ඉදිරි කාලය; මතු පැමිණෙන කාලය.
අනුසමරණය—සිහිකිරීම; සමරණය කිරීම.

අනුඤ්ඤ—අනුමතකිරීම; සප්‍රකිරීම.
අනුරූපව—සමාන රූපව; සමාන ලක්ෂණව.
අනුශාසනා—දනුමැනිකම්; අවවාද.
අනුත්තර—උතුම.
අනුජීවින්—දැසයින්; කම්කරුවන්; වැඩකරුවන්.
අනුචිත—නුසුදුසු.
අනුරූප—සමාන; එකවගේ.
අනුව—සමානව; එකඟව.
අනුක්‍රම්ක—පිළිවෙළ; පරිපාටිය.
අනුග්‍රහ—උපකාරය; සඬග්‍රහය.
අනුකම්පා—කරුණාකිරීම; අනුන්නේ දුකට හිත උණුවීම.
අනූනය—නැලවීම; නැලවිල්ල.
අන්තරායවිශොධන—අනතුරු නැතිකරණ.
අන්තගීතකොට—ඇතුළත්කොට; පදිඤ්චිකොට.
අන්තර්‍ධාන—නොපෙණීයන; අතුරුදහන්.
අන්‍යෝන්‍ය—අන්‍යයට එකඟ.
අබ්බසින්—දැස් නැතිවුන්; ඇස්දෙක නොපෙනෙන්නන්.
අන්නොවාසික—අනයට වාසයකරණ; වැඩකරු.
අන්නෙන්‍යානන්‍ය—ඔවුනොවුන්.
අන්‍ය—අනික්; වෙනින්.
අපමණ—අප්‍රමාණ; ගණනක්නැති; ප්‍රමාණයක්නැති.
අපවාදය—විරුඬවචන; නෝක්කඩුව.
අපථ්‍ය—අහිත දෙය; විරුඬ දෙය.
අපදාන—ප්‍රශංසා කටයුතුක්‍රියා.
අප්‍රමාණ—ප්‍රමාණනැති; කෙළවරනැති; බොහෝ.
අප්‍රාණ—පණනැති; ජීවන නොමැති.
අප්‍රාණ්ක—පණනැති; ජීවිත ඉන්ද්‍රිය නොමැති.
අභාවය—අනහිම; මැරියාම; සඬ්ගීසවීම.
අභාග්‍යතාව—අවාසනාඛව; පින් මදකම.
අභිවාඬ්ඡිය—දියුණුව; වැඩිම.
අභිඤ්ඤ—යටහත්.
අභිමානය—උඩඟුව.

අභිනන්දන—අධික සතුට; මහත් සන්තෝෂය.
අභිප්‍රාය—අදහස.
අභිමතාර්ථකොට—අභිප්‍රායකොට; අදහස්කොට.
අභිනව—අලුත්.
අභිධාන—නාමය; (සොයිසාභිධාන, සොයිසා යන නම්ඇති).
අභිවාදනය—වැඳීම; නමස්කාරය.
අභිමත—අභිප්‍රා; කැමති; ඕනෑවූ.
අභිප්‍රෙත—අභිප්‍රායවූ; අදහස්වූ.
අභිෂෙක—ඔටුනු පැළඳවීම; රජකම් සඳහා හිසපැන් වැක්කිරීම්.
අභිමුඛයට—ඉදිරියට; පෙරට; ඉස්සරහට.
අඟුත—නූවූ; බොරු.
අභ්‍යන්තර—ඇතුළ.
අමරපුර—දිව්‍යලෝකය; සුගීලොකය.
අමතර—අනියම්.
අම්දින්නෝ—අතුගාන්නෝ.
අමාපැන්—අමෘත සමාන පැන්.
අමිත—ඉනාබොහෝ.
අමුරන්—තද රත්රන.
අමුණු—කෙත්; අමුණු බැම්.
අමූල්‍ය—මිළකළනොහැකි; අගයකළ නොහැකි.
අමෘත—දෙවියන්ගේ භොජනය; දිව්‍යඕජා.
අය—ප්‍රයෝජනය; ලාභය.
අයුක්තට—වැරැද්දට; යුතුනැති දෙයට.
අයොග්‍ය—සුදුසුනොවන; නුසුදුසු.
අයෝමය—යකඩින්කළ.
අරක්කැම්යා—පිසන්නා; කෝකියා.
අරගල—කෝලහලය; කලහ.
අරාගත්—ආරූඪකරගත්; නංවාගත්.
අරිඤ්ඤ—නපුරු; රෞද්‍ර.
අරුණ—ඉනා උදය; සූර්‍යාපහළවීමට පළමු ලැබෙන ආලොකය
අලඞ්කෘත—අලඞ්කාර.
අලස—කම්මැලි; කාර්‍යයියෙහි මැලි.
අලඞ්කාර—අගය; ලක්ෂණ; බැබලීම.

අවසානකෘත්‍ය—අනන්තිමකටයුතු; මල කල කරණ කටයුතු.
අවනතව—නැමී; යටහත්ව.
අවදූත—සුදු; හෙල.
අවස්ථාව—කාලය; වේලාව.
අවඕත—වංකනොමැති; ඇද නොමැති.
අවරශීර—පළුතයේ අනික්පැත්ත.
අවදිව—(නින්දෙන්) නැගිට.
අවගාහනය—ජලාභිෂෙක ප්‍රභෙදයක්; ක්‍රීඩනියානිකිරීම්.
අවකාශ—ඉඩහැරීම; අවසරදීම.
අවභිරකම—අවකාශ නොමැතිකම.
අවසාන—අනන්තිම; කටමුතුව; නිමාදුව; හමාර.
අවශ්‍යබව—ඕනෑමබව; අනිශයින්ම උවමනාබව.
අවසර—සමු; වර; කැමත්තඇතිව යමහෝ කටයුතු කිරීම.
අවට—අසල; කිට්ටුව; තුදුරු; ලඟ; වට හෝ හාත්පස.
අවා—ස්ත්‍රියක් ගෙණ ඒම.
අවාජීවිතය—ස්ත්‍රියක්ගෙණ ගතකළ ජීවිතය.
අවිරල—තුනිනොවූ.
අවිද්‍යමාන—නැතිවීම; නොපෙණීම.
අවිඤ්ඤණක—නුවණ නැති; කල්පනාකිරීමේහි බලයක්නැති.
අවිරුඬ—විරුඬනොව.
අවිචිත්‍ර—චිත්‍රවැඩ නොමැති; චාම්.
අවිනිශ්චිත—විනිශ්චය නොකළහැකි; තීන්දුකළ නොහැකි.
අශ්ව—අශ්වයා; අස්.
අශ්වතරයා—කොටලූවාට දුව අශ්වධෙනුවගේ ගැබේ උපන් සතා.
අශ්වාභරණ—අශ්ව ඇඳුම්.
අර්ශස්—එනම් රොගයක්.
අෂ්ටකොණ—අටකොණ; කොන්අට.
අෂ්ටක—ශාන්තිය පිණිස කියන ප්‍රබන්ධ. (ශ්ලෝක අට)
අසල්වාසි—අසල වාසයකරන්නෝ.
අසරුවන්—අශ්වයින්පිට යන්නන්.
අසඬකුචිතව—නොහැකිලී; නොම්රිකී.
අසාධ්‍ය—අමාරු; සාධ්‍යනොවීම.

අස්වද්දුගැණීම—ගොසිතැන් කරගැණීම.
අස්වසා—නිශ්ශබ්දකොට; සනසා; නලවා.
අස්හල—අශ්වයින් බඳින සථානය; ඉසකාලය.
අස්ගොව්වා—අසුන් රකින්නා; කුදිරකාරයා.
අසථිර—සථිරනැති; නොපැවත්.
අහඞ්කාර—ආඩම්බර; උඩඟුව.

ආ.

ආකර—උපදිනතැන; (රත්රන්ආකර, රත්රන්උපදින ඕම).
ආකර්ෂණය—ඇදෙන; ඇලෙන.
ආගම නය—ආගමේ පිළිවෙළ.
ආගනුක—අමුතු; අමුතුවෙන් පැමිණි.
ආඝ්‍රාණය—ගඳ සුවඳ නාසයට ගැණීම; ඉඹීම; ඉවකිරීම.
ආචාර්‍යසමරණ—ගුරුවරයා සිහිකිරීම.
ආචාර—ගරුකිරීම; සැලකීම.
ආජීව—ජීවත්වීමේ උපාය; ජීවනය දක්වා.
ආඩිගුරු—රේඛාලක්ෂණ දෙහලක්ෂණ කෙළු බලා පල අපල කියන ගුරා; මෙයින් ජීවත්වෙන්නා.
ආඪ්‍ය—මහත්; පිරිවැරූ; වැඩිවූ.
ආත්මාර්ථ—තමන්ට ප්‍රයෝජන.
ආදාහන—දවාපිළිස්සිම; මිනි පිලිස්සිම.
ආදාහන භූමිය—මිනි පුලුස්සන ඕම.
ආදිපාද—ඔටුන්නට හිමි කුමරා.
ආදර්ශ—උදාහරණය; උපදෙශය.
ආධාරවූ—උපකාරවූ; සහායවූ.
ආධාර—උදව්; උපකාර.
ආධුනික—අලුත ඉගෙණගන්නා; මෙකලවූ.
ආපෙක්ෂාපදෙශය—සෑක සහිත යමක් තීරණය කරගැණීමට දක්වන වාක්‍යය; උපදෙශය.
ආහරණ—පළඳනා.
ආමරක්ත රොගය—ආම සහිත රක්තාතීසාරය.

ආමන්ත්‍රණය—කථාකිරීම; කැඳවීම.
ආමිෂය—ලාභය; ප්‍රයෝජනය; ආහාරය.
ආයු—ආයුෂ.
ආයත්‍යා—උත්තමය; උත්තමයෙකුගේ භාර්‍යාව.
ආරම්භ—පටන්ගැන්ම.
ආරූඪ—නැගගත්; (අශ්වාරූඪ, අශ්වයාපිට නැගගත්).
ආරොග්‍යශාලා—රොග සුවකරණ ස්ථාන; සත්‍රිතාල.
ආලම්බන—එල්ලෙන.
ආලිඞ්ගිත—වැලඳගත්.
ආලිස්සම්—නොසැලකීම.
ආලෝකය—බැබලීම; අඳුර නැතිකිරීම.
ආවරණය—වැසීම; රක්‍ෂාකිරීම.
ආවාසය—මත්තන්නේ නැවතීමට සැප පහසු ගැණීමේ ගෙය.
ආශංසන—ආශිර්‍වාද.
ආශිර්‍වාද—යමක් සිදුවේවාකියා කරණ ප්‍රාර්‍ථනාව.
ආශ්‍රය—සේවනය.
ආශ්වයත්‍ත්‍වම්—පුදුමවූ; විස්මිත.
ආශ්වයත්‍ත්‍ව—අපූර්වවූ; අරුම්වූ.
ආසඩාස—හුසම්හැඟීම.
ආසනන—කිට්ටු; ලං; හුදුරු.
ආසන්නවූයේ—කිට්ටුවූයේ; ලංවූයේ.
ආහාර—කෑම.
ආළකමන්දූ—වෛශ්‍රවණ දෙවියාගේ නුවර.

ඇ.

ඇඟැය—තොරණටහුරු සැරසිල්ල.
ඇනම්—සමහර.
ඇඹ—පොරොප්ප.
ඇඹුළුපුල—කුමුදු සහ මහනෙල්.
ඇල—ඔය.
ඇලුම්ව—ඇලී.
ඇසුරු—ආශ්‍රය.

ඉ.

ඉක්මවා—පසුකොට; පරාදකොට.
ඉවුකොට—ඉක්මකොට.
ඉවුකරණලද—ඉක්මකරණලද.
ඉවු—ඉක්ම.
ඉතිහාස—රවේ පැවැති කථාන්තරය.
ඉපිල—ඉලිප්පී; මත්ව; සම්පූර්ණව; නැඟ.
ඉවහල්—පිහිට; සරණ.
ඉසදියදීම—හිසට වතුර වැක්කිරීම.
ඉසිසිත්—ඊර්ෂ්‍යාසිත්.
ඉසුරුමතුන්—ධනවතුන්; ඓශ්වර්යශීලත්වතුන්.
ඉසුරු—ඓශ්වර්ය; (රන් රිදී මුතු මැණික් භව භොග දූ දරු ගහ කොල වතුපිටි ආදි).

ඒ.

ඒම—ඒම.
ඒෂ්‍යාව—නපුරුකම; අනුන්ගේ යසසට කොපවීම.

ඔ.

ඔකන—කී; කියනලද.
ඔග්‍ර—උසස්.
ඔච්චාරණය—කීම; කියවීම.
ඔඩුමහල—සොල්දරය.
ඔඩඟු—ආඩම්බර; අහංකාර.
ඔතුමානන්—උත්තමයානන්.
ඔතසවය—මඩගල්‍යය; සෙල්ලම් පැවැත්ම.
ඔත්තාෂ්ඨ—උතුම්.
ඔත්තර්තර—අතිශයින් උතුම්.
ඔතසනන—උසස්ලෙස; බලවත්ලෙස.
ඔත්තමාඩග—හිස.
ඔත්තුඩගචරිත—උසස් චරිත්‍ර.
ඔත්තුඩග—ඉතා උසස්.

උදක—ජල; වතුර.
උදයගිර—උදුවන පව්තය; ඉරපායන පව්තය.
උදරය—බඩ.
උදුර—උසස්, මහත්.
උදුරතර—අති උසස්.
උදුහරණ—සමාන.
උදුන—ලිප.
උදීපනික—උසස්ලෙස බැබලෙන.
උදීපන—දිලිසෙන; බබලන.
උණ්හීනඤ—අධික ප්‍රඥව; සූර්‍යාලෝකය ලැබුන කෙණෙහි නෙළුම් මල පිපෙන්නාක් මෙන් අවබොධවන ඥානය.
උත්තන—උයන.
උදෙක්ඛණය—උසස්කොට කරණ සොඹාව.
උනවා—ලිහවා; මුදවා.
උනා—ලිහා; මුදා.
උපත—උත්පත්තිය; ඉපදීම.
උපභොග—උපයනලද වස්තු.
උපසභාපති—සභාපතිතැනගේ දෙවෙනියා; දෙවෙනි දාඩාර කාරතැන.
උපලාලන—නැලවීම.
උපවිකා—වේ; වේයන්.
උපයන්ට—සම්භාවිරීමට; (ආදර්‍යය) ඉපදවීමට.
උපලක්ඛිත—සුඤ්ඤත.
උපලිපන—ගැල්වීම; ගෑම.
උපද්‍රව—උපද්‍රවය; විපත; පීඩාසහිත.
උපක්‍රම—උපා; පිළිවෙළ.
උපදෙස්—ආදෘශ; නිදසුන්.
උභයලොක—දෙලොව; මෙලෝ පරලෝදෙක.
උභය—දෙක.
උභයලොකාපි—මෙලෝ පරලෝ දෙක්හි වැඩ.
උයන්පාලයන්—උද්‍යානබලාගන්නන්.

උලලඛන—ඉවත්කරණ; උදුරාදමන; ඉක්මයාම.
උළිරස—තාරකා රාශිය.
උවමනා—ඕනෑකරණ.
උවටන්—උපසථාන.

ඌ.

ඌඩිභාගය—ඉහලකෑල්ල.
ඌනභාව—හානිය; අඩුව; පාඩුව.
ඌන—අඩු; හීන.
ඌනයසි—අඩුයයි; පාඩුයයි.
ඌනාතිපූරණ—අඩුවූදෙය පිරවීම; පාඩු සම්පුණී කිර්ම.
ඌෂ්ණ—රස්නය.
ඌෂ්ණමානකයන්ත්‍රය—ශීත ඌෂ්ණ ප්‍රමාණ දැනගැණීමේ යන්ත්‍රය.
(Thermometer)

සෘ.

සෘජු—කෙලින්; ඇදනැති.
සෘතුගුණය—කාලගුණය.
සෘතු—කාලභෙද; කාලගතිය.

එ.

එකාලොක—එක ලෙස එලියවීම.
එක්තිස්—තිස්එක. (31)
එකැස්බෙර—එක් පැත්තක පමණක් සම් බැඳි බෙරය.
එපස—ඒ පසෙය; ඒ පැත්ත.

ඒ.

ඒතාක්—ඒවනතුරු; එවක දක්වා.

ඔ.

ඔට්ටුකවිවි—රෙද්දට උඩින් ඉන සවියසඳහා ඔතන රෙදිපටිය.
ඔත්පලව—යාම් ඊම් ආදිය බැරිව; එකතැන්ව.

ඔලොම්බා—සවිකර; ඔබ්බා; එල්ලා.
ඔල්වරහඬ—ප්‍රීති ඝොෂා.
ඔවුනට—ඔවුන්ට.
ඔසප්—මල්වර; වැඩිවිය පැමිණීම; තරුණභාවයට පත්වීම.
ඔසවා—උස්සා; ඉහල්කර.
ඔහොරි—යහුන් විසින් පොරවන රෙද්ද.

ඕ.

ඕෂධාදිය—බෙහෙත් ආදිය.
ඕෂධ—බෙහෙත්.

ක.

කවුක—කවුසඟින; රළුවූ.
කවුලැහැබ—කවුසඟින පදුර.
කඩබැඳි—රෙද්දෙ බැන්දුවූ.
කඩුකැරලු—පවි කසතාන කරලූ.
කණවා—සාරා; හාරා.
කණලු—කණෙහි දූවූ.
කණ්ඨට—කුඩා; පුංචි.
කණ්නට—සෑරීමට.
කණ්රසායන—කණට මිහිරි.
කණුන්—එක ඇසක් නැතිවුන්.
කණේන්ද්‍රිය—කණ; කණ නැමති ඉන්ද්‍රිය
කණ්ඨක—කවු.
කණේ—කන්.
කතිකා—කථා.
කත්මළු—උසස් උතුමෙක් දැකීමට එනකල සතුටු පඬුරු වශයෙන් ගෙණ එන කැවුම්, කෙසෙල්කැන්, පැනි, කිරි ආදිය බැඳගෙණ එන මළු
කතීව්‍යය—කටයුතුය.
කථන—කියන.
කථානන්තර—කථා.

කථානන්තරය—කථාව.
කථාශෙෂභාවොපගතවීම—කථාවෙන් හානියටයාම; කථා කිරීමට බැරිවීම, මරණයට පැමිණීම; මියයාම.
කදෝකිම්—කනාමැදිරි; කදෝපැනි.
කනකපුෂ්ප—රත්රන් මල්; රන්මල්.
කනක—රත්රන්.
කනදූ—කෑමටගන්නා ද්‍රව්‍ය.
කන්‍යාරශ්මිමාලා—කන්‍යාකම නැමති ආලොකය.
කන්‍යාවරහන—පුරුෂයෙකු විසින් ශරීරසපර්ශ නොකරණලද උතුම් ලිය.
කන්‍යාඩහනාව—අවිවාහක ස්ත්‍රී; කසාද නොබැන්ද තරුණී.
කපිපුර—කපුරු.
කම්—කටයුතු; කම්.
කම්පිත—නැවුනු; කම්පාවූ.
